
24869



# ගිරිදේවි

ශාන්ති දිසානායක

Scanned with CamScanner

# 1

අතු පතර ලෙළ දෙන ආලෝක ලප පිළිබඳව කිසිදු තැකීමක් නොකරන කුඩා කුරුල්ලෝ අතොරක් නැතිව නද දෙති. ළහිරු මඬලක මහිම කියා පාන ළපලු පාර පාරා බුදින්නට යමක් සොයා වෙහෙසෙන සිඟිති නෙත් හා තියුණු තුඩ කැදර උදර පිළිබඳව කේලම් කියති. අතු ඉති අත්තටු ඇත්තන්ටම පවරා බිමට බට කටුස්සෝද මකුළුවෝ ද වියළි පත් පලස මත කඩිසරව ඔබ මොබ යති එති.

දිගු කලක් මුළුල්ලේ වැස්සක් ඇද නොහැළුණ බව කියාපාන දෙහි දොඩම් ගස් දෙක සෙමින් වුවද නිශ්චිත ලෙස වියළි යයි. අත්තක් ඉත්තක් ගානේ ගෙඩි හටගත් ස්වර්ණමය යුගය සිහි කොට ළතවන ඒ ඉපල් දකිත්ම ඇගේ දෑස හැකිලී ගියේය. කවර හෝ සුන්දර යමක් සොයා සක්මන් කළ යෞවන දෙනෙත අන්තිමේදී නතර වූයේ තවම හරිත පැහැය නොවියැකුණ තුගු අඹ තුර මතය. රුදුරු හිරුට පවා උදුරා ගන්නට නොහැකි වූ ඒ හරිත පැහැ පත් මධ්‍යයේ දුව පනින, සැණින් අහසට ඉගිල යළිත් අත්තක ලැගුම් ගන්නා කුඩා කුරුල්ලෝ ඇගේ දැවෙන හද මඳකට සනහාලන පොද වැස්සකි. ඉවසිය නුහුණු නිශ්චලතාවය බිඳ දමන දඟකාර ඇබිත්තන් සත්ත්වයන්හට ඇය ස්තුති කළ යුතු වූවාය. එහෙත් තරයේ පියැවුණ සිහින් දෙතොල සිනාවක් හෝ වදනක් උදෙසා කිසි කලෙකත් සලිත නොවන හැඩය.

බුම්මාගත් කෙල්ලක අහළ පහළ හුස්ම ඉහළ පහළ හෙලන බව නොදත් ලෙසින් කුරුළු කැල තවත් දවසකට මහත් ප්‍රබෝධයෙන් මුහුණ දෙති.

පියාපත් බර පමණක් දරන්නවුන් දෙස ඇය බලා සිටියේ ඊර්ෂ්‍යාවෙන් ඇඳිරිව ගිය දෙනෙතිනි. සැහැල්ලුවෙන්ද සොම්නසින්ද උතුරා කැලතී නොගිය අඳුරු යුගයක අම්හිරි මතකයෙන් වේදනා විඳින ලෙසින් ඇගේ මුහුණ හැකිලී ගියේ ය. සැබැවින්ම ජීවිතයේ එක් කාලපරිච්ඡේදයක් අවසන් වීද?

එසේ වී නම් තවත් කාලපරිච්ඡේදයක් ආරම්භ විය යුතුයි. එබන්දක් සිදු වී ඇයි නිශ්චය කර ගන්නට අපොහොසත්වූ යුවතිය හාත්පස සිසාරා බැල්මක් හෙළුවාය. කලකින් මිනිස් දෙපයක් නොගැටුණ බිමක ඇවිද යන්නට ඇය මැළි වූවාය. වල් බිහි වූ මිදුලත් ජරාජීර්ණව ගිය නිවසත් ඇය අන්දමන්ද කරන සුළුය. මොහොතක් හෝ රැදී නොසිට වහා පලායන්නට උපදනා ආවේගය මැඩගත නුහුණුව ඇය තොල සැපුවාය. විඳ දරා ගත නොහැකි හුදෙකලාවද නිවෙස ආක්‍රමණය කරන ප්‍රචණ්ඩ සෙබළ මුළක් බඳු වැල් ගෝටාවද ඇය පලවා හරින්නට පේවුණ ගානය.

"පලයං පලයං... දුවපං දුවපං..." නොකඩවා බෙරිහන් දෙන කලක මෙන් ඇය නොඉවසිල්ලෙන් සහ අසහනයෙන් මිරිකුණාය.

ඉකුත් රාත්‍රියෙහි ගන අඳුර මේ නිරස හා මූසල දසුන් ඇගේ නෙතින් සඟවා ලූ කඩතිරයක් විය. අඳුර පමණක් නොව ජීවිතාශාව සහ අධික භීතිය පාළු ගෙපැලේ අප්‍රසන්න දුගඳින් ඇගේ නැහැ පුඩු නොහකුළුවන්නට වගබලාගත්තේය. වෙහෙසින් සයින් හා පිපාසයෙන් පීඩිතව හුන් කෙල්ල කළුවරේ අත පත ගා සොයාගත් ඇඳකබලේ වැතිරී නින්දට වැටුණා ය. හරි හැටි මුහුණ කට දැක බලා ගන්නවත් ඉඩක් නොවූයෙන් කවරාකාරයේ හැඩරුවක් උසුලන්නේදැයි නොදන්නා තැනැත්තෙක් සමීපයෙහි පසුවන බවක් ඇගේ නිදිබර දෑසත් විඩාපත් සිතත් කයත් මුළුමනින්ම නොතකා හැරියේය.



නාඳුනන්නෙකු සමඟ නොදන්නා ඉසව්වක පාළු ගෙයක නිදි සුව ලබන්නට තමාට හැකිවනු ඇතැයි ඇය කිසි විටෙකත් නොසිතුවාය.

ගංජා මතින් අවසඟවූ තරුණයා ගොරොද්දේ අඳින හඬ පවා නොඇසෙන තරමට ඇගේ නින්ද දැඩි විය. ඔහුද නාඳුනන තරුණියක පියවර කීපයකට ඔබ්බෙහි මළාක් මෙන් නිදා සිටින බව නොතැකූ සෙයකි. එහෙත් ඇය සමඟ ඇඳ බෙදා ගන්නට නොසිතූ හෙතෙම තැන තැන කඩතොළු වූ සිමෙන්ති බිම වැතිර දෑත දෙපා දිග හැරගත්තේය. මේ අරුණෝදයේද ඔහු එකී ඉරියව්වෙන්ම පසුවනවා නොඅනුමානය.

මන්දයත් ඇය අවදිවූ සැණින් දෙපා තැබුවේ ඔහුගේ ළයමඬල මතය. තමා ඇවිද යන්නට තැත් කළේ මනුස්ස ශරීරයක් මතින් බව වැටහුණු කෙනෙහි ඇය මහා හඬින් කෑගැසුවාය. ඒ උච්ච ස්වරය සමත් වූයේ ඔහුගේ ඇසිපිය සලිත කරවන්නට පමණි. අඩක් ඇරුණු ඇස් ඇය දැක ගන්නට අපොහොසත්ව යළිත් පියැවිණ. ඇය ඇඳ පාමුලට රූටා ඔහු නොපෑගෙන ලෙසින් කාමරයෙන් පිටව යාමට වගබලාගත්තාය.

අපවිත්‍ර හා අප්‍රසන්න ගෙයින් පිටතද ඇය සුබ දසුනකට කියා දුටුවේ තොරතෝංචියක් නැතිව නදදෙන කුරුල්ලන් පමණි. අනෙක් අතට සොඳුරු දසුනකට වඩා ඇයට මේ මොහොතේ උවමනා කරන්නේ කුසට ආහාරයකි. උදරය පමණක් නොවේ හිසද දැවෙන්නාක් බඳුය. ක්ලාන්ත ගතිය නොතකා තමා කුස්සිය කරා යා යුතු බව ඇය සිතුවාය. එහෙත් මෙවන් ගෘහයක මුළුතැන්ගෙයි තතු දැන කියා ගන්නට එහි කරක් ගැසිය යුතු නැත. එසේ වුවද ආහාරයට ගත හැකි මොනවා හෝ යමක් කොතනක හෝ ඇතැයි විශ්වාසයෙන් ඇය ඒ වෙත දෙපා ඇද්දූවාය.

සිහිලැල්ව ගිය ළිප ඇගේ බලාපොරොත්තු සුන් කරයි... පෝරණුව යට දර කැබලි කීපයක් හා හතස්සක් දැවෙන දවසක් නොදැන නොමනාපයෙන් පසුවන සෙයකි.

මේස කබල මත නොසේදූ පිඟානෙන් පිළිණු ගඳක් හෝ වහනය නොවිණි. ඒ මත වූ ඉඳුල් වියළී යන තරමට පැරණි විය.

Scanned with CamScanner

අඳුරු අපිරිසිදු කුස්සිය සිසාරා බැල්මක් හෙළූ යුවතිය හුල්ලා වැටුණාය. අධික කුසගින්න තව දුරටත් ඉවසාගත නොහැක්කෙන් "මට බඩගිනියි" යි මුර ගාන්නට පවා ඇයට සිතිණි. කුසගින්නේ තරම ඇය කුඩා දැරියකව සිටියදී පවා දැන හඳුනාගෙන සිටියා ය.

"මට බඩගිනියි..." යි කෝපයෙන් බෙරිහන් දෙන්නට ඇය පුරුදුව සිටියාය.

"යකෝ.... මෙකිට ඩිංගක් බඩ රත්වෙන්න බැහේ... හත් අවුරුද්දකින් බත් ඇටයක් දැක්කේ නෑ වගේනේ මෙතන කෑගහන්නේ..." යි අප්‍රසාදයෙන් මුව ඇද කිරීමෙන් නොනැවතී රිදෙන්නට ටොක්කක් අනින්නට පවා චාන්දනී මැළි නොවූවාය. එකල්හී කෑදර කෙල්ලට වඩා රිදෙන්නේ සීතාටය.

"අනින්නෑ කෙල්ලට ටොකු.... තලනවා මං උඹේ ඇඟිලි ටික..." යි තර්ජනය කරන ඇය කෙල්ලට කන්නට යමක් දෙන්නට තරම් කාරුණික වෙයි.

"අනේ සීතම්මේ මට බඩගිනියි. සීතම්මේ මට බඩගිනියි. සීතම්මා හිටියනං මට කන්ඩ දෙයක් කොහොම හරි දෙනවනේ..."

දෙපා වාරු නැතිව ගියෙන් ඇය මැටි ගෙබිම හිඳගත්තාය. දැනටමත් කිළුටුවී තිබෙන ඇඳුමේ කවරාකාරයේ කැතක් කුණක් තැවරෙනු ඇත්දැයි ඇය නොතැකුවාය.

"ඔයා නං කොටට ඇන්දට කමක් නෑ ආශා... ඔයාගේ කකුල් ලස්සනයිනෙ..." යි යෙහෙළියකගේ වර්ණනාවට ලක් වූ හැඩැති දෙපා තවදුරටත් ඇගේ සිරුර උසුලාගෙන ඉන්නට අපොහොසත් වූ හැඩය.

දර කැබලි හා හනස්සට ඔබ්බෙහි පොල්ගෙඩිය දකින්නට ආශාට නැති වූයේ හිඳගැනීමෙන් පසුවය. දිව්‍යලෝකයේ වෙසෙන බවට කිසිත් සැකයක් නැති සීතම්මා තමාට පිහිට වූ බව සිහි කළ කෙල්ල පොල්ගෙඩිය දැතින් ගත්තාය. ඒ සඳහා අපිරිසිදු බිම බඩගාන්නට සිදුවීම පිළිබඳව බිඳකුදු නොසිතුවාය.



පමසක වූ මිරිස් ගලේ ගසා පොල්ගෙඩිය බිඳගත් ඇය සුදෝ සුදු පොල් බෑයක් මුවට ළං කළාය.

"බඩගිනිද?"

ඒ රළු පරළු හඬින් ඇය තැති නොගත්තාය. පෙරදා මුහුණ දුන් භයංකාර සිදුවීම සමඟ සසඳා බලන කල තෙල් බේරෙන මුහුණින් හා අවුල්ව ගිය හිසින් බලා ඉන්නා තරුණයා වෙත බියපත් වීමට කරුණක් ඇතැයි ඇයට නොහැඟිණ.

"හිස්බඩ පොල් කාලා වමනෙ යයි. මම කන්ඩ මොනව හරි ඇරං එන්නං හන්දිය පැත්තේ ගිහිල්ලා..."

ඇය නිහඬව පොල්බෑය උලා කෑවාය. පසුව ලැබෙන ආහාරයක් පිළිබඳව විශ්වාසයක් නොවූයෙන් අතට පත් ආහාරය ඉවත ලන්නට ඇය කැමති නොවූවාය.

රිලවියක් නොළසේනම් වැද්දියක මෙන් පොල්බෑය උලා කන කෙල්ල දෙස බලා හිඳීමෙන් විඩාපත්වූවාක් මෙන් ඔහු ආපසු හැරුණේය.

"පොඩ්ඩක් ඉන්නවා... මං ඉක්මනට මොනව හරි ඇරං එන්නං...."

ඔහුගේ ගැඹුරු හඬ ඇය සොයා ආවේය. එහෙත් ඇය ඔහුට අවනත නොවූවා ය. ඒ හිතුවක්කාරකමේ ප්‍රතිඵලය අත් විඳින්නට ඇයට වැඩි වේලාවක් ගත නොවීය.

නොසේදූ මුහුණ හිස් ආවරණයෙන් වසාගනිමින් කඩයට ගිය තරුණයා ආපසු එනවිට ඇය ඔක්කාරය කරමින් සිටියා ය.

බිම ඇද වැටෙමින් හෝ පිළිකන්නට යාමට සමත් වූයෙන් කුස්සිය තවත් අපවිත්‍ර වීමෙන් වැලකිණ.

"මම කිව්වා නේද....?" යි ඔහු කෝපයෙන් ඇසුවේ ඇය දැතින් උදරය මිරිකාගනිමින් "බඩ රිදෙනවා... බඩ රිදෙනවා" යි කෑ ගසන බැවිනි.

"කොච්චර බඩගිනි වුණත් කව්ද හිස්බඩ පොල් කන්නේ?"

Scanned with CamScanner

ඇය ඔහු දෙස හැරී නොබලාම දෑතින් උදරය මිරිකා ගනිමින් දෙකට තුනට නැමුණාය. තව තවත් වමනය කළාය.

ඔහු වතුර කෝප්පයක් දිගු කළ සැණින් අතකින් පහරක් ගැසුවාය.

"කට හෝදාගන්නවා..." යි ඔහු අණකළේ තවත් වතුර කෝප්පයක් ගෙන එමිණි.

ඇය මෙවර එය ගත්තේ කට සෝදාගැනීම සඳහා පමණක් නොවේ. දරාගත නොහැකි පිපාසයකින් ද පෙළෙමිනි.

"ඇති ඇති.... වතුර ගොඩක් බොන්න එපා... ආයෙත් වමනෙ යයි..." යි ඔහු අනතුරු ඇඟෙව්වේය.

වතුර කෝප්පයෙන් අඩක් හිස්කළ කෙල්ල යළි වමනය කරන්නට පටන් ගත්තා ය.

"මං කිව්වා නේද...?"

තවත් බැන වදින්නට උවමනා වුවද ඇය ඇද වැටෙන්නට ගියෙන් ඔහු දෑත දිගු කළේය. සිය දෑත මත ඇය සිහිසුන් වූ කල ඔහු වික්ෂිප්ත විය.

"ඒයි.... ඒයි..." යි ඔහු හඬගෑවේ ඇය ඇමතිය හැකි නමක් නොදත් බැවිනි. ඇගේ නම අසා දැනගන්නට තරම් ඉසිඹුවක් පෙර දිනයේ ඔහුට නොලැබිණි.

"යං... යං...." යි ඇය පිම්මේ දිවවිත් ඔහුගේ යතුරුපැදියේ නැගුණ කල ඇයට අවනත වූවා විනා කිසිදු ප්‍රශ්නයකට ඉඩක් නොලැබිණි.

"මො... මොකද මේ...? කව්ද මේ....? මොකක්ද වුණේ...? යි ප්‍රශ්න වැලක් මුවඟ නැගුණද "යමං යකෝ," යි ඇය බෙරිහන් දුන්නෙන් ඔහු සිය අබලන් වාහනයට වධ දුන්නේය. නිසි සත්කාරයක් නොලබනා යතුරු පැදිය අතරමඟ ඇණහිටීමකින් තොරව ගමනාන්තයට ළඟාවීම ආශ්චර්යයක්ම විය. එහෙත් ඇය යතුරු පැදියෙන් බසින්නට නොසිතුවාය.

"බහිනවා..." යි ඔහු නොරුස්නා හඬින් අණ කළේය.



"එච්චර දුරක් ආවේ නැතේ..."

ඔහු සිත නොරිස්සුමට හා නොඉවසිල්ලට කුහුල මුසු විය.

"කොච්චර දුරක්ද තමුසෙට යන්ඩෝනෑ...."

ඒ හඬේ සෝප්‍රහාසය නොතැකූ තරුණිය "අනේ යං... ඉක්මණට යං..." යි ආයාචනා කළාය.

"කොහෙද...? කොහේටද යන්ඩෝනෑ..."

ඔහු පෙරට වඩා උස් හඬින් ඇසුවේය.

"ම්... මං දන්නෑ..."

එය අන්ත අසරණ වූ එකියකගේ අභ්‍යන්තරික විලාපයක් වැනිය. ඇගේ රුව දැක බලා ගැන්මට උවමනා වූයෙන් ඔහු යතුරුපැදියෙන් බසින්නට තැත් කළේය. එහෙත් ඇගේ දෑත ඔහුගේ බඳ වටා එතී තිබුණේ යදමක් පරිද්දෙනි.

"මොන මඟුලක්ද මේ...? අතාරිනවා මාව... මට බහින්ඩෝනෑ..."

කටට ආ කුණුහරුපය ගිලගත් හෙතෙම ඇගේ ග්‍රහණයෙන් ගැලවෙන්නට වෑයම් කළේය.

"එපා... බහින්ඩෙපා... අපි යං... අනේ යං..."

තමාගේ කෙසඟ කය තරයේ බදාගත් ඇය උමතුවෙන් විය යුතුමය යන සිතිවිල්ලෙන් ඔහුගේ කෝපය මඳක් වියැකිණ. උන්මන්තක එකියක සමඟ ක්‍රියා කළයුත්තේ කෙලෙසදැයි සිතා බලන්නාක් මෙන් ඔහු මඳක් නිහඬව පසු විය. ඒ අල්ප වූ කාලය තුළ සිය සගයා සිහියට නැගුණෙන් ඔහු "අඩේ" යි කෑ ගෑවේ ය.

කිලෝමීටරයකට නොඅඩු දුරකින් පිහිටි කුඩා කඩයකින් පිටතට ආ තරුණයෙක්ද සිය මිතුරා සහ යතුරුපැදිය දක්නට නොලැබීමෙන් පුදුමයට පත් විය.

"සඳුන් අයියා?"

සිගරැට්ටු දෙකක් මිලට ගෙන එන්නට ගත වූ මොහොතක කාලය තුළ මිතුරා අතුරුදහන් වීම පිළිබඳව ඔහු කොතෙක් මවිත

වී දැයි කිවහොත් දුරකතනයේ පිහිට පතන්නට පවා කල්පනා නොවීය.

නාඳුනනා තරුණියකගේ ග්‍රහණය කෝපයෙන් ඉවසූ තරුණයාට සරදම් කරන්නාක් මෙන් දුරකතනය හඬ නැගුවේය.

"ලකියා..." යි මුමුණමින් ඔහු කලිසම් සාක්කුවට අතක් යැව්වේය. එහෙත් කිටි කිටියේ බදාගත් එකියක හේතු කොටගෙන ඔහු සිය දුරකතනය ස්පර්ශ කරන්නට හෝ අපොහොසත් විය.

"මාව අතාරිනවා ඕයි..." ඇගේ දෑත පසෙකට කරමින් ඔහු මහ හඬින් කෑගැසුවේය. ඒ සමගම ඔහු නැගී සිටි බැවින් තවදුරටත් සමබරතාවය රැකගත නුහුණු යතුරුපැදිය මත වෙව්ලාගිය ස්ත්‍රී ශරීරය බිම ඇද වැටිණ. අවසන් මොහොත් දී යතුරු පැදිය ඇය මත පතිත වීමේ අනතුර වලක්වාගන්නට ඔහු සමත් විය.

"තමුසෙට පිස්සුද..."

ඔහු කෑ ගසා ඇසුවේ උසුලාගත නොහෙන කෝපයෙනි.

කොන්ත්‍රාත් පදනම යටතේ ඉදිකිරීම් කටයුත්තක නිරතව සිටියද අද දවස කුටුම්භයක බර උසුලන්නන්හට පරිත්‍යාග කිරීමට තරම් සඳුන් සහ ලක්මාල් නිර්ලෝභී වූහ.

"දරු පවුල්කාරයෝනේ. නිමල් අයියලා වැඩට යන්ඩ... යි පළමුව කියා සිටියේ සඳුන්ය.

"ඒක නේන්නං අද එන්ඩ කිව්වේ හතර දෙනෙකුටනේ...."

ජීවන බර කැටයම් කළ අඟපසඟ සහිතව වුව නිමල් සිය සගයන් දෙදෙනා පිළිබඳව කණස්සල්ලෙන් නිකට කැසුවේය.

"හරි හරි.... මායි ලකියයි පැට්ටෙක් ඔතාගෙන පොඩි පන් එකක් දාන්නං... නිමල් අයියලා යන්ඩ..."

තවම පාසල් යා යුතු වයසේ පසුවන ලක්මාල්ද සිනාමුසු මුහුණින් සිය අනුමැතිය පළකර සිටියේය.

"අඹුදරුවො නැතුවට උඹලත් ඉතිං ගෙවල්වලට කීය කීය හරි දෙන්ඩෙපයි..... අම්මා අප්පා ඇතිනෙ උඹලා සල්ලි එවනකල් බලාගෙන"



සය දෙනෙකුගෙන් සමන්විත මෙ කුඩා කණ්ඩායමේ නායකයාද වයසින් වැඩි තැනැත්තාද වන්නේ නිමල් ය. ඔහු සිය ගමෙන් කැටිව ආ තිදෙනාගේ මිසක අතරමග එක්වූ තරුණයන් දෙදෙනා පිළිබඳව විස්තර නොදැනී. ලක්මාල්ගේ ලාබාල පෙනුමත් සඳුන්ගේ කාරුණික දෙඇසත් වංහුං දැන කියා ගැනීමේ පිපාසයට දිය දෝතක්ම විය.

"අවුලක් නෑ නිමල් අයියා... ආයෙත් වැඩක් අහුවෙයිනෙ...."

ගම, ගෙදර හෝ මව්පියන් පිළිබඳව කිසිවක් නොපවසන්නට පරිස්සම් වූ තරුණයන් දෙදෙනා දෙස දෙවරකට බැලූ නිමල් පිටව ගියේ ය.

නිවාඩු පාඩුවේ සුන්දර දවසක් අපේක්ෂා කළ තමා නාඳුනනා තරුණියක සමග කුමක් කරන්නේද යන වග කල්පනා වූයෙන් සඳුන්ගේ කෝපය හා නොරිස්සුම තිව්‍ර විය.

"තමුසේ පිස්සන් කොටුවෙන් පැනල එනවද?"

වෙර වෑයමෙන් උඩුකය කෙළින් කළ තරුණියගේ බියපත් දෑස යොමු වූයේ පාර අද්දර නවතාලූ ත්‍රීවීලරය වෙතය. ඉන් බට පුද්ගලයා දුටු කෙනෙහි ඇය නැගී සිටියාය.

"ඒයි ඒයී... ඔහොම ඉන්නවා..." යි හඬ ගාමින් දිව එන ආගන්තුකයා දකිත්ම සඳුන් යළිත් කෝපයෙන් නොව කුකුසින් දැවුණේය.

පියවි සිහිය දුරස් වී ඇති බවට සැකක් නැති තරුණියත් මෙ හැඩිදැඩි මිනිසාත් අතර සම්බන්ධය වටහාගත නුහුණු හෙතෙම විස්මිප්ත විය.

රුදුරු වන මෘගයෙකු අබියස අසරණ වූ මුවැත්තියක මෙන් වෙව්ලා ගිය තරුණිය නුදුරෙහි නිවස වෙත දිව්වාය.

"දුවන්ඩෙපා... දුවන්ඩෙපා..."

ගොරබිරම් ලෙස අණ කරමින් ආගන්තුකයා ඇය ලුහු බැන්දේය.

Scanned with CamScanner

කලඑළියක් නැති කුඩා නිවෙසේ දොර වසා තිබුණද අගුළුලා නොතිබිණ. වැඩපලේම තාවකාලිකව අටවාගත් මඩුව කම්කරුවන්ගේ ඉවුම් පිහුම් මෙන්ම රාත්‍රී නින්ද සඳහාද භාවිතා කිරීම සාමාන්‍ය පිළිවෙත විය. එහෙත් ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් වැඩ නිමවත්ම මිඳුල අලංකාර කර ගන්නට ඒ ධනවත් ව්‍යාපාරිකයාහට උවමනා වූයෙන් ඔවුන්ට කුලී නිවහනක් සොයා ගන්නට සිදු විය.

කිසිදු ගෘහ භාන්ඩයක් නොවුයෙන් නිවෙසට පිවිසි කෙනෙහි සඳුන්ට සිහිපත් වූයේ එකදු ඇටයක් හෝ නැති ගස් ලබු ගෙඩියකි. ගංගොඩේ ඉබේ වැවෙන ගස්ලබු ගෙඩිය තුළ ගිණිය නොහෙන තරම් ඇට දක්නට ලැබුණද වෙළඳපළේ ඇති නා නා නම්වලින් හැඳින්වෙන ගස්ලබු ගෙඩිවල ඇටයක් තිබෙන්නේ කලාතුරකිනි.

වැඩබිමට නුදුරින් කුලී ගෙයක් සොයාගත හැකි වීම පිළිබඳ කණ්ඩායම් නායකයා වූ නිමල් සතුටට පත්ව සිටියේය.

“උයාගන්ඩ කුස්සි කැල්ලයි... නාගන්ඩ ෂවර් එකයි. ටොයිලට් එකයි තියෙනවනං මදෑ.... මොකද ආයේ අපි නිවාඩුවක් ගත කරන්ඩ ආවැයි... මොකක් හරි වැඩක් කරලා ගතමනාවක් හොයාගන්ඩ ආවා මිසක...”

ඒ හැටි ප්‍රසාදයක් නැතත් ඔහුගේ ගෝල බාලයෝ නිහඬව පසු වූවා මිසක එරෙහිව හෝ පක්‍ෂව කිසිවක් නොපැවසූහ. එහෙත් මසක් ඉකුත් වන්නටද පෙර ඒ කුලී නිවහන වෙත දිව යන අමුත්තන් දෙස විමතියෙන් බලා හුන් තරුණයා එක්වරම එල්ල වූ ප්‍රහාරයෙන් අන්දමන්දව සිය දෙපා මත වැනුණේය.

“පර බල්ලා...” යි පරිභව කරමින් යළිත් ඔහු වෙත කඩා පැන්නේ තරුණිය හඹාගිය මිනිසා සමඟ පැමිණි අනෙකාය.

“මො... මොකද මේ?”

ඒ ප්‍රහාරය වලකාලමින් පසෙකට වූ සඳුන් උස් හඬින් ඇසුවේය.

“ඉස්සුවා නේද කෙල්ලව....? තෝ මරනවා මං අද....”



ගංජා දුමින් මත්ව සිහිනයක සැරිසරන්නට නොඉවසිලිමත්වූ තරුණයාට නාඳුනන තරුණියක හේතුකොට ගෙන නාඳුනන මැරයෙකුගෙන් පහර කන්නට සිදුව තිබේ. සැබැවින්ම තමාට ජය ගත නොහැකි මේ හදිසි සතුරා මැරයෙක්ද...? නොඑසේනම් අර තරුණියගේ සොහොයුරා... පෙම්වතා හෝ සැමියා ද...? ඇය හඹාගිය මිනිසා කව්රුන්ද? දෑස නිලංකාර වී ඇද වැටෙන්නට ආසන්න වන තෙක්ම සඳුන් ඒ ප්‍රශ්නවලට පිළිතුරු සෙව්වේය.

“අඩෝ....” යි මුරගාමින් තමා ගලවාගත්තේ හිතමිතුරු ලක්මාල් බව හැඳින ගත්තෙන් ඔහුට දැනුනේ මෙතෙකැයි කිව නොහැකි සහනයකි. බියපත්වී පලා යන බවට අනුමාන කළ හැකි තරමේ ලාබාල පෙනුමක් උසුලන ගැටවරයා තමා එල්ල කළ මුගුරු පහරින් බිම හොත් අමුත්තා දෙස බලා හුන්නේය.

“කවුද මූ....? ඇයි උඹට ගැහුවේ...?”

ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්නට නොවෙහෙසුනු සඳුන් ගෙතුළට දිව්වේය.

“සඳුන් අයියා” යි හඬගාමින් ලක්මාල් ද ඔහු පසුපස දිව ගියේ ය.

“එපා... එපා..”

ඒ උච්ච ස්වරය ඇගේ මුවින් පිටවූවක් බව දැන සිටියේ සඳුන් පමණි. ගෙතුළින් ඇසුණ ගැහැණු හඬින් විපිළිසර වූ ලක්මාල් මිතුරා දෙස බැලුවේය.

“උඹලා මොන මඟුලක් කර ගත්තත් කමක් නෑ... හැබැයි ගෑනු නං ගේන්ඩ බෑ. මෙතන්ට... අකුලගෙන යන්ඩ වෙයි ඕං මෙතන වාත කරගත්තොත්... උඹලා ඕන තැනක ගිහිල්ලා ඕනෑ මඟුලක් කරගනිල්ලා. හැබැයි මෙතෙන්ට එක්ක එන්ඩ බෑ...”

කණ්ඩායම් ප්‍රධානියාගේ නියෝගය කඩ කළ එකෙකු දෙන්නෙකු පිළිබඳව ලක්මාල් කෙසේ වෙතත් සඳුන් දැන සිටියේය. අසනීපයෙන් පසුවන බවට බොරු කියා නවාතැනේ නවතින අයෙකු කාමයේ වරදවා හැසිරුණ බවට බලගතු සාක්‍ෂයක් වූ උපත්පාලන කොපු දුටුවද කේලම් කියන්නට

නොගියේය. කලාතුරකින් දවසක ඔහු සිය සිත කය දවන තුරු ගිනි නිවා ගන්නට මුදල් වියදම් කළද කණ්ඩායමේ බාලයා වන ලක්මාල් එබඳු ගමනකට කැටිව නොයාමට වග බලා ගත්තේය.

“මාවත් මග ඇලා බඩු කැල්ලක් උස්සගෙන ආවද?”

ගැටවරයා ඇසුවේ හැබෑම විමතියෙනි.

“පිස්සුද බං...?”

කෝපයෙන් දෙවුර හකුළා ගත් සඳුන් රිදුම් දෙන සිරුර පිරික්සා බලන්නට නොවෙහෙසුණේය.

රෝහලින් පලා ආ බවට අනුමාන කළ හැකි තරුණිය කැටිව යන්නට උපකාර කළ යුතුද? නොඑසේනම් ඒ ප්‍රයත්නයට එරෙහි විය යුතුදැයි නිශ්චිතව තෝරා බේරා ගත නුහුණු තරුණයා පයක් පෙරට තැබුවේය.

“මොකක්ද වුණේ සඳුන් අයියා...?”

ලක්මාල් ඔහු පසුපස ගමන් කළේ කුකුසින් පෙළෙමිනි.

තරුණියගේ දිගුකෙස් වැටියෙන් අල්ලාගත් මිනිසා “පැනලා යන්ඩ නේද හැදුවේ...? පට්ට බැල්ලි” යි දෝෂාරෝපණය කළේ ය.

ඔහුගේ සවිමත් සුරතේ ග්‍රහණයෙන් රිඳුම් දෙන හිසින් ඇය නොනවත්වා විලාප දුන්නාය.

“අතැරපං... අතැරපං... මගේ කොණ්ඩෙ... ආයි රිදෙනවා... රිදෙනවා...”

සඳුන් මෙන්ම ලක්මාල්ද මහත් සේ ඇරුණු ඇසින් බලා සිටියහ.

“උඹ... උඹ... ගැන මං පස්සෙ බලා ගන්නං...”

නාඳුනන්නා සිහින් උස් තරුණයා දෙස එක එල්ලේ බැලුවේය.

“ඔය කෙල්ල අතාරිනවා”



සඳුන් අණ කළේ කෝපයෙන් සැලෙන හඬිනි.

“නිකං පලයං බං යන්ඩ වැඩක් බලාගෙන...” යි අවඥාවෙන් මුව ඇද කළ මිනිසා බෙරිහන් දෙන තරුණිය ඇදගෙන ත්‍රීවිලරය වෙත ගියේය.

“පස්සේ බලාගමු හරිද...?” යි තර්ජනය කරමින් එය පණ ගන්වා ගත්තේ මොහොතකට පෙර මිදුල මධ්‍යයේ හතරගාතේ වැටී හුන් තරුණයාය.

වියරුවෙන් මෙන් දඟලන තරුණිය ත්‍රීවිලරයට නංවාගැනීම පහසු කටයුත්තක් නොවීය. ඇය ඔහුගේ මුහුණ සූරා ඇමුවේ කුපිත වූ දිවි දෙනක මෙන් ගොරවමිනි.

“බැල්ලි... යි නිග්‍රහ කරමින් ඔහු ඇයට පහර දුන්නේය.

“කොහෙද ඔය යන්නේ?” යි ලක්මාල් හඬ ගා ඇසුවේ මහත් නොඉවසිල්ලෙන් යතුරු පැදිය පණ ගන්වා ගන්නා මිතුරා වෙත ළංවෙමිනි. ඔහුට උත්තර දෙනවා තබා හැරී බලන්නටවත් උත්සුක නොවූ තරුණයා පිටව ගියේ ය.

“ඒයි... ඒයි... සඳුන් අයියා ඔහොම හිටපං.... කොහෙද යන්නේ කියහං”

කිසිසේත් බලාපොරොත්තු නොවූ ඒ ක්‍රියාවෙන් අන්දමන්ද වූ ගැටවරයා පාර දිගේ මඳක් දුර දිව්වේය.

කෝපාවිෂ්ට මිනිසාගේ ග්‍රහණයෙන් ගැලවගත් තරුණියද පාර දිගේ දිව ගියේ පටාචාරාව මෙන් හඬා වැළපෙමිනි.

“නඟින්ඩ... නඟින්ඩ”

සඳුන් ඇය යතුරුපැදියට නංවාගන්නා අයුරු දුටු ලක්මාල් විමතියෙන් උතුරා ගියේය.

“යකෝ... මාර වැඩක්නෙ...”

යතුරුපැදිය ලුහුබඳින ත්‍රීවිලරය දෙස ඔහු හැකිතාක් විවර කරගත් ඇසින් බලා සිටියේය. කුමක් කළ යුතුදැයි නිනව් නොවූයෙන් ඔහු අතකින් හිස බදා ගත්තේය. තමා පාර මැද

Scanned with CamScanner

නළියන බව ඔහු වටහාගත්තේ තොරතෝංචියක් නැතිව, හැ දෙන නළා හඬිනි.

හඹා එන ත්‍රීවිලරය මඟ හැර පලා යෑම සඳුන්ට ඒ හැටි දුෂ්කර කාරියක් නොවීය. එහෙත් යතුරුපැදියේ ඉන්ධන හමාර වීම හේතුකොටගෙන ඔහු බලවත් ලෙස කැළඹුණේය.

නවාතැන්පල තුළ මුදල් තබා යෑම සුරක්ෂිත නොවූ නිසාම නිරතුරුව පසුම්බිය කලිසම් සාක්කුව තුළ වූයෙන් මුහුණ දුන් ගැටළුවට නොපමාව විසඳුමක් ලැබිණි.

එපරිද්දෙන්ම ඔහු මේ උදෑසන අපවිත්‍ර ඇඳමත වැතිර හුන් තරුණිය ඇසිපිය සලන අයුරු දැක සැනසුම් සුසුමක් හෙලුවේය. අළුත උපන් බිළිඳුගේ පළමු හැඬුමින් අස්වැසෙන කුළුදුල් මවක මෙත් ඔහු ඇය වෙත නැඹුරු විය.

# 2

වැන්දඹුවකගේ ශෝකය ඇය අඩපණ කර දමන්නට තරම් බලවත් නොවී ය.

"ඒ ඉතිං ඒ මනුස්සයා ඇරං ආපු ආවිස තමා..." යි හිතහදාගන්නට ඇය පුරුදුව සිටියාය.

"කරුමේ කරුමේ... වෙන මොකවත් නෙමේ කරුමේ..."

ඇගේ සැමියා අඩි හතලිහකට නොඅඩු පොල් ගසින් ඇද වැටුණේ පෙර කර්මය පළ දීමෙන් බව ඇය එක හෙළා විශ්වාස කළාය.

"උයන්ඩ මේ ලෝකේ දෙයක් නෑ... කොස් ගෙඩියක් තම්බාගන්ඩ තිබ්බා... අවාරේ විච්චි කොට මඤ්ඤොක්කා අලයක් ගලෝගන්ඩ බැලුවා... කොහෙද තව අල බැහැලා නෑ..."

තේ කහට කෝප්පයෙන් කුස රවටාගත් සැමියා පිටව යන අයුරු දැක දැක ඇය ඔහේ කියවාගෙන ගියාය. කොහොමටත් ඇයට හූ මිටි දෙන්නෙකු උවමනා නැත.

වත්තක පොල් කඩා මද්දහනේ ගෙදර එන මිනිසා ගෙන එන බඩු මල්ල පිළිබඳව සිහින මවමින් ඇය කල් මැරුවාය. ගේ දොර මිදුල ඇමදීමෙන් පසුව කළ යුතු වැඩක් පලක් නොවූයෙන් ඇය කාලයක් මුළුල්ලේ එක්රැස් කළ පුළුන් පුරවා කොට්ට දෙක තුනක් සකස් කළාය.

Scanned with CamScanner

"කෙල්ල ආසයිනේ.... හා පැටියෙකුත් මහනවා...."

ඇය දියණිය වෙනුවෙන් වෙන් කළ කොට්ටය හැඩ කළාය. එහෙත් පාසල් ඇරී ගෙදර ආ දැරිය දුටුවේ ඒ හා පැටියා නොව හිස අත් බදාගෙන වැළපෙන අම්මාය. බඩුමල්ල වෙනුවට සීතාට බාර ගන්නට සිදුවූයේ සිය සැමියාගේ මෘත දේහයයි.

"ඉගෙන ගනිං... ඉන්න තැනක ඉඳලා ඒ මනුස්සයා සන්තෝසෙ පැලෙයි. උඹ ඉස්කෝලෙ නෝනෙක් වෙච්චදාට..."

ඇය මන්තරයක් මතුරන කට්ටඩියෙකු මෙන් ඒ එකම කතාව නැවත නැවත පැවසුවාය. එහෙත් අම්මාගේත් දෝණියැන්දෑගේත් සියළු සිහින සුනු විසුණුකරන්නට එක් තරුණයෙකුගේ අනුරාගය සමත් විය. ඔහු වත් පොහොසත්කම් ඇති එකෙකු නොවී නම් චාන්දනී ඔහුටම විවාහ කර දෙන්නට සීතා හැම වෑයමක්ම දරනවා නිසැකය.

"අපි දැං මොකද කරන්නේ...? මං පොළේ ගිය ටිකට ඒකා ගෙට පැනලා උඹට හදි කෙරුවා කියලා ඒකාට මොනම විනම්බෑසියක්වත් සිද්ද වෙලා නෑනේ.... ඌට හරිගියා... ඌ රටෙනුත් පිටමං කෙරුවා උගේ අප්පගේ සල්ලි බලේට. දැං ඉතිං උඹට මොකද වෙන්නේ? මං අහන්නෙ උඹට මොකද වෙන්නේ?"

ඇය තවමත් තුෂ්නිම්භූතව බලාගත් අත බලා ඉන්නා දියණියට බැන අඩ ගැසූවාය. ඇතැම් විට පහර දුන්නා ය.

"මං එපා කියද්දි... මං වැඳ වැටෙද්දි ඒකා මට කරදර කෙරුවෙ.... ඇයි ඉතිං මට බැරි මේක නැති කරන්ඩ....?"

අවිවාහක ගැබිණිය කෑගසා ඇසුවා ය. එහෙත් ඇය සාපරාධී දූෂණයක නියත ඵලය ගර්භාෂයෙහි උසුලාගෙන පුරා නව මසක් පෝෂණය කළ යුතු වූවාය.

"හරි නං ඉස්පිරිතාලෙං මේක නැති කරන්ඩ එපැයි..."

නව යව්වනයෙහී දරු ගැබක් උසුලා සිටින්නට බල කළා වූ චාන්දනී රෝහලට ද පොලීසියටද දෝෂරෝපණය කළාය.

කුස කලලය හැඳින්වීම සඳහා ඇය භාවිතා කළේ මේක යන නාමයයි. ප්‍රාණය සහිත යමක් තමා තුළ සෙමින් වැඩෙන



බව ඇය විශ්වාස නොකළ සෙයකි. දියණියද නූපන් බිළිඳා ද රැක ගන්නට බෙහෙවින් වෙහෙසුණේ සීතා පමණි.

"පරාණයක් විච්චි... හිතන්ඩවත් එපා නපුරක්... ගිය ආත්මෙ පව් කරපු හින්දා නේන්නං මේ ආත්මෙ මෙයාකාර දුක් විඳින්නේ... මේ ආත්මෙත් පව් කරලා ලබන ආත්මෙ මොකක් වෙයිද අප්පේ...?"

පෙර හෝ පසු ආත්ම පිළිබඳව සිතන්නට නොවෙහෙසුණු චාන්දනී කළලයට ඊට වගකිවයුත්තාට පමණක් නොව මුළු මහත් සමාජයටම ද්වේෂ කළාය.

දියණියට නමක් තබන්නට පවා ඇය ඉදිරිපත් නොවූවාය. ඒ සඳහා සීතාට උපකාර කළේ හෙදියකි.

මිනිබිරියට 'ආශා' යි අමතන්නට මිත්තණියට කිසි විටෙකත් හැකි වූයේ නැත. ඇය හැමදාමත් හඬ ගෑවේ "ආසා... ආසෝ..." යි යනුවෙනි.

නිරතුරුව තමා රිදවන්නට සැදී පැහැදී සිටින එකිය පිටමං වූ පසු ආශා සමනලියක නොඑසේනම් කිරිල්ලියක මෙන් නිදහසේ තටු සැලුවාය.

"ඒකි ඉතිං කවදා හරි කසාදයක් බඳින්ඩෙයැයි"

සීතා උපේක්ෂාවෙන් පැවසූවා විනා දැරියක සමඟ තනිවූ බවට මැසිවිලි නොනැඟුවාය. දියණිය සමඟ වරක් තනිවූ ඇයට මිණිබිරියගේ බර බරක් නොවීය.

"මේ අත් දෙකේ හයිය තියෙනකං උඹ බයවෙන්ඩෙපා ආසෝ..." යි ඇය කරගැට පිරුණ දෑත ඇසට ළං කොට වහසිබස් දෙඩුවාය.

"උඹේ අම්මාට වෙච්චි දේ උඹට වෙන්ඩ එපා කියලයි මං උදේ හවා දෙයියන්ගෙං ඉල්ලන්නේ..."

තමා වෙනුවෙන් හුල්ලා වැටෙන මැහැල්ල හෝ තමා හැර ගිය ගැහැනිය වෙනුවෙන් ආශා කරදර නොවූවාය.

"හැබෑටම ආසෝ උඹට උඹේ අම්මව මතක් වෙන්නෙම නැද්ද?"

මිණිබිරියගේ වියළි දෙනෙත පුදුමයෙන් නරඹන සීතා ප්‍රශ්න කරන්නේ හැබෑම කුහුලිනි.

"එයා මගේ අම්මා නෙමේ.."

"එහෙනං....? එහෙනං උඹේ අම්මා මේ නාකි මමද?"

දැරිය මිත්තණිය දෙස රවා බලන්නට මැළි නොවෙයි.

"ඒ මගේ අම්මානං මගේ තාත්තා කෝ?"

"තාත්තා..."

සීතා තනන්නේ බහ තෝරන ළදැරියක මෙනි.

"අප්පුහාමි මුදලාලිගේ පුතානේ.... මං දන්නවා..."

මැහැල්ලගේ දුර්වර්ණ දෙනෙත පුදුමයෙන් මහත් වෙයි. ඒ නොතකන දැරිය "ඒ මිනිහා රට ගිහිල්ලා ඇවිල්ලා කසාද බැඳලා දැං ළමයිනුත් ඉන්නවා..." යි කියන්නී ය.

"උඹ කොහොමද දන්නෙ?"

ගංගොඩේ කොයි කව්රුත් දන්නා රහස තමාටද රහසක් නොවන වග කියා පාන්නට නොගිය දැරිය අත වූ කෝප්පය විසි කළාය. හිටි හැටියේ පිඟාන කෝප්පය පමණක් නොව හැළි වළං පවා ඔසවා බිම අත හරිනා එකියගේ ඒ නොහික්මුණුකම ඉවසා විඳදරා ගත නුහුණුව මෙන් සීතා වැළපුණාය.

"අළුත්ම කෝප්පේ... මං පොළේ ගිහිල්ලා උඹටමයි ගෙනාවේ... විසික් කොරපු ලස්සන... ඔය අත් දෙක බට කෝටු වාගේ කැඩිලා යන්ඩෝනෑ.... මේ ගෙදෙට්ට බඩු මුට්ටු අහසිං වැටෙනවද බොණ්ඩියේ...? මේ නාකි ගෑනි නේද අනුන්ගේ කුලී මලී කොර කොර පිඟාන කෝප්පෙ වළඳ ගේන්ඩෝනෑ"

කඳුළු සලන මැහැල්ල වෙත යොමු වූ දෙනෙතෙහි අල්ප වූ පශ්චත්තාපයක් හෝ නොවූ අතර සිහින් දෙතොල මත කුරිරු ප්‍රීතියක සේයා නැඟී තිබිණ.



"සීතම්මේ... අනේ සීතම්මේ... මං ආයේ බඩු පොළොවෙ ගහන්නෑ... මං ආයෙ එහෙම කරන්නෑ සීතම්මේ.... ඇත්තමයි... සත්තමයි.... අඬන්ඩෙපා සීතම්මේ... අඬන්ඩෙපා..."

ඇබිත්තන් කුස්සියේ ලී බංකුව මත හිඳගෙන හුන් කුඩා දැරියට සපුරා වෙනස් වූ තරුණියක අඩ අඳුරු කාමරයක් තුළ ඉකි ගැසුවාය.

"ඒයි... ඒයි..."

තවමත් ඇගේ නම නොදන්නා තරුණයා ඇය අවදි කරවන්නට වෑයම් කළේය.

"මාත්තෙක්ක තරහා වෙන්ඩෙපා සීතම්මේ... අනේ තරහා නෑ කියන්ඩ... එක පාරක් කියන්ඩ සීතම්මේ... එකම එක පාරක්...."

ළය පාරන හඬින් ඇය අයැද්දාය. ඇගේ අඩවන් ඇස් ඇය නිද්‍රාවේද අවදියේද අතරමැද පසුවන වගක් හෙළි කළේය.

"මොකද මේ...? නැගිටිනවා... නැගිටිනවා..."

නමවත් නොදන්නා එකියක වෙනුවෙන් වෙහෙසීමෙන් කෝපයට පත් සඳුන් නොරිස්සුමෙන් අණ කළේය.

"මාව දාලා යන්ඩ එපා සීතම්මේ... මට සීතම්මා විතරයි හිටියේ... මට කව්රුවත් නෑ සීතම්මේ... කව්රුවත් නෑ,,,"

අඩ නින්දේ පසුවන බවට සැකක් නැති මේ නාඳුනන තරුණිය දවස මුළුල්ලේ මේ අයුරින් තන් දොඩවනු ඇතැයි සැකයෙන් මෙන් ඔහු "ඒයි... ඒයි.." යි පෙරට වඩා උස් හඬින් කෑ ගෑවේය. ඇගේ දෙවුරින් අල්ලා වැරෙන් සෙලෙව්වේය.

දියෙහි ගිලෙමින් සිටියදී ගලවාගත් එකියක නොවසිල්ලෙන් හා කෑදරකමින් හුස්මක් කටක් ගන්නාක් මෙන් දිගු හුස්මක් ඉහළට ඇද්ද තරුණිය උඩුකය කෙළින් කළාය.

"මොකද?"

ඔහු ඇසුවේ සුළුමවක මෙන් නොරිස්සුමිනි. දළුලන කෝපයෙනි. ඇය අයාගත් ඇසින් ඔහු දෙස බලාගත්වනම උන්නාය.

Scanned with CamScanner

"මොකද වෙලා තියෙන්නේ?"

අවුල් හිසකේද දිගැටි මුහුනේ සිහින් දෙනයනද බොඳවී, ඇය මෙලොව ඇළුම් කළ එකම පුද්ගලයාගේ රුව ඉස්මතු විය.

"අවාරෙට පොල් වැටෙන්නා වාගේ යලට මහට ඉස්කෝලේ ගිහිල්ලා කොහොමද විභාග පාස් කොරන්නේ?..."

ජීවිතයේ තවත් කඩඉමක් පැනගන්නට තමා අපොහොසත් වීම පිළිබඳව මුනිවත රැකි යුවතිය මඳ සුළගේ සලිත වන අතු ඉති මත රැඳුණ දෙනෙතින් පසුවූවාය.

සුජාත භාවය අහිමි දැරියකට පාසල ප්‍රියමනාප ස්ථානයක් නොවීය.

"ඉස්කෝලේ නෝනා කෙනෙක් වෙයං... ඉස්කෝලෙ නෝනා කෙනක් වෙයං..." යි සීතා කොතෙකුත් මැතිරූ මන්තරය ඇය කෙරෙහි බලපැවැත්වූයේ කෙටි කාලයකි.

කිසිදු වරදක් නොකළ තමාට එරෙහිව සිදුවන්නාවූ කුමන්ත්‍රණයක කොටස්කරුවන් වූ සිසු සිසුවියන් මව්පියන් හා ඇතැම් ගුරුවරුන්ද හේතු කොටගෙන ඇගේ අවිහිංසක හා නිර්මල බව මුළුමනින්ම අතුරුදහන් විය.. ගුරු වෘත්තිය කෙරෙහි ඇය තුළ වූ ලැදියාවද භක්තියද දිනෙන් දින සිඳී වියැකී ගියේය. ඇගේ අභ්‍යාස පොත අතින් ගන්නා කල ගුරුවරියකගේ මුහුනේ නැඟී පිළිකුළ අදහාගත නුහුණුව රහසේ වැගුරු කඳුළු ඇය අතහැර ගියේ කොතරම් ඉක්මණින්ද...?"

"ටීචර්... ආශා මගෙ මකනෙ කෑවා..."

ඇය පවනිගේ මකන කැබැල්ල කෑවේ කුසගින්න ඉවසාගත නුහුණුව නොවේ. ඇගේ මිත්තණිය කෙසේ හෝ ඇගේ බඩකට පුරවන්නට වෙහෙසුණාය.

"ටීචර්... ආශා මගේ ගම් බෝතලේ බිව්වා..."

ගම් බෝතලයක් පවා ඇගේ මුවින් නොගැලවිණ...

"දෙයියනේ... ඔය ළමයට මොකද වෙලා තියෙන්නේ...? පුදුම කරදරයක්නේ අපිට තියෙන්නේ." පංති භාර ගුරුතුමිය



මහත්සේ කැළඹුණද ආශා කිසිදු උපද්‍රවයකින් තොරව වඩාත් කඩිසරව වඩාත් නිරෝගීව හා තවත් කුරිරුව නැඟී සිටියාය.

"යස්සනී.... යස්සනී..."

ඇය ඒ ගර්හා කටයුතු විරුදාවලියට උරුම කීවේ පන්තියෙන් පන්තිය ඉහළ යන්නාහාමය. මකන කැබලි, ගම් බෝතල් කෑම බීම වෙනුවට ඇය තමා සමඟ කිසි විටෙකත් මිතුරු නොවූ මිතුරියන් සපා කෑවා ය. ඉඩ දෙන්නේ නම් ඇය ඔවුන් එකියක් නැර කෙස් රොදක් හෝ ඉතිරි නොවන පරිද්දෙන් සපා කන බව නිසැකය. ඒ සා ඇඩි ද්වේෂයක් කෝපයක් හා වෛරයක් ඇගේ ළපටි හෘදය පුරා ඉතිර පැතිර තිබිණ.

පෙරේතිය යස්සනියක බවට පත්වන්නට වැඩි කාලයක් ගතව නොගියේය.

"තාත්තෙක් නෑ... අම්මත් වෙන මිනිහෙක් එක්ක ගිහිල්ලා... කිරියම්මා විතරයි. ඉන්නේ... කොච්චර අහිංසක කමට කීකරුකමට ඉන්ඩෝනෑද ඔච්චර අසරණ වුණාම..."

පාසලේ පොදු මතය එය විය. එහෙත් ආශා කිසි විටෙකත් කරබාගෙන නොසිටියාය. තමා දෙස රවා බැලූ දෙනෙත පහුරු ගා සූරා දමන්නට ඇය පසුබට නොවූවාය. ටොක්කට හා කෙනිත්තීමකට ඇය ප්‍රතිචාර දැක්වූයේ බිහිසුණු ලෙස පහර දෙමිනි.

හැම සතියකටම වරක් දෙවරක් පාසලට යන්නට සීතාට සිදුවිය. මිණිබිරියට එරෙහිව එල්ලවන චෝදනා සියල්ලට සාවධානව සවන් දෙන ඇය කඳුළු පිසියි.

"කෙල්ලට අපල හරියට..."

ඇය පුන පුනා කීවේ ඒ එක වැකියයි.

"අපිට පව් නොදී ගෙදෙට්ට වෙලා ඉන්නවා... එනව මහ ලොකුවට ඉස්කෝලෙ... තව හරියට අකුරක් ලියාගන්ඩ බෑ..." යි ආශාගේ පොත විසි කරමින් තර්ජනය කරන්නට පවා ඇතැම් ගුරුවරියක අකාරුණික වූවාය. දිලිසෙන ඇසින් හා තරයේ වසාගත් දෙතොලින් බලා ඉන්නා දැරිය කිසියම් ශාපයකට ගොදුරු

වූ එකියක මෙනි. බියෙන් හැකිලෙනවා වෙනුවට ඇය තමාට එරෙහිවන සියල්ලට හා සියළු දෙනාට ළය පුරා ද්වේෂ කළාය. ඉඳහිට හෝ ඇයට කාරුණික වූ ඇය වටහාගන්නට වැයම් කරන්නා වූ ගුරුවරයෙකු පවා ඇගේ ද්වේෂයෙන් නොගැලවුණේ ය. විභාගය අසමත් වීම පිළිබඳව තොරතෝංචියක් නැතිව දෙස් දෙවොල් තබන මැහැල්ලට අතක් එසවිය නොහැකි බැවින් ඇය හෙමින් සීරුවේ නැගිට්ටාය. වළං සෝදමින් සිටි සීතා චිත්ත පටින් තවත් කඳුළක් පිස දැමුවා ය.

"ඔය කඩවල්වල දිලිසි දිලිසි තියෙන වයිවාරන කෑම බීම නැතුවට මං මොන මොනවා හරි තම්බලා උඹේ බඩ කට පිරෙව්වෙ නැද්ද ආසෝ.... අනෙක් නැම්බියන්ට වගේ උඹට විච්චූර්ණ ඇඳුං නෑ තමා. මට කොහෙංද එච්චර සල්ලියක්... මං උඹට අඳින්ඩ ගවුමක් මහලා දුන්නැද්ද වෙළේ ගෙදර එකී ලව්වා...? උඹෙං මං මේ ලෝකේ වැඩක් ගත්තද ආසෝ.... කට කැඩෙනකං මං කිව්වෙ උඹට පාඩං කරපං විභාග පාස් වෙයං කියලා නේද... ලෙඩක් දූකක් හැදුණත් දණ බඩ ගාගෙන ගිහිං හරි මං උඹට උයලා කන්ඩ දුන්නා නේද ආසෝ...."

ඒ හැවිල්ල පහසුනේ අසා සිටිය හැක්කේ කා හටද?

"ඇති ඇති..."යි කෑගෑ ආශා මැටි මුට්ටියක් ඇතින් ගත්තාය.

කවදාවත් නැතිව ඇය ගෙදර දොරේ වැඩට උදව් පදව් කරන්නට තරම් දයාන්විත වූ බවට වරදවා වටහාගත් සීතා

"නෑ ඕන්නෑ... මෙව්වා මං කොරගන්නං... උඹ ආයේ වංගියක් හොඳට පාඩං කරලා විභාගෙට ලියපං..." යි මෘදු හඬින් පැවසුවාය. එහෙත් ඊළඟ නිමේෂයේ යුවතිය අත වූ මුට්ටිය කැබලිවලට බිඳී යත්ම ඇය "දෙයි හාමුදුරුවනේ..."යි මුර ගෑවාය.

පළමුව මුට්ටියද දෙවනුව ඇතිළියද බිම ගැසූ ආශා "කට වහගෙන හිටපං... නැත්තං මං උඹත් උස්සලා පොළොවෙ ගහනවා" යි තර්ජනය කළාය.

"සීවරං දෙයියනේ"

මිණිබිරියගේ සාහසික වේශයෙන් තැතිගත් මැහැල්ල අතකින් මුව වසා ගත්තාය.



"කට අරින්නෑ කට ඇරියොත් බලපං මං උස්සලා පොළොවෙ ගහන්නැද්ද කියලා..."

අනෙක් අතද ඇගේ මුව තෙක් එසවිණ.

"මේකිට යකෙක් වැහිලා... යකෙක් වැහිලා..."

ඇතින් වසාගත් මුව හැරුණුකොට ඇගේ දිරාපත් සිරුරේ හැම අංගෝපාංගයක්ම එක්වරම එක්හඬින් මිමිණුවේ ඒ වැකියයි.

"ඈ... ඇයි මේ?"

තවමත් තමා නමක් ගමක් නොදන්නියගේ ඇස එක එල්ලේ තමා වෙත යොමුව තිබීම හේතුකොටගෙන අපහසුතාවයට පත් සඳුන් උස් හඬින් ප්‍රශ්න කළේය. ඇගේ තරුණ කය තමා සමීපයෙහි වුවද ඇගේ සිත බොහෝ දුර ඈතකට ගමන් කර තිබෙන බව වටහාගනිමින් ඔහු

"ඒයි... ඒයි..." යි කෑ ගැවේය.

ඒ උච්ච ස්වරයෙන් තිගැස්සුණද මේ උදෑසනට පැමිණෙනවා වෙනුවට ඒ සන්ධ්‍යාවේ ඒ කඩවසම් රුව මිස අනෙකක් නොදකින්නී. "කුමාර... අනේ කුමාර" යි සංවේගයෙන්ද අපමණ ස්නේහයෙන්ද කොඳුළාය.

Scanned with CamScanner

# 3

පිඳුරු පුරා පිපි හෙන්දිරික්කා මල් දුටු සැණින් සීතා නොසන්සුන් වූවාය.

"ගුරුන්නාන්සේ දැං එනවා ඇති. අනේ නිමලියෝ කෙල්ල කොණ්ඩෙවත් පීරලද දන්නෑ..."

උදව්වට පදව්වට ආ නිමලාවතී යුහුසුළු වූවාය.

"මං බලන්නං සීතම්මේ"

"ඒකිට මාව වහකදුරු වාගෙනෙ... මං මොනවා හරි කිව්ව හැටියෙ පටං ගයි මෙතන යමතෙ..."

සීතාගේ ස්වරයෙහි කණස්සල්ලක් තැවරී නොතිබිණ. මිණිබිරිය සමඟ දහසය වසරක් මුළුල්ලේ කරන්නාවූ අරගලයෙන් ඇය හෙම්බත්ව සිටියද ශෝකයට යට නො වූවාය.

"ඒකි යස්සනී වගේ තමා. අපේ චාන්දනියා ඕකි බඩේ තියාගෙන ඉන්න කල් දත්මිටි කෑවෙ නැද්ද...? උපන්නට පස්සෙත් ඉස්පිරිතාලෙ ඈලා එන්ඩනේ හැදුවෙ... කිරි ටික පොවා ගත්තෙත් මගෙ කටේ බලේට. ඉස්සෙල්ලම වැදූ මව් කරුණාවන්ත වෙන්ඩ එපැයි.... ගින්නෙන් තවත් ගින්නක් මිසක්කා වෙන මොනවා පහළ වෙන්ඩද..."

ඇය මිණිබිරියගේ නිර්දය හැසිරීම් පිළිබඳව කතා කළේ නිමලාවතී සමඟ පමණි. එයද ශෝකයෙන් හෝ කළකිරීමෙන් නොවේ.



"පුරුවේ කරුම විඳවන්ඩත් එපැයි. විඳවලා විඳවලා ඉවරයක් විච්චහාම ඊළඟ ආත්මේවත් දුකක් කරදයක් නැතුව ඉන්ඩ බැරියැයි..."

ඇය ඉත සිතින් ප්‍රර්ථනා කළේ ඊළඟ අත් භවයෙහි යෙහෙන් ජීවත්වීමටය. ඒ සඳහා මේ අත්භවයේ ඕනෑම දුක් ගැහැටක් ඉසිලීමට නොපැකිළුණය. සැබැවින්ම ඇය වැඩි වැඩියෙන් දුක්කම්කටොළු අපේක්ෂා කළාය. අතට හසුවන ඕනෑම දෙයක් පොළොවේ ගසමින් කලහ කරන මිණිබිරිය පිළිබඳව ඇය නොතැවුණේ එහෙයිනි.

"නමෝ විත්තියෙං දෙහි කපලා නූලක් කරලනවා. යන්තරේකුත් දාන්ඩ බැරියැයි ඒත් බැරිනං බලියක් අරිනවා... අපල අණවිණවලට බයවෙලා බෑ..... කරුණාරත්න ගුරුන්නාන්සේ ඉන්නකං මොකට බය වෙනවද"

හිස සලා එකඟවන්නට නිමලාවතී සමීපයෙහි නොසිටියාය. ඇය ඇඹිරි මුහුනේ ගිනි පුපුරු, ඇස් දිලෙන කෙල්ලගේ දිගු වරළස පීරමින් සිටියා ය.

"කොණ්ඩෙ දිග ගෑනු ළමයා" යි අන්වර්ථ නාමයක් පට බැඳෙන්නට තරම් දිගු කෙස් වැටියක් හිමිවීම පිළිබඳව ආශා උඩඟු නොවූවාය.

"බාබර්සාප්පුවලට පූජා කොරන්ඩ සල්ලි මං ළඟ ඇත්තෙ නෑ" යි හන්දියේ සැලූනයට දොස් පවරමින් සීතා මිණිබිරියගේ කෙස්සට ඕනෑ හැටියට වැවෙන්නට ඉඩ හැරියාය.

"අර තාත්තෙක් නැති ළමයා..."

ඉහල පන්තිවලට යත්ම දිගු වරළස වෙනුවට ඉස්මතු වූයේ ආශාගේ අවජාතක භාවයයි.

"තාත්තෙක් නැතිව ළමයෙක් ඉපදෙන්නෑනේ.."

ඒ කටොළු කතා කන වැකුණේ නම් දෙන්නට ඕනෑ තරම් උත්තරද කෙල්ල වෙත තිබිණ.

"කව්ද තාත්තා...?"

Scanned with CamScanner

ආශාගේ කුරිරුබව හමුවේ වූ පසුබා නොයන එකියද පෙරළා ප්‍රශ්න කළාය.

"ඒක ඉතිං කව්රුත් දන්නවනේ..."

"ඔච්චර දන්නවනං කියන එකනේ තියෙන්නෙ..."

"කියනවා තමයි... මොකද කියන්න බැරි... වසන්ත වසන්ත බණ්ඩාර... දැං හරිද...? දැං සනීපද?"

ආශාගේ අවඥාව කොතෙක් වීද කිව හොත් ප්‍රතිවාදිනිය තවත් අභියෝගයක් එල්ල කළාය. පරම සතුරු වූ කොලු කෙල්ලන් පවා මොහොතකට ගොළු වූහ.

ක්‍රීඩා උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත බණ්ඩාර ඕනෑවට වඩා පුම්බන ලද බැලූමක් මෙන් අසුන් අරා සිටියේය. ඉහින් කනින් වැහෙන සාඩම්බරය දියව වාෂ්පවූයේ නොසිතූ විරූ ලෙසිනි.

"තාත්තේ..." යි නොකී කෙල්ලක සහතික පත ලබාගන්නට පෙර දණින් වැටුණාය. තම තමාට හිමි ත්‍යාග හා සහතික පත් ලබාගන්නට පෙර වැඳ වැටීමට සියළු සිසු සිසුවියන් පුරුදු පුහුණු කර තිබිණ. අකුරු ඉලක්කම් අරබයා මුළුමනින්ම අසාර්ථක වූ ආශා ක්‍රීඩා පිටියේදී කෙළවරක් නැතිව දස්කම් පෑවාය.

"ආශා කමෝන් ... කමෝන්..." යි ඔල්වරසන් දෙමින් ඇය දිරිමත් කළ කිසිවෙකුට ඇය සුජාත නොවන වග සිහිපත් නොවීය. එහෙත් නිවාසාන්තර ක්‍රීඩා තරඟ හමාර වූ සැණින් කෙළි බිම කිරුළුපලන් රැජින නැවතත් වහලියක තරමට පහතට ඇද දමන්නේද ඔවුන් විසින්ම ය.

වහා උඩුකය කෙළින් කොට සහතික පත් ලබාගන්නවා වෙනුවට මීටර් සියය දෙසීයය ධාවන තරඟ ජයගත් ක්‍රීඩිකාව හඬගා කීවේ කව්රුත් දන්නා ගාථාවකි. හය හතර වැටහෙනදා පටන් කට පාඩම් කළ ඒ ගාථාව පියාට වඳින කල කිව යුතු ගාථාව බවද නොදත් අයෙක් නොවීය



"වුද්ධිකාරෝ අලිං ගිත්වා

චුම්බිත්වා පිය පුත්තකං

රාජමජ්ජං සූපතිට්ටං

පීතු පාදං නමාමි..."

ආශා සෙව්වන්දි ඒ ගාථාව කොතරම් උස් හා මිහිරි හඬින් ගැයුවේද කිවහොත් මහ පිරිසක් මධ්‍යයෙහි පැතිර ගියේ අදහාගත නොහැකි නිහඬතාවයකි.

අලංකාර වේදිකාව මධ්‍යයෙහි අසුන්ගෙන හුන් සම්භාවනීය අමුත්තන්ද විදුහල්පති ඇතුළු ගුරු මඩුල්ලද සැනෙකින් නැගී සිටියේ ජාතික ගීය වාදනය වන කලෙක මෙනි.

පොදු ජනතා සේවයට ඇප කැප වූ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ගෝලාකාර මුහුණේ පැහැය වහා වෙනස් විය. දිවි රැක ගැන්ම උදෙසා වර්ණය වෙනස් කරන කටුස්සෙකු මෙන් වර්ණ විපර්යාසයන්ට ලක්වෙමින් ඔහු ඔරවාගත් ඇසින් බලා සිටියේය. ඊළඟ නිමේෂයේදී සිය උරහිසක් මත පතිතවූ විදුහල්පති සුරත පසෙකට කළ හෙතෙම නැගී සිටි සිසුවිය දෙස නොබලා වේදිකාවෙන් බැස්සේය. මහත් උදරය සලිතකරවමින් විදුහල්පති ඔහු හඹා ගියේය ගිරවෙකු මෙන් දොඩමළු ව හුන් නිවේදකයාද ඉදිබුවෙකුටත් වඩා ගොළුව ගිය කල මහ පිරිසක් මධ්‍යයේ එක් දඩබ්බර කොළුවෙකු මේ අනපේක්ෂිත නිශ්ශබ්දතාවය නොරිස්සුවේ හූ හඬක් නැගුවේය. ඒ හා ම ඒ හූව සැණෙකින් බෝවිය. මොහොතකට පෙර වූ නිශ්ශබ්දතාවය මෙන්ම මේ මහා හූවද ඇයට, මේ දැන් සිය පියාගේ දෙපා නැමදි කෙල්ලට ආශ්වාදයක්ම වූ වග පෙණින. ඇය අර දිලිසෙන දෙනෙතින්ද ක්‍රෑර සිනා බිඳක් සඟවාගත් දෙතොලින්ද බලා සිටියාය. දළඟ මාරාන්තික විෂ පුරවාගත් සැපින්නකගේ ක්‍රෑරත්වයෙන් හිටි පිය හිටගෙන හිටියාය.

"ඉස්කෝලෙං අස්කරන්ඩමයි හැදුවෙ. මං වැඳලා වගේ ලොකු මහත්තයාගේ හිත වෙනස් කෙරුවෙ... සුමාන දෙකක්ම ඉස්කෝලෙ එවන්ඩ එපා කිව්වෙ... හැබැටම ආසෝ උඹට මොකා

වැහිල ද අර අසමජ්ජාතියාට දණ ගහල වැන්දේ...? ඉතිං වැන්දට කමක් නෑ කියමුකෝ... උඹ තාත්තට වඳින ගාථාවත් කිව්වලු නේද හයියෙංම...."

මැහැල්ල සැතපුම් දෙකක දුර පා ගමනින්ම යෑමෙන් ඒමෙන් විඩාපත්ව සිටියාය.

"ඉතිං ඒ මිනිහනේ මගේ තාත්තා...."

"එහෙම කියලා ඉස්ටේජ් එකේ උඹ අච්චර සෙනඟක් මැද්දේ මොන එහෙකටද ගාථාව කියල වඳින්ඩ ගියේ...?"

"නැත්තං ආයේ මං ඒ මිනිහගේ ගෙදර ගිහිල්ලා කියන්ඩැයි... ඇක්කා වැන්දා එච්චරයි..."යි නොසැලකිල්ලෙන් කී ආශා කොණ්ඩ කරල් ලිහන්නට පටන් ගත්තාය.

"මොකද්ද ඒ එක පාරට මතුවෙච්චි ආදර කැක්කුම...? ඒකටත් උත්තරයක් දියංකො උඹ මට..."

මිත්තණියට සත්‍යය හෙළිදරව් කළ යුතුයැයි කල්පනා කළ කෙල්ලගේ අතැඟිලි නිසළ විය.

"අම්මා ගැනවත් බැරි වෙලාවක කටක් නොහොල්ලන උඹ තාත්තා කියන අසමජ්ජාතියා ඇක්ක හැටියේ වැඳ වැටෙන්ඩ උඹට මොනවා දීලද ඒකා? අඩු ගානේ උප්පැන්නෙට නම දුන්නද....? ඉගෙනගන්ඩය කියලා පෑනක් පැන්සලක් පොතක් ඇරං දුන්නද....? කියපං බලන්ඩ මට...."

අර අන්තරායකාරී මඳහස මුව'ග ඇතිව ඇය ඒ ප්‍රශ්ණ වැලටම එක උත්තරයක් දුන්නාය

"පංතියේ කෙල්ලෙක් කිව්වා ඒ මිනිහා මගේ තාත්තා නං තාත්තේ කියල කතා කරන්ඩ කියලා"

සීතාගේ අතක් නිකට තෙක් එසැවිණ. ඇගේ ඇස මහත්සේ ඇරිණ. බුලත් විට සැපීමෙන් රත් පැහැ ගැනුණ දෙතොල ද විවර විය.

"ඒ හින්දද උඹ ඔය මහ සෙනඟක් මැද්දේ ඒ මිනිහට වැන්දෙ?"



"නෑ ඉතිං... සහතික ගද්දි හැම ළමයම වඳිනවා. මං ඉතිං තාත්තට වඳින ගාථාව කිව්වෙ ඒ මිනිහා මගේ තාත්තා හින්දනේ"

කෝපයෙන් කඩා පැනිය යුතුද නොඑසේනම් ශෝකයෙන් හඬා වැළපිය යුතුදැයි නිශ්චය කරගන්නට අපොහොසත්වූ මැහැල්ල බලා ගත් අත බලා සිටියාය. නපුර කැටිකරගත් සිය මිණිබිරියගේ හෙට දවස කෙබඳු විය හැකිදැයි සැකයෙන් භීතියෙන් හා ශෝකයෙන් ඇගේ හැත්තෑවසරක් පැරණි සිරුර වෙව්ලා ගියේය.

එපරිද්දෙන්ම නව යෞවන දේහයක් සැලී ගියේ යකැදුරාගේ සහායට පැමිණි තරුණයා දැකීමෙනි. දෙහි කැපිල්ලට එරෙහිව අරගල කරන්නට ආශා නොපෙළඹුනේ මෙවන් කඩවසම් ගෝලයෙකු යකැදුරා සමඟ පැමිණෙනු ඇතැයි බලාපොරොත්තු වූ නිසා නොවේ. මිත්තණිය සමඟ ජල්ලි අල්ලනවාට වඩා බලවත් තෙදවත් යකැදුරෙකු සමඟ පැටලෙන්නට ඇය නිහඬව සැලසුම් කළාය. ඒ සියළු සැලසුම් බිඳ වැටුණේ ගෝලයාගේ සිහින් දෙනයන තියුණු බැල්ම හේතු කොටගෙනය. ඔහු පවා මෙවන් පියකරු ආතුරයෙක් අපේක්ෂා නොකළේය. පැදුර මත හිඳගෙන සුදු රෙදි කඩක් ඉහේ සිට පොරවා ගෙන සිටියද ඇගේ ගිනි පුපුරු ඇසත් පිරුණ දෙතොලත් හැඩකාර ශරීරයක් පිළිබඳව ඔහුට ඔත්තු සැපයුවේය. සැබැවින්ම කිවහොත් කරුණාරත්න ගුරුන්නාන්සේ සමඟ අනේක වාරයක් මෙවන් ගමන් ගියද ඔහු මින් පෙර මේ අයුරින් නොකැළඹුනේය.

දෙහි කැපිල්ලකදී ගෝලයෙකු උවමනා නොවෙතත් කරුණාරත්න ගුරුන්නාන්සේ සිය ඥාති පුත්‍රයා කැටිව ඒමට ප්‍රිය කරයි. ඒ කාරණා දෙකක් එකවර ඉෂ්ට සිද්ධවන බැවිනි. කට පුරා හොඳයයි කිව හැකි ගෝලයෙකු තැනීමත් ප්‍රවාහන පහසුකමත් ඒ කාරණා දෙකයි...

"බයවෙන්ඩ කාරියක් නෑ.... හත් දවසක් යනකං පුළුටු බැඳුං බෑ..."

මන්තර මැතිරිල්ලද දෙහි කැපිල්ලද තුල කරලෑමද ඉවසා සිටින්නට ආතුරයාට බල කළේ නිහඬ සන්සුන් ගෝලයා බව කරුණාරත්න ගුරුන්නාන්සේ කිසිසේත් අනුමාන නොකළේ ය.

Scanned with CamScanner

"යන්තරේකුත් දාමු කෝකටත්, මං කලමනා කුමාර අතේ දන්නලා එවන්නං. සල්ලි ලෑස්ති කරගන්න එකයි ඇත්තේ උපාසකම්මේ..."

ගින්නෙහි ලූ පරඬලා පතක් මෙන් හැකිළී ගිය සීතා "ස.... සල්ලි හුඟක් ඕනාද ගුරුන්නාන්සේ?" යි ඇසුවේ බිඳුන හඬිනි.

පළමුව හිනැහුණු කරුණාරත්න දෙවනුව නිකටින් පහළට එල්ලෙන දිගු රැවුළ පිරි මැද්දේය.

"සල්ලිබාගේ වියදං නොකර කොහොමද උපාසකම්මේ යමක් කොරන්නේ...?"

සීතා හුල්ලා වැටුණා ය.

"අපිට කොහෙන්ද සල්ලි බාගේ...ඕං මේකිගෙ අප්පටනං වැක්කෙරෙන්ඩ සල්ලි... කොයි ඉතිං හැරිලවත් බලන එකක් යෑ"

ආතුරයාගේ උපතට වගකිව යුත්තා සිහිපත් වූයෙන් යකැදුරාගේ බැල්ම බැරෑරුම් විය.

"හැබෑටම වසන්ත මහත්තයා කීයක්කත් දෙන්නෙම නැද්ද...?

"ඔහේ නෑ... මේකිගේ අම්මත් මිනිහෙක් එක්ක ගියාමයි අන්දෝ සංසාරයක් නෑ.... කලාතුරකින් ඇවිල්ලා යනවා. ඒත් ඉතිං මේකියි මායි බලන්ඩ නෙමේ පොල් ටික කඩාගෙන යන්ඩ..."

ඔහු හිස සැලුවේ ඇය වැමෑරු කරුණු කාරණා සියල්ල සිතෙහි ධාරණය කරගත් බව හඟවමිනි.

"මාත් යන්ඩෝනෑ සීතම්මේ..."

නිමලාවතී කන්කෙඳිරි ගෑවේ අඳුර මෝරන බව දකිමිනි.

"අනේ පුතේ බෑ නොකියා මේකි ඇරලෝලා වරෙංකෝ... දැං ආයෙ පයිං බඩගාන්ඩ ගියොත් මේකි වළඳක් ළිප තියන්නෙ කොයි වෙලාවෙද...?"

සීතා හෙළු බැගෑබර බැල්ම මඳහසකින් ඉවසූ තරුණයා කරුණාරත්න දෙස බැලුවේය.



"බෑ බෑ... මට තව වැඩකට යන්ඩ තියෙනවා... දැනටමත් පරක්කුයි" යි නොකී මිනිසා" ගිහිං එමුකො.... එතකං මට විටක් හපන්ඩ බැරියැයි..." යි නැවතත් පුටුවේ හරිබරි ගැසුණේය.

වඩා ආලෝකමත් වූයේ නිමලාවතීගේ නොව ආතුරයාගේ මුහුණය. තුන් වරුවක් ගතවන තුරු අවේලාවේ ගෙයින් එළියට නොබැසිය යුතු බවට මොහොතකට පෙර ගුරුන්නාන්සේ පැනවූ තහනම් නියෝගය නොසලකා ඇය ගෙම්දුලේ කොණක කල් මැරුවා ය. ඒ නිමලාවතී ඇරලවා ආපසු පැමිණෙන තරුණයා සමඟ වචනයක් දෙකක් කතා බහ කරන්නටය. වචන හුවමාරුවකට ඉඩ ප්‍රස්ථා නොතිබිණි නම් සිනාවක් බැල්මක් පවා ඇයට මහමෙරක් වටියි.

"එළියට ආවෙ ඇයි? ගුරුන්නාන්සේ මාමා කිව්වා නේද වරු තුනක් යනකං පරිස්සම් වෙන්ඩ කියලා..."

කොස්ගස යට හොර ගල් ඇහිඳින කෙල්ල දුටු හැටියේ කුමාර නෝක්කාඩු කීවේය.

"ඇයි ? මොකද වෙන්නේ?"

යතුරුපැදියෙන් බසින තරුණයා දෙස එක එල්ලේ බලමින් ඇය ඇසුවේ ආතුරයෙකුගේ දුබල හඬින් නොවේ. ජීවයෙන් පිරිපුන් කෙළිලොල් හඬිනි. ඇගේ පුෂ්ටිමත් සිරුරද දිගු කෙස් කළඹද ඇය වෙත ගෙන එන්නේ වයසට නොසරිලන පෙනුමකි. දුගී දුප්පත් චාන්දනිගේ කැහැටු පෙනුම වෙනුවට ධන ධාන්‍යාදියෙන් ආඩ්‍ය වසන්ත බණ්ඩාරගේ පෘෂ්ටිමත් බව සොරාගත් කෙල්ල කිකිණි හඬින් හිණැහුනාය.

"මේ අවේලාවේ ඔහොම හිනාවෙන්ඩ හොඳ නෑ..." යි ඔහු කීවේ නොමනාපයෙනි. ඇගේ බැල්මේ මෙන්ම ගවොමට හිරිහැර කරන ළමැදේ ද කිසියම් අග්ලීල බවක් ගැබ්ව ඇතැයි ඔහුට සිතිණ.

"එළියට එන්ඩ හොඳ නැලු... හිනාවෙන්ඩ හොඳ නැලු... මොනවද එතකොට හොඳ?..."

ඔහු ඇත මෑත බැලුවේ පිළිතුරක් සොයන්නක් මෙනි.

"කියන්නකෝ... මොනවද හොඳ...?"

දෙහි කැපිලි පමණක් නොව බලි තොවිල් සඳහාද බොහෝ වාරයක් සහභාගි වූ තරුණයාට මෙවන් ආතුරයෙක් හමු වී නැත්තේය.

"කො.... කොයි ගුරුන්නාන්සේ මාමා?"

ඇගේ දෑස මගහරිමින් ඔහු ප්‍රශ්න කළේ කරුණාරත්න ගෙතුළ සිටින බව දැන දැනමයි.

"කිරියම්මත්තෙක්ක බර කතාවක්..."යි ඇය උත්තර දුන්නේ බලගතු රහසක් අනාවරණය කලෙක මෙනි. ගෙතුළ කතා බහ ගෙපිළ පසුකොට මිදුල තෙක් ගලා එයි. උස් හඬින් කෙරෙන එය පිළිසඳරකට වඩා ඝෝෂාවකි.

"මොකද්ද නම ?"

ඔහු අඩ අඳුරේ දිලෙන ඇගේ දෑස දෙස බලමින් ඇසුවේය.

"ඇයි? මොකටද?"

"නිකං..."

ඔහු මහත් සරදමක් කළ පරිද්දෙන් ඇය හඬ නගා සිනාසුණාය.

"ඔහොම හිනාවෙන්ඩ එපා..." යි ඔහු මහත් උවමනාවෙන් ඉල්ලා සිටියේය.

"ඇයි?"

"හූනියං අප්පච්චි යන්ඩ යයි.."

හූනියම් දේවතාවා ගෙයක් පාසා ඇවිද යන්නේ මෙබඳු හැන්දෑවේ බව ඔහු අදහයි.

"මොන අප්පච්චිද?"

ඇය අඩ සිනාවෙන් ඇසුවේ දෑස හකුලාගනිමිනි.

"හූනියං අප්පච්චි... ඇයි අහලම නැද්ද...? කිරියම්මා කියලා දීලා නැද්ද?"



ඔහු කතා කළේ තරමක කෝපයෙනි.

"මගේ අප්පච්චිවත් මාව බලන්ඩ එන්නැති එකේ හූනියං අප්පච්චි හරි එන එක කොච්චර දෙයක්ද..."

හූනියම් දේවතාවාට මහත් සේ ගරු බුහුමන් දක්වන තරුණයා ඇගේ සරදම් හඬින් කිපුණේය ඔහු ඉක්මන් ගමනින් ගෙපිළට ගොඩවන අයුරු ඇය බලා උන්නේ සිනාමුසු මුහුණිනි.

පිටව යාමට පෙර සීතාට තවත් උපදෙස් රැසක් ලබා දුන් කරුණාරත්න ආතුරයා සෙව්වේය.

"ආසෝ.... ආසෝ.... කොයි දැං මේකි...?"

මිත්තණියගේ ඒ වැරදි සහගත උච්චාරණය පිළිබඳව මිණිබිරිය සිත ප්‍රථමවරට කෝපයක් ජනිත වූයේ මේ සන්ධ්‍යාවේදී විය යුතුය.

නොරිස්සුම් සහගත මුහුනින් වුව ඇය ඔවුන් වෙත පැමිණියා ය.

"කොහෙද බං ඇවිදින්නේ...? කියලා කට ගන්ඩ හම්බුණාද පරිස්සම් වෙන්ඩ කියලා..."

සීතා දොස් පැවරුවේ වැඩිකොටම යකැදුරා සනසනු පිණිසය.

"මළ ගෙවල්වල කොටහළු ගෙවල්වල යනව හෙම නෙමේ..."

හිස සලනවා වෙනුවට ඇය යකැදුරාගේ ගෝලයා දෙස බලා හුන්නාය.

ඒ තියුණු බැල්මෙන් අපහසුතාවට පත් ඔහු ඉක්මන් ගමනින් පිටව ගියේය.

"කු.... මා... ර" යි ඇය නැලවිල්ලේ ඔහුගේ නම උච්චාරණය කළාය. එහෙත් ඒ කිසි කනක නොවැකෙන තරමට පහත් හඬිනි. මෙදා මේ උදාසන ඇය සඳුන් තරයේ වැළඳගත්තේ "කුමාර... අනේ කුමාර"යි හඬගාමිනි. ඒ හඬෙහි ගැබ්වූ ශෝකයද ස්නේහයද

Scanned with CamScanner

හැඳින ගත්තෙන් ඔහු බෙහෙවින් කැළඹුණේය. කිව යුතු යමක් මුව'ග නොනැගුණෙන් ඔහු ඇගේ ස්පර්ශය නිහඬව ඉවසුවේය.

"මම කුමාර නෙමෙයි" කියා ගන්නටත් ඔහු අපොහොසත් විය.

# 4

අට්ටාලයක් බඳු කුඩා වේදිකාව සංගීත කණ්ඩායමට ප්‍රමාණවත් නොවූවද මංගල උත්සවයන්හී ගීත ගැයීම ජීවිකාව වූ පිරිසට එය ඒ හැටි ගැටළුවක් නොවූ වග පෙණින. අනෙක් අතට නාඹර ගැටවරයන් හතර පස් දෙනෙකුන් හට දැවැන්ත හා අලංකාර වේදිකාවක් කුමකටදැයි වැඩිහිටියෙක් සිතුවා විය හැක මුව නොවියැකෙන මදහසින් ගායනයෙන්ද වාදනයෙන්ද දස්කම් පාන සංගීත කණ්ඩායම දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේ කුඩා ළමුන් සහ තරුණ පිරිසය. මනාල යුවළ දෙස හෝ ඔවුන් එතරම් උවමනාවෙන් නෙත් නොහෙළුවා නිසැකය.

චාරිත්‍රවාරිත්‍රයන්හී නොමද හිරිහැරයට පාත්‍රවීම පිළිබඳව නොසතුටු මුහුණින් පසුවූ මනමාලයා දෙස සඳුන් මහත් උවමනාවෙන් බලා සිටියේය. සිය මවගේ බාල සහෝදරයා සමග ඥාතීත්වයෙන් ඔබ්බට ගිය මිත්‍රත්වයක් වගා දිගා වූයේ කෙලෙසදැයි ඔහුට වටහාගත නොහැක. එහෙත් වසර හය හතක පරතරය නොසලකා සඳුන් සහ ජාලිය ගමන් බිමන් ගියහ. සංගීත සංදර්ශනවලට සහභාගී වී එහි අනිවාර්ය අංගයක් වන ගහමරා ගැනීම්වලට මැදි වී ඔලු පලා ගත්හ. රෝහලේ යාබද ඇඳන් මත වැතිර වේදනා විඳින තරුණයන් දෙදෙනාට "ෂෝක් මාමයි බෑනයි" යි හෙදියන් පවා සරදම් කළෝය.

"චූටි මාමා" යි සඳුන් කට පුරා කීවද ජාලිය කිසි විටෙකත් "පුතේ" යි නොකීවේය. ඔහු සිය ඥාති පුත්‍රයා ඇමතුවේ "සඳූ" යන සුරතල් නමිනි.

Scanned with CamScanner

අන්තිමේදී ඒ නිශාචර ජීවිතයට නැවතීමේ තිත තබන්නට ජාලියට සිදුවූයේ වැඩි කොටම පියා රෝගී වීම හේතු කොටගෙනය. ඔහු මරණය පිළිබඳව නිතර සිහි කරමින් සිය හිතුවක්කාර පුත්‍රයා විවාහයේ විලංගුවෙන් බැඳ දමන්නට වෑයම් කළේය.

"තාත්තාට නිදහසේ හුස්ම ඩිංග පිට කරගන්ඩ හැටියක් නැත්තේ චූටි මල්ලියේ උඹ නිසයි." ජාලියගේ සොහොයුරියද සඳුන්ගේ මවද වූ දයාසීලි චෝදනා කළාය.

ජාලිය විවාහයක් කර ගත යුතු අතර සඳුන් රැකියාවක් සොයාගත යුතු විය.

"රස්තියාදු ගගහ හිටපංකො හැමදාම... අන්තිමට හිරේ විලංගුවේ වැටිලයි නවතින්නේ ඕං..."

දයාසීලි සිය එකම පුත්‍රයාට කඩා පැන්නේ වරක් දෙවරක් නොවේ.

"ඈ චූටි මාමේ... මනමාලි ලස්සනද?" යි අසන්නට සඳුන්ට රෑ බෝවෙනතුරුම බලා සිටින්නට සිදු විය.

සඳුන් රැකියාවක් සොයා නගරයට ගියේ මාමා සමඟ මනාලිය බලන්නට යාමට නුපුළුවන් වීම පිළිබඳව ළතැවුලිනි.

"හේමලයා වගේ පස්සෙං යන්නෝන්නෑ... මාමාට පරස්තාවක් ඕනවුණාට උඹට දැං ඕනෑ වෙන්නේ රස්සාවක්"

මව සමඟ වාද නොකළ සඳුන් කරබාගෙන හතරමං හන්දියට ගියේය.

"ඒක කෑම කඩයක්... ඒ හැටි අමාරු නෑලු එතන වැඩ අමාරු වුණත් ඉතිං කරන්ඩ එපැයි... හැමදාම නිකං ඉන්ඩ බෑනේ..."

නගරයේ සුප්‍රසිද්ධ ආපනශාලාවේ සේවයට එක්වීමට ඔහු කිසි කලෙකත් සිහින නොදුටුවේය."

"උඹ ඒ රස්සාවට යන්නම ඕනෑ... මාමා කසාද බැන්දට පස්සේ වෙනදා වාගේ රැයක් දවාලක් නැතුව මහගෙදෙට්ට රිංගන්ඩ බෑනේ උඹට..."



"ඇයි බැරි...?"

විවාහය මාමාගේ නිදහස මෙන්ම මාමා සමඟ වන ඇසුරද අසුරන බව ඒත්තු ගියෙන් ඔහු වහා ප්‍රශ්න කළේය.

"එහෙම තමා... අළුත් ජෝඩුවට නිදහසේ ඉන්ඩ දෙන්ඩ එපැයි..."

වෙලාවක් අවේලාවක් නැතිව මහගෙදර ආ ගිය තමාට මේ උන්හිටි හැටියේ පනවන තහංචි වාරණ පිළිබඳව ඔහු කෝපයට හා අසහනයට පත් විය.

"අම්මාට පිස්සු" යි ඇය හෙළා දැකීමෙන් සිත තුළ පැසවන ඒ අසහනකාරී බව පිට කරගන්නට වෑයම් කළේය.

"අපෙ අම්මවත් හිටියනං කමක් නෑ...."

දයාසීලි වසර තුන හතරකට පෙර මියගිය මව සිහිකර සුසුමක් හෙළුවාය.

"මාමයි කිරියත්තයි විතරයි" යි කියමින් සඳුන් බොහෝ රාත්‍රීන් ගත කළේ ද මහගෙදරය. සැතපුමකට නොවැඩි දුරක් යෑමෙන් ඒමෙන් වෙහෙසට පත් වූ දයාසීලි නිතර දෙවේලේ මැසිවිලි නැගුවාය.

"ගෙවල් දෙකක වැඩපල කරන්ඩ බෑ මට. කිව්වට අහන්නෑනේ යකෝ මේකා. කසාදයක් බැන්දා නං මට නිවන් දැක්කා වගෙයි.."

"පිට ගෑනු තාත්තට සලකයිද කව්ද දන්නේ අක්කේ..."

ජාලියගේ වචන ඇගේ කෝපාග්නිය මත හෙළන පිදුරු මිටකි.

"ලේලිලා ගූ හුජ්ජ අතගාන්නෑ තමා. තාත්තට බැරිම වුනාම මං එක්කං යනවා අපේ ගෙදර. දැන් වුණත් මං අඬගහන්නැද්ද... කොයි මේ හතර සීමාවෙන් පිටට කකුල හෙල්ලෙන්නෑනේ අපේ තාත්තාගේ"

ඇගේ පියා මඳ සිනාවෙන් හිස සලනවා විනා වාදයට නොඑළඹෙයි.

Scanned with CamScanner

වියපත් වන්නාහාම ඔහුගේ සෞම්‍ය ශාන්ත ස්වභාවය වර්ධනය වන සෙයකි. නිසි වේලාවට කෑම බීමද ඖෂධ ලැබෙන බැවින් ඔහු වෙතින් පළවන්නේ මහත් තෘප්තිමත් බවකි. ඔහුට කණස්සල්ලකට කියා තිබෙන්නේ බාල පුත්‍රයාගේ විවාහය ප්‍රමාද වීම පමණි.

ජාලියගේ විවාහ මංගල්‍ය උත්සවයේ ප්‍රීතිමත්ම පුද්ගලයා වන්නේ ඒ වියපත් මිනිසාය. ඊට සපුරා වෙනස් අන්දමින් සිහින් පැහැපත් තරුණයා නොඉවසිල්ලෙන් පසුවිය. සති කීපයක් මුළුල්ලේ නොකඩවා වෙහෙසීමෙන්ද නිදි මැරීමෙන්ද ඔහුගේ මුහුන මඳක් අඳුරුව තිබිණ. ඔහු රැකියාවේ නිරතව සිටියේ මාස තුන හතරක් වැනි කෙටි කාලයකි. ජාලියගේ විවාහය තීන්දු වූ බව සැළ වූ සැණින් ඔහු අළුයම ලූ කෙළපිඩක් මෙන් රැකියාව අතහැර ආවේය. කප්පරක් වැඩපල තිබුණෙන් දයාසීලි දිගින් දිගටම දෝෂාරෝපණය නොකළාය.

"අපරාදෙ නේද රස්සාව?" යි ජාලිය කණගාටු වුවද සඳුන් හිනැහුණේය.

"ආයෙත් ගියහැකි... එතනට එන උං වැඩි කාලයක් ඉන්නේ නෑ..." යි ඔහු කීවේ සැහැල්ලුවෙනි.

ජාලිය කරබාගත්තේ සිය ඥාතිපුත්‍රයාද ඔහුගේ මිතුරෝද ලබාදෙන සහයෝගය අතිවිශාල බව සිහි කරමිනි.

මධුවිත සප්පායම් වන පිරිස උදෙසා කට ගැස්ම උසුලාගෙන යමින් හුන් සඳුන් තමාගේ කඩිසරකම සොරාගන්නා ඒ දෙනෙතට ද්වේෂ කළේය.

දෙදිනකට පෙර මඟුල් පෝරුව මත මනාලයා සමඟ හුන් මනාලිය පමණට වැඩියෙන් වත්සුනු තැවරීමෙන් කිසියම් විකාර රූපී සත්ත්වයෙකු මෙන් දිස්වෙයි. ඇගේ ස්වභාවික සෞන්දර්යය සාහසික ලෙස ඝාතනය කළ රූපලාවණ්‍ය ශිල්පිණිය පිළිබඳව සඳුන් තුළ කෝපයක් පවා හටගැණින. අඳුන් ගැල්වූ නුවන් කොතරම් සෝබර වී දැයි කිවහොත් ඊළඟ මොහොත් ඇය වැලපෙන්නට බැරි නැතැයි ඔහු බියට පත්විය. එකෙනෙහි ඒ විපර්යාසය සිදු විය. පෝරුව මත නොව මිණී පෙට්ටියක් තුළ



සිටින කලෙක මෙන් සුදුමැලිව පසුවූ මනාලිය සිහින් සියුමැලි තරුණයා දුටුවාය. ඇගේ දෑස ඇල්වෙන අයුරු ඔහු බලා සිටියේ මහත් පුදුමයෙනි. තොල් ආලේපන යහමින් තවරා මුහුනේ අනෙකුත් අංගෝපාංගයන්ට වඩා ඉස්මතු කර තිබූ දෙතොල විවර විය. මෘත ශරීරයකට ප්‍රාණය ලැබී නැගී සිටින්නාක් මෙන් ඇය නොසන්සුන්වන අයුරු දකිත්ම ඔහු කැළඹුණේය. තමා දුටු පමණින් ඇය ඒ සා වෙනස් වූයේ මන්දැයි වටහාගත නුහුණු තරුණයා වටපිට බැලුවේය. පලායාමට අපහසු තරමට පිරිස පොදිකමින් පෝරුවේ චාරිත්‍ර ඇක බලා ගනු පිණිස දිගු කරගත් ගෙලින් පසුවූහ.

හරියට ලෝකාවසානයේ අවසන් විවාහ මංගල්ලයට සහභාගි වී සිටින කලෙක මෙනි. අන්තිම පෝරුව! අන්තිම මංගල යුවල!

මෙතක් කලක් තමා සමඟ ගමන් බිමන් ගිය... බොහෝ විට එක් යහනේ නිදාගත් ඥාතියා අලංකාර පෝරුවක් මත නාඳුනනා තරුණියක සමඟ ඡායාරූප ශිල්පීන්ගේ හා පෝරුවේ වතාවත් කරන මහල්ලාගේ අත් අඩංගුවේ පසුවීම ඉවසා සිටීම පහසු නැතත්, සඳුන් මහත් වෙර වැයමෙන් නොසැලී සිටියේය. එහෙත් හිටිහැටියේ දැල්වුණු ඒ වර්ණවත් නුවන් ඔහුගේ සංයමය බිඳ හෙළයි. මේ දැන් ජාලිය සමඟ අතිනත ගත් මනාලිය තමා දෙස මේසා උනන්දුවෙන් බලා සිටීම විමතියට මෙන්ම කුහුලටද කරුණකි.

නව යුවළ මධුසමය ගතකරන හෝටලයට ඇරලවා ආපසු පැමිණීමට තැත් කරනවිට ඇය ඔහු දෙස බැගෑබර බැල්මක් හෙලුවාය. වචන දහසක් ගැබ් වූ ඒ එක් ආයාචනාත්මක බැල්මෙන් ඔහු කොතෙක් නොසන්සුන් වීද කිවහොත් ආපසු එන අතරතුර කිසිවෙකු සමග කතා නොකළේය.

"කොල්ලට දුකයි... බඩබැඳගත්තා වගේ එකටමනේ හිටියේ"

සිය පුත්‍රයා ළත වන්නේ ජාලිය පිළිබඳව යැයි වරදවා වටහාගත් දයාසීලි පහත් හඬින් කොඳුළාය.

"මාමයි බෑනයි වුණාට අයියයි මල්ලියි වගේනේ හිටියේ"

ඥාතිවරියක නම් සිය හඬ පාලනය කරගන්නට වෑයම් නොකළාය. ඒ උච්ච ස්වරය සඳුන්ගේ දෙකනේ ගැටුණද ඔහු නෑසුණ විලාසයෙන්ම පසු විය.

"මාමගේ මනමාලි ඇයි මා දිහා එහෙම බැලුවේ...? යි ඔහු සියක් වරක් තමාගෙන්ම ප්‍රශ්න කළේය.

"නෑ... මට පෙනිච්ච විදිය වෙන්නැති. මාත් ඉතිං දවස් ගානක් මහන්සි වෙලා රෑ කීයක් නිදි මරලද හිටියේ" යි තමා කළ ඕලූ ඒ බැල්ම අමතක කරන්නට වෙහෙසුනේය.

"මට පිස්සු.... නට් එකක් බුරුල් වෙලාද කොහෙද..."යි තමාටම හිනැහෙන්නට තරම් කාලයක් ඔහු වෑන්රිය තුළ ගත කළේය. මහ ගෙදරට ගොඩ වූයේ සුපුරුදු කෙළිලොල් තරුණයාමය. ඔහු සිය මුත්තණුවන් වැළඳගනිමින් සරදම් කළේය.

"ලේලි සැර ආනකොට ඉතිං කිරියත්තට අපේ ගෙදර එන්ඩ වෙයි..." යි ඔහු අනතුරු ඇඟෙව්වේය.

"අනේ ඒ ළමයා තව මේ ගෙදෙට්ට අඩිය තිබ්බෙත් නෑ... මොනවද මේ කොල්ලා මේ කියන අවකැපෙන කතා..."

දයාසීලි අප්‍රසාදය පළ කළද මහල්ලා හඬනගා හිනැහුණේය.

නව යුවළ පිළිගැනීමේ සාදය හේතුකොටගෙන දයාසීලිට මහගෙදර නවතින්නට සිදු විය. මනාලියගේ නිවෙසේ පැවැති උත්සවයට වඩා අලංකාර හා උත්කර්ෂවත් උත්සවයක් පැවැත්වීමට මනමාලයාගේ පාර්ශවයට තිබූ බලවත් උවමනාව කැපී පෙනිණ.

එහිලා වඩාත් වෙහෙසුණේ දයාසීලි සහ සඳුන්ය. සෑම සියළු කටයුත්තකදීම ඔවුන් ප්‍රධානත්වය ගෙන කටයුතු කළෝය. එහෙත් නව යුවළ සම්ප්‍රාප්තවූ බව ගමටම ඇනුම් දුන් රතිඤ්ඤා හඬින් ඔහු යලිත් කැළඹුණේය. සිය මාමා මනාලියක නොව කිසියම් අද්භූත සත්වයෙකු නොඑසේනම් පිටසක්වල ජීවියෙකු කැටිව එන කලෙක මෙන් හෙතෙම පසුබෑවේය.



පිළිගැනීමේ ගීතය ගායනා කරන දැරියන් වෙතින් ලිස්සා ගිය ඒ අත්‍යාලංකාර දෙනයන සෙව්වේ රැලි හිසකේ ය. දිගු නැහැයක් සහ සිහින් දෙතොලය.

ඒ සියල්ලෙහි ඒ මන බඳන සියල්ලෙහි හිමිකරුවා පිරිස මධ්‍යයේ සැඟවෙන්නට නිරර්ථක වෑයමක නිරත විය. එහෙත් කිසිවෙකුගේ සුරතින් ඔහු ඉදිරියට තල්ලු විය.

"මාමයි නැන්දයි පිළි ගන්ඩෝනෑ බෑණානේ..."

ඒ කතාව මහා විහිළුවක් ලෙස සලකා පිරිස උස් හඬින් සිනාසුණහ. සිනාවක් සඳහා දෙතොල ඇත් මැත් නොවූයේ අළුත් නැන්දාගෙත් බෑණගේත් පමණක් විය යුතුය. ඉනික්බිති පෙර පුරුදු ලෙසින් ඇගේ දෑස ඔහු ලුහුබැන්දේය. එය ඔහුට මහත් හිරිහැරයක් වුවද පැමිණිලි කළ යුත්තේ කාටදැයි ඔහු නොදත්තේය.

අනෙක් අතට පැමිණිලි කරන්නට තරම් කරුණක් තිබිණි ද? මාමාගේ බිරිඳ තමා දෙස බලන බව කටක් ඇර කෙනෙක් සමඟ කිව හැකිද...? ඉලන්දාරියෙකුගේ තියුණු බැල්මෙන් අපහසුතාවයට පත් වූ නව යෞවනියක මෙන් ඔහු හැකිළුණේය. පැකිළුණේය.

"සඳුන්..."

ඇගේ දැසින් සැඟවී සිටීම සඳහා පිළිකන්නට වැදුණු ඔහු ඒ මිහිරි හඬින් තිගැස්සුණේය. වහා හැරී බැලූ තරුණයා මංගල ඇඳුම් ආයිත්තම්වලින් නිදහස් වූ තරුණියක දැක පුදුමයට පත් විය.

"සඳුන් නේද නම?"

ඇගේ සිනාවේ සුන්දරත්වය දැක බලා ගන්නට ඔහු මැළි විය.

"ඇයි කතා කරන්නැත්තේ...?"

ඇයට ළිඳට යාමට විශාල ඉඩකඩක් උවමනා නොවන බව දැන දැනත් ඔහු පසෙකට විය.

"කව්ද කීවේ මා එක්ක කතා කරන්න එපා කියලා...?"

ඒ අනපේක්ෂිත ප්‍රශ්නයෙන් තැතිගත් ඔහු වහා හිස තඟා ඇය දෙස බැලුවේය.

"කව්රුවත් කීවද සඳුන්ට මා එක්ක කතා කරන්න එපා කියලා...?"

ඇය මෙවර ඇසුවේ පෙරට වඩා මෘදු හඬිනි. ඔහු කිසිවක් කියන්නට තැතනුවේය. එහෙත් ඔහුට පෙර ඉස්සර වූයේ දයාසීලිය.

"නානවද නංගියේ? හවස් වුණා වැඩියි නේ...? කොණ්ඩේ වේලෙන එකක් නෑ..."

කිසිත් අමුත්තක් නැතිව මනමාලිය නැනන්ඩියට මුහුණ දුන්නාය. එහෙත් සඳුන් විළියෙන් රත් පැහැ ගැන්විණි.

"ඇඟ වුට්ටක් හෝදා ගන්නං අක්කේ... හෙට ම නානවා..."

දයාසීලි වහා බැලුවේ සිය පුත්‍රයාගේ මුහුනය.

"අනේ පුතේ නැන්දට සබන් කැල්ල හොයලා දීපං... ටැංකියේ වතුර නැත්තං මෝටරෙත් දාපං..."

ඒ අවසරයෙන් ඔහු ඉක්මන් ගමනින් ළිඳ වෙත ගියේ ය.

"ඉතිං ඔය අස්සයා වගේ දුවන්නේ... නැන්දා දන්නවද අගක් මුලක්... උපන්තේකට මේ ආවාමයි...."

මඳ සිනාවක් මුවඟ නංවාගත් මනමාලිය දයාසීලි දෙස බැලුවාය.

"අරයත් නායිද දන්නෑ"

"මොන... ආන් යාළුවෝ එක්ක එකතුවෙලා බොනවා. අද කියට නැගිටියිද මංදා..." යි නෝක්කඩු කියමින් ඇය යළි ගෙතුළට දිව්වා ය.

ළිඳ වෙත ගියද සඳුන්ගේ කඩවසම් රුව දක්නට නොලැබීමෙන් කණස්සල්ලට පත් මනාලිය "සඳුන්" යි හඬ නොනගා සිටියේ මහත් අසීරුවෙනි. ඇය වටපිට බලමින්



සොයන්නේ තමා බව අනුමාන කළ තරුණයා තව දුරටත් සැඟවී සිටියේය.

"මොකද මේ? හීනෙං බයවෙලා වගේ...? යි" අසන්නට දයාසීලිට සතියකට වඩා කල් ගත නො වීය.

"න්.... නෑ... මුකුත් නෑ..." ඔහු තැතනුවේ ඇගේ දෑස මඟ හරිමින් ය.

ඒ උකුසු ඇස් තමාගේ සිතෙහි වියවුල හැඳිනගනු ඇතැයි ඔහු බියට පත්විය.

"පහුගිය ටිකේ නිදි මරල ඔය. නාලා කාලා බුදිය ගනිං ඔය මතේ යන්ඩ..."

සොහොයුරාගේ විවාහ මංගලය වෙනුවෙන් අධික ලෙස වෙහෙසුනු පුත්‍රයා කෙරෙහි හටගත් කරුණාවෙන් යුතුව ඇය මොළොක් හඬින් කීවාය. ඇගේ ප්‍රශ්න පත්තරයෙන් ගැලවීමියි සිතෙහි හටගත් සහනයෙන් ඔහු වහා කාමරයට වැදුණේය.

"අනේ අපරාදේ කියන්ඩ බෑ රූපිකා අපේ තාත්තට හොඳට සලකනවා... ඊයේ බලනකොට වතුරත් උනු කරලා තාත්තව නාවන්ඩ... හරි ගුණ යහපත් කෙල්ල..."

අඩක් ඇරුණ දොර අම්මාගේ උච්ච ස්වරයට ඉඩකඩ පාදා දෙයි.

"රූපිකා...?" යි ඔහු විමතියෙන් කොඳුළේය.

"එයාගේ නම රූපිකාද?" යි හඬ නොනැඟෙන්නට ප්‍රශ්න කළේය. සුව නින්දක් අපේක්ෂාවෙන් ඇඳට ගියද ඔහුගේ ඇසිපිය සලිතව ඇගේ රුව දකින්නට බල කළේය.

"ඒ... ඒ මගේ නැන්දා"යි සිතන්නට ඔහු වෑයම් කළේය. එහෙත් පසුදින අම්මාගේ පෙරැත්තය නිසාම මහගෙදර ගිය තරුණයා "මට නැන්දා කියන්න එපා"යි රූපිකා ඉල්ලා සිටි විට වික්ෂිප්ත විය.

"ඇයි?"

Scanned with CamScanner

ඇගේ දෑස පහතට නැඹුරු විය. තමා දුටු විගස ඒ මුවග නැඟි හසරැල්ල අතුරුදහන්ව ගිය අයුරු ඔහු කෙමෙන් කැළඹෙන මනසින් බලා සිටියේය.

"මං ඔයාගේ නැන්දා නෙමෙයිනේ..."

"ඇයි නැත්තේ... ඔයා අපේ මාමගේ නෝනානේ... ඉතිං නැන්දා තමා..." යි කියන්නට තරම් ඔහු එඩිතර විය.

ඇය සුසුමක් හෙළුවාය. ඒ සරල ක්‍රියාවේ පවා දැවටී තිබුනේ සිත්ගන්නා සුළු බවකි. ඔහු මහත් උවමනාවෙන් ඇය දෙස බලා සිටියේය.

"වෙඩින් එක දවසෙ ඔයාව දැක්කම මට හරියට පුදුම හිතුණා සඳුන්... මට හිතුණේම මගේ රුවන් මිනී වළෙන් නැඟිටලා මං ඉස්සරහට ඇවිත් කියලා..."

එය දිගු කතන්දරයක සාරාංශය විය. ඔහු විමතියෙන් ඇරුණු ඇසින් බලාගත්වනම සිටියේය.

"එයාටත් තිබ්බේ ඔය වගේ කොණ්ඩයක්..."

ඇගේ හඬ බිඳිණ... ඇගේ දෑත සැලිණ. ඒ සිහින් දිගු අතැඟිලි ඔහුගේ හිස පිරිමැදීමේ නොතිත් ආශාවෙන් තලියන්නට විය. හැඬුමකට ලක ලෑස්තිවන දෙතොල ඔහුගේ දෙඇස නැහැය හා දෙතොල සිපගැන්මේ බලවත් ආශාවෙන් ඇවුණේය.

ඔහුට ඉවසාගත නොහැක්කේ ඇය වේදනාව මැඩගන්නට දරන ප්‍රයත්නයයි. අනෙක් අතට අළුත ගෙනා මනාලියගේ හැඬුම්බර මුහුණ කිසිවෙකුගේ නෙත ගැටෙනු ඇතැයි ඔහු බියට පත් විය. ජාලිය ආපසු පැමිණෙන්නේ අඩ අඳුරේ බව ඔහු දනියි.

"අම්මා"

"කිසිවෙකු ඔහුට අනතුරු ඇඟෙව්වේය. ඇය මුත්තණුවන් සමීපයෙහි පුවත්පත කියවමින් සිටියි. ඔහුගේ දුබල ඇසට කණ්ණාඩි කුට්ටමෙන්ද සැලකිය යුතු සහයෝගයක් නොලැබේ. එහෙයින් සතිපතා පුවත්පත ඔහුට ඇසෙන ලෙස හඬගා කිව යුතුය. බොහෝ විට ඒ රාජකාරිය පැවරුණේ සඳුන්ටය.



"බස බස ගාලා කියවගෙන යන්නේ නැතුව ටිකක් හෙමිං කියවපංකෝ...." යි මහල්ලා ඉල්ලා සිටින්නේ බැරිම තැනය. මේ නීරස කාරියෙන් නිදහස් වීමට මුණුපුරා තුළ ඇත්තාවූ බලවත් උවමනාව ඒ වේගයට එකම හේතුව විය.

මේ උදාසන පුවත්පත් කියවන දයාසීලිට කිසිදු හදිසියක් නැත්තේය. ඇය ඒක පුද්ගල ප්‍රසංගයක් රඟ දක්වන්නාක් සේය. හිටි හැටියේ ඇය හඬ නගා සිනාසෙයි. මොහොතකින් ඇගේ පියාගේ සිනහවද ඊට එක්වේ.

"කව්ද රුවන් කියන්නේ? කොහොමද එයා මැරුණේ...?"

කිසිවෙකුගේ අවධානයට තමාද මේ ශෝකාතුර ගැහැණියද ලක් නොවන බව තහවුරු කර ගත් පසු සඳුන්ට උවමනා වූයේ ඒ ප්‍රශ්න දෙකට උත්තරය. එහෙත් ඇගේ කඳුළු පිරි දෙඇස ඔහුගේ මුව අගුළුලයි.

"රුවන්... අනේ... රුවන්..."

අපමණ ශෝකයෙන් කොඳුරමින් ඇය ඔහු වැළඳ ගත්තා ය. ඇගේ උණුසුම් ස්පර්ශයෙන් තැතිගත් තරුණයා

"ම.... මම රුවන් නෙමේ... මම සඳුන්" යි කියාගන්නට ඇපොහොසත් විය.

එහෙත් වසර ගණනාවකට පසු වෙනකෙකු යැයි හඟිමින් තමා වැළඳගත් තරුණියට සත්‍යය පවසන්නට ඔහු සමත් විය.

"ම... මම සඳුන්..."

ඇය වහා ඔහු අතහැර ඇඳ මත ගුලි වූවාය. තමාගේ පෙම්වතාට වඩා සපුරා වෙනස් රූපකායකින් හෙබි එකෙකුහට රැවටෙන්නට තරම් තමා අනුවණවීම පිළිබඳව පසුතැවුණාය.

"කව්ද කුමාර කියන්නේ?" අසන්නට පෙර ඔහුට දැනගන්නට උවමනාවූයේ ඇය ලුහුබැඳි මිනිසුන් පිළිබඳ වංහුංය.

"ඇයි ඒ මිනිස්සු ඔයාගේ පස්සෙං පන්නන්නේ?"

ඊටත් පෙර ඔහු අසා දැකගත යුතුව තිබුනේ ඇගේ නමය. ඔහු ඇය ස්පර්ශ කළේ ඇගේ නිශ්ශබ්දතාවය නොරුස්සමිනි.

Scanned with CamScanner

වහා උඩුකය කෙළින් කළ ඇයා ඔහු පෙරළාගෙන කාමරය
පිටතට දිව්වාය. ඒ අනපේක්ෂිත ක්‍රියාවෙන් විපිළිසරවූ තරුණ
"මොන මගුලක්ද" යි කෑ ගැසුවේය. ඒ උච්ච ස්වරයෙහි කෝප
අප්‍රසාදයද නොරිස්සුමද යනමින් ගැබ්ව තිබිණ.

# 5

වඩා පටු නොවූ පාර වළ ගොඩැලිවලින් ගහණය. රිය සක තබා මිනිස් දෙපයකට පවා පහසුවෙන් තරනය කළ හැකි බවක් නොපෙනේ. දෙපස පුරන් කුඹුරු නිහඬව කියාපාන්නේ මේ ගුරුපාර කිසි කලෙකත් පිළිසකර නොවන බවයි. කළුම කළු තාර මේ ගුරුම ගුරු පාරට සදා සිහිනයක් පමණි.

ගේට්ටුවක හෝ කඩුල්ලක අවහිරයකින් තොරව පාරට පැනගත් තරුණිය ඈත මෑත බැලුවාය. තමා යා යුත්තේ කිනම් දිශාවකටදැයි සිතා බලනවාට වඩා ඇයට උවමනා වූයේ තවත් එක් නිවෙසක් හෝ දැක ගන්නටය.

එහෙත් නොඉවසිල්ලෙන් සලිත වන ඇසිපියට පවා සරදම් කරන්නාක් මෙන් හාත්පස කොතනක හෝ ගෙයක් තබා අඩු පැළක්වත් දක්නට නොලැබිණ. වික්ෂිප්තවූ කෙල්ල ආපසු හැරුණාය. අසෝබන ගෙමිදුල මධ්‍යයේ ගරාවැටෙන නිවෙසේ අප්‍රසන්න බව අදහාගත නුහුණුව ගල් ගැසුණාය. තමා පෙර දින රාත්‍රිය ගතකළේ ඒ නිවෙස තුළ බව සිහි කිරීමෙන් පවා ඇය පුදුමයට පත් වූවාය.

අලංකාර නිවෙසක් ඇයට හැමදාමත් සිහිනයක් වූ වග සැබෑය. අනෙක් අතට ගෙවල් දොරවල් හෝ ඇඳුම් පැළඳුම් ගැන පවා ඇය උනන්දු නොවූවාය යෝධ ලිපක් මත බුබුළු දමන තෙල් කටාරමක් සේ ඇය නිරතුරුව ද්වේෂයෙන් පුපුරු ගැසුවාය. ඇය ජීවී අජීවී සියල්ල කෙරෙහි උරණව සිටියාය. එහෙත් කුමාරයෙක්

නොවූ කුමාර ඇගේ දෙනයන නිබඳ දැල්වෙන ගිනි පුපුරු අඩකින් නිවා දමන්නට සමත් විය.

යන්තරයක් දැමීම සඳහා උවමනා වන භාණ්ඩ ලැයිස්තුව බාර දෙන්නට ඔහු පැමිනියේ තනිවමය.

නිය විකමින් පිල් ගැට්ට මත හිඳගෙන හුන් ඇය යතුරුපැදියේ හඬ ඇසුණද හැරී බලන්නට අදහස් නොකළාය.

"ඉඳගන්නකොට හිට ගන්නකොට ඇවිදිනකොට විතරක් නෙමේ බුදියාගන්න කොටත් ගෑනු ළමයෙක් වුණාම තියෙන්ඩෝනෑ සංවරයක් කියල දෙයක්, කොච්චර කිව්වත් අහනවද උඹ ඊට චිත්තයක් ඇඳගනිං කියල බුදියනකොට. ඊ මැද්දැවේ ඇහැරුණාම මට පේන්නේ මොනවද...?"

මිත්තණිය මේ කියන්නට අර අඳින්නේ කුමක්දැ යි දැන දැන වුව ආශා "මං දන්නෙ කොහොමද? මං ඇහැරෙන එකක් යැ... ඊ තිස්සේ" යි සැර දමයි.

"අප්පේ අපරාදෙ කියන්ඩ බෑ ඊට හොරෙක් පැනල උඹව උත්සාගෙන ගියත් උඹ දන්නේ නෑ තමා. උඹට ඇහැරෙන්නෙත් නෑ..."

කළු රෙදිකඩකින් ඇස බැඳගත් සොරෙකු තමා ඔසවාගෙන යන අයුරු දකින ඇය මුව'ග නැඟි සිනාව සඟවාගනියි. මිත්තණියට පෙනෙන්නට හිනැහෙන්නට ඇය කැමති නොවේ.

"හොරෙක් මාව උස්සාගෙන යනවනං මං කොච්චර ආසද... ඇහැරුණත් මං නං කෑගහන්නෙ නෑ... ඒ හොරත් එක්ක එකතුවෙලා මාත් හොරකම් කරනවා..."

සීතා සිය මිනිබිරිය දෙස රවා බලයි.

"ඉදකිං... කියන කඩප්පුලි කතා...."යි කෙළ පිඩක් බිම හෙලන්නට තරම් ඇය ආවේගශීලි වෙයි.

"ඔච්චද කියන්නෝනෑ ගෑනු ළමයෙක් වුණාහම..."

සුවිනීත, කීකරු හා ගුණයහපත් මිණිබිරියක ලබා නොදුන් දෙවියන්ට පවා දොස් පවරන්නට සීතා මැළි නොවෙයි.



"කෝ ඉතිං සීතම්මා කිවේ නැතේ ඊට මොනවද පේන්නේ කියලා..."

ආශා අසන්නේ මිත්තණිය කෙරෙහි හදිසියේ පහළ වූ කරුණාවකින් නොවේ. ඇය තව තවත් තලා පෙළා දමන අදහසිනි.

"වෙන මොනවද ඉතිං... ඊට උඹේ ඔක්කොම එළියේ... මං කොච්චර රෙදි පෙරෙව්වත් වැඩක් නෑ.... එක පාරයි පයිං ගහන්නේ... රෙදි කැලේ. අනේ අපේ බෝධිසත්තයා එක රැයනේ අර නාටිකාංගනාවන්ගේ විසූක දස්සන දැක්කේ... එදා ඊම උන්වහන්සේ ගිහිගේ අතැරලා ගියා... මං ඉතිං හැමදාම දකිනවා උඹ හෙලුවෙං දඟලන හැටි... මට අප්පිරියා වෙලා උඹේ නරි නාටක දැකලා... කොයි ඉතිං මට යන්ඩ හැටියක් නැතේ අප්පේ දමල ගහලා.... ඇත්තමයි සැරයක් නෙමේ දහ සැරයක් වන වදින්ඩ දේවල් මට සිද්දවෙලා නැද්ද?..."

ඇගේ හැවිල්ල ආශාට සිනාවට කරුණකි. මහ හඬින් සිනාසෙන මිනිබිරිය වෙතින් සීතා ඉවතට යන්නේ කඳුලක් පිසිමිනි.

මේ හැන්දෑවේ එපරිද්දෙන් දුක් දරන්නට ඇය අහළ පහළ නොසිටියාය. ගෙපිළ මත හිඳගෙන ඉන්නා කෙල්ලගේ ගවොම් සාය ඉහළට එසවී නිරාවරණය වන දෙපයේ හැඩකාර බවින් මත්ව ගියාක් මෙන් ඔහු හිටිපිය හිටගෙන හුන්නේය. යතුරුපැදියේ හඬ ඇසීමෙන් පසු හෝ ඇය ගවොම සකසාගත යුතුව තිබිනි. එහෙත් ඒ වෙනුවට සිය පැහැබර කලවා මනාව ප්‍රදර්ශනය කරමින් ඇය නිය විකන හැටි...!!

කුමක් කළ යුතුදැයි නිශ්චය කරගන්නට අපොහොසත්වූ ඔහු ආපසු යන්නට පවා සිතුවේය. එහෙත් ගුරුන්නාන්සේගේ විධානය ඉටු කළ යුතුය.

"මේ... ගෙදර කව්ද?"

ඇය ඔහු වෙත හෙලුවේ නොසැලකිලිමත් බැල්මකි.

"කාවද හොයන්නේ?"

කොතෙක් ඉවතට ගත්තද ඔහුගේ දෑස ඇගේ දෙපා වෙතම දිවෙයි. ඒ අකීකරු දෑසට ශාප කරමින් ඔහු "කොයි කිරියම්මා...?" යි ඇසුවේය.

"ගේ ඇතුලෙ....?"

ඒ උත්තරය ඔහුගේ සිත් නොගත්තේය. තමා පැමිණි වග දැන දැන ඇය ගෙතුළ රැඳෙන්නේ මන්දැයි සැකයෙන් "ඇයි සනීප නැද්ද?" යි ඇසුවේ ගෙපිළට ගොඩවෙමිනි.

ඔහු කෙමෙන් ළං වුවද ඇය ගවොම් සාය පහතට අඳින්නට උත්සුක නොවූවාය.

"ලැජ්ජාවක් කියලා දෙයක් නං ගෑවිලාවත් නෑ..." යි බැන වදින්නට ඔහුට උවමනා විය. එහෙත් වරක් පමණක් දුටු කෙල්ලක පිළිබඳව තමා කරදර වන්නේ මන්දැයි සිතුණෙන් නිහඬවම ගෙතුළට කර පෙව්වේය.

"නැන්දේ..." යි ඔහු හඬ ගෑවෙන් ආශාට සිනහ පහළ විය.

"ඇයි? නැන්දා ගේ ඇතුලෙ නැද්ද?"

වහා හැරී බැළු ඔහු නුරුස්නා හඬින් ඇසුවේය.

"ඉන්නවා ඉන්නවා"

"එහෙනං හිනාවෙන්නේ?"

ඇය පිල්කණ්ඩියෙන් බිමට පැන්නාය. ළය මඬල සැලී යන පරිද්දෙන් ඇය එසේ නොකළ යුතුව තිබිණැයි ඔහුට සිතිණ.

ගවොම් සාය අතින් අල්ලාගෙන සෙමින් හා පරිස්සමින් පිල්කණ්ඩියෙන් බැස විනීත යුවතියක වග තමාට හඟවන්නට ඇය කල්පනා නොකිරීම ඔහුට වේදනාවකි.

"ඇයි? හිනාවෙන්ඩ තහනංද...?"

ඇය හෙළු දඟකාර බැල්ම ඔහුගේ තුරුණු සිත නුහුරු හැඟුම් ජනිත කරවයි.

"වැඩේමයි. මට මොකද... මට හිනා වුණත් එකයි ඇඬුවත් එකයි...."



ඔහුගේ කෝපයද ඇයට සිනාවට කරුණකි.

"නෑ... මට හිනාගියේ ඔයා අපේ සීතම්මට නැන්දා කියන හිංදා..."

"ඇයි...?

"ඒ නාකි මැන්ටලේට නැන්දා කියලා හරියනවද"

ඔහු පුදුමයෙන්ද කුහුලින්ද ඇය දෙස බලාගත්වනම සිටියේය. මොලොව සිටින එකම ඥාතියා අරබයා ඇය භාවිතා කරන වචන ඔහුට දැරිය නොහැකි තරම් නිර්දයය.

"හරි ෂෝක්නෙ ගෑනු ළමයෙක් කතා කරන විදිය"

"හා හා ගෑනු ළමයි කතා කරන  විදියයි පිරිමි ළමයි  කතා කරන විදියයි කියලා දෙකක් තියෙනවද?"

ඔහු තව දුරටත් ඇය සමඟ වාද කරන්නට නොසිතුවේය.

"එතකොට පිරිමි ළමයින්ට ඕනම විදියකට කතා කරන්ඩ පුලුවං... ඕනම දෙයක් කරන්ඩ පුලුවං... හැබැයි ගෑණු ළමයින්ට බෑ... ඒකා යකාගේ වැඩක් නේ... කාගේ නීතියක්ද ඒ...?"

ඇය ප්‍රශ්න කරන්නේ පියෙන් පිය ඔහු වෙත ළංවෙමිනි. ඔහු ගෙතුළට වැදුණේය.

"නැන්දේ..."

ඒ හඬ කන වැකෙන මානයේ ඒ මැහැල්ල නොසිටියාය. ඇය සොයා පිරික්සා බලන්නට කාමර රැසක් තබා දෙකක්වත් නොවිණ. ඒ කුඩා නිවසේ අල්ප ගෘහ භාණ්ඩද එකම කාමරයද මෙලොව තනිවූ මැහැල්ලක හා යව්වනියකගේ දුගී දිවිපෙවත හඬගා කියන්නාක් මෙනි.

ක්ෂණයකින් ඔහුගේ සිත ආශා පිළිබඳව හටගත් නොරිස්සුම තුනී වී ගියේය.

"බොරු නේද කිව්වේ?"

ඔහු  දොරකඩ නැවතුණ කෙල්ල දෙස බලමින් ඇසුවේය.

"මම මොකටද බොරු කියන්නේ? දැං හිටියා..."

Scanned with CamScanner

"කොයි එහෙනං... බහිරවයා ගිල්ලද...?"

ඇය නැවතත් ඔහු දෙස යටැසින් බැලුවාය. ඒ නම් ඕනෑම ඉලන්දාරියෙකු කලඹාලන විසේකාර බැල්මකි.

"එහෙමවත් වෙනවනං කොච්චර හොඳද..."

මිණිබිරිය වෙනුවෙන් තොවිලයක් පවා නටවන්නට සූදානමින් පසුවන මිත්තණියක පිළිබඳව එලෙස කතා කිරීම කොතරම් නොහොබිනා දැයි ඔහුට සිතිණ.

"තාත්තා බලන්නෙත් නෑ නේද...?"

ඇය හිස සැලුවාය.

"අම්මා එන්නෙත් නැනේ"

"නැත්තෙමත් නෑ... මාස දෙකෙන් දෙකට එනවා.... පොල් පැහුණාම පොල් කඩාගෙන යන්ඩ...

"ඇයි ඉතිං තමුන්ගෙ දුක සැප බලන අර අහිංසක මනුස්සයට ඔහොම කතා කරන්නේ...?"

නිසි උත්තරයක් සොයා ගත නුහුණු තරුණිය

"ඔයාට වැඩක් නැනේ" යි කීවාය.

"මට වැඩක් නෑ තමා... මං ආවේ මේ තුන්ඩුව දීලා යන්න..."

"ඉතිං දෙන්ඩ..."

ඔහු ඇය වෙත ළං විය.

"විසි කරන්නැතුව මේක අරුන්දැට දෙනවා... බඩු ගොඩක් තියෙනවා හොයා ගන්ඩ..."

ඇය ඔහු දිගුකළ කොළය බාරගත්තේ පරාජිත මුහුණිනි.

"දෙහි කැපිල්ලෙන් ඒ හැටි ගුණයක් නෑ වගේ. යන්තරේ දාපුවාම හරියයි."

ඇය නිහඬවම අසෝබන අකුරින් පිරුණ ඒ කොළය සිහින් තීරුවලට ඉරුවාය.



"ඒයි... එපා... එපා... ඉරන්ඩ" යි කෑගාමින් ඔහු ඇය වෙත පැන්නේය. ඇගේ දෑත දැඩිව අල්ලා ගත්තේය. ඇගේ දෙනයන ගිනිපුපුරු යළි දිලෙන්නට විය. ගිනිකණ වැටුණු සතෙකු සේ ඔහු ඇගේ දෑස මත රැඳුණ දෑසින් යුතුව පසුවිය. එකිනෙකා හුස්ම ඉහළ පහළ හෙලන හඬ ඔවුනොවුන්ට ඇසෙන නෑසෙන තරමට ළංව සිටියද ඔවුන් ගොළුව බිහිරිව ගිය සෙයකි. අඳ නොවුනේද දිගින් දිගටම කතා කළේ ද ඔවුන්ගේ නෙත් පමණි. ඔහුගේ දෙතොලේ පහස ප්‍රාර්ථනා කරමින් ඇය දෑස වසාගත්තාය. ඇගේ පිරුණු කොපුල් සිපගන්නට නොව සෙමින් විකන්නට සිතෙන තරමට සොඳුරු විය. ඔහුගේ දෙතොල සැලිණ. එහෙත් යකැදුරාගේ හොඳම ගෝලයා නාඹර ඉලන්දාරියාට ඉඩ නොදුන්නේය. දෙවියන් යකුන් පමණක් නොව මළගිය පෙරේතයන් හා පිසාචයන් සමඟද හරි හරියට ජල්ලි අල්ලන්නට පේවුණ අනාගත යකැදුරා සිය ග්‍රහණය ලිහිල් කළේය. ඇගේ සුමුදු පහස නොලැබූ ඔහුගේ ඇවෙන දෙතොල වේදනාවෙන් විකෘති විය. ඔහු ඇය වෙතින් ඉවත්ව ගියේ බුර බුරා ඇල්වෙන ගිනිමැළයකින් ඈතට දිවෙන වනසතෙකු මෙනි.

අඩියට දෙකට මිදුලට බට තරුණයා යතුරු පැදියට නැගුණේය. එය පණගන්වන හඬින් සිහි එළවාගත් කෙල්ල දෑස විවර කළාය. තමාගේ හද පුබුදු කළ තරුණයා පලා යමින් සිටින බව තහවුරු වූයෙන් ඇය කිපුණාය. ගෙපිළේ ලී බංකුව මත වූ හිස් ආවරණය මත ඇගේ දිදුලන දෙනෙත නැවතිණ. වහා එය දෑතින් ඔසවාගත් ඇය හැකිතාක් වැරෙන් විසි කළාය.

"කුමාර..." යි ඇය ස්නේහයෙන් හෝ අනුරාගයෙන් නොව අප්‍රමාණ ක්‍රෝධයෙන් හඬ ගෑවාය.

මඳින් මඳ වන සැඩ වන හිරු රැසින් පීඩා විඳිමින් ඇය පාරක නෂ්ඨාවශේෂයක් වූ මඟක ඉදිරියටම ගමන් කළාය. කුඹුරක් කරා යන ගොවියෙක් පවා ඇයට හමු වූයේ නැත. සියළු මිනිසුන්ද නිවෙස්ද හදිසියේ අතුරුදහන්ව ගියාක් මෙනි. බියෙන් නොව කුකුසින් ඇල්වෙන දෙනෙතින් ඇය දෙමංසලකට ළඟා වූවාය. ගුරු පාර කෙළවර වූයේ තාර පාරකිනි. ඇය තාර පාරට ගොඩවූවාය. කිසියම් අදෘශ්‍යමාන හස්තයක් විසින් ගෙනැවිත්

Scanned with CamScanner

තැඹූ කලෙක මෙන් පාර දෙපස නිවෙස් දක්නට ලැබිණි. තාරපාරද ගුරු පාර මෙන් පාළුවට නොගියේය. ත්‍රීවිලරයක් ඇතින් මතුවත්ම ඇය තිගැස්සුණා ය.

ඒ හැඩිදැඩි මිනිසුන්ගේ හැඟීම් විරහිත මුහුණු සිහි කළ ඇය වහා ආපසු හැරුණාය. තාර පාරට සපුරා වෙනස් අන්දමින් අබලන්ව ගිය ගුරුපාරට පිවිසියාය. ඉනික්බිති ඇය දිව යන්නට වූයේ ත්‍රීවිලරය තමා හඹා එන කලෙක මෙනි.

ජරාජීර්ණ නිවෙස දකිත්ම ඇය සැනසුම් සුසුමක් හෙළුවාය. ඇය සොයා යන්නට යතුරු පැදිය පණගැන්වීමේ නිරර්ථක වෑයමක නිරතව හුන් සඳුන් ඇය හතිලන හඬින් හැරී බැලුවේය. අවුල්ව ගිය හිසකේද රූරා හැලෙන දහදිය ද ඇගේ පියකරු බව මුළුමනින්ම සොරාගෙන තිබිණි.

"කොහෙද ගියේ?"

ඔහු ප්‍රශ්න කළේ මහත් කෝපයෙනි. මේ නාඳුනන තරුණිය පළමුව තමාගේ රැකියාවද නවාතැනද අහිමි කළාය. ඇය තමාගේ ජීවිතයද උදුරා ගන්නට බැරි නැත. මින් පෙරද තමා මරණයේ කෲර හස්තය වෙත තල්ලු කර ඇමුවේ තරුණියක බව ඔහුට සිහිපත් විය.

ආශා ගෙට ගොඩවන පඩි කීපයෙන් එකක් මත හිඳ ගත්තාය. කඩතොළුවී ගියද ඒවා තවමත් පිරිපුන් සිරුරක බර උසුලන්නට සමත්ය. පසුගිය දිනයන්හි හරිහැටි කෑමක් බීමක් නොලද්දෙන් මඳක් කෘෂව ගියද ඇය නොපිරිහුණ ශක්තියෙන් යුතු වූවාය.

ඇයගේ ළයමඬල වේගයෙන් සැළිණ. ඔහුගේ දෙනෙත ඒ වෙත යොමු වූයේ අහම්බෙන් මෙනි. තමාගේ හිස හොවාගත්තද, තමාගේ දෙතොලේ හිරිහැරයට ලක්නොවූ ළය මඬලක් සිහිපත් වීමෙන් ඔහුගේ කෝපයද නොරිස්සුමද තුනී විය. යතුරුපැදියෙන් බට ඔහු "ඇයි ඉතිං ආවේ...? මහ ලොකුවට මාවත් පෙරලගෙන දිව්වේ... හරියට මං තමුසෙව ගිලින්ඩ හැදුව වගේනේ..." යි කීවේ සෝපහාස සරිනි.

ඇය අඹ අතු ඉති මත ඔබ මොබ දිව යන ලේනුන් දෙස බලා සිටියා විනා කිසිවක් නොපැවසුවාය.



"රෑ එළිවෙනකං මාත් එක්ක එක කාමරේ බුදියගන්ඩ බය හිතුනෙ නෑ... මෙච්චර හොඳට එළිය වැටිල තියෙද්දි තමා බයවෙලා පැනලා දිව්වේ..."

ඔහු කියන්නේ සැබෑවක් නොවේදැයි ඇයටද සිතිණ. සැබැවින්ම තමා ඒසා බියපත් වූයේ මන්ද? කුමාර පිළිබඳව වුව වැඩි තොරතුරක් නොදැනම ඇය බියෙන් හෝ සැකයෙන් නොපෙළුණාය. ඔහු සමඟ තනිවන්නට නොපැකිළුණාය.

"සීතම්මගේ කොත්තමල්ලි වතුරේ හයිය..." යි ඇය ඈත දිගු කරමින් සාඩම්බර සිනාවක් පෑයි. ඒ තමාට අවමන් කළා වූ එකියකට පහර දීමෙන් පසුවය.

"උඹට දෙන්ඩ උඹේ අම්මගේ තනේ කිරි කඳුලක් තිබ්බෙ නෑ ආසෝ... බැරි වෙලාවත් උඹ කිරි උගුරක් උරා බිව්වනං ඒ එක කිරි උගුර උඹට වහ වෙන්ඩත් තිබ්බා. ඒ තරං වයිරෙකිං කොරෝදෙකික් පැහැව පැහැව හිටියෙ ඒකි. තිරිසනෙක් වගේ තමුංට හදි කොරපු මිනිහාගෙ දරුවට ආදරයක් කරුණාවක් කොයින්ද ගෑනියෙක් ගාව..."

දියණිය සිටියදීත් මිණිබිරිය කොත්තමල්ලි වතුරින් උස් මහත් කරන්නට සිදුවීම පිළිබඳව සීතාගේ පැහැදිලි කිරීම එයාකාරය. එහෙත් අනේක දුක් ගැහැට විඳදරාගනිමින් තමා රැකගත් මිත්තණියට ආශා කිසිකලෙකත් කුළුණුබර නොවූවාය.

"මේ සිතම්මගේ මිණිබිරි නේද?" යි කිසිවෙකු විමසූ කල ඇය ලබා දුන්නේ අපූරු උත්තරයකි.

"නෑ... මං එයාගේ කරුමෙ.."

මිණිබිරියගේ නොහික්මුණුකම් ඉවසිය නුහුණු තැන "මේක නං මගේ කරුමෙ... කරුමේ විඳවන්ඩත් එපැයි..." යි කඳුළු සලන්නට සීතා පුරුදුව සිටියාය.

"මොන බම්බුවටද කොත්තමල්ලි වතුර පොව පොවා හදා ගත්තේ...? ඉපදුණ හැටියෙ බෙල්ල මිරිකලා දාන්ඩ තිබ්බනේ"

ආශාද ඇතැම්විට මිත්තණිය සමඟ දිගින් දිගටම එල්ලුණාය.

"ඔව් ඔව් උඹේ බෙල්ල මිරිකලා අරකියි මායි හිරේ විලංගුවේ වැටෙන්ඩ..."

"බෙල්ල මිරිකන්ඩ ඕනෙත් නැනේ... කොට්ටෙ මූනට තියලා තද කෙරුවනං කව්රුවත් හිරේ යන්නෙත් නැනේ..."

සීතා ඇස්ගෙඩි උළුප්පා ගනියි.

"බලාපල්ලා... ප්‍රාණඝාතේ කොරන හැටි නොවෙද මේකි මේ කියන්නේ නිකන් තඩි මරන ගානට... අප්පේ මෙහෙමත් චිංචි මානවිකාවියක්..."

ඇය අතක් නිකටේ හොවාගෙන මිනිබිරියගේ සාහසික බවේ දිග පළල මැන ගන්නට වෙහෙසෙයි.

"දැං ඉතිං ඇටිකෙහෙල් කාපු උගුඩුවා වගේ බලා ඉන්නවා... කියනවා දැංවත් තමුසෙ කව්ද? මොන බම්බුවකටද අරුං තමුසෙ පස්සෙ පැන්නුවේ....? තමුසේ පිස්සං කොටුවෙං පැනලා එනවද...? මට නම් මේ මුකුත් තේරෙන්නේ නෑ... මට ඇත්ත කියනවා"

තව දුරටත් ඉවසා සිටිය නොහැකිව සඳුන් මහ හඬින් ප්‍රශ්න කළේය. ඇය ඔහු වෙත හෙළුවේ උදාසීන බැල්මකි.

"මට නාගන්ඩෝන..."

ඇය කොතෙක් අපවිත්‍රව සිටියේද කිවහොත් ඕනෑම කෙනෙක් ඒ කතාවට එරෙහි නොවෙනවා නිසැකය. එහෙත් ඔහු කෝපයෙන් පුපුරා හැළුණේය.

"මොකක්?"

"මට නාගන්ඩෝනෑ..... නාලා අදින්ඩ ඇඳුමකුත් ඕනෑ.... මටම මාව ගඳයි..."

ඔහු ඇය වෙත ආවේ ඉක්මන් ගමනිනි.

"තමුසේ නාන්ඩ බැරිනං දියබුං ගහනවා.... මට මොකද... "මං වැඩක් හොයාගන්ඩ ඕනෑ, තමුසෙට කන්ඩ ගේන්ඩයි තමුසෙව නාවන්ඩයි. මට වෙන වැඩක් නැනේ මොන විකාරයක්ද මේ...?"



ඇය ඔහුගේ කෝපය නොතැකුවාය.

"බඩු ගෙනල්ල දුන්නොත් මං උයන්නං... මාව නාවන්ඩ ඕනෙත් නෑ... වතුර තියෙන තැනක් පෙන්නුවනං මට නාගත්තහැකි..."

ඇය කතා කළේ සන්සුන් විලාසයෙනි. ඔහුගේ කෝපයද නොරිස්සුමද මුළුමනින්ම වියළා දමන තරමට ඇය සන්සුන්ය. සාමකාමීය. ඔහු පුදුමයෙන් ඇය දෙස බලා උන්නේය. ඇය මානසික ව්‍යාධියකින් පෙළෙන්නේදැයි සැකයෙන් ඔහුගේ දෑස හැකිළී ගියේය. ඒ සැකය තහවුරු කරගත හැකි කවර හෝ සාධකයක් සොයා ගැනීමේ අරමුණින් ඔහුගේ දෑස ඇගේ සිරුර පුරා සක්මන් කළේය. ඔහුගේ බැල්ම තමා වෙත යොමුව ඇතැයි අනුමාන කළ ඇය තුළ සියුම් කෝපයක් ජනිත විය. ඉවත බලාගෙන හුන් ඇය එකවරම ඔහු වෙත හැරුණාය. එසැණින් සිව් නෙත් සම්මුඛ විය. ඔවුනොවුන් වටහාගන්නට දරන ප්‍රයත්නයක් මිස අන් යමක් ඔහුගේ හෝ ඇයගේ දෑසේ නොවීය. දොරට වැඩි බිළිඳෙක් අපමණ කුහුලින් හාත්පස පරිසරය නරඹන්නාක් මෙනි.

"මොකද බලන්නේ?"

තමා වෙත තවත් සිසුවෙක් හෙලන බැල්මක් පවා ආශාට දරුණු කලහයකට නිමිත්තකි.

"වැඩේමයි..."

කිසිවක් සොරා ගනිද්දී අතටම හසුවූ කලෙක මෙන් මොහොතක් පසුබෑ කොළුවා යළි දිරි වඩා ගත්තේය.

"මං දිහා තමා බලා ගෙන හිටියේ... මං දැක්කනේ..."

බලන්ඩම වැඩේ... හිතාගෙන ඉන්නේ මහලොකු රූපරාජිණි කියලා..."

පරණ සුදු ගවොමට වසන් කළ නොහෙන ඇගේ සුන්දරත්වය නොමඳව උරා බිව් දෙනෙතට ඒ වගක් හෙලි කළ නොහැකි නිසාම ඔහුගේ මුව මුසා බසට තෝතැන්නක් විය.

"ගිලින්ඩ වගේ බලං ඉඳලා දැං බොරු කියන ලස්සන"

Scanned with CamScanner

වෙනත් කෙල්ලක නම් මෙවන් කරුණක් ළෙදා දිගින් දිගටම එල්ලී නොයනවා නිසැකය. එහෙත් ආශා සෙදු කෙල්ලන්ට සපුරා වෙනත් වූවාය.

"කා එක්ක හරි දබර වුණ්නැත්තං උඹට වේලක් දෙවේලක් කැවේ නෑ වගේනේ... යි. ඇගේ මිත්තණිය වරෙක ඇනුම් පැ කීවාය.

"මේං බලාපල්ලකෝ... තාත්තෙකුත් නැති අම්මත් ආලා ගිය කෙල්ලෙක් කියන කතාව... ඇහුණද උඹලට.... ඉන්නේ තං අලි ඔලුවෙං... හැබැයි උත්පත්තිය කැතේ බෑ... පට්ට ගෑයි..."

සිව්පා සතෙකුට වඩා කෲර දෙපාවෙකු විසින් සිය සුරතල් පැටවා දඩයම් කළ විටෙක කුපිත වන වැලහින්න පවා ආශාගේ රෞද්‍ර බව අබිමුව දෙවන තැනට පත්වනවා නොඅනුමානය. වැලහින්නකගේද දිවිදෙනකගේද ක්‍රෝධයෙන් ඇවෙමින් ඇය අවඥාවෙන් හිනැහෙන සිසුවා වෙත කඩා පැන්නාය.

"ඒ වල් බල්ලා මගේ අම්මට කරදර කෙරුවම ඒක අම්මගේ වැරැද්දක්ද...? ඇයි කව්රුවත් ඌට මුකුත් කියන්නැත්තේ....? අම්මා මාව දාලා ගිය එක මගේ වැරැද්දක්ද.....? කුණු කතා කියන්ඩ බැරි වෙන්ඩ මං තොගෙ කට කනවා අද..."යි බැන වදිමින් ශාපකරමින්ද ඇය ත්‍රාසයට පත් කොල්ලාට පහර දුන්නා ය. ඇගේ දත් දෙපෙළට මැදි වූ ඔහුගේ යටි තොලින් ලේ රූරා හැළින. සකල විද තිරිසන් සතුන්ගේ කෲරත්වය ඇය තුළ කැටිවූවාක් මෙන් ඇය වියරු වැටී සිටියාය.

අනෙකුන් එකට එක්වී මහත් පරිශ්‍රමයක් දරා ඇගෙන් ඔහු ගලවා ගත්තේය. කොට බිත්තිය මතින් මිදුලට පැන්න කොළුවා පසුපස ඇය ලුහු බැන්දේ යක්ෂාවේශයෙනි.

පාසල් පරිශ්‍රය තුළ ඔබ මොබ යනෙන ගුරුවරුන්ගේ හා සිසු සිසුවියන්ගේ ද ඇගේ හැපෙමින් තමා ඔහු හඹා ගිය අයුරු දකිමින් ආශා හිනැහුනාය.

ඒ නපුරු හසරැල්ලෙන් සඳුන් තිගැස්සුණේය. මේ නාඳුනන තරුණිය උමතුවෙන් පෙළෙන බවට බලගතු සාධකයක් නොවේද ඒ හසරැල්ල..?



"මොකක් හරි අමාරුවක් තියෙනවනං මං ඉස්පිරිතලේ එක්කං යන්නං...."

එක එල්ලේ ඒ පිළිබඳව විමසිය නොහැකි බැවින් ඔහු තතනමින් වුව එලෙස යෝජනා කළේය. ඇය දිදුලන ඇසින් ඔහු දෙස බැලුවාය. ඔහුගේ අනුවණකමට ඇය මුවින් නොව ඇසින් හිනැහුණ සෙයකි.

මටැති අමාරුවක් නෑ. ඉස්පිරිතාලෙකට නෙමෙයි මාව එක්ක යන්ඩ ඇළකට... ඒ මුකුත්ම නැත්තං, වතුර වළකට හරි...."

සුසුමක් හෙළා සිතෙහි බර සැහැල්ලු කරගන්නට ප්‍රයත්න දැරූ තරුණයා "නම මොකද්ද?" යි විමසුවේය.

මේ මොහොත්දී කිසිසේත් අපේක්‍ෂා නොකළ ඒ ප්‍රශ්නයෙන් පුදුමයට පත්වූ ඇය මඳ නිහැඬියාවකට පසු හිනැහුණාය.

"දුන්නම කන්නා..."

ඔහුගේ වියළි දෙතොල'ග සිනාවක් නොනැගිණි. ඔහු වඩාත් උවමනාවෙන් හා තියුණු ඇසින් ඇය දෙස බලාගත්වනම සිටියේය. ඒ බැරෑරුම් බැල්ම ඔහුට වසර කීපයක වැඩිමහල් පෙනුමක් ලබා දුන්නේය. පසුගිය තෙවසර මුළුල්ලේ තැන තැන යමින් අතට අසුවූ වැඩපල කිරීමෙන් ඔහුගේ කඩවසම් බව මඳක් පළුදු වී තිබිණ.

6

මධ්‍යාහ්නය කොතෙක් උනුසුම් වීද කිවහොත් ඇසිල්ලකින් හාත්පස සියල්ල ගිනිගෙන ඇවිළෙනු ඇතැයි ඕනෑම කෙනෙක් තුළ සැක සංකා පහළවන සුළුය.

කය වෙහෙසා කිසිදු වැඩක් පලක් නොකළද ඔවුන් දහදියෙන් තෙමී සිටියහ. ඇය කැටිව වැවට යාමට ඔහු පැකිළුණේය. ගැමියෝ සිඳී යන වැව කරා වේලාවක් අවේලාවක් නොබලා යති. ඔවුන් සමඟ කිසිදු ඥාතිත්වයක් හෝ හිතමිතුරුකමක් නැතත් තමා තරුණියක කැටිව ආ බව ගම පුරා විදුලි වේගයෙන් පැතිරී යනවා නිසැකය. එබඳු කටකතාවක් පවා නොතකා හරින්නට ඔහුට පිළිවන. ඔහු ළතවූයේ නවාතැනේ දමා ආ ඇඳුම් බෑගය පිළිබඳවය.

"ඇඳුම් බෑග් එකවත් ගන්ඩ බැරි වුණානේ..."

සඳුන් කීවේ කනස්සල්ලෙන් බරව ගිය හඬිනි.

"ඉතිං මේ ගෙදර ඔයාගේ ඇඳුම් තියෙන්ඩ එපැයි"

හැඩක් වැඩක් නැති රෙදි රඳවනය දෙස බැලූ ඇය ඔහුගෙන් පිළිතුරක් බලාපොරොත්තු වූවාය. ලී රඳවනය මත වූයේ සරමක් කමිසයක් හා තව දුරටත් පාවිච්චි කළ නොහැකි තුවායක් පමණි.

"මගේ ඇඳුම් තියෙන්ඩ මේක මගේ ගෙදරක් යෑ..."

"එහෙනං...? එහෙනං කාගෙද මේ ගෙදර?..."



ඔහු ඇඳමත වූ ඇතිරිල්ල දැතින් ගත්තේය.

ගසාබසා දමන්නටත් පෙර එයින් පිට වූ දූහුවිලි ජනේලයෙන් කාමරයට කඩා වදින හිරු කිරණේ රඟන්නට විය.

"කෝ ඉතිං මේ ගෙදර මිනිස්සු?"

ඇය අපමණ කුතුසින් යළිත් ප්‍රශ්න කළාය.

"අයියයි මල්ලියි තමා හිටියේ."

"ඉතිං ?"

ඇය කතාන්දරයකට කන්දෙන දැරියකගෙන් වෙනස් නොවූවාය.

"අයියා කසාද බැඳලා තාර පාර අයිනෙන් ඉඩං කෑල්ලකුත් ඇරං ගේකුත් හදාගත්තා...."

ඇගේ උනන්දුව කොතරම් මහත්වීද කිවහොත් ඇය කිළිටි මෙට්ටය මත හිඳ ගත්තාය. නාඳුනන තරුණයකු සමඟ මේ පියකරු කාමරය තුළ තනිවීමට ඇය මේ මද්දහනේ නොපැකිළුණාය.

"ළමයිනුත් හම්බ වුණාට පස්සේ අයියට ඕන වුණා මේ ඉඩමයි ගේයි. මල්ලිව පන්නගන්ඩ දැගලුවා. ඒ යකා කොයි ලෝකෙ යන්ඩද.."

"ඉතිං? ඉතිං?"

ඔහු මඳකට හෝ නිහඬවීම නොඉවසමින් ඇය පෙරට නැමුණා ය. සඳුන් ජනේලයට පිටුපා සිටගෙන සිටියේය. ඔහු වටා ඇබිත්තන් වළාකුළක් මෙන් තවමත් දූහුවිලි අංශු කැරකෙයි. ඇය දුටුවේ මේ ගෙදර දෙසොහොයුරන්ය.

"ඉතිං මල්ලි අයියට උදැල්ලෙන් කොටලා මැරුවා...."

ඒ බිහිසුණු බේදවාචකය ඔහු ඉතා පහසුවෙන් කියා නිම කළේය. ඇගේ දෑස මහත්සේ ඇරිණ.

"එතකොට ඒ මිනිහගේ ගෑනියි ළමයිනුයි ?"

Scanned with CamScanner

කම්පා වීම පසුවට තැබූ ඇය වියළි හඬින් ප්‍රශ්න කළාය.

"ඒ ගැනි ගේයි ඉඩමයි විකුණලා ළමයිනුත් ඇරං ගමට ගියා...."

අයියා මරා දැමූ මල්ලි සිර දඬුවම් විඳිමින් සිටින බව ඇය වටහාගත්තාය. එය මරණ දඬුවමද නැතහොත් වසර විස්සක් වැනි දීර්ඝ කාලයක්දැයි ඇය ප්‍රශ්න නොකළාය.

"අමරේ අයියා මගේ යාළුවා... අපි එකට වැඩ කෙරුවෙ කොළඹ. මටත් යන්ඩ එන්ඩ තැනක් නැති හිංදා අමරේ අයියත් එක්ක මෙහේ එනවා වැඩ ඉවරවුණාම..."

හමුවූදා පටන් තමාට කාරුණික වූ මිතුරා සිහි කළ සඳුන් සුසුමක් හෙළුවේය. සුසුමක් හෙළන්නට පමා නොවූ ආශා වහා නැගී සිටියාය.

"කොහෙංද නාන්නෙ?"

මේ සා බිහිසුණු හා දුක්ඛිත කතාවකට ඇහුම්කන් දීමෙන් පසුවද ඇය දිය නෑම පිළිබඳව මේසා උනන්දුවක් දැක්වීම ඔහුට විමතියට කරුණකි.

"වත්ත පල්ලෙහදී තමා අමරේ අයියා වික්‍රමෙ අයියට කෙටුවේ...."

ඇය ඇඳුම් රඳවනය මත වූ සරම අතින් ගත්තාය. දියට හඳින්නට චීත්තයක් සෙවීමෙන් පලක් නැතැයි අවබෝධ කරගත්තාක් මෙනි.

"වික්‍රමේ අයියා ලේ පෙරාගෙන මිදුලට දිව්වා. අමරේ අයියා පස්සෙං පන්නලා තව පාරක් කොටන්ඩ හැදුවා. ඒත් ඊට කලින් වික්‍රමේ අයියා වැටුණා. මැරිලමයි වැටෙන්ඩ ඇත්තේ..."

ඔහුගේ හඬ සැලිණ. ඒ සාහසික ඝාතනයේ එකම සාක්ෂිකරු ලෙස තමා විඳින පීඩාව නොවලහා හෙළි කරන්නට ඔහුට උවමනා විය.

"හොඳ වැඩේ... එක ගෙයක් තියෙන මිනිහෙකුට තව ගෙයක් මොකටද... තියෙන තණ්හාවටනේ. මරල මදි..."



බියෙන් ඇස් උඩ ඉන්දාගත් කෙල්ලක දක්නට අපේක්ෂා කළ හෙතෙම ඒ ප්‍රතිචාරයෙන් අන්දුන් කුන්දුන් විය. ඇය කාමරයෙන් පිට වූයේ ඇගේ මිත්තනිය මෙන් නොකඩවා කියවමිනි. ඝාතකයා ට නොව ක්‍රෑර මරණයට පත් වූ මිනිසාට බැන වදිමිනි.

සඳුන් අතකින් හිසකේ අවුල් කළේය. ඇතිත් හිසකේ සිඳිමින් "මොකියක්ද මේකී?" යි හඬ නඟා අසන්නට ඔහුට උවමනා විය. අනපේක්ෂිත ලෙස තමාගේ ජීවිතයට සමීප වූ රූපිකා භීතියද, ශෝකයද, සොම්නසද නොමඳව පුදා දුන්නාය. හරියට වේදිකාවේ රඟන ගයන නිළියක මෙනි. ඇගේ බැල්මේ පවා වූයේ පිරිමි සිතක්. චමත්කාරයෙන් පුරවාලන සෞන්දර්යයකි. මසකට වරක්වත් රූපලාවන්‍යාගාරයක සේවය ලබන බව කියාපාමින් ඇගේ දෙබැම පවා නොදිලිණිදැයි ඔහු කල්පනා කළේ සුසුමක් හෙළමිනි.

"ඇහි බැමත් හදලා..." යි සිරිමා නැන්දා අවලාද නැගූ කල සඳුන්ගේ මව වහා සිය නැනන්ඩිය වෙනුවෙන් පෙනී සිටියාය.

"කොයි කෙල්ලද අද කාලේ ඉතිං ඔය සැලුන් ගානේ නොයන්නෙ?"

"තොලුත් පාට කරයි..."

තරබාරු ගැහැනිය දෙවුර හකුලමින් නොමනාපය පළ කළාය.

"ඔය කාලේ ඔච්චා කරන්නැතුව ආයෙ නාකි වෙලා කරන්නැයි"

දයාසීලි සිනාසුනේ ඥාතිවරියගේ නොරිස්සුම තුනී කරන අටියෙනි. එහෙත් සිරිමාගේ මුහුන තවත් එල්ලා හැලුණා මිස සිනාවක සේයාවක් හෝ නොනැගිණ.

"අනේ මංදා... ඔහැටි විච්චූර්ණ කරන්ඩ ගියොත් නං කොල්ලා හම්බ කරන තුට්ටු දෙක මදිවෙයි."

ඇය තව දුරටත් අළුත ගෙනා මනාලියගේ කල්කිරියාව හෙළා දුටුවාය.

Scanned with CamScanner

"ළමයෙක් දෙන්නෙක් හම්බුණාම ඔච්ච ඇරිල යයි අක්මෙ

කොතෙකුත් තමා ලුහු බඳින ඇස් ඇත්ති දරුවෙකු සමඟ එක්ව දකින්නට සඳුන් අපොහොසත් විය.

"උඹ අද අනුරාධපුරේ යනවද...?"

අරුණ නැඟී දෙපැයක් ඉකුත් වූ වග නොතකා තවම ඇඳේ වැතිර සිටින තරුණයා දෙස නොපහන් බැල්මක් හෙලමින් දයාසීලි ඇසුවාය.

"හෙටම යනවා..."

ඇය ජනේලය විවර කළේ "හැමදාම හෙට තමා... බාලගිර දෝසේ වගේ හෙට හෙට..." යි නෝක්කඩු කියමිනි.

ඔහු අනෙක් පස හැරුණේ ඇගෙන් මෙන්ම කාමරයට කඩා වදින හිරු රැසින්ද ගැලවීම පිණිසය.

"එතෙන්ට බැරිනං වෙන තැනකට හරි යන්න බැරියැයි..."

සිය පුත්‍රයාගේ මුවින් වචනයක් පිටවනතුරු ඇය නොඉවසිල්ලෙන් පසු වූවාය.

"කොතෙන්ට යන්ඩත් මාසෙ මැද බෑනේ අම්මා... ලබන මාසෙම යන්නං..."

ඒ කතාවෙන් ඇගේ කෝපය තවත් උත්සන්න විය.

"උඹ ගිය මාසෙ කිව්වෙත් ඔය කතාවනෙ...."

පොරෝණය පසෙකට විසි කරමින් ඔහු ඇඳ මත හිඳ ගත්තේය.

"යන්නං යන්නං... අම්මට ඉතිං මම ගෙදර ඉන්නවා පේන්ඩ බෑනෙ... එළව ගන්ඩම තමා හදන්නෙ..."

ඇගේ කෝපයට ශෝකයද මුසුවිය.

"එහෙම් නෙමේ පුතේ... මං මේ කියන්නෙ උඹේ හොඳටනෙ. නිකං මෙතන කාලෙ කකා ඉඳලා හරියනවද.... කීයක් හරි හොයාගන්නැද්ද... මාමා පිළිවෙළක් වුණා වගේ උඹත් කවදාහරි කසාදයක් බඳින්ඩ එපැයි.



මොනව කරන්ඩත් සල්ලි එපැයි... මොකද ආයෙ අපිට තේ වතු රබර් වතුවලින් සල්ලි එනවා කියලයෑ...."

"ඇති ඇති" යි කෑ ගැසූ සඳුන් ඇඳෙන් බැස්සේය.

"බලාපල්ලා කටේ සද්දෙ..."

ඒ උච්ච ස්වරයට ඇය මෙල්ල කළ නොහැක.

"පුකට ඉරේලිය වැටෙනකල් බුදියනවා... ඊට පස්සේ තම්බල තියෙන දෙයක් ගිලලා නාලා හැඩවැඩ වෙලා යනවා රස්තියාදුවෙ... කුරුල්ලා කොබෙයියත් ලැගුමට එනවා කළුවර වැටෙද්දි. ඒකට මේකා... රාත්තිරි වෙනකං මේ ගෑනි තට්ට තනියෙං නේද කියලා එක ඩිංගක් හිතනවද..."

ඇගේ කන්දොස්කිරියාවෙන් ගැලවෙන අදහසින් පමණක් නොව මුහුන කට සෝදා ගැනීම පිණිස ඔහු ළිඳ වෙත ගියේය. අඩක් වතුර පිරුණු ටැංකියේ ගැට්ට මත හිඳගත් හෙතෙම සන්සුන් වන්නට යත්න දැරුවේය. එහෙත් තමා කළඹන්නේ අම්මාගේ කන්දොස්කිරියාව නොව රූපිකාගේ දඟකාර ඇස බව පසක් වූයෙන් තිගැස්සුණේය.

"වෙනදා වගේ හිතිච්ච හිතිච්ච වෙලාවට මහගෙදර දුවන්ඩෙපා පුතේ... නැන්දා වුණත් ඉතිං ඇහැට කනට පේන ළමිස්සියක් නේ. දවල් තිස්සෙම ඉන්නෙ තනියමනේ..."

තමාට උපදෙස් ලබා දීමෙන් අම්මා වෙහෙසට පත් නොවන්නේදැයි ඔහු සිතුවේ කළකිරීමෙනි.

"ඇයි කිරියත්තා..."

ඔහු මුත්තණුවන් සිහි කළේ රූපිකා මහගෙදර හුදෙකලාව පසුවන බව සිතීමෙන් ජනිතවූ කණස්සල්ල තුනී කර ගැනීම සඳහාය.

"කිරියත්තා ඉතිං ලෙඩා දූකා... හිටියත් නෑ වගේනෙ...."

කතා කරන්නටවත් කෙනෙකු නොමැතිව ඒ තරුණ ගැහැනිය සංකාවෙන් පෙළෙන්නේදැයි කණස්සල්ලෙන් ඔහු නිකට කැසුවේය.

Scanned with CamScanner

"ඉතිං අම්මට බැරියැයි උදේට ගිහිල්ලා හවසට එන්ඩ" යි ඔහු යෝජනා කළේ රෝගී මහල්ලා නොව තරුණ ගැහැණිය පිළිබඳව ළතැවුලිනි.

"වෙන වැඩක් නැනේ මට එක එක්කෙනාට තනි රකිනවා මිසක. ඒ ගෙදෙට්ට ආවනං ඒ ගෙදර වැඩපල කරගෙන ලෙඩ්ඩුත් බලාගෙන තමුන්ගේ මිනිහාටත් සලකගෙන දරුවෙක් හදාගන්න දැනගන්ඩ ඕනෑ ගැනියෙක් වුනහම.... ඇවිල්ලත් දැං මාස තුනකට කිට්ටුයිනෙ.... ඔය රටේ නැති පෙති ගිල ගිල අන්තිමට ළමයි නැතිම වෙයිද කව්ද දන්නෙ..."

තරුණ පුත්‍රයා අහළ පහළ සිටින බව දැන දැන වුව දයාසිලි ඔහේ කියාගෙන යයි.

"ඇත්තටම එයා බබ්බු හම්බවෙන්නැතිවෙන්ඩ පෙති බොනවද?"

පුවක් ගස් ගොන්නේ සෙවණද සිහිලසද ඔහුට නොදැනිණ. ගහක් කොලක් තබා තණ පඳුරක්වත් නැති කාන්තාරයක අතරමංවූවෙකු මෙන් ඔහුගේ සියොළඟ දැවී ගියේය.

"මොනවද අප්පේ ඔය තරම් කල්පනා කරන්නේ?"

පළමුව ඔහු වෙත වතුර දෝතක් විසි කළ ඇය දෙවනුව හඬ නගා හිනැහුණාය.

කිසිදු මොහොතක තම සිත අතහැර ඉවත නොයන ගැහැනියගේ සොඳුරු රූපකාය නෙත ගැටෙත්ම ඔහු පුදුමයෙන් මුව විවර කළේය. හදිසියේ විදුහල්පති දුටු සිසුවෙකු මෙන් වහා නැගී සිටියේය. ඔහුගේ ළය මඬල වේගයෙන් ගැහෙන්නට විය. හරියට හිටි හැටියේ අසාධ්‍ය රෝගයකට ගොදුරු වූවාක් මෙනි.

"මොකද අනේ මේ?... හරියට හොල්මනක් දැක්කා වගේ"

ඇය කතා කළේ අමනාපයෙනි. තෙදිනකට පසු තමා දකින තරුණයා මුව පුරා හිනැහෙනු ඇතැයි ඇය තුළ වූ බලවත් අපේක්ෂාව බිඳ වැටුණ බැවිනි.

"කා.... කා එක්කද ආවේ? කොහොමද ආවේ...?" යි ඔහු වටපිට බලමින් ඇසුවේය.



"කව්රුවත් මොකටද මට මෙහෙට එන්න... මහ දුරක් යෑ..."

"එ.... එතකොට කිරියත්තා?

"හා... ඔයාගේ මාමා මාව ගෙනාවෙ ලෙඩ්ඩු බලන්නද...? හරි ෂෝක්නෙ..."

ඔහුගේ හිස පහතට නැඹුරු විය. නිරුත්තර වූ තරුණයා දෙස ඇය බලා සිටියේ ආරූඪ කරගත් කෝපයෙනි. මැඩගන්නට යත්න දරන සිනාව හේතු කොටගෙන ඇය වෙත අපූර්ව සුන්දරත්වයක් එක් විය.

"න්.... නෑ... ඉතිං... කිරියත්තව ආලා එන්නේ නැතේ එහෙම තනියම...."

"එයා පොඩි බබෙක් නෙමේනේ... ඔයානේ මෙතන පොඩි බබෙක් වගේ තටමන්නේ..."

ඔහු නැවතත් වැංකියේ ගැට්ට මත හිඳගත්තේය. ඇගේ දෑසින් සිය තෙල් බේරෙන මුහුන සඟවා ගන්නට ඔහුට උවමනා විය.

"ඇයි ඒ පැත්තේ ආවෙ නැත්තෙ?"

මෙවර ඇය කතා කළේ පහත් හඬිනි. ඔහු කිසිවක් නොපැවසුවේය. ඇය නැවතත් "අම්මා එන්ඩ එපා කිව්වද"යි ඇසුවේ තරමක ළතැවුලිනි.

"නෑ ඉතිං .... මාමත් දැං ඉස්සර වගේ නෙමේ... හරි වෙනස්..."

ඇය තවත් පියවරකින් ඔහුට ළං වූවාය.

"මාමා මුකුත් කිව්වද?"

ඔහු හිස දෙපසට සැලුවේය.

"නෑ..."

ඇය සුසුමක් හෙළුවාය. ඇය පවසන්නට අරඅඳින්නේ කුමක් හෝ වේවා ඊට කන්නොදී පලා යාමට ඔහුට උවමනා විය.

Scanned with CamScanner

දැනටමත් ඇය තමා කළඹා තිබෙන තරම හොඳටම ප්‍රමාණවත් ය. එහෙත් නැඟී සිටින්නට තරම් ධෛර්යයක් එක්රැස් කරගන්නට ඔහු අපොහොසත් විය.

"ජාලිය හරි හොඳයි... මට කිසි අඩුපාඩුවක් කරන්නෙ නෑ... ඒ වුණාට සඳුන් මට හැම තිස්සේම රුවන්ව මතක් වෙනවා... මගේ පපුව පිච්චිලා යනවා... ඔයාව දැක්කාම මට ලොකු සැනසීමක් දැනෙනවා සඳුන්... අනේ නැවිත් ඉන්න එපා... අම්මට හොරෙං හරි දවසකට එක සැරයක් හරි ඇවිත් යන්න සඳුන්... ඔයා එයි කියලා බලා ඉඳල බැරිම තැන තමා මම මේ ආවේ..."

ඒවා වචන පමණක් නොවීය... සිය මිය ගිය ප්‍රේම වන්තයා සිහිකොට තැවෙන පෙම්වතියකගේ විලාපය විය. අනෙක් අතට ඒ මිය ගිය පෙම්වතාගේ ස්වරූපය උසුලන්නාවූ තරුණයාගේ හදවත පාරන කඩු තුඩු හදිසිය.

"මම රුවන් වාගේ වුණාට රුවන් නෙමේනේ..." යි කියා ගන්නට නුපුළුවන් තරමට ඔහුගේ දෙතොල වියළී ගොසිනි.

"අපේ ගෙදරින් රුවන්ට කැමති වුණේ නෑ රස්සාවක් නෑ කියලා... එයා ත්‍රිවිල් එකක් ගත්තේ හයර් යන්ඩ ආසාවට නෙමේ. රස්සාවක් නැතිකමට ඉක්මනට මාව කසාද බඳින්ඩ හිතාගෙන. අනේ ඒ වුණාට එයාට යන්ඩ වුණේ අන්තිම ගමන... මං හිතාගෙන හිටියෙ ආයෙ බඳින්නෑ කියලා... අම්මාගෙන් බේරෙන්ඩ බැරිවට වඩා නංගි රණ්ඩු කරන්ඩ පටන් ගත්තා මං හින්දා එයාගේ මගුල කල් යනවා කියලා... අන්තිමට මං ජාලියට කැමති වුණා..."

ඇය දිගු කතාවක් ඉතා කෙටියෙන් කියා හමාර කළාය. එහෙත් ඒ ඒ සිදුවීමට සරිලන පරිද්දෙන් ඇගේ හඬ උස්පහත් විය. සුසුමක ඉකියක දැවටුණේය.

"මට හැමදේම එපාවෙලා හිටියේ... ඒ වුණාට ඔයාව දැක්කහම මගේ රුවන් මං ඉස්සරහ හිටගෙන ඉන්නවා වගේ. මට අදහගන්ඩ බැරි වුණා..."

තව දුරටත් ඇය ඇගේ පෙම්වතා පිළිබඳව කතා කිරීම ඔහුට ඉවසිය නොහැක.



"ඉතිං මට මොනවද කරන්ඩ කියන්නේ...?" යි ඔහු ඇසුවේ අපමණ කෝපයෙනි. ඇගේ ඇසි පිය වහ වහා සැලිණ.

"ඔයා මොනව කරන්ඩද සඳුන් මගේ කාලකණ්නිකමට"

ඇය පුවක් ගසකට හේත්තුවී හඬන්නට පටන් ගත්තාය. ඔහු වහා නැඟී සිටියේ ය.

"අඬන්ඩ එපා... අම්ම ආවොත්..." යි ඉල්ලා සිටිමෙන් හා අනතුරු ඇඟවීමෙන් සෑහීමකට නොපත් තරුණයා ඇය වෙත ළං විය.

"අඬන්ඩ එපා..."

මෙවර ඔහුගේ ස්වරය කොතරම් මෘදු මොළොක් වී ද කිවහොත් ඇය ආපසු හැරුණාය. ඔහුගේ නිරුවත් ළය මඬලේ හිස හොවාගත්තාය. ඒ ස්පර්ශය මිහිරකට වඩා ඔහු බියෙන් හා චකිතයෙන් කළඹාලීය.

"මං දන්නවා... මං වැරදියි. අනේ ඒ වුණාට මට ඔයාව නොදැක ඉන්න බෑ..."

ඔහුගේ දෑතේ දැඩි ග්‍රහණයෙන් ඇගේ මනහර සිරුර රිදුම් දුන්නේය.

"තරහද...?"

ඇය සිප වැළඳගනිමින් ඔහු ඇසුවේ කෙඳිරිල්ලක් තරමට පහත් හඬිනි.

"ම්... මාව අතාරින්ඩ..."

නිහඬ සන්සුන් තරුණයාගේ ආක්‍රමණශීලි බවින් තැතිගත් ඇය බැගෑබර හඬින් අයැද්දාය.

"දයාසීලි අක්කා එයි... මාව අතාරින්ඩකෝ..."

මව සිහිපත් කළ සැණින් ඔහුගේ අනුරාගය වියැකිණ ඇය අත්හළ ඔහු ළිඳ වෙත හැරුණේය. සම්පයෙහි සිත් ගැ ළඳක සිටින බවක්. නොදන්නවාක් මෙන් වතුර අඳින්නට පට ගත්තේය. වතුර පිරුණු බාල්දියේ බර ඉසිලිය නොහැකිවා

මෙන් හඬ නඟන බොලොක්කය දෙස ඇය කඳුළු පිරි දෙඇසින් බලා සිටියාය.

කළ ගෙඩියක්ද උකුලෙ හොවාගෙන ආ දයාසීලි දුටුවේ ටැංකිය පුරවන පුත්‍රයා හා කතුරුමුරුංගා ඉති කඩන නැනත්ඩියයි.

"ඈ නංගියේ කොයිවෙලේද ආවෙ...?" යි ඇය මහත් පුදුමයෙන් ඇසුවාය.

"මේ දැන් ආවා විතරයි අක්කේ... කතුරු කොළ ටිකකුත් කඩාගෙනම ගෙට එන්ඩ හිටියෙ... නැත්තං ඉතිං අක්කත් එක්ක කඳේ වැටුණාම මට කතුරු කොළ අමතක වෙනවා" යි කී රූපිකා මුව පුරා හිනැහුණාය.

"ඇයි නංගියේ.... කතුරු කොළ මැල්ලුං කන්ඩ ආසයි කිව්වනං මං මලවලාම ඇරං එනවනේ..."

මවගේ හඬෙහි ගැබ්වූ සන්තුෂ්ටිය හැඳිනගත් සඳුන් කතුරු මුරුංගා ඉති ගොන්නක් අතැති තරුණිය දෙස බැලුවේය. ඔහුගේ තියුණු ඇස මඟ හරිමින් ඇය දයාසීලි වෙත ළං වූවාය.

"නෑ අක්කේ... තාත්තගේ කටේ තුවාල... බෙහෙත්වලටද මංදා... කතුරු කොළ හොඳි කන්ඩ ඕන කිව්වා.... අරයත් ගෙදර නෑනේ... ඉතිං මං ආවා..."

ඉත සිතින් ප්‍රාර්ථනා කළ යමක් කඩවීමේ දුක දයාසිලීගේ මුහුන අඳුරු කළේය. එහෙත් ඒ හා ම නැනත්ඩිය සිය පියා කෙරෙහි දක්වන ඇල්ම හා අවධානය පසක් කරගනිමින් මඳ සිනාවක් පෑවාය.

"අනේ මංදා... මල්ලි දැනගත්තොත් බනී තනියම ආව කියලා... තාත්තත් තනියම නේද ගෙදර...?"

"සිරිමා නැන්දා ආවා..."

එවර දයාසිලීගේ මුහුණ ආලෝකමත් විය.

"අප්පේ ඇති යාතං... අද ඉතිං අපේ තාත්තට කන්ඩ බොන්ඩ ඕන්නෑ,.. කයිය ගහයි දෙන්නත්තෙක්ක මුළු දවසම..."



මුත්තනුවන්ගේ මෙන්ම සිරිමාගේද කන් ඇසීම දුර්වලය. ඔවුන් අතර පිළිසඳර මහා ගෝෂාවක් වන්නේ නිතැතිනි.

"මාත් එහේ යන්ඩ කියලා කොළ කැඳ ටිකකුත් හැදුවා තාත්තට... යං එහෙනං..."

අම්මාද රූපිකාද නිවෙස වෙත ගමන් කරන අයුරු බලන්නටවත් සඳුන් නොනැවතුණේය. ටැංකිය කට පෙත්තට පුරවා ඇමීමෙන් පසු ඔහු මුහුන කට සෝදාගන්නවා වෙනුවට නාගන්නට සිතුවේය. පළමු වතුර බාල්දිය හිසෙහි හලා ගන්නට බලවත් ආයාසයක් දැරිය යුතු වුවද දෙවන තෙවන වතුර බාල්දිවලින් පසු කය කිළිපොළා යන සිහිලසට ඔහු පුරුදු විය. ඇගේ ස්පර්ශයෙන් උණුසුම් වූ සිරුරට වතුර බාල්දි එකක් දෙකක් නොව පනහක් හැටක් වුව ප්‍රමාණවත් නොවීය.

ඒ මතකයෙන් ආතුර තරුණයා සුසුමක් හෙලන්නට හෝ පමා නොවී කාමරයෙන් පිට වූයේ තවමත් තමා නම නොදන්නා එකියට කුමක් වී දැයි කුකුසින් පෙළෙමිනි.

තමාගේ මඟපෙන්වීමකින් තොරව ඇය ළිඳ සොයා ගත් බව නිසැකය. ළඳ බොළඳ එකියක නොවන ඇය මේ වනවිටත් දිය නාමින් සිටින බව ඔහුට සහතිකය. ළිඳ සමීපයෙහි රෙදිවැලේ ඇය හැඳ හුන් දිගු රැලි සාය හා බ්ලවුසය මඳ සුළගේ සෙමින් සැළින. වටපිට බැලුවද ඇය කොතනකවත් දක්නට නොලැබීමෙන් ඔහු පුදුමයට මෙන්ම බියටද පත් විය. ඇය ලුහුබැඳි මිනිසුන් හොර රහසේ සැඟවී සිට ඇය පැහැරගෙන ගියේද...? කීප වරක් විමසුවද ඇය සිය නම හෙළි නොකිරීම පිළිබඳව ඔහු කිපුණේය.

"නමවත් දන්නැතුව මොකක් කියල අඬගහන්ඩද.... ෂික්..."

සඳුන් ළිඳ දෙස විමසිලිමත් බැල්මක් හෙලුවේය. බැම්මක් බැඳ නැතත් ලී දඬු යොදා ළිඳ වටා ගල් අතුරා කිසියම් ප්‍රසන්න තත්වයක පැවති ළිඳට අත්ව ඇත්තා වූ දුර්දශාව දුටු ඔහු සංවේගයෙන් ඇළලී ගියේය. අමරසිරිට සිර දඬුවම ලැබීමෙන් පසු තමා මෙහි පැමිණියේ වරක් දෙවරක් පමණක් බව සිහිපත් කරමින් ඔහු ළිඳට එබුණේය දිරා ගිය ලී දඬු මත පය තැබීමේදී ඔහු බෙහෙවින් පරිස්සම් විය.

"මං කොච්චර කෑගැහුවද..."

ඔහුගේ මුහුන දුටු සැණින් ආශා උස් හඬින් දොස් පැවරුවාය.

බොහෝ විට අනපේක්ෂිත සිදුවීම්වලට මුහුන දී ඇතත් ඔහු මේ සා පුදුමයට පත් නොවුවා නිසැකය. ලී දඬුද කඩාගෙන ළිඳට ඇද වැටෙන තරමට ඔහු පුදුමයෙන් උතුරා ගියේය.

නම නොදන්නා කෙල්ල ළිඳ තුල සිටියාය. ළිං පත්ලේ දිය බොරවී දුගඳ හමමින් තිබුණේ මේ දෙපාවාට පෙර සිව්පාවෙකු ඇද වැටීම හේතු කොටගෙනය.

"මළ මගුලයි... තමුසෙ ළිඳට වැටුන ද?.. පරිස්සමට අඩිය තියන්ඩ දන්නෙ නැද්ද?..."

සඳුන් පමණක් නොව අමරසිරිද හැඳි සරම හැඳගෙන උන් කෙල්ල ජීවිතය හැරගියා ගොස් දින කීපයක් විය හැකි මිමින්නා ඔසවා ගත්තාය.

"කව්ද වැටුණෙ...? මං වැටුණෙ නෑ.... මං පැන්නා..."

ඔහු දෑතින් හිස බදා ගත්තේය. ඇයගේ හෙළිදරව්ව විඳදරාගත නුහුණුව ඔහුට කෙඳිරි ගෑවිණ.

"ළිඳට පැන්නා...?"

7

පුපුළ වැලින් වැසී ගිය තහඩු වහළය මත පොල් අත්තක් පතිත වී තිබිණ. එහි බරින් නොව මඩුවේ එක් කණුවක් දිරාපත්වීම හේතු කොටගෙන පසෙකට ඇළවී තිබිණ.

දර පමණක් නොව කැත්ත උදැල්ල හා වී ගබඩා කිරීම සඳහාද තනා තිබූ මඩුව කරා ගමන් ගන්නා තරුණයා යළි යළි දුටුවේ හිත මිතුරාය.

"අමරේ අයියේ" ඔහු සෝබර හඬින් කොඳුළේය.

අමරසිරි ගොවිතැන ප්‍රිය කළේය. රුදුරු හිරු හා වියළි පොළොව සමඟ අරගල කිරීමෙන් ඔහු සතුටු වූයේ පන්දු කෙළින කොළුවෙකු මෙනි.

දෑතේ කරගැටද දෙපයේ නිය පැසවීමද ඔහු කුඹුරට බැසීමෙන් වළක්වාලන්නට සමත් නොවීය. එහෙත් සඳුන් රිය මුළුල්ලේ කෙඳිරි ගෑවේය. තමාගේ සිරුර පෙළනා රිදුම් නොතැකූ අමරසිරි මිතුරාට සාත්තු සප්පායම් කළේය.

"අනේ අමරේ අයියේ" යි සඳුන් නැවතත් තොල් මතුළේ ඒ මතකය බෙහෝ දුක්බර බැවිනි. සිරදඬුවම් නියමව සිරගතව සිටින්නේ ඉමක් කොණක් නැති නිල් අහස යට ඉතිර පැතිර ගිය කෙත් යායක කය වෙහෙසා දහදිය වගුළ තරුණයෙකි.

දර මඩුව තුළට රිංගන කල සඳුන් කිපුණේ ස්වල්ප වේලාවකට පෙර මහත් පරිශ්‍රමයක් දරා ගොඩට ඇදගත් කෙල්ල සමඟිනි.

"සතෙක් ළිඳට වැටිල ඉන්නව දැක්කහම මොන මෝඩයද ළිඳට පනින්නේ..."

ළිං පත්ලේ මීමින්නා දුටු කෙනෙහි දෙවරක් නොසිතා තමා ළිඳට පැන්න බව ඇය කී කල ඔහු බැන වැදුණේය.

"මං හිතුවෙ නෑ මැරිලා කියලා... පණ පිටිං ඉන්නවනං ළිඳට පැනල හරි බේරගන්ඩ එපැයි...."

ඉගටිය තෙක් වතුරේ නැඟී සිටිමින් ඇයද උත්තර දුන්නාය.

"තමුන්ගේ ළමයිනුත් ළිඳට දාන අම්මලා ඉන්න රටක් මේක. තමුසේ මේ කැලේ සතෙක් බේරගන්ඩ පණ එපා කියලා ළිඳට පැන්නා..."

පැයකටත් වඩා අධික කාලයක් ළිඳ තුළ සිටීමෙන් හෙම්බත් වූ ආශා දිවි දෙනක මෙන් ගෙරෙව්වාය.

"මගෙං හොඳ කුණුහරප අහගන්නැතුව මාව ගන්නවා ගොඩට... උඩ ඉඳගෙන මට බැන බැන ඉන්නේ හරකෙක් වගේ..."

ඔහු කොතෙක් නොසන්සුන් වීද කිවහොත් මඳක් පරිස්සම් නොවුණේ නම් ළිඳට වැටෙන්නට පවා ඉඩ තිබිණ.

"අනේ මාව ගොඩට ගන්න.... සීතලයි... මට බයයි.... අනේ ඉක්මන් කරන්ඩකෝ..." යි බැගෑපත් වෙනවා. වෙනුවට මේ කෙල්ල තමාට තර්ජනය කරන බව දැකීමෙන් ඔහු පුදුමයට පත් විය. දන්නා තරමක් කුණුහරුප හඬ ගා කියා ඇයට බැණ වදින්නට උපදින සිත මැඩගත් ඔහු ඇය ගොඩට ගත හැකි මඟක් පිළිබඳව කල්පනා කළේය.

"උඩ බලාගෙන ඉන්නැතුව ගේනවා කඹයක්..."

ළිං පත්ලේ සිටියදීත් ඇගේ කටේ සැර... ඇයට මළ මීමින්නා සමඟ ඉන්නට ඉඩහැර තමා පිටව යා යුතු බව සිතුණද



ඒ සිතුවිල්ලෙන් ඔහු ත්‍රස්ත විය. ඒ සා අකාරුණික විය හැකිද තමාට...?

"කඹයක් නැත්තං ඔය මොකක් හරි දිග ලීයක් දානවා.... ලීයක් හොයාගන්ඩත් බැරි නං ඔය ගහක් හරි කපල දානවා... මට මේක අස්සේ ඉන්ඩ බෑ..."

ඇය ගිරිය පුම්බා ගනිමින් කෑ ගැවාය. ලී දඬු සොයන්නට හෝ ගස් කපන්නට උවමනා නොවීය. ඇඳ යට සඟවා තැබූ කඹය රැගෙන ආ සඳුන් මහත් වෙර වැයමෙන් ඇය ගොඩට ගන්නට සමත් විය. එහෙත් මීමින්නාද ඔසවාගෙන කඹයේ එල්ලී සිටීම පහසු නොවීය.

"ඕකව අතාරිනවා... ඌව පස්සෙ ගන්ඩ බැරියැයි...

අතිශයින් අහිංසක වූ ද බිය ගුළු වූ ද මීමින්නන්ට ඇය අනේක වාරයක් දොස් පවරා තිබේ.

"මොකට ඔච්චර බය වෙනවද මංදා... ගහකින් කොළ යක් වැටුණත් බයේ ගැස්සෙනවා... පැනලා දුවනවා... දුවලා හැංගෙනවා..."

මිණිබිරියගේ ඒ දෝෂාරෝපණය මිත්තණියට සිනාවට කරුණකි.

"බය නොවී කොහොමද බං... ඕකා මරාගෙන කන්ඩ කී දෙනෙක් කියලා බලං ඉන්නවද... කී දෙනෙක්ගෙං බේරෙන්ඩද... ඉතිං තිස්ස දෙවේලේ බයේ ගැහි ගැහී ඉන්නවා... පව් අහිංසක සතා..."

ආශා ඒ අහිංසක සිව්පාවා වෙනුවෙන් සුසුමක් හෙළයි.

"මොකා මරාගෙන කන්ඩ වට වුණත් ඔහොම බය වෙලා හරියනවද... මැරෙන්නේ එක සැරයයි. මරාගෙන මැරෙන්නැතුව බයවෙවී හැංගි හැංගී... මොකටද ඔහොම ජීවිතයක්?..."

වත්ත පහළ වන ලැහැබේ සැඟවී නොපෙනී යන මීමින්නන් හෙළා දුටු ඇය මේ මළ මීමින්නා උසුලාගෙන සිටින්නේ මළදරු ළෙහි හොවාගත් කිසා ගෝතමිය මෙනි.

Scanned with CamScanner

ළිංගැට්ට මතට පය තබන්නට ඔන්න මෙන්න කියා සිටියදී ඇනටමත් පළින් පළ ඉරී තිබුණු සරම ලිහිල්ව ඇගේ තුරුණු සිරුරින් මිදී යළි ළිං පත්ලේ අපවිත්‍ර ජලය මත පතිත විය. මී මින්නා අතහැර සරම අල්ලාගන්නට ඇය තැත් නොකිරීම පිළිබඳව ඔහු පුදුමයෙන් ගල්ගැසුණේය. ඊටත් වඩා පුදුමය දනවන කරුණ වූයේ ළිං ගැට්ට මත ඇගේ ද මළ සතාගේද බර දරා සිටින්නේ තරුණයෙකු බව ඇය නොතකා හැරීමය. වෙනත් එකියක් නම් කඹය අතහැර දෑතින් නිරුවත වසා ගන්නට අසාර්ථක ප්‍රයත්නයක් දරනවා නොඅනුමානය. එහෙත් මේ නාඳුනන කෙල්ල නිරුවත හෝ ඈඳුරෙහි තුරුණු ඇස් හෝ නොසලකා පොළොව මතුපිටට එමින් සිටින්නීය.

"මළ කෙළියයි..."

නිරුවත් තරුණියක මළ සිවපා වෙකු ද අතකින් එල්ලාගෙන කඹයක ආධාරයෙන් ඉහළට ඇදෙන අයුරු දැක දැක තුරුණු මුවකින් ගිළිහිය යුතු නිවැරදි වචනය හෝ යෙදුම සිතාගත නුහුණුව ඔහු අසරණ විය.

"ඒ මගුල හොඳටම ඉරුණා... ඒක ඇගේ තිබ්බත් නැතත් දෙකම එකයි" යි පැහැදිලි කළ ඇය වැඩි දුරටත් "ඇස් දෙක පියාගන්ඩ... ඇස් ඇරගෙන හිටියොත් මං උගුල්ලනව ඔය ඇස් ගෙඩි දෙක" යි අණ කළා ය.

"ඇස් දෙක පියාගෙන කොහොමද ඔයි තමුසෙව ඇදල ගන්නෙ...? තමුසෙ කොච්චර බරද කියල දන්නවද... ඒ මදිවට තව මළකුණකුත් එල්ලගෙන... මට හිතුණොත් මං කඹේ අතෑරලා යනව යන්ඩ..."

නිරුවත් ලලනාවක සමීපයෙහි සිටිය ද නුරාවෙන් නොව කෝපයෙන් දැවෙමින් ඔහු කෑගැසුවේ ය.

"ඉතිං අතාරිනවා..." අතෑරලා යනවා... මං මේක ඇතුළෙ මැරෙන්නෑ... කොහොම හරි උඩට එනවා... දවස් කීයක් ගියත් කමක් නෑ..."

ඇය වහසි බස් දොඩනා කල ඔහුගේ මුව'ග අවඥාබර සිනාවක් නැගිණ.



"ඔව් ඔව්... දවස් ගානක්... ඉඳියි. තමුසෙ ඉතුරු වෙයි ඔක අස්සෙ... තමුසෙ මැරෙන්නෙ බඩගින්නෙ... කන්ඩ බොන්ඩ දෙයක් නැතුව..."

මෙවර ඇගේ මුව කොණ ඇද විය.

"මං නං බඩගින්නෙ මැරෙන් නෑ..."

"නෑ නෑ... තමුසෙට අහසින් වැටෙනවා කෑම බීම... ගොං කතා කියන්ඩ එපා..." පහළ නිරුවත් තරුණිය ද ඉහළ ඇඳුම් ඇගලාගෙන හුන් තරුණයා ද බහින්බස් වූයේ පාසල් වියේ කුඩා දරු දැරියන් මෙනි.

"මැරිච්ච සතා හරි කාලා මං බඩ පුරවා ගන්නවා... මේ බොරවතුර බීලා හරි මං මැරෙන්නැතුව ඉන්නවා..."

නැවතත් ඔහු ගේ දෑතේ ශක්තිය හීන විය. මේ තරුණිය පිළිබඳව පුදුමයට පත් නොවී සිටිය හැකිදැයි ඔහුට සිතිණ. කඹය ලිහිල් වී ඇය ආපසු ළිං පත්ලට ඇද වැටෙන්නට ආසන්න වුව ද ඔහු මහත් වෑයමෙන් විසිර ගිය ශක්තිය ඒකරාශී කර ගත්තේ ය. මළ සතෙකු නොවූයේ නම් ඇය ඇගේම ශරීරයේ කොටසක් ආහාරයට ගෙන හෝ පණ තල රැකගනු ඇතැයි ඔහු සිතුවේ ඇය කෙරෙහි මෝදුවන භක්තියෙන් හා ගෞරවයෙනි.

"ඇස් දෙක ඇර ගෙන හිටියොත් මං තමුසෙව මරනවා..."

ළිං ගැට්ට මතට ඇද ගැන්මේදී ඔහුට ඇය ස්පර්ශ නොකර සිටිය නොහැක. ඇයගේ නිරුවත් සිරුර අල්ලා ගැනීමේදී ඔහු ගේ දෑත වෙව්ලුවේ ය.

ගොඩට ආ හැටියේ ඇය ඔහුට පහර දුන්නා ය. මහත් සේ වෙහෙසට පත්ව හුන් තරුණයා ළී දඬු මත ඇද වැටුණේ ය. හැකිතාක් කඩිනමින් රෙදි වැළ වෙත දිව ගිය ඇය සාය හැඳ ගත්තා ය.

"හොඳ උදැල්ලක් තිබ්බා නෑනේ..."

ඔහු දරමඩුවෙන් පිටතට ආවේ උදලු කෙටියක් අතින් ගෙන ය.

Scanned with CamScanner

"හොඳ හරි නරක හරි... උදැල්ලක් නැත්තං අතිං හරි වළක් හාරලා මේ සතා වළදාන්ඩ ඕන..."

තනමත්තට සාය හැඳගෙන හුන් ඇය නොඉවසිල්ලෙන් හඬ ගෑවා ය.

"පායලා පායලා කට්ට වෙලා තියෙන පෙළොව උදැල්ලෙන් නෙමේ යකඩ ඉන්නෙන් තමා වළක් හාරන්ඩ වෙන්නෙ..."

"මොකෙං හරි... මොකෙං හරි හාරනවා වළක්"

මළ සතා උසුලාගෙන හුන් තරුණිය නොඉවසිල්ලෙන් ද කෝපයෙන් ද අණ කළා ය. ඔහු ඇය දෙස එක එල්ලේ බැලුවේ ය.

"තමුසෙ කියන කියන ඒවා කරන්ඩ මං තමුසෙගෙ වැඩකාරයෙක් ද?"

"ඇය ඔහු ගේ අප්‍රසාදය පිළිබඳ ව සැලකිල්ලක් නොදැක්වූවා ය.

"මොකෙක් හරි... තමුසෙට බැරි නං මෙහෙ දෙනව උදැල්ල මං හාරන්නං..."

තමා ගරුකටයුතු පිරිමියෙක් බව ද ඇය පහත් ගැහැනියක බව ද සිහියට නැගුණෙත් ඔහු .... නිහඬව වළක් කණින්නට විය. ඒ සඳහා මහත් පරිශ්‍රමයක් දරන්නට සිදුවූයේ කලකින් වැස්සක් ඇද නොහැළුණ බැවිනි. තාරුණ්‍යයේ ශක්තිය ද පොළවේ ඇඩි බව ද මල්ලර පොර ගුරයන් මෙන් එකෙකුට එකෙක් නොපරදින සෙයින් තරඟ වැදුණි.

ඇය වළ පත්ලේ මී මින්නා තැබුවේ තොට්ල්ලක් තුළ බිළිඳෙකු තබන මවක මෙන් පරිස්සමිනි. ඇගේ ජීවිතය හා බැඳී හුන් ඒ ආදරණීය මැහැල්ලගේ අවසන් කටයුතු සිදු කරන විටවත් ඇය මේ සා හැඟීම්බර නොවූවා ය.

මේ මී මින්නා පරිද්දෙන්ම උන්දැද ආගමික වතාවත් හෝ ශබ්ද පූජා හෝ ගුණ කථන කිසිත් නැතිව අවසන් ගමන් ගිය බව ඇය සිහි කළේ කකියන හදවතිනි.



"කොහෙද ඔය උඹ යන්නෙ?" යි සීතා ප්‍රශ්න කරන්නේ මිණිබිරිය ගේ මඟ අහුරමිනි. ඇගේ කෙසඟ හා දුබල කය තල්ලු කරදමා පැන දුවන්නට තරම් සිතෙතත් ආශා එපමණ අකාරුණික නොවූවා ය.

"මං යන්නෙද... මං යන්නෙ විරිදු කියන්ඩ..." යි ඇය උත්තර දෙන්නේ මිත්තණිය අවුස්සන්නට විනා සනසන සිතින් නොවේ.

"එක එක ඉස්ටේජ් ගානේ විරිදු කිය කියා ජවිසං නටන්ඩ උඹට විළිලැජ්ජාව කියලා දෙයක් නැද්ද ආසෝ?"

පියරු බිඳක් හෝ ආලේප නොකළ ද බබළන පැහැබර සමින් අලංකෘත වූ මුහුණේ පිරුණු දෙතොල තර සරදම් සිනාවක් නංවාගනිමින් ඇය ප්‍රහාරය එල්ල කළා ය.

"ඒක ඉතිං මගේ තාත්තා කියන මිනිහට තිබ්බෙත් නැතේ සීතම්මේ..."

සීතා මුළුමනින් ම අවුස්සන්නට ඒ කියුම සැහිණ.

"ඒ වල් බල්ලාගෙ වගක් ඕන්නැනෙ මෙතෙන්ට..."

යුවතියගේ දිලෙන දෑස මැහැල්ල වෙත යොමු විය. හැත්තෑවයස් පංචස්කන්ධයක් වෙනුවට එතන පිදුරු ගොඩක් විණි නම් ගිනිගෙන ඇවිළෙනවා නිසැකය.

"ඇයි නැත්තෙ... මට නම් ඒ මිනිහව මතක් වෙන්නැති වෙලාවක් නෑ... සීතම්මට පණ තිබ්බෙ නැතේ තමුන්ගෙ දුවට ගේ ඇතුළෙ හිටපු තමුන්ගෙ දුවට බලහත්කාරකම් කරපු මිනිහව මරාගෙන මැරෙන්ඩ... මං එහෙම නං උගුරු දණ්ඩ කඩනවා..."

ඕනෑවටත් වඩා දුක් ගැහැට අනුභව කිරීමෙන් අසූ වසරක පෙනුම උසුලන්නිය හුල්ලා වැටුණා ය.

"ඕකුං එක්ක හැප්පෙන්ඩ හයියක් තිබ්බද මටයි කෙල්ලටයි... අපි මේ එදා වේල හොයාගෙන කන දුප්පත් මිනිස්සු..."

උරහිසේ එල්ලා ගෙන ඉන්නා ගමන්මල්ල පසෙකට විසිකොට දෙපා බිම ගසා කෑ ගසන්නට තරම් වන ආවේගයකින්

Scanned with CamScanner

සැලී ගිය කෙල්ල "දුප්පත් මිනිස්සු කරබාගෙන ඉන්ඩෝනෑ පෝසත් මිනිස්සු ඕන ම බලු වැඩක් කරල යනකං... ඒක හරි වැඩක්නෙ..." යි කෑ ගැසුවා ය.

"වෙන මොකවත් නෙමේ බං... අපේ කරුමෙ... ගිය ආත්මෙ කොරාපු අකුසල් නේන්නම් මේ විඳවන්නෙ... ඒ හිංදා තමා මං උඹටත් කට කැඩෙනකං කියන්නෙ යමං පන්සල් කියලා. මලක් පහනක් පූජා කොරලා ලබන ආත්මෙවත් සැපට ඉන්ඩ කුසල් එක්කාසු කොරගන්ඩ ඕනෑ නේද..."

ලුණු ඇඹුල් යහමින් ඇත්තා වූ උත්තරයක් දෙන්නට මුව විවර කළ ආශාට බාධා කළේ කඩුල්ල අද්දර නැවැත්වූ ත්‍රීවිලරයයි.

"මං යනවෝ.... යි කියන්නටවත් දයාර්ද්‍ර නොවූ මිණිබිරිය ඒ වෙත දිව යන අයුරු සීතා බලා සිටියේ කෝපයෙන් ද ශෝකයෙන් ද කැකෑරෙමිනි. ඒ බව දුටුවාක් මෙන් වාහනය තුළ අසුන්ගෙන හිස පිටතට දමාගෙන හුන් කාන්තාව "අපි ගිහිං එන්නං සීතම්මේ" යි උස්හඬින් සමු ගත්තා ය. හිස ගැස්සූ මැහැල්ල ආපසු හැරුණා ය. ඇය ඇගේ දිරාපත් සිරුරට නොසරිලන තරමේ වේගයෙන් ඇවිද යන අයුරු දුටු රියදුරා හිනැහුණේ ය.

"සීතම්මට තද වෙලා"

කාන්තාව ඒ සිනාවට හවුල් නොවූවා ය.

"තද වෙන්නැද්ද සුමනෙ මේ ළමිස්සියක් මෙහෙම ඇවිදින්ඩ ගත්තහම..."

ඇගේ ස්වරයේ කිසියම් කණස්සල්ලක් ද කැටි වී තිබිණ.

"ඉතිං මාලක්කලාමනෙ ඔය කෙල්ල උස්සාගෙන එහෙට්ට මෙහෙට්ට යන්නෙ..."

කටට ආ උත්තරය ගිලගත් මාලා මේ දැන් පිපුණු කුසුමක් සේ සුන්දර වූ යුවතියට ඉඩ දුන්නා ය.

"යං යං..."

ආශාට උවමනා වූයේ හැකිතාක් ඉක්මණින් පිටව යාමට ය.



තෙරපෙන මහජනකාය ද වේදිකාව මත සම්භාවනීය අමුත්තන් හා අපේක්ෂකයන් ද තමාගේ ජීවිතයේ කොටසක් වනු ඇතැයි ඇය කිසි විටෙකත් නොසිතුවා ය. ඊට මුල පිරුණේ අහඹු සිදු වීමකිනි.

මිත්තණිය සමඟ පොළේ යන්නට ආශා කිසි දිනකත් නොපැකිළුණාය. බහ තෝරන වයසේ ඇරඹි ඒ ගමන මල්වරවීමෙන් පසු නවතා දමන්නට ඇයට මෙන්ම සීතාටද උවමනා නොවී ය.

"හා... ලාබයි ලාබයි එන්ඩ එන්ඩ... ගන්ඩ ගන්ඩ..." යි උස් හඬින් කියන්නට ඉදිරියට තෙරා එන ළය මඬල හා පුළුල් නිතඹ කෙල්ලට බාධා නොකළේ ය. තමාගේ රුව පිළිබඳව ඇය දැක්වූ නොසැලකිල්ල ම ඇගේ අනන්‍යතාවය විය. අතනින් මෙතනින් අණ්ඩ දැමූ ගවොමක් හඳින්නට ඇය කිසිවිටෙකත් මැළි නොවූවා ය.

"ඇතැම් දවසක බඩු ගෝනිය ඔසවන අතරතුර ඕනෑවට වඩා දීර්ඝ කාලයක් සේදීමෙන් හා ඇඳීමෙන් දියව ගිය ගවොමේ පඳාසයක් ඉරී යයි. හැට්ට කටුවකින් අමුණා ගෙන හෝ එළවළු පළතුරු හා බුලත් පුවක් සියල්ල විකුණාගන්නට වෙහෙසෙන මිණිබිරිය දෙස මැහැල්ල බලා ඉන්නේ කඳුළු පිරි දෙඇසිනි.

"කොයි වෙලාවෙ හුස්ම ටික ගියත් බයවෙන්ඩ කාරි නෑ.. කෙල්ල වැදැරෙන්නෙ නෑ... පිරිමියා වගේ ඔට්ටු වෙයි... යකඩ ගහ වගේ නොහෙල්ලී ඉඳී..." යි නුදුරු දිනයක තමා මරුමුව ඇද වැටෙන බව සිහි කරමින් වුව ඇය හිත හදාගනියි.

"නංගි බටු නැද්ද?"

නාඹර ගැටවරයන් දෙදෙනා හුදු පාරිභෝගිකයන්ට ඉඳුරා වෙනස් බව ආශා එක් බැල්මකින් සැක හැර දැනගත්තා ය.

විභාගය අසමත් වන්නට ද කාලයකට ඉහත අහිමි වූ පාසල් ජීවිතයේ දී ඇගේ එදිරිවාදීන් පූරුවේ සිට පතා කියාගෙන එන වෛරක්කාරයන් මෙන් ලුහුබැඳ එන බව හිතමින් වුව ඇය "මේ තියෙන්නෙ. කොච්චරක් ඕනද...?" ඇසුවාය.

පහත් වී බටු කරලක් අතින් ගත් එකෙකු අශ්ලීල සිනාවක් පෑවේ ය.

"නංගි හැමදාම බටු විකුණනව ද?"

"නෑ... ඉරිදට විතරයි"

අසංවර බැල්මකට හෝ දෙපිට කැපෙන වචනයකට ඇය විළියෙන් හකුලා දමන්නට නුපුළුවන් බව පසක් කර ගන්නට තවත් වචන කන්දරාවක් නාස්ති කළ යුතු විය.

"මේ මල්ලිලා ගන්නව නං ගන්නවා... නැත්තං කැපෙනවා නිකං වාත වෙන්නැතුව..."

ප්ලාස්ටික් බඩු වෙළෙන්දා ගෝරනාඩු කළේ ය.

දෙකනේ තෝඩු නොදිලුණ ද ඒ හිලව්වට වාගේ ඇගේ දිදුලන ඇස ඔහු ගේ සිත් ගත්තේ කාලාන්තරයකට ඉහතදී ය. ජීවන සංග්‍රාමයේ මේ අභීත සෙබළියන් දෙදෙන වෙනුවෙන් ඔහු හැමදාමත් පළිහක් මෙන් ම දුන්නක් ද වූයේ ය.

"ඒ අයියට තද වෙනවනෙ මේ නංගිට විහිළු කළාම... යි එකෙකු පහත් හඬින් අප්‍රසාදය පළ කළේ ය.

"හා... එන්ඩ එන්ඩ... තව ටිකායි... තව ටිකායි..."

ඇය නොහික්මුණු ගැටවරයන් නොතකා සුපුරුදු පරිදි හඬ ගෑවා ය.

"ආපෝ කටේ සද්දෙ..." යි එකෙකු අතකින් කනක් වසා ගත්තේ ය.

ඇය ලැජ්ජාවට පත් කරවන්නට හෝ අසරණභාවයේ පත්ලට ඇද පහළ හෙළන්නට පහසු නොවන බව වටහා ගත් ඔවුන් බටු කිලෝ දෙක සඳහා මුදල් නොගෙවා පිට වූහ.

"සල්ලි දුන්නැනෙ ආසෝ ඒ කොල්ලො දෙන්නා..." යි සීතා දුක්මුසු හඬින් ඇනුම් දුන්නා ය.

"ඒයි ඒයි..."



එවැන්නක් අනුමාන කළ කෙල්ල මහ හඬින් කෑගැසුවා ය. හැරී බැලූ කොල්ලෝ සරදම් සිනා පාමින් ඉදිරියට ඇදුණෝ ය. ඇය ඔවුන් පුහු බැඳ ගියේ යක්ෂාවේශයෙනි.

"කොයි සල්ලි...?"

මඟ අහුරා ප්‍රශ්න කරන්නට තරම් ඇය නිර්භීත වූවා ය.

"මොන සල්ලි ද නංගි?"

එකෙකු කිසිවක් නොදන්නා කලෙක මෙන් සුවිනීත හඬින් ඇසුවේ ය.

"බඩු ගත්තනං සල්ලි දීලා යන්ඩ දන්නැද්ද...?"

"දන්නැනේ... හොඳ වෙලාවට නංගි කියල දුන්නෙ" එකෙකු අනෙකා දෙස බලා ඉඟි මැරුවේ ය.

"අපි මුකුත් දන්නෑ නංගි" අනේ අපිට කියා දෙන්නකෝ."

වෙළෙන්දන්ගේ කෑ ගෑම් ද පොළ සිසාරා ඇවිද යන ගැහැනුන් මිනිසුන් හා ළමුන්ගේ හඬද තුළ ඔවුන්ගේ අවිනීත සිනා ගිලී ගියේ ය. තවත් ඉවසිය නොහැක්කෙන් ආශා බටු මල්ල උදුරා ගත්තා ය.

"දීපිය මෙහාට..."

ඇගේ කෝපය ඔවුන්ට හාස්‍යයට කරුණකි.

"මූන ලස්සන වුණාට වචන හරි කැතයිනෙ නංගි..."

තවත් කිසිවක් නොපැවසූ ඇය ආපසු හැරුණා ය. එකෙණෙහි එකෙකු ඇගේ දිගු කොණ්ඩා කරලින් ඇද්දේ ය.

ඉදිරියට යා ගත නොහැකි ව ආපස්සට පියවරක් තැබූ ඇය ඊළඟ නිමේශයේ දී බටු මල්ලෙන් ඔහුගේ මුහුනට දමා ගැසුවා ය.

සී සී කඩ විසිර ගිය බටු කරල් පයින් පාගමින් කලහ කර ගන්නා කෙල්ලත් කොල්ලත් දෙදෙනාත් දෙස යොමු වූ බොහෝ නෙත් නාටකයක් නැරඹීමට නොමිලයේ ලද ඉඩප්‍රස්තාවෙන් බැබළිණ.

Scanned with CamScanner

"අතැරපියව්... අනේ මගේ කෙල්ල අතැරපියව්"

සීතා විලාප දුන්නේ ඔවුන් වෙත දිව එමිනි.

ප්ලාස්ටික් බඩු වෙළෙන්දා පමණක් නොව තවත් වෙළෙන්දන් හා වෙළෙන්දියන් කීප දෙනෙකු ආශා කෙල්ල බේරා ගන්නට දිව ආහ.

වැඩි වේලාවක් ගතව යන්නට පෙර ගැටවරයන් දෙදෙනා හදිසි අනතුරු වාට්ටුවෙන් මෙපිට නොනවතින බව වටහාගත් මාලා දිය දෙබෑකර පිහිනා යන යෝධ මත්ස්‍යයෙකු මෙන් ඒ මිනිස් පොදියට පැන්නා ය.

"අතපත්තු මහත්තයගෙ කොල්ලො..."

ඒ හෙළිදරව්ව පමණක් නොව සීතා ගේ ආයාචනය ද හේතු කොටගෙන පාර්ලිමේන්තු අපේක්ෂකයාගේ ගෝලබාලයෝ නිරුපද්‍රිතව පලා ගියහ. පිරිස විසිර ගියෙන් ඉතිරි වූයේ මාලා සහ ආශා පමණි. කිසිවෙකුගේ අඩන්තේට්ටම් හමුවේ අසරණ ව කඳුළු පුරවා ගත් ඇසක් වෙනුවට මේ කෝපයෙන් දැවෙන ඇස ඇගේ සිත ඇද බැඳ ගනියි.

"ඉස්කෝලෙ යනව ද?"

"නෑ..."

"ඇයි?"

"විභාගෙ ෆේල්"

ආශාගේ හිස පහතට නැඹුරු වූයේ නැත. ඇය සිය අසමත් වීම හෙළි කළේ මහ ඉහළින් විභාගය සමත් වූ වග කියා පාන උදාරම් හඬකිනි. මාලාගේ මුව'ග සිහින් සිනාවක් නැගුණේ එහෙයිනි.

"මහන්සි වෙලා පාඩම් කරලා ඊ ළඟ පාරත් ලියන්න"

ආශා මුව ඇද කළා පමණි. ඒ එක් චලනයේ දීර්ඝ උත්තරයක් ගැබ්ව තිබිණ. මාලා තවත් කිසිවක් පවසන්නට වෑයම් කළ ද කෙල්ල මිත්තණිය වෙත දිව ගියා ය.



තැලී පෑගී ගිය බටු කරල් දෙස ඉක්මන් බැල්මක් හෙළු ගැහැනිය කිසිවක් සිත සනිටුහන් කරගත් පරිද්දෙන් හිස මඳක් සැලුවා ය.

පාර්ලිමේන්තු මැතිවරණයෙන් රට උණුසුම් ව තිබිණ. ඡන්ද වේදිකාවේ හිටිවන කවි කියන මාලා මල්කාන්ති කිසිදු හඬ පරීක්ෂාවකින් තොරව පොළේ මරුමුස් කෙල්ලට විරුදු කීම පැවරුවා ය. මැදිවිය පසුකරමින් සිටින මාලා මල්කාන්ති ට වඩා හද්‍ර යෞවනයේ පසුවන ආශා සෙව්වන්දි ආකර්ශනීය විය.

"ඡන්දයක් ඉවරවෙන කොට කී සීයක් නං මැරෙනවද මේ රටේ... උඹත් වෙඩි කාලා හරි පිහි ඇනුම් කාලා හරි මැරෙන්ඩද දඟලන්නෙ?" යි සීතා කොතෙක් දොස් පැවරුවද පලක් නොවීය.

"කිරියම්මනං පොඩ්ඩක්වත් කැමති නෑ නේද ආශා...?"

මාලා මල්කාන්ති සිය මනබඳනා සිනාව සමඟ ඇසුවා ය.

"එයාට පිස්සු ඇන්ටි..."

ගැහැනියගේත් යුවතියගේත් සිනාහඬ තරුණ රියදුරාගේ දෙතොල'තරද මඳහසක් මවන්නට සමත් විය.

"එහෙත් ඒ මතකය දැවුරුද්දකට පසු ආශා ගේ සිත රිදවයි.

අවසන් බුහුමන් දක්වන්නාක් මෙන් නොසැලී පසුවූ යුවතිය යතුරු පැදියක හඬ ඇසුණෙන් තිගැස්සුණාය. සිරුරේ සීරීම් තුවාල පිරික්සා බලන්නටවත් ඉඩක් නොලැබිණ. වැටේ වද පඳුරු පෙළ අතරින් ඇය ඔහු පිටව යන අයුරු දුටුවා ය.

"ගියා..." යි ඇය වියළි දෙතොල විහිදා මිමිණුවා ය. දෙපා අප්‍රාණිකව ගියෙන් ඇය මී මින්නා අවසන් නින්දේ සැතපෙන වළ අබියස හිඳ ගත්තා ය.

"ආයෙ එන එකක් නෑ" ඒ සිතිවිල්ල වඩාත් වේදනාකාරී මෙන්ම බිහිසුණු විය.

ඇගේ අපවිත්‍ර ශරීරය වෙව්ලා ගියේ ය.

Scanned with CamScanner

# 8

ඒ කුඩා නගරයෙහි සාමාන්‍යයෙන් ඕනෑම නගරයක තිබෙන කලබලකාරී, නොඉවසිලිමත් ස්වභාවය දක්නට නොලැබිණ. හෙට යනුවෙන් හැඳින්විය හැකි තවත් දවසක් නො එළැඹෙන බව සක්සුදක් සේ දන්නා කලක මෙන් වේගයෙන් ඒ මේ අත යන එන ජනකායක් ද පුළුල් වීදියේ නොගැවසිණ. උණුසුම ද ආලෝකය ද නොමඳ ව පුද දෙන හිරුමඬල ඉතා ඉක්මණින් මිය යන බව විශ්වාස කරමින් වුව කිසිදු හදිසියක් පෙන්නුම් නොකරන අල්ප වූ පිරිසක් පාරේ හා කඩ කීපයේ ගැවසුණහ.

කලඑලියක් නැති කඩ සාප්පු පවා නිදි කිරන්නාක් මෙනි. නපුරු මන්තරකාරියකගේ බිහිසුණු ශාපයකට හසු වූ කලෙක මෙන් අවපැහැගැන්වුණු නගරය දශක ගණනාවක් තිස්සේ නොවෙනස් ව පවතී.

කිරි ගොවියා නඟා සිටුවීම පිණිස නගරයක් පාසා කිරි හල් ඉදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකළ අලංකාර කිරිහල පාළුවට ගොස් තිබිණ. කිරි ගොවියා කෙසේ වෙතත් කිරිහල ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාගත් ගොඩනැඟිලි ඉදිකරන්නා සුඛිත මුදිත වන්නට ඇතැයි කසු කුසු ගෑ කම්කරුවෝ නුදුරෙහි ගොවිපල් භූමිය තුළ දහදිය වගුරුවමින් සිටියහ.

නගරය සේම අවපැහැ ගැන්වුණ තරුණයා රෙදිපිළි වෙළ ඳසැලකින් පිටතට ආවේ ය. ඔහුගේ අතක එල්ලාගෙන හුන් රෙදි



මල්ල වෙනුවෙන් සැලකිය යුතු මුදලක් වැය කරන්නට සිදු වීමේ කණස්සල්ල ඒ වැහැරුණ මුහුණේ කැටයම් ව තිබිණ.

පසුගිය තෙවසර මුළුල්ලේ අව්වට පිළිස්සෙමින් ඉසිළු දුක් ගැහැට ඔහු වෙත පෙර වූ සියුමැලි පිරිපුන් ස්වභාවය උදුරාගෙන තිබිණ.

"ආව්... ආව්... කොල්ලගෙ ලස්සන"

"රූපිකා වර්ණනා කළේ අපමණ සොම්නසිනි. සැබැවින් ම දිය නා හමාර වූ හැටියේ සඳුන් වෙතින් පළවූයේ මහත් පියකරු බවකි.

"කෙල්ලො කී දෙනෙක් ඉන්නව ද ඇං...?"

මුව සිනාව විසින් ඔප්නංවන දෙනෙතේ අලංකාරයෙන් වශීකෘතව ගිය කලෙක මෙන් ඔහු ඇය දෙස බලා ගත්වනම සිටියේ ය. ඒ තියුණු බැල්ම ඇගේ සිනාව ගිලගතියි.

"ඕ... ඔහොම බලන්න එපා..."

ඒ ආයාචනාත්මක ස්වරයෙන් සසල වූ සඳුන් "ඇයි?" යි අසන්නේ ඇය සමීපයට යමිනි.

"අනේ මට රුවන් මතක් වෙනවා. එයා මා දිහා බලන්නෙත් ඔහොම තමා..."

ඔහු අප්‍රසාදයෙන් ඉවත බැලුවේ ය. ඇගේ මිය ගිය පෙම්වතා සමඟ තමා සංසන්දනය කිරීම පිළිබඳ ව නොසතුටු සිතින් ආපසු හැරුණේ ය.

"ඔය ඉතිං..." යි හඬ ගෑ ඇය දැතින්ම ඔහු බදා ගත්තා ය.

"යන්ඩ නං එපා ආව හැටියෙ..."

"අතාරින්ඩ" යි ඔහු රළු හඬින් අණ කළේ ය.

"නෑ... අතාරින්නෙ ම නෑ..."

ඒ සුරතලය ඔහු ගේ නොමනාපය දිය කර හරි යි.

"කොයි වෙලාවෙත් අර මැරිච්ච එකෙක් මතක් කර කර... මට තද වෙන්නැද්ද..." යි ඔහු නොසඟවා සිය කෝපයට හේතුව හෙළි කළේ ඇය පිරිනැමූ තේ කෝප්පය තොල ගාමිනි.

Scanned with CamScanner

"එහෙම කියන්න එපා සඳුන්... ඔයාට තේරෙන්නෙ නෑ... රුවනුයි මායි එක පංතියේ... පුංචි කාලෙ ඉඳලම ළමයි අපිට විහිළු කලා... එයා රුවන්... මම රූපිකා... ඉතිං රුවනුයි රූපිකායි යාළුවෙන්න ඕන කියලා තමා හැමෝම හිතුවේ... රූපිකා රුවන්ගෙ..."

අතීත මතකය ඇගේ දෙතොල් අතර සෝබර සිනාවක් මවයි.

"හරියට අර අපි ඉස්සර විහිළු කරන්නෙ හෝඩියේ හොඳු දෙකේ දෙල්... තුනේ තුවාල කියලා... අන්න ඒ වගේ... රුවන් රූපිකා කිය කියා විහිළු කරපු හින්දමයි අපි දෙන්නා යාළුවෙන්න ඇත්තේ... රූ... රූ..."

ඇගේ ප්‍රේම පුරාණයට සවන් දෙන්නට ඔහු ප්‍රිය නොකරයි. ඇගේ මුහුන දෙස බලා හිඳීමෙන් ලබන්නා වූ චමත්කාරය හීන කරවන්නේ ඇය තමාට ඇළුම් කරන්නේ ඇගේ මියගිය පෙම්වතාගේ ස්වරූපය උසුලන නිසා ය යන කටුක සත්‍යයයි. එය ඔහු ගේ සිත පාරයි. එරමිණියා අකුලකට මැදි වූවාක් මෙන් වේදනා ගෙන දෙයි.

"මේං මෙහෙට්ට දූවගෙන ඇවිල්ලා නාලා ඉවර වෙච්ච හැටියෙ..."

දයාසීලිගේ ඒ උච්ච ස්වරයෙහි චෝදනාවක් මෙන්ම අනතුරු ඇඟවීමක් ද ගැබ්ව තිබිණ.

"මං බලනවා කොයි කොල්ලා කියලා..."

රූපිකා පෑ සිනාවට පිළිතුරු සිනාවක් නොලැබිණ. එහෙයින් ඒ සොඳුරු සිනාව මුළුමනින් ම අපතේ ගියේ ය.

"උඹ මොක ද මෙහෙ කරන්නෙ?"

කවදාවත් නැතිව දයාසීලි සිය පුත්‍රයාට කඩා පැන්නා ය. දවස මුළුල්ලේ ඇය ඔහුට ආඩපාලි කියන බව සැබෑය . එහෙත් එක එල්ලේ ප්‍රශ්න කරන්නේ කලාතුරකිනි.



"තේ බොනවනෙ... පේන් නැද්ද?."

සඳුන් නොසැලකිල්ලෙන් උත්තර දුන්නේ ය. අම්මාගේ රකුසු වෙසට රකුසු වෙසකින් ම ප්‍රතිචාර දැක්විය යුතු බව ඔහු දනියි.

"උඹට තේ බොන්ඩ මෙහෙට්ටම එන්ඩ ඕන ද...?"

"තේ බොන්ඩම ආවා නෙමේ"

බියෙන් පසුබා යමින් වුව රූපිකා මව පුතු අතරේ හබයට මැදිහත් වූවා ය.

"මේ... සඳුන් ආවෙ තාත්තව බලන්ඩ... එපාම කියද්දි තමා මං තේ එකක් හදල දුන්නෙ..."

දයාසීලි නැනන්ඩිය දෙස රවා බැලුවා ය. ඒ එක් රැවුමක බොහෝ කරුණු කාරණාද චෝදනා ද සැඟවී තිබිණ.

"කිරියත්ත බලන්ඩ කිය කියා තමයි එන්නෙ. ලෙඩ්ඩු බල බලා ඉඳල හරියන් නැතේ... මේකා රස්සාවට යන්නැද්ද..."

රූපිකාගේ හිස පහතට නැඹුරු විය. හරියට තමා ලබා දිය යුතු උත්තරය බිම පතිතව ඇත්දැයි පිරික්සන්නාක් මෙනි.

"යන්නං යන්නං" යි කෝපයෙන් කී තරුණයා නැඟී සිටියේ ය.

"යනව තමයි. හැමදාම කියන්නෙ ඔහොමනෙ... කොයි ඉතිං යනවා... මටත් දැං කියලම එපාවෙලා..."

බියෙන් පැකිලෙමින් වුව රූපිකා නැවතත් කතා කළා ය.

"ත්... තේ ටිකක් වක්කරන්ඩ ද අක්කෙ?"

"තේ නෙමෙයි... මට දැං වහ බොන්නයි වෙලා තියෙන්නෙ..."

තරුණියගේ දෑසට කඳුළු නැගිණ.

"අ... අනේ ඇයි අක්කෙ?"

Scanned with CamScanner

"උඹට තේරෙන්නෙම නැද්ද නංගියේ... මේකා රැකී රස්සාවක් කොරන්නෝ නෑ මේකා කොල්ලෙක්... නැත්ද කෙනෙක් හැටියට උඹටත් පුලුවන් නෙ මේකාට දැනමුතුකමක් දෙන්ඩ.... මෙතෙන්ට එනේන වෙලාවට තේ පොව්වන එක නෙමේනෙ කරන්ඩ තියෙන්නෙ..."

මේ රූබර තරුණිය තමාගේ නැන්දණිය බව ඒත්තු ගියෙත් සඳුන්ගේ කෝපය හා අසහනය තීව්‍ර විය. ඔහු කෝප්පය බිම ගසා කුස්සියෙන් පිටතට ගියේ ය.

කෝප්පයේ බිඳුණු කැබලි මත ඇගේ කඳුළු පිරී දැස නැවතිණ. ඇය යටි තොල විකාගනිමින් හැඬුම් මැඩගන්නට දරන වෑයම දකිත්ම දයාසිලිගේ සිත අනුකම්පා සහගත හැඟීමක් පහළ විය.

"මං මෙහෙම මේ කෙල්ලට කෑ ගහන එක හොඳ නෑ..." යි පසු තැවෙමින් ඇය පුතුයා ලුහු බැන්දා ය.

කුණු කාණුවක බඩ ගෑ කලෙක මෙන් අපවිත්‍රව සිටිය ද මේ ගිනි ගහණ දාවලේ ආශා සිතින් කයින් ප්‍රාර්ථනා කළේ කැමට යමකි. නුදුරෙහි වියළී යමින් ඇත්තා වූ මඤ්ඤොක්කා පඳුරු කීපය දෙස ඇය තෘෂ්ණාබර දෑසින් බැලුවා ය. උදලු කෙටියක් ඇතත් කලකින් වැස්සට සේදී නොගිය පොළොව කළු ගල් පර්වතයක් මෙන් දැඩි බව ඇය දැන සිටියා ය. එහෙත් දිගු රැළි සායකින් පමණක් විළි වහගෙන සිටියදී පවා ඇය මහපොළොව සමඟ අරගල කරන්නට ලක ලෑස්ති වූවා ය.

"මොක ද ඔය කරන්නෙ?"

යතුරු පැදියේ හඬ නොඇසුණෙන් ඇය ඔහු සමීපයට පැමිණෙනතුරුම දකින්නට සමත් නොවූවා ය. එහෙයින් කන ළඟම ඇසුණු ඒ හඬින් ඇගේ සිරුර කිළිපොලා ගියේ ය. ඔහු තමා අතහැර පලා ගිය බව දැඩිව විශ්වාස කළ ඇයට ඒ හඬ ඇදහිය නොහැක. ඇය ඔහු දෙස හැරී බැලුවේ හැකිතාක් විවර කරගත් දෙ ඇසිනි. ඒ බැල්ම ඔහුගේ සිත සිදුරු කළ කිනිසි තුඩක් විය.



"ඇයි?" යි ඔහු ඇසුවේ හැබෑම පුදුමයෙනි. ඇගේ දෙතොල සැලිණ.

"ඇයි?"

කොතෙක් වෑයම් කළ ද ඇය හැඬුම් මැඩගන්නට ඇපොහොසත් වූවා ය. මිත්තණිය මිය ගිය මොහොතේදීවත් කඳුළු නොසැළු තමා මේ පිටස්තරයෙකු අබියස හඬා වැළපිය යුතු නැතැයි තීරණය කළ ඇය උදළු කෙටිය අමෝරා ගත්තා ය.

"මේ... මොකද ඔය කරන්නෙ?"

ඇය මඤ්ඤොක්කා පඳුර වටා හාරන්නට වූයේ වියරුවෙන් මෙනි. ඒ සඳහා දරන නුවූමනා ආයාසය ඔහු කුපිත කරවයි.

"පේන්නැද්ද කරන දේ...?"

මැඩගත් ඉකිය ඇගේ හඬ විකෘති කරයි.

"මොකටද මඤ්ඤොක්කා?"

"තම්බන්ඩ... නැතුව ආයෙ බල බලා ඉන්ඩ මඤ්ඤොක්කා හාරනවැයි කව්රුවත්..."

තැම්බූ මඤ්ඤොක්කා හැළියක සුගන්ධයෙන් ඔහු ගේ නැහැපුඩු පිරී ගියේ ය.

"ඔන්න මං ෂෝක් ලුණු මිරිසකුත් ඇඹරුවා..."

රූපිකා හපන්කමක් කළ දැරියක මෙන් ජයග්‍රාහී සිනාවක් පෑවා ය.

"ඇත්තට... මං කාලම නෑනෙ ඔය ෂෝක් ලුණු මිරිස්... මොනවගේ ද නැන්දෙ එව්වා...?"

ඇය ඔහුට නොරිදෙන්නට පහරක් ගැසුවා ය.

"එන්න එපා දන්නව ද මාව පල් කරන්න..."

ඇය යටැසින් බලා හෙළු තරවටු බැල්මෙන් ඔහු ගේ යෞවන හෘදය උණුසුම් විය.

"හරි හරි මීට පස්සෙ එහෙම කරන්නෑ..."

Scanned with CamScanner

ඇය වෙත තවත් ළංවූ තරුණයා මෘදු හඬින් පොරොන්දු විය.

"මට නැන්ද කියන්නත් එපා සඳුන්"

එය බැගෑබර ආයාචනයක් විය. ඔහු දයාන්විත මඳහසක් පෑවේ ය.

"ඔයා එහෙම කියද්දි මට බය හිතෙනවා. මම කරන්නෙ වැරැද්දක් නේද කියලා මට මතක් වෙනවා..."

"අපි වැරැද්දක් කළේ නැතේ..."

ඇය ඔහු දෙස එක එල්ලේ බැලුවා ය. ඒ බැල්මේ වූයේ "අපි වැරැද්දක් කරමුද" වැන්නකි. ඔහු ගේ හදවත වේගයෙන් ගැහෙන්නට විය. ඇය සමඟ එක්ව ඕනෑම වරදක් කරන්නට ඇයට උවමනා වන්නේ නම් මනුෂ්‍ය ඝාතනයක් කරන්නට පවා ඔහු මේ මොහොතේ ඉත සිතින් සූදානම් ය. ඇගේ අනුරාගී දෑස ඉන්ද්‍රජාලයක් විය. ඔහු ඒ ඉන්ද්‍රජාලයට යටව ඇගේ අණ පතා බලා සිටියේ ය. සැබැවින් ම කිවහොත් ඔහු ඇලඩින්ගේ පුදුම පහන තුළ සිරගත භූතයා හා මුළුමනින් ම සමාන විය. ස්වාමියා ගේ නියෝගය නොපිරිහෙළා ඉටු කරන්නට සැදී පැහැදී සිටින සුවච කීකරු භූතයා...! ඔහු ගේ යෞවන සිරුර දවාලන රාගාග්නිය දෙඇසින් පමණක් නොව දෙතොලින් ද දකිමින් ඇය තැති ගත්තා ය. රෝගී මහල්ලා හැරුණු කොට බාධා කරන්නට අයෙක් නිවස තුළ නොසිටිය ද කිනම් මොහොතක හෝ නැනණ්ඩිය පැමිණිය හැකි බව සැක කළා ය.

දයාසීලි දෙනාස් පුඩු පුම්බා ඉව කරන බැල්ලක මෙන් කිසිවක් සොයන බව රූපිකා දැන සිටියා ය. ඇය නිතර පතිවත පිළිබඳව කතා කරයි.

"ගෑනියෙක් විච්චහම පතිවත රකින්ඩෝනෑ... දැක්ක නෙ සීතා දේවි ගිනිමැලේට පැනලත් එක මයිල් ගහක්වත්, පිච්චුණේ නෑනේ... ඒ තමා පතිවතේ බලය... ගෑනියෙකුට තියෙන ලොකු ම බලයයි හයියයි ඒක තමා..."



හූමිටි දෙන්නටවත් දොතොල ඇත් මෑත් නොකරන රූපිකා හිස සලයි.

සඳුන්ට ඇහෙන්නට මෙන් ම ඇනෙන්නට ද දයාසීලි බොහෝ දෑ කියයි.

"කසාද බැඳපු ගෑනියෙකුට අහුවුණොත් ඉතිං කොල්ලෙක් ඉවරම තමා... ඉවරෙටම ඉවරයි... ආයේ ඒකාගෙං ගන්ඩ දෙයක් නෑ... රූකඩේ වගේ අර ගෑනිගේ අතේ නැටවෙනවා මිසක්කා ඒකාට වගතුවක් නෑ... මෙච්චර මේ රටේ පිපිච්ච මල් වාගේ කෙල්ලෝ ඉන්දැද්දි අනේ මෝඩ කොල්ලෝ කසාද බැඳපු ගෑනු එක්ක පැටලෙනවනෙ... මුංට මොළේ කළඳක් නැද්ද හැබෑටම..."

කටදිව පිළිස්සෙන තරමට උණුසුම් දියරයක් මුවෙහි ලා ගිලගන්නට ද ඉවත දමන්නට නොහැකි වූ එකෙකු මෙන් සඳුන් බලා හිඳි යි. ගිල්ලොත් කටදිව මැදිවාට උගුර ද පිළිස්සෙයි. රසවත් බැවින් ඉවත දමන්නට ද ලෝබය. තක්කු මුක්කු වී ඉන්නා ඉලන්දාරියා දෙස නෙතඟින් බලන දයාසීලි කොස්සට උඇල්ලකට වාගේ බර දෙයි. ඇවිස්සෙන දුහුවිල්ල ඔහු ගේ පමණක් නොව ඇගේ ද පෙණහලු තුළට රිංගන බැවින් දෙදෙනා ම කිවිසුම් අරිති.

"අත් දෙක ඇවිල්ල යි... ඉන්න බෑ අප්පා..."

කුස්සිය තුළ ම තමා බදා වැළඳගෙන වැතිරෙන්නට ඔහු තුළ වන බලවත් ආශාව හැඳින ගත් ඇය දෙ අත්ල විදහා පායි. දැරියක මෙන් මුහුන හකුළා ගනිමින් වේදනා මවා පායි.

"හුඟක් ඇවිල්ල ද..?"

ඔහු අසන්නේ ඇගේ දෑත දෑතින් අල්ලා ගනිමිනි. නුහුරු නුපුරුදු ඉසව්වක් කරා තමා රැගෙන යන ඇයම යළි ඒ මන්මත් හැඟීම් සිඳ බිඳ විසුරුවා දමන්නේ යැයි උපදනා නොපහත් බවින් වෙළෙමින් වුව ඔහු ඇයට තවත් සමීප විය.

"මොකද ඔය...?"

ඒ එක් පැනය මිනිස් මුවකින් නොව කාලතුවක්කුවකින් පිට වූ උණ්ඩයක් තරමට වේගවත් හා බිහිසුණු විය.

සඳුන් වහා ඇගේ දෑත අත් හැරියේ ය. ඇය බය බිරාන්තව ගිය ද අවේලාවේ පැමිණි සැමියා වෙනුවෙන් නොව තමා වෙනුවෙන් බැගෑබර සිනාවකට වෙහෙසුණා ය.

"මොකද්ද මෙතන වෙන්නෙ?"

ජාලිය ගේ දෙනෙත බුර බුරා දැල්වෙන ඇබිත්තන් මිට දෙකකි.

"ම්... මාමේ..."

සඳුන් තැතනුවේ ය.

"තාත්තා බලන්ඩ ආවා..."

ඇය සිය ඥාති පුත්‍රයා වෙනුවෙන් වහා උත්තර බැන්දා ය.

"මං ඇහුවෙ උඹෙං නෙමේ මූගෙං..."

ඇය කැට මුගුරින් තැලුම් කෑ බැල්ලක මෙන් හැකිලුණා ය.

"ම්... මං කිරියත්ත බලන්ඩ ආවෙ..."

ජාලියට කුපිත වීමට කිසිදු කරුණක් නැතැයි අඟවන කලෙක මෙන් සඳුන් හිනැහෙන්නට තැත් කළේ ය.

"කිරියත්ත ඉන්නෙ කොහෙද..."

"ඉන්නෙ... ඉන්නෙ ඉස්සරහ කාමරේනෙ..."

ඒ ප්‍රශ්නය හාස්‍යයෙන් සලකමින් සඳුන් හිනැහුණේ ය.

"එහෙනං යකෝ උඹ මොන මගුල ද මේ කුස්සියේ කරන්නෙ...?" යි උස් හඬින් ඇසූ ජාලිය අකුල් පහරක් එල්ල කළේ ය.

"අනේ එපා... එපා ගහන්න..." යි කෑ ගාමින් රූපිකා ඔවුන් අතරට පැන්නා ය.

"ඇයි? මූට ගහනකොට උඹට රිදෙනව ද?"

සැමියාගේ සාවද්‍ය බැල්ම ඉවසිය නුහුණු ඇය "මොක ද ඔයාට මේ වෙලා තියෙන්නෙ?" යි කෑ ගසා ඇසුවා ය.



"මට මුකුත් වෙලා නෑ... හැබැයි මූට මොක ද වෙලා තියෙන්නෙ කියලා හොයලා බලන්ඩ... තමා මම මේ ආවෙ..." යි කී ජාලිය තවමත් ඒ අකුල් පහර අදහාගත නුහුණු තරුණයා වෙත කඩා පැන්නේ ය.

මාමාත් බෑණාත් අතර කලහයෙන් මහත් සේ බියපත් තරුණිය "අනේ එපා... එපා... යි මුර ගෑවා ය.

පෙරළා පහර දීමේ හැකියාව ඇතත් සඳුන් සිය මාමාට අතක් ඔසවන්නට නොසිතුවේ ය.

"පිස්සු ද... පිස්සු ද මාමේ... මාව අතාරින්ඩ..." යි ඒ සවිමත් ප්‍රහාරයෙන් ගැලවෙන්නට වෑයම් කළා විනා ප්‍රති ප්‍රහාරයක් අරබයා අල්ප වූ වෑයමක් හෝ නොදැරුවේ ය.

"අනේ අතාරින්ඩ... අයියෝ අතාරින්ඩ..."

රූපිකා කඳුළු සලමින් සිය සැමියාගේ ඇගේ එල්ලුණා ය. ඇයට අවනතව නොව වාවාගත නොහැකි කෝපයෙන් සඳුන් අතහැර අගේ කෙස් වැටියෙන් අල්ලාගත් තරුණයා "මෙහෙ වර" යි ගෝරනාඩු කළේ ය.

"එපා... එපා ගහන්ඩ එපා... අනේ කව්රුවක් නැද්දෝ..." යි ඇය භීතියෙන් ද ශෝකයෙන් ද වෙව්ලා යමින් බෙරිහන් දුන්නා ය.

ඇය ඇදගෙන යාම පහසු නොවීය. "එපා එපා අනේ මාව අතාරින්ඩ" යි කෑ ගසන බිරිඳ කාමරය තුළට තල්ලු කළ ඔහු දොර වසා යතුරු ලෑවේ ය. වැසුණු දොරට එපිටින් ඇය නොනවත්වා විලාප දුන්නා ය. ඒ හඬ වෙනත් ලෝකයකින් ගලා එන්නාක් මෙනි.

"ඇයි මාමේ මේ?"

සඳුන් හැඬුම්බර හඬින් ඇසුවේ ය.

"මාමට කව්රුහරි ලොකු බොරුවක් කියලා..." යි නිර්දෝෂීභාවය ගෙන හැර පාන්නට උත්සාහ කළේ ය.

Scanned with CamScanner

"කට වහපං... උඹ එක වචනයක් කතා කරන්ඩ ඕන් තැ. රස්සාවට යන්නැතුව මෙතෙන්ට රිංගන්ඩ උඹට ලැජ්ජ නැද්ද...? යකෝ ඒ උඹේ තැන්දා..."

"එහෙම දෙයක් නෑ මාමේ... මං ආවෙ කිරියත්තා බලන්ඩ. මස්සෙනාත්තා නැමිලුවා කියපු නිංදා කුස්සියට ආවෙ..."

ජාලිය නැවතත් සඳුන් අල්ලා ගත්තේ ය.

"බොරු කියන්ඩ එපා මිනිහෝ... මගෙ ඇස් දෙකම දැක්කා උඹ අරකිගෙ අත් දෙකෝං අල්ලගෙන ඉන්නවා..."

එවර එල්ල වූ අතුල් පහර තරුණයා බිම හෙළන්නට තරම් වේගවත් හා වේදනාකාරී විය.

"ලුණු මිරිස් අඹරලා ඇස් දෙක දැවිල්ලයි කියපු නිංදා..."

නිදහසට කරුණු ගෙන හැර පාන්නට ඉඩ නොදුන් ජාලිය ඔහු නැගිටුවා තවත් පහරක් ගැසුවේ ය.

"හා හා... එතකොට මං එනකොට උඹ ඒකිගෙ අත් දෙක පිඹ පිඹ හිටියෙ දැවිල්ල නිසා... අනේ යකෝ තොපිට විලියක් නැතේ... තොපි දෙන්නව මරලා මං හිරේ යනවා..."

රූපිකා හොතවත්වා දොරට ගසන හඬ පසුබිම් සංගීතයක් මෙන් රැව් දුන්නේ ය.

"මාමට වැරදිලා... එහෙම දෙයක් නෑ මාමේ... ඇත්තමයි. මේක ලොකු වැරදීමක්..."

හොතවත්වා පහර කමින් වුව සඳුන් වැයමෙන් කතා කළේ ය. කොළ පුපුරා රුරා හැලෙන ලේ බිඳු ඔහුගේ හිස තෙමා දමයි.

"පුතේ..."

වේදනාවෙන් ද බියෙන් ද කැකෑරෙන ළය මඩලක වග කිය පාන ඒ උස් හඬ ජාලියගේ යක්ෂාවේශය තුනී කළේ ය. හරියට බලසම්පන්න ඇඳුරෙකු මන්තරයක් ජප කළාක් මෙනි. හැරී බැලූ තරුණයන් දෙදෙනා දුටුවේ සැරයටියේ ආධාරයෙන් පැමිණි



මහල්ලා ය. සිය පුත්‍රයාටද මුණුබුරාට ද අපමණ ස්නේහයක් දක්වන "සිනාමුසු මහල්ලා මේ හැන්දෑවේ අවතාරයක් දුටුවෙකු මෙන් සුදුමැලිව සිටියේ ය.

ජාලියගේ ප්‍රහාරය ලිහිල් වූයෙන් සඳුන් වහා පලා ගියේ ය.

"සඳූ..."

ඒ වියපත් හඬ කුස්සියේ දොරින් පැන දුවන තරුණයාගේ දෙකනේ පමණක් නොව හදවතේ ද ඇමිණුනේ හීයක් මෙනි. දැනුදු තෙවසරකට පසුවද විෂ පෙවූ හී තුඩක් මෙන් ඒ හඬ ඔහුට දුක් දෙයි.

"කිරියත්තා එක අතකින් පපුව අල්ලාගෙන කෑ ගහනවා මම ඇස් කොණින් දැක්කා. අනේ මොනව වුණාද දන්නෑ..." යි පාපොච්චාරණය කරන්නට තරම් අමරසිරිගේ මිත්‍රත්වය උණුසුම් විය.

"ඇයි ඉතිං අම්මටවත් කතා කරන්නැත්තෙ? කතා කෙරුවනං විස්තර දැනගන්ඩ තිබ්බනේ... අහිංසක අම්ම ගෙ පපුවෙ මොන ගින්දරයක් ද ඇත්තෙ තමුන්ගෙ පුතා කොයි ලෝකෙ ඉන්නව ද කියලා හිතනකොට..."

ගෙදරින් පලා ගිය පුත්‍රයාගේ දෑසට කඳුළු නැගිණ.

"මාමා අම්මටත් කියන්නැති... මං කොහොමද අමරෙ අයියා අම්මගෙ මූන බලනවා තියා කටහඬවත් අහන්නෙ...?"

තවත් කිසිවක් නොපැවසූ අමරසිරි සිය මිතුරාගේ අභාග්‍ය සම්පන්න ඉරණම වෙනුවෙන් සුසුමක් හෙළුවේ ය.

උදළු තලය වියළි පොළොවේ ගැටෙන හඬ කනකට විද දරා ගත නොහෙන තරම් අමිහිරිය.

"ඕක නවත්තනවා..."

සඳුන් ඇගේ දෑතට මැදි වූ උදැල්ල අල්ලා විසි කළේ ය.

"මං කැම නොවා... ඔච්චර බඩගිනි නං ගිහිල්ල කනවා..." යි කියමින් ඔහු ඇය ද තල්ලු කළේ ය. වෙහෙසින් ද සයින් හා පිපාසයෙන් ද මිරිකී හුන් තරුණිය ඇද වැටුණා ය.

Scanned with CamScanner

ඒ නොදුටු විලාසයෙන් නිවෙස වෙත මඳක් දුර ගිය ඔහු හිටි හැටියේ නැවතුණේ ය. ඇය කෝපයෙන් වියරු වැටී තමාට පහර දෙන්නට හඹා එනු ඇතැයි ඔහු අපේක්ෂා කළේ ය. එහෙත් ඇය මලාක් මෙන් නිහඬ ය. කුකුසින් දැවෙමින් ඔහු හැරී බැලුවේ ය.

මඤ්ඤොක්කා පඳුර යට වැදහොත් සිරුරින් කිසිදු හඬක් නොනැගිණ.

"මං තල්ලු කරපු පාරට මේකිගෙ ඔලුවවත් වැදුණා ද..." යි කොඳුරමින් ඔහු ඇය වෙත දිවවේ ය.

"ඒයි.. ඒයි... මොකද?... මොකද මේ...?' යි කෑ ගාමින් ඇය වෙත නැඹුරු විය. ඇගේ උරහිසින් අල්ලා සොලවවේ ය. තවමත් තමා ඇගේ නම නොදන්නා බව සිහි වත්ම ඔහුගේ කුකුස කෝපය මුසුවිය. වදෙන් පොරෙන් ඇය නැගිටුවා ගනිමින් "ඒයි.. ඒයි..." යි පෙරට වඩා උස් හඬින් කෑ ගැසුවේ ය.

පිළිතුරු ලෙස ඇගේ මුවින් පිටවූයේ ඉකි බිඳුමකි. ඇය ඔහු තරයේ බදා ගනිමින් වැළපුණා ය.

"ඇයි? ඇයි මේ අඬන්නේ...?"

ඔහු ඇසුවේ කරුණාවෙන් නොවේ. මහත් නොරිස්සුමකිනි.

"මං... මං හිතුවෙ ඔයා පැනල ගියා කියලා..."

ඔහුගේ දෙතොලතර සානුකම්පිත සිනා බිඳක් නැගිණ.

"මං හිතුවෙ නෑ හිතුවෙම නෑ ඔයා ආපහු එයි කියලා..." යි වැයමින් කියාගත් ඇය තවත් හයියෙන් ඉකි ගැසුවා ය.

මේ නාඳුනන තරුණිය අත හැර පලා යා යුතු බව තමා වරක් දෙවරක් නොව කීප වරක්ම සිතූ බව ඔහු හෙළි නොකලේ ය.

# 9

එකම වේදිකාවක ලෙළ දෙන කොළ හා නිල් කොඩි නිහඬව කියා පාන්නේ ඉතිහාසයේ ප්‍රථම වරට ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක සුසංයෝගය පිළිබඳව ය. සැරසිලි සඳහා කොළ හා නිල් දෙපැහැයම භාවිතා කරන්නට සංවිධායකයන් තරයේ වග බලා ගත්තෝ ය. වෙනදා දෙපසට වී සතුරු ආකල්පයෙන් එකිනෙකා පතුරු ගසන කඳවුරු දෙකක් මෙලෙස එකතුවීම අදහාගත නොහැකි හා අනුමත නොකළ පිරිස් පවා රැස්වීම් භූමිය කරා ගෙන එන්නට මාලා මල්කාන්තිගේ හිටිවන කවියට වඩා ආගා සෙව්වන්දිගේ විරිඳු ගායනය සමත් විය.

එහිලා වඩාත් බලපාන්නට ඇත්තේ මැදිවිය පසුකරමින් සිටින ගැහැනියගේ තරබාරු ශරීරය හමුවේ භද්‍ර යෞවනයේ පසුවන්නියගේ පිරිපුන් හා ආකර්ෂණීය ශරීරය විය යුතුය. කොතෙක් අගහිඟ ඇතත් දංකුඩය සූරා කා හෝ ඇතැම් විට වතුර කෝප්පයකින් කුස රවටාගනිමින් මිණිබිරියට යහමින් කන්නට බොන්නට දුන් සීතා ද මේ නෙරපෙන පොදිකන ජනකාය අතරේ දිගු කරගත් ගෙලින්ද කඳුළු පිරි ඇසින් ද පසු වූවා ය.

ආගා දේශපාලන වේදිකාවක විරිඳු කීම කෙරෙහි කිපෙමින් වුව සීතා ඒ හැම රැස්වීමක්ම නරඹන්නට ගියා ය.

"ඔය විරිදු කියන්නෙ මගෙ කෙල්ල" යි සමීපයෙහි සිටින්නෙකු සමඟ පවසන්නට ද ඇය අමතක නොකළා ය. එහෙත්

ඈත රූබර යෞවනියද මෑත ජරපත් මැහැල්ල ද සංසන්දනය කරමින් ඒ කියුම හාස්‍යයෙන් හා අවඥාවෙන් බැහැර කළ අයෙක් ද නොසිටියා නොවේ.

"මයෙ මිණිබිරී... මයෙ චාන්දනියගෙ කෙල්ල..." යි තව දුරටත් කියන සීතා තවත් කඳුලක් පිස ගනියි. කිළිටි ඔසරිපට ඇගේ අසෝබන අතැඟිලි අතරේ පැටලුන හැටියේ ය.

"අප්පේ ඇස්වහ කටවහ වදින්ඩෙපා මගෙ හිඟන්නිට..."

කිසිදු සබකෝලයකින් තොරව විරිදු කියන කෙල්ල වේදිකාව මත පරිණත හා ආධුනික දේශපාලඥයන් ද පිට්ටනියේ අතුරු සිදුරු නැතිව පිරුණ ජනකාය ද තඹ සතයකට මායිම් නොකරන්නීය. හරියට වේදිකාවක් මත උපන්නියක මෙන් ඇය නොබියව ඒ මේ අත යයි. වේදිකාව ද ඒ මත සියළු අංගෝපාංග ද සකල පංචස්කන්ධයන් ද කෙරෙහි දක්වන නොසැලකිලිමත් භාවයම ඇය වෙත එක් කරන ආකර්ෂණයද උජාරුවද මෙතෙකැයි කිව නොහැක.

සකල සිරින් පිරි සිරි ලංකාවේ
සියළු දූසිරිතින් මුල් තැන ආවේ
දන්නෝ දනිති වසන්තගේ වග
සන්තෝ බුදු සන්තෝ
කෙල්ලන් ගෙට ගං
කෙල්ලන් ගෙට ගං....

පාර්ලිමේන්තුවට තේරී පත් වීම සඳහා තරඟ වැද සිටින හිටපු පළාත් සභා මන්ත්‍රීවරයා නිරුවත් කරන ඒ විරිදුව පබඳන්නට මල්කාන්තිට සහාය වන මහළු කවියා වේදිකාව පසුපස හිට ගෙන හිස සලයි. රාත්‍රිය මුළුල්ලේ නිදි වරමින් ඔහු රචනා කරන විරිදු මෙන් ම කවිද මෙලෙස කාන්තා හඬකින් ඇසෙන කල ඔහු ලබන්නේ අපමණ සන්තුෂ්ටියකි. ඒ හිලව්වට ඔහු අත තබන බත් පැකැට්ටුවටත් සොච්චම් මුදලටත් වඩා ඔහු ප්‍රිය කරන්නේ අරක්කු බෝතලයට ය. කසිප්පු පැකැට්ටුවකින් සිය මත් ලෝලී



බව සන්සිඳුවාගන්නා මහළු කවියාට ඉඳහිට ලැබෙන මේ අරක්කු බෝතලය අමිල නිධානයකි.

"ගෙදර ඉන්න කැහැටු ගෑනි වට චන්දනාවේ ගියදාක දිව්‍ය අප්සරාවක් ආවා වගේ මාලෝ මට මේක..."

අරක්කු බෝතලය බහාලූ රෙදි මල්ල පරිස්සමින් ඇකයේ තබාගෙන ඔහු හඬනගා හිනැහෙන්නේ ආපසු යන අතරතුර ය. මාලා නොපමාව ඒ සිනාවට හවුල් වෙතත් ආශාගේ දෙතොල තරයේ පියැවුණ හැටියේ ය. ඇය කොහොමටත් නිතර හිනැහෙන එකියක නොවේ.

"වෙන කෙල්ලො ගිරව් වගේ කච කචේ... මේකි ගල් ගිල්ලා වගේ මීක් සද්දයක් නැතුව ඉන්නවනෙ යකෝ හත් අවුරුද්දක් හරි..." යි ඇතැම්විට ඇගේ මිත්තණිය දොස් පවරයි.

ඒ කතාවේ එල්ලී බොහෝ වේලා බහින් බස් වන්නට මෙන්ම නිහඬවම පසුවන්නට ද ආශාට පිළිවන.

බත් පැකැට්ටුව ද මුදල් නෝට්ටුවද මිත්තණියගේ ඔඩොක්කුව මත අත හරින යුවතිය "අදත් ආව නේද?" යි අසන්නේ රළු පරළු හඬිනි.

සීතා කොතරම් හොර රහසේ ගියද, රැස්වීම හමාරවන්නට පෙර ආපසු පැමිණ ගෙපැලෙන් එළියට නොගිය ලෙස පසුවූවද ආශාගෙන් යමක් සඟවා ගැනීම පහසු නැත.

"මං ගිය එකක් නෑ... මගේ මේ තුනටිය ඇවිලිලා දොට්ට පිලටවත් යාගන්ඩ බැරුව මං මේ ඉන්නෙ..."

රැළි නැඟි මුහුන හකුලා ගනිමින් ඇය පාන වේදනාව නොතකන ආශා ඉතා පරිස්සමින් ඇඳුම් උනයි. ඒ අත් දිග බ්ලවුසය සහ විළුඹ තෙක් දිග රැළි සාය මාලාගේ නිර්මාණයකි.

"කොට සායක් ඇන්ද නං කෙල්ලට ලස්සනට තියෙයි..."

පාර්ලිමේන්තුවට යාමට සිහින මවන අපේක්ෂකයාගේ කෑදර ඇස විරිඳු කෙල්ලගේ හිස් මුදුනේ සිට දෙපා දක්වා සක්මන් කරයි.

Scanned with CamScanner

"කොට සායක් අන්දලා විරිදු කියන්ඩ බෑ මන්ත්‍රීතුමා... එහෙනං ඉතිං ඔය බයිලාවක් පොප් සිංදුවක් තමා කියන්ඩ වෙන්නෙ..."

මාලා මල්කාන්ති ඔහුගේ රැස් වළල්ලට බිය නොවෙයි. ඇය කිව යුත්ත එක එල්ලේ කියයි.

"හිතේ ඇති කොටට කොටේ අන්දලා කෙළ හල හලා ඉන්ඩ. මං ඔය කොයි ගොයියත් හොඳට අඳුරනවා... ඕනවට වඩා අරක මේක කියාගෙන ආවොත් නඟිනවා වසන්තයගෙ ඉස්ටේජ් එකට... මූංටම හිට්වන කවියි විරිදුයි කියාගන්ඩ ඇරලා. ඔය මොකා දිනුවත් අපිට ඇති සෙතක් නෑ නංගියේ... අපි අත හෙල්ලුවොත් අපේ බඩ පිරෙයි. අපිත් මේ දඟලන්නෙ වතුර ටික බොරවෙච්චි වෙලාවේ මාලුවෙක් අල්ලගන්ඩ මිසක්කා වෙන මොන කෙහෙල්මලට ද...? ඕකුං පාර්ලිමේන්තු නොවෙයි දිව්‍යලෝකෙ ගියත් කොරයි අපිට..."

ත්‍රීවිලරයට නැඟි වේලාවේ පටන් ඇය අතොරක් නැතිව බැන වදියි. ඇකයේ උණුසුම් වන අරක්කු බෝතලය පිළිබඳව සිතන මහළු කවියාට ඇගේ හඬ නොඇසෙයි. මහා ජනකායකගේ ඔල්වරසන් හඬ තවමත් දෙකනේ රැව් දෙන බැවින් දෝ ආශාද නිහඬ ය.

"හැමදාම ඉතිං මං ගියාට පස්සෙ යනවා. මං එන්ඩ කලිං එනවා. මොන එහෙකට යනවද මංදා නිකං බොරුවට අව්වෙ පිච්චි පිච්චි ඉන්ඩ..."

ආශා අකීකරු දියණියකට දොස් පවරන මවක මෙනි.

"උඹේ පස්සෙං යන්ඩ මට වෙන වැඩක් නැතේ..."

මිණිබිරිය සමඟ බහින් බස් වන්නට තරම් හයියක් නොවූයෙන් සීතා දුර්වල හඬකින් උත්තර දුන්නා ය. සැබැවින්ම මේ ගමන් බිමන් ඇගේ මහළු කයට ඔරොත්තු නොදෙයි.

"මොනව වුණත් උඹ ඌට ඔහොම පලිච්චි කොරන එක වැරදියි ආසෝ... උඹට අඹ ඇටේක දෙයක් නොදුන්න බව හැබෑව. ඒ වුණාට ඒ උඹේ අප්පා..."



ඒ කතාවෙන් කෙල්ල ඇවිස්සෙන්නේ කඩි ගුලක් මත පස්ස ඔබාගත් කලෙක මෙනි.

"ගියේ නැත්තං කොහොමද දන්නෙ...?"

තනපටය හා යටසාය සහිතව වූව මිත්තණිය ඉදිරියට එන්නට ආශා නොපැකිළෙයි.

හැන්දෑ අඳුරේ බබළන ඒ තුණුසපුවෙන් කැළඹෙන මැහැල්ල "බලාපල්ලා මේකි... බාගෙට හෙළුවෙං ඉඳගෙන... ඇදගනිං වස්තරයක්..." යි කෑ ගසයි.

"නෑ නෑ ඉස්සෙල්ලා කියන්ඩ බලන්ඩ. ගියේ නැත්තං දැන ගත්තෙ කොහොමද කියලා"

"ඕකට ආයෙ රැස්සීමටම යන්ඩෝනැයි. ඔය කව්රුත් කියන්නෙ උඹ වසන්තයා පතුරු ගහනවා කියලා ඉස්ටේජ් ගානෙ ඇවිද ඇවිද..."

ආශාගේ දෙතොලතර ඒ කෲර සිනා බිඳ නැගෙයි. දෙනෙත ගිනි පුපුරු දිදුලයි.

"අනේ මේ ඔයා කට වහගෙන ඉන්ඩ..."

"කට වහගෙන ඉන්නෙ කොහොමද...? ඔය රැස්වීම් හෙටානිද්දට ඉවර වෙයි. ඉං පස්සෙ මොකා දිනයිද මොකා පරදියිද කව්ද දන්නෙ... හා බැරි වෙලාවත් වසන්තයා දිනුවොත් මොකද වෙන්නෙ? මේ පැල් කොටේට ගිනි තියන් නැද්ද බං... උගෙ චක් ගෝලයෝ උඹට ඇදගෙන යන් නැද්ද...? මේ නාකි මං මොකද කොරන්නෙ...? එක පයිං පාරක් වැදිච්ච හැටියෙ මං මැරිලා වැටෙයි... ඉං පස්සෙ උඹට මොකද වෙන්නෙ? උඹටත් උඹේ අම්මට වගේම අප්පෙක් නැති දරු පැටියෙක් වදන්ඩ වෙයි..."

ඇඳ මත හිඳගෙන ඉන්නා මැහැල්ල වෙත කඩා පැන්න කෙල්ල "නෑ... නෑ..." යි මුර ගෑවා ය. ඇය වෙතින් ඒ සා සාහසිකත්වයක් අපේක්ෂා නොකළ සීතා "ආසෝ" යි කෑ ගෑවා ය.

Scanned with CamScanner

මිත්තණියට පහර දිය නොහැකි බැවින් ඇය බත් පැකැට්ටුව ගෙන බිම ගැසුවා ය. ඇය කොපමණ වේගවත් වී දැයි කිවහොත් කඩදාසි කොළය ද ඉටි කොළය ද ඉරී පිපිරී ඒ තුළ බත් මාළු පිඟී විසිර ගියේ ය. මුදල් නෝට්ටුවද ඇගේ දැතින් කුඩා කැබලි වලට ඉරිණ.

"එපා එපා..."

බත් පැකැට්ටුව නොව මුදල් නෝට්ටුව රැක ගන්නට සීතා වෙහෙසුණා ය.

"මොන අපරාදයක් ද අප්පේ... දාහෙ කොළයක් නේද...?" යි ඇය අපමණ සංවේගයෙන් හූල්ලා වැටුණා ය.

"ඉතිං මොකද...? තාත්තා කියන එකාට බැනලා හම්බ කරපු සල්ලිනෙ... බනින එක වැරදි නං ඔය සල්ලිත් වැරදිනෙ..."

අඩ නිරුවතින් පසුවූ කෙල්ල අභියෝගාත්මක බැල්මක් හෙළුවා ය.

"උඹේ අත් දෙක කුණු වෙන්නෝ නෑ මේ කොරාපු අපරාදෙට... ඈ යකෝ සල්ලි කොළයක් ඉරනවද ඔහොම සිහි කල්පනාව තියෙන මනුස්සයෙක්...?"

ඊට ද ආශාට උත්තරයක් තිබිණ.

"කව්ද දන්නෙ නෑ හෙට අනිද්දට මැරිලා ගියාම කුණුවෙන්නෙ... මං නං එහෙම ඉක්මණට කුණුවෙන්නෑ... මේ ජේන්නැද්ද ඇනුත් සොහොං ලකුණු පහළ වෙලා තියෙන්නෙ..."

මරණය සිහි කිරීමෙන් මිත්තණිය කුපිත වන බව ඇය හොඳින් දනියි.

"ඔව් ඔව්... උඹ බලාගෙන ඉන්නෙ මං මැරිලා යනකල් තමා... මං ඒක නොදන්නවා කියලා හිතන්ඩ එපා ආසෝ... උඹ කොයි වෙලාවක හරි ඔය අත් දෙකෙං මගේ බෙල්ල මිරිකලා දාන්ඩත් බැරි නෑ... උඹ එහෙමට බැරි ගෑනි නෙවේ. උඹේ කුරිරුකොම දැක දැක තමා මං උඹ ඇහැක් වගේ බලාගත්තේ... පූරුවේ පතාගෙන එන වයිරක්කාරියක් උඹ මගේ. මං ඒකත් දන්නවා... මොකදැ ඉතිං කොරන්නෙ... කරුමෙ විඳවන්ඩෙපැයි..."



ඒ හැවිල්ල මේ හැන්දෑවේ ආශාට සිනාවට කරුණකි. පහසුවෙන් සිනා නොවෙන ඇය හඬ නගා හිනැහේ. ඒ උස් සිනා හඬින් ගෙපැළේ තහඩු පවා සැලෙන්නාක් මෙනි. අඩ අඳුරේ රැව් දුන් ඒ වියරු සිනාවට සපුරා වෙනස් මඳ සිනාවක් ඇගේ මුව'ග නැගුණේ රෙදිමල්ල පිරික්සා බලන කලය.

රැළි සායක් සහ ටීෂර්ටයක් පමණක් නොව චීත්තයක් ද තුවායක් ද දක්නට ලැබීමෙන් ඇය විමතියට පත් වූවා ය.

"අපරාදෙ... සල්ලි ගොඩක් යන්ඩැති" යි ඇය කුඩා දැරියක මෙන් සිය සිතැඟි නොවළහා හෙළි කළා ය.

"කීයක් ගියත් ඉතිං අඳින්ඩ එපැයි. මේ ගෙදර තියෙනවැයි ගෑනියෙකුට තියා මිනිහෙකුටවත් අඳින්ඩ ඇඳුමක්"

සඳුන්ගේ ස්වරයේ ද බැල්මේ ද තවමත් තැවරී ඇත්තේ නොරිස්සුමකි. හිටි හැටියේ කඩා පැන්න කෙල්ලක වෙනුවෙන් මේ හැටි මුදලක් වියදම් කරන්නට සිදු වනු ඇතැයි ඔහු කිසිසේත් නොසිතුවේ ය.

"කෝ...?"

ඇය අත පෑවේ ඔහු දෙස එක එල්ලේ බලමිනි.

"මොනවද?"

"ඔහු කුහුලින් දෑස හකුළාගත්තේ ය.

"බිල..."

"මොන බිලද...?"

ඔහු පුදුමයෙන් ඇසුවේ ය.

"ඇයි බඩුවක් ගද්දි කඩෙං බිලක් දෙන්නැද්ද?"

ඔහු අවඥාවෙන් මුව ඇද කළේ ය.

"ඇයි පුච්චලා නළලෙ අළු ගා ගන්ඩ ද..." මහ ලොකුවට බිල ඉල්ලන්නෙ?'

දුගඳ හමන සිරුර ද අපවිත්‍ර සාය ද ඇගේ රළු දිව නවතාලන්නට සමත් නොවේ.

"අන්තිම සතේට මම ගෙවනවා. බයවෙන්ඩ එපා..."

ඒ උජාරු කතාවට සිනා නොවී සිටින්නේ කෙලෙසදැයි ඔහුට සිතිණ. එහෙත් තුසගින්නත් අධික උණුසුමත් මුව මද සිනාවක් හෝ නොතගයි.

"අනේ මේ... එනව යන්ඩ නාන්ඩ..."

"කොහෙද?"

"වැවට... මොකද ආයෙ ස්විමිං පූල් තියෙනව ද බැහැල ඉන්ඩ මේකෙ..."

ඇය මහත් උනන්දුවෙන් වැවට යාමට සූදානම් වූවා ය. දිය දහරක ගිලෙන්නට ඇත්නම් මේ තරුණයාගේ කවර කොන්දේසියකට හෝ යටත්වීමට ඇය සූදානම් ය.

ඇය යතුරුපැදියට නගින තුරු ඔහු ඉවසා සිටියේ ය.

"හරි..." යි කිව ද ඔහු යතුරුපැදිය පණ ගන්වන්නට උත්සුක නොවී ය.

"හරි... මං නැග්ගා..." යි ඇය තව දුරටත් පැහැදිලි කළා ය.

"මං දැක්කා..." යි ඔහු නොසැලකිල්ලෙන් කීය.

"එහෙනං ඉතිං ඕක ස්ටාර්ට් කරනවා..." යි ඇය අණ කළේ නොඉවසිල්ලෙනි.

"නාන්ඩ එක්ක යන්නෙ නම කිව්වොත් විතරයි..."

ඔහු එවැන්නක් පවසනු ඇතැයි නොසිතූ ඇය මොහොතකට ගොළුව ගියා ය.

"නම මොකක් වුණාම මොකද..."

"ඒක තමයි ඉතිං... නමක් දන්නෙ නැතුව මං කතා කරන්නෙ කොහොමද...?"

"කතා කර කර ඉඳල හරියන්නෙ නැනේ... මං යන්ඩ ඕන..."



පිටව යා යුතු බව නිතර සිතුණ ද කොතැනකට දැයි නිශ්චය කර ගන්නට ඇය අපොහොසත් වූවා ය. තමාට මේ විශාල ලෝකයේ ඇත්තේ ඉතා සුළු බිම් කඩක් හා හිතිගෙන ඇවුණු පැල්පතක් බව ඇය දනියි. එහෙත් එය ද මේ වනවිට අහිමිව නැතැයි ඉඳුරා කිව හැකි ද...?

"මාත් මෙහෙ ඉඳලා හරි යන්නෑ... වැඩක් හොයාගන්ඩ එපැයි..."

බත් මුලක් ද අතැතිව දෙමගක යන දෙදෙනෙකුගේ කතාන්දරයක් ඇයට සිහිපත් විය. මිත්තණිය කියා දුන් කප්පරක් කතන්දර සියල්ල අමතකව ගොසින. ඇය සිය කුඩා මිණිබිරිය උකුලේ හොවා ගෙන කතන්දර කී ඒ යුගය වෙනත් ආත්මයකට අයත් ලෙසින් දුරස් ය.

"මගේ නම සඳුන්..."

ඔහු සිය සැබෑ නම හෙළි කළේ මුසාවක් කිව යුතුදැයි මද වෙලාවක් කල්පනා කිරීමෙන් පසුව ය.

"එහෙනං මම සඳුනි" යි කී ආශා හිනැහුණා ය.

ඒ ස්වරය ද ඒ සිනාව ද ඇය අසත්‍යක්ම කී බවට සේලම් කියයි.

"මොක ද නම කියන්ඩ ඔච්චර බය?"

"බය වෙන්නෙ මොකට ද?" මම මොකෙකුටවත් බය නෑ..."

ඔහු දුටුවේ පලා යන කෙල්ලකි.

"බය නැති හිංදා වෙන්ඩැති දිව්වෙ... දුවගෙන ඇවිල්ලා මගෙ බයික් එකට නැංගේ..."

ඇය වහා යතුරු පැදියෙන් බැස්සා ය. රෙදි ගොන්න ද එක් අතකින් ගෙන සබන් කැටය සහිත කුඩා බාල්දිය අනෙක් අතින් එල්ලාගෙන පාරට ගොඩ වූවා ය.

"පයිං යන්ඩ බෑ. වැවට හුගක් දුරයි..." යි හඬ ගා කියමින් ඔහු යතුරු පැදිය පණ ගන්වා ගත්තේ ය.

Scanned with CamScanner

ආශා හැරී බලන්නටවත් නොසිතුවා ය. විඩාපත් සිරුර වෑයමින් උසුලාගනිමින් වුව ඇය නොනැවතී ගමන් කළා ය.

"නඟින්ඩ නඟින්ඩ... නිකං බොරුවට කකුල් කඩාගන්ඩ ඕන්නෑනේ..."

යතුරු පැදියේ වේගය බාල කරමින් ඔහු ඉල්ලා සිටියේය.

"නෑ ඕන් නෑ..."

ඇය ඔහු දෙස නොබලාම ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළා ය.

"හරි හරි... සඳුනි හරි හිරුණි හරි... නඟින්ඩ... නම මොකක් වුණත් ඔය මරුමුස් ගතිය නැතිවෙන්නෑනේ..."

ඒ කතාව ඇයට මිත්තණිය සිහි කරවයි.

"ඒ නේස් නෝනා මොන එකකට උඹට ආසා සෙව්වන්දි කියලා නම ආන්ඩ කිව්වද මං දන්නෑ... උඹට ආන්ඩ තිබ්බෙ තණ්හා රතී රඟා කියන නං තුනෙන් එකක්... ඒ මාර දූතිකාවෝ පරද්දන්නැද්ද උඹ... උඹේ දූස්ටකං දවසින් දවස වැඩි වෙනවා... කවදා හරි උඹව ගන්න මිනිහාට එක්කො බෙල්ලෙ වැල ආගන්ඩ වෙනවා... එහෙමත් නැත්තං ඒ මිනිහා අතිං උඹ මැරිලා යනවා... කවදා නමුත් සිද්ද වෙන්නෙ ඔය දෙකෙං එකක් තමයි. හොඳට මතක තියා ගනිං... මේ නාකිච්චි කිව්වය කියලා උඹ හොඳට මතක තියාගනිං."

කඳුළු පිසිමින් ද හොටු සූරමින් ද ඇය කියාගෙන යන්නේ මිණිබිරියගේ නොහික්මුණු ක්‍රියාවකින් සිත රිදුණු කලය.

"ගුරුන්නාන්සෙ ආවද?"

මුළු දවසක් බණ්ඩක්කා කැපීමෙන් විඩාපත් මැහැල්ල ගෙට ගොඩවූ හැටියේ ඇසුවා ය.

"නෑ... ගෝලයා ආවෙ..."

"සීට්ටුව දුන්නද...?"

සීතා මහත් උද්යෝගයෙන් වටපිට බැලුවා ය.

"ඔව්..."



"කොයි ඒක?"

ආශා මිත්තණිය දෙස නෙතඟින් බැලුවා ය.

"මං ඉරුවා..."

"ඉරුවා?"

ඒ කතාව ඇඳහිය නුහුණු මැහැල්ල ඉහළට ගත් හුස්ම පහළට නොහෙළා හිටිපිය හිටගෙන සිටියාය.

"ඇයි ඉරුවෙ?" යි අසන්නට ඇයට තරමක වේලාවක් ගත විය.

"නිකං..." යි කී කෙල්ල ඇකය මත එක් රැස් වූ අඹ ඇට බිම විසුරුවමින් පිල්කණ්ඩිය මතින් නැඟී සිටියාය.

"උඹට නං හොඳක් වෙන්නෙ නෑ... උඹේ අපල අණාවින දුරින් දුරු වෙන්ඩ කියලා නේද මං ඔය යන්තරයක් ආන්ඩ හදන්නෙ... සල්ලි බාගෙ තිබිලද... අප්පේ මං මැරිලවත් යන්නෙ නැනේ" යි සීතා මිට මොළවාගත් දැතින් වැහැරුණ ළය මඩලට පහර දෙමින් නොනවත්වා කෑගැවාය. අඳව ගොළුව බිහිරිව ගියාක් මෙන් ආශා වත්ත පහළ අඹ ගස වෙත ඇදුණා ය.

"කිව්වම අහලා නඟිනවා... තමුසෙ නමක් කිව්වත් මං කොහොමද දන්නෙ ඇත්තද බොරු ද කියලා... මට මගේ කටට එන නමක් කියන්ඩ බැරියැ... දැං නඟිනවා බයික් එකට..."

සඳුන් ඇවිට්ලි කළේ කිලෝමීටර් දෙක තුනක දුරක් ඇයට පයින් යාම කොතෙක් දුෂ්කර දැයි හඟිමිනි. කෙසේ හෝ වේවා නම පිළිබඳ විමසීම ද ඒ වෙනුවෙන් අඩදබර කරගැනීම ද එතෙකින් නිමා විය.

ආශා යතුරුපැදියට නැංගේ වැවට යා යුතු දුරට වඩා එය පිහිටා ඇත්තේ කොතනකදැයි නොදන්නා බැවිනි.

පරම සතුරන් මෙන් ඔරවා නෙරවා ගත් දෑසින් ගමන් ගන්නා යුවළ තවත් දවනු තවනු නොහැකිව මෙන් හිරු වළාකුළ කට මුවා වී සැඟවුණි. දුහුවිලි මුසු සුළං රොද පවා සුවදායක

විය. මඟ දෙපස ඉපල් බේරුණු ගහකොළ දැක දුක් ගන්නට අකැමැත්තෙන් වාගේ ඇය ඉදිරිය බලාගත් වනම උන්නාය.

"ගිය ආත්මෙ කරපු කරුමයක් පඩිසං දීලා... මොන වදයක්ද මේ..."

සඳුන්ගේ මැසිවිල්ල ඇගේ කනට නොවැටෙන්නට මෙන් බලාගනිමින් සුළඟ වේගයෙන් හැමුවේ ය.

# 10

ලිප ගින්දර විසින් වඩාත් මොලොක් හා උකු කරවන කුරහන් කැඳ මුට්ටිය වෙතින් වහනය වන ප්‍රණීත සුගන්ධයෙන් නැහැපුඩු පුරවා ගනිමින් ඇය තෘප්තිමත් සිනාවක් පෑවා ය.

"තාත්තා හරි ආසයි කුරහං කැඳ බොන්ඩ..."

කිසිවෙකු සමීපයෙහි නැතත් ඇය මදක් හඬ නගා පැවසුවා ය. එකම පුත්‍රයා ගෙදර සිටිය ද සිය මව සමඟ පිළිසඳරෙහි නොයෙදෙයි. මව හා පුත්‍රයා එක වහලක් යට නොව බොහෝ දුරින් පිහිටි ග්‍රහලෝක දෙකක වාසය කරන්නාක් මෙනි. දවස මුළුල්ලේ ඔහුට දොස් පැවරීම මව් පදවියේ අනිවාර්ය අංගයක් ලෙස ඇය සිතුවා ය.

ඒ රොස් පරොස් වචන ඔහු ඇය වෙතින් දිනෙන් දින මොහොතින් මොහොත ඈත් කරවන වග ඇයට නොවැටහිණ. නැතහොත් ඇය ඒ බව නොතකා හැරියා ය. ඔහු සර්ව සම්පූර්ණ මිනිසෙකු බවට පත් කරවාගැනීම උදෙසා තමාගේ මුවේ පමණක් නොව දැතේ සවියද බලපාන බව ඇය විශ්වාස කළා ය. තදින් කිපුණු දවසක ඔහුට පහර දෙන්නට පවා ඇය පසුබට නොවූවා ය.

"ඇනේ බබා වගේ ඉන්නෙත් එකයි. එකා යකා වෙයි කියලා බයේ ගැහි ගැහි නේද මං මේ ඉන්නෙ..."

එබඳු ආරවුලකින් අනතුරුව ඇය කඳුළු සලයි. කෝපයට හා බියට පත්වීම නවතා ඔහුට සෙනෙහෙස පෑමෙන් ආදරණීය පුත්‍රයෙකු සහ යහපත් තරුණයෙකු නිර්මාණය කරගත හැකි බව ඇය කිසි විටෙකත් තේරුම් නොගත්තා ය. ඔහු නොමග යනු ඇතැයි තැති ගැනීමෙන් ඇය ඇගේ ජීවිතය ද අපතේ හරින බව පෙනෙන්නට තිබිණ. වැන්දඹුවක වන තමා ශෝක පරිපීඩා උසුලනු විනා ප්‍රීතියෙන් හා සුඛාස්වාදයෙන් මත් විය යුතු නැතැයි ඇය දැඩිව අධිෂ්ඨානය කර ගත් සෙයකි.

යතුරු පැදියේ හඬ ඇසෙත් ම කුරහන් කැඳ මුට්ටිය පිදූ සොම්නස වියැකිණ.

"හා ආවද...? කොයි ලෝකෙ යනවද දන්නැ පුක කැඩිච්ච කඩියා වගේ... කියන දේ නාහා මේක වට කර රෝන්දෙ ගහනවට උඹේ කකුල් දෙක කඩනවා මං... වෙලාවක. ඇත්තමයි පුතේ..."

වෙනදා මෙන් බහින් බස්වන්නට නොගිය තරුණයා අල්මාරිය උඩ වූ ගමන් මල්ල බිමට ඇද දැම්මේ ය. කැරපොත්තෝ අහුමුළු සොයා දිවගිය අතර දූහුවිල්ල අඩව් ඇල්ලුවේ ය.

"මොකට ද බෑග්ගෙ?"

දයාසීලී විමතියෙන් ප්‍රශ්න කළා ය. ඒ අතරම ඔහු නැවත රැකියාවට යන්නට සූදානම් වන බවක් හැඟී යාමෙන් සියුම් සොම්නසක් ද ඇගේ හද ගැබ පැන නැගිණ.

"අනේ සාධු..." යි ඇය දෑත එක් කළේ ගසා බසා දැමූ ගමන් මල්ලේ රෙදි පිළි අසුරන අයුරු ආශාවෙන් නරඹමිනි.

එහෙත් රැකියාවට යන්නෙකුගේ ස්වභාවය ඔහු වෙතින් පළ නොවී ය. අභය ස්ථානයක් සොයා දිවෙන මුව පොව්වෙකු මෙන් ඔහු සැලුණේ ය.

"අක්කේ..."

වෙනදා සතුට හා සැහැල්ලුව කැන්දාගෙන එන ඒ හඬින් මේ හැන්දෑවේ ඔහු කොතරම් තදින් තිගැස්සුණේ ද කිවහොත් දයාසීලි පුදුමයෙන් මුව විවර කළා ය.



"මොකක් නමුත් හෙයියම්මාරුවක් වෙලා තියෙනවා... මට ඇත්ත කියාපං සඳුන්... මොකද වුණේ? මොකක්ද උඹ අල්ලපු අඩව්ව?"

ඇය නොඉවසිල්ලෙන් ද කෝපයෙන් ද ප්‍රශ්න කළා ය.

"අක්කේ..."

ජාලිය ගේ ඇගේ නොහැපී තමාට පලා යා නොහැකි බව වටහාගත් තරුණයා වටපිට බැලුවේ ය. උගුලකට හසුවූ සතෙකු මෙන් අසරණව පසුවන පුත්‍රයා දෙස තවත් මොහොතක් බලා හුන් දයාසීලි "මොක ද වුණේ...? මොකක් ද උඹ කෙරුවෙ?" යි කෑ ගසා ඇසුවා ය.

ඇයට පිළිතුරු දෙනවා වෙනුවට ඔහු කල්පනා කළේ පලා යා හැකි මගක් පිළිබඳව ය. කුස්සියේ දොරින් පිළිකන්නට වැදිය හැකිය. එහෙත් ඒ සඳහා ද දොරකඩ අවුරා ඉන්නා මව බාධාවකි.

ඇය ආපසු හැරුණේ ඔහුට පලායාමට ඉඩකඩ සලසා දෙමිනි. එහෙත් එවැන්නක් සඳහා ඇයට අවශ්‍යතාවයක් නොතිබූ අතර ඇයට උවමනාවූයේ හැකි ඉක්මණින් ජාලිය වෙතින් වංහුං දැන කියා ගන්නට ය.

වෙනදා මෙන්ම "මං යනවා අම්මේ" නොකියා, නිවෙසින් බැහැර වීමට අවසර නොඉල්ලා සඳුන් පලා ගියේ ය. ඔහුට තවත් පහරක් දෙකක් එල්ලකොට දයාශීලී අබියස පාපොච්චාරණය කරවීමේ අභිප්‍රාය ව්‍යාර්ථ වූයෙන් ජාලිය වියරු වැටුණේ ය.

"ඕකාව අහුවුණොත් මං මරන එක මරනවා... නැත්දැයි පුතයි නේද... අක්කට තිබ්බ ටිකක් හෝදිසියෙන් ඉන්ඩ..."

ඒ නපුරු වචන පළා යන තරුණයාගේ දෙකනේ ඔබන්නට තරම් සුළඟ අකාරුණික විය.

මිතුරෙකුගේ නිවෙසක රාත්‍රිය ගත කළ ද සඳුන් දිගින් දිගටම කල්පනා කළේ කෝපාවිශ්ට මාමාද, විමතියෙන් අයාගත් ඇසින් බලාහුන් අම්මාද, හඬා වැළපෙන රූපිකාද පිළිබඳවය. ඇයට ජාලිය පහර දෙනු ඇත්දැයි සැක කළ හෙතෙම දහස් වරක් පසුතැවුණේ ය.

Scanned with CamScanner

"ෂිත්... මට තිබ්බෙ වෙඩින් එක ඉවර වෙච්ච හැටියෙ අනුරාධපුරේ යන්න...."

එකසිය අට වරක් මතුරන මන්තරයක් මෙන් ඔහු ඒ වචන ටික නැවත නැවතත් තෙපලුවේය.

තුන්වුරුද්දකට පෙර අඳුරේ තොල් මතුළ තරුණයා මෙන්ම ඇයද අඩ අඳුරේ මුමුණමින් සිටියාය.

"ඉක්මණට කනවා... ඉටිපන්දම නිවෙන්ඩ ළඟ යි..."

සඳුන් ඇය නොදරුවකු මෙන් සලකා තරවටු කළේ ය.

"ඒක තමයි මං කිව්වෙ ලාම්පුවක් පත්තු කරමු කියලා..."

ඇය කතා කළේ ද ඔහුට නොදෙවෙනිව මහත් කෝපයෙනි.

"කුප්පි ලාම්පු නං ඔය තියෙන්නෙ... එව්ව පත්තු කරන්ඩ ලාම්පුතෙල් තියෙන්ඩ එපැයි..."

"ඉතිං ගේන්ඩ තිබ්බනේ"

අතවූ බත් පතින් ඇගේ මුහුනට දමා ගසන්නට තරම් වන කෝපයෙන් ඔහු ඇවී ගියේය.

"තමුසෙට කුප්පි ලාම්පුවක් ඕන නං ලාම්පුතෙල් ගන්ඩ එපැයි. මට පුළුවන් විදියට තමයි මං ඉටිපන්දං ගෙනාවෙ..."

"ඉටිපන්දම් දහය එළිවෙනකං පත්තු කරන්ඩ පුළුවන්ද...?"

ඔහුගේ මුවඟ සාවඥ සිනාවක් නැගිණ.

"ඊයෙ රෑ මොන පන්දමක්වත් තිබ්බෙ නැනේ... තමුසෙ ගොරව ගොරව බුදියගත්තෙ... අද මොකද...?"

සැබැවින්ම ඇය බියට පත්ව සිටියාය. පෙරදා රාත්‍රියෙහි ඇය බිය වූයේ පසුපසින් හඹා ආ මැරයන්ට ය.

එහෙත් අද ඇය ඔවුන්ට නොව ඔවුන්ගෙන් තමා ගලවා ගත් තරුණයාට බිය ය. ඔහුට ද වඩා ඔහු දරන්නා වූ ලිංගේන්ද්‍රිය කෙරෙහි බිය සැක සංකා ඇගේ සිත පුරා මෝදු වෙයි.

"කනව ඕක... අත ගගා ඉන්නෙ...."



ඇගේ නිශ්ශබ්දතාවය ඔහුගේ නොරිස්සුම් සහගත කෝපය තුනී කර දමයි. ගැහැනු ළමයෙකු ඇහැට කනට පෙනෙන නොපෙනෙන ඕනෑම ගැහැනු ළමයෙකු පිරිමියෙකු සමඟ හුදෙකලා වූ කල මේ අයුරින් තැති ගැනීමේ වරදක් ඇත්දැයි සිතන්නට තරම් ඔහු අනුකම්පා සහගත විය.

"තමුසෙ බය නැතුව ඉන්නවා..."

ඒ සැනසිලිදායක වදන් ඇගේ සිත් ගත්ත ද ඔහු "තමුසෙ" යි ආමන්ත්‍රණය කිරීම පිළිබඳව නොසතුටු වූවා ය.

"මේ එන්ඩ එපා මට තමුසෙ තමුසෙ කියන්ඩ. මගෙ නම ආශා..."

ඔහු දෙබැම ඉහළ නංවා විමතිය පල කළේ ය.

"ආශා..." යි උස් හඬින් ඇගේ නම කිපවරක් උච්චාරණය කළේ ය.

ඇය නිහඬවම බත්පත ගිල දැමුවා ය.

"මට නං කිසි ආසාවක් හිතෙන්නේ නෑ තමුසෙව දැක්කම"

ඒ සෝපහාස ස්වරයෙන් ඇගේ සිත රිදිණ.

"ෂුවර් එකටම ඕකත් බොරුවක්... තමුසෙ කටට එන නම ඔහේ කියල දානවා... මං රැවටෙන් නෑ" ඔය බොරුවලට."

"ආයෙත් තමුසෙ..."

ඔහු සිනාසුණේ ය.

ඒ ඇයට නොව තමාටම ය.

වැවෙන් ගොඩට ආවේ වැවට බට කෙල්ල නොවේ. අපවිත්‍රව දුගඳ හමමින් හුන් ඇය ඒ සිඳී යන වැවෙහි මඩදියෙහි ගත කළ පැයක හමාරක කාලය තුළ අදහාගත නොහැකි තරම් විපර්යාසයකට ලක්ව සිටියා ය.

"කාලෙකට පස්සෙ නේද?"

අමරසිරිගේ මිතුරා දැක පුරුදු අයෙක් සුහද පිළිසඳරකට ප්‍රයත්න දැරීය. එහෙත් සඳුන් පෑ මඳ සිනාව ඒ සඳහා අනුබල නොදුන්නේ ය.

"බැන්ද ද?"

විමසිලිමත් ඇස් දියෙන් ගොඩ එන කෙල්ල මත නවතී. තෙත කෙස්කළඹද, ඇඟට ඇළුණ අළුත්ම රතුමල් චීත්තය ද ඇය කොතරම් පියකරු ද කොතරම් ආකර්ශනීය ද යන වග නොවලහා විදහා පාන සෙයකි.

ළිං පත්ලේ මළ මී මින්නාද ඔසවාගෙන බෙරිහන් දුන් එකියමද මේ...? සඳුන් විමතියෙන්ද ආශාවෙන් හා වේදනාවෙන් ද ඇගේ නව යෞවන සිරුර නැරඹුවේ ය. පිරිමි ඇස් හතරක බැල්මෙන් කෝලයට නොව කෝපයට පත්වූ ඇය වහා කුඹුක් ගසට මුවා වූවා ය.

"ඇඳුමක් ගන්ඩවත් දන්නෑ..."

ආශා නෝක්කඩු කීවේ සඳුන් ගෙනා සාය දිගු වැඩි බැවිනි. ටීෂර්ටය පමණට වඩා ලොකු නිසා ය.

පාසලේ දී පවා ඇගේ සුදු ගවොම කොට වැඩි විය. විනය බාර ගුරුතුමියගෙන් ඇය පහර කෑ වාර ගණන නිමක් නැත.

"ආණ්ඩුවෙං මුංට රෙදිත් දෙනවනෙ. පොතුත් දීලා රෙදිත් දීලා.... මුංට සැප වැඩියි."

ආශාගේ ඇස දිළිසෙන්නේ කඳුලින් නොව දරාගත නොහෙන කෝපයෙනි.

"එක සුදු ගවුම මුළු අවුරුද්දක්ම වාර තුනක්ම අඳින්ඩ පුලුවංද?... වාරෙං වාරෙ නෙමේ මාසෙං මාසෙ මං උස් මහත් වෙනව කියල සීතම්මත් මට බනිනවා. මං මොක ද කරන්නෙ... මගෙ අම්මා පුංචි ගෑනියෙක් වුණාට තාත්තය කියන මිනිහා හුගක් උස මහතයිනෙ... මං ඒ මිනිහගෙ ආරෙට ඇවිල්ල කියල තමා සීතම්මා කියන්නේ..." යි නොකියා ඇය නිහඬව පහර කෑවා ය.



"වැඩිය ඕන්නෑ මිස් උදේට යි දවල්ට යි රෑට යි විතරක් අපේ ගෙදර ඇවිල්ල යන්ඩ. මිස් දැං කිව්වනේ මට සැප වැඩියි කියලා..." උදේට මං ඉස්කෝලෙ එන්නෙ විස්කිරිස්ස්ඇයක් කාලා තේ කහට බීලා. දවල්ටත් ඔය රොටී කෑල්ලක් මඤ්ඤොක්කා අලයක් තමා. අපි බත් කන්නෙ රෑට විතරයි. කොළ මැල්ලුමක්වත් මලව ගන්ඩ පොල් නැති දවසට මායි සීතම්මයි ලුණු යි බතු යි කාල තියෙනවා.... ලුණු යි බතු යි කන එක දෙවේලක් ම බඩ රවට්ටලා එක වේලක් කන එක සැපක් ද මිස්...?" යි අසන්නට උවමනා වෙතත් පන්තියේ පමණක් නොව පාසලේ ම දඩබ්බර සිසුවිය ගේ මුව විවර නොවේ.

අඟහිඟකම නිසාම පමණක් නොව මිත්තණිය හා මුළු මහත් සමාජයම කුපිත කරවන අදහසකින් ආශා පමණට වඩා කොටට හඳින්නට පුරුදු ව සිටියා ය. ඇගේ මනහර දෙපයද පිරිපුන් ළමැද ද එකට එක්ව රාගයෙන් අවුස්සන එකෙකු බැරි වෙලාවත් ඇගේ මනබඳනා සිරුර ස්පර්ශ කළහොත් රූබර මෙනවිය අතුරුදහන්ව දරුණු යකින්නක ප්‍රාදුර්භූත වෙයි. අනුරාගී බැල්මකට අවලම් සිනාවකට කතාවකට පවා ඇය දැක්වූයේ බිහිසුණු ප්‍රතිචාරයකි.

"බලනවා මේ සාය දිගම දිගයි.... ටීෂර්ට් එක ලොකුම ලොකුයි... මං යෝධයෙක් කියල ද හිතුවෙ?"

කුඹුක් ගසේ පුළුල් කඳට මුවා වී මඳ වේලාවක් සැඟව හුන් ඇය ඉන් මෑත් ව ආවේ මහත් කෝපයෙනි.

ඇය දෝෂාරෝපණය කළේ ද සඳුන් සමඟ කතා බහ කරන තැනැත්තා පිළිබඳ ව තැකීමක් තබා බැල්මක් හෝ නොහෙළමිනි. ඔහු හකුළාගත් දෙනෙතින් ඇය දෙස බලාගත්වනම සිටියේ ය.

"කෙල්ලනං සුරංගනාවියක් වගේ ලස්සන යි. හැබැයි යස්සනියක් වගේ සැරයි..." යි කියාගන්නට ඔහුට උවමනා වුව ද සඳුන් සමුගැනීමේ බැල්මක් පවා නොහෙලා යතුරුපැදිය කරා ගමන් කළ බැවින් නිහඬවම පසු විය.

"අඳින්ඩ එකක් නැති හින්දා ඇන්දා... නැත්තං මං අල්ලලා විසික්කරනවා වැවටම" යි කොඳුරමින් ආශා සියඹලා ගස යටට

Scanned with CamScanner

ගියා ය. එහෙත් ඇය එනතෙක් පමා නොවූ සඳුන් යතුරුපැදියේ නැඟී පිටව ගියේ ය.

"ඒයි... ඒයි..." යි කෑගසමින් ඇය මඳක් දුර දිව ගියා ය.

අතවූ නොන රෙදි හා සබන් පෙට්ටිය බිම ගසා හැකිතාක් උත්සාහයෙන් බැන වදින්නට බිම පෙරළී ශාප කරන්නට උපදනා සිත වැයමින් මෙල්ල කරගත් කෙල්ල වටපිට බැලුවා ය.

"මෑන්ට නැඳුණා නේද?"

බයිසිකලය තල්ලු කරගෙන ආ තරුණයා ඇසුවේ පුළුල් සිනාවක් ද සමගිනි.

"දාලා ගියා නේද?"

ඇය කිසිවක් නොපවසා වැව් බැම්ම දිගේ ඉදිරියට ගමන් කළා ය. සිහිල් සුළඟේ සෙමින් සැලෙන ඇගේ දිගු වරලස ඔහු තුළ මහත් වූ චමත්කාරයක් ජනිත කරවයි.

"බැඳලා හුඟක් දවස් ද...?"

ඇය ඔහු වෙත හෙළු සෂණික හා ඉක්මන් බැල්මේ ගැබ්ව තිබූ තර්ජනය ඔහු තුළ පොපියන චමත්කාරය මුළුමනින්ම වියළා දමයි.

"ම්... මං ගිහිං දාන්ඩ ද?"

ඇගේ මුව කෙළවර ඇද ව ගියේ ය.

"අනේ මේ යනව ද යන්ඩ තමුන්ගෙ වැඩක් බලාගෙන..."

ඔහුගේ දෙපා මොහොතකට ගල් ගැසිණ. ඇය පාරට ගොඩවූයේ ඒ නාඳුනන තරුණයාට දොස් පවරමිනි.

"එනව මෙතන අනුන්ගෙ සීනි කිරන්ඩ..."

"යකෝ ඒකිගෙ සැර..." යි කියාගන්නටවත් ඔහුට හැකි වූයේ මඳ වෙලාවකට පසුව ය.

"මං මේ මනුස්සකමට කතා කෙරුවෙ... කව්ද දන්නෙ ඒකි අලි ඔලුවෙං ඉන්න බඩුවක් කියලා..." යි කොඳුරමින් ඔහු බයිසිකලයට නැංගේ ය.



"වාවාගත නොහැකි කෝපය හේතු කොටගෙන ඒ කළ ගුණ නොදත් කෙල්ල දමා ආව ද මඳක් දුර යැමෙන් පසු සඳුන් යතුරු පැදියේ තිරිංග තද කළේ ය.

"ෂික්.... අරූ ඉන්න තැන මට කතා කරපු කැත... මෙකි මොකියක් ද මංදා... කෙලෙහි ගුණ කියලා නාමයක් දන් නෑ."

පාර අද්දර කොහොඹ ගසක් යට නැවතී ඔහු ඇය පැමිණෙනතුරු බලා හුන්නේ ය. ආපසු හැරී ඇය සොයා යන්නට වරෙක සිතුණද "නෑ... ඔය වුට්ට පයිං ආපු දෙං... මට්ටු වෙන්ඩත් එක්ක" යි ඒ අදහස බැහැර කළේ ය. මඟ යන එන උදවිය අතරින් බොහෝ දෙනෙකුන් ඔහු දුටුවද හැඳින ගත්ත ද කතා බහ කරන්නට නොහැවතුණහ. මිනීමරුවෙකු ගේ මිතුරෙකු සමඟ ඇයි හොඳයියක් උවමනා නැතැයි ඔවුන් තීරණයකට එළැඹ සිටින්නාක් මෙනි. එකම සහෝදරයා අමු අමුවේ මරා දැමූ ඝාතකයා සේම ඔහු ගේ මිතුරාද නරකෙහි හා නපුරෙහි ජීවමාන සංකේත ලෙස ඔවුන් දකිනවා නොඅනුමානය.

දිය නෑමෙන් ගතට යම් ප්‍රබෝධයක් දැනුණ ද කෝපයෙන් පුපුරු ගසන සිත ද කුසගින්නෙන් දැවී යන උදරය ද ආශාගේ සුන්දරත්වය යම් තරමකින් අඳුරු කරවයි. එහෙත් දිය නෑ හැටියේ ඔනෑම ගැහැනියක සුන්දර හා නැවුම් වන සෙයින් ඇයද තවම දියබිඳු රූරා හැලෙන වරළසකින් යුතු ව කැළුම් දුන්නා ය.

ඇය ඇත තියාම සඳුන් දුටුව ද නොදුටු විලාසයෙන් පය ඉක්මන් කළා ය.

"ඔහොම ඉන්නවා..." යි ඔහු හඬ ගෑවේ ඇගේ සුන්දරත්වයෙන් උණුසුම්ව ගිය සිතිනි කයිනි. ලිප් බොක්කේ අළු ගොඩේ වැතිර හුන් අළු කුමාරිය මෙන් මේ තරුණිය ද අපියකරුව හා අපවිත්‍රව සිටියා ය. එහෙත් වැව්දිය ඇගේ කුණු කිළුටු සියල්ල සෝදා පිස දැමුවාක් මෙනි. සෝදා ඔප ලූ බඳුනකටත් වඩා ඇය රුවින් බබළයි. ඇය ද රූපිකා ද සංසන්දනය කරන්නට ඔහු පෙළඹුණේ නිරායාසයෙනි. එහෙත් එහිලා ඔහු මුළුමනින් ම අසාර්ථක වූයේ ය. රූපිකා වෙත වූ සුන්දරත්වයේ ඇවටී තිබූ අවිහිංසක හා සියුමැලි බව මේ තරුණිය වෙත නොවන බව ඔහු පසක් කර ගත්තේ ය. ගලවා අඳින්නට තවත් එකදු

ඇඳුමක් හෝ සන්තකයෙහි වටිනා කියන කිසිවක් නැතත් ඇය අධිරාජිණියකගේ ආඩම්බරයෙන් හිස ඔසවා ඇවිද යයි. අන්ත අසරණ වූ කල නිතැතින්ම ආරූඪ වන නිවට බැගෑබර බව ඇයට නම් ගව් ගණනක් දුර ය.

"මෙහෙ එනවා.... නඟිනවා බයික් එකට..."

ඔහු ඇය හඬා යමින් අණ කළේ ය. ඇය නැවතුමෙන් කෝපයෙන් පුපුරු ගසමිනි.

"මහ ලොකුවට උඩ දාගෙන ගියේ... දැං මොන මඟුලට ද මඟ රැකල ඉන්නෙ?"

ඒ බැල්ම ද ඒ ස්වරය ද ඔහුගේ කාරුණික බව අතුරුදහන් කරවන්නට සමත් වෙයි.

"අර යකා ඉස්සරහ මට බැනගෙන බැනගෙන ගියේ... තද වෙන්නැද්ද...? ඌ මොනව හිතන්ඩ ඇද්ද... මාර නෝන්ඩියනෙ..."

ඇය දිදුලන ඇසින් ඔහු දෙස බැලුවා ය. අව්වට පිලිස්සීමෙන් දුර්වර්ණ වූ මුහුන මඳක් ආලෝකමත් වී තිබෙන්නේ දිය නැම හේතු කොටගෙන විය යුතු ය. කුමාර මෙන් පිරිපුන් නැතත් මේ කෙසඟ තරුණයා වෙත ද එක්තරා අන්දමක කඩවසම් බවක් ඇතැයි ඇයට ප්‍රථම වරට හැඟිණ. එහෙත් රුදුරු හිරුගෙන් නොදැවෙනා දේවාල සහ දෙවියන් ඇසුරේ සැපවත් ජීවිතයක් ගත කරන කුමාර මෙන් ඔහු සුකුමාර නෙවෙයි.

"දෙයියොත් රවට්ටගෙන මිනිස්සුත් රවට්ටගෙන සැපට ඉන්නවා නේද...? යි වරෙක ඇය ඒ දේවදාසයාට සරදම් කළා ය.

ඔහු බියමුසු බැල්මක් හෙළුවේ ය.

"දෙයියන්ට යි දේව කාරියට යි විහිළු කරන්ඩ එපා ආශා..." යි ඔහු මහත් උවමනාවෙන් ඉල්ලා සිටියේ ය.

"විහිළු නෙමේ... මං ඇත්තටමයි කිව්වෙ..."

"දෙයියො කෝප වුණොත් උදහස් වුණොත් ලේසි වෙන් නෑ..."



ඇය බියපත් කරන්නට ඒ අනතුරු ඇඟවීම සමත් නොවේ.

"මට නං ඉතිං මුල ඉඳලම දෙයියො අහක බැලුවා කුමාර..."

ඇයගේ ඒ දුක්මුසු බැල්මට ඔහු කැමැත්තේ ය. නිතර රවාගෙන ඔරවාගෙන, දෙනෙතින් ගිනි පුළිඟු විහිදුවමින් ඉන්නා කෙල්ල මනුස්ස දුවණියක බව ඔහුට පසක්වන්නේ එවන් මොහොතකදී ය.

"පාර මැද්දෙ ජවුසං නටන්ඩ බෑ... එනව යන්ඩ..." යි කෝපයෙන් කී සඳුන් මුරණ්ඩු කෙල්ලගේ අතින් ඇද්දේ ය. ඇය ඔහුගේ අත ගසා දමා පැන දුවන්නට අදහස් නොකළා ය. ඒ සඳහා ඇය මුළු හදින් පෙම්කළ තරුණයාගේ මතකය ද තවමත් හරිහැටි නාඳුනන මේ පිටස්තරයා ද එකලෙසින් හේතු වූවා නිසැක ය.

"මම කවද්ද ගෑනුන්ට ඇඳුං ගත්තෙ... මට තේරෙන විදියට... අතේ සල්ලි තියෙන විදියට තමා මං ගත්තෙ... තමුසෙට ඒවා හොඳ නැත්තං ගලවල විසිකරලා ඉන්නවා හෙළුවෙං..."

යතුරු පැදිය පණ ගන්වා ගනිමින් ඔහු බැන වැදුණේ ය.

"මං දැකල නැති දෙයක්යැ..." යි කියැවෙන්නට ආව ද ඔහු ඒ වැකිය ගිල ගත්තේ ය. මේ නිහැඬියාව පුදුම සහගතසේම හිටි හැටියේ බෙහෙවින් කිපී ඇය තමාට පහර දෙන්නට පවා උත්සුක නොවනු ඇතැයි විශ්වාස කළ හැකි ද?

මඳින් මඳ දියව වැගිරෙන ඉටිපන්දමේ ඇබිත්තන් ආලෝකයෙන් ඒ තරුණ මුහුණ මත සනිටුහන් වී ඇත්තේ කවරාකාරයේ සුඛ දුක්ඛ හැඟීමක්දැ යි තේරා බේරා ගත නොහැක. පරණ මේස කබල මත දිග හැර ගත් බත් පාර්සල් දෙක මත කඩිසර ඇතැඟිලි නිසල වූයේ ද එකම මොහොතේදී ය.

"ඔච්චර බයනං දොර වහගන්නවා... මං සාලෙ බුදියන්නං..."

හදිසියේම ඇය කෙරෙහි හටගත් දයානුකම්පාවෙන් තෙත්ව ගිය හඳින් ඔහු විසඳුමක් යෝජනා කළේ ය. ඒ ඔහුට මේ අඳුරු රැයෙහි ගෙන ආ හැකි හොඳම හා එකම විසඳුම යි...

"ඒ කබල් දොරවල් ලොක් කරගන්ඩ බැරි වෙයි...."

"එහෙනං ඉතිං ලොකු දොර වහගන්නවා... මං ඉස්තෝප්පුවේ ඉන්නං.... ඒත් එපානං මං මිදුලෙ බුදියන්නං... හරිනෙ. එතකොට ඔක්කොම හරිනෙ..."

ඇය නිරුත්තරව බත්පතෙහි ඉතිරි වූ කරපිංචා හා රම්පෙ කොළ ඇඟිලි තුඩින් ගත්තා ය.

# 11

කාලවර්ණ පොරෝනයකින් හාත්පස වසා තිබෙන කලෙක මෙන් සියල්ල අඳුරු ය.

සුළඟේ සෙමින් සැලෙන අතු ඉති නඟන සියුම් සර සරය, හුදෙකලාව ඉවසාගත නුහුණු වැන්දඹුවන් රොත්තක් එකට එක් වී හෙළන සුසුම් සේම සාංකාකුලය.

තැන තැන කඩතොළු වූ ඉස්තෝප්පුවේ වූයේ පරණ පුටුවක් පමණි. මේ ගෙදර තිස් වසරක් පමණ ජීවත් වූ අමරසිරි කටුක තිකිණියේ රැය පහන් කළ ලණු ඇඳ අභාවයට ගොසිනි.

"ඇතුළෙ ඉන්ඩ බෑ බං... දාඩිය වැක්කෙරෙනවා. මේ මදුරු හැත්ත නැත්තං හුළං වැදි වැදී ෂපාන් එකට බුදියගන්ඩ තිබ්බනේ."

පොල්ලෙලි කිහිපයක් මත ගිනි අඟුරු ලා ඇතිරූ කොහොඹ කොළ ගොන්නෙන් පිට වන දුම මඳින් මඳ ඉහළ නඟී. කටුක දුගඳක් වහනය වෙතත් මදුරුවන් පළවා හරින්නට මේ අයුරින් දුම් ගසන්නට සඳුන් ද හැම හැන්දෑවකම වග බලා ගනිති.

"තනියම යන්ඩ බැරි නං මාත් එන්නං. දෙන්නත් එක්කම යං..."

Scanned with CamScanner

අමරසිරි පුන පුනා කියන්නේ එකම කතාවය. මේ රුපෙකින් ගමට යන්නට ගෙට ගොඩවන්නට අම්මා දැක බලා ගත්තා, සඳුන් තුළ මහත් ආශාවක් හා උවමනාවක් හට ගනියි. එහෙත් ද සැණින් ජාලිය ගේ රකුසු වෙස ඔහු මුළුමනින් ම අධෛර්යමත් කරවයි.

"ලබන මාසෙම යං අමරෙ අයියා. නිකංම යන්ඩත් බැලුවොත් කියක් හරි එකතු කරගන්ඩෙපැයි..."

"උඹට ඔන්නං හෙටම යං. මං සල්ලි දෙන්නං..."

කුලියක් මලියක් කොට උපයන මුදල දියව යන්නට වැඩි කාලයක් ගත නොවෙයි. එසේ තිබියදීත් මිතුරාගේ ඒ වචන සඳුන් ගේ සිත සසල කරයි.

"බලමුකෝ"

"මොනවද ආයෙ බල බලා ඉන්නෙ. අපි හෙට යමු හරිනෙ... ඕං ආයෙ බෑ කියන්ඩ බෑ..."

හිස සලා එකඟ වන්නට උවමනා වුවද ජාලිය, රුපිකා පමණක් නොව මව හා මුත්තණුවන් ද එක පෙළට හිටගෙන හෙලන චෝදනාත්මක බැල්මෙන් ඔහු පසුබායි.

"හෙට නෙමේ... අපි ලබන සතියෙ යං..."

"බාලගිරි දෝසෙ වගේ තමා..." යි අමරසිරි කියන්නේ නොමනාපයෙනි.

"නෑ අමරෙ අයියා... ඕන දෙයක් වෙන්ඩ අපි යං. බැන්නත් ගැසුවත් මැරුවත් කමක් නෑ... හැමදාම මෙහෙම හැංගිලා ඉන්න බැනේ..."

එවර හිස සලන්නේ අමරසිරිය.

"කියල වැඩක් නෑ... මොකද ආයෙ මිනියක් මරලැයි. අනිත්තෙක උඹ ඒ ගෑනිත් එක්ක බුදිය ගත්තෙත් නැතුව මොන මළ විකාරයක් ද මේ..."

දෙනෙත පිරී ඉහිරෙන ස්නේහයෙන් ද දෙතොල මැද මූ සිනා බිඳකින් ද බලා සිටින ඒ පියකරු ළඳ සිප වැළඳගන්නා



පමණක් නොව අනුරාගයේ අනන්තය කරා ඉගිල යන්නට තමාට කොපමණ වාරයක් සිතුණේ ද යන්න සඳුන් හෙළි නොකළේ ය. ආදරයෙන් ආශාවෙන් සහ අනුරාගයෙන් තමා මත්මත් කළ ඇය නිරුවත් කරමින් ඇගේ සියුමැලි සිරුර මත නැගුණ හැම රැයකම ඔහු තිගැස්සී ඇහැරුණේ ය.

"ඒ උඹේ නැන්දා... නැන්දා..." යි ජාලිය පමණක් නොව මුළුමහත් ලෝකයම එකට එකතු වී මුර ගාන හඬින් ඔහුගේ අනුරාගී ස්වප්න සිඳී බිඳී යයි."

"ඕන මළදානෙකට මං ඉන්නවනෙ බං... ඉස්සෙල්ලා අපි යං... ඉංපස්සෙ එන දේකට මූණ දෙමු. ඉවරයිනෙ කතාව..."

අමරසිරිගේ කතාව හැකිළෙන පැකිළෙන තරුණයා ධෛර්යමත් කරයි. අම්මා පමණක් නොව මහගෙදරට ගොඩ වී මුත්තණුවන් බලන්නට ද සඳුන් ගිවිස ගත්තේ ය.

නොඉවසිල්ලෙන් ද අනුපමේය උද්යෝගයෙන් ද කළඹා ලූ දෙදිනකට පසු සියල්ල කණපිට පෙරළිණ.

මේ අඳුරු රැයද මදුරු හිරිහැරය ද සඳුන් තල්ලු කර දමන්නේ ඒ අමිහිරි හැන්දෑව වෙත ය. ගත ලොමු ඩැහැගැන්වෙන සුළු බිහිසුණු සිදුවීම ආවර්ජනය කරන්නට ඉඩ නොදුන්නේ ඇගේ හඬයි. ඊටත් පෙර ලොකු දොර ඇරෙන කර්කශ හඬයි."

"මදුරුවො කනව නේද...?"

සුපුරුදු නොරිස්සුම වෙනුවට ඒ ප්‍රශ්නයෙහි තැවරී තිබුණේ එක්තරා අන්දමක මට සිළිටි බවකි.

"ඔව්"

ඔහු හැරී බලන්නට නොසිතුවේ ය.

අතකින් ඉටිපන්දමක් ද අනෙක් අතින් මදුරු දඟරයක් ද සහිතව දොරකඩ හිටගෙන හුන් කෙල්ල "මං මදුරු කොයිල් එකක් පත්තු කෙරුවා" යි දැනුම් දුන්නා ය.

"ඇත්ත ද? පත්තු කෙරුව ද? ගහගන්නව පුකේ... කොයිල් එකක් නෙමෙයි සීයක් පත්තු කෙරුවත් වැඩක් වෙන්නෑ මේ මදුරු සේනාවට"

ඒ සෝභමාන සිරුර තුළ සැඟව සැතපී හිඳින තරුණ යක්ෂණිය අවදි කරවන්නට තරම් ඔහුගේ කතාව නිර්දය විය. ඇය මදුරු දඟරය බිම ගැසුවාය... එය කැබලි ගණනාවකට කැඩී ගියේ ය. ඔහු වහා නැඟී සිටියේ ය.

"මදුරුවෝ කනවනෙ කියල හිතලා පව් කියලා මං කොයිල් එකක් පත්තු කරගෙන ආවෙ... කතා කරන හැටි... මොකද්ද මංදා..."

ඇය මහත් කෝපයෙන් හඬ ගෑවා ය.

"ඔව් ඔව්... මං බොහොම ඉස්තුතියි කියලා කොයිල් එක ගත්ත නං තමා හරි."

ඒ ස්වරයෙහි ගැබ් වූ අවඥාව රෑ ගනාන්ධකාරයටත් වඩා උකු විය.

"එහෙනං ඉතිං තමුසෙ ගේ ඇතුළෙ බුදිය ගන්නවා... මං ඉන්නං ඉස්තෝප්පුවේ" යි කී ඇය ඉස්තෝප්පුවේ කොණක හිඳගත්තා ය. අත වූ ඉටිපන්දම බිම තැබුවා ය. එයින් විහිදෙන මලානික ආලෝකය සතුරු බල ඇණියකට එරෙහි හුදෙකලා සොල්දාදුවෙකු හා සම විය.

"ඉතිං ඔය ටික ඉස්සෙල්ලම කිව්ව නං ඉවරයිනෙ... මං මෙතන මදුරුවෝ තල තලා දුක් විඳින්නැතේ..." යි කී සඳුන් ගෙතුළට යාමට සැරසුණේ ය.

"නෑ නෑ තමුසෙ ගේ ඇතුළෙ බුදිය ගන්නවා..." යි පෙරළා කරනවා වෙනුවට ඔහු වැඩි ප්‍රමාදයකින් තොරව ගෙතුළට යාමට තැත් කිරීම ඉවසාගත නුහුණු ආශා නැඟී සිටියා ය.

"මං හිතුවෙ තමුසෙ පිරිමියෙක් කියල"

ඒ හඬෙහි අවඥාව විඳ දරාගත නොහැකිව මෙන් ඉටිපන්දම නිවී ගියේ ය.

"මොකක් ද කිව්වෙ...?" මොකක්ද බැල්ලියේ ඒ කිව්වේ"

සඳුන් අඳුරේම ඇය වෙත කඩා පැන්නේ ය.



ඇස් අඳ කළ අඳුරට ස්තුතිවන්නට ඔහුට ඇය අල්ලා ගත හැකි විය. පිම්මේ දිව යාමට එසවූ පය සැනෙකින් ගල් ගැසිණ.

"කිව්ව එක හොඳටම ඇහුණනේ... මං හිතුවෙ මං ගෑනියෙක් තමුසෙ මිනිහෙක් කියලා... බලාගෙන ගියහම ඒකෙ අනිත් පැත්ත... ඉතිං තමුසෙ ගෑනි වගේ ගෙට වෙලා බුදිය ගන්නවා දොර වහගෙන. මං ඉන්නං එළියේ... මං බය නෑ. මදුරුවෙක් කෑව කියලා මං මැරෙන්නෙත් නෑ...."

ඒ වහසිබස් ඔහුගේ කෝපාග්නිය මත ඇඳ හැළුණ පිදුරු පරඬැල් කන්දකි.

"වහපිය කට..."

ඔහු අඳුරේම ඇයට පහරක් ගැසුවේ ය.

පහරක් කා දැසේ කඳුළු පුරවාගෙන පසුබාන එකියක නොවූ ආශා ද පෙරළා ඔහුට පහර දුන්නා ය.

"ඇත්ත කියනකොට අමාරුයි නේද...? මං කට වහන්නෑ එක එකා කියන කියන වෙලාවට. මං කට වහන්නෙ මට ඕන වෙලාවට..."

තරුණයා ද තරුණිය ද එකිනෙකා සමඟ පොර බදින්නට වූයේ, කෲර වන මෘගයන් පරිද්දෙනි. තුරුණු දෙහදක ඉතිර පැතිර යා යුතු රසබර හැඟීම් වෙනුවට ඔවුන්ගේ සිත් ක්‍රෝධයෙන් හා වෛරයෙන් ගිනිගෙන ඇවිළුණි.

"රස්සාව නැති වුණා... බෝඩිම නැතිවුණා... ජොබ් එක නැති වුණා... ෆෝන් එකත් නැති වුණා... තිබ්බ අන්තිම සතෙත් ඉවරයි... බයික් එකට තෙල් ගහන්ඩවත් කීයක්කත් නෑ... ඒ ඔක්කොම කරලත් මේකිගෙ කිසි කෙළෙහි ගුණයක් නෑ..."

ඔහු ඔහුගේ මව මෙන්ම දෝෂාරෝපණය කළේ ය. ඇය ද නිහඬ ව නොසිටියා ය.

"මං කිව්වද... මං කිව්වද මට ඇඳුං ඕනැ කියල... මං දන්නෙත් නෑ මහලොකුවට ගෙනැල්ලා මෙතන දැන් කියාපානවා..."

"කියන්ඩ ඕනැ නෑ.... නාලා අඳින්ඩ ඇඳුමක් තිබ්බ ද? උඹට නං ඉතිං අමු හෙළුවෙං ඉන්නෙක එච්චර දෙයක් මෙතමේ තමා... ඒ වුණාට මට පුලුවංද හෙළුබැල්ලෙං ඉන්න ගැනියෙක් එක්ක ගේක ඉන්ඩ...?"

ඔහුගේ ග්‍රහණයෙන් ගැලවගන්නට ඇය දැරූ ප්‍රයත්නය ව්‍යර්ථ විය. ඇය බිම ඇද වැටුණ බැවිනි.

"අඳින්ඩ ඇඳුමක් නැත්තං මං කොළ අත්තක් හරි පටලගන්නවා... ඉස්සර වැද්දො ඇඳුං ඇන්ද ද...?"

ඇගේ පාදයක් හරස් වීම හේතු කොටගෙන ඔහු ද ඇද වැටුණේ ය.

"උඹ වැද්දියක් තමා... හිටපිය... අද මං උඹේ බෙල්ල මිරිකලා මරනවා... අම්මාපල්ලා මං උඹ මරනවා..."

ඔහු බිහිසුණු ලෙස ශාප කළේ ය. දිවුරුවේ ය. ඇගේ සිරුර මත නැගුණේ ය. ඇගේ ගෙල සොයා ඉදිරියට දිගු වූ ඇතට පළමුව හසු වූයේ ඇගේ පුන් පියයුරු ය. තනපටය සෝදා ඇමූ බැවින් ලිහිල් වී ෂර්ටය තුළ නිදහසේ නැගී පියයුරු අත ගැටෙත්ම ඔහුගේ ක්‍රෝධය අතුරුදහන් විය.

"මරපිය බලන්ඩ... උඹ මගෙ බෙල්ල මිරිකලා මාව මරනකං මං කරබාගෙන ඉඳී කියල හිතනවද... මං මරාගෙන මැරෙනවා යකෝ..."

ඇය වියරුවෙන් මෙන් බෙරිහන් දුන්නා ය. නැගී සිටින්නට සිය සිරුරේ උපරිම ශක්තිය එක්තැන් කර ගත්තා ය.

තව දුරටත් ඇගේ ගෙල සොයාගන්නට වෑයම් නොකළ හෙතෙම අතැඟිලි හා ඇගේ පියයුරු අතර වන එකම බාධකය වූ ඊ ෂර්ටය ඉරා දැමුවේ ය. එකෙණෙහි රළු අතැඟිලි පහස පතා නොඉවසිලිමත්ව බලා හුන් කලෙක මෙන් ඒ පුන් පියයුරු ආශා හරිතව ඇඩී විය. ලිහිල් බව හැර පියා පිරිමියෙකු උදෙසා සැදී පැහැදුණු තන පුඩු ඉහළ නැගිණ.

"අතහැරපං... මාව අතෑරපං..."



පරම සතුරා වූ තරුණයා පමණක් නොව තව යොවුන් ශරීරය ද තමාගේ සිතෙහි බුර බුරා ඇවිළෙන කෝපයට පටහැනිව ක්‍රියා කරන බව හැඟී ගියෙන් ඇය කෑ ගැහුවා ය.

"කෑ ගහන්ඩ එපා..." යි ඔහු සැලෙන හඬින් ඉල්ලා සිටියේ ය. ඔහුගේ අතැඟිලි වලට මැදිව වේදනා ගෙන දෙන පියයුරු ඇගේ ක්‍රෝධයද අකාමකා දමන්නේ ඇයට ද අඳහාගත නුහුණු ආකාරයෙනි.

"දඟලන්ඩ එපා..."

ඒ නුරාබර හඬ ඇගේ දෙපයේ දැඟලිල්ල නවතා දමයි. වේගයෙන් හතිලමින් වුව ඇය කෙමෙන් නිශ්චල වූවා ය. ඔහුගේ දෙතොලට මැදිවූ තන පුඩුව ඒ බිහිසුණු යක්ෂණිය යළි සනහා සතපා නින්දට යවන්නට සමත් විය. තිඳි ගැට හැර පිබිදෙන්නේ ඇගේ අනුරාගයයි.

"එ... එපා..." යි ඇය සැලෙන හඬින් දැක්වූ විරෝධය අතිශයින් දුබල විය. එහෙයින්ම එයින් සිදුවුණේ ඔහු වලක්වා ලීමකට වඩා ඔහුගේ හැඟීම් තවත් උත්සන්න වීම ය.

ඇගේ නම නිශ්චිතව නොදත්තේ නමුදු ඒ නොදැනුවත්කම ඔහුගේ ඉඳුරන් කෙරෙහි මොනයම් ආකාරයකට හෝ බල නොපෑවේ ය.

"මං ආදරෙයි... ඇත්තටම ආදරෙයි වස්තුවේ..."

ඔහුගේ සිරුර කොතෙක් උණුසුම් වී ද කිවහොත් ඔහුගේ දෙතොල දැවෙන්නට විය. මෙවර ඒ දැවෙන දෙතොල ඇගේ දෙතොලේ සිහිලස සොයන්නට පටන් ගත්තේ ය. සිහිමූර්ඡා වූවක මෙන් ඔහුට ඉඩ හැර ඔහේ වැතිර හුන් ඇය වෙව්ලා ගියා ය. අන්ධකාරයේ කැලි කැපිය හැකි ඝන අන්ධකාරයේ ඇය ඒ කුඩා ජරපත් මැහැල්ල දුටුවා ය.

"මෝඩි... මී හරකි... ගොං නැම්බි... නැගිටිං... කිංද මංද කිසියම් දෙයක් නොදන්නා එකෙක් නේද ඔය උඹගෙ ඇඟ උඩ ඉන්නෙ? ඒකව පෙරලාගෙන නැගිටිං. දුවපං... ඒකා අන්තරස්දාන වෙන්ඩ මහවෙලාවක් යන්නෙ නෑ... හැබැයි ඒකා යන්ඩ

Scanned with CamScanner

යන්නෙ ඒකාගෙ පැටියෙක් උඹේ බඩට දීලා... බඩ ගෙඩියකුත් උස්සාගෙන මිනිහෙකුත් නැතුව උඹ මොකද කරන්නෙ...? අද්ද ගානෙ ගෙදරක වළඳක් සෝදලා හරි කීයක් නුමුත් හොයාගන්න පුලුවංද උඹට ඉං පස්සෙ...?"

හැමදාමත් සීතම්මා සමඟ බහින්බස් වන කෙල්ල මේ මැදියම් රැයෙහි නිහඬව අවනත වූවා ය. ජීවිතයේ පළමුවරට මිත්තණියට කීකරු වූවා ය.

යක්ෂණිය නින්දට ගොස් ඇහැරුණු ගැහැනිය ගැහැනුකමට ඉඩ දී නිසලව හා නිහඬව පසුවන බවට තරුණයා තුළ උපන් බලවත් විශ්වාසය සැනෙකින් බිඳ වැටිණ.

"අතෑරපං මාව" යි බෙරිහන් දෙමින් ඇය ඔහු පෙරළා ගෙන නැඟී සිටියා ය. එවැන්නක් කිසිසේත් අපේක්ෂා නොකළ තරුණයා අන්දුන් කුන්දුන් විය.

මිදුලට බසින පඩි කීපය සොයා ගන්නට පමා නොවූ ඇය ගෙපිළෙන් පැන්නා ය.

"ඒයි... දුවන්ඩ එපා... දුවන්ඩ එපා..." යි ඔහු වහා නැඟී සිටිමින් කෑගැසුවේ ය.

ඇය මිදුල හරහා දිව ගියේ යකෙකු රකුසෙකු ලුහුබැඳ එන්නාක් මෙනි.

"කළුවරේ කොහෙද ඔය දුවන්නෙ...? ඔහොම ඉන්නවා..."

අතපත ගා සරම සොයාගත් ඔහු එය හඳිමින් මිදුලට බැස්සේ ය.

පාරට ගොඩවන්නට ඇය පැකිළුණා ය. ඉරුණු ටීෂර්ටයට වඩා ඇගේ දෙපා ආපස්සට ඇදින්නේ තමාට යාමට තැනක් නොමැති බවට උපදනා හැඟීමයි. ඒ අවබෝධය ඇගේ ශක්තිය පිරිහෙළයි.

ඇය අඹ ගසට හේත්තු වූවා ය. නිවස තුළ මෙන් නොව මේ එළිමහනේ අඳුරේ උකුබව යම් තරමකින් දියව ගිය සෙයක් දැකිය හැකි ය. ඊට හේතු කාරණා කිමදැයි දැනගන්නට වාගේ ඇය ඉහළ බැලුවා ය. අඹ අතු ඉති ඇගේ දෑසද අහස ද අතරේ



බැඳි වියනක් විය. එහෙත් පලින් පල ඉරී ගිය ඒ වියනම ඇයට අන්ධකාරය දියව යාමට හේතුව පහදා දෙයි.

"තරු එළිය" යි ඇය කොඳුළේ තමා සොයන පිරිමියෙකු සමීපයෙහි ගැවසෙන බව පවා අමතක කර දමමිනි.

අහසේ තැන තැන විසිරුණු තාරකා කොතෙක් ප්‍රභාමත්දැයි කිවහොත් ඇයට හැඟුණේ ලොව සියළු අගනුන් ඔව්, එකියක් නැර දෙකන පැළඳි අරුංගල් කිසියම් ප්‍රාතිහාර්යයකින් අහසට විසි වී ගිය බවකි. එවන් රහසිගත ප්‍රාර්ථනයක් ද ඇය වෙත තිබිණ.

නොපීරූ හිසකින් ද යටි කයෙන් වහනය වන රුධිරයෙන් තෙත්ව ගිය රෙදි කඩකින් ද යුත් දැරියක ගෙතුළේ එකම කාමරයේ සිරගතව සිටියා ය. ඇගේ තනි නොතනියට කිසිවෙක් නොවූ බැවින් සීතම්මා ඇගේ අත ගිරයක් තැබුවා ය.

"දැං ඉතිං බය වෙන්ඩ කාරණාවක් නෑ... තනියට දහදෙනෙක් ඉන්නවා වගේ තමා" යි උන්දෑ පාරම් බෑවා ය. එහෙත් අතැති ගිරය විසි කර දමා පැන දුවන්නට තරම් වන කෝපයකින් හා නොරිස්සුම් සහගතබවකින් කෙල්ල ඇවෙමින් සිටියා ය. ඊට බාධා කරමින් ඇගේ මව යැයි කියනු ලබන ගැහැනිය පැමිණියා ය.

"අම්මටත් විකාරනේ... ඇන ගත්තු හැටියේ වතුර වක් කරලා ගෙට ගන්ඩනෙ තිබ්බෙ..."

ඔරවාගෙන ඉන්නා දියණිය දෙස එක් හදිසි හා කෙටි බැල්මක් හෙළු චාන්දනී සිය මවට දොස් පැවරුවා ය.

"එහෙම හොඳයැ බං... චාරිත්තර කියලා දේකුත් තියෙනවනෙ..."

"මොන චාරිත්‍ර ද අම්මා...? මං මේ දැනුත් ආවෙ බෙහෙත් ගන්ඩ යනවා කියලා අරයට බොරු කියලා..."

ගැබ්බර දියණිය සමඟ බහින් බස් වන්නට නොසිතූ සීතම්මා "හිටපංකො මං තේ කහට උගුරක් වක් කරන්න" යි කියමින් කාමරයෙන් පිටව යාමට සැරසුණා ය.

“තේ බිබී ඉන්ඩ බෑ අම්මා... මං පරක්කු වුණොත් අරය දබර වෙනවා...” යි කී ඇය සිය මව වෙත ළං වූවා ය.

“ආ... මේ කරාබු කුට්ටම දාන්ඩ වතුර වැක්කෙරුවට පස්සෙ”

දියණිය දිගු කළ අලංකාරවූ ඇබිත්තන් වූ ද මංජුසාව වෙත අත නොපෑ සීතා කඳුලක් පිස දැමුවා ය.

“උඹනෙ චාන්දනියෝ කෙල්ල නාවන්ඩෝනෑ... දැං කොහෙන්ද ඉස්සර වගේ රෙදි නැන්දලා... උඹේ අතින්ම එපැයි ඕක කෙල්ලගේ කනට දාන්ඩ...”

“නෑ නෑ මට ආයෙ එන්ඩ විදිහක් නෑ... මටත් කොයි වෙලාවෙ ඉස්පිරිතාලෙ යන්ඩ වෙයිද දන්නෑ... අම්මනෙ මේ ඕන්නැති පණ්ඩිත කං කෙරුවෙ... දැං ඉතිං අම්මම ඉතුරු ටිකත් කරගන්ඩ...”

මැහැල්ල හෝ ගැබ්බර ගැහැනිය කිසිසේත් අපේක්ෂා නොකළ පරිද්දෙන් ආශා පෙරට පැන්නා ය. මව අත වූ මංජුසාව ඩැහැගත්තා ය. ඉනික්බිති කාමරයෙන් පිටතට දිව්වා ය.

“ආසා... දෙයි හාමුදුරුවනේ මේකි දිව්වා නේද?”

සීතා නිම්හිම් නොවන උද්වේගයෙන් කෑ ගසමින් මිණිබිරිය ලුහු බැන්දා ය.

“ආසා... ආසා...”

ඇගේ උච්ච ස්වරය විලාපයක් මෙන් රැව් දුන්නේ ය. ඉදිරියට නෙරූ උදරය චාන්දනීට කඩිසර වන්නට ඉඩ නොදෙයි.

“දැක්කා නේද...?” දැක්කා නේද....? ඔහොමද ගෑනු ළමයෙක් වෙච්චහම... අම්ම තව හුරතල් කරන්ඩ.... තව හුරතල් කරන්ඩ...”

ඇගේ ඉඳිමුණ දෙපයේ අලසකමට සපුරා පටහැනිව මුව නොනවත්වා චලනය විය.

“කොයි කරාබු කුට්ටම?”



වදෙන් පොරෙන් ඇදගෙන එන කෙල්ලගෙන් සීතා පුනා පුනා ඇසුවේ ඒ ප්‍රශ්නයයි.

එහෙත් ඇය හදිසියේ ගොළුව ගියාක් මෙන් නිහඬව පසුවූවා ය.

“විසිකරන්ඩැති...”

චාන්දනීගේ උත්තරය නිවැරදි බව හඟවමින් ඇය හිස සැලුවා ය.

“අපුච්චියේ...”

සීතා අප්‍රමාණ සංවේගයෙන් හඬ ගෑවා ය.

“අර මනුස්සයටත් හොරෙන් මං කොච්චර අමාරුවෙන් ද ඕක ගත්තේ... ඒ මිනිහත් එක්ක ගිය දවසේ ඉඳං රුපියලෙන් රුපියල එකතු කෙරුව. කැටේ කැඩුවෙ අම්මා පණිච්ඩෙ එව්ව දවසේ. මාලයක් ගන්ඩ හිතාගෙන හිටියට සල්ලි මදිවුණා අම්මේ... ඒ හින්දයි මං ඔය පුංචි කරාබු කුට්ටමක් ගත්තේ...”

චාන්දනීගේ හඬ බිඳිණි.

ඇය හඬා වැටෙන අන්දම ආශා අකම්පිත දෑසින් බලා සිටියා ය.

“උඹ අඬන්නැතුව ගෙදර පලයං දුවේ. වත්ත පහළටනෙ මේකි ඒක විසික් කරන්ඩ ඇත්තේ... මං කොහොම හරි හොයා ගන්නං...”

මිත්තණිය මිණිබිරියට දොස් පවරන්නට මැළි වූවා ය. තමාගේ අවධානය ගිලිහී ගිය මොහොතක ඇය ළිඳට පනින්නට බැරි නැත. එහෙමත් නැත්තං කණේරු ඇට කන්නට පවා මේ හිතුවක්කාරිය නොපැකිළෙනවා නිසැක ය. තමාට ඇත්තේ සාරි දෙක තුනක් වුවද එයින් එකක් ගෙන ගෙල වැළලා ගන්නට පවා ඇය තැත් නොකරන බවට තමාට සහතික විය හැකිද...?

“චාන්දනියා හදා ගන්ඩ මං එච්චර දුක් වින්දෙ නෑ... ඒ වුණාට මේකි හදන්ඩ මං නොවිඳින දුක් වින්දා. බැරි වෙලාවත් මේකි පරාණෙට මොනවා හරි කොර ගත්තොත් මගේ පපුව පැළෙයි...”

සිල් සමාදන් වන්නට අඩ ගැසූ යෙහෙළියක සමඟ සීතා එලෙස පැවසුවේ ඒ ඉල්ලීම කාරුණිකව ප්‍රතික්ෂේප කරමිනි.

කරාබු කුට්ටම සොයා ගන්නා බවට මව ලබා දුන් පොරොන්දුව විශ්වාස කළ චාන්දනී ආපසු ගියා ය. පිටව යාමට පෙර දියණියගේ හිස අත ගාන්නට උවමනා වුවද "එපා... එපා... අල්ලන්ඩ එපා මාව" යි ඇය බිහිසුණු ලෙස මුරගෑම හේතු කොට ගෙන ඒ කුඩා සිරුර ස්පර්ශ නොකොටම යන්නට ගියා ය.

කොතෙක් සොයා බැලුව ද සීතාට කරාබු කුට්ටම සොයා ගත නොහැකි විය.

"යකෝ මේක බහිරවයා ගිල්ල වගේනේ..." යි ඇය මහත් පුදුමයෙන් පැවසුවා ය.

"කියපං මයෙ අම්මා උඹ ඒක කොහෙට්ට ද විසික් කෙරුවෙ...?" යි කොතෙක් ඇසුවද බැගෑපත් වුවද ඇය නිහඬව පසුවූවා ය.

මිත්තණියට ද මිණිබිරියට ද පමණක් සීමා වූ මල්වර මංගල්ලය අලුත් ගවුමකින් හා කැවුම් කොකිස් කෙසෙල් ගෙඩිවලින් පමණක් සමන්විත විය.

"කරාබු දෙකක්වත් නෑ" යි පාසලේ දී සෙසු ළමයින් අවමන් කරන කල ආශා කෝපයෙන් පුපුරා හැළුණා ය.

"නෑ තමා... ඉතිං මොකද...? ඇයි කරාබු දාන්නැත්තං උල තියන්ඩ ද...?"

ඇගේ ඇතේ සවි ශක්තිය කවරාකාරදැයි හොඳින් දන්නා ළමයින් මගහැර යති.

"කරපිංචා... කරපිංචා..." යි කෑගසන්නේ ළමයින් අතරේ සැඟවුණු එකියකි.

"කන විදපුදා නිටං කරපිංචා නැටි තමයි... නිටපංකො බලපංකො මං කොහොම හරි කවදාහරි උඹේ කනට කරාබු දෙකක් දාන්නැද්ද කියලා..."



කලින් කලට කරපිංචා නැටි අළුත් කරන අතරතුරේ සීතා කඳුලින් ද සුසුමින් ද ප්‍රතිඥා දෙන්නී ය.

"කරපිංචී... කරපිංචී..."

වඩා නිර්මාණශීලී දැරියක ආශාට සරිලන පරිද්දෙන් ඒ අන්වර්ථ නාමයේ ස්ත්‍රී ලිංග පදය නිර්මාණය කරයි.

අරුංගල් මෙන් බබළන තරු වියන යට අඹ ගස බදා ගත් තරුණිය කොපුලක් ඔස්සේ රූ රා හැලෙන කඳුළු පිසගන්නට නොසිතුවා ය.

"බය වෙන්ඩ එපා... මා එක්ක පොරකන්ඩත් එපා... මට ගහලා පැනල දුවන්ඩත් එපා..."

සඳුන් ඇය දැඩිව අල්ලාගනිමින් අවධාරණය කළේ ය.

"ම්... මං දන්නෙ නෑ. මට මොනා වුණා ද කියලා මට තේරෙන්නෑ... මං ඔයාව අමාරුවෙ දාන්ඩ හැදුව නෙමේ... ඇත්තමයි මං හිතල කරපු දෙයක් නෙමේ..."

ඔහුගේ පියවර හඬ හෝ අසන්නට තමා අසමත් වීම පිළිබඳව පුදුමයට පත් වූවා විනා ඇය පැන දුවන්නට තැත් නොකළා ය.

"ගිහිං නිදාගන්ඩ..."

ඔහුගේ හඬ බෙහෙවින් හැඟුම්බර විය.

"ත... තරහද...?" යි ඇසිය යුතුව තිබුණේ ඔහු වුවද දුබල හඬින් එසේ ඇසුවේ ඇය යි.

"නෑ..." යි කියමින් ඔහු ඇය වැළඳ ගත්තේ ය.

"මං... මට බයයි.... මට මගේ කියලා ඉතිරි වෙලා තියෙන්නෙ එච්චරයි... මට මුකුත් නෑ... මට කවුරුවත් නෑ... මං හිඟන්නියෙකුටත් වඩා අන්තයි."

ඇය ඔහුගේ පුළුල් ළය මඩලේ මුහුණ ඔබා ගනිමින් හඬා වැටුණා ය.

"අඬන්ඩ එපා..." යි ඔහු බැගෑපත් විය.

"ඔයාට මං ඉන්නවනේ" යි ඇය අස්වසාලන්නට ඔහු පැතිළුණේ ය. සැබැවින්ම තමා මේ රූබර හා රුදුරු කෙල්ලට පෙම් කරන්නේ දැයි ඔහු නොදත්තේ ය. එහෙයින් එබඳු පොරොන්දුවක් දීමට ඔහු පසුබට විය.

"යං... නිදාගමු..."

"බෑ..."

"ඇයි?"

ඇය ඔහුගේ තුරුලින් මෑත් වූවා ය.

"මට නිදිමත නෑ..."

ඔහු සානුකම්පිත මදහසක් පෑවේ ය.

"ඒ බොරු..."

"බොරු නෙමේ..."

"මං ඔයාට ආයෙ කරදර කරන්නෙ නෑ... ඇත්තමයි... ඔයා ගෙට ගිහිං දොර වහගෙන නිදා ගන්ඩ..."

ඇය සුසුමක් හෙළුවා ය. එයම යෞවනියකගේ හද ගැබ ශෝකාග්නිය සංකේතවත් කරන්නක් විය.

"ඔයා ඇහුවනේ ඇයි අර මිනිස්සු මගෙ පස්සෙං පැන්නුවේ කියලා..."

මේ මැදියම් රැයෙහි ඔහුට ඒ කිසිවක් දැන ගන්නට උවමනා නොකළේ ය.

"කමක් නෑ... ඒ විස්තර තියා ඔයාගෙ නමවත් මට දැං දැනගන්ඩ ඕන් නෑ..."

"ඇයි...?"

ඇයිදැයි ඔහු ද සිතා බැලුවේ ය.

"මං දන් නෑ... ඒ වුණාට මට හිතෙනවා තව කෙනෙක් ගැන මුකුත්ම නොදන්නා තරමට හොඳයි කියලා..."



"ඒ වුණාට මට කියන්ඩ ඕන... ඔක්කොම ඔයත් එක්ක කියන්ඩ ඕන..."

ඔහු ඇගේ අතක් අල්ලා ගත්තේ ය.

ඔවුන් ඉස්තෝප්පුවට ගොඩ වූයේ සාමදානයද, අවබෝධයද විසින් මොළොක් කරන ලද සිත් සතන් උසුලා ගනිමිනි.

# 12

ඒය අරාබි නිසොල්ලාසය මෙන් රසවත් නොවී ය. එහෙත් පන්සිය පනස් ජාතකය මෙන් සංකීර්ණ විය. වඩා දීර්ඝ වීම වළක්වාලන අදහසින් හෝ තමාගේ අපකීර්තිමත් උපත ඔහුගෙන් වසන් කිරීමේ උවමනාවෙන් හෝ ඇය මුල නොතකා මැදට ගියා ය. සැබවින්ම ඇයට දේව දූතයෙකු වූ ඒ දේවදාසයාගෙන් කතාව අරඹන්නට ඇය ප්‍රිය කළා ය.

"ලැජ්ජ නැද්ද ඉස්ටේජ් ගානෙ නැඟ නැඟ විරිඳු කියන්ඩ...?"

ඔහුගේ මුහුණේ ශෝභමාන බව කෝපයේ අන්ධකාරයෙන් මඳකට මැකිණ.

"ලැජ්ජ වෙන්නෙ මොකට ද? ඇඳුම් ඇඳගෙනනෙ විරිඳු කියන්නෙ..."

ඇය ශෝකයෙන් හෝ කෝපයෙන් නොව සොම්නසින් කීවා ය.

"ඒ වුණාට... කොච්චර දිගට ඇඳුං ඇඳගෙන හිටියත් සමහරු ඇස්වලින් ඇඳුං ගලවන්නැද්ද...?"

ඇය සිනාව මැඩ ගන්නට වෑයම් නොකළා ය. ඒ මෝහණීය හසරැල්ල ඔහු ගේ නොරිස්සුමද කෝපය ද අකාමකා දමා ඔහු අන්ද මන්ද කරවයි.

"ඇස්වලිං කොහොමද අනේ ඇඳුං ගලවන්නෙ...?"



ඔහු ඉවත බැලුවේ ය.

තමා පවා නොයෙක් වර ඒ අසෝබන ක්‍රියාවේ නිරතව හිඳින වග හෙළි කළ නොහැකිව දුර්මුඛ විය.

"හැමෝම කියනවනෙ මං හරි ලස්සනට විරිඳු කියනවා කියලා..."

"ඇය දැරියක මෙන් හපන්කමක් කළ දැරියක මෙන් ආඩම්බරයෙන් හිස නැටෙව්වා ය."

"ලස්සනට කියනවා නං තමා... කව්ද දන්නෙ විරිඳු කියලා ඉවර වෙලා රැස්වීමත් ඉවර වුණාට පස්සෙ ඔය ඡන්දෙ ඉල්ලන උං එක්ක මොන මොන බයිලා කියනව ද කියලා. එක එක නැටුමුත් නටනවා ඇතිනෙ අපි නොදන්නවට..."

ඇගේ දෙනෙත රත් පැහැ ගැන්වෙමින් කියා පෑවේ ළය පැන නැඟි කෝපයේ තරමයි.

"මොකක් ද කිව්වෙ...?"

ඇය ඔහුට මුහුනලා හිටගත්තා ය. ඒ හැන්දෑවේ ඇය දිස්වූයේ බොක්සිං වළල්ල මධ්‍යයේ ප්‍රතිවාදියාට ප්‍රහාරයක් එල්ල කරන්නට මාන බලන බොක්සිං ක්‍රීඩිකාවක් පරිද්දෙනි.

"හොඳටම ඇහුණනෙ කියපු දේ... ඇයි ආයෙත් බොරුවට අහන්නෙ...?"

"ඔව්... මං එක එකා එක්ක බයිලා කියනවා... නටනවා. ඉතිං තමුසෙට මොක ද?"

ඇගේ මනබඳනා සුන්දරත්වය සමඟ කිසිසේත් නොපෑහෙන ඒ රළු වචන අඳහාගත නොහැකිව මෙන් ඔහු බලාගත්වනම බලා සිටියේ ය.

"මේක හරි වැඩක්නෙ... හැම එකාම බලා ඉන්නෙ පද හදන්ඩ. මුංට පිස්සුද මංදා... ඩිංගක් හරි මොළේ තියෙනවා කියලා හිතුවා... ඩිංගක් හරි කරුණාවක් මනුස්සකමක් ඇති කියලා හිතුවා... මොන... හැම එකාම එකයි..."

Scanned with CamScanner

ඇය නොවළහා සිය සිතැඟි හෙළි කළා ය. ඒ වචන ඔහුගේ ළයෙහි ඇනී ඇමිණී ගියේ ය.

"කුමාරී..."

ඔහුගේ සිතෙහි චංචල බව ඒ ස්වරයෙහි ද ගැබ්ව තිබිණ. ඇය පුදුමයෙන් වටපිට බැලුවා ය.

"මොන කුමාරියෙක් ද?"

ඔහු බංකුව මත හිඳ ගත්තේ ය.

එය ආගන්තුකයෙකුට විනා මේ ගෙපැළේ දඩබ්බර කෙල්ල උදෙසා නොවී ය. සීතා හිඳගත්තේ පමණට වඩා වැඩි කලක් පාවිච්චි කිරීම හේතු කොටගෙන අබලන් වූ පුටු කබලක් මත ය.

"වෙලාවක පුටුව කැඩිලා වැටිලා කොන්දත් කඩාගෙන කෙඳිරි ගගා ඉඳී..." යි ඇතැම් විට ආශා අනතුරු ඇඟෙව්වා ය. එහෙත් ඒ පුටු කබලේ හිඳ ගැනීමේ කලාව ප්‍රගුණ කර හුන් මැහැල්ල ඒ අනතුරු ඇඟවීම් නොතකා හැරියා ය.

"මං ආසයි ඔයාට කුමාරී කියන්ඩ..."

"ඒ ආශාව ඇයට වටහාගත නොහැක."

"ඇයි?"

"ඇය දෑස හකුළා ගනිමින් ප්‍රශ්න කළා ය. ඔහු කට කොණකින් හිනැහෙමින් ඉවත බැලුවේ ය. ඇය ඒ සරල ක්‍රියාවෙන් කිසියම් වින්දනයක් ලද්දා ය. ඔහු නොයෙක් වර ඒ පරිද්දෙන් ඉවත බලයි. එකල්හී ඇයට නිදහසේ ඔහු දෙස බලා සිටිය හැක. කය වෙහෙසා වැඩපල නොකරන අඩ අඳුරු දේවාලය තුළ දෙවියන්ගේ ආවතේව කරන මේ තරුණයාගේ පැහැබර පුෂ්ටිමත් සිරුර නරඹන්නට ඇය ප්‍රිය කළා ය.

"ඒ ළමයා උඹේ හැඩහුරුකමම යි... එක ළඟ ඉන්නකොට අයියයි නංගියි වාගේ.... අනේ ඇත්තමයි."

සීතා නිතර දෙවේලේ එසේ කියන්නේ කුමාර හා ආශා එක් බඳු රූ සෝභාවෙන් යුක්ත නිසාම නොවේ. සහෝදරත්වය ඉස්මතු කළ විට ඒ ඉලන්දාරියා හා මේ නැම්බිය අතර හාදකමක්



හට නොගනු ඇතැයි සිතමිනි. එහෙයින් එය කිසියම් ආරක්‍ෂිත උපක්‍රමයක් විය. අකීකරු හා අවිනීත මිණිබිරිය කිනම් මොහොතක හෝ කන්‍යාභාවය අහිමි කර ගනු ඇතැයි ඇය කොතෙකුත් තැති ගත්තා ය.

"කඩප්පුලිකමටම නෙමේ. මටයි අරකිටයි රිද්දන්ඩ ඕකි හිඟන්නෙක් එක්ක හරි බුදිය ගනියි... පල් හොරෙක් මිනීමරුවෙක් වුණත් ඕකිට වගක් නෑ. ඕකි එහෙව් බඩ්ඩ... මං මේ ගිනි පත්තුවෙලා ඉන්නෙ ඕකි කොයි වෙලාවෙ මොකෙක් එක්ක නාඩගං නටයි ද කියලා..."

ඇය එක දිගට කියාගෙන යන්නේ පෝයක් පාසා සිල් සමාදන් වීමට ඇරයුම් කරන යෙහෙළිය සමඟිනි. පෝයට පෙරදින නිමලාවතී අනිවාර්යයෙන් පැමිණියා ය.

"මේ ලෝකෙ අපිට තව ඉතුරු වෙලා තියෙන්නෙ බොහොම ටික කාලයයි සීතක්කේ... දැං ඉතිං ඒ ලෝකෙට යමක් කොර කියා ගන්ඩෝනෑ.... මේ පෝයටවත් යමං මා එක්ක අසපුවට..."

ඒ ආරාධනාව අරබයා සීතා විවිධාකාරයෙන් ප්‍රතිචාර දක්වයි. එහෙත් ඒ හැමකක්ම ගොඩනැගුණේ මිණිබිරිය වටා ය.

"අසපුවට යන්ඩ අඩ ගැහුවම උඹ යස අපූරුවට බැග් ගානවා... හැබැයි සීතාක්කේ මාරයා අඩ ගහපු දාට මිණිබිරි තනිවෙනව කියලා උඹට නොගිහිං ඉන්ඩ බැනේ."

බැරිම තැන මාරයා සිහිපත් කළ ද මැහැල්ල ඇගේ සිල ව්‍යාපාරයට එකතු කරගත නොහැක.

"කියන්ඩකෝ... ඇයි මට කුමාරී කියන්නෙ?" යි ආශා අසන්නේ මඳ වෙලාවකට පෙර ඔහුට පහර දෙන්නට තරම් වන කෝපයෙන් තමා දැවෙමින් සිටි බව අමතක කර දමමිනි.

"නෑ ඉතිං... මං කුමාරනේ..." යි කී ඔහු ලැජ්ජාශීලී සිනාවක් පෑවේය.

"ඉතිං...?"

"ඉතින් මම කුමාර ඔයා කුමාරි... ගැලපෙනවා නේද...?"

ඔහුගේ බොළඳකමට හිනැහෙනවා වෙනුවට ඇය බැරෑරුම් බැල්මක් හෙළුවා ය.

"නම් විතරක් ගැලපිලා මොකට ද...?"

ඔහු වහා නැඟී සිටියේ ය.

"ඇයි අපි දෙන්නා ගැලපෙන්නැද්ද...? හැමෝම කියනවා ඔයයි මායි අයියයි නංගියි වගේ කියලා..."

ඇය කොණ්ඩා කරල අතැඟිලි අග පටලවා ගනිමින් කල්පනා කළා ය.

"මට නං ඕන අයියෙක් නෙමේ කුමාර..."

ඇය කතා කළේ ගැඹුරු හඬිනි.

"එහෙනං...?"

ඔහු මහත් උනන්දුවෙන් බලා සිටියේ ය.

"කොල්ලෙක්...." යි කී ඇය සැණෙකින් ඔහු දෙස බැලුවා ය. කෝල බැල්මක් වෙනුවට ඒ තියුණු බැල්ම ඔහු අපහසුතාවයට පත් කරවයි.

"ඔයා මීට කලිං කවදාවත් කොල්ලෙක් එක්ක යාළුවෙලා නැද්ද...?"

මෙවර අපහසුතාවයෙන් පීඩා වින්දේ ඇය ය. ප්‍රේමාරාධනාවක් ලබන්නට තරම් ඇය සුකොමල නොවූවා ය. ගිනි කන්දක් මෙන් පුපුරන සුළු යුවතිය වෙතින් ඈත්ව සිටීමට වගබලා ගත්තවුන් අතරේ කලාතුරකින් ලද ප්‍රේමාතුර බැල්මක පවා සැඟව තිබුණේ ආශාභරිත අනුරාගයකි. දූෂණයෙන් උපන් එකිය දූෂණය කිරීමට ශුද්ධ වූ අයිතියක් ඇතැයි තරුණයන් මෙන්ම වැඩිහිටියන්ද කල්පනා කළ සෙයකි. අවජාතක හංවඩුව ගැසීමෙන් නොනැවතී නිර්මල වූ කිසිවක් ඇය වෙත නැතැයි එවැන්නක් ඇය ලැබිය යුතු ද නැතැයි හඟින සමාජයට ඇය වෛර කිරීමේ අරුමයක් ද නොවිණ. ආදරයේ නාමයෙන් ඇගේ කය රිසිසේ භුක්ති විඳින්නට තැත් කළ කිසිවෙකු ඇගේ සාහසික



කෝපයෙන් ගැලවගන්නට සමත් නොවූහ. අපේක්ෂා භංගත්වයට හා අවමානයට පාත්‍ර වූවෝ ඇය අවලම් බැල්ලක බව කියමින් නිග්‍රහ කළ විටෙක ඇය මෙල්ල කිරීම පහසු නොවීය..

"ඔකි ළමා නිවාසෙකට බාර දෙන්ඩයි තියෙන්නෙ... උඹ කොහොමද ඔය විසේකාරියක් එක්ක ඔට්ටු වෙන්නෙ...?" යි සීතාගේ යෙහෙළිය පවා අවවාද කළා ය.

"අප්පෙක් ඇතා නැතා අම්මෙක් අහක බැලුවත් මේ කිරියම්මා ඉන්නකං ඒකි කොහෙවත් යන් නෑ... ඒකි මං මොකෙකුටවත් දෙන්නෙත් නෑ... ඇයි මං මගේ මිණිබිරි ආණ්ඩුවට දෙන්නෙ...? ආණ්ඩුවට කිරි එරෙනවද ඒකිගෙ දුක දැකලා... අනේ නිකං පලයං නිමලියේ යන්ඩ..."

"සීතා සිය මිණිබිරිය වෙනුවෙන් කොන්දේසි විරහිතව පෙනී සිටියා ය.

"කොල්ලො මට බය යි..."

ආශා පැවසුවේ අර්ධ සත්‍යයකි.

"ආසයි බයයි වෙන්ඩැ" යි කී කුමාර හිනැහුණේ ය. ඇය ඒ සිනාවට හවුල් නොවූවා ය. කිසියම් බරක් ළය තෙරපෙන බවක් හැඟී ගියෙන් ඇය අසරණ වූවා ය.

"මං දන්නෑ..."

"මං යාළුවෙලා හිටපු කෙල්ලට තවත් කොල්ලෙක් හිටියා..."

ඇය අයාගත් ඇසින් සවන් දුන්නා ය.

"ඒ වගේ චපල කෙල්ලෙක් මොකට ද...? මං ඒකි අතෑරියා..."

"කෙල්ලො විතරක් නෙමේ කොල්ලොත් චපලයි..."

ඔහු ඇය දෙස එක එල්ලේ බැලුවේ ය.

"කොල්ලො ගැන හොඳට දන්නවා වගේ..."

එය ඇණුම් පදයක් දැයි විමසන නියායෙන් ඇය ඔහු දෙස බලාගන්වනම සිටියා ය. ඒ දෙනෙතේ නොකිළිටි බව හැඳින ගත්තෙන් ඔහු පළමුව ඉවත බැලුවේ ය.

Scanned with CamScanner

"කොල්ලො ගැන විතරක් නෙමේ... මං කෙල්ලො ගැනත් දන්නවා... මිනිස්සු ගෑනු ඔය හැමෝම ගැන මං දන්නවා... ඌං ඔක්කොම එකයි.. කාට හරි හිනාවෙන්ඩ කුණු කතා කියන්ඩ තමා කට හදාගෙන ඉන්නෙ... මං නං බය නෑ ඔය මොකෙකුටවත්..."

"මං නං දෙයියන්ටයි යක්කුන්ටයි බයයි..." යි ඔහු ඇත්තම කිවේ ය.

"ඇයි?"

"දෙයියන්ටයි යක්කුන්ටයි බය නොවී කොහොමද...?"

ඇය අනුවණ ප්‍රශ්නයක් ඇසුවේ යැයි නොසතුටු සිතින් ඔහු පෙරළා ප්‍රශ්න කලේය.

මොකට ද ඉතිං කාට වුණත් බයවෙන්නෙ...?"

"බය වෙන්ඩෝනෑ... දෙවියන්ට යි යක්කුන්ටයි අපි බය වෙන්ඩම ඕනෑනේ..."

"ඇයි මොකද වෙන්නෙ?"

"අණ විණ කරනවා... එතකොට තමා අපල උපද්‍රව... රටේ නැති කරදර කෝන්තර ඔක්කොම ඔලුව උඩට කඩං වැටෙන්නෙ..."

ඔහු තමා දේවදාසයෙකු බව සනාථ කරවමින් පහදා දෙයි.

"ඒ ගොල්ලන්ට බය වුණාම මොකද වෙන්නෙ?"

ඇය දැරියකගේ කුතුහලයෙන් ඇසුවා ය. ඔහු පුටුව මත හිඳගත්තේ වඩා පුළුල් පිළිතුරක් දීමේ අදහසිනි.

"එපා එපා..." යි ඇය කෑගෑවාය. එයින් නොසන්සුන් තරුණයා පුටුව මත මඳක් ඇඟලුවේ ය. එකෙනෙහි එහි දුබල අණ්ඩක් බිඳී ගියේ ය. ඇය පෙරට පැන්නද ඔහු බිම වැටුණි.

"අයියෝ වැටුණා නේද...?" යි ඇය සංවේගය පළ කළා ය.

"මං කිව්වනේ ඕකේ ඉඳගන්ඩ එපා කියලා..."

කුමාර නැගී සිටියේ කෝපයෙනි. හද බැඳි ළඳක අබියස පුටුවෙන් වැටීම මහත් අවමානයකැයි ඔහුට හැඟිණ. ඔහු පුටුව



ඔසවා මිදුලට විසි කළේ පළුදු වූ ආත්මාභිමානයට පිළියමක් ලෙසිනි.

"එපා එපා..."

ඇය ඔහු ගේ ඇඟේ එල්ලුණේ ඔහු කබල් පුටුවක් නොව මැණිකක් විසි කරන කලෙක මෙනි.

"කැඩිච්ච කබල් තියාගෙන මෙතන..."

තවත් ආණ්ඩක් කැඩී ගියෙන් මිදුලේ පතිත පුටුව අංගවිකල අබ්බගාතයෙකු මෙන් දිස්විය.

"සීතම්මගෙ පුටුව..."

"උන්දැ වැටුණනං මෙහෙම නෙමේ... කොන්ද කැඩිල ගියාම ඔයාට තමා උස්සන්ඩ පෙරලන්ඩ වෙන්නෙ..."

"ඇයි මං උස්සන්නෙ" යි ඇය ඇසුවේ නොමනාපයෙනි.

"ඉතිං ඔයා විතරනෙ උන්දැට ඉන්නෙ... වෙන කව්ද උන්දැට සාත්තු සප්පායං කරන්නෙ..."

ඇය ඔහුට පිටුපා කොට බිත්තියට හේත්තු වූවා ය. පිට දිගේ එල්ලා හැලෙන කොණ්ඩා කරල මත ඔහුගේ ඇස නැවතිණ. එයින් ඇද ඇය රිදවන්නට උපදනා ආශාව පිළිබඳව ඔහු විමතියට පත් විය.

"එයාගෙ දෝණියැන්ද කරන්නෙ නැතෑ.. මං නං අඳින්නෑ කාගෙවත් ගූ හුජ්ජ..."

මිත්තණියක සමඟ වෙසෙන කෙල්ලක එවන් ග්‍රාම්‍ය වදන් භාවිතා කිරීම පිළිබඳව පුදුමයට පත්විය යුතු නැතැයි ඔහුට සිතිණ.

"උන්දැගෙ දුව ඔයාගෙ කව්ද...?"

ඔහු මඳ සිනාවක් ද සමඟ ඇසුවේ ය. ඇය නිහඬව පසුවූයේ "අම්මා" යි උච්චාරණය කරන්නට අකැමැත්තෙනි. කිරි කඳුලක් නොපෙව් උකුලේ ළමැදේ සුව නොදුන් මවක පිළිබඳව කතා කරන්නට හෝ ඇය ප්‍රිය නොකළා ය.

"කියන්ඩකෝ ඉතිං... සීතම්මගෙ දුව ඔයාගෙ කව්ද?..."

"මගෙ කව්රුවත් නෙමේ"

ඔහු ඇගේ දෙවුරින් අල්ලා තමා වෙත හරවා ගන්නට තැත් කළේ ය.

"කෝ මේ බලන්ඩ... මේ පැත්ත හැරෙන්ඩ..."

ඒ මෘදු වදන් ඇගේ නොරිස්සුම තුනී නොකරයි.

"ඇයි අම්මට අම්ම කියන්ඩ බැරි?"

"ඒ නම් ඔහු ඇය වැනි වහා කිපෙන කෙල්ලකගෙන් නොඇසිය යුතුව තිබූ ප්‍රශ්නයකි. ඔහු වෙත හැරුණේ ද ඔහුගේ දෑත ගසා දැමුවේ ද යුවතියක නොව යක්ෂණියකි. යකුන් මෙල්ල කරන්නට සැදී පැහැදී සිටිනා දේව දාසයා පවා තැති ගත්තේ ය. එපමණටම ඇගේ පෙනුම බියකරු විය.

"බඩේ තියාගෙන ඉඳලා එළියට දැම්මට අම්මෙක් වෙන්නෑ ගෑනියෙක්... තේරුණා ද? මට අප්පෙක් අම්මෙක් නෑ... මං ඕපපාතිකයි... ඒ කියන්නෙ මං ඉබේ හැදිලා... අර අහසිං මේ මහ පොළොවට වැටිලා..." ඇද්ද...? තව මදිද...?

ඔහු නිරුත්තරව බලා සිටියේ ය. ගිනි පුළිඟු විහිදෙන ඒ දෙනයන ඔහුට ඇය වෙතින් තවත් අඩියක් පස්සට යන්නට බල කරයි.

"යන්ඩ... ඉතිං යන්ඩ... ආයෙ කවදාවත් මෙහෙ එන්ඩ එපා... මේ පැත්ත බලාගෙන බත් කන්ඩවත් එපා..."

ඇය කෑ ගැසුවේ කෝපයෙන් පමණක් නෙව ශෝකයෙන් ද මිරිකෙමිනි.

ඇයට අවනතව පිටව යාමට ඔහු පළමුව කල්වනා කළේ ය. එහෙත් වේගයෙන් උස්පහත් වන ඇගේ ළමැද ඔහුගේ දෙපය බැඳ දමන රැහැනකි.

"කුමාරි..."

ඔහු ඇය වැළඳගත්තේ අනුරාගයෙන් ද ස්නේහයෙන් ද එකට කැළතෙන හදිනි. විරෝධය පාන්නට ප්‍රතික්ෂේප කරන්නට



පමණක් නොව ඔහු තල්ලු කර දමා පැන දුවන්නට හැකි වුවද ඇය ඒ කිසිවක් නොකළාය. ඔහුගේ සවිමත් දෑත් අතරට මැදිව කාලාන්තරයක කඳුළු වගුරන්නට ඇයට උවමනා විය. ඇගේ දෙනෙතින් කඳුළු රූරා හැලිණ.

"මං ඔයාට ආදරෙයි... ඇත්තමයි... මට ඔයා නැතුව ඉන්ඩ බෑ..."

අසන්නට අනන්තවාරයක් අපේක්ෂා කළ ද තමා වෙනුවෙන් එබඳු මිහිරි තෙපුල් පිරිමි මුවකින් පිටවනු ඇතැයි කොහෙත්ම නොසිතන කෙල්ලක වෙව්ලා ගියා ය. කිසි කලෙකත් නොනිවෙන ලාවා ගංගාව සැණෙකින් හිම කන්දක් විය.

කුරුල්ලන් තවමත් කැදලි තුළ උණුසුමේ සුව විඳිමින් සිටිය දී ඈතින් කුකුළෙක් හඬ නැගුවේ ය. ඒ හඬින් ඇවිස්සී ගියාක් මෙන් තැනින් තැන තවත් කුකුළන් කිප දෙනෙක් නැගූ උච්ච ස්වරයෙන් අළුයම නිශ්ශබ්දතාවය බිඳ වැටිණ.

"ඉතිං ඊට පස්සෙ?"

ඇගේ ප්‍රේම පුරාවතට මහත් උවමනාවෙන් ඇහුම්කන් දුන් තරුණයා නොඉවසිල්ලෙන් ඇසුවේ ය.

"එළිවෙන්ඩත් ළඟයි"

ඇය උදාවන දවසට බියෙන් මෙන් කොඳුළා ය.

ඔහු හිස සැළුවේ ය.

අඹ අතු ඉති අතරින් ආකාසේ අසිරිය යාමතම් දැකිය හැක. අහස පොළොව එක්වන්ව බිහි කරන්නට තතනන තවත් දවසක්!

"අද නං මොනව හරි වැඩක් හොයා ගන්ඩම වෙනවා... අතේ සත පහක් නෑ..."

ඇය පසුතැවිල්ලෙන් හේබා ගිය වතින් ඔහු දෙස බැලුවා ය.

"මං හිංද නේද සල්ලි ටික ඔක්කොම ඉවර වුණේ...?" ඇය දුක්මුසු හඬින් ඇසුවා ය.

Scanned with CamScanner

"කොහොමටත් ඉතිං ඒ තුට්ටු දෙක ඉවර වෙනවනෙ... මං පොඩ්ඩක් ඇවිදල බලන්නං...මොනව හරි වැඩක් හොයා ගන්ඩ බැරි වෙන්නෑ..."

ඇය හිස කැසුවා ය.

"මටත් පුලුවන්නෙ..."

"නෑ ඕන්නෑ... ඔයා ඉන්ඩ... මං බලන්නං..."

ඔහු කතා කළේ ඇය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නට තමාට අයිතියක් ඇතැයි සිතන්නට මෙනි.

"මටත් ආයෙ නිකං උඩ බලාගෙන ඉන්ඩ බෑ මේක අස්සට වෙලා..."

"එහෙනං ඉතිං බිම බලාගෙන ඉන්ඩ..." යි කී ඔහු සිනාසුණේ ය.

"මොකක්ද නම?"

තවම හරිහැටි නොපෙනෙන ඔහුගේ මුහුන දෙස විමසිලිමත් බැල්මක් හෙළු ඇය රළුපරළු හඬින් ඇසුවා ය.

"මං ඉතිං ඉස්සෙල්ලත් කිව්වනේ... හැබැයි ඉතිං ඔයාට ඕන්නං මට කුමාර කිව්වත් කමක් නෑ... ඔයා කුමාරටනෙ ආදරේ..."

ඔහු ආදරය කරන්නේ කාටදැයි අසන්නට ඇය පැකිළුණා ය. ඔහුගේ උණුසුම් පහසද දෙතොලේ මිහිරද යළි සිහිපත්වන වාරයක් පාසා ඇය වේදනා වින්දා ය.

"නේද? ඔයා කුමාරටනෙ ආදරේ...?"

ඇගේ හිස පහතට බර විය.

"තුවාල පාරන්ඩ එපා... හුගක් රිදෙනවා..."

මෙවර ඇගේ හඬ සෝබර විය.

"කුමාර ඔයාව තුවාල කෙරුවද? එහෙම නැත්තං කුමාර එහෙම පිටිංම තුවාලයක් ද...?"



ඔහු අනුකම්පා විරහිතව නැවතත් ප්‍රශ්න කළේ ය.

"මං කියන්නං... මම සේරම කියන්නං..." යි ඇය පොරොන්දු වූවා ය.

"අද රෑට...?"

ඇය හිස සැලුවා ය.

"ඔව්... ඉතිං... දැං වෙලාවක් නැතෙ... එළියත් වැටිලා..." යි කී ඔහු දෑත දෙපසට විහිදා ඇනුමක් ඇරියේ ය.

"මං හින්දා නිදාගන්ඩත් නෑ..."

ඔහු අපවිත්‍ර ඉස්තෝප්පුවේ වැතිරුණේ ය.

"ඔයා හින්දා මට කොච්චර දේවල් නැති වුණා ද...?"

එකෙණෙහි ඔහුට සිහිපත් වූයේ රූපිකා ය. ඒ අත්සතු ළඳ යි. මාමාගේ බිරින්දෑ වුවද තමා කිසි කලෙකත් ඇයට "නැන්දේ" යි ආමන්ත්‍රණය නොකළ වග සිහි කරමින් සුසුමක් හෙළුවේය.

"කොහොමටත් ගෑනු හිංදා මට දෙයක් නැති වෙනවා මිසක් ලැබිච්ච කෙහෙල්මලක් නෑ. ඉස්සෙල්ලම අම්මව කිරියත්තව මාමව ගෙදර ගම... ඒ හැමදේම නැති වුණා... ඒක මාර වැඩක්."

ඇය මෝදු වන කුහුලින් ඔහු දෙස බැලුවා ය.

"ඇයි? මොකද වුණේ?"

"ඉස්සෙල්ලා ඔයාගේ කතාව කියන්ඩකෝ... ඊට පස්සෙ මං මගෙ කතාව කියන්නං..."

ඇය නැගී සිටින්නට තැත් කළා ය. උඩුකය කෙළින් කළ ඔහු ඇගේ අතින් ඇද්දේ ය. ඇය හැරී බැලුවේ විමතියද කුතුහලයද පිරී ගිය දෑස විදහා ගනිමිනි.

"තරහ ද...?"

ඉකුත් රැයෙහි ඔහුගේ අනුරාගී හැසිරීම සම්බන්ධයෙන් සමාව අයදින්නාක් වැනි ඒ බැල්මෙන් ඇය කැළඹී ගියා ය.

"න්...නෑ..." යි හීන් හඬින් කොඳුලා ය.

# 13

අකාරුණික අහසට දෙස් දෙවොල් තබමින් වුව ගම්මු මොන මොනවා හෝ වගා කරන්නට වෙහෙසුණහ. විශාල වපසරියකින් යුත් වගා ළිං ඒ සඳහා ඔවුන්ට මහෝපකාරී විය. එහෙත් වී වගාව කුඹුරක වගල් කොටසට පමණක් සීමා විය. උණ ලෙඩා කැඳ ඉල්ලන්නාක් මෙන් වැඩි වැඩියෙන් වතුර අයදින වී වගාව අමතක කර දමා වම්බටු, වට්ටක්කා, බණ්ඩක්කා, කැකිරි වැනි බෝග වගා කරන්නට ඔවුන් බෙහෙවින් වෙහෙසුණ හ. අහස් වැස්ස විශ්වාස කරන්නට නොහැකි වූයෙන් බොහෝ දෙනා කොළඹ ගොස් අහුවෙන වැඩක් පලක් කොට කීයක් හෝ හොයා ගන්නට පුරුදු වී සිටියහ.

සඳුන් දැන හඳුනාගෙන හුන් කීප දෙනා ද එලෙස කොළඹ ගිය කාණ්ඩයට අයත් වූහ. මංමුලා වූවෙකු මෙන් ඉබාගාතේ ඇවිද ගිය තරුණයා පැයෙන් පැය ඉක්ම යනවා විනා තමාට වැඩක් සොයාගත නොහැකි වනු ඇතැයි බියපත් විය.

"ෂික්..."

බයිසිකලය පැදීමෙන් වෙහසට පත් ඔහු මඳකට නැවතුණේය. හිමිදිරියේ පටන් ඔහු බයිසිකලය සමඟ ඔට්ටු විය. මකුළු දැල් හා දූවිලි පිස දමා පැද යා හැකි මට්ටමකට අළුත්වැඩියා කර ගන්නට ඇයද උපකාර කළා ය.



අමරසිරි සිය බයිසිකලය උදෙසා වන ආම්පන්න සියල්ල එක්රැස් කර තිබුණි. ඒ නිසා වින්කලයකට යෑමේ අවශ්‍යතාවයක් පැන නොනැගිණ.

"මට නං ඉතිං මේ බයිසිකල් කට්ට තමා මැරෙනකංම" යි පවසා උස් හඬින් හිනැහෙන්නට ඔහු පුරුදුව සිටියේ ය.

"අමරෙ අයියට නැතුවට ඉතිං වික්‍රමෙ අයියට තියෙනවනෙ මෝට බයික් කාර් බාර් සේරම..."

අමරසිරිගේ සොහොයුරා මෑතකදී මෝටර් රථයක් මිලදී ගත්තේ ය. ඒ වැඩිකොටම ගුරුවරියක් වන ඔහු ගේ බිරිඳගේ පෙරත්තය හේතුකොටගෙනය.

"කාර්රෙක ගන්ඩ වෙන්ඩැති මේ ගේයි ඉඩම යි ඉල්ලුවේ..."

සඳුන්ට එය අළුත් මෙන්ම ඇදහිය නොහැකි ප්‍රවෘත්තියකි.

"මේක ඉල්ලුවා...? මාරයිනෙ..."

"තණ්හාව... තණ්හාව... තණ්හාවේ කෙළවරක් නෑනෙ සඳුන් මල්ලි..."

"ඉතිං අමරෙ අයියා මොකද කිව්වෙ...?"

සඳුන් මහත් නොඉවසිල්ලෙන් ප්‍රශ්න කළේ ය. ගරා වැටෙමින් තිබුණද මේ නිවස අමරසිරිට මෙන්ම ඔහුට ද මාළිගාවකි.

"වෙන මොනව කියන්ඩද...? මං කෙළිංම කිව්වා මට තියෙන්නෙ මෙච්චරයි... මේකට නං කුරු ගහන්ඩ එන්ඩෙපා කියලා..."

කෝපයෙන් අඳුරුව ගිය ඒ මුහුණ යළි යළි දකිමින් සඳුන් සුසුමක් හෙළුවේ ය. ඒ සුසුමින් නොව හදිසියේ හමා ආ වියළි සුළං රොදින් සැලෙන කෙසෙල් කොළ මත ඔහුගේ දෙනයන නැවතිණ.

ඔහු අබියස කෙසෙල් කොරටුවකි. බොහෝ කුඹුරුවල කෙසෙල් වගා කරන්නට ගොවියෝ කලක් තිස්සේ පුරුදුව සිටිති. එය වී වගාවට වඩා ලාභදායක බව ඔවුන් සිතති.

Scanned with CamScanner

"වී ඉහලා ගොඩ යන්ඩ බෑ..." යි නොකියන ගොවියෙක් මෙ ගම් දනව් පුරා නැති තරම්ය.

ඉඳිකිරීම කටයුතුවල අත් උදව්කරුවෙකු වූ සඳුන් ගොවිතැන පිළිබඳව දන්නා දෙයක් නැත්තේ ය.

"කුඹුරේ හතර මායිමවත් දන්නැතුව ඇති අපේ එකා..." යි ඇතැම් විට දයාසීලි සිය පුත්‍රයා හෙළා දුටුවා ය.

"අඳේට දෙන්ඩ ඕන් නෑනේ කොල්ලෙක් ගෙදර ඉද්දි... කොයි ඉතිං කැත්තක් උදැල්ලක් අතින් අල්ලන එකක් යැ..."

රිදෙන තැලෙන සිත සනසාගන්නට ඇය නිරර්ථක වෑයමක නිරත වෙයි.

බොහෝ දුර බයිසිකලය පැදීමෙන් හෙම්බත් වූ තරුණයා පයක් බිම ඔබාගෙන මඳක් කල්පනා කළේ ය. සරුසාර කෙසෙල් පඳුරු හා විශාල කෙසෙල් කැන් එකට එක්ව ඔහු ප්‍රිය නොකරන හා මෙතෙක් කිසි කලෙකත් නොකළ ක්‍රියාවකට බල කරන සෙයකි.

"ඔච්චර කැන් තියෙන එකේ එකක් කපා ගත්ත කියල පාඩුවක් වෙන්නෑ අයිතිකාරයට..."

මහා පාපයක් වන සොරකම සම්බන්ධයෙන් තමා මෙසා ලිහිල් අන්දමින් සිතන්නේ කෙලෙසදැයි ඔහු පුදුමයට පත්විය.

"නෑ ඕන් නෑ.... කොහෙවත් යන කෙල්ලෙක් හිංදා මං මොකටද හොරකං කරන්නෙ...? අනිත් එක ඒකි මෙලහටත් පැනල ගිහිල්ල ද කව්ද දන්නෙ... කිසි විශ්වාසයක් තියන්ඩ පුලුවංද... ඊයෙ රෑ මහ ලොකුවට දැගළුවට වෙන්ඩ ඕන සේරම වෙලා ඇත්තෙ. මට මොත්තෙ දාන්ඩයි හදන්නෙ... පත්තිනි අම්ම වෙන්ඩ හදනවා මට පේන්ඩ..."

බයිසිකලයෙන් බට තරුණයා කෙසෙල් කොරටුවට වැදුණේ ඇයට බැන වදිමිනි. එහෙත් ඇයගේ සිරුර තමා අනුරාගයෙන් කළඹාලන්නට සමත් වූ වග පිළිගන්නට තරම් හෙතෙම අවංක විය.



"මැස්සෙක්වත් වහල නෑ වගේ ඇට් කෙරුවට කොල්ලො කී දෙනෙක් එක්ක බුදිය ගත්තද කියල කව්ද දන්නෙ..."

ඔහු තොල් මතුලේ ද්වේෂයෙනි. සියල්ල තමාට අහිමි කළ ඇය පෙරැත්තයකින් තොරවම ඇගේ සිරුර තමාට පිදිය යුතු නැත්දැයි ඔහුට සිතිණ... ඇය වන්දි ගෙවිය යුත්තේ ඒ ආකාරයටය. ඇය සන්තකව කිසිත් ධනයක් නැතත් නිධානයක් තරමට අගනා ඒ මනහර සිරුරින් තමාට වන්දි ගෙවන්නට ඇය සූදානම් නොවීම පිළිබඳව ඔහු කිපුණේ ය.

"හවස එනකොට ඉඳිකට්ටකුයි නූල් බෝලෙකුයි අරං එනවද...?"

ඔහු බයිසිකලයට නගින කල ඇය ඉල්ලා සිටියේ එපමණකි.

"ඉඳිකට්ටකුයි නූල් බෝලෙකුයි?" යි පුදුමයෙන් ඇසූ ඔහු ඇය දෙස විමසිල්ලෙන් බැලුවේ ය. ඔහුගේ තියුණු දෙනෙතින් අපහසුතාවයට පත් වූ කලෙක මෙන් ඇය ගෙතුළට ගියා ය. එකෙණෙහි ඉඳිකටුවක් සහ නූල් බෝලයක් ඉල්ලා සිටින්නේ මක් නිසාදැයි ඔහුට අවබෝධ වූයේ ය.

තමගේ දැතින් ඉරී ගිය ටීෂර්ටයේ පැත්ත මාරු කොට හැඳ තිබූ බැවින් නිරාවරණය වූයේ ඇගේ පිට පෙදෙස ය. ඔහුගේ ළය දැවී ගියේ ය. පෙරදින හැන්දෑවේ සෝදා දැමූ ඇගේ අනෙක් එකම ඇඳුම තවමත් වියළී නැතුවා විය යුතු ය.

ඉඳිකටුවක් හා නූල් බෝලයක් වෙනුවට ඇයට නවත් ඇඳුමක් ගෙන එන්නට ඔහු හිවිස ගත්තේ ය. එහෙත් ඇඳුමකට තබා ඉඳිකටුවකට හෝ වියදම් කළ නොගෙන පරිද්දෙන් තමා අවාසනාවන්ත අඩියක වැටී සිටින බව ඔහුට අවබෝධ විය.

කෙසෙල් කැනක් කර තබා ගෙන ආවෙකුගේ ඇගේ හැපුණු සඳුන් "ඔහ්" යි හඬ නැඟුවේ ය.

මුවග නැඟි කුණු හරපය යළි ගිලගත්තේ වැවේදී හමු වූ තරුණයා ය.

"මික් මං දැක්කෙම නෑ... වෙන කල්පනාවක හිටියෙ" යි පසුතැවෙමින් සඳුන් කෙසෙල් කැන ඔසවා දුන්නේ ය.

"හරි... හරි... ඒකට කමක් නෑ..."

"මංජුලගෙද කෙසෙල් කොටුව?"

මංජුල හිස සැලුවේ මහත් ආඩම්බරයෙනි.

"මං දැනගෙන හිටියෙ නෑ..."

"එහෙනං මේ පැත්තෙ මොකද?"

සත්‍යය හෙලි කිරීමෙන් විනා බොරුවක් කීමෙන් අත්වන සුගතියක් නැති බව වහා තීරණය කළ සඳුන් "උදේ ඉඳලා වැඩක් හෙව්වා හම්බවුණේ නෑ බං" යි කළකිරුණු හඬින් කී ය.

"මාත් උදේ ඉඳලා වැඩට කෙනෙක් හෙව්වා.. හම්බුනේ නැනේ" යි නොකී මංජුල පුළුල් සිනාවක් පෑවේ ය. නළල වටින් දහදිය රූරා සැලෙන මුහුනට එයින් අත් වූ අමුතු ආලෝකයක් නැත්තේ ය.

"මාත් තනියම වැඩ..." පුලුවං නං සපෝට් එකක් දියං...

සඳුන් උත්තරයක් දීමට පමා විය.

"හරි හරි පරක්කු වුණාට කමක් නෑ. මං ගානක් දෙන්නං... කෙසෙල් කැනකුත් දෙන්ඩ බැරියැයි නෝනට ගෙනියන්ඩ. ඌං ඉතිං එක එක ඒවා කන්ඩත් හිතිල ඇතිනෙ..."

වැයමින් සිනහවක් පෑ සඳුන්ද තරුණයා පසුපස ගමන් කළේ ය.

ඇය තමාගේ බිරිඳ තබා පෙම්වතිය හෝ නොවන බව කීමෙන් පලක් නොවන බව ඔහු දනියි. එක වහලක් යට දෙදිනක් ගත කළ යුවළක් පිළිබඳව කව්රුත් බලන්නේ එකම දෘෂ්ටි කෝණයකින් බව දැන දැනත් කිසිවක් කීම අනුවණකමකි.

කෙසෙල් පරඬැල් කපා දැමීමට හා කපන ලද කෙසෙල් කැන් ගොඩැල්ල කරා රැගෙන යාමට මුළු දවසම ගත විය. දිවා ආහාරය සඳහා ලැබුණු කෙටි කාලය තුළ කුමක් කළ යුතු දැයි සඳුන් නොදත්තේ ය.



"මං නං කැම එකක් ගෙනාවා. සඳුන් ගෙදර ඊසිල්ලා කාල එන්ඩ. ඕන්නං මේකෙන් කන්ඩත් පුලුවං... ඒ වුණාට නෝනා මග බලාගෙන ඇතිනෙ රසට උයාගෙන..."

සඳුන් ආපසු හැරුණේ ලැජ්ජාශීලී සිනාවක් පාන්නට අපොහොසත් වූ බැවිනි.

"බැඳපු අළුත ඔහොම තමා... පනු පනු වෙනකොටනෙ ඉතිං කොහු කොහු වෙන්නෙ... ඉක්මනට වරෙං මචං පුරතල් කර කර ඉන්නැතුව..."

අබලන් බයිසිකලයට වඩා ඔහු වෙහෙසට පත්කළේ ඒ හඬයි.

"බොරුවට කකුල් කඩාගෙන බයිසිකල් පැද්දවත් පාඩුයි. ගෙදර ගියා කියලා ඉතිං මොනව කන්ඩද... ඒ කෙල්ලත් ඇත්තෙ බඩගින්නෙ... කඩෙංවත් මොනව හරි ගෙනියන්ඩ තිබ්බා... ඒකටත් අතේ සතේ නැනේ... මට ණයට දෙයියැ මේ කඩකාරයො"

ඔහු බයිසිකලය අඹ ගසට හේත්තු කළේ මහත් අසහනයෙනි. කුසගින්නේ පසුවන තරුණියට මුහුන නොදී ආපසු යාමට පවා ඔහුට සිතිණ. එහෙත් ඇය කුමක් කරන්නේදැයි දැක බලා ගන්නට උපන් කුහුලින් ගෙට ගොඩ විය.

නිසැකවම ඇය ඇඳ බඳා වැළඳ වැතිර සිය ප්‍රේමවන්තයා සිහි කරනවා ඇති. සියුම් ඊර්ෂ්‍යාවකින් කිළිටිව යන හදින් සුසුමක් හෙළු ඔහු කාමරයට එබුණේ ය. එහෙත් ඇය ඒ තුළ නොසිටියා ය. ඇගේ මනහර සිරුර දැකගන්නට අපේක්ෂා කළ දෙනෙත හැකිළිණ.

"යන්ඩ ඇති..." යි ඔහුට සිතිණ.

"කොහෙ ගියාද දන්නෙ නෑ" යි ළතැවුලින් කොඳුරමින් වටපිට බැලුවේ ය.

අසෝබනත්වය එලෙසම තිබියදී වුව අතු පතු ගා පිරිසිදු කළ බවක් දක්නට ලැබිණ. ඒ වෙනස හඟිමින් ඒ දැන දැනුදු වැඩක නිරතව ඇත්දැයි සැක පහළ කරමින් ඔහු කුස්සියට දිව්වේය. ඇය පිටව නොගිය බව සිතීම පවා ආශ්වාදජනකය.

අමරසිරි සිටියදී පවා පිස්සිගේ පලාමල්ල මෙන් අවුල්ජාලයක් වූ කුස්සියද එක්තරා ප්‍රමාණයක කලඑළියක් ඉසිළීය.

"නෑ... ගිහිං නෑ..."

ඔහුගේ සන්තුෂ්ටිය සීමා රහිත විය.

තවමත් ඇල්වෙන ගිනි පෙනෙළි ලිපෙන් පිටතට ඇදී තිබිණ. ලිප මත මුට්ටියෙහි ඇත්තේ කුමක්දැයි දැක බලා ගැනීමේ නොඉවසිල්ලෙන් ඔහු ඒ වෙත ළං විය. දිගු කළ අත හකුළා ගන්නට සිදු වූයේ ඇගේ උස් හඬ හේතු කොටගෙනය.

"හා හා අල්ලන්ඩ එපා... අත පිච්චෙ යි..."

රෙදි කඩක් අතින් නොගෙන ලිප මත වළඳක් පිරික්සා බලන කල දයාසීලි කෑ ගසන්නේ ද ඔයාකාරයෙනි. ඇය දැක ගැන්මේ බලවත් උවමනාවෙන් ආතුර වෙමින් ඔහු හැරී බැලුවේ ය.

"ඉව්වද...?"

"මොනව උයන්ඩ ද?" යි නොසැලකිලිමත් ලෙස අසමින් ඇය ලිප වෙත ළංවූවා ය.

"එහෙනං මේ ලිපේ මොනව ද?"

"මඤ්ඤොක්කා..."

ඔහු පුදුමයෙන් ඇස් අයාගත්තේ ය.

"කොහොමද ගැලෙව්වේ?"

"උදේම මං වතුර වැක්කෙරුවා..."

ඔහු නැහැ පුඩු පුම්බා ගනිමින් මඤ්ඤොක්කා මුට්ටියෙන් වහනය වන සුගන්ධයෙන් පෙනහළු පුරවාගන්නට වෑයම් කළේ ය.

"හොඳ වෙලාවට ලුණු ටිකක් තිබ්බා."

මඤ්ඤොක්කා කන්නට ලුණුමිරිස් ඇතැයි ඔහු කිසිසේත් නොසිතුවේ ය. එහෙත් ඇය දිගු කළ පිගානේ පසෙක ලුණු මිරිස් තලියක් ද විය.



"මිරිස් නං තිබ්බෙ නෑ... මං කොච්චි ටිකක් කඩා ගත්තා"

ඔහු නිහඬවම මඤ්ඤොක්කා කැබැල්ලක් ගිල දැමුවේ ය. ඇය මේ සා වෙහෙසුනේ මන්දැයි නොසිතා සිටින්නට හෙතෙම ආපොහොසත් විය. ඒ ඇයගේ කුසගින්න නිවා ගැනීමේ අවියෙන් පමණක් ද? නැතහොත් තමා කෙරෙහි වන අනුකම්පාවෙන් ද? දයාවෙන් ද?

"කඩෙං කෑම ගේන්නත් සල්ලි නැති හිංදා මට හිතුණ මඤ්ඤොක්කා තම්බන්ඩ ඕන කියලා..."

ඔහු අමනාපයෙන් පසු වන්නේදැයි සැකයෙන් ඇය පැහැදිලි කළා ය.

"පොඩි වැඩකුත් හම්බ වුණා. මං එනකොට හවස් වෙයි..."

ඇය කිසිවක් නොපැවසුවා ය. ආපසු යැමට මිදුලට බට තරුණයා හැරී බැලුවේ ය.

"ඇයි? බය ද...?"

"නෑ... මං යකෙකුටවත් බය නෑ..."

ඔහුගේ මුව කොනක සිනාවක් නැගිණ.

"හැබැයි රෑ වෙනකොට මට බයයි..."

ඇගේ හිස පහතට නැඹුරු විය. සැබැවින්ම රාත්‍රිය පිළිබඳව ඇය මේ මධ්‍යහ්නයේ සිටම බියෙන් පසුවන්නීය.

"ඔයාට තේරෙන්නෑ... ඔයා පිරිමි ළමයෙක්.. පිරිමි කෙනෙකුට කවදාවත් ඒක තේරෙන්නෙ නෑ..."

සාමාන්‍යයෙන් රළු පරළු වූ ඒ හඬ බෙහෙවින් හැඟීම්බර විය.

"මං දැනගෙන හිටියෙ නෑනේ ඔයා ගෑනු ළමයෙක් කියලා..."

ඔහු සරදම් කළේ අගේ දෙතොල'තර සිනා බිඳක් දැක ගැන්මේ අපේක්ෂාවෙනි.

Scanned with CamScanner

"ඇයි? එහෙනං මං කව්රු කියලද හිතුවෙ...?" ඇය යැටැසින් ඔහු දෙස බලමින් ඇසුවාය. ඒ බැල්ම ප්‍රිය බව තරුණයා සිතාසුණේය.

"ඇත්තම කියන්ඩ ද?"

"ඇයි ඉතිං බොරු කියන්නෙ?"

ඇය කෝපයට පත් වී තමාට බැන වදින්නට හෝ පහර දෙන්නට ඉඩ තිබෙන බව නොසලකා හළ ඔහු "මං හිතුවෙ මහා යස්සණියක් කියලා..." යි කීවේය.

"ඒ හින්දද ඊයෙ රෑ මගෙ ඇඟ උඩ ඇඟළුවේ" යි අසන්නට පොපියන මුව වැයමෙන් තදකොට වසාගත් ඇය ලී කඳුළු තියඟින් සූරන්නට වූවා ය.

"මං යනවා..."

ඇය හිස සැළුවා පමණි. ඔහු බයිසිකලයට නැග්ගේ ය. එහෙත් එකෙණෙහි මේ අඹ ගසයට දෙබෑවූ හිසින් බිම හෙත් මිනිසා ඇක සුදුමැලි විය. මාරක පොරෝ පහරින් තුවාල වූ හිසින් වැගිරුණ රුධිරය තවමත් මේ වැලිකැට මත තැවරී ඇතැයි ඔහුට සිතිණ.

"මල්ලිට අපේ ගෙදර ඉන්ඩ බැරියැයි."

ගෙයත් ඉඩමත් විකුණා දමන්නට අදහස් කරන බව ශ්‍රී වික්‍රමතුංග සහෝදර ප්‍රේමය විදහා දැක්වීය.

"ඒව බොරු කතානෙ අයියෙ..."

"මොනවද බොරු කතා? ජයන්තිමයි කිව්වෙ මල්ලිව එක්කරගෙන එන්ඩ කියලා..."

අමරසිරිගේ මුව'ග යැයි සිතාව මුළුමනින්ම සාවද්‍ය විය.

"අනේ නිකා ඉන්ඩ අයියේ. පාරක මූනට මූන හම්බ වෙලාවත් හිනාවක් කතාවක් නැති මනුස්සයා මාව එක්ක එන්ඩ කිව්වා...? ඔය කතා හොඳයි ඉතිං මෝඩයන්ට... මට මේ ගෙදර හොඳයි.. මේක ගරා වැටිලා තමා... ඒ වුණාට අයියේ මේ ගේ මට රාජ මාළිගාවක්... අයිය අයියගෙ මාළිගාවේ ඉන්ඩ... මං



එන්නැතේ අයියගෙ මාළිගාවේ පස් පාගන්ඩ... අයියත් මට මගේ පාඩුවේ ඉන්ඩ දුන්නනං තමා හොඳ..."

අයියා මලෝ අතර වාදයට තමා මැදිහත් විය යුතු නැතැයි සිතුණෙන් සඳුන් ළිඳ වෙත ගියේ ය. නැවත වැඩපලකට යනතෙක් නිකරුනේ කල් නොමරා ගෙවත්ත වගා කළ යුතු යැයි යෝජනා කළේ ද ඔහුම ය. ඒ හැටි වතුරත් වැඩි වියදමකුත් අනවශ්‍ය බෝගයක් පිළිබඳව කල්පනා කළ දෙමිතුරෝ අන්තිමේදී මඤ්ඤොක්කා වගා කළ යුතු යැයි තීරණයකට එළඹුණේ වවන කන්දරාවක් ද පැය ගණනාවක් ද නැති නාස්ති කිරීමෙන් පසුවය. බොහෝ විට සිදුවූයේ ගංජා මතින් අවසගව වැටුණ නැතක අඩවන් ඇසින් සිහින දැකීමය.

මඤ්ඤොක්කා දඬු කැබලි මෙන්ම සඳුන් විසින් සාරන ලද වළවල්ද ඉතිරිව තිබුණේ ස්වල්පයකි. එහෙයින් සිය සොහොයුරා සමඟ කතා බහ කරන අතරේම අමරසිරි ඒ කාරිය නිම කරනු ඇතැයි තරුණයා සිතුවේ ය.

"තනි මිනිහෙකුට මොනාටද මෙච්චර ලොකු ගේකුයි අක්කර බාගෙකුයි...? ඔන්න උඹ දරුපවුල් කාරයෙක් නං මං එන්නෑ තමා මේවට කුරු ගාන්ඩ... මං සද්ද නැතුව හිටියොත් උඹෙත් බෙල්ල මිරිකලා පිට එකෙක් තමා මේව්ව අයිතිකර ගන්නෙ..." ඔය වැටිල හිටියට එක පතේ කෑවට ඒ කොල්ල කව්ද කොහෙද කිංද මංද උඹ ඒ කිසි දෙයක් දන්නවද? මිනියක් මරලා පැනලා ඇවිල්ල ද කාටද කියන්ඩ පුලුවං..."

වික්‍රමතුංග උස් හඬින් කියාගෙන ගියේ තමාට ඇසෙන්නට මෙන්ම ඇනෙන්නටද බව සඳුන්ට වැටහිණ. වතුර බාල්දියේ බර ඉසිලිය නොහෙන තරමට ඔහුගේ දෑත සැලිණ.

"මං යනවා... අදම මේ දැම්ම යනවා... මං මොකට ද එක එකාගෙං කුණු කතා අහගෙන මෙතන ඉන්නෙ... අමරෙ අයිය නං රත්තරං මිනිහා තමා... ඒ වුණාට..." යි කොඳුරමින් ඔහු විගසින් මුහුන කට දැත දෙපය සෝදා ගත්තේ ය.

"ගෙතුළට ගෙස් හැඳ පැළඳගන්නා අතරත් දෙසොහොයුරන් ගේ බහින්බස්වීම ඇසුණද පිටස්තරයෙකු වන තමා පිටස්තරයෙකු

ලෙසම පිටව යා යුතු බව ළතැවුලින් සිතුවේය. එහෙත් මිතුරා ගෙන් සමුනොගෙන යාම මහත් අකෘතඥ කමකැයි යන පශ්චත්තාපයෙන් ගැලවෙන්නට අපොහොසත් විය.

වත්ත පහළට යා යුතු යැයි පසුව තීරණය කළද එය කොතෙක් දුරට නිවැරදිදැයි තව දුරටත් සිතා බැලුවේ ය. හැන්දෑ අඳුර ඔහු යුහුසුළු විය යුතු බව අඟවයි.

ගමන් මල්ල උරහිසේ එල්ලාගත් තරුණයා පරාජිත සිතින් හා අප්‍රාණිකව ගිය සිරුරින් මිදුලට බැස්සේ ය. ගමනාන්තය නිශ්චිතව නොදැන මගට බැසීම තරම් කාලකණ්ණිකමක් තවත් ඇත්දැයි ඔහු තමාගෙන්ම ප්‍රශ්න කළේ ය.

"මා එක්ක තරහ වෙන්ඩ එපා අමරෙ අයියා... මං යන්ඩ යන්නෙ යන්ඩ තැනක් තියෙන හිංදා නෙමේ. උඹේ හොඳට..."

තරයේ පියවුණු වියළි දෙතොල සලිත නොවූවද ඔහු මුළු මහත් හදවතින් ම එලෙස හඬ ගෑවේ ය.

අඹ ගස පසු කර යාමට නොලැබිණ. කිසිවෙකුගේ විලාපයක් ඔහුගේ දෙපයේ කඩිසරකම සොරාගත්තේ ය. වටපිට බලන්නට උවමනා නොවීය. ඒ විලාපය ඇසුණේ වත්ත පහළින් බව ඔහුට වැටහිණ. ගමන්මල්ල බිම අත හළ හෙතෙම ඒ හඬ ඔස්සේ දිව යාමට පයක් එසෙව්වේ ය. එකෙණෙහි දිව ආ අයෙක් ඔහුගේ ඇගේ හැපුණේ ය. ඒ අනපේක්ෂිත සිදුවීමෙන් මහත් සේ තැළුණුනද වහා දෑත දිගු කොට වැටෙන්නට ආසන්න වූ තැනැත්තා අල්ලා ගන්නට සඳුන් සමත් විය.

"කෙ.... කෙටුවා.... උං මට කෙටුවා..."

වික්‍රමතුංග ගේ තරබාරු ශරීරය තරුණයාගේ දෑත් අතරින් ලිස්සා බිම ඇද වැටිණ. කොතෙක් වෑයම් කළ ද ඔහු අල්ලා ගන්නට නොහැකි වීමෙන් ද, මාරාවේගයෙන් දිව ආ මිතුරා දැකීමෙන් ද සඳුන් තැතිගත්තේ ය.

"මොකද මේ?" යි ඔහු මහ හඬින් ඇසුවේ ය.

උදැල්ල අමෝරා ගත් අමරසිරි බිම වැටී කෙඳිරි ගාන මිනිසා හට පහර දෙන්නට තැත් කළේ ය. වහා පෙරට පැන්න



සඳුන් පොරවේ එල්ලුණේ ය. එහි තලයෙන් රුධිරය වැගිණ. මඩ හා මිශ්‍ර වූ රුධිරය කාලවර්ණයක් ඉසිලීය.

"එපා එපා..."

අමරසිරි මිතුරා සමඟ පොර බැඳුවේ ය.

"පර බල්ලා.... මූට කොටලා මදි..."

"උඹට පිස්සුද...?" පිස්සුද අමරෙ අයියා?

සඳුන් අපමණ ශෝකයෙන් ද භීතියෙන් ද මුර ගාමින් වියරුවෙන් දඟලන තරුණයා බදා ගත්තේ ය.

"මොකක්ද මේ කෙරුවෙ? අයියෝ ඇයි උඹ වික්‍රමෙ අයියට කෙටුවෙ...? මේ මොන අපරාදයක් ද අමරෙ අයියා?"

පශ්චත්තාපයෙන් මිරිකෙමින් වැළපෙන මිතුරා තල්ලු කර දැමූ අමරසිරි මරණ මංචකයේ වැදහොත් සොහොයුරා දෙස ක්ෂණික හා කෙටි බැල්මක් හෙළුවේ ය. මේ අක්කර බාගයටද ලොබ බැඳි මිනිසාට ඉතා ඉක්මණින් උරුම වන්නේ සිව් රියනක් නොවේදැයි ඔහුට සිතිණ. ඒ සමගම තමා දෑත බදා පොරෝ පහරක් එල්ල කළේ තමාගේ සොහොයුරාට නොවේදැයි වැටහුණෙන් ඔහුගේ ඉහමොළ කකියන්නට විය.

"අපරාදෙ මං ආවෙ... මං හිටිය නං මේ ටික වෙන්නෙ නෑ... උඹ පොරවෙන් ගහනකං මං බලාගෙන ඉන්නෙ නැතෙ අමරෙ අයියා... මගේ වැරැද්ද මේක... වෙන කාගෙවත් නෙමේ මගේ වැරැද්ද..."

සංවේගයෙන් ඇළලුණු තරුණයා දනින් වැටුණේ ය.

"වික්‍රමෙ අයියා... වික්‍රමෙ අයියා"

ස්වල්ප වේලාවකට පෙර තමා හෙළා දුටු මිනිසා වෙත නැඹුරු වූයේ ය.

වික්‍රමතුංගගේ දෙතොල සැලුණ ද වචනයක් වෙනුවට ඉන් ගිලිහුණේ ලේ කැටියකි. මෙතෙක් වේලා වහනය වූ ලෙයින් ඔහුගේ ගෙල තෙත්ව තිබිණ.

"අයියෝ..."

මාරාන්තික ප්‍රහාරයකට ලක්ව මුවින් පමණක් නොව නැහැයෙන් හා දෙකනින් ද ලේ වැහෙන මිනිසෙකු මින් පෙර නොදුටු තරුණයා අප්‍රමාණ භීතියෙන් කෑ ගැසුවේ ය.

"ඉස්පිරිතාලෙට අරං යං අම්මරෙ අයියා... බලං ඉඳල බෑ... අපි ඉස්පිරිතාලෙට අරං යං..."

තවමත් පොරොව අතැතිව හිටගෙන ඉන්නා මිතුරා දෙස බැලූ ඔහු නොඉවසිල්ලෙන් හඬ ගෑවේ ය. සිහින් කෙඳිරියක් ද නොනැගෙන මිනිසා වත්තත් කර ගන්නට සූදානම් විය. අඳුරේ වුව ඔහු පොරෝ තලය කිඳා බැසීමෙන් සිදු වූ ගැඹුරු තුවාලය දැක ගත්තේ ය. වික්‍රමතුංග රෝහලකට ගෙනයාමෙන් පලක් නොවන බව ද මරණ මංචකයේ පසුවන බව ද ඒ බිහිසුණු කැපුම් තුවාලය ඔහුට පසක් කර දුන්නේ ය. ඔහුගේ හද බිඳී ගියේ ය.

"වැඩක් නෑ... දැං වෙච්ච දේ වුණා..."

අමරසිරිගේ හඬ කොතරම් වියළි දැයි කිවහොත් ඔහු තම මිතුරාගේ වේශයෙන් පෙනී සිටින නාඳුනන්නෙකු යැයි සඳුන් මොහොතකට සිතිණ.

"නැගිටපං..."

අමරසිරි නිර්දය ලෙස අණ කළේ ය.

"කෝකටත් ඉස්පිරිතාලෙ අරං යං අමරෙ අයියා... මැරෙන කං බලං ඉන්නෙ කොහොමද...?"

"මං උඹට නැගිටින්ඩ නේද කිව්වෙ... කිව්වහම අහල නැගිටපං යකෝ..."

අමරසිරි තමාටද පහර දෙනු ඇතැයි බියෙන් සැකයෙන් මඩනා ලද සිතින් සඳුන් නැගී සිටියේ ය. ඒ සඳහා ඔහු දැරුවේ ඇඩි ආයාසයකි. කිසිසේත් නොසිතූ විරූ මේ විපත ඔහුට දරා ගන්නට නුපුළුවන.

"කෙටුවෙ මං... ලේ පෙරාගෙන ඉන්නෙ උඹ..."



අමරසිරි එසේ පවසන තුරුම සියොළඟ රුධිරය තැවරී තිබෙන බවක් ඔහු නොදත්තේ ය.

"ඕක ගලවලා වෙන එකක් අඳපං... ඊට පස්සෙ පලයං යන්ඩ "යන දේවාලෙක"

සඳුන් භීතියෙන් සුදුමැලි විය.

"එ... එතකොට අමරෙ අයියා...?"

අමරසිරි ඉවත බැලුවේ ය.

"මං පොලීසියට බාර වෙනවා..."

"එපා..."

තරුණයා මහත් උද්වේගයෙන් කෑ ගැසුවේ ය.

"එපා... ඒ වැඩේ නං කරන්නෙපා අමරෙ අයියා. අපි පැනල යං. අපි හුගාක් ඈත පලාතකට යං... කව්රුවත් දැක්කෙත් නෑ. කවුරුවත් දන්නෙත් නෑ..." යි ඔහු පිංසෙණ්ඩු විය.

අමරසිරිගේ දිගැටි මුහුණේ මස්පිඩු තදව ගියේ ය.

"අපි හැංගිලා ඉමු අමරෙ අයියා. මගේ කටිං නං අමරෙ අයියට විරුද්ධව එක වචනයක්වත් පිටවෙන්නෙ නෑ.. අපි යං... අපි දැම්ම යං..."

සොහොයුරාට වඩා ළෙන්ගතු වූ මිතුරා දෙස අමරසිරි මොහොතක් බලා උන්නේ ය. ඇවුරුද්දක මිත්‍රත්වයේ මතක මැද ඉකි බිඳින හදවත ඔහුට සුසුමකට බල කරයි. එහෙත් තමා සුසුමින් නොව කඳුලින් සිහි කළ යුත්තේ එක බඩවැල කඩාගෙන ආ සොහොයුරා සාහසික ලෙස මරා දැමීම පිළිබඳව බව නොසිතා සිටින්නට ඔහු අසමත් විය.

"කොහොමටත් උඹ මුකුත්ම දැක්කෙත් නෑ... දන්නෙත් නෑ... නැත්තං උඹට පොලීසි උසාවි ගානෙ බඩ ගානවා මිසක වෙන මොකවත්ම කරගන්ඩ හම්බ වෙන්නෑ..."

සඳුන්ගේ දෙනෙතට කඳුළු නැගිණ.

"අපි දෙන්නම යං අමරෙ අයියා... මට අමරෙ අයියව දාලා යන්ඩ බෑ..."

Scanned with CamScanner

"මල්ලි යන්ඩ. මල්ලි කොල්ලෙක්..."

අවසන් හුස්ම පොද හෙලා ඇත්දැයි හරියාකාරව නොදන්නා වික්‍රමතුංගත් තමාට ආදරණීය සොහොයුරෙකු කළාණ මිත්‍රයෙකු වූ අමරසිරිත් හැර දමා යාම පහසු කටයුත්තක් නොවූයෙන් සඳුන්ගේ ළය කකියන්නට විය.

ඒ හැන්දෑ ඇඳිරියේ ගමන් මල්ලක් ද කරේ එල්ලා ගත් තමා වැයමින් ඇවිද ගිය හැටි යළි යළි දකිමින් සඳුන් හුල්ලා වැටුණේ ය.

"ඇයි?"

ඔහුගේ ප්‍රමාදය වටහා ගත නුහුණු ආශා උස් හඬින් ඇසුවා ය.

"මොකද?"

පිළිතුරක් පමා වූයෙන් ඇය නැවතත් ප්‍රශ්න කළා ය.

ඔහු ඇය දෙස හැරී බලන්නට කැමති නොවී ය. දැස පිරුණු කඳුළු දැකගන්නට බැරි තරමේ දුරකින් සිටියද "නෑ මුකුත් නෑ" යි උත්තර දුන්නේ ඉවත බලාගෙන ය.

"මං යනවා" යි යළිත් සමුගන්නට නොසිතු හෙතෙම පිටව ගියේ ය. වික්ෂිප්ත වූ කෙල්ල දිගින් දිගටම නිය විකුවා ය.

# 14

පුංචි ... පුනුමැලි සඳ පළුව අත් හළ කිරි දරුවෙකු මෙන් අසරණ අනාථබවක් පළ කරයි. නුදුරු දිනයක නොනිම් සුන්දරත්වයෙන් අනූනව අහස අරා බබළන්නේ ද මේ සඳ ඇබින්ද ම බව ඇදහිය නොහැක. එවන් සඳ කැල්මක් පිළිබඳව වගක් නොදන්නාක් මෙන් දිලෙන තාරකා නරඹන්නට ඔහුට ඉස්පාසුවක් නොවීය.

වැවට නැමුණ කුඹුක් ගස යට හිඳ ගන්නට පවා ඔහුට නොසිතිණ. ඔහු අත වූ විදුලි පන්දම වරින් වර ඇය වෙත එල්ල කළේ ය. දිය නාන කෙල්ලගේ දිගු කෙස් කළඹ දිය මත ලෙළ දුන්නේ ය.

"එපා..." යි ඇය කෑ ගැසුවේ සබන් ගාන අතරතුරද විදුලි පන්දමේ දීප්තිමත් ආලෝකයෙන් නැහැවෙන්නට සිදුවීම පිළිබඳ ව හටගත් ක්ෂණික කෝපයෙනි. ඒ එක් මොහොතේ දියරෙද්ද ඇත් මෑත් වී දිස් වූ ඇගේ නිරුවත ඔහුගේ සිත කය උණුසුම් කළේ ය.

"ආයෙත් ටෝච් එක ගැසුවොත් මං ඔක අල්ලල විසික් කරනවා වැව ට..."

ඇය එසේ කරන බව ඔහු නිසැකවම දනියි. එහෙයින් විදුලි පන්දම නිවා දමා කුඹුක් ගස මුල හිඳ ගත්තේ ය.

"මං මේ බයේ ඉන්නෙ කිඹුලෙක් පනී කියල කළුවරේ නානකොට..."

දියගොඩ දෙකෙහි වාසය කරන ඒ කෲර හා තිහඬ උභය ජීවියා පිළිබඳව නොව ඉවුරේ සක්මන් කරන දෙපාඩා පිළිබඳව තමා බියෙන් පසුවන බව ඇය හෙළි නොකළා ය. කිනම් මොහොතක ඔහුගේ ඉඳුරන් කුපිත වනු ඇත්දැයි නොදැන ආත්මාරක්ෂාව උදෙසා කිසිවක් කර කියා ගත නුහුණුව ගෙවන මේ ජීවිතයෙන් ඇය දැනටමත් හෙම්බත්ව සිටින්නී ය. එසේ වුව විසකුරු නාගයෙකු දිවි දෙවැනි කොට සුරකින නාග මාණික්‍යයක් මෙන් ඔහු තුළ සඟවාගත් කිසියම් යහගුණයක් හේතුකොට ගෙන මඳින් මඳ මෝදු වන ලෙන්ගතුකම ඇගේ හද පුබුදු කරවයි. ඔහු අත්හැර පලායන්නට සිතන හැම වරකම ඔහුගේ යහ ගුණයද තමාගේ ලෙන්ගතුකම ද ඊට එරෙහිව අත්වැල් බැඳ ගත්තා බව ඇය ළතැවුලින් සිහි කළා ය.

ප්‍රේමයම ප්‍රාණය කරගත් කෙල්ලකගේ විශ්වාසය තිබීත ලෙස බිඳ දැමූ ප්‍රේමවන්තයා තවමත් ගිනි පුපුරක්ව ඇගේ සිත කය දවාල යි. ඒ නිර්දය ගිනි පුළිඟුව නිවී යනතෙක් තමාට සැනසුමක් නොලැබෙන බව ඇය ඉතා හොඳින් දැන සිටියා ය. එහෙත් ගිනි මැළයක් අවුලන්නට තරම් බලගතු නොවෙතත් නිවී යන්නට තරම් දුබල ද නොවෙන එයින් අත්මිදෙන්නේ කෙලෙසදැයි ඇය නොදත්තා ය.

"මට මොකද කිඹුලෙක් කැල්ලක් කඩාගෙන ගියත් මං නෑ බලන්නෑ..."

තරුණයා නෝක්කඩු කියන්නේ නොමනාපයෙන් එල්ලා හැලෙන මුහුනිනි.

"නාල ඉවරයි..."

ඇය කීවේ ද අමනාපයෙනි.

"නෑ... නෑ... තව නාන්ඩ තව නාන්ඩ... නාන්ඩ ඕනෑ කියල නෙ නහයෙන් ඇඩුවෙ... මාත් ඉතිං පව් කියල එක්කගෙන ආවා... ඔච්චර බය නැති ගෑනි එන්ඩ එපැයි තනියම... ආයෙ මං මොකටද..."

ඇඳිරි වැටෙනතුරුම කෙසෙල් කොරටුවේ වැඩ කිරීමෙන් ද මංජුලගේ වාචාල කතා ඇසීමෙන් ද හෙම්බත් ව හුන් තරුණයාට



උවමනා වූයේ ගංජා දුමක සුවයයි. එහෙත් ඔහු මෙන්ම දවස මුළුල්ලේ වෙහෙසී හුන් ආශා කොතෙක් අපවිත්‍රව සිටියේද කිවහොත් ඇය දකිත්ම ඔහුගේ හිස රිදුම් දුන්නේ ය.

"යං..."

රෙදි පෙරෙදි හා සබන් කැබැල්ල බහාලූ කුඩා බාල්දිය අතකින් එල්ලාගෙන සඳුන් වෙත ආ ඇය තොඹුවසිල්ලෙන් ඉල්ලා සිටියා ය.

"කොහෙ ද?"

"නාන්ඩ..."

ඔහුගේ නොසැලකිල්ල ඇගේ කෝපය අවුස්සයි.

"මං නාලා ආවෙ... කෙසෙල් කහට ඇඟ පුරාම. ගන්ඩ දෙයක් නෑ... නාගෙනම ආවා..."

ඇගේ මුහුන අඳුරු විය.

"එතකොට මං...?" යි ඇය ආත්මානුකම්පාවෙන් මිරිකුණා ය.

"දවසම ගේ අස්සෙ රිංගගෙන හිටියෙ... දන් නැද්ද වැවට ගිහිං නාල එන්ඩ... මං එතකංම බලාගෙන හිටියෙ මොන බම්බුවටද...? මට වෙන වැඩක් නැතෙ නාවන්ඩ වඩම්මනව ඇරෙන්ඩ..."

ඇය කිසිසේත් බලාපොරොත්තු නුවූ ලෙස ඔහු බැන වැදුණේ ය. අළු ගොඩේ නිදාගත්තා අළු කුමාරිය මෙන් අපවිත්‍රව සිටියදී පවා ඇය වෙතින් දිස් වන සුන්දරත්වයෙන් ඔහු කුපිත වෙයි.

"මටවත් ජීවත්වෙන්ඩ බැරිව ඉද්දි තවත් කෙනෙකුටත් කන්ඩ අඳින්ඩ දෙන්ඩ වෙලා... මොන මගුලක් ද මේ...? මං මොනව කෙරුවත් වැඩකුත් නෑනේ. කෙළෙහි ගුණයක් ගැව්ලාවත් නෑ..."

ඇගේ සොඳුරු දෙනයන ගිනි පුපුරු දිලෙන්නට විය. එහෙත් ඇය නිහඬවම ආපසු හැරුණා ය. ඒ ප්‍රතිචාරයෙන්

Scanned with CamScanner

වික්ෂිප්ත වූ ඔහු ඇය කුමක් කරන්නේ දැයි සොයා බැලීම සඳහා පිල්කණ්ඩිය මතින් නැගී සිටියේ ය.

ඇය ඉක්මන් ගමනින් ඇවිද ගියේ කුස්සියට ය. අබලන් මේසය මත වූ සිලි උරයට අත යැවූ ඇය එක් බත් පැකට්ටුවක් ස්පර්ශ කරන්නාහාම ඔහු "මොකද ඔය කරන්නෙ?" යි උස්හඬින් ඇසුවේ ය.

ඇය බත් පැකට්ටුව බිම අත හරින්නට සැරසෙන බව අවබෝධ වූයෙන් ඔහු ඇගේ අතින් අල්ලා ගත්තේ ය.

"විසික් කරන්ඩ නං හිතන්නවත් එපා... දවසම මැරිලා හොයා ගත්තු තුට්ටු දෙකෙං ගෙනාපු කෑම ටික..."

ඒ හැඟීම්බර හඬ ඇගේ කෝපය අකා මකා දමයි. එබැවින් ඇය ඔහු සමඟ පොර බඳන්නට තැත් නොකළා ය. ඔහු ඇය අත වූ බත් පැකැට්ටුව නැවතත් මේසය මත තැබුවේ ය.

"මං නං කන්නෑ..."

ඇය කෝපයෙන් ද ශෝකයෙන් ද පැවසුවා ය.

"මොකක් ද නම කිව්වෙ..." ඔහු ඇගේ නම මතක් කරන්නට වෙහෙසුණේ ය. ඇය ඒ සඳහා කිසිදු සහායක් නොදක්වා බලා සිටියා ය.

"සඳුනිද මොකක්ද කිව්වා නේද...?" ඊට පස්සෙ ආයෙ තව නමක් කිව්වා. මං දන්නෑ කෝකද ඇත්ත නම කියලා. සමහරවිට ඒ දෙකම බොරු නම් වෙන්ඩැති. හරි කොහොම හරි කමක් නෑ... අර මෝඩයා හිතාගෙන ඉන්නෙ ඔයා මගේ නෝනා කියලා. මට මල පනිනවා උගෙ කතා වලට..."

ඔහුගේ අසහනකාරී බවට හේතුව අනාවරණය වූයෙන් ඇගේ කෝපය ඇවිස්සිණ.

"එක එකා කියන කතාවලට මං පළිද...? මං මොනවා කරන්ඩද...? මේක හරි වැඩක්නෙ..."

ඇගේ කතාව ද ඇගේ කෝපය ද සාධාරණ බව වැටහුණෙන් ඔහු ඇය අතහැර මේසයට හේත්තු විය.



"කියවනව කියවනව ඉවරයක් නෑ... හොම්බට දෙකක් අනින්ඩත් හිතලා මං සද්ද නැතිව හිටියා..."

"ඉතිං අනින්ඩනෙ තිබ්බෙ... මෙතන ඇවිල්ල මාව කන්ඩ හදන්නෙ..."

ඔහු අතකින් නළල පිරිමැද්දේ ය.

"වැඩක් හම්බුණේම නෑ... උගෙ කෙහෙල් කොටුවෙ තමා අද වැඩ කෙරුවෙ. උගේ හොම්බට ඇන්න නං අද රෑට බඩගින්නෙ තමා..."යි කියමින් ඔහු ඇය දෙස බැලුවේ ය.

"ඇය ඔහුගේ දෑස මඟහැරියා ය.

"බත් පැකට් දෙකක්ම තියෙනවනෙ... කන්ඩ බැරියැ බඩ පැලෙන්ඩ..." යි ඇය පහත් හඬින් පැවසුවා ය.

"ඔව් ඔව් නොකාම ඉඳී..."

ඇගේ අඳුරු දෙනයන බිමට හැරිණ.

"හැමදාම... හුඟාක් පුංචි කාලෙ ඉඳලම මං කෑවේ බැණුම් අහ අහ... මට කන්ඩ දුන්නෙ බැන බැන... මං වැඩිපුර කෑවේ බඩගින්නටම නෙමේ... තරහට"

ඒ අතීතාවර්ජනය ඔහු තුළ බලවත් හැඟීමක් ඇති කළේ ය. එහෙත් කිව යුතු යමක් ඔහුගේ මුව'ග නොනැගිණ.

"සමහර වෙලාවට මං සීතම්මටවත් බත් ඉතුරු කෙරුවෙ නෑ... උන්දැ දංකුඩේ හූරනකොට මට දැනුණෙ ලොකු සතුටක්... මට කවදාවත් දුක හිතුණෙ නෑ. සීතම්මා දංකුඩේ ඇතිළියේ පිහාගෙන කනකොට. ඒ ඇතිළියේ හොඳි බිංදුවක්වත් නැති බව දැනගෙනත් මට පොඩ්ඩක්වත් දුක හිතුණෙ නෑ ඇත්තමයි."

"පාපොච්චාරණයක් වැනි ඒ සෝබර හඬ ඔහුගේ ළය රිදවයි. ඔහු අතකින් දෑස වසාගනිමින් තමාගේ මව දකින්නට වෑයම් කළේ ය.

"තව ටිකක් කාපං... ඔහොම කාල ඇද්ද ඉළන්දාරියෙක් වෙච්චහම..." යි කියමින් ඇය තමාගේ බත්පතට තව බත් හැන්දක් හොඳි ඇබින්දක් බෙදන්නට උත්සුක වූවා ය. ලොකුම

Scanned with CamScanner

මාළු කැබලි දෙක තුන බෙදා තිබියදීත් ඇගේ පතෙහි කුඩා මාළු කැබැල්ල ද තමාට දෙන්නට ඇය වග බලාගත් හැටි සිහි වීමෙන් ඔහුගේ දෑසට කඳුළු නැගිණ.

"අම්මට තියෙනව ද...?" යි නොඅසා තමා එයද බාර ගත් හැටි ශෝකයකින් තොරව සිහි කරන්නට ඔහුට නුපුළුවන. රූබිද රූපිකාගේ බැල්මෙන් සිනාවෙන් වසඟ වී හුන් තමාට "අම්මා කෑවද?" යි අසන්නටවත් මතක් නොවීම පිළිබඳව ඔහු මේ හැන්දෑවේ අතිශයින් කණගාටු වෙයි.

"හැකි ඉක්මණින් ඇය දකින්නට යා යුතු යැයි තීරණය කරමින් ඔහු කුස්සියෙන් පිටවිය.

ඉස්තෝප්පුව තෙක් ඇවිද ආ තරුණයා ආශා දක්නට නොලැබීමෙන් කැළඹුණේ ය.

කාමරයට කර පොවා බැලුවද ඇය එහිද නොසිටියා ය. ඔහු නැවත ඉස්තෝප්පුවට දිව්වේ ය.

"කතා කරන්ඩවත් නමක් දන්න එකක්යැ..." යි අප්‍රසාදයෙන් තොල් මතුළ හෙතෙම මිදුලට බැස්සේ ය.

"සඳුනි... සඳුනි..."

ඇත්ත හෝ වේවා බොරු හෝ වේවා ඔහු ඒ නමින් ඇයට හඬ ගෑවේ ය.

"දෙයියෝ සාක්කි.... කළුවරේම නාන්ඩ ගියාවත් ද...?"

සඳුන් යතුරු පැදියට නැංගේ ඇගේ හිතුවක්කාරකමට ශාප කරමිනි. වැඩි දුරක් යාමට පෙර ඔහුට ඇය හමු විය. යතුරු පැදියේ හඬ නොඇසුණ විලසින් ඇය ලහි ලහියේ ගමන් කරයි.

"ඔහොම ඉන්ඩ..." යි ඔහු නොරිස්සුමින් ඉල්ලා සිටිය ද ඇය නතර නොවූවාය.

"කොහෙද ඔය යන්නෙ?"

යතුරු පැදියේ වේගය බාල කළ ඔහු උස් හඬින් ඇසුවේ ය.



"වැවට..."

"මේ කළුවරේ...? තනියම?"

ඔහු විමතිය පළ කළේ ය.

"කළුවරේ හරි තනියම හරි යන්ඩම එපැයි. නාන්ඩ නං වැවට නොයා වෙන මොනවා කරන්ඩද... මොකද ආයෙ බාත්රූම් තියෙන එකක් යැ..."

"නොනා ඉන්ඩ බෑ එක දවසක්?

ඔහු ඇසුවේ ඇය කතාවට අල්ලා ගැනීමේ අදහසිනි.

"ආඩිය වැක්කෙරෙනවා... අර ජරා ගේ අස්කරලා මාව මැරෙන්ඩ ගියා... දූවිලියි මකුළු දැලුයි..."

"හා හා නඟිනවා නඟිනවා..." යි කී තරුණයා යතුරු පැදියේ තිරිංග තද කළේ ය. ඇය බලාසිටියේ ද ඔහු තව වරක් පෙරැත්ත කරනතුරුය. කෙමෙන් දැඩි වන අඳුරේ හුදෙකලාව වැවට යා නොහැකි බව ඇයට පසක් වෙයි.

"අපෝ... පුදුම කරදරයක් මේක නං... ගිය ආත්මෙ තරහා කාරයෙක් ද කොහෙද..."

ඔහු කතා කළේ කෝපයෙන් නොවේ. ඇය නිහඬව පසුවීම නොඉවසන බැවිනි.

"ඔන්න අනං මනං කියන්ඩ ගියොත් මං පනිනවා බිමට..."

ඇගේ තර්ජනය නොසලකා හළ යුතු නැතැයි ඔහුට සිතිණ. එහෙයින් ඔහු වැව් කණ්ඩියේ කුඹුක් ගස යට යතුරු පැදිය නතර කරනතුරුම කිසිවක් නොපැවසුවේ ය. ඒ නිශ්ශබ්දතාවයට වැඩි ආයුෂක් නොතිබින. ඇය දියෙහි ගිලෙන වාරයක් පාසා ඔහු නොඉවසිල්ලෙන් හා අසහනයෙන් පීඩා වින්දේ ය. අතෙහි ගැටෙන නොගැටෙන මානයේ ඉම්හිරි පලතුරක් තෙලා රස විඳින්නට ඉඩක් නැති කුඩා කොළුවෙකු මෙන් ඔහු තැවුණේ ය. ඇවුණේ ය.

"දැං ඇති... දැංවත් ගොඩට එනවද...?"

ඇය ඔහුට අවනත වූවා ය. එහෙත් ඒ දියෙන් ගොඩවීම පිණිස නොව සබන් ගෑමට බව වැටහුණෙත් ඔහුගේ අසන්තෝෂය තීව්‍ර විය.

"චූට්ටක් ටෝච් එක ගහනවද?"

ඇය මේ සා විනීත අයුරින් කතා කළ ප්‍රථම වතාව මෙය විය යුතු ය.

"දැං නිවන්ඩ..."

සබන් කැබැල්ල සොයාගන්නට ඔහුගේ සහාය ඉල්ලා සිටි ඇය නොපමාව අණ කළා ය. ඔහු විදුලි පන්දම නිවා ඇමුවේ නොමනාපයෙනි.

"මං තමුසෙගෙ වැඩකාරයෙක් නෙමේ" යි කියන්නට සලිත වන දෙතොල වෑයමෙන් වසාගත්තේ ය. අඳුර නොසලකා ඇය පලායන්නට පවා ඉඩ තිබේ. ඒ තිස්සේ මේ නාඳුනන කෙල්ල සමඟ ඔට්ටු දුවන්නට ඔහු කැමති නොවෙයි. හැකි ඉක්මණින් බත් පාර්සලය ගිල දමා නින්දට යාමට ඔහු නොඉවසිලිමත්ය.

ඈ නිහඬව පසුවන නිසාම නොව දිය නාන කෙල්ලක සබන් ගාන විට නොබලා සිටින්නේ කුමන කොල්ලා දැ යි පසක් කරමින් වාගේ ඔහු විදුලි පන්දම එල්ල කළේ ය. අඳුරු වැහිබර අහසක ක්ෂණිකව පැන නගින විදුලිය රේඛා මෙන් කැළුම් දෙන ඇගේ අඩ නිරුවත මොහොතකට දකින්නට ද ඇගේ තර්ජනයෙන් පසුබාන්නටද ඔහුට නොපමාව සිදුවිය. එසේවුව කිසියම් ජයග්‍රාහී හැඟීමකින් ඔහු උදම් නොවුණාද නොවේ. අඳුරේද ආලෝකයේ ද දුහුවිල්ලේ ද ජලයේ ද දිලෙන ඇගේ සුන්දරත්වය ඔහු තුළ සොම්නසක් සේම සියුම් ශෝකයක් ද ජනිත කරවයි. රූපිකා අත්සතු ළඳක වූවා මෙන්ම මේ තරුණිය ද කිසි කලෙකත් තමාට දිනාගත නොහැකි වස්තුවකැයි යන හැඟීමෙන් ඔහු වේදනා විඳියි. ඒ පැරණි හුදෙකලා නිවසේ තමාට බාධා කරන්නට කෙනෙක් නැතත් ඇගේ සිත කය මොහොතකට හෝ හිමි කරගන්නට මෙතෙක් අපොහොසත් වීම පිළිබඳව හෙතෙම කළකිරීමට හා කෝපයට පත් වෙයි.



"තව කොච්චර වෙලා මං මදුරුවෝ තල තලා මේ සීතලේ මෙතන ඉන්ඩ ඕන ද?" යි හඬ ගා ඇසුවේ ඒ කළකිරීම ද කෝපයද විසින් බෙලහීන කරන ලද තරුණියෙකි.

"ඉන්ඩ බැරිනං යන එක නෙ තියෙන්නෙ... කවුද අල්ල ගත්තෙ?"

ඇය ඇගේ සුපුරුදු නොහික්මුණුකම ප්‍රදර්ශනය කළා ය.

සඳුන් කොතරම් තදින් කිපුණේ ද යත් තවත් කිසිවක් නොපවසා යතුරු පැදියට නැගුණේ ය. එය පණ ගන්වන හඬින් තිගැස්සුණ තරුණියව හා දියෙන් ගොඩට ආවාය.

යතුරු පැදියේ ඉදිරිපස පහන් ආලෝකයෙන් හාත්පස කැටි ගැසී තිබූ ඝනාන්ධකාරය වැව් දියේ ගිලී ගියාක් මෙනි.

ආශා ඒ දීප්තිමත් ආලෝකයෙන් නැහැවෙමින් දිව ආවා ය. පියාපත් සලා ඉගිළ යන කුරුල්ලෙකු මෙන් ඔහු තමා හැර දමා පිට ව යනු ඇතැයි ඇය තැති ගත්තා ය.

"එපා එපා.... යන්ඩෙපා"

ඇය යතුරුපැදියේ කටුක හඬ පරයමින් කෑ ගැසුවා ය.

ඔහුග් මුව'ග ඇද වූයේ සාවඥ සිනාවකට ඉඩකඩ සලසාදෙමිනි.

"එහෙනං දැං මට යන්ඩ කිව්වෙ..."

ඔහු යතුරුපැදිය ක්‍රියා විරහිත කරන්නට ප්‍රමාද වූයේ ඇඟට ඇලී ගිය දිය රෙද්දෙන් ඉස්මතු කෙරෙන නාරිලාලිත්‍යය තව දුරටත් රස විඳිනු සඳහා ය.

"තමුසෙ නං යයි සුරුස් ගාලා... එතකොට මං කොහොමද මෝඩයෝ කට්ට කළුවරේ තට්ට තනියම එන්නෙ...?" යි අවලාද නගමින් ඇය කුඹුක් ගසේ පුළුල් කඳින් සැඟව ගියා ය.

"කතා කරන කැත විතරක්... අද නං මං මේකිගෙ කට කඩනවා..." යි මහත් කෝපයෙන් කොඳුරමින් ඔහු යතුරු පැදියෙන් බිමට බැස්සේ ය. එයින් පිටවූ කටුක හඬ නැවතිණ විහිදුණ අලෝකයද සැනෙකින් අතුරුදහන් විය. අඳුර කාලවර්ණ

Scanned with CamScanner

කඩතිරයක් මෙන් ඔහු ද ඇය ද ඇවැන්ත කුඹුක් ගසද වෙළා ගත්තේ ය.

"මොනව කරනවද මංදා... ඔය ටෝච් එක දෙනව මට ඇඳුම් ඇඳ ගන්ඩ..." යි ඇය බෙරිහන් දුන්නේ ගනාන්ධකාරය ඇගේ ඇස් අඳ කළ බැවිනි.

"මොකක් ද ඔය කතා කරන විදිහ...? ඔයිට වඩා හොඳට කතා කරන්ඩම බැරිද...?"

"තෙතබර කෙල්ල වෙත කඩා පැන්නේ කෝපයෙන් දැවෙන කොල්ලෙකි.

ඔහු සමීපයට එතැයි අපේෂා නොකළ ඇය දැස විහිදා බැලුවාය. විදුලි පන්දම එක එල්ලේ ඇය වෙත එල්ල වූයෙන් ඇගේ ඇස් නිලංකාර විය. අඳුරේද ආලෝකයේ ද ඥාති සබඳතාවයක් ඇති වග පසක් කරමින් ආලෝකය මධ්‍යයේ වුව ඇගේ ඇස් මොහොතකට අඳුරින් වැසිණ.

"ඔය කෙහෙල් මල අහකට ගන්නවා... මූනට ටෝච්චෙක ගහන්නෙ මොන මෝඩයද?"

ඇය පෙරට වඩා උස් හඬින් කෑ ගැවා ය.

ඔහු විදුලි පන්දම අසල මාර ගස වෙත දමා ගැසුවේ ය.

පුළුල් කඳෙහි හැපී එය බිම පතිත වූයේ ආලෝකය ද අහිමි කරගනිමිනි. යළිත් ඇඩි වූ අඳුරේ ඇය "තමුසෙට පිස්සුද මිනිහෝ?" යි මහ හඬින් ඇසුවා ය. තරුණයෙකු ඒ වචනද ඒ ස්වරයද මහත්ම නිග්‍රහයක් කොට සළකන බව ඇය දැන නොසිටියා ය. ඇගේ මිත්තණිය ඇගේ ඕනෑම කටොළු කතාවක් අසා සිටියා ය. එක්කෝ කඳුලින්.... එහෙමත් නැත්නම් පෙරළා වාග් ප්‍රහාර එල්ල කරමින්... මිණිබිරියගේ චාරයක් නැති කට වසන්නට අපොහොසත් වූ තැන ඇය චීත්ත පටින් නොකඩවා කඳුළු පිසිමින් පිට ව යයි.

"මොන අපායෙ යන්ඩද මංදන්නෑ ඔයාකාර කුණු කතා කියන්නෙ... ඔය රූපෙට නං ඔබින්නෙම නෑ ........ ඔය කට නං... ඕක කටක් නෙමේ අවීචි මහා නරකාදියක්... උඹ ඊළඟ



ආත්මෙ ඉපදෙන්නෙ ගෙම්බියක් වෙලා.... කැතේ බැරි ගඳ ගහන ගෙම්බියක් වෙලා... බලාපංකො නැද්ද කියලා..."

මැහැල්ල කඩුල්ල පනින්නේ තොරතෝංචියක් නැතිව දෙස් දෙවොල් තබමිනි.

"ගෙම්බො ගෙම්බියන්ව දූෂණය කරන්නෙ නැතෙ සීතම්මේ... ඒ හිංදා මං ගෙම්බියක් වෙන එකක් නෑ..."

නවවන ශ්‍රේණියේ උන් ආශා සෙව්වන්දි පරිසර දූෂණය ශබ්ද දූෂණය මෙන්ම ස්ත්‍රී දූෂණය ද පිළිබඳව ද යම්තාක් දුරකට දැන සිටියා ය.

"දූසනේ නෙමේ... මේක බීසනේ... බලාපං උඹට මෙලොවදීම පටිසං දෙන්නැද්ද කියලා..."

සීතම්මා බැරෑඩිව ගිය හඬින් කිය යි.

මොන බොරු ද... එහෙම පටිසං දෙන්නෑ මොකෙකුටවත්... එහෙනං ඉතිං අර වසන්තයට පටිසං දෙන්ඩ එපැයි... ප්‍රාදේශීය සභාවෙන් පලාත් සභාවට... පලාත් සභාවෙන් පාර්ලිමේන්තුවටත් ඉල්ලයි හෙටානිද්දට..."

තව දුරටත් වාද නොකරන සීතා සිය මිතුරිය වෙත යයි. ආපසු නොඑන බවට වැලි මිටක් උඩ දමා යන මැහැල්ල පැයක් හමාරක් ඉක්ම යන්නට ද පෙර පාරට ගොඩවෙයි. ඒ සිය යක්ෂ මිණිබිරිය මේ වනවිටත් කුමන අඩව්වක් අල්ලා ඇත්දැයි සැකයෙන් පීඩා විඳිමිනි.

"මාත්තෙක්ක තියන තරහට මේකි ගෙටත් ගිනි තියාගෙන හරියට සීතාදේවි වාගේ ඒ ගිනි ගොඩටම පනින්ඩත් බැරි නෑ නිමලියේ..."

මිණිබිරියට ඇනෙන්නට තවත් ටික වෙලාවක් හෝ රැඳෙන්නැයි නිමලාවතී ඉල්ලා සිටින කල උන්දැ කියන්නේ ඒ කතාවය.

"කතා කරන්ඩ ඉගෙන ගනිං..." යි දත් සපමින් කී සඳුන් ඇයට පහර දෙන්නට අතක් එසෙව්වේ ය. රුදුරු වදන් ගිලිහෙන

ඒ සොඳුරු දෙතොල පුපුරා යන පරිද්දෙන් අතුල් පහරක් එල්ල කරන්නට ඔහුට උවමනා වුවද අඳුර ඊට බාධා කළේ ය.

"කොච්චර ලස්සන වුණත් වැඩක් නෑ ලස්සනට කතා කරන්ඩ දන්නැත්තං..."

ඔහු ඇගේ දෙවුරින් ඇල්ලුවේ රිදුම් දෙන තරමට තදිනි. සැබැවින්ම ඇගේ දෑසට කඳුළු නැගිණ.

"මට කව්ද ලස්සනට කතා කෙරුවෙ...?"

ඇගේ හැඬුම්බර හඬ ඔහුගේ ක්‍රෝධය තුනී කර දමයි.

"මට මගේ අම්මවත් ලස්සනට කතා කරල නෑ.... ගමෙ උං මට හිනාවුණේ අවජාතක බැල්ලියක් කිය කියා... ඉස්කෝලෙ උංට මාව එහෙම පිටිංම ගූ ගොඩක්..... ඇගේ ගෑවෙනවටත් කැමති නෑ... මගේ පොතක් පෑනක් පැන්සලක්වත් ඇල්ලුවේ නෑ උං... හරියට මං ඒ හැමදේම ගූ ගොඩක වැටිල තිබිල ඇරං ආවා වගේ.... මිස්ලා සර්ලා මං දිහා බැලුවේ හරියට මං හෙලුබැල්ලෙං ඉන්නවා වගේ. ඒ ඇස්වල තිබ්බෙ කටු විතරයි.... ඒ කටවල්වලින් වැක්කෙරුණෙ වහ... වහ... තනිකරම වහ... ඉතිං ඇයි මං ලස්සනට කතා කරන්නෙ...? කොහොමද මං ලස්සනට කතා කරන්නෙ?"

ඇය තවමත් තෙතබරිතව සිටින බව නොසලකා ඔහු ඇය වැළඳගත්තේ ය. ඇය ඔහු ගේ ළයමඩලෙහි මුහුන ඔබා ගනිමින් කඳුළු සැළුවා ය.

"අ... අඬන්ඩ එපා..." යි ඔහු තතනමින් ඉල්ලා සිටියේ ය.

"සීතම්මගෙං පස්සෙ ඔයා විතරයි මට මනුස්සයෙකුට වගේ සැලකුවේ... ඇත්තමයි..."

ඇය ඉකිබිඳිමින් කී කල ඔහුගේ දෙතොල'තර සානුකම්පිත මඳහසක් මතුවිය.

"ඇයි කුමාර...?" ඇගේ යොවුන් සිරුර වෙව්ලා ගියේ ය. ඔහු සිය ග්‍රහණය දැඩි කළේ ඇය සීතලෙන් පීඩා විඳින බවට වදරවා වටහා ගනිමිනි.



"කුමාර නං ඔයාට ලස්සනට කතා කරන්ඩ ඇති... නේද...?" ඔහු ඇය සිප ගනිමින් ඇසුවේ ය.

ඔහුගේ දෙතොලේ උණුසුමට ලොල් වෙමින් වුව ඇය සිය ප්‍රේමවන්තයා සිහි කළා ය.

"මාර ගස යට පතිතව තිබූ විදුලිපන්දමෙන් මලානික එළියක් විහිදිණ. හරියට සිහි විසංඥව සිටියෙකු සිහි ලැබ තදින් වැළඳගත් යුවළ දැක ගන්නට උත්සුක වූ මිනිස් දෙඇසක් හාත්පස කොතනකවත් නොදිළිණ. එහෙත් දියෙන් ගොඩට ආ දිය බල්ලෙකු මොහොතකට නැවතී ඔවුන් දෙස බලා සිටියේ ය. බල්ලෙකුට ද වඩා කුඩා මුගටියෙකුට වඩා විශාල බලල් මුහුනේ තෙත නැහැ පුඩු වේගයෙන් සලිත විය. මේ දැවැන්ත දෙපාවන් මඟහැර යා යුතු යැයි හදිසියේ තීරණය කළාක් මෙන් ඒ කාලවර්ණ උභය ජීවියා වහා පලා ගියේ ය.

එකිනෙකාගේ සිරුරේ උණුසුමට වසඟ වූවන්ට ඒ සර සරය නොඇසිණ.

# 15

ඉඳිකටුව හා නූල් බෝලය අතින් ගනිත්ම ඇය අබියස හැඩුවේ ද හීල්ලුවේ ද අවලාද නැගුවේ ද ඒ කුඩා මැහැල්ල යි. ඉරුණු ඇඳුම් එළලන්නට ඇය ඇතැම් දවසක පැය ගණනාවක් මිඩංගු කළා ය. ඇයට ද ඇගේ මිණිබිරියට ද ඒ හැටි ඇඳුම් කන්දරාවක් නොවූයෙන් ඇය වැඩි වේලාවක් අණ්ඩ ඇමුවේ මදුරු ඇලට ය.

වටිනා කියන විද්‍යුත් මෙවලමක් ගෙට ගෙනෙන කලෙක මෙන් සීතා මදුරු ඇල ඔසවා ගෙන ආවේ අතිශය ආඩම්බරයෙන් ඇපෙමිනි. ඇගේ මුහුණේ රැළි පවා මොහොතකට මැකී යන තරමට ඒ දෙතොල'තර හසරැල්ල පුළුල් විය.

"උඹේ ඇඟපත ගන්ඩ දෙයක් නෑ රෑ තිස්සේ මදුරුවෝ කාලා... මේ කට්ට කළු මං වගේ යැ උඹ පාටයි... කහ කැල්ල වගේ... ඉතිං මදුරුවෙක් කෑවත් ලේ පාටින් පේනවා.... මදුරු ඇලක් ගන්ඩෝනෑ කීයක් ගියත්..." යි සීතා නිතර දෙවේලේ තොල් මතුළා ය.

කුලියක් මලියක් කිරීමෙන් හා පොළේ යාමෙන් උපයන මුදලින් ඒ හපන්කම කළ නොහෙන බව අවබෝධ වූයෙන් ඇය කැටයක පිහිට පැතුවා ය. හැමදාම පාහේ ඒ කුඩා මැටි කැටයට රුපියල් විස්සේ නෝට්ටුවක් දමන්නට ඇය වග බලා ගත්තා ය. බොහෝ විට සිදුවූයේ කැටය අතුරුදහන් වීමයි.



"කොයි කැටේ?" යි ඇය මිණිබිරියගෙන් අසන්නේ අගනා මැණිකක් නැතිවූ කලෙක මෙන් විස්සෝපයෙනි.

"මං දන්නේ නෑ... මං දන්නෙ කොහොමද?"

ආශා කුරුම්බා ගෙඩිය පළා ලොද සූරා කමින් කියන්නේ නොසැලකිලිමත් අන්දමිනි.

"මේ ගෙදර ඉන්නෙත් උඹයි මායි විතරයි විච්චි කොට කැටේට මොකද වුණේ කියනෙක එක්කො උඹ එක්කො මං දැනගන්ඩෙපැයි..."

"මං දැක්කෙත් නෑ... මං ගත්තෙත් නෑ..."

මිණිබිරිය මුසා බස් කියන බව මිත්තණිය දනියි. ඇය කැටය කඩා කඩචෝරු කන්නට ඇතුවා නිසැක ය.

"උඹ දැක්කෙම නෑ මං එදා පොළෙං ගෙනා මැටි කැටේ?" සීතා විමතිය පළ කරයි.

"නෑ... නෑ... මං දැක්කෙ නෑ... ඉතිං මට තඩු දාන්න ද?"

ආශා මහ හඬින් කෑ ගසා අසයි.

"තඩු දාන්ඩෝනෑ උඹට නෙමේ. උඹේ අප්පට... තමුන්ට දාව උපන්න දරු පැටියෙක් මේ ලෝක ධාතුවේ එහා කෙළවරේ නෙමේ තමුන්ගෙ ඇහැට පෙනි පෙනී ඉඳිද්දිත් මේ මිනිහා යකෝ එක සීනි බෝලයක් ගෙනැල්ල දීලා තියෙනව ද...?"

සීතා දොස් පවරන්නේ වසන්ත බණ්ඩාරට ය. ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවට ගිය මහජන නියෝජිතයාට ය.

"හා හා එතකොට ඒ මිනිහද ගෙට පැනලා කැටේ හොරකං කෙරුවෙ...?" යි අසන කෙල්ල හඬ නගා හිනැහේ.

"උඹෝය හිනැහෙන්නෙ මොනවා දැනගෙන ද බං?"

සීතා අතක් නිකටේ හොවා ගනී. වැඩිවිය පැමිණුන කෙල්ලක මේ අයුරින් උස් හඬින් සිනාසීම නොහොබිනා බව කියාපාන්නේ ඒ ඉරියව්වයි.

"එහෙනං හෙට පත්තරේ වැටෙයි.... ටී වී එකේ නිවුස් වලටත් කියයි."

"මොකක් ද?"

මැහැල්ල අසන්නේ හැබෑම කුහුලිනි... සිනා සීමෙන් රත් පැහැ ගැණුනු යෞවන මුහුන මත ඇගේ විමසිලිමත් දෙනෙත නවතී.

"පළාත් සභා මන්ත්‍රීවරයා දුප්පත් ගෙයකට පැන කැටයක් සොරකම් කරයි..."

ආශා එක් මොහොතකට නිවේදිකාවක වෙයි. මේ ගෙපැලේ රූපවාහිනී යන්ත්‍රයක් නැතත් ඇය ඇතැම් දිනක මිත්තණිය සමඟ නිමලාවතීගේ නිවෙසට ගොස් රූපවාහිනිය නරඹයි. එහෙත් ළමිස්සියක ඉස්සර කරගෙන රෑ යාමයේ පාර දිගේ ගාටන්නට සීතා කැමති නැත. එහෙයින් ආශාට රූපවාහිනිය නරඹන්නට ඉඩ ලැබෙන්නේ ඉතා කලාතුරකිනි.

"හිටපංකො... මදුරු ඇලක් ගෙනාවා වගේ මං උඹට ටී.බී. එකකුත් ගෙනල්ලා දෙන්නංකො" යි සීතා පොරොන්දු වූයේ වරක් දෙවරක් නොවේ. ඒ පොරොන්දුව කනවැකෙන වාරයක් පාසා ආශා හිනැහෙයි.

"ඉතිං හිනැහෙනවා... ඇයි උඹ හිනැහෙන්නේ?"

සීතා ප්‍රශ්න කරන්නේ මහත් අසතුටිනි.

"මදුරු ඇලක් වගේ ද සීතම්මෙ ටී.වී. එකක්... කොච්චර ගණන් ද... කැට ඇලා ටී.වී. ගන්ඩ බෑ..."

මිත්තණිය පිළිබඳ ව අනුකම්පාවෙන් තෙත්ව ගිය හදින්ද හඬින් ද ඇය පවසයි.

"ඒ හිංදා තමා ගෙවන්ඩ ගන්නෙ... මිනී පෙට්ටිය ඇරුණාම අනෙක් ඕනෑම බඩකඩෙත්තුවක් දෙනවනේ ගෙවන්ඩ"

සීතා දළුලන කෝපයෙන් කියයි.

"ආං හරි... සීතම්මට තියෙන්නෙ දැං තියා මිනී පෙට්ටියට සල්ලි එකතු කරන්ඩ... නැත්තං ඉතිං ඕං මට නං සල්ලි නෑ මිනීපෙට්ටි ගන්ඩ... මං ඔය පරණ පැදුරක ඔතලා වල දානවා..."



ඒ කතාවට සීතාට අසූහාරදහසට නඟී.

"බලාගෙන ඉන්නෙම මං මැරෙනකං... අප්පේ මෙහෙමත් හතුරුකමක්... පූරුවේ ඉඳං පතා ගෙන එන වයිරක්කාරියක්..."

දැතින් හිසකේ සිඳිමින් වැහැරුණු ළමැදට පහර දෙමින් ද වැළපෙන මැහැල්ල නුදුටු ලෙසින් ආශා මඟහැර යයි.

ගෙපැළේ කොයි අහුමුල්ලක සැඟවූව ද මිණිබිරිය කැටය සොයාගෙන මුදල් සොරා ගන්නා බැවින් අන්තිමේ දී සීතා සිය මිතුරියගේ සහාය පැතුවා ය. දෙදිනකට හෝ තෙදිනකට වරක් නිමලාවතී වෙත යමින් අජීවි කැටය වෙනුවට සජීවි කැටයක් නිර්මාණය කර ගත්තා ය.

ජීවිතයේ කිසි කලෙකත් සතුටක් නොලද ගැහැනිය කෙරෙහි දයානුකම්පාවෙන් මඩනා ලද සිතින් නිමලාවතී එලෙස එක් රැස් වූ මුදල ආපසු දෙන කල ඊට තවත් මුදලක් ද එක් කරමින් මදුරු ඇලට සම්මාදම් වූවා ය.

මදුරුවන්ගේ දෂ්ටනයෙන් මිණිබිරිය රැක ගන්නට සමත් වූ සීතා දියණියගේ ප්‍රහාරය වලකාලන්නට අපොහොසත් වූවා ය.

"ගෙවල් දොරවල් ගං රටවල් ඇලා යන්ඩයි වෙලා තියෙන්නෙ... මේකි මැරුවත් හිත් වදී ද මේ කරන අසමජ්ජාති වැඩවලට..."

චාන්දනී ගිරිය පුම්බා ගනිමින් බැණ අඩ ගැසුවා ය.

"ඇයි? මොනව ද මං කෙරුවෙ...?"

වසර ගණනාවකින් සිය මව සමඟ එකදු වචනයක් හෝ කතා නොකළ කෙල්ල ප්‍රශ්න කළේ දළුලන කෝපයෙනි. දෙතුන් මසකට වරක් පැමිණෙන චාන්දනී නුදුටුවාක් මෙන් පසු වීමට පුරුදුව දුන් ආශා මේ මද්දහනේ සිය ගොළුවත බිඳ දැමුවා ය.

"තොත්ත බබා... මොකවත්ම දන්නෙ නෑ... අපෙ අම්මව බය කරගෙන තෝ නටන නාඩගං මං දන්නෑ කියල ද හිතන්නෙ?"

කෙසඟ ගැහැනිය කඩා පැන්නේ බයහීත වූ කුඩා දරුවා පිළිබඳ ව පවා නොසලකමිනි.

Scanned with CamScanner

"මං නටපු නාඩගමක් නෑ."

පොල් ගෝනියක් ඔසවාගෙන එන මිනිසා දෙස නෙතගින් බැලූ ආශා සිය හඬ පාලනය කරගත්තා ය. එහිලා වඩාත් බලපෑවේ දහදිය වැගිරෙන ඒ නිරුවත් උඩුකය නොව හැඩුම්බර මුහුණින් බලා ඉන්නා ඇගේ අර්ධ සොහොයුරා ය. තවම පස්විය සපුරා නැති පොඩිත්තාට ඇය කවර කලකවත් කාරුණික නොවූ බව සැබෑ ය. එහෙත් කුපිත වූ අම්මාගේ රළු සාමයේ එල්ලුණු කොළුවාගේ කඳුළු පිරි දෑස යවුළක්ව ඇගේ ඇඩි සිත සිදුරු කරයි.

"උඹ පලයං බලන්ඩ ආයෙ ඉස්ටේජ් ගානෙ විරිදු කියන්ඩ... මං උඹේ කෙස් වල්ලෙං ඇදගෙන එන්නෙ..."

සිය සිරුරේ මුළු මහත් ශක්තිය එක්රැස් කර ගනිමින් චාන්දනී කළ ඒ තර්ජනය නොසලකා හරින අවඥාබර සිනා බිඳක් ආශාගේ දෙතො'ල තර නැඟිණ.

'මොක ද මොක ද ඔය සද්දෙ?"

උරයේ පොල් මිදුලේ දැමූ මිනිසා අපේක්ෂා කළේ පිළිතුරක් නොව නිශ්ශබ්දතාවයකි.

"නෑ සිසිර මේකිට මොන දේසපාලනේ ද...? මේකිට තියෙන්නෙ ආයෙ සැරයක් විභාගෙට ලියන්ඩ නේද...?"

චාන්දනී සිය සැමියාගේ සහයෝගය පතා ඉක්මන් බැල්මක් හෙළුවා ය.

සිසිර සිය බිරින්දෑගේ දියණිය දෙස විමසිල්ලෙන් බැලුවේ ය.

ඇය ජෑම් ගස යට ලී කොටය මත හිඳගෙන සිටියේ එල්ලාගත් මුහුනිනි. හිඳ ගැනීමේදී කිසිවිටෙකත් සංවර නොවන කෙල්ලගේ දෙදණ නිරාවරණය වී තිබිණ. එහෙයින් ඒ අන්ධකාර මුහුනේ නොව ඒ පැහැබර දෙදණ මත ඔහුගේ තියුණු දෑස අතරමං විය. ඇය හැඳි කොට ගවුමේ කාල වර්ණය ඇගේ දෙපයේ පැහැපත් බව වඩාත් ඉස්මතු කරයි.

"ආසෝ... උඹ පලයං ගෙට..."



සීතා අණ කළේ ඇඩි හඬිනි. බෑණනුවන්ගේ දෙනෙත නැවතුණේ කොතනකදැයි දැකීමෙන් ඇය නොසන්සුන් වූවා ය.

"නැගිටිං... කිව්වහම ඉතිං ඔතනින් නැගිටිං"

ඒ මිණිබිරියට පමණක් නොව බෑණනුවන්හට ද කළ තර්ජනයක් විය. ඒ බව වටහාගත්තාක් මෙන් සිසිර හිස් උරය ගසා ඇමුවේ ය.

"විරිදු කියන කෙල්ල ගැන හැම තැනම හැම එකාම කතා වෙනවා... වැවට ගියත් ඔයට ගියත් මට දත්මිටි කාගෙන තමා ඉන්න වෙන්නෙ..."

සැමියාගේ අසංවර දෑස නොදුටු චාන්දනී තව දුරටත් බැන වැදුණා ය.

"ඇති ඇති... තමුසෙ දැං කට වහගන්නවා..."

සිසිර අණ කළේ මිත්තණියට අවනත වූ මිනිබිරිය දෙස බලමිනි. නැඟී සිටි ආශා කොතෙක් සුන්දර වී ඇයි කිවහොත් ඔහුගේ ළය ද යටිකය ද එක ලෙසින් ඇවෙන්නට විය. මේ පිරිපුන් යොවුන් සිරුරත් තම බිරින්දෑගේ කෙසඟ කයත් සසඳමින් ඔහු මහරු නිධානයක් අබිමුව යාචකයෙකු මෙන් විමතියෙන් ද සොම්නසින් ද වේදනාවෙන් ද පිරී ඉතිරී ගියේ ය.

"අපෙ අම්මට බෑ මේ බඩ්ඩ ආංබං කරන්ඩ..."

දියණිය ඉතා ඉක්මණින් ඉලන්දාරියෙකු සමඟ පලා යනු ඇතැයි සැකයෙන් පීඩා විඳිමින් චාන්දනී සිය මව වෙත චෝදනාත්මක බැල්මක් හෙළුවා ය.

"එහෙනං ඉතිං අපි එක්ක යං... ඔයාටත් ලේසියිනෙ. මේ ළමයා ඉස්කෝලෙ ඇරලන්ඩයි එක්ක එන්ඩ යි බෑනෙ ඔයාටත් ඔය ළමය හම්බ වුණාට පස්සෙ..."

ගෙතුළට රිංගාගන්නවා වෙනුවට ආශා ජෑම් කඩන්නට පටන් ගත්තා ය. කුඩා කොළුවා ඇයට කිට්ටු වූයේ සහෝදර ප්‍රේමයක ආස්වාදය විඳීමට නොව ජෑම් ගෙඩියක රස මිහිර පතාගෙන ය.

Scanned with CamScanner

"උඹ ආයෙත් බඩින් ද?"

සීතා ඇසුවේ නොමනාපයෙනි. චාන්දනී වෙත වූ යක්ෂාවේෂය අතුරුදහන් විය. ඇය හිස සැලුවාය.

"මේ ළමයට තනි නොතනියට සහෝදරයෙක් ඉන්ඩෙපැයි අම්මේ..."

"ඒ ළමයගෙ තනියට මේ ළමය ඉන්නෙ..."

සීතා අක්කා මලෝ දෙස බලා ගත්වනම තෙපළුවා ය.

"නෑ නෑ මට කිසි නෑයෙක් නෑ... මං ඔය එක එක්කෙනාගෙ තනිය මකන්නෙත් නෑ..."

ආශා සුසුරුදු උස් හඬින් කියා සිටියා ය.

"නෑයො නැත්තෙ කාට ද? මේ උඹේ අම්මා... අර උඹේ බාප්පා... මේ පුංචි එකා උඹේ සහෝදරයා... නාකි මං පැත්තකට දාපල්ලකෝ... උඹ තේන්නං ආසො මේ කවුරුත් බලාකියා ගන්නෝ නෑ වැඩිමලී හැටියට..."

ඉඳුණු ජෑම් ගෙඩියක් මුව තුළ ලා විකමින් ආශා තමාගේ සනුහරේ උදවිය දෙස බලා සිටියා ය.

"මට මං විතරයි..." යි ඇය වහා කීවා ය.

බාප්පා යයි කියනු ලබන මිනිසාගේ දෙනෙතේ දැල්වෙන රාගාග්නිය දැකීමෙන් ඇය අසන්තෝෂයට හෝ කෝපයට පත් නොවූවාය. කිසියම් ජයග්‍රාහී හැඟීමකින් මඩනා ලද කෙල්ල ඉහළ අතු අල්ලා පහත් කර ගන්නට උඩ පැන්නා ය. ජෑම් ගෙඩියක මිහිරට වඩා ඇයට උවමනා වූයේ සිසිරගේ දෑසේ ගින්න වඩා හොඳින් අවුළුවාලීමට ය. සැබැවින් ම ඇගේ පුලුළුකුළ ද පිරිපුන් ළය මඩලද උස් පහත් වන වාරයක් පාසා ඔහු ගිනි මැළයක ඇවිළුණේ ය.

"මටත්..."

බොළඳ හඩක් ඇගේ උද්දාමය උදුරා ගත්තේ ය. හැරී බැලූ කෙල්ල දුටුවේ බැගෑබර ඇස් දෙකකි.



"මටත් ජෑම් ගෙඩියක්..."

ඔහු කිසි කලෙකත් තමා වෙනුවෙන් සිනාවක් නොපෑ එකියකට ආයාචනා කළේ ය.

"මල්ලි..."

ඇගේ සිත හඬ ගෑවේ ය.

"මගේ මල්ලි..." යි දයාවෙන් සිතමින් ඇය ඉඳුණු ජෑම් ගෙඩි අහුරක් ම ඒ සිඟිති දෝත මත තැබුවා ය. ඒ සඳහා නැඹුරුවන කෙල්ල දෙස සිසිර අපමණ ආශාවෙන් බලා සිටියේ ය. ඇගේ පියයුරු යාම්තමට හෝ දැකගන්නට ලැබීම පිළිබඳ ව ඔහුගේ සොම්නස සීමා රහිත විය.

"අපිත් එක්කම ගියහැකි නෙ... ඉක්මට ලැස්ති වෙන්ඩ කියන්ඩකෝ..." යි බිරිඳට පැවසූ මිනිසා වත්ත පහළට ගමන් කළේ ය.

"ගනිං උඹේ රෙදි කඩමාළු ටික... යමං අපිත්තෙක්ක..."

චාන්දනී අණ කළේ රළු හඬිනි.

"උඹේ ඉස විකාර වෙලා ද චාන්දනියේ?"

සීතා වීත්තය තදකොට හදිමින් ඇසුවා ය. ඇය මිණිබිරිය වෙනුවෙන් අවසන් ලේ බිඳුව දක්වා සටන් වදින්නට සූදානම්ව සිටින බව පැහැදිලිව පෙනිණ.

"වෙන මොකද කරන්නෙ? අම්මට බැරිනං මේ මී හරකි මෙච්චල් කරන්ඩ අපි හරි ඒ ටික කරන්ඩෙපැයි."

මවගේත් මිත්තණියගේත් වාග් හරඹයට මැදිහත් වන්නට නොසිතන ආශා තවමත් ජෑම් ගෙඩි කඩයි. රත් පැහැයෙන් දිළිසෙන ඉඳුණු ජෑම් ගෙඩි සොයා ඇගේ දෙනෙත අත්තක් ඉත්තක් ගානේ දිව යයි.

"අර මනුස්සයා කැමති වෙච්ච එකම කොච්චර දෙයක් ද අම්මෙ... වෙන මිනිහෙක් නං එක්ක යයිද අනුන්ගෙ ළමයි?"

සීතා කටට ආ කුණු හරුපය ගිල ගත්තේ මිණිබිරිය නොව මුණුබුරා හේතු කොටගෙන ය.

Scanned with CamScanner

"ඒ මිනිහා මොකද කැමති නොවෙන්නෙ... උඹ දැක්කෙම නැද්ද ඒකා මෙකි ගිලින්ඩ වගේ බලාගෙන හිටපු හැටි?' යි අසන්නට තදබල උවමනාවක් පහළ වුවද ඇය අනෙකක්ම කියා පෑවා ය.

"මට මොකද...? උඹේ දෝණියන්දෑ විච්චි... කරදඬු උස් මහත් වුණාට පස්සෙ තමා කාට කාටත් ළමයි බමයි මතක් වෙන්නෙ... කොත්තමල්ලි වතුර පොව පොවා ඇඩි මෙති කොරද්දි නං හැරිලාවත් බැලුවෙ නෑ.." යි කියාගෙන ඇය මිදුලේ කොණක පොල්අතු ගොන්න අබියස හිඳ ගත්තා ය. ගෙට හෙවිල්ලන්නට නොව විකුණා ගන්නට පොල් අතු වියන්නට පුරුදු වූ මැහැල්ල නිබඳ වේදනා ගෙන දෙන දෙපය ද කොන්ද ද මුළුමණින් ම අමතක කර දැමුවා ය.

"මොක ද ආයෙ පොල් ගෙඩියක් විකුණාගන්ඩ කියලයි මං? මාළු කන්ඩ දහයක් පහලොවක් ඉතුරු කොරලා සේරම මුං ඇන්න යන එකේ මං පොල් අත්තක් හරි වියලා කීයක් නුමුත් හොයාගන්ඩෙපැයි..." යි කොඳුලේ අතැඟිලි සේම කඩිසර ඇගේ මුවයි.

"ආසා... ඉක්මං කරපං ඉතිං..."

ඇරියක වාගේ උඩ පනින ළමිස්සිය දෙස නොමනාපයෙන් බැලූ චාන්දනී නැවතත් අණ කළා ය.

"මං එන්නං... හැබැයි බාප්පා මාත්තෙක්ක යාළුවුණොත් මං බාප්පාත්තෙක්ක පැනල යනවා..."

දියණියගේ මුවින් ඒ සා නිර්දය හා නොහොබිනා කතාවක් කිසිසේත් අපේක්ෂා නොකළ ගැහැනිය අප්‍රමාණ පුදුමයෙන් මුව අයා ගත්තා ය. ඇයගේ දෑස පුළුල්ව ලැගුම් ගත් පිළිකුළ ද කෝපය ද මෙතෙකැයි කිව නොහැක.

"මොනවා?" යි ඇය උගුර යටින් කෑ ගැවා ය.

"හවුලෙ කෑඳත් ඕන්නෑ කියන්නේ... ඔයාට ඉතිං ළමයි දෙන්නෙක් එක්ක තව මිනිහෙක් හොයා ගන්ඩ වෙයි. ඉස්සෙල්ලා එක ළමයෙක් එක්කත් මිනිහෙක් හොයා ගත්තු එකේ දෙන්නෙක් එක්කත් හොයාගන්ඩ බැරි වෙන එකක් නෑ..." යි කියාගෙන ආශා සිය පුළුල් නිතඹ සලිත කරමින් ඇවිද ගියා ය.



"යසයි... කෙල්ලගෙ කටේ මසුරං දාන්ඩෝනෑ..." යි සිතා නිහඬව මිණිබිරියට ප්‍රශංසා කළා ය. මුව'ග නැඟි සිනාව සඟවා ගන්නට වෑයම් කළා ය.

මෝස්තර නිරූපිකාවක් මෙන් ළමැද හා නිතඹ උළුප්පාලමින් ගෙපැළ කරා ඇවිද යන දියණියගේ නාරි ලාලිත්‍ය මුල්වරට දකින්නාක් මෙන් ඇසිපිය නොහෙළා බලා හුන් චාන්දනීට සිහි එළවා ගන්නට තරමක කාලවේලාවක් ගත විය.

"වල් බැල්ලී..." යි ගිගිරූ ඇය පොළවේ පය ගසා සිටින දරුවා හෝ කුස හොත් කලලය හෝ බිඳකුදු නොතකා ආශා හඹා ගියා ය. ඇගේ දිගු වරලස ඇඩිව අල්ලා ගනිමින් ඇගේ ගමන නවතාලන්නට වැඩි ආයාසයක් නො දැරුවා ය.

"මොකක් ද තෝ ඒ කිව්වෙ...?"

හිසින් පැන නඟින වේදනාව ඉවසන්නට හෝ එය නොතකා හරින්නට වෑයම් කළ කෙල්ල සිහින් කෙඳිරියකුදු නොනැගුවා ය. පරාජය වන්නට සේම යටත් වන්නට ද ඇය කිසිසේත් කැමති නොවූවා ය.

"කියාපිය... මොකක් ද තෝ ඒ කිව්ව බලු කතාව?"

චාන්දනී ඇයට පහර දුන්නේ ඉසිලිය නොහෙන කෝපයෙනි.

"ඒක කියල ඉවරයි... හොඳට ඇහුණනෙ මං කියපු දේ. දැං මාව අතෑරපං..."

ක්‍රෝධයෙන් වෙව්ලුම් කන මේ කෙසග ගැහැනියගේ ගර්භාෂයේ පුරා නව මසක් තමා සැඟව හුන් බව මුළුමනින් ම අමතක කළ ආශා දත් සැපුවාය.

"තෝ මරලත් මදි" මට මේ කිව්ව කුප්ප කතාවට."

චාන්දනී නොනවත්වා පහර දුන්නාය. ශාප කළා ය. හඬා වැළපුණා ය.

Scanned with CamScanner

"දෙයි හාමුදුරුවනේ... මොන විනම්බෑසියක් ද මේ... ඔන්නොය කෙල්ල අතැරපං චාන්දනියෝ..."

සීතා ඔවුන් වෙත දිව ආවේ කෝපයෙන් ද ශෝකයෙන් ද උතුරා යමිනි. දියණියගෙන් ද මිණිබිරියගෙන් ද තමාට කිසිදු සැනසීමක් නැතැයි පසක් කර ගනිමින් ඇය "මොන කරුමයක් ද මේ.... අපුච්චියේ මෙච්චා ඇස් දෙකට පෙනි පෙනී ඉන්නවාට වඩා හොඳයි මං මැරිලා යනවනං..." යි විලාප දුන්නා ය.

"හා හා... මොකද මේ... මොකද මේ...?"

පොල් ගෝනිය බිම දැමූ සිසිර ගැහැනු පොකුර මැද්දට කඩා පැන්නේ ය. ඔහු අල්ලාගත යුතුව තිබුණේ ඔහුගේ බිරිඳ වුව ද ඒ සවිමත් දෑතට මැදිවූයේ ආශාගේ මනහර සිරුරයි.

"අතැරපං..." යි ඇය ඔහු ගේ ස්පර්ශය නොඉවසමින් කෑ ගැසුවා ය.

"අම්මේ අම්මේ..."

ගැහැනුන්ට ද මිනිසාට ද අමතකව ගිය කුඩා කොළුවා කඳුළු වගුරුවමින් ඉකි ගැසුවේ ය. ඔහු චාන්දනීගේ දෙපා වැළඳගත්තේ "අම්මේ අම්මේ" යි නොනවත්වා හඬ ගාමිනි.

"පොඩි එකත් බය වෙනවා... අනේ පිං සිද්ද වෙයි පොල් කඩාගත්ත නං උඹලා පලයල්ලා යන්ඩ..."

සීතා මේ මොහොතේ කම්පා වූයේ නොදරුවා පිළිබඳව ය.

"අතැරපං මාව..."

තවමත් ග්‍රහණය ලිහිල් නොකළ මිනිසා සමඟ පොර බදමින් ආශා මහ හඬින් කෑ ගැසුවා ය.

"මෙන්න මෙහෙ එනව යන්ඩ. ඕකි ඉස්ටේජ් ගානෙ විරිඳු නෙමෙයි රෙදි ගලවගෙන අමු හෙළුවෙන් හිටියත් මට මොකද... උපනුපන් ජාතිවත් මට හම්බවෙන්ඩෙපා මේ වගේ වරත්තු බැල්ලියක්..."



කෙළ පිඩක් බිම හෙළු චාන්දනී සිය සැමියාගේ අතින් ඇද්දා ය. එකෙණෙහි ආශා ගෙපැලට දිව්වා ය. සැනෙකින් ඒ කුඩා අඳුරු ගෙපැලේ සැඟව ගිය ඇගේ රූපකාය නැවත නැවත සිහි කරමින් මේ දැන් ඇගේ යෞවන සිරුරේ උණුසුම් ස්පර්ශය විසින් සිදූ මිහිරියාවෙන් මත්වෙමින් ඔහු බිරිඳට අවනත විය.

"දූවෙක් අම්මෙකුට කියන කතාවක් ද ඕකි ඒ කිව්වෙ... ඉදකිං... ඕකිගෙ කටේ හොරි හැදෙන්ඩ ඕන.... ඕකිට හොඳක් නං වෙන්ඩ එපා... අමාරුවේ වැටෙයි කියල බයේ හොඳක් කරන්ඩ හැදුවම ඕකි මායි මේ අහිංසකයයි පාරට බස්සන්ඩ හදන්නෙ... ඕකි බලාගෙන ඉන්නෙ මං පාරක් පාරක් ගානෙ හිඟා කනකං... ඕකිට මේ රටේ වෙන මිනිස්සු නැතේ..." පට්ට වේසි."

ඒ ගෙපැලේ එකම ඇඳ මත වැතිරුණ කෙල්ලට ඇසුණ පරිද්දෙන්ම මේ පැරණි ගෘහයේ ඉස්තෝප්පු පඩිය මත හිඳගත් කෙල්ලට ද ඒ හැවිල්ල ඇසෙයි.

ඇනෙන්නට කී කතාවක් ඒ සා තදින් විශ්වාස කළ මව කෙරෙහි උපදනා සියුම් කරුණාව ඇගේ මුව'ග මදහසක් නංවයි.

"මහනව ද හීන බලනවද?"

තවමත් ඉඳිකටුවට නූල දමන්නටවත් වෑයම් නොකරන කෙල්ල වෙත එමින් සඳුන් ඇසුවේ සරදම් සරිනි.

"නෑ... මට අම්මව මතක් වුණා..."

ඔහු මෙන්ම ඇය ද පුදුමයට පත් වූ වග පැහැදිලිව දිස් විය. එකිනෙකා දෙස අයාගත් ඇසින් බලා ගත්වනම ඔවුන් ඒ පුදුමය නොසඟවා පළ කළෝ ය.

"ඒ ගැනි... ඒ ගැනි"

අතීතය ආවර්ජනය කරන කල ආශා සිය මව හැඳින්වූයේ එලෙසිනි.

"ඇයි අම්ම කියන්ඩ බැරි?" යි කුමාර මෙන්ම සඳුන් ද ප්‍රශ්න කළේ නොරිස්සුමිනි.

Scanned with CamScanner

"අම්මෙක් නොවිච්ච ගෑනියෙකුට ගෑනි කියනවා මිසක් අම්මා කියලා කියන්නෙ කොහොම ද?" යි උඩඟු ලෙස ඇසූ කෙල්ල සිය ජීවිතයේ මුල්වරට " අම්මා" යි නොකීවේ ද? ඒ බවට එකම සාක්ෂිකරුවා වූ තරුණයා ඇය දෙස බලාගත්වනම සිටියේ ය. ඇගේ හිස පහතට නැමිණ.

"බොරුවට මහ මහ දඟලන්ඩ ඕන් නෑ... මං කලිං එන්නං... ටවුමට යං... ඇඳුමක් ගන්ඩ බැරියැ තෝරලා..." යි ඔහු යෝජනා කළේ ඇගේ මුහුනට නැඟි අසරණ අනාථ භාවයෙන් සසල ව ගිය හදිනි.

"ඔයා මොන බම්බුවට ද මට ඇඳුම් අරං දෙන්නෙ...?"

ඇය විගසින් සුපුරුදු යස්ස කෙල්ල බවට පරිවර්තනය වූවා ය.

"එහෙනං ඉතිං මහ ගන්නවා... මට මොකද..."

දයානුකම්පාව වියැකී ගියෙන් ඔහු කතා කළේ කෝපයෙනි.

"මහනවා තමා..." යි කී ඇය මසන්නට පටන් ගත්තා ය.

"මහන්නෙත් ඉතිං මංම අරං දුන්නු ඇඳුමක් තමා..." යි කියන්නට ගියද ඔහුගේ මුවින් ගිලිහුණේ සිනාවකි. කිසි කලෙකත් ඇඳුමක් එළලා නැති බව තහවුරු කරන්නේ ද ඇයම ය.

"ඔහොම ද ඕයි මහන්නෙ?"

ඔහු සිනාව අතරින්ම ඇසුවේ ය.

"එහෙනං කොහොමද මහන්නෙ?"

ඇගේ දෙකොපුල මත රත් පැහැයක් ඉහිරිණ. කෝපයෙන් ද විළියෙන් ද ඇළලෙමින් ඇය ඔහු දෙස රවා බැලුවා ය.

"පට ගාලා ඉඳිකට්ටට නූල දැම්මට තමුසෙ කවදාවත් මහල නං නෑ මීට කලිං..." යි කී සඳුන් මහ හඬින් හිනැහුණේ ය.

ඇය වඩාත් තදින් කිපුණේ ඔහු කීවේ සැබෑවක් බැවිනි.

"කොල්ලටත් කෙල්ලටත් දෙන්නට ම ඉන්නෙ උඹ විතරනෙ... උයන්ඩ පිහින්ඩ විතරක් නෙමේ පුතේ මහන්ඩත්



ඉගෙන ගනිං" යි කියමින් දයාසිලි සිය එකම පුත්‍රයාහට ගෙදර දොර වැඩපල කියා දුන්නාය. ඉඳිකටුවද නූලද කාන්තා හස්තයක පමණක් රැඳී තිබිය යුතුය යනුවෙන් ඇඳුනු ඉලන්දාරියෙකු වෙනස් කරන්නට ඇයට වැඩි කලක් ගත වූයේ නැත.

"කොන්දෙ කැක්කුම ඉවසන්ඩ බෑ පුතේ... හාල් හුණ්ඩුවක් ළිප තියලා පරිප්පු හොද්දක්වත් හදාපංකෝ... කරවල පැටියෙක්වත් කර කරලා ගත්තනං මදැයි වැඩිය මුකුත් නැතුවට අපි දෙන්නට" යි ඇය ඇඳේ වැතිරී කෙඳිරි ගාමින් කියන කල ඔහු නොසන්සුන් වෙයි.

"බෙහෙත් ගන්ඩ යං අම්මෙ... උයන්ඩ පස්සෙ බැරියැ"

ඔහුගේ බියමුසු බැල්ම දකින ඇය කෙඳිරිල්ල නවතයි.

"සුදුළූනු උළුහාල් ටිකක් තම්බලා බිව්වා... දැං අඩුවෙයි. හැබැයි ඉතිං ඩිංගිත්තක් සමහං වුණා කියලා ගැහෙන්ඩ ගත්තොත් ආයෙත් වැඩි වෙයි මේ ඉලව් කොන්දෙ කැක්කුම"

ඔහු වහා කුස්සියට වදියි. වැඩි වේලාවක් ඉක්මයන්නට පෙර ඇගේ නැහැපුඩු බතක හොද්දක සුවඳින් පිරී යයි. ඇගේ දෙතොල්'තර සිහින් සිනාව ඇය විශිෂ්ට නිළියක බවට සේලම් කියයි.

"කොල්ලාට ඉඳිකටුව හා නූල හුරු කරන්නට ද ඇය එ'පරිද්දෙන් ව්‍යාධියක වේදනා මවා පෑවා ය.

"මං ඉන්නකං හැම දේම අතට පයට කරලා දුන්නා වගේ නෙමේ හදිස්සියේ හොස් ගාලා හුස්ම ඩිංග ගියදාක කොල්ලා අනාත වෙනවා නේද...?" කිසි දෙයක් කර කියාගන්ඩ බැරුව තටමද්දි ඕකා මට පළි ගහයි. ගෑනු ගත්තත් ඉතිං තමුං බතක් හොද්දක් උයා පිහාගන්ඩ තේ කෝප්පයක් වක් කොරගන්ඩ ඉරිච්ච ඇඳුම කැඩුමකට අණ්ඩයක් දාගන්ඩ පුරුදු වෙනේක නරකයැ..." යි ඇය තොල් මතුරන්නේ සිය පුත්‍රයා මුසා බසින් රැවටීම පිළිබඳ ව සිත පෙළන පසුතැවිල්ලෙන් මිදීම පිණිස ය.

'අනේ අනේ ගෑනු ළමයෙක් වෙලත් වාටි මැස්මවත් මහගන්ඩ බැරි හැටි.."

Scanned with CamScanner

සඳුන්ගේ සිතාව නොරිස්සූ කෙල්ල ඇකය මත වූ ඊ ඊටය මෙන්ම අතැඟිලි අතරේ රැඳි ඉඳිකටුව හා නූල් බෝලය ද මිදුලට විසි කළා ය.

"ඒ මොකද්ද කෙරුවෙ?"

ඔහු අඩක් විමතියෙන් ද අඩක් කෝපයෙන් ද ඇසුවේ ය.

ඇය නැඟී සිටියා ය. ඔහුට මුහුනලා හිට ගත්තා ය.

"ඔව්. මට මහන්ඩ බෑ තමා. මම මහන්ඩ දන්නෙ නෑ... මම කවදාවත් මහලත් නෑ..."

"එහෙනං මහ ලොකුවට ඉඳිකටු නූල් ගේන්ඩ කිව්වෙ."

ඇගේ ඇසින් ගිනි පුපුරු විහිදෙන්නට පටන් ගත්තේ ය.

"ඇඳුමක් ගන්නවට වඩා ඉඳිකට්ටයි නූල් බෝලෙයි ගන්නෙක ලේසි හිංදා... තමුසෙ දුක් මහන්සි වෙලා හොයන සල්ලි වියදං කරන්ඩ ලෝබ හිංදා... ඉරිච්ච එක කොහොම හරි මහගෙන අඳින්ඩ හිතාගත්තෙ කවදත් මට ඇඳුම් තුන හතරකට වඩා තිබ්බෙ නැති හිංදා... පුංචි කාලෙ එක ජංගියක් හෝදලා වේලෙනකං මං හෙළුවෙං ඉඳල තියෙනවා... ටික ටික ලොකු වෙනකොට සීතම්මගෙ යටසායක් ඇන්දුවා මට. ඒක හුඟක් දිගයි. ඒක ඇඳගෙන ඇවිද්දොත් සාය පෑගිලා වැටෙයි කියලා මට වාඩිවෙලාම ඉන්ඩ වුණා... මං හිඟන්නියක් වගේ ජංගිය හරි ගවුම හරි වේලෙනකං බලං ඉන්නකොට මගේ තාත්තා කියන මිනිහා පළාත් සභාවෙ ලොකු ලොකු කතා කියනව. මගේ අම්මා කියන ගෑනි හම්බවෙන්ඩ ඉන්න ළමයට ලස්සන චූටි ගවුම මහනවා..."

ඇගේ හඬ බිඳිණ. ඔහු ඇගේ දෙවුර මත දෑත තැබුවේ අපමණ දයානුකම්පාවෙනි. ඒ දෑත ගසා දැමූ ඇය ගෙතුළට වැදුණා ය. ඔහු මහත් ළතැවුලින් හේබායමින් සුසුමක් හෙළුවේ ය.

# 16

කුඩා නගරයේ අඳුරට හා අසෝබනත්වයට සපුරා පටහැනි අන්දමින් ඇය ප්‍රීතිමත් මුහුනින් පසුවූවා ය. ඇය සමඟ ගමන් කරන තරුණයා වෙත වූ සැහැල්ලුව සාප්පු හිමියා විසින් අඩ පැයකට පෙර උදුරා ගත් සෙයකි.

"ගෑනුන්ගේ ඇඳුම් මෙච්චර ගණන්ද...?" යි ඔහු තමාගෙන්ම ප්‍රශ්න කළා විනා ඇගේ කනට නොකොඳුරන්නට වගබලා ගත්තේ ය. ඇය අත එල්ලෙන ඇඳුම් බෑගය විසි කර දමා මහ හඬින් බැන වදින්නට පවා පසුබට නොවන බව ඔහු දනියි.

"මාර නෝන්ඩිය ටවුම මැද්දෙ බෙරිහන් දුන්නොත් එහෙම" යි ඔහු සිතුවේ ඇය කෙරෙහි අප්‍රසාදයෙන් නොවේ. බෝම්බයක් බඩ බැඳගත්තෙකු මෙන් තමා ප්‍රවේසම් විය යුතු බවද ඔහු දැන සිටියේ ය. වහා පුපුරා යා හැකි යමක් සමඟ පසුවන්නෙකු තුළ නිතැතින් හට ගන්නා බිය සැක හා අවිනිශ්චිතබව ඔහුගේ දිගැටි මුහුනේ ද නොමඳ ව ගැබ්ව තිබිණ.

ඇයට ආගක්ත වන අතරේම ඇය සමඟ ගෙවන ජීවිතයෙන් හෙතෙම හෙම්බත් වෙයි. ඉකුත් රැයෙහිද ඇය ඇගේ පෙම්වතා, මිත්තණිය හා බාප්පා පිළිබඳ ව බොහෝ දෑ පැවසුවා ය. එය අතීතාවර්ජනයක් මෙන්ම ආරක්‍ෂක උපක්‍රමයක් ද විය. ඇය තුළ යම් බියක් හට ගන්නේ නම් ඒ ඔහුට ද නොව ඔහුගේ දෙපා අතරේ එල්ලෙන ඒ අසෝබන හා සීතල හපුයියාට ය. ඇගේ මිත්තණිය එය හැඳින්වූයේ ඒ නමිනි.

"සීතලේ වකුටු බකුටු වෙලා හිටියට මොකද කොයි වෙලාවෙ මෝල් ගහ වාගේ කෙළින් වෙලා හපා කයිද දන් නෑ... උඹ ආසෝ හොඳට මතක තියාගනිං ඔය හපුයියගෙං පරිස්සං වෙලා ඉන්ඩ. ආයෙ මං කිව්වෙ නෑ කියනවා එහෙම නෙමෙ ඕං..."

ඉසදිය වක් කරන අතරතුර ඒ කුඩා අපියකරු මැහැල්ල කොතරම් තදබල ලෙස අවධාරණය කළේ ද යත්, ඇරියගේ සියළු සතුරන් පරයා මුල් තැනට එන්නට ඒ හපුයියා සමත් විය.

අතොරක් නැතිව සිප වැළඳගත්ත ද කුමාරගේ අතට මෙන්ම දෙතොලට ද ආශාගේ ගෙලෙන් පහළ තහනම් අඩවියක් විය. ඔහු නොයෙක් වර ඒ පිළිබඳව සිය අසතුට පළ කළේ ය.

"ඇයි? ඔයාට මාව පොඩ්ඩක්වත් විශ්වාස නෑ නේද...? මට අල්ලන්ඩවත් දෙන්නෑ..."

ඇය අතකින් අවුල් හිසකේ පිරිමදිමින් ගෙපිළට යයි. පිල් කණ්ඩිය සුරක්ෂිත බව ඇය දනියි. ඔහු කොතෙකුත් තැත් කරන්නේ ගෙපැලේ අඩ අඳුරේ ඇය සමඟ තනිවන්නට ය.

"මොක ද ඔච්චරටම මාව සැක?"

නොසන්සිඳුණු ආශාවෙන් පීඩා විඳින තරුණයා ගෙපිළේ ප්ලාස්ටික් පුටු දෙකෙන් එකක් මත හිඳගනියි.

"උඹයි මායි බලන්ඩ එන එකෙක් නං නෑ තමා මේ ලෝක ධාතුවේ. ඒ වුණාට ඉතිං එහෙමයි කියලා පුටුවක් නැතුව පුලුවනෑ. තිබ්බ පුටු කබලත් කැඩිලා ගිය එකේ ඕං ආසෝ මං ප්ලාස්ටික් පුටු දෙකක්ම ගත්තා."

තද දුඹුරු පැහැ පුටු දෙක දෙස කෙල්ල හෙලුවේ නොසැලකිලිමත් බැල්මකි.

"අපරාදෙ සල්ලි"

මිණිබිරියගේ ප්‍රතිචාරයෙන් කිපෙන මැහැල්ල දොස් පවරන්නට පමා නොවෙයි.



"කීයක් ගියත් ඉතිං උවමනා දේ ගන්ඩම එපැයි. නිමලියාට නං පුටු ඕන්නෑ ඉඳගන්ඩ. ඒ වුණාට අර තඩි ගෑනි විඩේකට ටී වීල් එකෙං බැහැල එනවනේ. මයෙ ඇස් දෙකට පේන්ඩ බෑ තමා ඒ විංචිමානවිකාවි. ඒත් ඉතිං හතුරෙක් වුණත් ගෙට ගොඩවුණාට පස්සෙං පහු රජෙකුට වාගේ සලකන්ඩ එපායැ..."

මිත්තණිය කුපිත කරවන යමක් නොකියන ආශා දකින්නේ කුමාරගේ පෘෂ්ඨීමත් සිරුරයි. තමාගේ හද දිනූ දේවදාසයා හේතු කොටගෙන ඇය පුටු දෙකක් හෝ මිලදී ගන්නට කල්පනා කළ මැහැල්ලට සිත යටින් ස්තුතිවන්ත වූවා ය. එහෙත් සිනා උදෙසා තුනිබර මඳහසක් හෝ පාන්නට තරම් කාරුණික නොවූ කෙල්ල

"මෙයාට සල්ලි වැඩි වෙලා... මං ඉල්ලුවොත් නං ඉතිං නැතිවාදම තමා..." යි හෙලා දකියි.

සුපුරුදු අවිනීත ඉරියව්වෙන් පසුවන රූබරිය තරුණයා වෑයමෙන් වඩවා ගත් සංයමය බිඳ දමයි.

"කිරියම්මා දැංම එන එකක් නෑ නේද?" යි ඔහු අසන්නේ අනුරාගයෙන් සැලෙන හඬිනි.

"ඇයි නැත්තෙ... දැං එනවා"

ඔහුගේ අභිප්‍රාය වටහා ගන්නා ඇය සිනා පැමිණෙන වේලාව නිශ්චිතව දන්නා බව අවධාරණය කරයි. එහෙත් නිමලාවතී සමඟ දේවාලයට ගිය මැහැල්ලට කාලය පිළිබඳව හැඟීමක් නැත්තේ ය. දෙවියන් වෙනුවෙන් වතාවත් කළ යුතු දේව දාසයා තමාගේ ගෙපැලේ අනුරාගයෙන් දැවෙන වග ඇය කිසිසේත්ම අනුමාන නොකළා ය.

"ඇයි ඔයා ඔච්චර බය?"

කුමාර අසන්නේ නොමනාපයෙනි. බාධා කරන්නට කිසිවෙකු නොමැති ගෙපැලක හුදෙකලාවෙන් පල ප්‍රයෝජන ගන්නට නොදන්නා අනුවණ කෙල්ලට දොස් පවරන්නට තරම් ඔහු ගේ දිව රළු වේ.

"මං...? මං කාටවත් බය නෑ..."

Scanned with CamScanner

ආශා හිස ගස්සා උදාරම් බැල්මක් හෙළයි.

"මොකද නැත්තෙ... ඔයා මට බයයිනෙ..."

ඇගේ දෑස ඔහුගේ යටි කය මත නවතී.

ඇය ඔහු වෙත හෙළන්නේ දඟකාර බැල්මකි.

"මං බය ඔයාට නෙමේ මෙයාට" යි කියාගන්නට පොපියන දෙතොල මෝදු වන හිනා මල් පොහොට්ටුව වියළා දමන්නේ අනපේක්ෂිත ආගන්තුකයෙකි.

"ගෙපිළේ ඉලන්දාරියාද පිල්කණ්ඩියේ ළමිස්සිය ද දුටු සිසිර කෝපයෙන් පුපුරා හැළුණේ ය.

"කොයි කිරියම්මා?"

ඔහු ඔවුන් අතරට කඩා පැන්නේ ද ප්‍රශ්න කළේ ද මහත් නොඉවසිල්ලෙනි.

"ඇයි මොකට ද?"

ආශා සිය මවගේ විවාහක පුරුෂයා දැක තැති නොගත්තා ය. එහෙත් කුමාර වහා අසුනින් නැගී සිටියේ ය.

"තමුසෙ කව්ද? මෙහෙ මොක ද කරන්නෙ?"

සිසිර එක එල්ලේ තරුණයා දෙස බැලුවේ ය. කය වෙහෙසා වැඩපළ කරන වගක් විද්‍යාමාන නොවන ඒ ශරීරයේ සුකුමාර බව මිනිසාගේ කෝපය දෙගුණ තෙගුණ කරවයි.

"එයා ආවෙ යන්තරයක් දාන්ඩ..."

ආශා පිල්කණ්ඩියෙන් බසින්නට අදහස් නොකළා ය. ඇගේ ගවොම් සාය ඉහළට එසැවී නිරාවරණය වන දෙදණ ද දෙකලවා ද සිසිර ගේ කෝපයට අනුරාගයද මුසු කරයි.

"කාටද?"

"කාට වුණත් ඔයාට වැඩක් නැනේ... පොල් පැහිලද බලන්ඩ ආව නං බලල යනේකයි ඇත්තෙ"



නින්දාවට ලක් වීමේ අවමානයට වඩා ඔහු සිත හටගත්තේ එක්තරා සතුටකි. ඇගේ ඒ නිර්දය කතාවේ අඩංගු එකම එක වචනයකින් ඒ සා සතුටක් අත්පත්වූ වග ඔහුට ද අදහාගත නොහැක.

"ඔයාට..."

මේ යව්වනියගේ ඒ ආමන්ත්‍රණය කොතෙක් සිත් ගත්තේ ද කිවහොත් ඔහු මඳකට සන්සුන් විය.

"මං ආවෙ පොල් බලන්ඩ නෙවේ"

"එහෙනං?" යි ඇසුවේ ඇගේ නිල් නුවන් ය.

"අම්මට ටිකක් සනීප මදි. ඔයාව එක්කරගෙන එන්ඩ කිව්වා"

ඔහුද කවදාවත් නැතිව ඒ මෘදු ආමන්ත්‍රණයේ පිහිට පැතුවේ ය.

"මං දොස්තර කෙනෙක් යැ..." යි ඇය නොසැලකිලිමත් ලෙස පැවසුවා ය.

කුමාර මුළුමනින් ම අමතක කර දැමූ සිසිර අහංකාර අංගනාව වෙත ළං විය. තරුණයා නැවතත් අසුන් ගත්තේ කළ හැකි අන් යමක් නොවූ බැවිනි.

"අම්මට ටිකක් අමාරුයි ආශා..."

ඔහුගේ නිවැරදි උච්චාරණය පිළිබඳ ව ඇය සතුටට පත් වූවා ය. අම්මාවත් මිත්තණියවත් තමාගේ නම නිවැරදිව උච්චාරණය නොකරන වග ඇය දැන සිටියා ය.

"ඉතිං...?"

ඔහු බැගෑබර බැල්මක් හෙළුවේ ය.

"ඉක්මනට ලෑස්ති වුණා නං හොඳයි... පොඩි එකා අලා යන්ඩ කෙනෙකුත් නැනේ..."

ඇගේ දෑස ඔහු ගේ ශක්තිමත් ශරීරය පසු කොට ඒ සුකුමාර කුමාර වෙත ගමන් කළේ ය. ඔහු පුටුව මත හිඳගෙන ඉන්නේ

Scanned with CamScanner

උලක් උඩ ඉන්නා කලෙක මෙන් අපහසුවෙන් බව ඇය වහා වටහාගත්තා ය. ඒ මුහුනේ පැහැබර බව අකා මකා දමන්නේ හුදු ඊර්ෂ්‍යාවදැයි සිතන්නට ඇය නොවෙහෙසුණා ය.

"මං මොකට ද අනුන්ගෙ පොඩි උං බලන්නෙ... ළමයි හැදුවනං බලාගන්ඩ දැනගන්ඩෙපැයි..."

සිසිර තවත් පියවරකින් ඇයට ළං විය.

"ඇයි ඔහොම කතා කරන්නෙ? ඒ ඔයාගෙ සහෝදරයනෙ..."

ඒ වගක් මුල් වරට ඇසූ පරිද්දෙන් ඇය විස්මිත බැල්මක් හෙළුවා ය. ඒ දෙනෙතේ දීප්තියෙන් ද අලංකාරයෙන් ද ඔහු වසඟ විය. ආගන්තුකයෙකු සමීපයෙහි පසුවන බව නොසලකා මේ සුන්දර යුවතිය වැළඳගන්නට පවා ඔහුට සිතිණ.

"ඇත්තට? ඒ මගෙ සහෝදරයද? හොඳ වෙලාවට මතක් කළේ..." යි විමතිය පාමින් ඇය පිල් ගැට්ට මතින් බිමට බැස්සා ය. සලිත වූ ළයමඩල මත නැවතුණු පිරිමි ඇස් හතරක් අපමණ ආශාවෙන් ද අනුරාගයෙන් ද හැකිළී ගියේ ය. ඇයට උවමනා වූයේ ද එයම ය. ඇය ඉන් ලද්දේ බලවත් තෘප්තියකි.

"පරක්කු වෙනවා... අම්මට ටිකක් අමාරුයි ආශා..."

සිසිර නොඉවසිල්ලෙන් හඬ ගෑවේ ය. අත පොවන මානයේ සුපිපි කුසුමේ රොන් උරන්නට කැදර වූ බඹරෙකු සිහිපත් කරන මිනිසා දෙස කුමාර මහත් උවමනාවෙන් බලා සිටියේ ය. තමාගේ පෙම්වතිය ඔහු සමඟ යාමට කැමැත්ත පළ කරනු ඇත්දැයි ඔහු බියෙන් ද වේදනාවෙන් ද කෝපයෙන් ද කැළඹෙමින් කල්පනා කළේ ය.

"අමාරු නං ඉස්පිරිතාලෙ ගෙනියන එකනෙ තියෙන්නෙ"

නොසැලකිලිමත්කමින් කිපුණු මිනිසා ඇගේ අතින් ඇද්දේ ය.

"මං මෙච්චර වෙලා හොඳිං කිව්වා..."

ඔහුගේ තර්ජනාත්මක බැල්මෙන් ඇය බිඳකුදු නොසැලුණා ය. එහෙත් ඇගේ පෙම්වතා වහා නැගී සිටියේ ය.



"අමුතු ලැස්තියක් ඕන් නෑ... යං... මට මෙතන උඹ හුරතල් කර කර ඉන්ඩ වෙලාවක් නෑ... අර ගෑනි අරහෙ මැරෙන්ඩ යනවා..."

සිසිර ගේ හඬ උස් විය. ක්‍රෝධයෙන් සැලුණේ ය.

"ඉතිං මැරිච්චදෙං... මට මොකද..."

ඔහුගේ ග්‍රහණයෙන් ගැලවෙන්නට වෑයම් කරමින් ඇය ද උස් හඬින් ඇසුවා ය.

"ඒ උඹේ අම්මා..."

සිපගන්නට නොව සෙමින් විකන්නට පවා සිතෙන තරමට රුවැති දෙතොල සරදම් සිනා බිඳකින් අසෝබන විය.

"මගෙ අම්ම නං ඉන්නෝනෑ මාත් තෙක්ක මේ ගෙදර... ඔය කොහෙවත් ඉන්න ගෑනියෙක් කොහොමද මගෙ අම්ම වෙන්නෙ...?"

"කට වහපං" යි ගිගිරූ මිනිසාගේ සුරත ඇගේ කොපුලක් මත පතිත විය. එකෙණෙහි කුමාර ඔවුන් වෙත කඩා පැන්නේ ය.

"අතාරිනවා ඔය ළමයව"

වේදනාවෙන් ඇඳිරි වූ ඇගේ දෙනයන එකිනෙකා සමඟ පොර බඳන මිනිසා සහ තරුණයා නොදුටුවේ ය.

ඇය මුගුරකින් පහර කෑ සැපින්නක පෙණ ගොබය පුප්පා දෂ්ට කරන්නට සැරසෙන්නාක් මෙන් සිසිරගේ ඇඟේ එල්ලුණා ය.

"පර බල්ලා..."

ඒ සා සුන්දර මුවකින් ඒ සා රළු පරළු වදනක් ගිලිහෙනු ඇතැයි කිසිසේත් අපේක්ෂා නොකළ මිනිසා තිගැස්සුණේ ය. අතුල් පහරකින් ඇය කීකරු කර ගන්නට පිළිවන් වන බවට ඔහු තුළ වූ විශ්වාසය බිඳ වැටිණ. කඳුළ වෙනුවට ඇගේ දෑසේ එක් රොක් වූයේ ක්‍රෝධයයි. ගිනි පුළිඟු දිලෙන ඒ ඇස් ඔහු ගේ ආත්ම විශ්වාසයද ආත්ම ශක්තිය ද දවා හළු කරයි.

Scanned with CamScanner

"තොගේ ගෑනි ලෙඩ වුණාට මං පළිද? තොගේ ළමයා බලාගන්ඩ වැඩකාරියක් ද මං...? අඩ ගහපු හැටියෙ දුවල එන්ඩ මං කව්රු කියල හිතුව ද?" යි එක දිගට ප්‍රශ්න කරමින් ඇය ඔහුට පහර දුන්නා ය. පෙරළා පහර දිය හැකිව තිබුණ ද ඔහු ඇගේ ප්‍රහාරයන් වැලැක්වීමට තැත් කළා පමණි. ඇය මේ තරම් දැඩි ලෙස කුපිත වනු ඇතැයි නොසිතූ, ඇගේ කෝපාග්නියේ තරම මින් පෙර නොදුටු මිනිසා වික්ෂිප්තව සිටියේ ය. කරබා ගෙන ගුටි කන ගැහැනු මිසක පෙරළා පහර දෙන ගැහැනියක කිසි කලෙකත් දැක නොතිබුණෙන් ඔහු ගේ පුදුමය සීමා රහිත විය.

"එපා... එපා..."

සිය පෙම්වතියගේ පහර දීමෙන් ආගන්තුකයා බේරා ගන්නට කුමාර වෙහෙසුණේ ය.

"කිච්චහම අහල අන්න අහට්ට යන්ඩ කුමාරි..." යි ඔහු ඇයට තරවටු කළේ ය. එහෙත් ඔහු තමා ගේ පෙම්වතා බව ඇයට මේ මොහොතේ දී සිහිපත් නොවීය. ඇය කොතෙකුත් පෙරට පැන්නේ මේ දැන් පරම සතුරු වූ මිනිසාට පහර දෙන්නට ය. එහි ලා ඇගේ දිගු අතැඟිලි අග නියද මුවෙහි කදිම දත් දෙපෙළද මහෝපකාරී විය. එක් මොහොතකදී විෂඝෝර හැපින්නක වූ ඇය ඊළඟ මොහොතේ බුරා හැලෙන උමතු බැල්ලක වූවා ය.

"මං තෝ මරනවා... තොට ළමයෙක් හිටියට තොගෙ ගෑනිට තව ළමයෙක් හම්බවෙන්ඩ හිටියට මට කමක් නෑ..."

ඇය නොසරුප් බසින් පවා ඔහුට බැන වැදුණා ය. කල් කදුරු තිත්ත ඒ කුණුහරප කන වැකෙන කල කුමාර දැඩි අපහසුතාවයට පත් විය.

"යන්ඩ යන්ඩ..." යි කියමින් ඔහු සිසිර තල්ලු කර ඇමුවේ ය.

"යන්ඩ? මට යන්ඩ කියන්ඩ උඹ කව්ද? මං මේකිගෙ බාප්පා..."

කුමාරගේ ඇතට මැදි වූ ආශා "අම්මෙක් අප්පෙක් නැති මට කොහෙංද බාප්පලා... පව කෙළින්නැතුව පලයං යන්ඩ..." යි කෑ ගැවා ය.



"හොඳයි... මං උඹට පෙන්නන්නං මං කව්ද කියලා. වැඩි දවසක් යන්නෑ... බොහොම ඉක්මණට උඹ හිඟන්නියක් වගේ මගේ පස්සෙං එයි... බලපං එහෙම වෙන්නැද්ද කියලා... මං දන්නවා උඹේ ඔය ලොකුකම නැති කරන්නෙ කොහොමද කියලා..."

සිසිර ගෙපැලෙන් බැස්සේ දබරැඟිල්ල අමෝරා තර්ජනය කරමිනි.

"ඇයි? උඹ මට මොනව කරන්ඩද? මගෙ අස්සයට වෙඩි තියන්ඩද?"

කුමාරගේ අත් අඩංගුවේ සිටියදී පවා ඇය මහා හඬින් ඇසුවා ය.

"බලාගෙන හිටපං... මොකද ආයෙ හැම තිස්සෙම ඉන්නවැයි උඹට මුරට කට්ටඩියෝ. අර නාකිච්චිත් මගෑරලා යනවනෙ යකෝ" එක එකා ගෙට රිංගනකොට."

දේව ආසයා අවුස්සන්නට ඒ කතාව සෑහිණ.

"නොදන්න දේවල් කතා කරන්ඩ එපා... මං ආවෙ ගුරුන්නාන්සෙ මාමගෙ පණිවිඩේකට."

එය මුසාවක් ද නොවී ය. යන්තරයක් ඇමීම සඳහා ඇවැසි කළමනා මෙන්ම ඊට සරිලන ගාස්තුවද සූදානම් කරගන්නට සිතා සමත්ව සිටියා ය. සුපුරුදු පරිදි නිමලාවතී සම්මාදම් වූවා ය. අසරණ මිත්තණියට හා මිණිබිරියට උපකාර කොට එක්රැස් කරගන්නා කුසල් සම්භාරයෙන් තමාට දෙව් මිනිස් සැප සම්පත් නොඅඩුව ලැබෙන බව ඇය විශ්වාස කළා ය. ලොකු හාමුදුරුවෝ නිතර අනුශාසනා කරන්නාක් මෙන් දෙව්මිනිස් සැප කෙළවර අමාමහ නිවන් සම්පත්තිය පිළිබඳව ඇය ඒ හැටි නොතැකුවා ය. දිව්‍යාංගනාවක් වීම ඇගේ පරම පැතුමයි. ඒ සඳහා මැහැල්ල ද ළමිස්සිය ද ඇයට ඒ දණ්ඩකි.

"අනේ නිකං පලයං යන්ඩ... නාකිච්චි නැති වෙලාවක් බලල ගෙට රිංගගෙන මෙතන මට මොත්තෙ දාන්ඩ හදනවා..."

Scanned with CamScanner

සිය මනහර සිරුරේ සියළු ශක්තිය එක්රැස් කරගත් කෙල්ල කුමාරගේ ග්‍රහනයෙන් මිදුණා ය. ඇය ගෙමිදුලට දිව ගියේ මුර බුරා ඇවිලෙන ගිනිමැළයක් සේ ය.

"පල... පල... යන්ඩ..."

සියළු රූසිරි අතුරුදහන්ව ප්‍රාදූර්භූත වූ යක්ෂණිය දෙස සිසිර හෙලුවේ ඉක්මන් බැල්මකි. කවර දැසක් වුව ඇගේ රකුසු වෙස දකින්නට පැකිළෙනවා නිසැකය.

"යනව තමයි. මං ආයෙ මෙතන පැළවෙන්ඩ ආවෙ නෑ.."

"තව එක සැරයක් අර කඩුල්ල පැන්නොත් මං තොට කොටන එක කොටනවා"

"එච්ච කොහෙද... උඹ ඔහොම උඩ පැන්නට උඹට ඇති දෙයක් නෑ... අර නාකිච්චි මැරිල ගියාම මෙච්ච අයිති වෙන්නෙ චාන්දනීට. ඒකි උඹේ අම්ම නෙමෙයි කියලනෙ උඹ හැම තිස්සෙම කියන්නෙ... ඉතිං එහෙමනං උඹට මොන අයිතියක් ද?..."

"තොපි බලාගෙන ඉන්නෙ සීතම්මා මැරිච්ච හැටියෙ මාව එළවන්ඩ ද? ඒක නං ටිකක් අමාරු වෙයි..."

මෙවර අවඥාව වෑහෙන සිනාවක් නැගුණේ ඔහුගේ මුවගේ ය.

"හිටපංකො... උඹේ ඔය ලොකුකං මං නැති කරන්නැද්ද කියල බලපංකො..."

ඇයි? උඹ මට මොනව කරන්ඩ ද?"

"උඹට කරන දේ කියල වැඩක් නෑ... ඒක මං කරල ම පෙන්නන්නං..."

ඇය පෙරට පැන්නේ ඔහුට නැවතත් පහර දීමේ තදබල උවමනාවෙන් මඩනා ලද සිතිනි. එහෙත් කුමාර ඇය අල්ලා ගත්තේ ය.

"ඔව් ඔව්... තෝ දන්නෙ ඔච්චරනෙ... හිතන්ඩ එපා තොගෙ මෝල්ගහෙං මාව මට්ටු කරන්ඩ... මං තෝ මරාගෙන මැරෙනවා..."



ඇය ඉහවහා ගිය ක්‍රෝධයෙන් දත් සැපුවාය.

"තොට නං අමුතුවෙං කොරන්ඩ දෙයක් නෑ... තෝ වන්නං දහඅටම නටලා ඇත්තෙ... මොකා මොකා ගෙට රිංගනවද කියල කව්ද දන්නෙ... අර නාකිච්චිත් තෝ විකුන විකුණා වෙන්ඩැ කන්නෙ බොන්නෙ..."

හාදුවකින් ඔබ්බට නොගිය යුවතියක එවන් අවලාදයක් ඉවසන්නේ කෙලෙස ද?

"අතැරපං... මාව අතැරපං..." යි ඇය ගිරිය යටින් මුරගාමින් කුමාර සමඟ පොර බැඳුවා ය.

"උඹ ඔහොම උඩ පනින්නෙ තව ටික දවසයි..."

යතුරු පැදියේ කර්කශ හඬ පරයා ආශා බෙරිහන් දුන්නා ය.

"වර... වර මෙහෙට්ට මං තොගෙ උගුරු දණ්ඩ කන්නැද්ද බලාපිය... පර බල්ලා... ගල් මූසලයා..."

"ඇති... දැං ඇති... දැංවත් ඔය කට වහගන්නව... පිංසිද්ද වෙයි..."

ඇගේ තිත්ත කතා අසා සිටිය නොහැකිව කුමාර අණ කළේ තර්ජනාත්මක බැල්මක් ද සමඟිනි.

"කට වහගෙන හිටියොත් මුං කටෙත් රීලා යයි."

ඔහු ඇය අත් හළේ ඉවසිය නොහෙන කෝපයෙනි.

"මාව අල්ලගන්ඩ ද තිබ්බෙ... අර නරියට දෙකක් අනින්නැතුව මාව අල්ලගෙන ඉන්නවා... මොන මෝඩයෙක් ද තමුසෙ..."

ඇය තමාට කඩා පනිනු ඇතැයි නොසිතූ කෙතෙම වික්ෂිප්ත විය.

"මහ ලොකු කට්ටඩියා... මතුරන්න තිබ්බනෙ අරූගෙ ඔළුකට්ට පුපුරන්ඩ. කොයි...? බකං නිලාගෙන හිටිය මෙතන..."

Scanned with CamScanner

අවමානයෙන් හැකිළී යමින් ඔහු ඇය දෙස බලා ගත්වනම සිටියේ ය. අවුල් ව ගිය හිසකේ ද දහදිය රූරා හැලෙන සියොළඟ ද ඇය තමාගේ පෙම්වතිය නොව පෙරේත ලෝකයෙන් පලා ආ මළ පෙරේතියක සිහි ගන්වන සුළු ය.

“එන්ඩෙපා මට නං යන්තර ආන්ඩ... යන්තරේ ගහගත්තව පුකේ...”

ඒසා අසෝබන කතා නැවත ඇගේ මුවින් නොගිළිහෙන්නට නම් කළ යුත්තේ ඇගේ ගෙල මිරිකා මරා දැමීම බව ඔහුට ක්ෂණිකව සිතිණ. එවන් කෲර සිතිවිල්ලක් තමා වැනි දේවදාසයෙකු සිත පහළ වීම ඇදහිය නොහැකිව ඔහු මොහොතකට ගල් ගැසුණේ ය.

“ආව් ආව් අළුත් ජෝඩුව ෂොපින් ආවද...?”

මංජුලගේ උස් හඬ කන වැකුණ ද ඇගේ දෑස තවමත් දකින්නේ කුමාර හෙළු පරාජිත බැල්මයි.

“මංජුල ටවුමට ආවද?”

සඳුන් ඒ නොහොබිනා සිනාවෙන් උරණ වෙමින් වුව ආචාරශීලි වීමට යත්න දැරුවේ ය.

“කොණ්ඩෙ කපා ගන්ඩ කියල ආවා බං...” යි පිළිතුරු දෙමින් වුව මංජුල විමසිලිමත් බැල්මක් හෙළුවේ නිහඬ යුවතිය දෙසය. ඇගේ මුව සිහින් සිනාවක් හෝ නොනැගි බව ඔහු සනිටුහන් කර ගත්තේ ය.

“අපි නං යන්ඩ කියලා” හැකි ඉක්මණින් ඔහු මඟහැර යාමට උවමනා වූයෙන් සඳුන් සමු ගැනීමේ බැල්මක් හෙළුවේය.”

“පිස්සුද...? යමං යමං තේ එකක් බොන්ඩ...”

ආශාගේ දෑසින් ද පළ වූයේ මංජුලගෙන් නොපමාව වෙන්විය යුතු බවයි.

“අනේ බෑ බං... පරක්කු වෙනවා”

“හරි හරි... මොනව හරි බීල යං... අළුත් ජෝඩුවට එහෙම යන්ඩ දෙන්ඩ පුලුවන්ද?”



ඇගේ නොමනාපය ද නොරිස්සුම ද දැක දැක වුව සඳුන් තව දුරටත් වාද නොකළේ ය.

තරුණයාගේ ද තරුණියගේ ද කැමැත්ත හෝ නොකැමැත්ත විමසන්නට තරම් ඉවසිලිමත් නොවූ මංජුල කුඩා හෝටලයකට ගොඩවිය. සැබැවින් ම ආශා ප්‍රිය කළේ අයිස්ක්‍රීම් බඳුනක රස බලන්නට ය. සඳුන්ට පළතුරු බීමක් උවමනාවුවද මංජුල “ටී තුනයි” යි හඬ ගෑවේ ය.

කෙටිකෑම තැටිම දෙස නෙත් හෙළුවා විනා ඇය අතක් දිගු නොකළා ය.

“කන්ඩ කන්ඩ... ගන්ඩ”

මංජුල ඇයට පෙරැත්ත කළේ ය.

“උඹවත් කියපංකො මචං මෙයාට මොනව හරි කන්ඩ කියලා...”

ඇය සෙල් පිළිමයක් සේ නිහඬව හා නිසලව පසු වූ බැවින් ඔහු සඳුන් වෙත හැරුණේ ය.

“පැටිස් එකක්වත් කන්ඩ” යි කියමින් තරුණයා තමා සමඟ ජීවත්වුවද තමාගේ කිසිවෙකු නොවන තරුණියගෙන් ඉල්ලා සිටියේ ය.

“තෙල් කෑම කන්නැද්ද? කුරුලෑ එයි කියල බය ද?”

මංජුලගේ සිනාව අපතේ ගියේ ය. ඇගේ දෙතොල සිනාවකට සූදානම් නොවූ බැවිනි.

“ඇත්තටම මොනාද නංගි මූනෙ ගාන්නෙ? දැන් නං ඉතිං ඔය එක එක දේවල් තියෙනවනේ... පෙති කරල් ක්‍රීම්... ඉන්ජෙක්ෂනුත් ගහනව කියන්නෙ සමහර නිළියො...”

සඳුන් තිගැස්සුණේ ය. මේ රූමතියගේ සාහසික බව දන්නේ නම් මංජුල කිසිවිටෙකත් එවන් ප්‍රශ්නයක් නොඅසන බව ඔහුට විශ්වාසය. ඇගේ ප්‍රතිචාරය කුමක් විය හැකි දැයි බියෙන් ද සැකයෙන් ද ඔහු යුහුසුළුව එළවළු රොටිය ගිල දැමුවේ ය.

"ඔච්චර ආඩම්බර වෙන්ඩ එපා. ලස්සන කෙල්ලො කොහොමත් ආඩම්බරයිලුනේ... හැබැයි ඉතිං ඔච්චර ලස්සන ඔච්චර ආඩම්බර කෙල්ලක් මං නං දැකල නෑ මිට කලිං..." යි කී මංජුල හඬනගා හිනැහුණේ ය.

චතුරස්‍රාකාර මේසය වටා හිඳගෙන සිටින තිදෙනා එකිනෙකාට පුදුමාකාර ලෙස අසමාන වූ අතර මේසය යට ද යම් යම් දෑ සිදු වෙමින් තිබිණ.

කිසිකලෙකත් කොස්සක හිරිහැරයට ලක් නොවන මකුළු දැල් ගොන්නෙහි විසිරුණු මකුළුවෝ මේ තිදෙනා කෙරෙහි කිසිදු අවධානයක් නොදැක්වූහ. නිවහනක්ද වධක භූමියක් ද වන මකුළු දැල මධ්‍යයෙහි හපයක් වූ කුඩා කෘමියෙකු මකුළුවන්ගේ තීක්ෂණ අවධානයෙන් ගිලිහී ඔහේ එල්ලී සිටියේ ය. පණ ගැහෙන ජීවයක් පතා මකුළු ඇස් සුපරීක්ෂාකාරී වූ මොහොතක මේසය යට අසෝබන සිමෙන්ති බිම ගැටුණු දෙපයක් සිතක රාගයෙන් මෙහෙයවන ලදුව අසංවර විය. තවත් දෙපයක හිරිහැරයට ලක් වූ දෙපා තිම්කාරිය සඳුන් දෙස එක එල්ලේ බැලුවා ය. වෙනත් වේලාවල කෙසේ වෙතත් මේ මොහොතේ දී නම් ඔහු රාගයෙන් නොදැවෙන බව ඇය ඒ එක් බැල්මෙන් වටහා ගත්තා ය. ඉතිරිව සිටියේ තවත් එක් තැනැත්තෙකු පමණි.

මංජුලගේ දිදුලන දෑස ද මුවග සිහින් සිනා බිඳ ද ඇගේ සැකය තහවුරු කරයි. අර අන්තරායකාරී රත් පැහැය ඇගේ දෑසට ගලාගෙන එන්නට පටන් ගත්තේ ය.

"මොක ද මගෙ කකුල පාගන්නෙ?" යි ඇය උස් හඬින් ඇසුවා ය. මාධුර්යයෙන් මුළුමණින්ම තොර වූ ඒ උච්ච ස්වරයෙන් යාබද මේසයේ අසුන් ගෙන සිටිය වුන් පවා හැරී බැලුවෝ ය.

"විනාසයි" යි සඳුන්ට කෙඳිරි ගැවිණ. ඇගේ ඊළඟ පියවර කුමක්දැයි ඔහුට අනුමාන කළ නොහැක.

"කව්ද කකුල පෑගුවේ?"

මහත් අපහසුතාවයට පත් මංජුල බිඳුණු හඬින් ඇසුවේ ය.

"වෙන කව්ද තමුසෙ මිසක්..."



ඇගේ දෙනෙත දැල්වෙන ගිනි පුපුරු විද දරාගත නොහැක්කෙන් ඔහුගේ හිස පහතට නැමුරු විය.

"ඒයි මේ බලපන්කො මචං මෙයා මේ කියන කතාව."

මොහොතකින් දිරි උපදවාගත් තරුණයා සඳුන් වෙත හැරුණේ ය.

"එයාගෙං වැඩක් නෑ... තමුසෙ තමා මගෙ කකුල පෑගුවේ..."

"පුංචි මේසයක්නෙ... බැරි වෙලා විකක් ගෑවෙන්ඩ ඇති..."

මංජුල වටපිට බැලුවේ විළියෙන් හැකිළී ගිය මුහුණිනි.

"මාත් මෙච්චර වෙලා සද්ද නැතුව හිටියෙ බැරිවෙලා ගෑවෙනවා කියලා හිතාගෙන තමා. එහෙම නැතුව තමුසෙ එක්ක මගුල් නටන්ඩ ඕන හිංදා නෙමේ..."

තමා මැදිහත්විය යුතු බව සඳුන් තීරණය කළේ මිතුරාගේ මුහුණේ අඳුර දුටු නිසාම නොවේ. ඔහින් ඔස් විමස් අවසන ඇය මේසය පවා පෙරළා දමන්නට ඉඩ තිබෙන බවට උපන් බියෙන් හා සැකයෙනි. යම් අලාභ හානියක් වුවහොත් ඒ සඳහා ගෙවන්නට ප්‍රමාණවත් මුදලක් තමා අත නොමැති බව දත් බැවින් ඔහු වහා නැගී සිටියේ ය.

"කෑ ගහන්ඩෙපා හෝටලේටම ඇහෙන්ඩ... ජේරම කට්ටිය මේ පැත්ත බලනවා..." යි තරවටු කළේ මංජුලය.

"ඉතිං ඇහිච්චදෙං... ඇහෙන්ඩ තමා මං කිව්වෙ... යකෝ කොරන්ඩ හොඳයි... කියන්ඩ තරක යි..."

හඬ නැගෙන සේ වැරෙන් පුටුව පසෙකට කරමින් නැගී සිටි ආශා "සෙවල පෙරන්ඩ එපා හලෝ..." යි කියා සිටියේ ද මහ හඬිනි.

කෝපයෙන් වෙව්ලුම්කමින් නැගිටගත් මංජුලට කිසිවක් පවසන්නට ඉඩක් නොලැබිණ.

"එනව යන්ඩ" යි කී සඳුන් ඇගේ අතින් අල්ලා ඇද්දේ ය. ඔහු ඇය ද ඇද ගෙන හෝටලයෙන් පිටතට දිව ගියේ මේසයකද හැපෙමිනි.

Scanned with CamScanner

"ඇයි දුවන්නෙ?" කාට බයේ ද දුවන්නෙ...?"

ඇයට උත්තර දෙන්නට පමා නොවූ තරුණයා කට ඇරියේ ඒ ජරාජීර්ණ නිවෙසට ගොඩවීමෙන් පසුවය.

"මොකක් ද ඒ කෙරුවෙ?"

"ඇයි? මොකද?"

හිතේ හැටියට දබර කරගන්නට ඉඩ නොදුන් සඳුන් කෙරෙහි හටගත් නොරිස්සුමින් ඇය ද පෙරළා ප්‍රශ්න කළා ය.

"තමුසෙ යන පාරකවත් යන්ඩ හොඳ නෑ..."

"ඇයි?"

උරණ වූ කුඩා කොළුවෙකු මෙන් ඔහු කාමරයට වැදුණේ ය. ඇඳේ වැතිරුණේ ය. ඇය ද ඔහු හඹා ගියේ පහසුවෙන් පසු නොබසින බව පසක් කරමිනි.

"දැං මොකක් ද මං කෙරුවෙ...?"

"කෙරුවෙ මොකක් ද කියල දැන දැන ඇයි මගෙං අහන්නෙ?"

"හා හා... අර වරත්තු බල්ලට මගෙ කකුල පාගන්ඩ දීලා මං කරබාගෙන හිටියනං තමා හොඳ... එහෙම හිටියනං මං හරි හොඳයි... හරි ගුණයහපත්... හැබැයි විරුද්ධ වුණාම මං නරකයි... හැදියාවක් නෑ... පුදුම වැඩක්නෙ යකෝ මේක..."

ඔහු උඩුකය කෙළින් කළේ ය.

'ඒක හෝටලයක්... තව මිනිස්සු හිටියා. ඌ මං දන්න අඳුරන එකෙක්, කකුල පෑගුවනං හෙමීට අහකට ගන්ඩ තිබ්බනේ. කොල්ලො එහෙම තමා... ලස්සන කෙල්ලෙක් දැක්කහම කොල්ලො ඇවිස්සෙනවා... තමුසෙ මැරෙන්ඩ හැදුවට ඒක සිම්පල් දෙයක්. තමුසෙ ගම කෑවා... ආයෙ ඉතිං ඌ ළඟ වැඩට ගිය හැකි ද මට...?"

ඇය ජනෙල් කූරු දැඩිව අල්ලාගනිමින් ආක්‍රමණශීලී හමුදා බණ්ඩයක් මෙන් නිවෙස වසා පැතිරෙන්නට වෙර දරන පුපුළ හා ගාල්මරුවා වැල් ගෝටාව දෙස බලා සිටියා ය.



"ෂිත්... මාර නෝන්ඩිය... ආයෙ නං ඉතිං තමුසෙ එක්ක කිසි තැනක යන්නෑ මං... මට අඩ ගහන්ඩත් එපා..." යි කී ඔහු නැවතත් ඇඳේ වැතිරුණේ ය. සියළු කතා බතා හමාර බව හඟවන්නාක් මෙන් අනෙක් පස හැරුණේ ය.

"හරි... දැං මට මොකක් ද කරන්ඩ කියන්නෙ...? ඒකගෙං සමාව ඉල්ලන්ඩ ද? එහෙම නැත්තං අනේ කමක් නෑ ඔයාට ඕන තරං වෙලා මගෙ කකුල පාගන්ඩ කියලා කකුල දික් කරගෙන ඉන්ඩ ද?"

ඇගේ ස්වරයෙහි එක්තරා ප්‍රමාණයක සෞම්‍ය බවක් තිබිණ. ඔහු ගේ කෝපය ද නොරිස්සුම ද මඳින් මඳ දිය කර හරින තරමට ඒ හඬ පහත් විය.

"මංජුලයා කරපු වැඩේ හොඳ නෑ තමා. ඌ හිතාගෙන ඉන්නෙ අපි දෙන්නා කසාද බැඳලා කියලා නං මාත් ළඟ ඉද්දි ඔයාට එහෙම කරපු එක වැරදියි..."

ඇය මුව ඇද කළා ය.

"අනේ නෑ කිසි වැරැද්දක් නෑ... මොකද ගෑනු ඉපදිලා ඉන්නෙ පිරිමින්ට තලන්ඩ පොඩිකරන්ඩ පාගන්ඩනේ... කකුල පාගපු එකා නෙමේ වැරදි කකුල අයිතිකාරි... ඉදකිං මේ කරුමක්කාර ගෑනු... ආයෙ නං කිසිම ආත්මෙක මං ගෑනියෙක් වෙලා ඉපදෙන්ඩ එපා... ඇත්තමයි මං දෙයියංගෙං ඉල්ලන්නෙ එච්චරයි..."

ඇගේ හඬ බිඳිණ. ඔහු අබියස කඳුළු සලන්නට අකැමැති වූ ඇය කාමරයෙන් පිටතට දිව්වා ය.

"සඳුනි" යි ඔහු ඇඳ මත හිඳගනිමින් හඬ ගෑවේ ය. ඇය හිස වැළඳ ගන්නට නොඉවසිලිමත් වූ ඔහුගේ තුරුණු කය උණුසුම් විය. ඇය පිළිබඳව මෙතෙක් වේලා කැකෑරුණු කලකිරීම ද කෝපය ද පහව ගියේ ය.

"සඳුනි..."

ඔහු ඇසෙන නෑසෙන හඬින් මිමිණුවේ ය.

Scanned with CamScanner

ඇය හඬා යන්නට ඔහු මැළි විය. ඇගේ මුවින් පිටවන රළු වදනකින් මේ ප්‍රේමාන්විත හැඟීම් සුනු විසුණුව යනු ඇතැයි බියෙනි.

# 17

චිමිනි ලාම්පුවේ සෞම්‍ය ආලෝකයෙන් වුව අහුමුළු කරා පසුබසින අඳුර ඒ දැල්වෙන සිළුවට ශාප කරන්නාක් මෙන් ඇය ද රාත්‍රියට ශාප කළා ය. එහෙත් ඒ ස්වභාවික සංසිද්ධිය වලක්වාලන්නට ඇගේ නපුර සමත් නොවේ. ශෝකයෙන් සේම කෝපයෙන් ද පලක් නොවන බව ඇයට වැටහෙයි.

"අනේ මංදා හෙට මොනව කරන්ඩ ද කියලා... ආයෙ ඉතිං රෙද්දක් ඇඳගෙන අරූ ළඟට යන්ඩ බෑනේ..."

සඳුන් කතා කළේ මහත් කණස්සල්ලෙනි. එහෙත් ඇය නිහඬවම පසුවූවා ය.

"ෂික්..." යි ඔහු සිය අප්‍රසාදය නොසඟවා පළ කළේ ය. ඇය නැවත වරක් කුපිත වන්නට ඉඩ තිබෙන බව පවා අමතක කර දැමුවේ ය.

"ඔච්චර කියවන්නෙ මේ ඇඳුං කඩමළු ටිකක් ඇරං දීලනේ... ඉඳා උඹේ බඩකඩුත්තුව" යි කෑගසමින් ඇය ඇඟලා සිටින ගවොම පවා ගලවා තමා වෙත දමා ගසන්නට ඉඩ ඇතැයි සිතුණෙන් ඔහු තවත් කිසිවක් නොපැවසුවේ ය.

කෝපයෙන් පුපුරු ගසනවා වෙනුවට ඇය චිමිනි ලාම්පුව මත රැඳුණු ඇසින් උගුර පෑදුවා ය. අනෙක් පැත්ත හැර වූ වංගෙඩිය මත හිඳ හුන් සඳුන් ඇය දෙස හොරැහින් බැලුවේ ය.

ඇය කුමක් කරන්නට කියන්නට සැරසෙන්නේ දැයි ඔහුට සිතාගත නොහැක. සැබැවින් ම අඳුරේ ද ආලෝකයේ ද ඇය හොඳින් මුව විවර කර කවි පෙළක් ගායනා කරන්නට පටන් ගත්තා ය. විමතියෙන් ද කකුසින් ද ඔහු හොඳින් සවන් දුන්නේ ය. හඬවන්නට අත් රබානක් නොමැත්තෙන් ඇය මේස කබලට තට්ටු කරමින් තමාගේ විරිදු ගායනයට අලංකාරය එක් කරගන්නට වෙහෙසුණා ය.

“අටලෝ දහමට අනුවයි
සිදුවන දේ සිදුවන්නේ
අවි ගත්තෝ අවියෙන්මයි
කවදා හරි වැනසෙන්නේ

කළ ජඩ වැඩ වහගන්ඩ ලු
වේදිකාවේ මොර දෙන්නේ
ඡන්දේ දෙන අය දන්නවා
කාටද ඡන්දය දෙන්නේ

හොරමැරකම් දූෂණයෙන්
පාතාලයට පෝරලා
බිය සැක සංකා ගෙන දී
මහජන සිත් පාරලා...

ගමත් කාල රටත් කාල
පපු කැනතිත් පාරලා
කවුන්සිලේටත් යනවලු
වසන්ත බණ්ඩාරලා...”



ඇගේ ස්වරයෙහි මාධූර්යය සමඟ කැලතී තිබූ ද්වේෂය හැඳිනගත් ඔහු සුසුමක් හෙළුවේ ය. ඇගේ පියාට එරෙහිව ඇය කළ අරගලය පිළිබඳ ව තරමක් දුරට දැන හුන් හෙතෙම ඒ සම්පූර්ණ කතාව අසන්නට නොඉවසිලිමත් විය.

“ඒ මනුස්සයා පාර්ලිමේන්තුවට ගියා ද?”

ඇය තමා සමඟ අමනාපයෙන් පසුවන බව අමතක වූයෙන් ඔහු වහා ප්‍රශ්න කළේ ය. ඇයට ද මේ අමනාපය තිත්ත වී තිබිණ. මේ රැයෙහි අතීතාවර්ජනයට කවියකින් මුල පුරන්නට ඇය වගබලා ගත්තේ ද ඔහුගේ උනන්දුව වඩවාලනු පිණිස ය.

“කව්ද දන්නෙ... ඒ මිනිහා පාර්ලිමේන්තු නෙවේ දිව්‍යලෝකෙ ගියත් මට වැඩක් නැතේ...”

“මොනව වුණත් ඒ ඔයාගෙ තාත්තනෙ” යි නොකියන්නට ඔහු පරිස්සම් විය. මේස කබල මත තිබෙන කොත්තු රොටී පාර්සලය උඩින් පියඹා ගොස් අසෝබන ගෙබිම මත පතිත වනවා දකින්නට ඔහු කැමති නොවෙයි.

“ඔයාගෙ සීතම්මට මොකද වුණේ?”

ඒ කුඩා කෙසඟ මැහැල්ල මුසුප්පුව ඉන්නා අයුරු දුටු ආශා ද “මොකද වෙලා තියෙන්නෙ?” යි ඇසුවා ය. දුක සැප විමසන ලෙන්ගතුකමකට වඩා ඒ හඬෙහි ගැබ්ව තිබුණේ නොරිස්සුමකි.

“අප්පට බැන බැන ඉස්ටේජ් ගානෙ විරිදු කියන කෙල්ල හොයාගෙන ආවෙ නැද්ද අප්පගෙ චක්ගෝලයෝ”

සීරුවෙන් රැළි සාය ගලවා පසෙකින් තැබූ කෙල්ල “මොකක්?” යි පෙරට වඩා උස් හඬින් ඇසුවා ය.

“එකෙක් නං බැරියැ. හතර පස් දෙනෙක් ම ආපි... හෙට රැස්සීමට ගියොත් මාව මේ ගෙටම දාලා ගිනි තියනවා කිව්වෙ...”

“සීතාගේ දෑස භීතියෙන් විසල් විය. එහෙත් මිණිබිරිය හකුළාගත් දෙනෙතින් බලා සිටියා පමණි.

“උඹට ඇහුණ ද ආසෝ... හෙට නං යන්ඩ හිතන්ඩවත් එපා... ආපුදෙංකො අර අංගනාව... මං පොල්පිත්තෙන් ගහලා පන්නන්නෙ...”

Scanned with CamScanner

ආශා අත් දිග බ්ලවුසයද ගැලෙව්වා ය. තන පටය හා යටසාය ඇගේ නව යොවුන් සිරුරේ හැඩය උළුප්පාලයි.

"පොල් පිත්තෙන් ගහල පන්නන්ඩ තිබ්බෙ ඒ ආපු එවුංටනෙ..."

"උඹ නං කියයි. මගෙ උගුර කට වේලිලා ගියා. සර්වාංගෙම ගැහෙන්ඩ ගත්තා. උං යක්කු වගේ කඩං පනිනකොට මේ නාකි මං මොනවා කොරන්ඩ ද...?"

ආශා පටු සාලයේ ඒ මේ අත සක්මන් කළා ය.

"මං හිටියනං හොඳ කුණුහරුප දෙකක් කියනවා උංට පස්ස නොබලා දුවන්ඩ"

"සීතා සරදම් සිනාවක් එක්ක හිස ගැස්සුවා ය.

"කුණුහරුප ඇහිලා දුවන ජාතියේ මිනිස්සුද බං එවුං... උඹ මොනවා දැනගෙන ද හැබෑටම ඔය කතා කොරන්නෙ... උඹ නොහිටි එක කොච්චර හොඳ ද... ඒ අළුගුත්තේරුවෝ උඹ දැක්කානං එක්කො උස්සාන යයි. එහෙමත් නැත්තං මෙතන මොන විනම්බෑසියක් වෙයි ද කියලා දෙයියො තමා දන්නෙ"

මැහැල්ල හූල්ලා වැටුණා ය.

"ගූ බයේ දඟලනව දැං මෙතන... මං නං බයවෙයි ඔය ගැරඩින්ට" යි වහසිබස් කී කෙල්ල දහදියෙන් තෙමී ගිය තනපටය ද ගලවා දැමුවා ය.

"කොයි මගෙ නයිටිය?"

ඇය සීතාට පිටුපා හිටගත් වනම පසුවූයේ රාත්‍රී නිදන ගවොම අතපත් වන තෙක් ය.

"මං ඒක හෝදලා දැම්මා..."

මැහැල්ල නොනැගිටම උත්තර දුන්නා ය.

"හේදුවනං ගෙනත් දෙන එකයි ඇත්තෙ..."

"ඇගේ තියෙන වස්තරේ ගලවන්ඩ කලිං අඳින්ඩ වස්තරේ හොයාගෙන ඉන්ඩෙපැයි..." සීතා කතා කළේ කෝපයෙනි.



"මට බෑ හොය හොයා ඉන්ඩ... ගෙනත් දෙනවද නැද්ද? නැත්තං මං යටසායත් ගලවනවා."

කාලවර්ණ යටසාය රේන්දයකින් හැඩ වැඩ වී ඇත්තාක් මෙන්ම ඇගේ සිරුරේ හැඩය හා පැහැය වඩාත් ඔප්නංවන්නේ ය.

"ඔව් ඔව්... උඹ ඕක ගැලෙව්වා කියලා මං බය වෙයි... මං දැකලම නැනේ උඹ හෙළුවෙං ඉන්නවා..."

සැනෙකින් ඇගේ යට සාය ඇගේ දෙපයේ පිටි පතුල මත පතිත විය.

"ගේනවද නැද්ද මේ දැංම... නැත්තං මං පැන්ටියත් ගලවනවා..."

තවමත් පිටු පා ඉන්නා මිණිබිරියගේ මන බඳනා සිරුර දෙස පුදුමයෙන් අයා ගත් ඇසින් හා මුවින් බලා හුන් මැහැල්ල "දෙයි හාමුදුරුවනේ" යි කොඳුළා ය. ඒ සිරුරේ සුන්දරත්වයෙන් වසඟ වනවා වෙනුවට ඇය කෝපයෙන් පුපුරා හැළුණාය.

"ඉදකිං... තියෙන කඩප්පුලිකම. විලි ලැජ්ජාවක් කියලා දෙයක් ගෑවිලාවත් තියෙනවද මේකිට..."

නොනවත්වා දොස් පවරමින් වුව ඇය ආශා ගේ නිදන ගවොම ගෙන ආවා ය. හිස වැසෙන සේ එයින් දමා ගැසූ මැහැල්ල වැලපෙන්නට පටන් ගත්තා ය.

"ඔයිට වඩා හොඳයි මයෙ බෙල්ල මිරිකලා මරලා දැම්මනං... කිරියම්මෙක් ඉස්සරහ ඔහොම නිරිවස්තරෙං ඉන්නවද අප්පේ මිණිබිරියක්... මෙහෙමත් නැහැදිච්චකමක්... මෙහෙමත් නොසංඩාල කමක්... ඔය ජංගි පොඩ්ඩත් ගලෝලා උඹ ඔය ඉස්ටේජ් එකකට නැංගත් ආයෙ ඉතිං පුදුම වෙන්ඩ දෙයක් නෑ... තියෙන වේසාකමනෙ... වෙන මොනව ද ආයෙ එහෙනං..."

නිදන ඇඳුම ලැබීම හේතු කොටගෙන ඒ රෝසපාට ජංගි පොඩියට ඇගේ රෑබර කය අතහැර ගොම මැටි බිම පතිත වීමේ අභාග්‍ය සම්පන්න ඉරණමට මුහුන පාන්නට සිදු නොවී ය.

ගවොම ඇඟලා ගත් කෙල්ල සිය මිත්තණිය වෙත හැරුණා ය.

"අර මන්තිරියගෙ වලත්තකම එහෙම පිටිංම ඇරං ඉපදිලා... අප්පගෙම දෝණියැන්දැ... ජාති ජාතිත් නොවාසනාවන්... මෙහෙව් වේසාවියෝ..."

දේව දාසයාගේ හාදුවකින් පමණක් ඉඳුල් වූ කෙල්ල ඒ අවලාදයෙන් බලවත් ලෙස කිපුණා ය.

"මං කරපු වේසකමක් නෑ... දැං කටවහගෙන බුදියගනිං..."

මිණිබිරියක සිය මිත්තණියට ඒ සා නිර්දය ලෙස කතා නොකරන බව සීතාට සහතිකය.

"උඹ කාටද ඔය කතා කරන්නෙ?"

එවන් කර්කශ කතා අරුමයක් නොවූවද සීතා මේ රාත්‍රියෙහි පෙරළා ප්‍රශ්න කරන්නට නොපැකිළුණාය.

"කතා කරන්නෙද..." යි අසමින් ඇය වෙත ළංවූ ආඟා "කතා කරන්නෙ සීතා කියන නාකි මරගාතෙට... තව එක වචනයක් හරි ඔය ගඳ ගහන කටිං පිට කෙරුවොත් මං මිරිකන එක මිරිකනවා බෙල්ල..."

මේ යස්ස කෙල්ල එසේ නොකරන බවට විශ්වාසයක් නොවූයෙන් සීතා අතකින් මුව වසාගත්තා ය. ළය තෙරපෙන භීතියද ශෝකය ද සුසුමක්ව පිටවන්නට ආවද ඇය එය ද වළකාගත් බැවින් වැහැරුණු ළය මඬල වේගයෙන් උස් පහත් විය.

මිණිබිරියට අවනතව කට පියාගෙන පැදුරේ වැටුණු ද පසුදා මද්දහනේ හිටිවන කවිකාරිය සමඟ බහින් බස්වන්නට පසුබට නොවූවා ය.

"මෙකි එක්කාන යන්ඩ එපා... වසන්තයගෙ මිනිස්සු ඊයෙ ගෙට පැන්නා... අද මොන ගිනිවිජ්ජුම්බරයක් වෙයි ද කියලා කාට ද කියන්ඩ පුලුවං... උඹට මං වැඳල කියන්නං මාලෝ කෙල්ල නං එක්කාන යන්ඩ එපා..." යි ඇය පළමුව දෙඅත එක් කරමින් ආයාචනා කළා ය.



"වසන්තයා පරදිනවා සීතම්මේ... කිසි දේකට බය වෙන්ඩෙපා... අපේ අතපත්තු මහත්තයා උඩිංම දිනනවා..."

මාලා මල්කාන්ති ඇය අස්වසන්නට තැත් කළා ය. එහෙත් එයින් සිදු වූයේ මැහැල්ල කුපිත වීම ය.

"යකෝ මොකා දිනුවත් පැරදෙන්නෙ උඹලා. උඹලට හම්බවෙයි ලබ්බ... අනේ නිකං පලයං මාලො යන්ඩ..."

හිටිවන කවිකාරිය උරණ නොවූවා ය. ඇය මේ මද්දහනේ පවා අඩ අඳුරින් වෙළී ගිය ගෙතුළට රිංගුවේ කැමැත්තකින් නොවේ. අවසන් රැස්වීමේ දී විරිදුකාරිය රෙදි හැට්ට ඇඳිය යුතු වූවා ය.

"කෙල්ලට සාරියක් ඔසරියක් අන්දලා ගත්තොත් හොඳ නැද්ද මාලක්කේ...?"

අනාගත මන්ත්‍රීවරයා අසා සිටියේ අවසාන දේශපාලන රැළිය අත්‍යාලංකාර එකක් විය යුතු බව හඟිමිනි. දුර බැහැරින් පැමිණ රැස්වීමට සහභාගි වන දේශපාලඥයන්ගේ ඇස් නිලංකාර කරන්නට තමා වෙනුවෙන් විරිදු ගයනා රූපිකාව සමත් වන බව ඔහුට විශ්වාසය. ඇගේ රූපශ්‍රීය වඩාත් ඉස්මතු වන ආකාරයෙන් ඇඳුම් පැළඳුම් නිර්මාණය කිරීම උදෙසා ඔහු කොතෙක් නිර්ලෝභී විද යන්න පිළිබඳ ව හොඳින් දැන සිටියේ මාලා මල්කාන්ති මිස අන් කව්රුන්ද?"

"මාත් ඔසරිය ඇඳලා ඒ ළමයත් ඔසරියක් සාරියක් ඇන්දම හරි නෑ වගේ... ඊට වඩා හොඳයි රෙදි හැට්ට අන්දන එක"

තරුණ දේශපාලඥයා ඒ අදහස ඉතසිතින් අනුමත කළේ ය.

"මාලක්කටත් මාර අයිඩියානෙ එන්නෙ..." යි කී ඔහු පුළුල් සිනාවක් පෑවේ ය. මේ සිනාවත් ද චාටු කතාවත් ද ඡන්දය හමාර වනවාත් එක්කම වියැකී යන බව ඇය හොඳින් දැන සිටියා ය. ජයග්‍රාහකයා වටකරගත්තේ ඔහුගේ ජයග්‍රහණය වෙනුවෙන් දරදිය ඇදි පිරිස නොව පරාජයට පත් කරන්නට වෙහෙසී පිල් මාරු කළවුන් බව පසුගිය කාලය පුරා පැවැත් වූ ප්‍රාදේශීය සභා පළාත්

සභා මැතිවරණ පමණක් නොව ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ ආදියේ ද වේදිකාවට නැඟී හිටිවන කවිකාරිය පසක් කොටගෙන සිටින්නී ය. අනාගත අපේක්ෂාවන්ගෙන් මෝහනය කරවන ගැහැනිය උගුර ලේ රහ වනතුරු කවි කීව ද එතෙක් මෙතෙක් කල් අත්පත් කරගත් සුගතියක් නැත්තේ ය. ඇයද ඇගේ හිතමිතුරු කවියාද දේශපාලඥයන්හට සිහිපත් වන්නේ ඡන්දයක් අල්ල පනල්ලේ පමණි.

බෝරිච්චි අත් සහිත හැට්ටයකින් සහ රතුමල් ඉහිරුණ චීත්තයකින් සැරසී හුන් ආශා කොපමණ සුන්දරවීද කිවහොත් ත්‍රීවිල් රියැදුරා ද මහළු කවියා ද ත්‍රීවිලරයෙන් බැස්සේ කලින් කතිකා කරගෙන වාගේ එකම මොහොතේදී ය.

"ආයිස් අප්පා... අද අපේ ආසා කෙල්ලගෙ ලස්සන... අනේ අම්මාපල්ලා ඒ කාලේ මාලනී පොන්සේකා වාගේ..."

කවියා මුව පුරා හිනැහෙමින් කීවේ ය.

"අද නං කෙල්ලෙ මොකෙක් හරි උස්සන එක ෂුවර්... කොළඹ ගෙනියයි ද නුවර ගෙනියයි ද කුරුණෑගල ගෙනියයි ද මංදා... ඔය හතර දිග් බාගෙංම අද මැති ඇමතිවරු එනවනෙ..."

ත්‍රීවිල් රියැදුරා මේ තරම් වචන කන්දරාවක් සිය මුවින් පිට කළේ පළමු වරටය. බොහෝ විට යන එන අතරතුර නොනවත්වා කතා කළේ මාලා මල්ලිකා පමණි. මහළු කවියා ද හූමිටි දෙනවා මිස වැඩිමනත් යමක් නොපවසයි. ආශා නම් හූමිටියකට තබා සුසුමකට හෝ සිය දෙතොල සලිත නොකළා ය.

"තූ... නොදකිං... ඇස්වහ කටවහ මතුරන්ඩ වෙයි වාගේ ඔක්කෝටම කලිං..."

සීතා තෙවරක් කෙළ ගසා සිය මිණිබිරිය ඇස්වහ කටවහ දෝෂයන්ගෙන් රැක ගන්නට වෙහෙසුණා ය.

"යං යං පරක්කු වුණා" මාලා මල්ලිකා යුහුසුළු වූයේ මැහැල්ලගේ කන්දොස්කිරියාවෙන් බේරී පිටව යාමට ය.

"උඹලා මේකිත් ඇන්න යන්ඩ යයි. අරුං ඇවිල්ලා ගෙටත් ගිනි දාලා මාත් ඒ ගින්නටම ඇදල දාන්ඩ බැරි නෑ..."



පණ ගන්වා ගත් වාහනය වෙත යමින් සීතා කතා කළේ උස් හඬිනි.

"පිස්සුද... එව්ව කොහෙද... උංටම ගිය රටක් ද මේක සීතම්මා කිසි දේකට බයවෙන්ඩ එපා..."

හිටිවන කවිකාරිය සපථ කළ ද බියවීමට කරුණු කාරණා යෙදී තිබිණ. ත්‍රීවිලරය ගුරු පාරට අවතීර්ණ වූවා පමණි. වේගයෙන් පැමිණි වෑන්රියක් ගොරහැඩි හඬක් නගමින් දූහුවිලි ඇවිස්සී යන අන්දමින් නවතන ලදි. එයින් බට පිරිස ත්‍රීවිලරය වට කරගත්තේ ගොදුරක් මත කඩා පතිත වෘක රැලක් පරිද්දෙනි.

"එපා... එපා... ගහන්ඩ එපා..."

ත්‍රීවිල් රියැදුරාගේ විලාපය ඇසෙත්ම කඩුල්ල අද්දර බලාහුන් සීතා උන් හිටිහැටියේ පණ ලද පඹයෙකු මෙන් පාරට දිව්වා ය.

"තොපි රැළියට යන්ඩ. ඈ? යවන්නං අද තොපි රැළියට නෙමේ අපායට..."

කළු රෙදිකඩින් මුහුනු ආවරණය කරගෙන හුන් පිරිස දුටු සැණින් මහළු කවියා කොතරම් ඇඩි ලෙස බියට පත්විද කිවහොත් සුදු සරම තෙමී ගියේ ය.

"පල... පල යන්ඩ නාකියා"

ඔහුට පහරක් ගැසූ එකෙකු මහ හඬින් අණ කළේ ය.

"දුවපිය... නැත්තං ගුටිකාලා මැරෙනව උඹ... මහ ලොකු කවියා..." යි තවකෙකු ගිහිරුවේ ය. ලිහිල්ව කඩා වැටෙන සරම ඇතින් ඔසවා ගනිමින් මහල්ලා දිව ගියේ ය.

"කවිකාරියි විරිඳුකාරියි ඩබලගෙ රෙදි ගලවලා හෙළුවෙං මහ පාරේ ඇවිද්දවන්ඩයි තියෙන්නෙ"

ඒ යෝජනාව අනුමත කරන ලද්දේ දෙකන රිදුම් දෙවන හූ හඬිනි.

ආයාචනා හෝ කඳුළු නිශ්ඵල වන වග ඉඳුරා දැන හුන් මාලා මල්ලිකා සෙල්රුවක් සේ නිසල යුවතිය රැක ගන්නට තැත් කළා ය.

"තොපි පර බල්ලො... කරන දෙයක් මට කරපියව්... මේ කෙල්ලට යන්ඩ දීපියව්..."

ඇය කෝපයෙන් වෙව්ලමින් ඉල්ලා සිටියා ය.

"මේ වගේ තෙල් බේරෙන කෑල්ලක් අතාරින්ඩ පුළුවංද එහෙමත්..." "යකෝ... මේකි වසන්ත බණ්ඩාරගෙ දුව..." තොපිට මේ අසමජ්ජාති වැඩේ බාරදෙනකොටවත් ඒ වල් බල්ලා කිව්වෙ නැද්ද ඒ ටික?"

හැඩි දැඩි පිරිමි කීප දෙනෙකුන් විසින් වට කරගෙන සිටියදී පවා ආශා බියෙන් නැති නොගත්තා ය. ඇගේ දෙනෙත කිසි කලෙකත් නුවූවිරූ ලෙස රත් පැහැ ගැනිණ. සතුරන් සමඟ සටන් වැදීම පිණිස අවියක් තබා කෝටු කැබැල්ලක් හෝ නොතිබුණ ද ඇගේ දෑතේ දිගු නියද මුවේ දසන් පෙළ ද ඒ අඩු නඩුව පිරිමසන්නට සූදානම් වග කිසිවෙකුත් නොදත්හ. අභ්‍යන්තරයෙහි ගිනිගෙන ඇවිළෙන එහෙත් පිටතින් නිහඬ නිසල ගිනි කන්දක් මෙන් ඇය හිටිපිය හිටගෙන හිටියා ය.

"වරෙව්... මරාගෙන මැරෙනවා... මං බය නෑ තොපිවගේ ජරා බල්ලන්ට... කටු ලොවින හොරිකඩ බල්ලො" යි ඇය දත් සපමින් කොඳුළා ය.

"ගලවන්ඩ ඉරන්ඩ කරන්ඩ කිසි දෙයක් නෑ... රෙද්ද උස්සන්ඩ විතරයි තියෙන්නෙ..." යි කී එකෙකු හඬ නගා හිනැහුණේ ය.

"උස්ස උස්ස ඉන්නෙ මඟුලටද...? ඔන්න ඔය රෙද්ද ගලවල විසිකරපල්ලා..."

මේ මැර කණ්ඩායමේ ප්‍රධානියා ලෙස සිතිය හැකි තරුණයා අණ කළේ ය.

"අප්පේ... මයෙ කෙල්ල... අනේ දෙයියනේ... දෙයියනේ... මයේ කෙල්ල..."

බියෙන් ද ශෝකයෙන් ද ඇඳුරුව ගිය ළය මඬල අතකින් මිරිකාගනිමින් සීතා ඔවුන් වෙත දිව ආවා ය.



"කට වහගෙන පලයං යන්ඩ... තාකිච්චි..." යි එකෙකු ඇය තල්ලු කර ඇමුවේ ය.

"මයෙ බුදු නාතෝ... මුං මිනී මරනෝ..."

බිම ඇද වැටෙමින් වුව ඇය මරහඬ දුන්නා ය.

"අපි උඹට කිව්ව නේද ගැනියේ... කෝ... ඇහැව්වද අපි කිව්ව එක... දැං නිකං බොරුවට මෙතන කෑනුගහ හිටපං..."

මාලා මල්ලිකාගේ අත ගසා දැමූ ආශා පෙරට පැන්නා ය. බිම හොත් මිත්තණිය දෙස බලන්නට පමා නොවූ ඇය එකෙකු මුහුන වසාගත් රෙදිකඩ ගලවා විසි කළා ය. තමා නිරාවරණය වීම නිසා කැළඹුනු තරුණයා ඇයට පහර දුන්නේ ය. ඒ දුටු මාලා මල්ලිකා ගිරිය යටින් විලාප දුන්නා ය. වර්ණවත් සාරිය තව දුරටත් ඇගේ තරබාරු සිරුරේ එතී නොතිබිණ. එය රළු පරළු පිරිමි අත් මතින් ගිලිහී ගුරුපාරේ පතිතව තිබිණ. හැට්ටය හා යට සාය සහිතව වුව ඇය පිහාටු ගලවා ඉවත් කරන ලද කිකිළියක මෙන් අවලස්සන වූවා ය. මුළුමනින් ම නිරුවත් වීම නම් වන බිහිසුණු ඉරණමෙන් ඇය ගලවා ගත්තේ පොලිස් ජංගම මුරසේවා රථය ය.

මැර කණ්ඩායමට වෑන් රියට නැඟී පලා යාමට හැකි වූයේ සිහිසුන් මැහැල්ල වෙත යොමුවූ අවධානය හේතු කොටගෙන ය. ඇතැම් විට ජයග්‍රහණය කා හට හිමි වේදැයි නිසැකව නොදන්නා බැවින් ඔවුන්ට පලා යාමට ඉඩ ලබා දිය යුතු බව පොලිසිය කල්පනා කළා විය හැක. පාර්ලිමේන්තු අපේක්ෂක වසන්ත බණ්ඩාරගේ පෝස්ටර් ගලවා දමන්නට තරම් සිහි බුද්ධියක් මැර කණ්ඩායම වෙත නොතිබුණෙත් ඔවුන්ගේ මුහුණු ආවරණය කරන්නට දරන ලද ප්‍රයත්නය නිෂ්ඵල එකක් විය.

ගුරු පාර පාරවා වේගයෙන් පලා ගිය වෑන් රිය හඹා යන්නට අදහස් නොකළ පොලීසිය පොලු මුගුරුවලින් තලා දැමූ ත්‍රීවිල් රථය එතනම තිබෙන්නට ඉඩ හැර තුවාල ලද රියදුරා හා සිහිසුන් මැහැල්ල රෝහල් ගත කරන්නට ක්‍රියා කළහ. විමතිය දනවන කරුණ වූයේ ගුරු පාරේ මේ මැර ක්‍රියාව මුළුමනින්ම ආවරණය කරන්නට යුහුසුළු වූ මාධ්‍ය කණ්ඩායමක හදිසි ආගමනය යි.

Scanned with CamScanner

පාර්ලිමේන්තු අපේක්ෂක අතපත්තු ගේ ආධාරකරුවන්ට මිලේච්ඡ ලෙස පහර දීම හදිසි පුවතක් ලෙස රූපවාහිනී වැනල ඔස්සේ විකාශය විය. සියළු කටයුතු පසෙකලා රෝහලට ගිය දේශපාලඥයා තුවාලකරුගේ සුවදුක් විමසා බැලුවේ ය.

තවමත් සිහි විසංඥව සිටින මැහැල්ලගේ දිරාපත් සිරුර අබියස සියළු ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට හා පාදඩ මැර දේශපාලනයට එරෙහිව වේගවත් අදහස් දැක්වීමකට සැලසුම් කළද දැඩි සත්කාර ඒකකයට ඇතුළු වීමට අවසර නොලැබුණ ද වෛද්‍යවරුන්ගේ විරෝධය නොතකා ඉතා කෙටි කතාවක් කළේ ය. මිණිබිරිය සමඟ පසුවන සමීප දර්ශනයකින් සංවේදී ප්‍රවෘත්තියක් නිර්මාණය කරන්නට මාධ්‍ය කණ්ඩායම වෙහෙසුණෝ ය.

"ටිකක් අඩන්ඩ එපැයි... කිරියම්ම නේද අයි සී යූ එකේ ඉන්නෙ... කෝ ඉතිං ඇස්වල කඳුළු බිංදුවක් නැනේ..." යි ඔහු ආශාට නෝක්කඩු කීවේ කැමරා ආම්පන්න ඉවත් කිරීමෙන් පසුව ය.

"මං ඇඬුවහම සීතම්මට සිහිය එයිද...?"

ඇය ගිනි පුපුරු දිලෙන දෑසින් ඇසූ කළ ඔහු හෙමින් සීරුවේ මඟහැර ගියේ ය.

"ගෑනු ළමය ඇඬුව නම් මාර ගති... ඔච්චර කියලත් පොඩ්ඩක් ඇඬුවෙ නැනේ"

මාධ්‍ය කණ්ඩායම වෙතින් නැගී මැසිවිල්ල මඳහසකින් ඉවසමින් අනාගත අමාත්‍යවරයා රෝහලෙන් පිටව ගියේ ය.

"ලොක්කි මැරිල වැටුණ නං... කෙල්ල ඉකිගහලා ඇඬුව නං නිව්ස් බලන මිනිස්සු හොල්මන් වෙනව ෂුවර්..."

ආපසු යන අතරේ මාධ්‍යවේදියෙකු කණගාටුව පළ කළේ ය.

"කොහොමත් ඉතිං පට්ට නිවුස් එකක්නෙ... අපේ අතපත්තුත් උඩිංම දිනනවා..."



දෙකනට මී බිඳු වක්කරන්නාක් වැනි ඒ වචන ඇසූ අතපත්තු හඬ නංවා සිනාසුණේ ය.

ආශාට අඳින්නට ඇඳුමක් හා කන්නට යමක් ගෙන ආ මාලා මල්ලිකා පුන පුනා ඉල්ලා සිටියේ තමා සමඟ පැමිණෙන ලෙස ය.

"බෑ..."

"ඉස්පිරිතාලෙ ඉන්න එකේ තේරුමක් නැතෙ නංගියේ... හෙට උදේම එමු..."

"බෑ..."

ඉනික්බිති ඒ පිළිබඳව තවත් කතා නොකළ ඇය මෙතෙක් වේලා සිත පුපුරු ගැසූ සැකය හෙළි කළා ය.

"ඈ බං නංගියේ උඹ අර උස එකා එක්ක පොර කැවා නේද... උගෙ මූන වහගෙන හිටපු රෙදි කැල්ලත් ගලවලා විසික් කෙරුවෙ... ඒකා මට හොඳට දැකල පුරුදුයිනෙ..."

ආශා මුව ඇද කළා ය.

"ගමෙ උං තමා ඔක්කොම... ඕකට ආයෙ කොළඹිං ආවැයි..."

මාලා මල්ලිකා හිස සැලුවා ය.

"ගමේ චුණ්ඩාට උං වසන්ත බණ්ඩාරගේ එකෙක් නෙමේ නංගියේ..."

කෙල්ලගේ දෑස රත් පැහැ ගැනිණ.

"මට මතක් කරන්ඩ එපා ඔය පර බල්ලව... උගෙ නම ඇහෙනකොටත් මගේ ඇගේ ලේ උණුවෙනවා..."

උප්පැන්න සහතිකයේ පියා ගේ නම ඉදිරියේ සිය නම නොයෙදූ මිනිසාට නොව දේශපාලනයේ දීර්ඝ ගමනක් යාම උදෙසා අහිංසකයන් තලා පෙලූ නොමිනිසාට ඇය මේ හැන්දෑවේ ළය පුරා ද්වේෂ කළාය.

Scanned with CamScanner

"මාත් අද ගෙදර ඉන්නෑ නංගියේ... කව්ද දන්නෙ උං ගෙටත් පනියිද කියලා බං"

වසන්ත බණ්ඩාරගේ මැරයන් අත් අඩංගුවට ගැනීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායමක් මඟින් පරීක්ෂණ පවත්වෙන බවක් රූපවාහිනියෙන් අසන්නට ලැබිණැයි කියන්නට පමා නොවූ මාලා මල්ලිකා පිටව ගියාය.

"මට එකෙක් මරා ගන්ඩ බැරි වුණානේ"

රෝගීන්, හෙදියන් හෝ වෛද්‍යවරුන් නොදුටු, රෝහලක නා නා ආකාර ශබ්ද නොඇසූ යුවතිය රාත්‍රිය මුළුල්ලේ පශ්චාත්තාපයෙන් මිරිකුණා ය. නිරන්තරයෙන් නහයට වදින බෙහෙත් ගඳ පවා ඇයට නොදැනිණ. ඇගේ මවගේ විලාපය පවා ඇය නොඇසුවා ය.

"අයියෝ මගේ රත්තරං අම්මා... අනේ මොකක් ද මේ වෙච්චි අපරාදේ..." යි පළමුව හඬා වැටුණ ඇය දෙවනුව ගහක් ගලක් මෙන් නිසලව හා නිහඬව ඉන්නා ආශාට පහර දුන්නා ය.

"මං උඹට කිව්වා... මං උඹට කිව්වා නේද මෝඩියේ මේ ටික වෙයි කියලා... උඩ දාගෙන ගියා ඉස්ටේජ් ගාණේ... දැං මොකද වුණේ...? උඹේ ගූ හුජ්ජ අත ගාපු ගෑනි සිහියක් පතක් නැතුව මැරෙන්ඩ වැටිලා... ඇත්තමයි මට උඹ මරාගෙන කැවත් මදි මේ කරපු අපරාදෙට... උඹට හෙණ ගහන්ඩෝනෑ... හෙණ හතක් ගහන්ඩෝනෑ... හෙණ හතක් ගහන්ඩෝනෑ මගේ රත්තරං අම්මට මේ කරපු දේට..."

ඉතා පහසුවෙන්ම චාන්දනී තල්ලු කර දමා ගැල වී යන්නට හැකිකමක් තිබුණ ද ආශා අතක් පයක් නොහෙල්ලුවා ය.

තව මොහොතකින් බිම පතිත වන්නට බැරි නැතැයි ඕනෑම කෙනෙකුන් තුළ බිය සැක දනවන ඒ මහත් වූ උදරය උසුලා ගනිමින් දියණියට පහර දුන් ගැහැණිය හති ලෑවා ය.

"උං උඹට මොනව හරි කෙරුව නං මට දුක නෑ... කට කැඩෙනකං එපා කියද්දි එක එකාගෙ ඉස්ටේජ් ගාණේ නැග්ග උඹට මොනව වුණත් කමක් නෑ... ඒ වුණාට අර අහිංසක ගෑනි...



මොන වැරැද්දක් කෙරුවටද...? පුලුවංකමකට ද කුලී වැඩ කර කර උඹට කන්ඩ අඳින්ඩ දුන්නෙ...? පන්සලකට ගියා ද? සිල් සමාදං වුණා ද? මලක් පහනක් පත්තු කෙරුවද...? නෑ... ඒ ඇයි? උඹ දාලා යන්ඩ බැරිකමට..."

සාත්තු සේවිකාවන් පැමිණ පසෙකට ඇදගෙන යනතුරුම චාන්දනී කෑ ගෑවා ය.

"ඒ මනුස්සයා උඹට පණ ඇරලා... පණ ඇරලා... මොනව හරි වෙච්චදෙං බලන්ඩ මගෙ අසරණ අම්මට... මං උඹ තැරි ගහනවා... ඇහේ හිට පට්ට ගහනවා..."

මැරයන් එවන ලද්දේ ප්‍රතිවාදී අපේක්ෂකයා නම් ඇය ඔහුට දොස් නොනගන්නේ මන්දැයි ආශා නිස්කාංසුවේ කල්පනා කළා ය. ගෙතුළ හුන් දැරියක බලහත්කාරයෙන් කෙලෙසූ සල්ලාලයා සම්බන්ධයෙන් චාන්දනී වචනයක් හෝ නොපවසන්නේ ඇයි? ඒ අඩ අඳුරු ගෙපැලේ ශක්තිමත් පුරුෂ කයකට යටවූ දුබල හා මුළුමනින් ම නොවැඩුණ, ඇතැම් විට මන්දපෝෂණයෙන්ද පෙළුණා වූ ස්ත්‍රී ශරීරය තුළ තමා පිළිසිඳ ගත් ඒ අප්‍රසන්න මොහොත පිළිබඳව පිළිකුල ද අප්‍රසාදය හා ක්‍රෝධයද කාලයාගේ ඇවෑමෙන් වියැකී යාමේ අරුමයක් නැතත් තවම විසිහතර පැයක් ගත නොවූ සිදුවීමේ වගකිව යුත්තා අමතක කරදමා හිරිහැරයට ලක් වූ තමාට බැනවැදීම ද පහර දීමද ආශාට වටහාගත නොහැක.

සුසුමක් හෙළිය යුතුව තිබුණේ ඇය වුවද සැබැවින්ම සුසුමක් හෙළුවේ සඳුන් ය.

"දැං කමු. බඩගිනියි" යි කී ඇය ඔහු අවසරය හෝ අනුමැතිය ලබා දෙනතුරු බලා නොසිට කොත්තුව දිගහැර ගත්තා ය. ඔහු ඇය දෙස බලාගත්වනම සිටියේ ය. හරියට පිටසක්වළ ජීවියෙකු දැක බය බිරාන්තවූ පෘථිවිවැසියෙකු පරිද්දෙනි. එහෙත් ඔහු තුළ රළ රැළි නැගුණේ බිය සැක හෝ වකිතය නොවේ. නිශ්චිතව කිව නොහැකි හැඟීම් සමුදායකි. තමා මෙන්ම මේ යුවතිය ද නොකළ වරදකට දඬුවම් ලද්දියක නොවේදැයි ඔහුට සිතිණ. මිහිඳුම් සළුවකින් වැසී ගියද මුළුමනින් ම මැකී නොයන කඳුකරයේ කළු ශිඛරයක් මෙන් ඔහු ගේ හදවතේ ඔහුගේ පියාගේ රුව

ගුණ ශේෂ වී තිබේ. ඒ ඇකයේ ද උරහිසේ ද උණුසුම ජීවිතයේ දුෂ්කර අවස්ථාවන්හිදී ධෛර්යය හා ශක්තිය ලබාදෙන බව ඔහු කෘතවේදී සිතින් සිහි කළේ ය. එහෙත් ගිජු ලෙස අහර බුදින නම හෝ නිසැක නොවන කෙල්ල පිය උණුසුම කවරේදැයි නොදන්නා බව පසක් කර ගනිමින් ඔහු නොහෙළ සුසුමක බරින් මිරිකුණේ ය.

# 18

ඇස් යට කළු පැල්ලම් කියාපෑවේ ඉකුත් රාත්‍රිය ඇය නිද්‍රාවර්ජිතව ගත කළ බවකි. කබල් ඇඳ හා කොහු මෙට්ටය කිසිසේත් සුවදායක නොවූ බව සැබෑය. එහෙත් ඇගේ නින්ද උදුරා ගත්තේ ඒවා විසින් නොවේ. වැසූ දොරට එපිටින් පැදුරු කබලක් මත දෑත දෙපා දිග හළ තරුණයා කිනම් මොහොතක හෝ තමා වෙත පැමිණෙනු ඇතැයි ඇය විශ්වාස කළා ය. ඒ බියෙන් සහ සැකයෙන් මඩනා ලද හදින් නොවන බව පිළිගන්නට තරම් ඇය මේ උදෑසන අවංක වෙයි. පොපියන හදින් හා පිබිදෙන ගතින් ඇය ඔහුගේ පා ගැටෙන හඬ අසන්නට නොඉවසිලිමත් වූවා ය.

වරක් පමණක් ඔහු ගේ දෙතොලට මැදි වූ ඇගේ තනපුඩුව කකියන්නට විය. ඔහු වහා වැළඳගෙන ඔහුට සිත්සේ දිය කෙළින්නට පොකුණක් වන රිසියෙන් ඇය ඒ මේ අත පෙරළුණා ය.

කාමරය තුළ හුදෙකලා කෙල්ලට සපුරා වෙනස් අන්දමින් අසෝබන ගෙබිම වැතිර හුන් කොල්ලා නොඉවසිලිමත් වූයේ ඇගේ කතාන්දරයේ ඉතිරි අඩ ඇන කියාගන්නට ය. හෙට රාත්‍රියට කල් තැබූ කතාව අසනතුරු ඔහුට කිසිදු සහනයක් නැත්තේ ය. ඇගේ මිත්තණියට සිදුවූයේ කුමක් ද? ඒ අසරණ අහිංසක මැහැල්ල සිහි නොලබාම මිය ගියේද? පුදුමයකට මෙන් සඳුනි යන නමින් තමා විසින් ආමන්ත්‍රණය කරන කෙල්ලගේ

Scanned with CamScanner

පහස පතා ගතවූ හැම රාත්‍රියකම විඳි පීඩාව හා ගත දවන ලද අනුරාගය වෙනුවට ඔහු මුසපත් කරවන ලද්දේ ඒ අන්දරයයි... ඇය නොකියා ඉතිරි කළ අඩයි. වහා නැගිට ගොස් තින්දේ පසුවන ඇය ඇහැරවා "ඔයාගෙ සිතම්මට මොකද වුණේ? සිහිය ආවද?" යි අසන්නට පවා ඔහුට සිතිණ. එහෙත් තමා කාමරයට ඇතුළු වූ සැණින් වරදවා වටහා ගන්නා ඇය පහර දීමට බැරි නැත. එළියට පැන රාත්‍රිය හෝ අඳුර නොසලකා පලායාමටද ඉඩ තිබෙන බව සිහි කරමින් හෙතෙම නිදාගන්නට වෑයම් කළේ ය. පසුදා රාත්‍රිය එළැඹෙන තුරු බලා හිඳීම හැරුණු කොට අන් කළ හැකි යමක් නොවන වග වටහා ගනිමින් නින්දක සුවය පතා දෑස තදකොට වසා ගත්තේ ය.

"වවුමට යනවනං මටත් මොකක් හරි වැඩක් හොයල බලන්ඩකෝ..."

බයිසිකලයට නඟින තරුණයා දෙස බලමින් ඇය තරමක මෘදු හඬින් ඉල්ලා සිටියා ය. එය ඇගේ සාමාන්‍ය ස්වභාවය නොවන බැවින් ඔහු මඳක් වික්ෂිප්ත විය.

"මාරයිනෙ... සැබෑ වෙනසක්..." යි කී සඳුන් මඳ සිනාවක් පෑවේ ය.

"ඇයි?"

ඇය කුකුසින් මෙන්ම තරමක ලැජ්ජාවකින් ප්‍රශ්න කළා ය.

"නෑ ඉතිං... ලස්සනට කතා කරන්ඩ පුලුවංනෙ... ඇයි බැරි හැම තිස්සෙම ඔහොම ලස්සනට කතා කරන්ඩ...?"

ඇගේ හිස පහතට නැඹුරු විය. ඉස්තෝප්පුව අතුගාමින් හුන් ඇය ඒ කාරියද නවතා කිව යුතු යමක් සෙව්වා ය.

"හරි හරි... හෙට වවුමට ගියාම මං බලන්නං මොකක් හරි..."

නිරුත්තර වූ කෙල්ල දෙස දිගින් දිගටම බලා හිඳීමෙන් විඩාපත් තරුණයා යන්නට සැරසුණේ ය.

"එ... එතකොට අද කොහෙද යන්නෙ?"



වහා හිස නැගූ ඇය මඳක් තැතනුවාය.

ඔහු හෙළු විමසිලිමත් බැල්මට ගොදුරු වන්නට නොකැමැත්ති පසෙකට හැරුණා ය.

"ගහක් කපන්ඩ... අතු පාහින්ඩ තියෙනවලු. වහලෙට බරවෙලා හිංදා අතු බාන්ඩත් වෙනවලු... දවසම යයි..."

ඒ පුවතින් ඇය මඳක් තැති ගත්තා ය. තමා වෙත යොමු වූ දෙඇසේ බියද ශෝකයද හැඳින ගත්තෙන් ඔහු විමතියට පත් විය.

"ඇයි අමුතු වෙලා? සනීප නැද්ද?"

"නෑ..."

ඔහුගේ දෑස මඟ හරිමින් ඇය යළි ගෙතුළට රිංගා ගත්තා ය.

ලාහිරු කිරණින් නැහැ වෙමින් ඔහු මොහොතක් බලා සිටියේ ය.

"ඒයි.... සඳුනි... අසනීපයක් නම් කියනවා..." යි ඔහු හඬ නංවා කතා කළේ හිමිදිරියේ පටන් ඇය වෙතින් යම් වෙනසක් දුටු බව හඟිමිනි.

"මටෑනි අසනීපයක් නෑ... තමුසෙ යන තැනක යනවා..."

ඇය නැවත පිටතට පැමිණියේ කොස්ස ද උරුක් කරගෙන ය. ඒ චණ්ඩ ස්වභාවය ඔහු ගේ සිතෙහි බර සැහැල්ලු කරයි.

"දැං නං පේනවා කිසිම අසනීපයක් නෑ කියලා... තමුසෙ ගෙ ලෙඩ දුක් බලන්ඩ ගිහිල්ලා මටයි තව පොඩ්ඩෙං අසනීප වෙන්ඩ වෙන්නෙ" යි කී සඳුන් බයිසිකලය පැද්දේ ය. පමණට වඩා දීර්ඝ කාලයක් පාවිච්චි කළ බව ද තිසි නඩත්තුවක් නැති බව ද කියාපාමින් චිරි බිරි හඬ නංවන බයිසිකලය මිතුරු මතක ඉස්මතු කරවයි.

"සල්ලි කීයක් හරි එකතු වෙච්ච හැටියේ අමරෙ අයියව බලන්ඩ යන්ඩෝ නෑ..." යි තොල් මතුරමින් කළණ මිතුරෙකුගෙන් වෙන්වීමට සිදුවීමේ කණස්සල්ල මැඩ ගත්තේ ය. එහෙත් දවස

Scanned with CamScanner

මුළුල්ලේ කය වෙහෙසා උපයාගත් සොච්චම් මුදලින් බත් පැකට්ටු දෙකක් ද රැගෙන ආ තරුණයා ඇගේ මුහුනේ කණස්සල්ල දැක තිගැස්සුණේ ය.

"ඇයි?"යි ඔහු ඇය ඇස ගැටුණු හැටියේ ඇසුවේ හිතාමතා නොවේ.

නොදැනුවත්තවම වාගේ ඒ පැනය ඔහුගේ මුවින් ගිලිහිණ.

"ඇයි?" යි ඇයද පෙරළා ප්‍රශ්න කළේ ඔහු අසත්තක් නොවැටහෙන නියායෙනි. එහෙත් ඔහු ප්‍රශ්න කරන්නේ තමා කණස්සල්ලෙන් පසුවන්නේ මන්දැයි යන්න බව ඇයට වැටහෙයි.

"මොක ද ඔය මූනෙ හැටි?"

"ඒ ඉතිං ලබා උපං හැටි තමා" යි ඇය වැඩි තැකීමක් නොකරන බව අඟවන්නට තැත් කළා ය.

"ඇත්තටම අසනීපයක් නම් කියනවා. මා ළඟ සල්ලි තියෙනවා... යං බෙහෙත් ටිකක් ගන්ඩ..." යි කී ඔහු මහත් උවමනාවෙන් ඉල්ලා සිටියේ ය.

"ඔයා මොකට ද මට බෙහෙත් ඇරං දෙන්නෙ...? ඔයා මගෙ කවිද? මං ඔයාගෙ කවිද?"

ඔහු කෑම පාර්සලය මේස කබල මත තබා ඇය වෙත ලංවිය.

"සඳුනි... දැං එතකොට ඒකද මෙතන තියෙන ප්‍රශ්නෙ?"

"ඒකත් ලොකු ප්‍රශ්නයක් තමා..." යි කියමින් ඇය කුස්සියෙන් පිට වූවා ය.

"මොනව වෙලා ද...?" යි ඔහු මහත් අසහනයෙන් තොල් මතුළේ ය. ඇය ප්‍රේමයෙන් හා අනුරාගයෙන් කැලතී කැළඹී හිඳින වග ඔහු වටහා නොගත්තේ ය. කුපිත වූ බැල්ලක මෙන් බුරා හැලෙන දිවි දෙනකගේ කෲරත්වයෙන් පිරි එකියක සිත ප්‍රේමයක් ජනිත වනු ඇතැයි ඔහු කිසිසේත් නොසිතුවේ ය.

"එනව කන්ඩ..."



ඔහු කාමරයේ දොරකඩ නැවතී හඬ ගැවේ රළු හඬිනි. ඇය ඇඳේ වැතිරී සිටියේ පුලුළුකුල කැපී පෙනෙන ආකාරයෙනි. ඒ අනුරාගී ඉරියව්ව පවා ඔහුගේ කෝපය අකා මකා දමන්නට සමත් වූයේ නැත.

"මේ... මට බඩගිනියි... මුලු දවසම අර කොහොඹ ගහ එක්ක ඔට්ටු වෙලා මට යකෙක් කන්ඩ බඩගිනියි. එනව යන්ඩ කන්ඩ..."

මට බඩගිනි නෑ..."

ඔහු තවත් පෙරැත්ත නොකොට කුස්සියට ගියේ ය.

"ඒකිට බඩගිනි වෙන්නෙ කොහොමද? දවසම ගේ අස්සට වෙලා නිකං ඉඳ්දි..."

සිය අප්‍රසාදය නොවලහා පළ කරමින් ඔහු කුස පුරවා ගත්තේ ය.

"ඕන්නං කන්නැතෑ... ආයෙ මං කවන්ඩැයි අනල..." යි කියමින් වුව හෙතෙම ළිප මත හට්ටි මුට්ටි පිරික්සා බැලුවේ ය."

"මඤ්ඤොක්කවත් තම්බගෙන කන්ඩැති බඩ පැලෙන්ඩ... ඉතිං ආයෙ කොහෙට්ට ද බත් කන්නෙ?"

එහෙත් ඒ අනුමානය නිවැරදි නොවී ය. හට්ටි මුට්ටි හිස්ව තිබිණ.

"එතකොට මුලු දවසම බඩගින්නෙද ඉඳල තියෙන්නෙ?"

ඔහුගේ ළය දැවී ගියේ ය.

"මොකක් හරි අසනීපයක් තමා... නැත්තං නොකා ඉඳී ගැනි..."

බත් පාර්සලය ද අතකින් ගත් සඳුන් ඇය වෙත ගියේ ය.

කනප්පුව මත චිමිනි ලාම්පුව වෙතින් සියුම් හඬක් නැගේ. එබඳුම සිහින් හඬක් තවමත් ඇඳේ වැතිර සිටින යුවතිය වෙතින්ද නැඟිණ. ඔහු ඇය වෙත නැඹුරු විය.

"ඒයි... කෝ නැගිටින්ඩ... මේ බත් එක කාලා නිදාගන්ඩ"

Scanned with CamScanner

"මටේපා..."

ඒ හැඩුම්බර හඬින් ඔහු කොතෙක් වික්ෂිප්ත වීද කිවහොත් බත් පාර්සලය ගිලිහී බිම වැටෙන්නට ද ඉඩ තිබිණ.

"අඬනවද...?" ඇයි අඬන්නෙ...?"

"කව්ද අඬන්නෙ...? මට මගේ පාඩුවේ ඉන්ඩ දීලා යනවද නැද්ද?"

"කිළිටි කොට්ටයේ මුහුන ඔබා ගත්වනම ඇය කෑගැසුවා ය. ඔහු ඇඳේ අයිනක හිඳ ගත්තේ ය.

"හරි... කව්රුවත් අඬන්නෙ නෑ... නැගිටලා මේ බත් එක කන්ඩ... ඔයා දවල්ටත් මුකුත් කාල නෑනේ... දවසෙම බඩගින්නෙද හිටියෙ...?"

තමා කුසගින්නෙන් නොව ප්‍රේමයෙන් හා රාගයෙන් දැවෙන බව හෙළි නොකළ යුවතිය "ම... මට බඩගිනි නෑ" යි මිමිණුවා ය.

"මට දවල්ට බත් කද්දි ඔයාව මතක් වුණා. ඒ වුණාට මම හිතුවා ඔයා මක්ෂ්ඃඛඃක්කා අලයක්වත් තම්බගෙන කන්ඩ ඇති කියලා... ඔයාට බඩගින්නෙ ඉන්ඩ බෑනේ..."

ඇය වහා උඩුකය කෙළින් කළා ය. ඔහුගේ ඇකයේ හිස හොවා ගත්තා ය. ඇය කිසි කලකත් එබන්දක් කරනු ඇතැයි කිසිසේත් නොසිතූ තරුණයා අන්දමන්ද විය.

"ස... සඳුනි..."

ඇගේ හැසිරීම වටහාගත නුහුණු සඳුන් කෙඳිරුවේ ය.

"මී... මං... මං හිතුවා ඔයා ඊයෙ රෑ මා ළඟට එයි කියලා..."

මඳ වේලාවක් කඳුළු සැලූ ඇය පහත් හා සෞම්‍ය හඬින් පැවසුවා ය. විදුලි සැරයක් වැදුණෙකු මෙන් ඔහු තිගැස්සුණේ ය.

"මො... මොකද්ද...?"

තමාගේ දෙකන තමා රවටන ලද බව අදහන්නට කැමති වූ සඳුන් පුදුමයෙන් ගල් ගැසුණේ ය.



"මං දන්නෑ... මට මුලු රෑම නින්ද ගියේ නෑ.. මට ඔයා ළඟට එන්නම හිතුණා... ඒ වුණාට ඔයා මොනව හිතයි ද කියල මට බය හිතුණා..."

ඔහු ඇය වැළඳගත්තේ සානුකම්පිත මදහසක්ද සමගිනි.

"මං නං හිතාගෙන හිටියෙ ඔයා බය කියන දේ මොකක්ද කියලවත් දන්නෙ නැති කෙල්ලෙක් කියලා..."

ඇය ඔහුගේ උරහිසේ කඳුළු තවරමින් හිනැහුණා ය.

"මට බය හිතිච්ච වෙලාවල් තිබ්බෙ නෑ කිව්වොත් ඒ බොරු... මටත් බය හිතුණා... දුක හිතුණා... ඒත් මං ඒවා පෙන්නුවේ නෑ... කාට පෙන්නන්ඩ ද...? මට මගේ කියල හිටපු එකම එක්කෙනාත් නැතිවුණාට පස්සෙ...?"

ඔහු නැවතත් තිගැස්සුණේ ය.

"සීතම්මා...? සීතම්මට මොකද වුණේ...?"

ඇය ඔහුට තව තවත් තුරුළු වෙමින් ජීවිතය හැර පියා ගිය මැහැල්ලගේ දිරාපත් සිරුර දකින්නට වෙහෙසුණා ය.

"සිහිසුන් මැහැල්ල වටා අනේක කැමරා එල්ල වුවද දේශපාලඥයන් බුරුතු පිටින් රෝහලට සම්ප්‍රාප්ත වුවද මිය ගිය මැහැල්ලගේ මළසිරුර අබියස අකම්පිත දෑසින් බලා හුන්නේ නව යච්චනිය පමණි. පාර්ලිමේන්තු මැතිවරණය නිමා වී මසකට වඩා වැඩි කාලයක් ගතවූයෙන් ඇගේ ජීවිතය හෝ මරණය තව දුරටත් ප්‍රවෘත්තියක් නොවෙයි. ඡන්ද ප්‍රචාරණ කටයුතු අවසන් වීමට නියමිතව තිබූ දවසේ සිදුවූ මැර ක්‍රියාවෙන් සීතා මිය ගියේ නම් ඊට ඉතා ඉහළ ප්‍රවෘත්තිමය වටිනාකමක් එක්වෙනවා මෙන්ම පාර්ලිමේන්තු අපේක්ෂකයාගේ මනාප සංඛ්‍යාව ද ඉහළ යනවා නොඅනුමාන ය. එහෙත් මීඹිබිරියගේ මිත්තණිය ගේ හෝ දේශපාලඥයාගේ අභාග්‍යයට මැහැල්ල ජීවිතය හැර පියා යන්නට මාසයකට වඩා වැඩි කාලයක් ලබා ගත්තා ය. ඒසා දීර්ඝ කාලයක් මුළුල්ලේ සීතා හුස්ම පමණක් ඉහළ පහළ හෙළන, වෙනත් කිසිදු කාර්යයක් කරන්නට අපොහොසත් පංචස්කන්ධයක් ලෙස රෝහලේ ඇඳක වැතිර සිටියා ය. මහත්

Scanned with CamScanner

වූ උදරය උසුලා ගෙන චාන්දනී ඇය බලන්නට එන කල මඟ හැර ඉන්නට ආශා පුරුදු වූවා ය. ඊට වැඩි කොටම හේතු වූයේ චාන්දනීගේ සැමියා ය. ඔහු දකින්නට කෙල්ල කිසිසේත් කැමති නොවූවා ය. අහම්බෙන් හෝ ඔහුගේ දෑස හමු වූ ඇසිල්ලේ ඇය ක්‍රෝධයෙන් දැවී ගියා ය. ඔහුගේ දෑසෙහිද ගැබ්ව තිබුණේ මෙතෙකැයි කිව නොහැකි වෛරයකි.

සිය මධුර හඬින් ද මනෝහර රුවින් ද අපමණ සහයෝගයක් ලබා දුන් දේශපාලඥයා ජයග්‍රහණය කළ බව ආශා දැක ගත්තේ රූපවාහිනියෙනි. ඒ සුබ ආරංචිය හෝ පවසන්නට මාලා මල්ලිකා නොපැමිණියා ය. ඇයගේ බැරෑඩි හඬ ද තරබාරු සිරුර ද මතකයට පමණක් සීමා විය.

ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකට එක් වී හවුල් ආණ්ඩුවක් පිහිටුවාගත් ප්‍රීතිය නිමිත්තෙන් දැල්වුණු අති විශාල රතිඤ්ඤා හා අහස්කූරු තොගයේ උස් හඬින් තැතිගත් බල්ලෝ වාට්ටු තුළට දිව එමින් සැඟවගන්නට අහුමුළු සෙව්වෝ ය. සාත්තු සේවක සේවිකාවන් ද කම්කරු කතුන් ද කොසු ඉදල් අමෝරා ගනිමින් බල්ලන් පලවා හරින්නට දැරූ ප්‍රයත්නය නිහඬව නිසලව නැරඹූ පරිද්දෙන්ම ආශා සිය මිත්තණියගේ මළ සිරුර දෙස බලා සිටියා ය. තමා මරණය සිහිපත් කළ හැම වාරයකම කිපෙන හඬන දොඩන මැහැල්ල යළි යළි දකිමින් වුව ඇය කඳුලක් නොසැලුවා ය. එහෙත් ජයග්‍රහණයෙන් උද්දාමයට පත් ආධාරකරුවන් අතරින් දේශපාලඥයාට මල් මාලයක් පළඳවන තැනැත්තා දකිත් ම ඇගේ දෑස දැල්විණ. ඇය රූපවාහිනිය වෙත තවත් පියවරකින් සමීප වෙමින් ඔහු හඳුනාගන්නට දැරූ ප්‍රයත්නය සඵල විය. පසෙක ලොකරයක් මත වන උණුවතුර බෝතලයත් දැතින් ගෙන රූපවාහිනී තිරය කුඩුපට්ටම් වන සේ දමා ගසන්නට උපදනා ආවේගය දරා ගැන්ම පහසු නොවී ය.

අවසාන රැලියට සහභාගි වීමට යන අතරමඟ පහර දුන් පිරිස අතර අතපත්තු ගේ ආධාරකරුවා සිටි බව ඇය ප්‍රත්‍යක්ෂ කර ගත්තා ය. ඔහු සමඟ පොර බඳනා අතරතුර ඇය ඔහු ගේ මුහුණ වසා ගත් රෙදිකඩ ගලවා විසිකළ බැවිනි.



"පරයා... ජඩ බල්ලා..." යි ඇය ඇසෙන නෑසෙන හඬින් නව දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් පෙනී හුන් දේශපාලඥයාට අවමන් කළා ය. කකියන රුහිරු ඇයට එක තැනක ඉන්නට ඉඩ නොදෙයි.

ජයග්‍රහණයෙන් පසු සීතා බලන්නට පැමිණි අතපත්තු ගෙන ආ අඩුම කුඩුම කොට බිත්තිය මතින් ඉවතට විසි කළ ආශා ගිනි පුපුරු විහිදෙන දෑසින් බලා සිටියා ය.

"ඇයි මේ? පහුගිය ටිකේ නිකමටවත් හොයල බලන්ඩ බැරි වුණා තමා... කොහෙද ඉතිං කෙරුවෙ ඡන්දයක් යැ... යුද්ධයක් නෙ... මං ගැනු කෙනෙකුත් එක්ක ආවා. මෙයා ලෙඩා ළඟ ඉදී. ඔය ළමය යං මා එක්ක..."

ආගන්තුක ගැහැනිය පැ සිනාව අපතේ ගියේ ය. පුවත්පත් හා රූපවාහිනී කැමරා ශිල්පීන් සංවේදී දසුන් පෙළක් පතා කැමරා ආම්පන්න මානාගෙන සිටියේ ගොදුරක් වටකර ගත් දඩයක්කරුවන් පරිද්දෙනි. එහෙත් මේ හැන්දෑවේ සිහිසුන් මැහැල්ලගේ මිණීබිරිය දඩයක්කාරිය වූවා ය. අන්ත අමානුෂික දඩයක්කාරියකගේ කෘරත්වයෙන් උතුරා යමින් ඇය පළමුව ගැහැනිය දෙස රවා බැලුවා ය. ඒ රුදුරු බැල්මෙන් සාත්තු සේවිකාව තිගැස්සුණා ය.

"පලයං... මගෙ දෑහට නොපෙනී පලයං යන්ඩ..."

එක්රැස් වී සිටින පිරිස පිළිබඳ ව බිඳකුදු නොතකා කෙල්ල අතිශය රළු හඬින් අණ කළා ය.

"මේ... මොකද්ද මේ ළමයගෙ නම...?"

අතපත්තු හැබෑම පුදුමයෙන් ප්‍රශ්න කළේ ය.

"මගෙ නම කියන්ඩ කලිං අපිට ගහන්ඩ එව්ව බල්ලං ගෙං තමුසෙට මල්මාලෙ දාපු බල්ලගෙ නම කිව්වොත් නේද හොඳ..."

වාට්ටුවේ තැන තැන නිරන්තරයෙන් නැගෙන්නා වූ කෙඳිරිලි හඬ පවා අතුරුදහන් විය. නිශ්ශබ්දතාවය කොතරම් වේදනාකාරී වී දැයි දේශපාලනඥයා ගේ විරූපී වූ මුහුණ කියා පෑවේ ය. උන්හිටි හැටියේ හටගත් නිශ්ශබ්දතාවය නොව ඊට

හේතුපාදක වූ කියුම ඔහු භ්‍රාන්තියට පත් කළ වග පෙනෙන්නට තිබිණ.

"මේ ළමයට ලොකු වැරදීමක් වෙලා... පොඩ්ඩක් මං..." ඔහුට නිර්දෝෂී වන්නට ඉඩ හැර මුනිවත රකින්නට ඇය සූදානම් නොවූවා ය.

"පලයං මහත්තයා යන්ඩ මගෙං හොඳ කුණුහරප අහගන්නෙ නැතුව..."

රූමත් යව්වනියකගේ මුවින් එබඳු කර්කශ වදන් අපේක්ෂා නොකළ මාධ්‍යවේදීන් විපිළිසර වූහ.

"මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන්හී තම රුව දකිනු ලැබීමේ නොතිත් ආශාවෙන් පසු වූ වාට්ටු බාර වෛද්‍යවරයා හා හෙදියන් පමණක් නොව රෝහල් අධ්‍යක්ෂවරයා ද දිළිඳු යුවතියට සිතින් ශාප කරමින් දේශපාලඥයාගෙන් පුන පුනා සමාව අයැද සිටියහ.

"කෙල්ලට විසාදිය... කිරියම්මට තාම සිහිය නැනේ... ඔහොම තමා..."

අතපත්තු ආපසු යන අතරේ උමතු යුවතිය වෙනුවෙන් කණගාටු විය. සැහැල්ලුවෙන් පසුවන බව හැගෙව්වද තමාගේ සැලසුම මුළුමනින්ම සාර්ථක නොවීම සම්බන්ධයෙන් ඔහු දැඩි කෝපයෙන් දත් සැපුවේ ය. මැර කණ්ඩායමට ඔහු උපදෙස් ලබා දී තිබුණේ විරිදු කියන කෙල්ල පැහැර ගැනීමට ය. දේශපාලන වේදිකාව තම ආධිපත්‍යයට නතු කර ගන්නා රූමතිය සමග යහන් ගතවීම පමණක් නොව ප්‍රබල ආධාරකාරියක අතුරුදහන් වීමේ ප්‍රවෘත්තියෙන් රට කළඹන්නට අපේක්ෂා කළේ ය. එහෙත් ඒ කමකට නැති මැහැල්ල කඩා වැදී එවන් අගනා සැලසුමක් ව්‍යර්ථ කළා ය. නැවත ඇසිපිය සලන බවට කිසිදු විශ්වාසයක් නැති ජරපත් මැහැල්ල සමීපයෙහි සාත්තුකාරියක නවතා කෙල්ල කැටිව යාමට පැමිණි ඔහු ආපසු යන්නේ අපේක්ෂා භංගත්වයෙන් මෙන් ම ඉවසිය නොහෙන කෝපයෙනි. රෝහල තුළ නිරන්තරයෙන් රැඳී සිටින ආශා පැහැර ගැනීම දුෂ්කර කටයුත්තක් නොවෙතත් හදිසි විය යුතු නැතැයි ඔහු තීරණය කළේ ය.



"නිවුස් එක එඩිට් නොකර දානවා එහෙම නෙවේ..."

මාධ්‍යවේදීන්ට අණ කරමින් රූපවාහිනි චැනල හා පුවත්පත් ආයතන හිමිකරුවන් සමග ද කතා කිරීමෙන් පසු ඇගේ පහස වෙනුවෙන් තවත් ටික කාලයක් ඉවසා සිටින්නට හෙතෙම ගිවිස ගත්තේ ය.

තවු ලද ප්‍රවෘත්තිය හේතු කොටගෙන පැමිණි විකල්ප ධාරාවේ මාධ්‍යවේදීන්ට ඉක්මණින් ආපසු හැරී යාමට සිදු වූයේ ආශා ගොළුවත බිඳින්නට කැමති නොවූ බැවිනි. කැමරාවක් අතැති කිසිවෙකු දකින්නට හෝ ඇය සූදානම් නොවූ අතර දේශපාලඥයා හා යුවතිය අතර දෙබස මකන කැබැල්ලකින් මැකූ කලෙක මෙන් මකා දැමිණ. දේශපාලඥයා රෝගී දුගී කත බලන්නට පැමිණි මොහොතේ කිසිවක් සිදු වූ බවට කිසිදු වාර්තාවක් පළ නොවූවා සේම එබන්දක් ඇසූ දුටු අයෙකු ද නොසිටියේ ය.

ආගමික වතාවත් හා සැරසිලි ආදියෙන් තොර අවමඟුලේ කිසිදු උත්සවශ්‍රීයක් නොවී ය. එහෙත් අතපත්තු ඇමතිවරයා අමාත්‍යාංශයේ වැඩකටයුතු ඇරඹුයේ මහත් උත්සවශ්‍රීයෙනි.

"මට මිනිය ගෙනියන්ඩ බෑ..." යි ඇය එක එල්ලේ කියා සිටි අතර පැහැදිලි කිරීමක් හෝ තවත් වැඩි විස්තරයක් අපේක්ෂාවෙන් බලා හුන් බලධාරීන් අසමාන්‍ය නිහැඬියාවකින් අනතුරුව ඒ ඉල්ලීමට ඉඩ දුන්හ.

මිණිබිරියට පණ දෙවැනි කොට ඇළුම් කළ මැහැල්ල මහපොළොවේ සැඟව යන අන්දම ආශා වියළි දෑසින් බලා සිටියා ය. කඳුළු සලා වැළපෙන යුවතිය මෙල්ල කරගන්නේ කෙලෙසදැයි කල්පනා කළ යමෙක් වී නම් ඒ කල්පනාව පිළිබඳව පසුතැවෙනවා නිසැකය. වළට පස් මිටක් අතහරින කල පවා ඇගේ දෑසින් කඳුලක් රූරා නොහැලිණ. එහෙත් සැතපුම් ගණනාවකට නුදුරින් සිය දෙවන දරුවා බිහි කරමින් ඇගේ මව විලාප දුන්නාය. රෝහලින් පිටවූ කෙල්ල කිසිවකුගෙන් සමු නොගත්තා ය. සියළු දෙනා කෙරෙහි උරණ වූවාක් මෙන් ඇය රෙදි මල්ලත් අතින් ගෙන පාරට ගොඩ වූවා ය. තමා

පැමිණෙනතුරු මඟ බලා ඉන්නා මනුස්ස පරාණයක් ඒ අඩ අඳුරු ගෙපැළේ නොසිටින බව සිහි නොකළා ය. කිසියම් බන්ධනයකට යටත් වූවාක් මෙන් ඇය බසයට නැඟුණා ය. ගමනාන්තය විමසූ විට මෙන්ම මුදල් ඉල්ලා සිටි විට ඇය කොන්දොස්තර දෙස බැලුවා විනා කිසිත් නොපැවසුවා ය. අවුල්ව ගිය හිසින් ද කිළිටි ගවොමින් ද ඇය පෑ අර්ධ උන්මත්තක බවින් කැළඹී ගිය කොන්දොස්තර ඒ තිබුණු බැල්මෙන් අපහසුතාවයට පත්වූයේ, තවත් වචනයක් හෝ නොදොඩා ඉදිරියට ගියේ ය.

පුරා මාසයකට පසු ආශා දකින්නේ දැවී ගිය සැකිල්ලක් මිස ගෙපැළක් නොවේ. තමා සමග වසර ගණනාවක් එක වහලක් යට ජීවත් වූ මිත්තණිය අවසන් සුසුම් පොද මුදා හළ මොහොතේ පවා නොකැළඹුණු කෙල්ල කෝපයෙන් ද ශෝකයෙන් ද උමතු ව ගියා ය.

"කවිද මේ බලු වැඩේ කෙරුවේ? මේක නං කරන්ඩ ඇත්තෙ අතපත්තුවා හෙමේ අර පාහර වසන්තයා"

ඇය ගෙපැළක නෂ්ඨාවශේෂයක් ලෙස ඉතිරි වූ සුන්බුන් වටා යමින් දන්නා තරම් කුණුහරුප කිය කියා දෙපක්ෂයේ දේශපාලඥයන් දෙදෙනාටම බැන වැදුණා ය. ඇඳේ වැටී වැතිර දින දෙක තුනක් වුව නිදා ගන්නට පමණක් උවමනා වූ කෙල්ල ගින්නෙන් දැවී ගිය ගෙපැළ ඇඳහිය නොහැකි ව වුව කඳුළක් නොහෙළුවා ය.

වේදනා ගෙන දෙන තරමට බරට ඇනුණ මල්ල ඒ සුන්බුන් ගොඩටම විසිකළ ඇය ආපසු හැරුණා ය. ඉනික්බිති ගෙවී ගියේ අඩ පැයකි.

පරාජිත දේශපාලඥයාගේ දෙමහල් මැඳුර දැඩි නිහඬතාවයක ගිලී තිබිණ.

"ආ මොකද මොකද මේ... කව්ද මේ? කොහෙද යන්නෙ? යි අසන්නට රැකවලෙකු නොසිටියෙන් ඒ පැනය ඇසුවේ වසන්ත බණ්ඩාරගේ ප්‍රිය බිරින්දෑ ය.

"වෙන කොහෙ යන්ඩද?" ගේ පුච්චලා දාපුවහම මෙහෙ එන්නැතුව වෙන කොහෙ යන්ඩද?"



සිය ජීව විද්‍යාත්මක පියාගේ බිරින්දෑ දෙස එක එල්ලේ බලමින් පෙරළා ප්‍රශ්න කළ කෙල්ල ඉදිරියටම ගමන් කළා ය.

"මොනවා?" යි අප්‍රමාණ පුදුමයෙන් ඇස් අයාගත් ගෑනිය "වසන්ත... වසන්ත මෙහෙ එන්ඩකෝ... මේ බලන්ඩකෝ..." යි කෑ ගැවා ය. කහබිලියා ගිලුණ කලෙක මෙන් ඇය නොඉවසිලිමත්ව නළියන්නට වූවා ය.

අඳුරට අභියෝග කරන අයනා විදුලි පහන් වෙනුවට කලෙකින් පවිත්‍ර නොකළා කහත්පුව මත දල්වෙමින් තිබූ චිමිනි ලාම්පුව වෙතින් හඬක් නැඟිණ. ඒනම එය තිබී ගියේ ලාම්පු තෙල් හමාර වූ බව දැනුම් දෙමිනි.

"ලාම්පුව නිවුණා..." යි හඬ නැගුවේ ආශා මිස සඳුන් නොවේ. ඔහු ඇගේ පියාගේ දෙමහල් මැදුරේ අසිරිය දැක බලාගන්නට නොව පියා ද දියණිය ද අතර හමුව තවරාකාර වේදැයි නොඉවසිල්ලෙන් පසුවිය.

"දැං මං කන්නෙ කොහොම ද කච්චරේ...?" යි ආශා ඇසුවේ කිසිවක් සිදු නොවූ විලාසයෙනි.

"ඉස්සෙල්ලා කන්ඩ බෑ කිව්වෙ..."

අඳුරේ මෝරන අනුරාගය ඔහුගේ සිරුර පමණක් නොව ස්වරය ද උණුසුම් කරවයි. ඒ බව හැඟී ගියෙන් ඇය වහා ඔහුගේ තුරුලෙන් මෑත් වූවා ය.

"සඳුනි..." යි ඔහු නොඉවසිල්ලෙන් ද ගැහෙන හඬවතින් ද කොඳුළේ ය. ඇය නැඟී සිටියා ය.

"මට බඩගිනි යි..."

ඇය ඇඳ මත පෙරලාගන්නට උපදනා අපමණ ආශාව මැඩ ගනිමින් ඔහු ද නැඟී සිටියේ ය.

"ජනෙල් පඩිය උඩ ඉටිපන්දමක් තිබ්බා..." යි ඇය සිහිපත් කළා ය.

ඉටිපන්දමේ ඇබිත්තන් ආලෝකයෙන් බත්පත ගිල දමන කෙල්ල දකින කල ඔහුගේ අනුරාගය වියැකී යයි. ඇය මුහුන

දුක් අනේක දුක් ගැහැට සිහිපත් වූයෙත් ඔහුගේ සිත දයාවෙන් පිරී යයි.

"හෙමිං කනවා... මං වතුර එකක් ඇරං එන්නං..." යි ඔහු තරවටු කළේ ආදරබර පියෙකු මෙනි.

තමා හැඟීම්වලට වහල් නොවී දුරදිග සිතා බැලිය යුතු බව ආශා කල්පනා කළේ අවසන් බත් පිඩද මුවෙහි ලා ගනිමිනි.

"අපි කසාද බඳිමු" යි ඔහු නොපවසනතාක් තමා ඔහුට ඉඩදිය යුතු නැතැයි ඇය තීරණය කළේ පැසුණු ගැහැනියක පරිද්දෙනි.

සඳුන් ගෙනා වතුර කෝප්පය එක හුස්මට බීව ඇය නැඟී සිටියාය. ඉටිපන්දම් එළියෙන් වඩාත් සෝබමානව දිස්වන ඇය "අතෙහි තැවරුණ ඉඳුල් සෝදා ගත යුතු බව පවා අමතක වූයෙන් ඔහු ඇය වැළඳගන්නට තැත් කළේ ය.

"අත්ත අහට්ට යන්ඩ... මට අත හෝදගන්ඩ ඕන" යි රළු හඬින් කියමින් ඇය ඔහු පසෙකට තල්ලු කර ඇමුවා ය.

"සඳුනි..."

ඇගේ පහස පතා නොඉවසිලිමත් වූ තරුණයා තුරාබර හඬින් කෙඳිරීය.

"අනේ මේ වද නොදී ගිහිං බුදියගන්නවද...?" යි කෝපයෙන් ඇසූ ඇය ඉටිපන්දමද ගෙන කාමරයෙන් පිට වූවා ය.

තමාගේ ඇකයේ මුහුන ඔබා ගනිමින් හඬාවැටුණේද ඇයම නොවේදැයි ඔහු කල්පනා කළේ මහත් පුදුමයෙනි.

ඇගේ ස්පර්ශය ද ඇගේ කඳුලද එකට එක්ව අවදි කරවන ලද සිරුර වාවාගත නුහුණු තරුණයා ගන අන්ධකාරය බාධාවක් කොට නොසැලකුවේ ය. ඔහු කුස්සියට කඩා වැදුණේ තව දුරටත් ඇය අත නැටවෙන රූකඩයක් විය යුතු නැතැයි ඇඩිව හඟිමිනි.

ඔහු තමා හඹා එන බවක් නොසිතූ ඇය තිගැස්සුණා ය.



"ඇයි?" යි ඇය ප්‍රශ්න කළේ උසට උසේ හිටගෙන ඉන්නා සඳුන් කුමක් හෝ අඩවියක් අල්ලන්නට මාන බලන බවට සැක හිතකව හටගත් සැකයෙනි.

"තමුසෙ හිතන්නෙ මං පොන්නයෙක් කියල ද?"

ඇගේ හද සැලිණ. ඔහුට තුරුළුව හඬා වැටෙන්නට තරම් තමා අනුවණ වූයේ මන්දැයි ඇය සිතුවේ මහත් පසුතැවිල්ලෙනි.

"අපරාදේ. පාඩුවේ හිටපු කොල්ලව මං අවුස්ස ගත්තා..." යි ඇගේ සිත ඇයටම චෝදනා කළේ ය.

"එක්කො මට පාඩුවේ ඉන්ඩ දෙන්ඩ ඕන. දැං පොඩ්ඩකට කලිං මාව බදාගෙන ඇඬුවෙ මොන මගුලකටද?"

මේස කබල මත දැල්වෙන ඉටිපන්දම මත ඇගේ දෑස රැඳිණ. හතර වටින් එබිකම් කරන අන්ධකාරය ඇතට පළවා හරින්නට අපොහොසත් ඒ සිඟිති දුබල පහන් සිල මෙන් අසරණ වන්නට ඇය සූදානම් නැත.

"කියනවා... ඇයි එහෙනං ඇඬුවෙ...? මේ ඩිංගට වෙස් පෙරළුණේ කොහොම ද? හිතුණම බදාගන්නවා... හිතුණම පැනල දුවනවා... මං පඹයෙක් වගේ ද පේන්නෙ...?"

ඔහු ඇගේ දෙවුරින් අල්ලා සෙලෙව්වේ ඉවසිය නොහෙන කෝපයෙනි.

"මාව අතාරින්ඩ..."

ඔහුගේ එකදු ප්‍රශ්නයකට හෝ පිළිතුරක් නොදුන් ඇය පාලනය කරගත් හඬකින් ඉල්ලා සිටියා ය.

"ඔව්... මං හැම තිස්සෙම ලැහැස්තිවෙලා ඉන්ඩ ඕන තමුසෙ කියනකොට අතාරින්ඩ... ඒක යකාගෙ වැඩක්නෙ... කෙල්ලෙක් එක්ක දවස් ගානක් මේ ගේ අස්සේ තට්ට තනියෙං ඉඳලත්.

ඉවසීමේ ඉම ඉක්ම වූයෙන් ඇය ඔහුට ඒ කතාව හමාර කරන්නට ඉඩ නොදුන්නා ය.

Scanned with CamScanner

"කෙල්ලෙකුයි කොල්ලෙකුයි තනිවෙච්ච හැටියෙ ඒ දේ සිද්ධ වෙන්ඩම ඕනෙද...? කෙල්ල කැමති වුණත් නැතත් කොල්ලා කොහොම හරි කෙල්ල එක්ක බුදිය ගන්ඩ ඕන... එහෙම නැත්තං ඒක ඒ කොල්ලට මදිකමක්... පිරිමිකම ඒක කියලයි හිතාගෙන ඉන්නෙ... පුදුම කතාවක්නෙ ඒක..." යි ඇය කෝපයෙන් කෑගැවා ය.

"මං මගේ පාඩුවේ හිටියෙ නැද්ද...? කව්ද දැං මාව බදාගෙන ඇඳුවෙ...? මාව අවුස්සලා ඊළඟට මාව පත්තගන්නවා... තමුසෙ තමුසෙට ඕන විදියට මාව නටවනවා... අද මං තමුසෙට පෙන්නන්නං මාත් පිරිමියෙක් කියලා..."

ඔහු ඇය වැළඳගත්තේ සෙනෙහසකින් නොව ළය නැතැරෙන ද්වේෂයෙනි.

"අතාරිනවා... අතාරිනවා මාව..."

ඇය ඔහු සමඟ පෙර බදින්නට වූයේ වියරුවෙන් මෙනි. කෙසේ හෝ ඔහුගේ ග්‍රහණයෙන් ගැලව ගත යුතු යැයි ඇය තුළ වූ අධිෂ්ඨානය වඩා මුවහත් කරන ලද්දේ ඇයගේම මවය. ඇගේම පියාය. මව මුහුන දුන් ඉරණමම අත්පත් කරගන්නා දියණියක වීමට ඇය කිසිදිනකත් කිසිසේත් සූදානම් නැත. එහිලා ඇයට ධෛර්යයද ශක්තිය ද නොමඳව පුදන්නී ඇය වෙනුවෙන්ම දිවි දුන් ඒ කුඩා කෙසග මැහැල්ලයි.

"අද නං අල්ලගන්නෙ අතාරින්ඩ නෙමෙයි."

ඇය ඔහුගේ දෙතොල නොඉවසුවා ය.

"අතෑරපිය... අතෑරපිය යකෝ මාව"

ඔහු සිය ග්‍රහණය දැඩි කරමින් ඇය සිඹින්නට වූයේ උන්මත්තකයෙකු පරිද්දෙනි.

"අතාරින්නං... හැබැයි මට ඕන දේ කෙරුවට පස්සෙ..."

"ඔව් ඉතිං... එච්චර තමයි උඹලට කරන්ඩ පුලුවං... කොහොමටත් තමුන්ගෙ වැඩේ කරගෙන අතාරින එක තමා උඹල වගේ පිරිමි කරන්නෙ... වල් බල්ලො... බල්ලොත් එහෙමනෙ...



දකින දකින බැල්ලි පස්සෙ යනවා... වැඩේ කර ගත්තට පස්සෙ අතෑරලා දානව. පැටව් එක්ක ඉන්න බැල්ලියක් මිසක බල්ලෙක් දැකල තියෙනවද මේ ලෝකෙ කව්රුවත්... පැටව් බැල්ලිට... දුක බැල්ලිට... බර බැල්ලිට... බල්ලා ෂෝක් එකට ඉන්නවා... නව බැල්ලියක් පස්සෙ යනවා... බල්ලගෙයි උඹලගෙයි වෙනසක් තියෙනව ද? නෑනේ... කිසි වෙනසක් නෑ..."

ඇගේ කඨෝර වාග් ප්‍රකාරයෙන් ඔහුගේ ශක්තිය මෙන්ම ද්වේෂයද අනුරාගය ද පිරිහුණේ ය. එපරිද්දෙන්ම ඔවුන් ගේ පෙර බැඳීමෙන් මේසයේ ද ආයු කාලය හමාර විය. එය හඬ නංවමින් කැඩී බිඳී ගියේ ඉටිපන්දමේ දුබල ආලෝකයද උදුරා ගනිමිනි. තිත්ත කළුවර ඔහු මුළුමනින්ම අධෛර්යමත් කරන ලද අතර ඇය එහි වාසිය සපුරා අත්පත් කර ගත්තා ය.

"ආයෙ අල්ලපං බලන්ඩ මාව... ගෙනවා මළකට්ට පුපුරන්ඩ" යි ඇය තර්ජනය කළේ කළුවරේ අතපත ගා සොයාගත් මේස කකුල අමෝරා ගනිමිනි. ඇය අත ඇත්තේ කුමක්දැයි ඔහු නොදුටු අතර ඒ වචන එයාකාරයෙන්ම ඉෂ්ට සිද්ධ වන බව නම් ඉඳුරා දත්තේ ය.

"ඒයි ඒයි... ගහන්නෙ නං නෑ ඔන්න... කළුවරේ කොහෙට වැදෙයිද දන්නෑ..." යි ඔහු හඬ ගෑවේ හිතා මතා නොවේ. නිරායාසයෙන් ම ඔහුගේ මුවින් ඒ වදන් ගිලිහිණ. එයින්ම තමා පරාජය පිළිගත් බව පසක් වූයෙන් ඔහු නොසන්සුන් විය.

"හරි හරි... මං අල්ලන් නෑ තමුසෙව... ඉවරයිනෙ"

ඇය නිහඬවම තමාට පහර දෙනු ඇතැයි සැකයෙන් ඔහු නැවතත් කතා කළේ ය.

"ඉවරයක් වෙන්ඩ නං මං මෙහෙං යන්ඩ ඕන"

මේස කකුල ඇතේ තිබෙන තුරු තමා සුරක්ෂිත බව හඟිමින් ඇය කෙමෙන් වියැකී යන ක්‍රෝධයෙන් පැවසුවා ය.

"තමුසෙ කොහෙ යන්ඩ ද...? මං යන්නං ඉවරනෙ කතාව..."

කෝකටත් ඇය වෙතින් ඈත් වූ තරමට තමාගේ හිස් කබල පළුදු නොවන බව සිතමින් ඔහු පියෙන් පිය ආපස්සට ගියේ ය.

"තමුසෙටත් යන්ඩ තැනක් නැතේ..."

"මං කොල්ලෙක්. මට ඕන තැනක ගියහැකි"

ඔහුද උස් හඬින් උත්තර දුන්නේ ය.

"හිරේ ගිය මනුස්සයා ළඟදී එයි කිව්වා නේද...? ඒ මිනිහා මාව එලවයි..."

අමරසිරිගේ ලෙන්ගතුකම සිහිපත් කරමින් හෙතෙම සුසුම් හෙළුවේ ය.

"එලවයි ද කසාද බැඳගනියි ද කව්ද දන්නෙ..."

ඇගේ මුව'ග සෝපහාස සිනාවක් නැගිණ.

"කව්ද මාව කසාද බඳින්නෙ...?"

ඔහු කිසිවක් නොපැවසුවේ ය.

"ඇයි මං...? මං කැමතියි ඔයාව කසාද බඳින්ඩ... යි ඔහු මද වේලාවක් ගතකොට හෝ පවසන බවට ඇය තුළ උපන් විශ්වාසය බිඳ වැටිණ. ඔහු නිරුත්තරය. කුමාර මෙන්ම සඳුන් ද විවාහය නම් භාරධූර මාතෘකාව අබියස නිහඬ ය. අපමණ කලකිරීමෙන් හේබායමින් ඇය මේස කකුල පසෙකට විසි කළා ය. එය නැගූ හඬ අඳුර විනිවිද ඔවුන්ගේ දෙසවන් තුළ දෝංකාර දුන්නේ ය.

# 19

ඒ ඒකාකාර හඬ ඇගේ නිදිබර ඇස් සලිත කරවයි. මැදියම් රැය ඉකුත්ව යන තෙක්ම අවදියෙන් පසුවූ ඇය නිද්‍රාවෙහි ගිලුණේ අළුයම් කාලයේ ය. පරාජය වීමේ අවමානයෙන් මිදෙන්නට ඔහු කිනම් මොහොතක හෝ තමා වෙත පැමිණෙන බවට හටගත් සැකයෙන් ද බියෙන් ද ඇය නොකඩවා පිඩා වින්දා ය. වැසූ දොරට එපිටින් නින්දේ පසුවන බව අයවන්නාගේ සිරුර අවදි වී ඇතැයි හැඟී ගනිමින් රාත්‍රිය ගෙවා දැමීම කොතෙක්නම් දුෂ්කර විද...? තමා පලා නොයන්නේ මන්දැයි ඇය විටින් විට කල්පනා කළා ය. එහෙත් මේ ජරාජීර්ණ නිවෙස තුළ සිටින්නාට වඩා ඒ පිටත විශාල ලෝකයේ සිටින්නවුන් යහපත් බව විශ්වාස කරන්නට තරම් ඇය අනුවණ නොවෙයි.

ආශා තැඟී සිටියේ තවත් ටික වෙලාවක් හෝ නින්දේ සුව අයදින දෙනෙතටද සිරුරට ද තරවටු කරමිනි. ඒ ඒකාකාර හඬ ඇසෙන්නේ මිදුල දෙසිනි.

"සීතම්මා...?"

ඇගේ වියළි දෙතොල සැලිණ.

හැම උදයකම ඇය අවදි වූයේ සීතම්මා මිදුල අතුගාන හඬිනි.

"සීතම්මා...!"

Scanned with CamScanner

ඇය කාමරයෙන් පිටව ඉස්තෝප්පුව තෙක් දිව ගියේ කකියන හදවතිනි. ඇගේ ඇස් දකින්නට අපේක්ෂා කළ කුඩා කෙසඟ මැහැල්ල වෙනුවට මිදුල අතුගාමින් සිටියේ උස සිහින් තරුණයා ය.

තමා වෙනුවෙන් අනන්ත අප්‍රමාණ දුක් ඇරූ මිත්තණිය යළි කිසි කලකත් දක්නට නොලැබෙන බව පසක් වූයෙන් ඇගේ දෑසට කඳුළු නැගිණ. ඒ හාම අරුණෝදයේ ළා හිරු කිරණින් වඩාත් ඔප් නැංවෙන ඒ කඩවසම් සිරුර ඇගේ වියෝ දුක තුනී කර දමයි. ඉනික්බිති සිත පුරා පැතිර යන ප්‍රේමනීය හැඟුමින් ඇය නොසන්සුන් වූවා ය. විවාහය පිළිබඳව වචනයක් පවසනවා තබා ඉඟියක් හෝ නොකරන තරුණයෙකුහට ප්‍රේම කරන්නට තරම් තමා අඥාණ හා ළඳබොළඳ වීම පිළිබඳව ඇය කිපුණා ය. එහෙයින් ඔහු හිස නගා පෑ සිනාවට ප්‍රතිචාරයක් නොදක්වා ආපසු හැරුණා ය.

කුස්සියට වැදුණ ද ළිප මත මුට්ටියෙන් වහනය වන සුගන්ධයෙන් ඇය තවත් කැළඹුණා ය.

"මඤ්ඤොක්කාත් තම්බලා" යි තොල් මතුරමින් ඇය හිස කැසුවා ය. තෙල් බිඳකද ඇති ලොකු පනාවක ද පහස යැද ඇගේ කෙස් කළඹ සුසුම්ලන්නාක් මෙනි. වදෙන් පොරෙන් වුව මිණිබිරියගේ හිසෙහි තැඹිලි තෙල් ගල්වා පීරන්නට සීතා දැරුවේ පුදුමාකාර වෙහෙසකි.

"මොන කරදරයක්ද මේ... එපා වෙනවා අප්පා..." යි අප්‍රසාදය පළකරන කෙල්ල වැඩි වේලාවක් ගත ව යාමට පෙර ඒ සුවයට ලොල්ව ඇස පියා ගනියි.

පෙරදා රැයෙහි මුළුමනින් ම කැඩී ගිය මේසය ඉවත් කර තිබිණ. ලුණු මිරිස් තලිය කෙසෙල් කොළයක ඔතා තිබිණ. ඒ දැකීමෙන් ඇගේ ආහාර රුචිය වර්ධනය වෙනවා වෙනුවට ඇය කෝපයෙන් ඇවුණා ය. දුන්නෙන් මුදා හැරුණු ඊතලයක් මෙන් ඇය එක පිම්මට දිව ගියේ මිදුලට ය.

අතුපතු ගා හමාර වූයෙන් ඔහු සැනසුම් සුසුමක් හෙළන්නට ලක ලැස්ති වූවා පමණි. තවත් පමා නොවී පිටත්ව යා යුතු බව



ඔහු සිහි කළේ අසතුටින් නොවේ. ගස් කට්ටිය තවත් ගසක් කැපීම සඳහා ඔහු එක් කරගන්නට කැමැත්ත පළ කර තිබේ.

"ඉන් නෑ අතුගාන්ඩ" යි කියමින් ඇය ඔහු ගේ අතට මැදි වූ ඉදල උදුරා ගත්තා ය.

ඒ අනපේක්ෂිත ක්‍රියාවෙන් විස්මිත වූ තරුණයා "ඇයි?" යි විමසුයේ හැබෑම පුදුමයෙන් හා කුතුහලිනි.

"උදේම උයලත් තියෙන්නෙ"

"ඔව්... නැත්තං ඉතිං දවසම බඩගින්නෙනෙ ඔයා..."

"ඉතිං ඒකට මොකද...?" තමුසෙට අමාරුවක් නැතේ..."

ඇගේ ප්‍රශංසාව හා සොඳුරු හසරැල්ල බලාපොරොත්තු වූ සඳුන්ට මේ ප්‍රතිචාරය ඉවසිය නොහැක.

"සඳුනි මේ උදේ පාන්දරම මාත් එක්ක රණ්ඩු වෙන්ඩ එපා... මං වැඩට ගියාට පස්සෙ ඔයාට තියෙන්නෙ කාල බීලා ගෙට වෙලා ඉන්ඩ..."

ඔහු හැකිතාක් සන්සුන් හඬින් පැවසුවේ ය.

ඇගේ මුවඟ නැඟි සිනා බිඳ අවඥාවෙන් පිරී තිබිණ.

"ඔව් ඔව්... ඊට පස්සෙ තමුසෙත් එක්ක ජල්ලි අල්ලන්ඩ ඊ තිස්සෙ..."

ඇනුම්පදය කාගෙනම ඔහු, "මං ඔයාට උදව් කරන්ඩ හැදුවෙ..." යි බිඳුණ හඬින් කීවේ ය.

"උදව්වට හිලව්වට මං ඊට තමුසෙට ගවුම උස්සන්ඩ ඕන?"

ඇයට පහර දෙන්නට තරම් වන කෝපයක් ඇනුණෙන් ඔහු අතක් උරුක් කළේ ය. එහෙත් පාරේ යමින් සිටි ගැහැනියක් ඔවුන් වෙත දිව ආවේ "හා... හා එපා... එපා... උදේ පාන්දර රණ්ඩු වෙන්ඩ එපා..." යි කෑ ගසමිනි. ඔහු වහා අත පහත ඇමුවේ ය.

ආශාගේ දෙනෙත ගිනි පුපුරු නම් නොතිවිණ.

Scanned with CamScanner

"ඇයි අප්පේ මොනවා කෙඳිරිගාන්ඩ බැරුවද මේ අමුතු ජෝඩුව දකින් වෙන්නෙ?"

නිසර එළිමහනේ වැඩ කිරීමෙන් තඹ පැහැ ගැන්වුණු ගැහැණිය සඳුනාගේ සඳුන් මඳ සිනාවක් පෑවේ ය.

"නෑ ඉන්දුන්නේ... මේ... මෙයා මං කියන දෙයක් අහන්නෙ නෑ..."

ඉන්ද්‍රානිගේ කාරුණික බැල්ම නොඉවසූ ආයා ඉවත බැලුවා ය.

"ඇයි නංගියේ...? කොයිදේ වුණත් මොකද බැරි කතා කර කරලා විසඳගන්ඩ..."

"ඒ... එක තමයි මමත් කිව්වෙ... කොහෙද... මෙයා හරි මුරණ්ඩු යි ඉන්දුන්නෙ..."

ගැහැණිය දෙසද තරුණයා දෙසද රවා බැලූ කෙල්ල ගෙට වීගා ගත්තේ ඉදල විසිකර දැමීමෙන් පසුව ය.

"අපුන් විට මහෙයම තමා මල්ලිගේ... පසු වෙනකොට හරියයි..."

සඳුන් අස්වසන්නට මොහෝ තරුණු කාරණා කී ඉන්ද්‍රානි පිටව යාමට පෙර අමරසිරි පිළිබඳව විමසන්නට ද අමතක නොකළා ය.

"මැරිච්ච එකා වගේ නෙමේ... අමරෙ මලගෙ හිත හොඳයි... අනේ අපරාදෙ කියන්ඩ බෑ අපිට නං වරදක් නෑ කරලවත්..."

ඇය මිතුරා පිළිබඳ ව ප්‍රශංසා මුඛයෙන් කතා කරන අතර ඔහු සිත්හි ඇති වූයේ දැඩි වේදනාවකි.

හැකි ඉක්මනින් අමරසිරි බලන්නට යා යුතු බව ඔහු යළි යළි සිහිපත් කර ගත්තේ ය.

"මේ මල්ල ගෙනියන්න නිසා මට අමරෙ අයියව බලන්ඩ යන්ඩත් බැරි වුණා..." යි කොඳුරමින් ඔහු වැඩට යාමට සූදානම් විය. ඇය පෙනෙන්නට නොවූයෙන් ඔහු කාමරයට එබුණේ ය.



සමුගැනීමක් පිළිබඳව සිතිය නොහැකි වුවත් පිටව යාමට පෙර වරක් හෝ ඇය දැක බලාගන්නට ඔහු කැමති විය. ගෙතුළ සොයාගතවත් ඇගේ සොඳුරු රුව දක්නට නොලැබීමෙන් නොසන්සුන්වූ තරුණයා පිළිකන්නට කර පොවා බැලුවේ ය.

මදුවියා ගම මුල හිඳ ගෙන තුන් ආයා කෝටුවකින් බිම කාරමින් කිසිවක් කොඳුරන්නීය.

නොරුස්සනා සහගත බව දියවී ඔහු සිත දයානුකම්පාවක් පහළ විය. මේ රුවන්තිය මේ ලෝකයේ තනිවූ එකියක නොවේදැයි ඔහුට සිතිණ. ඔහු ඇය වෙත ඇවිද ගියේ නිහඬවමය.

ඇය තමා අසල හිඳගත් තරුණයා දෙස හැරී නොබැලුවා ය. එහෙත් මොහොතකට පෙර තමා විසින් කුපිත කරවන ලද සඳුන්ගේ මේ හැසිරීම ඇය කිසිසේත් අපේක්ෂා නොකළ එකකි.

"ඔයාට නාන්නව හම්බ වුණා ද?" ඒ මනුස්සයා මොකද කිව්වෙ?"

ඇය වසන්ත බණ්ඩාරගේ නිවෙසට කඩාවැදීම පිළිබඳව සියළු විස්තරය අසා දැන ගැන්මේ උවමනාවට වඩා ඔහු තුළ බලපෑවැත්වූයේ ඇය පෙළන කණස්සල්ල යම් තරමකින් හෝ තුනී කර දැමීම ය.

"ඔයාට යන්ඩ පරක්කු වෙනවා"

මඳ වේලාවකට පෙර ඔහු වෙත කඩා පැන්නේ ඇයමදැයි සැක සිතෙන තරමට ඒ ස්වරය හා බැල්ම අවිහිංසක විය.

"පොඩ්ඩක් පරක්කු වුණාට කමක් නෑ. නවයට විතර තමා මට එන්ඩ කිව්වෙ..."

ඇය හිස සැලුවාය.

"මගෙත් මොනව හරි වැඩකට යන්ඩ තිබ..."

"මං බලන්නං"

ඇය වියළි සිනාවක් පෑවා ය.

"බලන්නං කිව්වට බලන්නැතෙ. හැමදාම කියනවා විතරයි..."

ඒ චෝදනාව සිනාවකින් ඉවසූ හෙතෙම "ඉතිං කියනවකෝ... ඊට පස්සෙ මොකද වුණේ?" යි ඇසුවේ නොඉවසිල්ලෙනි.

"බෑ... දැං කියන්නෑ... රෑට කියන්නං..."

"ඇයි දැං කියන්ඩ බැරි?"

ඔහුගේ තියුණු බැල්මට ගොදුරු වන්නට නොකමැත්තී හිස පහතට නැඹුරු කරගත්තා ය. දවසේ ඕනෑම වේලාවක දී අවදි විය හැකි, එහෙත් රාත්‍රියෙහිදී වඩා ප්‍රචණ්ඩ වන බවට සැක නැති යමක් ඔහුගේ දෙකලවා මුල එල්ලෙන බව කියන්නට නොගිය ඇය කෝටු කැබැල්ලේ පිහිට පැතුවා ය. එහි ආධාරයෙන් ඇය පොළොව මත සටහන් කරන අකුරු දෙස ඔහු මහත් විමසිල්ලෙන් බලා සිටියේ ය.

"කුමාර..."

රහසක් හෙළිදරව් වූ කලෙක මෙන් කැළඹුණ කෙල්ල කෝටුවම අතුල්ලා වහා ඒ අකුරු තුන මකා දැමුවා ය.

"තවමත් කුමාරට ආදරේ ද?"

කුමාර ඇගේ ප්‍රථම පෙම්වතා විය. සිහිපත් වන වාරයක් පාසා තවමත් හද දැවෙන බව සැබෑය. එහෙත් මේ මොහොතේ තමා ප්‍රේම කරන්නේ ඒ දේව ආසයාට නොව මේ කමකට නැති තරුණයාට බව කියන්නට නොගිය ඇය "නෑ..." යි කෙඳිරුවා ය.

"ඇයි?"

ඔහුගේ උනන්දුව සීමා රහිත විය.

"ඒකත් මං රෑට කියන්නං"

ඔහු නැඟී සිටියේ නොමනාපයෙනි.

"කියනවා නේන්නං රෑ තිස්සෙ මහා පදරංග ජාතකේ වගේ... කව්ද දන්නෙ ඔය කියන්නෙ ඇත්ත ද බොරු ද කියලා..."

ඇගේ දෙපා අභියස මෙවර ඇය අතින් සිත්තම් වූයේ ගැහැනු මුහුණකි. එහි පුළුල් නුවන් පහළින් රූරා හැලෙන කඳුළු බිඳු දෙපේළිය ඔහුට ලබා දුන් පිළිතුරක් වැනි ය. එහෙත් ඔහු එය



නොදුටුවේ ය. ඇය අඳින බලි රූප බලන්නට ඔහුට උවමනාවක් ද නොවී ය.

"මාව මෝඩයා කරගෙන මට හිනාවෙනව ඇති... ඕක් මං වගේ ගොනෙක්..."යි තමාටම ශාප කරගනිමින් ඔහු බයිසිකලයට නැගුණේ ය. ඇය ඇගේ අවලස්සන ගැහැනු මුහුනට තවත් කඳුළු බිඳුවක් එක්කළා මිසක කිසිවක් නොපැවසුවා ය.

ගතවූ රාත්‍රීන් ගණනාව මුළුල්ලේ තමා ඔහුට සත්‍යයක්ම මිස අසත්‍යයක් නොපැවසූ වග හෙළි කරන්නට උත්සුක නොවූවා ය. අරාබිකරයේ සුල්තාන් රජුගේ කෲර මරණයෙන් ජීවිතය ගලවා ගැනීම සඳහා එක්දහස් එක් රැයක් පහන්වනතුරු කතාන්දර එක් දහස් එකක් කිව් ෂෙහෙරා සාද් කුමරිය පිළිබඳව ඇය දැන නොසිටියා ය. අරාබි නිසොල්ලාසය යන වචනය කීපවරක් අසා තිබුණ ද ඇය පත පොතට ප්‍රිය කළ සිසුවියක නොවූවාය. ද්වේෂය, වෛරය හා පළිගැනීමේ චේතනාව විනා සාහිත්‍යයේ පුරාවෘත්තයේ චමත්කාරය අත් විඳින්නට ඇයට කිසි විටකත් උවමනා නොවීය.

ෂෙහෙරාසාද් කුමරියගේ අරමුණට ඉඳුරා පටහැණි ලෙස ආශා රැය මුළුල්ලේ අතීතය ආවර්ජනය කරමින් වෙහෙසුණේ කන්‍යාභාවය රැක ගැනීම සඳහා ය.

"මං බොරු කිව්වෙ නෑ සඳුන්... මං ඔයාට එක බොරුවක්වත් කියල නෑ... ඒ ඔක්කොම ඇත්ත... ඒ කතා එකක්වත් ලස්සන නෑ තමා... ඒ වුණාට ඒ ඔක්කොම ඇත්ත..."

අතු අග එල්ලෙන කරල් පුපුරා බිම පතිත මදටියා ඇට අතුරින් එකක් මත ඇගේ ඇසින් ගලා හැලුණ කඳුලක් පතිත විය. ඒ එක කඳුල දුටු ඇය වහාම පිටි අත්ලෙන් ඇස පිස ගත්තා ය. හඬා වැටීම අවමානයට කරුණකි. කඳුල යනු පරාජයේ සංකේතයක් බව ඇදහූ ඇසූ කෙල්ල කෝටුව කැබලි කීපයකට කඩා විසි කළා ය.

මුහුන කට සෝදා ගන්නට මෙන්ම වතුර කළයක් ගෙන එන්නට ද යාබද නිවෙසක් වෙත යාමට සිදුව තිබේ. ඒ නිවෙසත් ළිඳත් අතර වූ දුර හේතු කොටගෙන නිවැසියන්ගේ හරස් ප්‍රශ්නද

Scanned with CamScanner

කුකුස් ඇස් ද ආදියෙන් ගැල වී ඒ කාරිය කර ගැන්මට හැකිවීම පිළිබඳ ව ආශා කවදත් සතුටු වූවා ය. එහෙත් වෙනදාට වඩා ප්‍රමාද වූ හෙයින්දෝ ඇයට ආගන්තුක බැල්මකට ගොදුරු වන්නට සිදුවිය.

මග තොටේ දී හමුවන බොහෝ ගැහැනුන් මෙන් දුර්වර්ණ නොවූ කාන්තාවගේ දෙකනද දෑත හා ගෙල ද රනින් බැබළිණ.

"මහත්තයා වැඩට ගිහිං එනකල් ගෙදරට වෙලා හිටිියෙ පරණ ගෑනු... අලුත් ගෑනුත් මහත්තුරු වගේම වැඩ කරනවා... කීයක් හරි හොයාගන්නවා... අපරාදෙ වැඩක් කරන්ඩ පුලුවං කාලේ නිකං ගෙදරට වෙලා බත් තම්බ තම්බා ඉන්නෙ..."

කලකට පසු කෙනෙකු සමග සිනාසුණ ආශා " යන්නං" යි සමුගන්නට ද අමතක නොකළා ය.

"මං කොළඹ වැඩ කරන්නෙ. නිවාඩු මේ දවස් ටික. ඕන්නං මං ආපහු යනකොට මාත් එක්ක ගියහැකි.... මොකද කියන්නෙ?"

වැටක නෂ්ඨාවශේෂයක් පමණක් වූ දිරාගිය කටුකම්බි පටක් මතින් එහා වත්තට පැනගත් කෙල්ල හැරී බලා සිනාවක් පෑවා පමණි.

"මොකද කියන්නෙ..? එනවද යන්ඩ මාත් එක්ක?"

"බලමු..."

කාන්තාව නොමනාපයෙන් හිස ගැස්සුවා ය.

"මහත්තුරුගෙන් නං අවසර ලැබෙයි කියලා හිතන්ඩ එපා... මිනිස්සු හරි කැමතියි තමුන්ගෙ ගෑනි ළිපේ වැටීගෙන ඉන්නවනං..."

ඇගේ ඒ වචන බොහෝ වේලා යනතුරු ආශා ගේ දෙකණේ රැව් දුන්නේ ය.

"මට නං අවසර ගන්ඩ මහත්තයෙක් ඇත්තෙ නෑ... ඒ වුණාට ඉතිං අර කොල්ලගෙං අහන්ඩ ඕන... කොච්චර වුණත් මෙච්චර දවස් මට කන්ඩ අඳින්ඩ දීපු ගුණේ තියන්ඩ එපැයි... නොකියා හොරෙං යන එක හොඳ නෑ..." යි ඇය කොළඹ ගමන



හා තමාට පිහිට වූ තරුණයා පිළිබඳව කොතෙකුත් කල්පනා කළා ය.

"අහන්නෙ මොකට ද...? අහන්ඩ ඕනි නෑ. යනවා කියලා යනවා... එච්චරයි ආයෙ ඉතිං එයාගෙං අවසර ගන්ඩ එයා මගෙ කව්ද...?"

ඉතා ඉක්මණින් හෝ බෙහෙවින් ප්‍රමාද වී හෝ ඔහුගෙන් සමුගත යුතු බව ඇය අවබෝධ කර ගත්තේ රිදුම් දෙන හදිනි. දයානුකම්පාවක් මිසක ඔහුගේ සිත කොතනක හෝ ප්‍රේමයේ අංශු මාත්‍රයක් හෝ ඇතැයි ඇය විශ්වාස නොකරයි.

වරෙක තමාගේ පහස පතා අඩදබර කරන බව සැබෑය. එහෙත් එවන් අවස්ථාවක පවා ඔහු ප්‍රේමය හා විවාහය පිළිබඳ ව කිසිවක් නොපවසන බව ඇගේ මතකයේ රැඳී තිබේ. තමා වැනි අසරණ අනාථ එකියක සමඟ ජීවිතය බෙදා හදා ගන්නට ඔහු කල්පනා නොකරන්නේ නම් ඊට දොස් පැවරිය නොහැකි බව සිතමින් ඇය සුසුමක් හෙළුවා ය.

නිකරුණේ කාලය විනාශ නොකොට කුමක් හෝ වැඩක නිරත විය යුතු බව තීරණය කළ ආශා අඩක් තෙමී ගිය ගවොම ගලවා දැමුවා ය. වත්තේ පිටියේ වැඩකට මේ ගවොම හොඳ වැඩිය. ගෙදර කිසිවෙකු නැති බව හොඳින් දන්නා බැවින් ඇය දොර වසන්නට හෝ ප්‍රවේසම් සහගත වීමට තැත් නොකළා ය. කොහොමටත් කවදත් ඇය ඇඳුම් ගැලවීමේ දී හා ඇඳීමේ දී සංයමයක් දැක්වූ එකියක නොවූවා ය. සීතා ඇයට කොතෙකුත් බැන වැදුණේ ඒ අසංවරකම හේතු කොටගෙන ය. සඳුන් සිටින විට නම් ඇය බෙහෙවින් පරිස්සම් වෙයි. වැඩිකොටම ඔහු ගේ ඒ නපුරු සතා ඇහැරෙන්නට බැරි නැතැයි සැකයෙන් ද බියෙන් ද මඩනා ලද සිතිනි.

"මං නං කියන්නෙ ආසෝ මං මැරිච්ච දාක උඹ මහණ වෙයං... උඹට පිරිමියෙක් එක්ක ඉන්ඩ බෑ සමගියෙන් සමාදානෙං කවදාවත්. උඹ පිරිමියා වෙන්ඩ හදනවානේ... පිරිමි කැමති නෑ එහෙව් ගෑනුන්ට... දෙන්නටම පළවෙනියා වෙන්ඩ බෑනේ... එක්කෙනෙකුට දෙවැනියා වෙන්ඩම වෙනවා... උඹ දෙවැනි

වෙන්නෙ නෑ නෙව මහරජ්ජුරුවන්ටවත්... ඉතිං උඹට ඔබින්නෑ ගිහිගේ... උඹ මහණ වෙයං... හැබැයි ඉතිං මහණ වුණා වුණත් ඔය රූපෙත් එක්ක උඹ පස්සෙං දුක් කරදර නැවිත් ඉන්නෙ නෑ රජෝ..."

මිත්තණියගේ වචන දෙකනේ හැපෙන්නට වූයෙන් ඇය වැඩට හඳින පරණ ගවොම ඇඟලා ගන්නට මඳක් ප්‍රමාද වූවා ය. එහෙයින් තන පටයෙන් හා යට සායෙන් කැපී පෙනෙන ඡවි වර්ණයද සිරුරේ මනා හැඩය ද සිත්සේ නරඹන්නට භාග්‍යමත් වූ දෙනෙතක් දිලිසිණ.

කිසිවෙකු තමා දෙස බලා සිටින බව එක්වනම හැඟීගියෙන් ඇය ගවොම හැඳ ගන්නවා වෙනුවට එයින් ළමැද වසාගනිමින් "කවුද?" යි මහ හඬින් ප්‍රශ්න කළා ය.

"නංගියේ මේ මම..." යි කියමින් මඳක් ඉදිරියට ආවේ ළිඳ ළඟදී හමු වූ කාන්තාව ය. සැඟවී බලා සිටියේ පිරිමියෙකු වී නම් ගෙල මිරිකා දමන තරමට ක්‍රෝධයක් පහළ වනවා නොඅනුමානය. එහෙත් නිහඬව හා අනවසරයෙන් ගෙතුළට වත් ආගන්තුකයා කෙරෙහි අමනාපයෙන් මෙන් ඇය එක එල්ලේ බලා සිටියා ය.

"මං කතා කෙරුවා නංගිට ඇහුන්නෑ මයෙ හිතේ..."

ඒ නෝක්කඩු බැල්ම හඳුනා ගත්තාක් මෙන් කාන්තාව නිදහසට කරුණු ගෙන හැර පෑවා ය.

"ඇහෙන්ඩ ඉතිං කතා කරන්ඩ එපැයි" යි නොකී ආශා අනෙක් පස හැරුණා ය. කඩිමුඩියේ ගවොම හැඳ ගත්තා ය. ඒ කෙටි කාලසීමාවේ වුව අර උකුසු ඇස් ඇගේ සිරුරේ සුන්දරත්වය දැක ගන්නට සමත් විය.

"මල්ලිත් ගෙදර නැති බව දන්න හිංදා මං ආවා ටිකක් කතා කර කර ඉන්ඩ..."

කාන්තාවගේ ඇගෑළුම්කමට ප්‍රතිචාර දක්වන්නේ කෙලෙසදැයි ආශාට නොවැටහේ. කොහොමටත් ඇයට ආචාර සමාචාර විධික්‍රම නුහුරු ය. නුපුරුදු ය.



"කව්ද ආවා..." යි ඇතැම් හැන්දෑවක ඇය දවසේ වැඩ හමාර කොට ගෙට ගොඩවන මිත්තණියට ඇනුම් දෙයි.

"කව්ද?" යි සීතා අසන්නේ වෙහෙසකර හඬිනි. දවස තිස්සේ කුලී මලී කිරීම ඇගේ මහළු කයට ඔරොත්තු නොදේ. එහෙත් මේ වහල යට කන්නට කටවල් දෙකක් තිබෙන බව ඇයට නොතකා සිටිය නොහැක.

"බඩ කට නං පුරවගන්ඩ බැරි යැ මොනවා හරි තම්බාගෙන කාලා... එහෙම ද අප්පේ මේ ඇඳුං සෙරෙප්පු සපත්තු කියන එව්වා... මේකිගෙ බොඩියක්ම කීයක් වෙනවද... ඒ මදිවට ජංගි... සායවල්... යටටයි උඩටයි නානාප්පකාර ඇඳුං. ගෑනියෙක් වෙලා නං ඉපදෙන්ඩ එපා මේ සංසාරේ කවදාවත්..." යි ඇතැම් හැන්දෑවක මැහැල්ල නොනවත්වා කියාගෙන යයි. ඒ කියවිල්ල ඉවසිය නුහුණු කෙල්ල "ගෑනු විතරක් නෙමේ... පිරිමිත් යටට ඇඳුම් අඳිනවා... ගොං කතා කියන්ඩ එපා මෙතන" යි තරවටු කරන්නීය. එහෙත් මේ හැන්දෑවේ මිණිබිරියගේ උත්තරය අසන සීතා කුපිත වෙයි.

"මං දන්නෑ... කව්ද මංදා කෑ ගහල කෑගහල යන්ඩ ගියේ"

"ඉතිං උඹ ඩිංගක් බලන්ඩ එපැයි කව් ද ආවෙ මොකටද ආවෙ කියල..."

"මට යැයි කතා කෙරුවෙ..."

"කාට හරි... කාට කතා කෙරුවත් ගෙදර ඉන්න මනුස්සයා ඩිංගක් එළියට ගිහිං බලන්ඩ එපැයි... ඇයි ආවෙ අහලා කිරියම්මා ගෙදර නෑ කියලා. ආපු කාරණාවත් අහගන්ඩ එපැයි. බීරෙක් වාගේ කරබාගෙන ඉන්නවද මනුස්සයෙක් ගෙදරකට ආපුවහම..."

ආශා දෙතොල හකුලා අප්‍රසාදය පළ කරයි.

"අනේ මට බෑ..."

"ළමිස්සියක් විච්චහම හිනාවෙලා කතා කරලා ගෙට ගොඩ විච්චි මනුස්සයෙකුට තේ කෝප්පයක් වක් කරලා දෙන්ඩ පුරුදු වෙන්ඩ එපැයි... මේක එහෙමද... කවදාවත් කෙනෙක් එක්ක හිනාවෙලා එක වචන දෙකක් කතා කරනවද... අනේ මට

Scanned with CamScanner

නං තේරෙන්නෑ මං නැති කාලෙක උඹ මොනවා කොරගනී ද කියලා..."

මිත්තණියගේ ඒ දුක් ගැනවිල්ල අසමින් වුව ආශා සිතාවක් නොපෑවා ය. එබැවින් කාන්තාව අතරාධනයෙන් ම ඇඳ මත බිඳ ගත්තා ය.

"මං ප්‍රියාති... නංගිගෙ නම මොකක් ද...?"

මොහොතක් නිහඬව හුන් යුවතිය හිස නගා බැලුවා ය.

ප්‍රියාති මුව පුරා තිහැහෙමින් පිළිතුරක් බලාපොරොත්තු වෙයි.

"ආශා..."

"ඔයාටම ගැලපෙනවා..."

ඒ ඇයිදැයි නොඇසූ අශා ජනේලයෙන් එපිට ගාල්මරුවා වැල් ගෝටාව දෙස බලා සිටියා ය.

"නෑ ඉතිං... ඔයාව දැක්කහම ආසාවක් නොහිතෙන්නෙ කාට ද...?" යි කී ප්‍රියාති හඬ නගා හිනැහුණා ය. ඊට හවුල් නොවූ යුවතිය අද කෙලෙස හෝ ඒ ආක්‍රමණශීලි වැල් ගෝටාව මට්ටු කළ යුතු බව සිතුවා ය.

"අපේ සුසිරි නං කිව්වෙ ඔයාලා මෙහෙට ඇවිල්ලා වැඩි කාලයක් නෑ කියලා..."

ආශා හිස සැලුවා පමණි.

"දෙපැත්තෙම අය විරුද්ධ වුණ හින්දද පැනල ආවෙ දෙන්නත්තෙක්ක...?"

එවැන්නක් සිදු නොවූ බැවින් ඇය හිස සලන්නට මැළි වූවා ය.

"කසාද බැන්දද...?"

ප්‍රියාති ඊළඟ ප්‍රශ්නය ඇසුවේ නැගී සිටිමිනි. යුවතියගේ නිශ්ශබ්දතාවය ඇයට සතුටට කරුණකි.



"අනේ මංදා... ඔයා වගේ ලස්සන කෙල්ලෙකුට මේ වගේ ජීවිතයක් හරියන් නෑ නංගි.. පණ දෙන්නං කියල රවට්ටගෙන එන්න ආවට කොල්ලො විශ්වාස කරන්ඩන් බෑ අද කාලේ... කොයි වෙලාවෙ පැනලා යයි ද කව්ද දන්නෙ..."

ප්‍රියාති මොහොතක් නිහඬව සිටියේ ආශා සිසිවක් පවසනු ඇතැයි බලාපොරොත්තුවෙනි. එහෙත් ඒ බලාපොරොත්තුව ඉක්මණින්ම බිඳ වැටිණ.

"බබ්බු නැතෙ තාම..."

ඒ ප්‍රශ්නයෙන් ද තියුණු බැල්මෙන් ද ආශා තිගැස්සුණා ය. තමා තවමත් කන්‍යාවක බව කියාගත නොහැකිව ඇයගේ දෙතොල සැලිණ.

"මොනව හරි පාච්චි කරනවා ඇතිනෙ... දැං කොල්ලො කෙල්ලො කසාද බැඳපු ගමං බබාලා හදන්නෙ නෑ..."

ඇගේ මුහුණේ අඳුර ද ප්‍රියාතිගේ ප්‍රමෝදය දෙගුණ තෙගුණ කරවයි.

"මං නං දැං අවුරුදු ගාණක් තිස්සෙ කොළඹ. ගෙදර එන්නෙ මාස දෙක තුනකට සැරයක්... හරි කම්මැලියි අප්පා ආවත්... මේකෙ ඉන්න ගෑනු එක්ක මගෙ නෑනෙ බජනයක්..."

ඇය රහසක් හෙළි කරන්නට සැරසෙන කලෙක මෙන් හඬ පහත් කළා ය.

"උං මාත්තෙක්ක තරහයි නංගියේ... තරහට වැඩියි ඉරිසියාව... ඇයි ඉතිං උං පට්ට අව්වෙ පිච්චි පිච්චි පණයන කල් නැහෙන කොට මං කුල්එකේ හොඳ ගානක් හොයනවනෙ..."

"මොකක් ද අක්කා කරන රස්සාව...?"

කුහුල ආශාගේ මුව පණ පොවයි.

"මං බංගලාවක වැඩ... වැඩ කිව්වට ඇති වැඩක් නෑ නංගියේ. මොක ද ආයෙ වතුර අදින්ඩ දර හොයන්ඩ තියෙනවැයි මං නංගිට ඊටත් වඩා හොඳ රස්සාවක් හොයලා දෙන්නංකො නංගි කැමති නං අද වුණත් කමක් නෑ අපි දෙන්නා යං"

Scanned with CamScanner

යුවතිය දෑස විහිදා විස්මිත බැල්මක් හෙලුවා ය.

"කොළඹ?"

"ඔව්... කොළඹ යන එක මහ වැඩක් යැ... බස් තියෙනවා ඕන හැටියෙ වවුමට ගියාම. මට නං ඇති වැඩකුත් නෑ. මං කොහොමටත් හෙට දිහාවට යන්ඩ තමා හිතාගෙන හිටියෙ. යනවනං යං..."

ආශාගේ හද ගැහෙන්නට විය. යා යුතු බව සැබෑය. පිටව යාමට නොඉවසිලිමත් වූ වග ද සැබෑය. එහෙත් මේ සා විගසින් මේ ගෙදර ද තමාට කරුණාව හා දයාව දැක්වූ තරුණියා ද හැර දමා යාම පහසු කාර්යයක් ද...

පැයකට පෙර හමු වූ කාන්තාවකට අවනතව පලා යාමට තරම් නිර්දය විය හැකිදැයි ඇය කකියන හදවතින් කල්පනා කළා ය.

"මොක ද කියන්නෙ?"

ආශා අතිරණයෙන් පසුවන බව වටහාගත් ප්‍රියානි මෘදු හඬින් ඇසුවා ය.

"ඔයාගෙ කැමැත්තක්. සමහර විට ඕගොල්ලො තාම කසාද බැඳලත් නැතුව ඇති. එහෙම නං ඉතිං මෙහෙම ඉන්න එක මහ මෝඩකමක්. මං නං කියන්නෙ මාත් එක්ක යං කියලා... යන්ඩ ද ඇහුවට යන්ඩ දෙන එකක් නෑ ඔයාගෙ කොල්ලා... හැබැයි ඉතිං මෙහෙම ඉඳලා එයා අතුරුදහන් වෙන්ඩ බැරි නෑ. හිටපු ගමං... එක හිතක් තියෙන්නෙ කොයි කොල්ලට ද නංගියේ..."

දෙපා අප්‍රාණිකව යන්නාක් මෙන් හැඟී ගියෙන් ආශා ඇඳ මත හිඳගත්තා ය.

"දොළහට තියෙනවා කොළඹ බස් එකක්. ලෑස්ති වෙලා එන්ඩ. නැත්තං මං එන්ඩ ද එකොළහට විතර...?"

ඇය කිසිවක් නොපවසා හිස් බැල්මක් හෙළුවා ය.

"බය වෙන්ඩ එපා... මං ඉන්නවනේ. සැප විඳින්ඩ පුලුවං කාලෙ මොකට ද නිකං අපරාදෙ දුක විඳින්නෙ...? සල්ලි ගැන



හිතන්ඩ එපා මා ළඟ සල්ලි තියෙනවා දෙන්නටම යන්ඩ..." යි කී ප්‍රියානි දොරකඩ නැවතී හැරී බැලුවා ය.

"ඔන්න ආයෙ නහයෙන් අඬන්ඩ බෑ හරිද... ඔයාට මීට වඩා කොච්චර ලස්සන කොල්ලෙක් හොයාගන්ඩ පුලුවංද... මං දැක්කනෙ ඔයාගෙ කොල්ලා... ඔයාට ගැලපෙන්නෙ නෑ... ඔයා ගියා කියලා එයා වහ බොන්නෙත් නෑ... තව කෙල්ලෙක් එක්ක එයි. එහෙම තමා කොල්ලො..."

වික්ෂිප්ත යුවතියගේ හිස පහතට නැඹුරු විය.

"ඉතිං? ඉතිං? ඊට පස්සේ මොකද වුණේ?"

හැම රැයකම විටින් විට ඇසෙන ඒ උද්යෝගීමත් හඬ මින් පසු නොඇසෙන බව අදහා ගන්නට බැරිව ඇය නිය සැපුවා ය.

"මං යනවා... එහෙනං හොඳ ළමය වගේ ලෑස්තිවෙන්ඩ හොඳේ..."

වචනයක් නොළසේනම් එක් චලනයක් හෝ බලාපොරොත්තු වුවද ආශා ගල් ගැසුණ ගාන ය.

"පස්සෙ බෑ කියන්ඩ නං බෑ..."

ප්‍රියානි පිටව ගියා ය. ඇගේ ගෝලාකාර මුහුණේ නිරතුරුව රැඳි උඩඟු සිනාව වඩ වඩාත් පුළුල් වන අයුරු ආශා නොදුටුවා ය. ඇය නපුරු සිහිනයක් දැක හිටි හැටියේ අවදි වූ දැරියක මෙන් භ්‍රාන්තව සිටියා ය. සෙවණැල්ල මෙන් සමීපයෙහි හුන් මිත්තණිය මියගිය විට හෝ මේ අන්දමින් තමාගේ හදවත සිර වී තෙරපී නොගිය බව ඇය සිහි කළේ එක්තරා පශ්චත්තාපයකිනි.

ඒ කෙසඟ දිරාපත් සිරුර දෙස ඇය ඔරවා බැලුවා නොවේද? නිරන්තරයෙන් මිණිබිරියගේ සැප පහසුව සොයා බැලූ මිත්තණිය සිහි නොලබා මිය යෑම සමාව දිය නොහෙන වරදක් ලෙස ඇයට හැඟිණ.

"ගියා... සීතම්මත් මාව දාලා ගියා... ඇයි ගියේ? කොහොමද ගියේ? කොහොම හරි ජීවත්වෙන්ඩ තිබ්බ නේද? කොයි වෙලේ හරි හෝස් ගාලා හුස්ම ටික යයි කියලනෙ ඉතිං මන්තරේ වගේ මැතිරුවේ. ඒ කිව්ව විදියටම හුස්ම ටික ඇරියා. ඒ වුණාට ඇයි

බැරි වුණේ තව ටික කලෙකට අල්ලගෙන හිරකරගෙන ඉන්ඩ...? යි දිගින් දිගටම ප්‍රශ්න කළා විනා ඇය කඳුලක් නොහෙළුවා ය.

දුර බැහැර ඇඳගෙන යා හැකි ඇඳුමක් නොවූයෙන් ආශා ගොම කොළ පැහැ ගවොම හැඳගත්තා ය. එහෙත් ඒ කැමැත්තකින් නොවේ.

"ඔයා සුදු හිංදා කොළ පාට ලස්සනයි" යි කියමින් මේ ගවොම තෝරා දුන්නේ ද ලෝබ නැතිව මුදල් ගෙව්වේ ද සඳුන් ය.

"එපා එපා ඕන නෑ..." යි ආශා කවුන්ටරය අබියසදී ඔහු ගේ අතක් කෙනිත්තුවා ය.

"ඇයි?"

"ගණන් වැඩි යි... මීට වඩා අඩුවට වෙන ඇඳුමක් ගමු..." යි ඇය පහත් හඬින් කී කල ඔහු පෑ සිනාව කොපමණ දයාන්විත වී ද?

"කමක් නෑ... රස්සාවක් හම්බුණාම පොලියත් එක්ක ගෙවන්ඩකෝ" යි සාප්පුවෙන් පිටතට එමින් ඔහු කියා සිටියේ සැහැල්ලුවෙනි.

"මං රස්සාවක් කරන්ඩ යනවා. හැබැයි ඔයාට හොරෙං... ඔයා අරං දුන්නු ඇඳුම් ඇඳගෙන ඔයාට හොරෙං යන එක කොච්චර අමාරු ද කියලා ඔයා දන්නෙ නෑ... ඒ වුණාට මම යන්ඩ ම ඕන. මේ ඉන්න ඉඳිල්ලෙ කිසිම තේරුමක් නෑ... කොයි වෙලාවක හරි මටත් මගෙ පරිස්සම අමතක වෙලා යයි. ඊට පස්සෙ මොකද වෙන්නෙ? ඔයා මාව කසාද බඳින එකක් නෑ... ඔයාට මාව එපාවුණාම ඔයා මාව දාලා පැනලා යයි. ඊට කලිං මම ඔයාව දාලා පැනලා යන එක තමා හොඳ..."

ඇය කුස්සියට ගියේ ද සිහිනයෙන් ඇවිදින්නියක මෙනි. ප්‍රියයන්ගෙන් වෙන්වීම මෙසා අසීරු බවක් ඇය මින් පෙර දැන නොසිටියා ය. කුමාර ඇගේ පළමු ප්‍රියතමයා විය. එහෙත් ඔහු හැරදමා ඒමෙන් ඇයට බලගතු සිත් වේදනාවක් නොදැනිණ. කුලගෙය වෙත නොව බිහිසුණු මරණය කරා තමා කැටිව යාමට



තරම් ඔහු සටකපට වූයේ කෙලෙසදැයි ඇය දැනුදු ඇතැම් රැයක හිසට වධ දෙමින් කල්පනා කරයි. අන්තිමේ දී නැවත ජීවිතය ලබා දෙන්නටද ඔහු නොපැකිළ ඉදිරිපත් වුවද බිඳ දැමූ විශ්වාසය හා ස්නේහය ගොඩ නංවන්නට සමත් නොවූ වග සිහි කරමින් ඇය නිදිවර්ජිතව ගෙවූ රාත්‍රීන් කොතරම් දිගු වී ද?

පැය ගණනාවක් ගත විය හැකි ගමනක් බැවින් මස්සොක්කා කැබැල්ලක් කන්නට තැත් කළද ඇගේ උගුර සිරව ගියේ ය. ඔහු හිමිදිරියේ නැගිට මස්සොක්කා තැම්බුවේ තමා වෙනුවෙන් නොවේදැයි හැඟුණෙන් ඇගේ ඇසට කඳුළු නැගිණ.

"මට වෙන කරන්ඩ දෙයක් නෑ.... තව හිටියොත් තවත් දුකයි ආල යන්ඩ... ඇම්මම යන එක හොඳයි..." තොල් මතුරමින් ඇය වතුර කෝප්පයක් බිව්වා ය.

"මහන්සි වෙලා මහන්සි වෙලා ඇවිල්ලා මාව හොය හොයා දඟලයි ද දන්නෙ නෑ..." යි සිතූ ඇය අඟුරු කැබැල්ලක් අතින් ගත්තා ය.

දුර්වර්ණ බිත්තියේ "මං යනවා. මාව හොයන්ඩ එපා" යි ලොකු අකුරින් සටහන් කළා ය.

සැබෑ නම ලියන්නේ ද නැතහොත් කුමාර දුන් කුමාරි සඳුන් දුන් සඳුනි යන නම් දෙකෙන් එකක් ලියන්නේ දැයි තෝරා බේරා ගත නුහුණුව විපිළිසර වූවා ය. අන්තිමේ දී ඒ හැම නමක් ම අත් හැරියා ය.

"නම ඕන් නෑ... දැක්ක හැටියෙ හිතයි මං තමා කියලා" යි සිතමින් අඟුරු කැබැල්ල විසි කළා ය.

"නංගියේ..."

ප්‍රියානිගේ ලගන්නා හඬ ඇසෙත්ම ඇය තිගැස්සුණා ය. තමා නිසැකවම මේ ගෙය ද ඔහු ද අතහැර යන බව පසක් වූයෙන් ඇගේ ළය දැවෙන්නට විය.

"අමාරුවෙං හරි මම මේ ගමන යන්න ඕන. මං යන එක ඔයාට හොඳයි. ඔයාට ලේසියි. දෙන්නෙකුට කන්න අඳින්ඩ හම්බ

කරන එක ලේසි වැඩක් නෙමේ. ඔයාගෙ හිරේ ඉන්න යාළුවත් ළඟදී නිදහස් වෙයි කිව්වනේ... වැඩි කාලයක් යන්ඩ කලිං ඔයාට මාව අමතක වෙලා යයි. ඔයාට හුඟාක් වද දුන්න නපුරු මෝඩ කෙල්ලව අමතක වෙලා යයි. මට නං ඔයාව අමතක වෙන එකක් නෑ. සීතම්ම වගේ ඔයත් මගේ පැත්තකින් හිටගෙන ඉඳී මං කවදා හරි මැරෙනකං..."

කෙල්ල කඩුල්ල කරා ඇවිද ගියේ ඇසෙන නෑසෙන හඬින් එසේ කොඳුරමිනි.

"අම්මෝ මොක ද මේ මූනෙ හැටි...?"

ඇය දුටු හැටියේ ඇසූ ප්‍රියානි හඬ නගා හිනැහුණා ය. දිගු කලිසම ඇය වෙත එක් කරන අපූර්වත්වය දෙස ආශා ඇරුණු ඇසින් බලා සිටියා ය.

"දුකයි ද අල යන්ඩ?"

පිළිතුරක් නොදුන් ආශා අවසන් වරටත් ඒ ජරාජීර්ණ නිවෙස දෙස හැරී බැලුවා ය. ඉහට වහළක් පමණක් නොව සිතට සහනයද අසහනය ද බිය සැක ද ස්නේහය ද ද්වේෂය ද එකවර එක ලෙසින් ලබා දුන් ඒ නිවෙසේ අශෝබන කාමරය තුළ නො එසේ නම් ඇබිත්තත් කුස්සිය තුළ කතන්දර කියන්නිය ද හූමිටි දෙන්නාද යළි යළි දකිමින් ඇසිපිය සැලුවා ය.

"ගණන් ගන්ඩ එපා අනේ... ඔයා වගේ ලස්සන කෙල්ලෙකුට කොල්ලො ඕන තරම් හොයාගන්ඩ බැරියැ... යං යං..."

ප්‍රියානි නොඉවසිලිමත් වූවා ය.

බරවා වැළඳුන කලෙක මෙන් තමාගේ දෙපය ඉදිමී ඇතැයි ආශාට සිතිණ. පයක් ඔසවා පයක් නගා යන්නට බැරි ඒ නිසා විය යුතු ය.

"කෝ බෑග් එකක් ගත්තෙ නැද්ද?"

කෙල්ල අත එල්ලෙන ඉටිමල්ල දෙස උවමනාවෙන් බැලූ ගැහැනිය ප්‍රශ්න කළා ය.

"නෑ... මට බෑග් එකක් නෑ..."



"ඒකනෙ... බලන්ඩකෝ ඔයාට මුකුත්ම නැනේ. ගෑනු ළමයෙක් වුණා ම කොයිතරම් දේවල් ඕන ද... ඇඳුම් සෙරෙප්පු හෑන්ඩ් බෑග්... සෙන්ට් පව්ඩර් ක්‍රීම්... ඉන්නකෝ වැඩි දවසක් යන්න කලිං ඔයාට ඒ ඔක්කෝම ගන්ඩ පුලුවං... ඇත්තටම ඔයාට කුමාරිකාවක් වගේ ඉන්ඩ පුළුවං"

නිවෙසක බැල මෙහෙවර සඳහා පිටත්ව යන තමා ඒසා සුන්දර සිහින දැකිය යුතු නැතැයි ආශාට සිතිණ, වැටුපක් හිමි වුව ද ප්‍රියානි උජාරුවෙන් වර්ණනා කරන අඳුම කුඩුම උදෙසා ඇය තුළ ඒ හැටි ආශාවක් නූපදී. තමාට උවමනා කරන්නේ මොනවාදැයි ඇයට සිතාගැන්ම අපහසු ය.

"බඩට කන්ඩයි ඉතට අඳින්ඩයි වැටිල ඉන්ඩ වහලෙකුයි තිබ්බම ඉහටත් උඩිං බං..." යි සීතම්මා නිතර පැවසූවා ය.

"යං... යං... පරක්කු වෙනවා" යි ප්‍රියානි සුසුසුර වුවද වේගයෙන් පැමිණි ත්‍රීවිලරයක් හේතු කොටගෙන මදක් පමාවන්නට සිදු විය. ත්‍රීවිලරය දකින් ම ආශා තැති ගත්තා ය. භීතිය ඇගේ රූපශ්‍රීය මුළුමනින් ම උදුරා ගත්තේ ය. වහා දිව යාමට උවමනා වුවද ඇය පයක් තබා අතක ඇඟිල්ලක් හෝ ඔසවාගත නොහැකිව අසරණ වූවා ය. එහෙත් දෙදෙනෙකු එක් ව ත්‍රීවිලරයෙන් පිටතට ගත් තැනැත්තා දුටු සැණින් ඇගේ මුහුනේ සුදුමැලි බව අතුරුදහන් විය.

"සඳුන්..." යි කෑ ගසන්නට උවමනා වුවද ඇය අතකින් මුව වසා ගත්තා මිස කෙඳිරියකුදු නොනැඟුවා ය.

"ඔයාගෙ කොල්ලා නේද?" යි ප්‍රියානි පහත් හඬින් ඇසුවා ය.

"බලාගෙන... පරිස්සමට"

සඳුන්ගේ පයක් අනතුරට ලක් වී තිබෙන බව පෙනෙන්නට තිබේ. වෙළුම් පටි යොදන ලද පය දකින්නට මෙන්ම ඔහුගේ මුවින් ගිලිහෙන වේදනාත්මක කෙඳිරිය අසන්නට ද ආශා පසුබට වූවා ය.

Scanned with CamScanner

තරුණයන් දෙදෙනෙකු විසින් ඔසවාගෙන යන සඳුන් පසුපස දිව යමින් "අනේ සඳුන්... මොකද මේ වුණේ?" යි කෑ ගසා අසන්නට උවමනා වුව ද ඇය ඔහේ බලා සිටියා පමණි.

"දැං මොකද කරන්නෙ?"

ප්‍රියානි පවා වික්ෂිප්තව සිටියාය.

"මොකද දන්නෑ වුණේ?"

ආශා යටිතොල විකාගත්තා මිස කිසිවක් නොපැවසුවාය.

"බස් එකට පරක්කු වෙනවා... යාළුවෝ බලයි නේද? අපි යංද...?"

ගැහැනිය ඇසුවේ සමාව අයදින බැල්මක් එක්ක ය. මේ තරුණියගේ පෙම්වතා හෝ සැමියා හදිසි අනතුරකට ලක්ව සිටියදී තමා මෙලෙස විමසීම මානුෂික නොවන බවට උපන් පශ්චත්තාපය ඒ ස්වරයෙහි දැවටී තිබිණ.

"අක්ක යන්ඩ..." යි වෑයමෙන් කී ආශා ආපසු හැරුණා ය.

"අපරාදේ... මං නං කියන්නෙ ලැස්ති වෙච්ච එකේ යං කියලා..." ඇය පයක් පෙරට නොතැබූ බව දුටු ප්‍රියානි තවත් වරක් උත්සාහ කරන්නට නොපැකිළුණා ය.

"මිනිස්සු නං මොනවද... ගෑනු ඔය කිරි දරුවොත් අලා යන්නෙ... කොළඹ රටට විතරක් නෙමේ පිටරටත් යන්නෙ ඕන තරං..."

නිරුත්තර තරුණිය පොළඹවා ගත හැකි බව සිතමින් ඇය නැවතත් කතා කළා ය.

"වැඩි අමාරුවක් නැතුව ඇති. හුඟක් අමාරුනං ඉස්පිරිතාලෙ නවත්තනවනේ. ගෙදර එක්ක ගෙන එන්ඩ ඇත්තෙ වැඩි අමාරුවක් නැති හින්ද වෙන්ඩැති"

ඇය අස්වසන්නට ප්‍රියානි අපොහොසත් වූවා ය. ආශා පයක් පෙරට තැබුවා ය. ගැහැනියගේ හදවත කිඳා බැස්සේ ය. අවසන් ප්‍රයත්නය ලෙස ඇය වහා තරුණියගේ අතක් ඇද්දා ය. මොහොතක් නිසලව හා නිහඬව හුන් ආශා අත ගසා ඇමුවෙන්



ගැහැනියගේ දෙතොල්'තර සියුම් මඳහස වියැකිණ. නිවෙස වෙත දිව යන තරුණිය දෙස ඇය බලා සිටියේ තෘෂ්ණාවෙන් හා වේදනාවෙන් ඇඳිරිව ගිය ඇසිනි. මිල කළ නොහැකි නිධානයක් සැඟවුණු ගුහාවක ද්වාරය හදිසියේ වැසී ගියාක් මෙනි. ඇය පාරට ගොඩ වූයේ නැවත වරක් උත්සාහ කළ යුතු බවට හිටිස ගනිමිනි.

"උස මහත පාට කොණ්ඩෙ සේරම ඉස්තරම්. මෙහෙම කෙල්ලක් නං ලේසියෙන් හොයාගන්ඩ හම්බ වෙන්නෑ..." යි ඇය පෙරට තබන පයක් පාසා ළතවූවා ය. එහෙත් ඒ ඉස්තරම් කෙල්ල දුටු හැටියේ සඳුන් කෝපයෙන් බැන වැදුණේ ය.

"කොහෙද ඔයි ගියේ? මට ඉන්ඩ බැරුව ඉන්නවා... අරුං හිතන්ඩ ඇති මං වැඩට ගිය හැටියෙ තමුසෙ එක එකා එක්ක මඟුලෙ යනව කියලා..."

සාමාන්‍යයෙන් ඇය දැඩි කෝපයට පත්වී ඔහුට මුවින් පමණක් නොව අතින් පයින් ද ප්‍රහාර එල්ල කළ යුතු වුව ද නිහඬව ඇඳේ අයිනක හිඳ ගත් කල ඔහු පුදුමයෙන් ඇළලුණේ ය.

"මොකද වුණේ?" යි ඇය නොඇසුවා ය. කපන ලද අත්තකට යටවීමෙන් බිඳී ගිය පාදයෙන් නැඟෙන වේදනාව ඉවසමින් ඔහු ඇය දෙස විමසිල්ලෙන් බැලුවේ ය. කොළපාට ගවොමින් වඩාත් ඔප් නැංවුණු නමුදු ඇය වෙතින් දිස් වන ශෝකාකුල බව වටහාගත නොහැකිව "ඇයි?" යි විමසුවේ ය.

ඇය ඔහු ගේ දෑස දකින්නට මැළි වූවා ය.

"යන්ඩද හැදුවෙ?"

වැඩි වේලාවක් මිඩංගු නොකොට ඇගේ අළුත් ගවොමටත් දුක්බර පෙනුමටත් හේතු කවරේදැයි දැනගත් තරුණයා පහත් හඬින් ඇසුවේ ය. ඇය හිස සැලුවා ය.

"කොහෙද?"

ඇය පිළිතුරක් නොදුන්නා ය. ඔහු ගේ මුහුණේ අඳුර දැඩි විය.

Scanned with CamScanner

"ඉතිං යන්ඩෙපැයි... කව්ද අල්ලගත්තෙ..."

ඇගේ හිස පහතට නැඹුරු විය. ඇසිපිය අග එල්ලෙන කඳුළු බිඳු තරම් මේ මොහොතේ ඇගේ ද්වේෂයට පාත්‍රවූ වෙනත් යමක් නොවී ය.

"මං හිතාගෙන හිටියෙ හෙට ඔයත් එක්කම අම්මෙ අයියව බලන්ඩ යන්ඩ..."

තවත් යමක් පවසන්නට උවමනා වුවද වේදනාව ඔහු ගේ මුව අගුළුලයි. ඔහු දෙතොල තද කොට වසා ගනිමින් වේදනාව විඳ දරගන්නට වෙහෙසුණේ ය.

"ඇ... ඇයි?" හු... හුඟක් රිදෙනව ද...?"

ඔහුට ද නොදැනුවත්ව ම ඔහුගේ මුවින් පිටවූ කෙඳිරිල්ලෙන් තිගැස්සුණු ඇය වහා ප්‍රශ්න කළා ය.

"නෑ... රිදෙන්නෙ කොහෙද... හරි සනීපයි..."

ඇගේ කඳුළු පිරි දැස ඔහුගේ කෝපය යළි අවුළුවයි.

"ඇයි ඉතිං ගියෙ නැත්තෙ?" යන්ඩ ලෑස්ති වුණා නං යන්ඩ එපැයි. අපරාදෙ උදේ කිව්වනං මං ණයට හරි සල්ලි කීයක් හරි හොයලා දෙනවනෙ..."

ඇගේ ඇසින් ගලා ආ කඳුළක් රුවැති කොපුලක් ඔස්සේ රූරා හැලිණ.

"ඇයි ඉතිං අඬන්නෙ?"

ඒ රළු හඬ ඉවසිය නොහැකිව මෙන් ඇය ඔහුගේ නිරුවත් ළමැද මත හිස හොවා ගත්තාය. ඇය හඬා වැටෙන බව ඇගේ සැලෙන දෙවුරින් ද ළය තෙමන කඳුලින් ද වටහා ගත් ඔහු "ඇයි අඬන්නෙ?" යි යළිත් ඇසුවේ ය. එහෙත් ඒ පෙර මෙන් රළු හඬින් නොවේ. මෘදු මොළොක් හඬිනි.

"මගෙ ආඩියයි... ජරාවයි..." යි කියමින් ඔහු ඇගේ හිස ඔසවන්නට තැත් කළේ ය. එහෙත් ඇය තවත් තදින් මුහුන ඔබා ගත්තා පමණි.



"අඬන්ඩ එපා සඳුනි... ඔයා දන්නවද අන්තට යට වෙනකොට මට මතක් වුණේ මගේ අම්මව නෙමේ. මට මතක් වුණේ ඔයාව. මං මැරුණොත් ඔයාට මොකද වෙන්නෙ කියලා මට ලොකු බයක් දැනුණා සඳුනි... මං දන්නවා ඔයාගෙ හිත හයියයි. ඒ වුණාට මට මැරෙන්ඩ බය හිතුණා... මට ජීවිතේට ලෝබ හිතුණ සඳුනි... ඒ ඔයා හිංදා... සමහරවිට මං මැරුණෙත් නැත්තෙ ඔයාගෙ වාසනාවට වෙන්ඩැති.. ඒ අත්ත මගෙ ඔලුවෙ වැදුණනං මං එතනම මැරෙනවා. ආයෙ ඒකෙ දෙකක් නෑ..."

රෝගී දරුවෙකු රැක බලා ගන්නා මවකගේ භූමිකාවට ප්‍රවිශ්ට වීමට ඇය තීරණය කළේ ඉකිගසා හැඬීමෙන් පසු සැහැල්ලුව ගිය හදවතිනි.

"එක අතකට අරුං එද්දි ඔයා නොහිටපු එකත් හොඳයි... ඔයාව දැක්ක නං උං කොයිවෙලාවෙත් මෙහෙට්ට එන්ඩ ගනී.." යි කී ඔහු මඳ සිනාවක් පෑවේ ය.

ත්‍රීවිලරය පැමිණෙන විට තමා කවුල්ල අද්දර සිටි බව ඇය හෙළි නොකළා ය. බෙහෙවින් කැළඹී හුන් තරුණයන් තමා පමණක් නොව ප්‍රියානිද දකින්නට ඇත්තේ යාමතමින් විය යුතු ය.

"ඉස්පිරිතාලෙ යංද?" ඇය ඔහු වෙතින් ඉවත් වෙමින් ඇසුවා ය.

"තුවාලෙට බෙහෙත් දාලා තියෙන්නෙ... ඉස්පිරිතාලෙ නවතින්න කියද්දිත් සිංහල බෙහෙත් කරන්ඩ ඕන කියල මං ආවෙ ඔයා මේ ගෙදර තනියම ඉන්නෙ කොහොමද කියල හිතල..."

ඇගේ ළය දැවී ගියේ ය.

"ඔයා හරි මනුස්සයෙක්නෙ.." නවතින්ඩ කිව්ව නං නවතින්ඩ එපැයි."

ඔහු දෑස පියා ගත්තේ ය.

"මට වතුර ටිකක් බොන්ඩ ඕන..."

ඒ විඩාපත් හඬ ඇයට විඳ දරාගත නොහැක.

"සල්ලි කීයක් ද මංදා තියලා ගියා..."

ඇය කනප්පුව මත මුදල් නෝට්ටු කීපය දෙස හිස් බැල්මක් හෙළුවා ය.

"සල්ලි ටිකත් අරං පැනල යන්ඩද හිතන්නෙ?" යි ඇසූ ඔහු සිනාසෙන්නට වෑයම් කළේ ය.

"ඔයා ටිකක් නිදාගන්ඩ... මං කඩේට ගිහිං එන්නං..." යි ඇය බැරෑරුම් බැල්මක් හෙළමින් කීවා ය.

කුටුම්භයක බර දෙවුරින් ගන්නට තවම කුටුම්භයක කොටු නොවුණ කෙල්ල මුළු හදින්ම තීරණය කළා ය.

"කඩචෝරු කන්ඩ විතරයි කඩේට යන්නෙ... උඹ දන්නවද ආසෝ හාල් කිලෝඑකක් සීනි පන්සීයක් කීයද කියලා... අනේ අම්මාපල්ලා දවසක ඉතිං මිනිහෙක් දරුවෙක් එක්ක ඔට්ටු වෙන්ඩ ඕනැ නේද දැං ඔහොම කඩචෝරු කකා හිටියට..."

සීතාගේ වදන් අසමින් ඇය අළුත් ගවොම ගලවා වෙනත් ඇඳුමක් හැඳ ගත්තා ය. වෙනදා මෙන් පරිස්සම් නොවූ ඇය ඔහු කාමරය තුළ සිටින බව අමතක කළා ය.

"ඒයි..."

හදිසියේ ඇගේ අඩ නිරුවත දුටු ඔහු උද්වේගයෙන් කෑ ගැහුවේ ය. හඬ නගා හිනැහෙමින් ඇය හැකි ඉක්මණින් ඇඳුම් ඇඟලා ගත්තා ය.

"දැං බය නෑ නේද?... ඇයි ඉතිං කකුල කැඩිලනෙ මගෙ... ඉන්නවකො මේක සනීපවෙච්ච හැටියෙ මං තමුසෙට හොඳ වැඩක් කරන්ඩ..."

දඟකාර බැල්මක් හෙළු ඇය කාමරයෙන් පිටතට දිව ගියා ය. ඔහු දිගු සුසුමක් හෙළුවේ ය. ඇගේ සුන්දරත්වය යළි යළි දකින රිසියෙන් ඇස පියා ගත්තේ ය.

ඔහුට උවටැන් කිරීමෙන් ඇය ලද්දේ අපමණ සැනසුමකි.



"මං නං ඉතිං හත් අවුරුද්දක් ඔත්පලේ හිටියත් උඹ නං ඇහැක් ඇරලා බලන එකක් නෑ ආසෝ... මට වෙන්නෙ ඉතිං කවදා හරි ගූ හුජ්ජ ගොඩේම මැරිලා යන්ඩ... හූනා කියත් නැහේ මං ඒ ටික කියන්නෙ ඕං" යි සීතා කී අනාවැකිය සඵල නොවී ය. රෝහල්ගතව සිටි මුළු කාලය පුරාම ආශා ඇයට කොතරම් හොඳින් සාත්තු සප්පායම් කළේ ද කිවහොත් වාට්ටුවේ හෙදියන්ගේ පමණක් නොව රෝගීන්ගේ පවා ප්‍රශංසාවට ලක් වූවාය. එහෙත් මැහැල්ල සිය මිණිබිරිය තමාගේ මළමූත්‍රා පවා ඉවත්කොට පිරිසිදු කර දමන බව නොදත්තාය.

කෙල්ල පිළිකුලෙන් නොමැඩුණා ය. ශෝකයෙන් හේබා නොගියාය. අණක් නොපිරිහෙලා ඉටු කරන යාන්ත්‍රික රොබෝවරියක මෙන් ඇය සියල්ල මැනවින් කළා පමණි. එහෙත් මේ තරුණයාට සාත්තු සප්පායම් කරද්දී ඇගේ ළය වේගයෙන් ගැහෙයි. මුහුනට ලේ පුරයි. වාචාගත නොහැකි සෙනේහයෙන් දෙනෙත කඳුළු නැඟේ. වඩාත් අසීරු වූයේ ඒ සියල්ල ඔහුගේ දෙනෙතින් සඟවා ගැනීමයි.

"හරි වැඩේ නේද? ඔයා නිදාගන්නෙ කොහෙද?" යි ඔහු ඇසුවේ ඇය දිගු කළ බඳුනේ ඉඳුල් අත ඔබමිනි.

"ඇයි ඔයාගෙ පැඳුර..."

ඔහු මඳ වේලාවක් නිහඬව පසුවිය.

ඔයත් එන්ඩ ඇඳට..." යි ඔහු ඉල්ලා සිටියේ හැඟීම්බර හඬිනි.

"අම්මෝ බෑ..." යි ඇය දෙවුර හැකිළුවා ය.

"මේ අණ්ඩක් කඩාගෙන ඉන්න මගෙං ඔයාට මොන කරදරයක් වෙන්ඩද සඳුනි... පිස්සු නැතුව එනවා ඇඳට..."

"බෑ බෑ... මං පැදුරෙ..."

"ගොම්බො කැරපොත්තො විතරක් යැ මීයොත් දුවනවා රෑ තිස්සෙ."

ඔහු තමා බියපත් කරවන්නට දරන වෑයම ඇය සිනාවකින් ඉවසුවාය.

"මං ඔය මොකෙකුටවත් බය නෑ..." යි කියමින් ඇය කාමරයෙන් පිටවන්නට තැත් කළාය.

"මට නම් බය. මං යකෙක්නෙ..."

ඇය දෙතොල හැර නොයන මඳහසින් පැදුර එලුවා ය.

"එතකොට අද කතාව කියන්නෙත් නැද්ද...?" යි ඔහු මඳක් උස් හඬින් ඇසුවේ ය.

"නෑ"

"ඇයි?"

"ඔයාට සනීප නැනේ..."

ඔහු උඩුකය කෙළින් කළේ කෙඳිරියක් ද නගමිනි.

"දවලුත් නිදියලා මට නිදිමතක් නෑ... කතාව කියන් නැත්තං මං එනව තමුසෙගෙ පැදුරට..."

ඇය වහා නැඟී සිටියාය.

"මොන කරදරයක් ද මංදා..." යි දොස් පවරමින් ඇය නැවතත් කාමරයට අතුළු වූයේ පැදුරත් කිහිලි ගන්වාගෙනය.

"තමුසෙ දවල් තිස්සෙ බුදියගත්තට මං බුදිව්වද...? සේරම ළඟට කරලා මං දැංවත් බුදියගන් නැද්ද... අනිත් එක හෙට මං වැඩකට යන්ඩත් ඕන... හැමදාම අර මිනිස්සු සල්ලි ගෙනැල්ල දෙන්නෙ නැනේ..."

ඇය කෝපයෙන් බෙරිහන් දුන්නද ඔහු තුළ කෝපයක් හෝ අප්‍රසාදයක් ගැන නොනැඟිණ. සන්සුන් කෙල්ලට වඩා මේ නොසන්සුන් හා හා වහා කිපෙන එකියට තමා ප්‍රිය කරන බව වටහා ගනිමින් දුක්මුසු බැල්මක් හෙලුවේ ය.

"හෙටවත් ඔය සල්ලි ඇතිවෙයිනෙ..."

"එහෙම කියල බෑ... මං උදේට ඔක්කොම කරල යන්නං... හවස ආපහු එනවනේ..."

"හදිසියේ මට කක්කබර වුණොත් මොකද කරන්නෙ?"



ඇය ඔහු දෙස එක එල්ලේ බැලුවා ය. එහෙත් කුඩා කොලුවෙකුගේ වැනි ඒ අවිහිංසක බැල්ම ඇගේ කෝපය තුනී කරයි.

"ඔයාට තේරෙන් නැද්ද... මං මොනවා හරි කරන්ඩ ඕන... එහෙම නැත්තං ඔයාලගේ අම්මට කෝල් එකක් දෙන්ඩ ඕන ඔයාගෙ කකුල කැඩිල කියලා... එතකොට ඒ ගොල්ලො ඇවිල්ල ඔයාව එක්කරගෙන යයි..."

ඔහු තිගැස්සුණේ ය.

"එපා එපා... හරියකට ඇවිද ගන්ඩවත් බැරුව මම කොහොමද අම්මලා දකින්ඩවත් කැමති වෙන්නෙ"

"ඒ හිංදා තමයි කියන්ඩ ඕන. එතකොට ඒ ගොල්ලො හොඳ වෙදකමක් කරයිනෙ"

"හරි... අපෙ අම්මලා මාව එක්ක යයි. එතකොට ඔයා? ඔයාට මොකද වෙන්නෙ?"

ඇය නිහඬවම ඔහු ගේ ඇඳ පාමුල පැදුර එලුවා ය.

පය බිම ඔබා ඇවිද ගන්නට බැරි තරුණයෙකු සමඟ එක කාමරයේ රැය පහන් කිරීම අනතුරුදායක නොවන බව වටහාගත්තාක් මෙනි.

"කියනවා ඉතිං... තමුසෙට මොකද වෙන්නෙ?"

ඔහු දළලා වැඩෙන කෝපයෙන් ඇසුවේ ය.

"මට මොනව වෙන්ඩද... මාත් ඉතිං කොහෙ හරි යන්ඩ එපැයි. මේක අස්සට වෙලා ඉඳල හරියන්නෑනෙ හැමදාම..."

ඔහු සුසුමක් හෙළුවේ ය.

"සඳුනි... මට ටිකක් කල් දෙන්ඩ... මටත් ජීවිතේ වැරදිලා... ඔයත් තනිවෙලා තමා. ඒ වුණාට ඔයා එක්ක ගෙවන ජීවිතයක් ගැන මට තවම හිතාගන්ඩ බෑ... අතරමග දාලා යන්ඩ මට ඔයත් එක්ක ගමනක් පටං ගන්ඩත් බෑ... මං ඉක්මණටම තීරණයක් ගන්නං... එතකං ඉවසන්ඩ සඳුනි. එක රුපියල් සීයක් අතේ නැතුව ඉන්ඩ හිටින්ඩ තැනක් නැතුව කසාද බඳිමු කියල කට

Scanned with CamScanner

ඇරලා කියන්නෙ කොහොම ද මං...? මාව තේරුම් ගන්ඩ" යි කියන්නට ඔහුට උවමනා විය. එහෙත් ඒ වෙනුවට ඔහු යළිත් වැතිරෙන්නට වෑයම් කළේ ය. ඇය පැදුර බිම දමා ඔහු වෙත නැඹුරු වූවා ය. ඇගේ උපකාරයෙන් හිස කොට්ටයේ තබාගත් ඔහු පයෙහි වේදනාව උත්සන්න වූ බැවින් කෙඳිරි ගෑවේ ය.

"ඔය ඉතිං... ඒක තමා කිව්වෙ දඟලන්නෙ නැතුව ඉන්ඩ කියලා... හෙල්ලුනාම රිදෙනවා තමා..." යි නෝක්කඩු කියමින් ඇය ඔහු ගේ ඉහ අද්දර හිඳ ගත්තා ය.

"මං ඔලුව අත ගාන්නං නිදාගන්ඩ" යි මෘදු හඬින් ඉල්ලා සිටියාය.

"ඔලුව නෙමේ රිදෙන්නෙ කකුල"

"ඒක මං දන්නවා මෝඩයෝ... ඒ වුණාට කකුල අල්ලන්ඩ බෑනේ... බෙහෙත් බැඳලනෙ තියෙන්නෙ..."

"එහෙනං ඔලුව නෙමේ ඊට ටිකක් පල්ලෙහයින් අතගාන්ඩ"

"කොහෙද පපුව...?" පපුවත් වැදුණ ද...?"

චිමිනි ලාම්පුවේ සෞම්‍ය ආලෝකය ඇයට ඔහුගේ පුළුල් ළය මඬල පිරික්සා බලන්නට බාධා නොකරයි.

"නෑ... ඊට ටිකක් පහළින්"

"බඩ...? බඩත් රිදෙනවද?"

"නෑ... ඊටත් ටිකක් පල්ලෙහා" ඇය වහා නැඟී සිටියාය. "එන්ඩෙපා දන්නවද ඕන්නැති කතා කියන්ඩ... පච් කියලා ඔලුව ටිකක් අතගාන්ඩ හැදුවෙ... නින්ද යයිද බලන්ඩ. තියෙන වනවරකම... කකුල කැඩිලවත් වනවරකම ගිහිං නෑ... ඒක එහෙමමයි..."

ඇය බැන වැදුණද ඔහු මුව'ග නැඟි සිනාව මැඩ ගත්තා විනා කිසිවක් නොපැවසුවේ ය. එහෙත් ඇය චිමිනි ලාම්පුව නිවා දමා පැදුරේ වැතිරුණ හැටියේ "තරහ ද?" යි ඇසුවේ ය.

"ඔව්..."



"තරහ වුණාට කමක් නෑ... කියන්ඩකො... වසන්ත බණ්ඩාරගේ ගෙදර ගියාට පස්සෙ මොකද වුණේ...?"

"නමත් මතකයි" සිතූ ඇය සුසුමක් හෙලුවා ය.

මොහොතකට පසු ඇගේ හඬ අඳුරේ රැව් දුන්නේ ය. ඈඳ මත වේදනා ගෙන දෙන පය නොසලකා හරිමින් ඇයට සවන් දුන්නේ ඔහු පමණක් නොවේ. ඒ මේ අත ඉගිල යන කලාමැදිරියන් ඒ අඳුරේ ආලෝක රටා අඳින්නට වෙහෙසෙමින් ඇගේ කතාවද ඇසුවා නිසැකය.

"ඇයි ගේ පිච්චුවේ? මොන හිතකින් ද එහෙම කෙරුවෙ? හෙණ ගහන්ඩ ඕන... හෙණ හතක් ගහන්ඩ ඕන තොට"

වසන්ත බණ්ඩාර දුටු හැටියේ ඇය ප්‍රශ්න කළේ ද ශාප කළේ ද කඳුළු වගුරුවමිනි.

ඔහු නිහඬව හා මහත් උවමනාවෙන් ඇය දෙස බලා සිටියේ ය.

තමාගේ පැහැයද ස්වරූපයද උසුලන කෙල්ල තමා නිසා ගැබ්ගත් දුගී ළඳකගේ කුසින් බිහිවූවක යැයි සිතෙත්ම ඔහුට දැඩි අපහසුතාවයක් දැනිණ. අනුරාගයෙන් ඇවුණ එක් නිමේෂයක නියත ඵලය මේ හඬන ශාප කරන මනුෂ්‍ය ජීවියාදැයි හෙතෙම පුදුමයට පත් විය. ඇයට හෝ ඇගේ මවට සාධාරණය ඉටු කරන්නට තමා නොසිතුවේ මන්දැයි කල්පනා කරන්නට වසන්ත බණ්ඩාර මැළි විය. දිගු ගමනක් යාමට පෙරුම් පුරන්නෙකුට ඒ ගැහැනියද යුවතියද වහා මකා දැමිය යුතු කළු පැල්ලමක් විනා අන් කිසිවක් නොවේ.

"ගින්දර කෑවනං රෙන්ඩ වෙන්නෙ අඟුරු තමා..."

ඔහුගේ නිත්‍යානුකූල බිරිඳ කෝපයෙන් ද ශෝකයෙන් ද වෙව්ලමින් කියා සිටියේ එපමණකි. ඉනික්බිති ඇය ගෘහ අභ්‍යන්තරය විසින් ගිලගත්තාක් බඳුය.

"මං මොන බම්බුවටද ඒ පැල පුච්චන්නෙ?"

දියණියගේ කඩා වැදීමෙන් නොව බිරින්දෑගේ නිර්දය ප්‍රකාශයෙන් කිපුණ මිනිසා ඇසුවේ රළු පරළු හඬිනි.

Scanned with CamScanner

"එහෙනං වෙන මොකද ඒ වගේ මිනු වැඩක් කරන්නෙ? ඒක කොට පැළක් වුණාට මට මාළිගාවක්..." යි කී ආශා සුවපහසු අසුනක් මත හිඳ ගත්තාය.

"මං දැං පොලීසියට කෝල් කරොත් මොකද වෙන්නෙ කියල දන්නවද?"

ඔහු විශ්වාස කළ ලෙස ඇය බියට පත් නොවූවා ය.

"ආහුදෙ... පොලීසිය බැරි නං ඕන එකෙක් ආහුදෙ... මටත් තියෙනවා කියන්ඩ කතාවක්... ගඳ ගහන කතාවක්... හැබැයි ගඳ ගහන්නෙ මාව නොවේ... ගඳ ගහන්නෙ තොපි..."

ඇය කෑ ගැහුවේ ඇගේ වයසට ද රූප සෝභාවට ද කොහෙත්ම නොගැලපෙන අන්දමිනි.

"මේ යුවතිය හිටපු පළාත් සභා අමාත්‍යවරයාගේ අවජාතක දියණිය බව ගම්මු දනිති. එහෙත් ඒ බවත් මාධ්‍ය ඔස්සේ මුළු මහත් රටක ජනතාවට හෙළිදරව් වීම පිළිබඳව ඔහු කැමති වන්නේ කෙසේ ද? තමාගේ අපකීර්තිය හා විනාශය මීට මොළ වගත් මේ යුවතිය සම්බන්ධයෙන් මීට පෙර සුදුසු ක්‍රියා මාර්ගයක් නොගත්තේ මන්දැයි ඔහු පසුතැවුණේ ය.

"එදා ඉස්කෝලෙදි අර ගාථාව කියාගෙන වැඳපු දවසෙමයි මට මේ බැල්ලිගෙ කට වහන්ඩ තිබ්බෙ..." යි ඔහු අලංකාර ආලින්දයේ සක්මන් කරමින් කොඳුළේ ය.

"වසන්ත මහත්තයා කියනවනං අපිට කිරියම්මයි අම්මයි මිණිකිරියි තුන්දෙනාටම වැඩක් දුන්නැහැකි..." යි වන්ගෝලයන් කී කල ඔහු එහා විරෝධය පෑවේ ය.

"චන්ද්‍රනී නං කසාද බැඳලා පැත්තකට වෙලා ඉන්නවනෙ... අර නාකි මරගාතෙ වෙන්ඩැති කෙල්ලට උගන්නනවා ඇත්තෙ... කීයක් හරි කඩාගන්ඩද කව්ද දන්නෙ... කපටි ගෑනු" යි කීමෙන් ඒ සිදුවීම අමතක කර දමන්නට ඔහු වග බලා ගත්තේ ය. එහෙත් තමාගේ ඒ තීරණය සාවද්‍ය බව ඔහුට දැන් වැටහෙයි.

"කුමාරි..." යි හඬගාමින් දිව ආ කුමාර දේපොලඥයා පැටලී හුන් අවුල් ජාලයෙන් ගලවා ගත්තේ ය.

"මොකද මේ? පිස්සු ද?" යි ඇසූ දේවදාසයා "යං යං" යි ඇය නැගිටුවා ගත්තේ ය.

"කොහෙ යන්ඩද...? මට යන්ඩ තැනක් නෑ..." යි ඇය මුර ගෑව ද ඔහු වදෙන් පොරෙන් ඇය ඇදගෙන ගියේ ය.

වසන්ත බණ්ඩාර ඒ පියකරු තරුණියා දෙස බලා සිටියේ බලවත් උවමනාවෙනි. ඔහු ගේ දෑස ද සිත ද මොහොතකට කැමරාවක් විය. වඩා උසස් ඡායාරූපයක් ගත හැකි අන්දමේ අගනා කැමරාවක් විය.

"මං ඉස්පිරිතාලෙටත් ගියා..."

කුමාර පැවසුවේ හතිලමිනි. ඇය සමග පොර බැදීමෙන් ඔහු වෙහෙසට පත්ව සිටියේ ය.

"සීතම්මා මැරුණට පස්සෙ මං ඉස්පිරිතාලෙට වෙලා මොනව කරන්ඩ ද?"

අවුල් හිසකේ එක්ක ඇය ඔහු වෙත කඩා පැන්නේ යක්ෂණියක මෙනි.

"මැරුණා...?" යි ඔහු ඇස්ගෙඩි උඩප්පා ගනිමින් අපමණ පුදුමය පළ කළේ ය.

දේවාල බිමේ දැවැන්ත නුග ගසේ සිහිලසින් ඇය මදින් මද නිවෙන්නට පටන් ගත් බව පෙනෙන්ට තිබිණ.

"අයියෝ දැං මොකද කරන්නෙ? අම්මට කිව්වද...?"

ඇය හිස දෙපසට සැලුවා ය.

"එතකොට...? මිනිය එහෙටවත් ගෙනියන්ඩ වෙයිනෙ"

"මිනිය එහෙට මෙහෙට ගෙනියල්ලා හරියනවැයි. වළ දානවා මිසක..."

ඔහු ඇය දෙස බලාගත් වනම සිටියේ ය. හරියට ඇය ගේ දෙතොල අතරින් ඇඹරෙමින් නලියමින් සර්පයෙකු පිටතට එන අපූරුව නරඹන්නෙකු මෙනි.

Scanned with CamScanner

"ඉස්පිරිතාලෙං වළ දැම්මා" යි ඇය කීවේ බලු බළල් කුණක් වළ දැමූ බව කියන්නාක් මෙනි. ඔහු අතකින් නළල මිරිකා ගත්තේ ය.

"ඇයි? ඇයි කුමාරි එහෙම කෙරුවෙ...? උන්දැ පව් නේද...?"

"මැරුණම වළ නොදා? වෙන මොනව කරන්ඩ ද?"

ඔහුගේ සිත වේදනාවෙන් කිරි ගැසිණ.

"උන්දැ අනාථයෙක් නෙමේනෙ කුමාරි... දුවෙක් බෑනෙක් ඉන්නවනේ... ඔයාට අයිතියක් තියෙනව ද ඔහොම කරන්ඩ... කොච්චර වැරදිද... ෂික්... මට නම් හිතාගන්ඩ බෑ..."

ඇගේ මුව'ග අවඥාබර සිනා බිඳක් නැගිණ.

"අහගන්ඩ එපා මගෙං දුවගෙයි බෑනගෙයි කෙරුවාව... ඉන්නකං හරියකට බැලුවෙ නැති මිනිස්සුන්ට මළ මිනිය මොකට ද...?"

"අම්මයි බාප්පයි ඔයාට බනී කුමාරි"

"බැනපුදෙං... මං බය නෑ ඔය එකෙකුටවත්"

"දැං අර මිනිහත් ඔයත් එක්ක වයිර බැඳගෙන ඇති... ඔයා මොනවද මේ කරන මෝඩ වැඩ...?"

දේවදාසයා සැබවින්ම ඇය පිළිබඳව බිය විය. කළුගලේ ඔලුව ගහගන්නට තතනන කෙල්ල පිළිබඳ ව උපදනා බිය ද සැකය ද ඔහු ගේ පියකරු බව සොරා ගනියි.

"වයිර බැන්දා කියලා මොනවා කරන්ඩද...? ඒ මිනිහා මාව ජාතක කළා වගේම ඕන් නං මාව මරයි. එච්චරනේ"

ඔහු කිසිවක් නොපැවසුවේ ය. තීරණයක් ගත යුත්තේ තමා බව ඔහුට අවබෝධ වෙයි. මේ සා රූමත් යුවතියකට විනාශ වන්නට ඉඩ හැර බලා සිටිය හැකි ද?

"කුමාරි... මං කියන දේත් පොඩ්ඩක් අහන්ඩ... මට ඔයාව අද අපේ ගෙදර එක්ක යන්ඩ බෑ... මම ඔයාව ගුරුන්නාන්සෙ මාමලගේ ගෙදර නවත්තන්නං... ඒ නැන්දම්මාත් හරි හොඳයි..



ඔයාගෙ කිරියම්මගෙ හත් දවසෙ දානෙ තුං මාසෙ දානෙ දෙනකල් ඉතිං කැවුමක්වත් බඳින්ඩ හොඳ නැනේ... අපි තිකං කසාදෙ ලියල දාමු. තුංමාසෙ දානෙත් දීලා. එහෙම හොඳයි නේද...?"

ඇගේ සියොළඟ හිරි ගඩු නැඟිණ. විවාහය? ඇය එබන්දක් පිළිබඳ ව මෙතෙක් නොසිතුවා ය. ප්‍රේමය හෝ විවාහය තමාට අකැප බවක් හෝ කල්පනා කරන්නට තරම් නිරවුල් මනසක් ඇය වෙත නොවිණ.

"ඉතිං කුමාර ඔයාව කසාද බැන්දද?"

නිම්හිම් නොවන විස්මයෙන් ප්‍රශ්න කළේ ද බිඳුන පය අමතකව ගියෙන් වහා උඩුකය කෙළින් කළේ ද සඳුන් ය. ඒ උස් සිහින් තරුණයා ය.

# 20

ළබැඳියෙකු වැළඳ ගන්නා කලෙක මෙන් මදටියා ගස බදාගත් කෙල්ල කඳුළු සැලුවාය. කඳුළට ද්වේෂ කළ එකිය කඳුලින් සියළු සෝ තැවුල් පිසදා හරින්නට දරන නිෂ්ඵල ප්‍රයත්නය දෙස කරල් එල්ලාගත් මදටියා ගස දයානුකම්පාවෙන් බලා සිටිනු වැන්න.

"මං අහන්නෙ මිනිහා තමුසෙව කසාද බැන්දද කියලා... ඇයි උත්තරයක් දෙන්ඩ බැරි...?"

සඳුන් කෝපයෙන් දැවෙන බව දැන දැනම ඇය නිහඬව පසුවූවා ය.

"ඒකයි එහෙනං මගෙං බේරෙන්ඩ හදන්නෙ... මට බොරු කිය කියා මගෙං තමා බේරිලා ඉන්ඩ හදන්නෙ... ඇයි ඉතිං හොරේ අහුවෙනවනෙ මට ඉඩ දුන්නොත්. ඒ මිනිහාව කසාද බැඳලා ඒ මිනිහා ඇලා පැනලා ඇවිල්ලා මෙතන ඇටි කරන්නෙ නිකං මැස්සෙක්වත් ඇගේ වහල නැති සයිස් එකට... මහලොකු පත්තිනි අම්ම. මම යි මෝඩයා... මම යි ගොනා... ෂික්..."

ඔහු මධ්‍යම රාත්‍රිය පසුවනතුරුම බැන වැදුණේ ය. ඇය හඬ නොනැඟෙන සේ කඳුළු සැලුවා විනා දෙතොල සලිත නොකළා ය.

"එ... එළියට යන්ඩ ඕනද...?" යි ඇය හැඬීමෙන් බැරැඩිව ගිය හඬින් ඇසුවේ කිසිවක් සිදු නොවූ ලෙසිනි.



"මට තමුසෙ කණවැල අල්ලන්ඩ ඕන නෑ... මං යන්නං මට ඕන්නං..."

"කකුල බිම තියන්ඩ හොඳ නැතේ..."

"කකුල කරේ තියාගෙන ගියත් තමුසෙට වැඩක් නැතේ..."

එහෙත් ඔහු කොතෙක් බැන වැදුණද ඔහුට උපකාර කරන්නට ඇය සැදී පැහැදී සිටියා ය. දහදිය වගුරා තමාගේ කුසගිනි නිවූ තරුණයා වෙනුවෙන් ඇය කිසිකලෙකත් නොකළ පරිද්දෙන් ඉවසන්නට පුරුදු වූවා ය.

"ඉවසීමක් කියලා දෙයක් ඇත්තේම නෑ... අනේ මංදා කැත්තට පොල්ලට වගේ ඉඳලා කොහොම පවුල් කන්ඩද කියලා කවදා හරි දවසක..." යි කොතෙකුත් කනස්සල්ලට පත් වූ මැහැල්ල මිණිබිරියගේ මේ ඉවසීම දුටුවේ නම් විමතියෙන් මුව අයාගන්නවා නිසැකය. ඉවසා සිටින්නට කොතෙක් වෑයම් කළද සඳුන් කිරි කෝප්පය විසි කළ විට ඇය කෝපයට පත් වූවා ය.

"මොන අපරාදයක් ද ඒ කෙරුවෙ? මං චූටි කිරි පැකට් එකක් ගෙනාවෙ තමුසෙට විතරයි... මාත් බිව්වෙ නිකං තේ කහට... අසනීපෙං නේද කියලා හිතලයි කිරි එකක්ම හදල දුන්නෙ..."

"මට ඇති අසනීපයක් නෑ... මට අසනීපයක් තිබ්බත් නැතත් තමුසෙ මොන මඟුලට ද මට සාත්තු කරන්නෙ...? තමුසෙ සාත්තු කරනවා තමුසෙව කසාද බැඳපු අර කුමාරද මොකාද කියන එකාට..."

ඇය ගෙබිම පිරිසිදු කර දැමුවා විනා කිසිවක් නොපැවසුවා ය.

"කට උත්තර නෑ... අනික් ඒවට නං කට ගහගෙන එනවා... මිනිහ ගැන කියද්දි ගෑනි මීක් සද්දයක් නෑ... ඇයි ඉතිං මෙතන රැඟුවෙ ආසයයි මාසයයි වගේ... කසාද බැඳල තියා පිරිමියෙක් අතින් අල්ලලාවත් නෑ වගේ... මට ම හොඳයි ඉතිං ඔය පාට්... මං මී හරකනෙ... ෂික්... මං නං පට්ටම පට්ට ගොනා..."

Scanned with CamScanner

බරව ගිය හදින්ද අඳුරු අසෝබන මුහුණින් ද ඇය ගෙනා බත්පත දෙස ඔහු හැරී බැලුවේවත් නැත.

"මේ බත් ටික කන්ඩ... තේ බීපු නැති එකේ බත් කටක් දෙකක්වත් කන්ඩ සඳුන්..."

ඇය නැවත නැවතත් පෙරත්ත කළා ය.

"තමුසෙම කා ගන්නවා... මට ඕන් නෑ..."

"එහෙනං මං කවන්ඩද?"

ඔහු ඇය දෙස රවා බැලුවේ ය.

"තමුසෙගෙ මිනිහට කවා ගන්නවා. මට මොකට ද බත් කවන්නෙ...? මං මොකෙද්ද...?"

කන්‍යාවකැයි මෙතෙක් දවස් ඇඩිව විශ්වාස කළ යුවතිය විවාහයෙන් බැඳී මිනිසෙකු සමඟ යහන්ගත වූ එකියක බව සිහි වන වාරයක් පාසා ඔහු ඇවුණේ ය. බිඳී ගිය පාදයේ වේදනාව පරයා ඔහුගේ හද වේදනාවෙන් පිරී ඉතිරී ගියේ ය.

සියල්ලට වඩා උසුලා ගත නොහැක්කේ ඇය තමා මුසාවෙන් රැවටීමයි.

"ඔයා මුකුත් දන්නෙ නෑ නෙ සඳුන්... මං ඔයාට සේරම කියන්නං... අනේ මට බනින්නම ඕන නම් බත් ටිකක් කාල බනින්න..."

තමා කිසිවෙකුටත් මේ අන්දමින් බැගෑපත් වී නැති බව ඇය සිහි නොකළා ය.

"තවත් ඉතිං මොනව ද දැන ගන්ඩ තියෙන්නෙ. ඔක්කොම මං දැං දැන ගත්තනෙ... මට හිතාගන්ඩ බැරි එක මිනිහෙක් එක්ක බුදියගත්තු තමුසෙ මොකද මට මෙච්චර ගණන් ඉස්සුවේ කියන එක..."

"ඇති දැං ඇති ඕක..." යි ඇය කෑගෑවේ අන්ත අසරණ වූ එකියක මෙනි.



"කොහොම ද මට අපු මොත්තෙ... අනේ මට මෙච්චරයි තියෙන්නෙ... මට වෙන මුකුත්ම නෑ... ඒක නං මාරයි... පට්ටම පට්ටයි..."

ඇය විළියෙන් ශෝකයෙන් හා කෝපයෙන් මිරිකුණා ය.

"ඊයෙත් යන්ඩ ගියේ මොකෙක් එක්ක ද කව්ද දන්නෙ... මං ඉතිං දවල් තිස්සෙම ගෙදර නැනෙ... මොකා එක්ක මඟුල් නටනවද කියලා මට පේන එකක් යෑ..."

"කට වහගනිං..." යි ඇය මෙතෙක් වේලා මෙල්ල කරගත් යක්ෂණිය ප්‍රාදුර්භූත විය.

ඔහුගේ කට වසන්නට තරම් ඇයගේ පෙනුම රෞද්‍ර විය.

"මගෙ කතාව තව ඉවර නෑ.... අද රෑට මං ඉතුරු ටිකත් කියන්නං... එතකං ඔය කට වහගෙන හිටපං කුණු කතා කියන්නෙ නැතුව... මං උඹේ ගූ හුජ්ජත් අදින්නං.... හැබැයි ඔය කට ආයෙත් ඇරියොත් මට මාරයා වැහෙයි..."

ඔහුගේ විස්මිත බැල්ම නොතැකූ ඇය කාමරයෙන් පිටවූවා ය.

"කළු අයියලා ආවම මං යනවා ඉස්පිරිතාලෙ නවතින්ඩ... ඊට පස්සෙ තමුසෙට ඕන මඟුලක් නටන්ඩ බැරියැයි..."

ඔහු හඬ නඟා කීවේ ඇය කොතනක සිටියද ඇසෙන ලෙසිනි.

ගස් කට්ටිය පැමිණි විගස ඇය පිළිකන්නට වැද මදටියා ගසට මුවා වූවා ය. තමාට බැන වදිමින් හෝ සඳුන් රෝහල් ගත වීම හොඳ බව ඇයට සිතිණ. ඔහුට උවටැන් කිරීමෙන් විඩාපත් වූ නිසා නොවේ. ඔහු බලවත් වේදනාවෙන් පෙළෙන බව පෙනෙන බැවිනි.

"ත්‍රීවිලරයේ හඬ නෑසී යනතුරුම ඇය ගෙතුළට යාමට නොසිතුවා ය. එහි හඬ ඇගේ ළය පාරා දැමුවේ ය. ඔවුන් ඔහු කැටිව යන්නට ඇති. තමා මඟ හැර සිටීමෙන් බලවත් වරදක් කළ බව සිතමින් යළි යළි පසුතැවෙමින් ඇය ගෙතුළට දිව්වාය.

Scanned with CamScanner

කාමරයට පිවිසෙන්නට බැරි තරමට ඇගේ දෙපය සැළුණේ ය. ඔහු වැතිරී හුන් ඇඳ හිස් ව ඇතුවාට සැක නැත.

"සඳුන්... අනේ සඳුන්" යි නොකඩවා තොල් මතුරමින් දිව ආ ඇය දොරකඩ ගල් ගැසුණා ය.

ඔරවා නෙරවා ගත් ඇසින් ඔහු ඒ පරණ ඇඳ මත වැතිර සිටියේ ය. තමාගේ ඇස් තමා රවටන බව සිතන්නට කැමැත්තී වහ වහා ඇසිපිය සැළුවා ය. ඔහු වෑයමෙන් උඩුකය කෙළින් කළේ ය. ඇගේ මුහුන වඩා හොඳින් දැක බලාගන්නට වාගේ.

ආශා අතකින් මුව තද කොට වසාගත්තා ය. එහෙත් ඇය කඳුළු නවතාගත නුහුණුව, ඔහුට තමා හෙළිදරව් වන බව දැන දැන ම බලා සිටියා ය.

"ගියාද කියල බලන්ඩ වෙන්ඩැති දුවගෙන ආවෙ... යන්ඩ තමා හැදුවෙ... කොහෙද ඉතිං... මට හිත හදාගන්ඩ බෑ තමුසෙව දාලා යන්ඩ... තමුසෙ කිසිම ලැජ්ජාවක් නැතුව මාව රැවට්ටුවට මට හිතක් පපුවක් නෑ වාගේ දාල යන්ඩ බෑ... ඔතන උලම වගේ බලං ඉන් නැතුව යනව යන්ඩ මගෙ ඇස් දෙකට පේන්නැතුව... මට තමුසෙව පේන්ඩ බෑ..."

වෙනදා මෙන් ඇය කෝපයට පත් නොවූවා ය. කැට මුගුරු පහර කමින් ස්වාමියා වෙතම ඇදී යන බැල්ලක මෙන් ඇය ඔහු වෙත ගියා ය.

බිත්තිය පැත්තට හැරෙන්නට උවමනා වුව ද තවමත් වේදනා ගෙන දෙන පය ඔහුට බාධා කරයි. එබැවින් ඔහු හිස පමණක් හරවා සිත රිදවන ඒ රුව නොදකින්නට තැත් කළේ ය.

ඇය ඔහුගේ හිස අද්දරින් හිඳ ගත්තේ යළිත් බැන වදින්නට බැරි නැතැයි හඟිමිනි. එහෙත් ඔහු ඇය තමා සමීපයෙහි සිටින බව නොදන්නවාක් මෙන් නිහඬව පසුවිය. සැලෙන අතින් ඔහුගේ හිස පිරිමදින්නට වූ ඇය "මගෙ පපුව පැලෙන්ඩ වගේ ආවා" යි හැඬුම්බර හඬින් කොඳුළා ය.

"ඇයි? මං ගියෙ නැති හින්ද ද?"

ඔහු අවඥාබර හඬින් ඇසුවේ ය.



"ඔහොම කතා කරන්ඩ එපා සඳුන්... මං... මං සීතම්මා මැරිලවත් ඇඬුවෙ නෑ... දන්නව ද සීතම්මව වළ දැද්දිවත් මගේ ඇස් දෙකින් එක කඳුලක් වැටුණෙ නෑ..."

ඒ හෙළිදරව්ව ඔහුගේ සිත දවන කෝපාග්නිය මත පතිත වූ අනෝරා වැස්සකි.

"ඉතිං ඇයි දැං අඬන්නෙ? මං හින්දද...? ඇයි මං හින්ද අඬන්නෙ... ඔයා එක දවසකුත් ඇඬුවා... මං ඔච්චර අහලත් ඒ ඇයි කියල කිව්වෙ නෑනේ..."

ඇය මේ මොහොතේත් කඳුළු සලන බව වැටහී ගියෙන් ඔහු ප්‍රශ්න කළේ දයාන්විත හඬිනි.

"මං දන්නෑ... මං දන් නෑ මට මොනා වෙලා ද කියලා... සීතම්මා කිව්වෙ මගේ ඇහෙන් එක කඳුළු බිංදුවක් වැටුණොත් හෙට ඉර පායන පායන එකකුත් නෑ කියලා..." යි කී ඇය දුක්බර මඳහසක් පෑවා ය.

ඔහුට ඇගේ මුහුන දැක බලා ගන්නට උවමනා විය.

එහෙත් ඒ සඳහා දරන ලද ප්‍රයත්නය වේදනාකාරී විය.

"දඟලන්නැතුව ඉන්ඩ අනේ.. තේරෙන් නැද්ද... කකුල පෑරෙනවා..."

ඇය තරවටු කළේ මවක මෙනි.

"ඔයා වෙලාවකට අපෙ අම්ම වගේ..."

ඇගේ ඇඟිලි තුඩු හිස පුරා දිවෙන කල උපදනා නොහිමි සහනයේ ගිලෙමින් ඔහු කෙඳිරීය. පෙරදා රාත්‍රියේ සිට තමා නිර්දය ලෙස ඇයට බැන වැදුණ බව ද, විශ්වාස කළ නොහැකි ලෙස ඇය නිහඬව කඳුළු සැළු බව ද ඔහුට අමතකව ගියාක් මෙනි.

"මට අම්මගෙ නම්බර් එක දෙන්න..."

"ඒ මොකට ද?"

Scanned with CamScanner

"ඔයාට තේරෙන්නැද්ද සඳුන්... ඔයා මෙහෙම දුක් විඳින්ඩ ඕන කෙනෙක් නෙමෙයි. මට නං ඉතිං ඉපදෙන්ඩ කලිං ඉඳලම දුකම නේ. ඔයා එහෙම නෙමේ. ඔයා කකුලකුත් කඩාගෙන ඉන්නවා කියල කීවම අම්මලා ඇවිල්ලා ඔයාව එක්කගෙන යයි."

ඇය කතා කරන්නේ පැසුණු තලකුනා ගැහැනියක පරිද්දෙනි.

"නෑ ඕන්නෑ..."

"එහෙම කියන්ඩෙපා සඳුන්... ඔයාගෙ අම්ම මොන දුකක් ද විඳිනවා ඇත්තේ ඔයා ගැන හිත හිතා..."

"මං අම්මට සැරයක් දෙකක් කතා කෙරුවා..."

"හරි ඉතිං... ඒ වුණාට මෙහෙට ආවට පස්සෙ කතා කෙරුවෙම නැනේ..."

ඇය හමු වූ දිනයෙහි තමා ගේ දූරකතනය අහිමි වූ බව කියන්නට නොගිය හෙතෙම සිය මව වෙනුවෙන් සුසුමක් හෙළුවේ ය.

"කකුල හොඳ වුණාට පස්සෙ අපි යං අම්මව බලන්ඩ..."

ඇයට ඒ වචන ඇදහිය නොහැක.

"මො... මොකක්ද කිව්වෙ?"

ඇය සැලෙන හඬින් ඇසුවා ය.

"හොඳට ම ඇහුණනෙ කිව්ව එක..."

ඇයගේ දෑසට යළිත් කඳුළු නැගේ.

"ඔයාගෙ අම්මා මාව ගහල පන්නයි..."

"එහෙම කොහොමද...? අම්ම කොහොමද මගෙ නෝනව එළවන්නෙ...?"

ඇගේ අතැඟිලි ඔහු ගේ හිසකේ අතර ගල් ගැසිණ.

"මං... මං... ඔයාට ගැලපෙන්නෑ සඳුන්... ඔයාගෙ අම්මලා මට කවදාවත් කැමති වෙන් නෑ..."



ඇය කතා කළේ මහත් ආයාසයෙනි. ඇගේ පළමු පෙම්වතා විවාහ යෝජනාව ගෙනා දිනයේවත් ඇය මේ සා නොකැළඹුණා ය.

"අපෙ අම්මලාට ඔයගෙ ඔය පරණ කතා කියන්න ඕන් නෑ සඳුනි. ඔයාගෙ අම්මයි තාත්තයි දෙන්නම මැරිල කියමු. ඉවරයිනෙ කතාව..."

"ඒ... ඒ වුණාට..."

ඔහු ඇය තුරුළු කර ගත්තේ ය.

"ඔයා එක මිනිහෙක් එක්ක නෙමෙ සඳුනි මිනිස්සු දාහක් එක්ක බුදියගත්තත් මට කමක් නෑ... ඔයාට දරුවො තුන් හතර දෙනෙක් හිටියත් මට කමක් නෑ... මම ඔයාට ආදරෙයි... අමරෙ අයියා ආපු හැටියෙ අපි කසාද බඳිමු... ඔයා කුමාරව කසාද බැඳල හිටිය නං දික්කසාදෙ ඉල්ලමු... ඊට පස්සෙ අපිට බඳින්ඩ පුලුවංනෙ..."

ඇයගේ දෙනෙතින් ගලා හැලෙන කඳුලින් ඔහුගේ ළය ලොම් කැටිය තෙමී ගියේ ය.

"අඬන්ඩ එපා මගෙ රත්තරං" යි ඔහු අපමණ ආදරයෙන් ඉල්ලා සිටියේ ය.

"නෑ... කුමාර මාව කසාද බැන්දෙ නෑ සඳුන්..."

ඔහු විමතියෙන් උතුරා ගියේ ය.

"එහෙනං එහෙනං මොකද වුණේ?"

කුහුලින් ද අති මහත් උද්යෝගයෙන් ද ඇළලුණු තරුණයා හට බිඳුණු පාදය මුළුමනින් ම අමතක විය. එහි වේදනාකාරී ප්‍රතිඵලය ද ඒ මොහොතේදීම අත් වින්දේ ය.

"ඔය ඉතිං... කකුල හොල්ලන්ඩ එපා අනේ..." ඇය කෝපයෙන් ද ශෝකයෙන් ද කෑ ගැසුවා ය.

"මට කියන්ඩ... ඉක්මණට කියන්ඩ මොකක් ද වුණේ කියලා..."

Scanned with CamScanner

"ඊට කියන්නං..."

"ඊ වෙනකං ඉන්ඩ බෑ සඳුනි. මට පිස්සු හැදෙයි... කියන්ඩ කියන්ඩ..."

ඇයට ඔහුගේ නොඉවසිල්ල වටහා ගත නොහැක. එහෙත් තමා පෙම් බැඳි ළඳ කන්‍යාවක නොවන බව යළි යළි මෙනෙහි කරමින් පරාජිත බවින් වෙළී හුන් තරුණයාගෙන් ගැලවුමක් නොමැති බව වටහා ගත්තා ය.

"ඕවා කිය කියා ඉඳලා හරියන්නැනේ... මං වැඩකට යන්ඩ ඕන... ඉන්ද්‍රක්කා කිව්වා ඇට තෝරන්ඩ එන්ඩ කියලා..."

"කවුද ඉන්ද්‍රක්කා කියන්නෙ?"

"ඇයි අනේ එදා අපි රණ්ඩු වෙද්දි මෙහෙ ආවෙ. "හැමදාම පාරෙ යන්නෙ..."

ඔහුට කිසියම් අසවැසිල්ලක් දැනිණ. " ආ... ඉන්ද්‍රක්කා" යි ඔහු ඇය දකිමින් සැනසුම් සුසුමක් හෙළුවේ ය.

"ඒ වගේ වැඩකට නං ගියාට කමක් නෑ... අවිවෙ වැඩ කරනවට නං මං කැමති නෑ..."

ඇගේ දෙතොල'තර මඳ සිනාවක් නැගිණ.

"ඇයි කළුවෙයි කියල ද?"

ඔහු හිස සැලුවේ ය.

ඇය හඬනගා සිනාසුණා ය.

"මං කට්ට කළුවට ගිහිය නං මට කැමති වෙනව ද?"

ඔහු ද සිනාසුණේ ය.

"ඔය අනම් මනම් නෙමේ... කියන්ඩකෝ ඉක්මණට... ඇයි ඔයයි කුමරයි කසාද බැන්දෙ නැත්තෙ...?"

ඇය නැගී සිටියේ තරවටු බැල්මක් හෙලමිනි.

"ඊට ඊට... මං දැං යනවා... මං එනකං හෙල්ලෙන්නෙ නැතුව ඉන්ඩෝන..."



ඔහු උරණ වූ තොදරුවෙකු මෙන් ඇය දෙස බලා සිටියේ ය.

"එතකොට හැමදාම ඊට ඊට මට කතා අහ අහද ඉන්ඩ වෙන්නෙ...?"

අනුරාගය මී මැස්සෙකු මෙන් ඇයට දෂ්ට කළේ ය.

ඒ සුඛ දුක්ඛ මිහිරෙහි ගිලෙමින් වුව ඇය "මගේ කතාව නං අද ඊට ඉවර වෙයි" යි කීවා ය.

"හරි හරි ඊට පස්සෙ මං මගේ කතාව පටං ගන්නංකො."

ඇය දෑස විහිදා විස්මය පෑවා ය.

"ඔයාගෙ කතාව ඉවරවෙලා කොච්චර දවස් ද...?"

ඔහු මුවග මඳ සිනාවේ පවා අනුරාගය ගැබ්ව තිබිණ.

"මීට පස්සෙ කතා කරන්නෙ මෙතනිං නෙමේ" යි දෙතොල් අතරට දබරැඟිල්ල තැබූ ඔහු මඳ නිහැඬියාවකට පසුව අත පපුවට ගෙන ගියේ ය. දැනටමත් අවදිව සිටින ඒ පිරිමි සතා මත තැබුවේ ය.

"මෙතනිං..."

එවන් සල්ලාල කතාවක් හා හැසිරීමක් බලාපොරොත්තු නොවූ ඇය "යන්ඩ හරි නරකයි" යි ලැජ්ජාවෙන් හැකිළෙමින් පැන දිව්වා ය.

ඔහු අපමණ ප්‍රමෝදයෙන් හා උතුරා යන සැනැල්ලුවෙන් යුතුව දෑස පියා ගත්තේ ය. පියවුණ දෑස අබියස පවා සිනාසුණේ ද හැඩුවේ ද බැනා වැදුණේ ද ඇයයි.

"ඊජ් සඳහා මෑ ඇට තෝරා වෙන් කළ මුළු මහත් කාලය මුළුල්ලේ ම ඇය දුටුවේ ද ඔහු ය."

"දෙයියනේ... මං දාලා යන්ඩ හදුවෙ රත්තරං කොල්ලෙක් නේද...?" යි ඇය සිය දහස්වර සිතුවා ය.

මෑ කරල් කොටුවේ හිම්කරු මේ රුමර ලලනාව දැක ප්‍රමුදයට පත් විය. ඇය කැවිව ආ ඉන්ද්‍රානිට ඔහු හද පත්ලෙන්ම

ස්තුතිවන්ත විය. මැදි විය පසුකළ මිනිසාගේ නියුණු බැල්මෙන් ආශා අපහසුතාවයට පත් නොවූවා ය. ඕනෑම පිරිමියෙකු දෙවරක් හැරී බලන තරමට තමා රූමත් බව දැක සිටි ඇයට ඒ බැල්ම ද අනවශ්‍ය කාරුණිකත්වය ද හිරහැරයක් නොවී ය.

"අර හිරේ ඉන්න අමරෙගෙ යාලුවා නේද ඔය සඳුන්...?" ඔහු අමරසිරි ද සඳුන් ද හෙළා දකින්නට සැරසෙන බව අනුමාන කළ ඇය නිහඬවම පසු වූවා ය.

"දෙන්නම එකතු වෙලා තමා වික්‍රමෙ මැරුවෙ... යාළුවා අහු කරන්නැතුව අමරෙ තනියම හිරේ ගියා..." යි ඔහු ඉන්ද්‍රානි සමඟ පැවසුවේ වික්‍රමතුංග මරා දැමූ මොහොත ඇසින් දුටුවාක් මෙනි.

"අනේ මංදා... මේ ගංජාකාරයෝ කුඩුකාරයෝ මිනීමරුවො එක්කත් එනවනෙ අප්පා බෝනික්කෝ වගේ කෙල්ලො... මුංට ඇස් නැද්ද මංදා... කොහෙද ඉතිං මෝඩකම තමා... පොත්ත රතු වුණාට වැඩක් නෑ... ඔලුවෙ මොකවත් නෑනේ..." යි ඔහු මෑ කරල් කන්ද අබියස හිඳ ගනිමින් කීවේ රුවන්තියට ඇසෙන්නට පමණක් නොව ඇනෙන්නටත් එක්කය.

"නංගි ඔවා ගණන් ගන්ඩ එපා... ඔය මිනිහගෙ කට හොඳ නෑ..." යි ඉන්ද්‍රානි කෙල්ලගේ මුහුණේ අඳුර දැක මෝදු වූ දයාවෙන් පැවසුවා ය.

"හෙටම ගම්මු... හෙටත් වැඩට එනවනේ."

හැන්දෑවේ වැඩ නිමා කොට ආපසු යාමට සැරසෙන ගැහැනිය ද ළමිස්සිය ද දෙස එක එල්ලේ බලමින් ඔහු කියා සිටියේ රළු පරළු හඬිනි.

"මට නං හදිස්සි නෑ පොඩි මහත්තයා. ඒ වුණාට මේ නංගිගෙ මල්ලිත් කකුල කඩාගෙන බෙහෙත් බඳිනවා... ඒ ළමයා හොඳට හිටිය නං මේ නංගිට වැඩකට එන්ඩ දෙන්නෙ නෑ..."

ඔහුගේ දෙනෙත ආශාගේ සිරුර පුරා සක්මන් කරන බව දුටු ඉන්ද්‍රානි කියාගෙන ගියා ය.



"හ්ම්" යි හිස සැලූ පොඩිමහත්තයා කලිසම් සාක්කුවට අත යැව්වේ ය. විශ්‍රාමික ගුරුවරයෙකු වන ඔහු වෙනත් බෙහෝ ගොවියන් මෙන් සරමක් අඳින්නට ප්‍රිය නොකරයි. කොට කලිසම ද ටීෂර්ටය ද යහමින් ඩයි ආලේප කරන ලද හිස ද ඔහු තාරුණ්‍යයේ රැඳී සිටින්නට දරන්නා වූ වෙහෙසට සාක්ෂි දරයි.

"කුඩුකාරයෝ ගංජාකාරයෝ එක්ක ආපුවහම ඉතිං දුක තමා... මොනවා කරන්ඩ ද... කෙල්ලො දුක හොයාගෙන යනවා..."

මුදල් නෝට්ටු කීපය ගුලි කොට ඔහුගේ මුහුනට දමා ගසන්නට උපදනා බලවත් උවමනාවෙන් ගැලවී ගැන්ම පහසු නොවී ය.

ආශා ආපසු යන අතර වුව පොඩිමහත්තයාට බැන වදින්නට තරම් නිර්භය නොවූවා ය. ඉන්දානි හා ඔහු අතර හිත මිතුරු කමේ දිග පළල පිළිබඳ ව අවබෝධයක් නොවූයෙන් නිහඬව සිටීම සුදුසු බව සිතුවා ය.

සියළු ඇප උපස්ථාන නොපිරිහෙලා ඉටු කළ ද ඇය උදයේ ගෙයින් පිටව ගිය එකියට සපුරා වෙනස් බව සඳුන්ට වැටහිණ.

"ඇයි? ඇයි මේ?" යි ඔහු ඇගේ මුහුන විමසිල්ලෙන් නරඹමින් ඊට හේතු සොයන්නට වෙහෙසුණේ ය.

"මුකුත් නෑ..." යි කී කෙල්ල වියළි සිනාවක් පෑවා ය.

"නැත්තෙ නෑ... මූනත් එක්ක අමුතු යි... මහන්සි ද...?"

"අනේ නෑ... මොන මහන්සියක් ද?"

ඇය පෑ සිනාවේ ව්‍යාජය අවබෝධ කරගත් ඔහු සුසුමක් හෙළුවේ ය.

"මොකද වුණේ? පොඩි මහත්තයා අතිංවත් ඇල්ලුවද...? පොර කුකුල තමා. මං ඉතිං බය නැතුව හිටියෙ ඉන්ද්‍රක්කත් යන හින්ද..."

ඇය හිස කැසුවා ය.

"මගෙ අතිං ඇල්ලුවොත් ඉතිං ඒ අත කඩාගන්ඩ හිතිල තමා. කාට හරි..." යි ඇය වහසි බස් කීවේ වෙනදා මෙන් උඩගු ලෙස හිස නටවමින් නොවේ.

"මට ඇත්ත කියන්ඩ සඳුනි... මොනව හරි වෙලා තියෙනවා..."

ඇගේ දෑස ඔහු ගේ දෑසේ පැටලිණ. කිසිවක් නොසඟවන්නැයි අණක් ඒ සිහින් දෙනයන ගැබ් ව තිබිණ.

"මුකුත් වුණේ නෑ. දන්නැද්ද ඒ මනුස්සයා ඔය එක එක ඒවා කිව්වා..."

"මොනවද? මොනව ද කිව්වෙ...?"

ඔහු නොඉවසිල්ලෙන් නළියයි. ඇගේ උදාසීනත්වය ඔහුට ඉවසිය නොහැක.

"ඔයයි අමරෙ අයියයි දෙන්නම එකතු වෙලාලු අර එක් කෙනාව මැරුවෙ... ඔන්න ඔහොම කතා තමා..."

"මං ඔයාට සේරම කිව්වනෙ සඳුනි. මට ඔයාගෙං මුකුත් හංගන්ඩ ඕන නෑ... මං ඇත්තම තමා කිව්වෙ... මොකට ද මම ඔයාට බොරු කියන්නෙ?"

ඇය නිහඬවම ඔහු ගේ අතැඟිලි මිරිකා ගත්තා ය.

"ඒ වුණා ට ඉතිං ගංජා බොනවා කියලා කීවෙ නෑනේ..."

ඔහු කට කොණකින් හිනැහුණේ ය.

"ඒකත් කිව්ව ද... ජරා යකෙක්නෙ... ඌට මොක ද මං මොනව බිව්වත්... ඌට වැඩක් නෑනේ..."

"හරි හරි... ඒ කියන්නෙ ඔයා ඒ ජරාව බොනවනේ..."

ඔහු ඇත්තක් හෝ බොරුවක් කියන්නට අදහස් නොකළේ ය.

"ඔයාට නීති දාන්ඩ මං කැමති නෑ සඳුන්... මොක ද කව්රු හරි මට නීති දානවට මාත් කැමති නෑනේ... ඒ වුණාට ඔයා ඔය ජරාව බොන්ඩ එපා අනේ..."



ඇය ඔහුට තුරුළු වෙමින් කොඳුළා ය.

"බැන්දට පස්සෙ මං ඒ නරක වැඩ ඔක්කොම අතාරිනවා..."

"අනේ යන්ඩ... හැම පිරිමියම ගෑනුන්ට ඔහොම කියනවා ඇති... මෝඩ ගෑනු ඒ බොරු විශ්වාස කරනවත් ඇති... ඒ වුණාට අන්තිමේ දී වෙනස් වෙන්නෙ ගෑනුන්ගෙ ජීවිතේ විතරයි..."

ඔහු කොක් හඬලා හිනැහුණේ ය.

"අම්මෝ... කෙල්ල දන්න දේවල්... මාරයි ආ... මං හිතාගෙන හිටියෙ ඔයා දන්නෙ කන්ඩයි මාත්තෙක්ක රණ්ඩු වෙන්ඩයි විතර යි කියලා..."

"යන්ඩ"

ඇය ඔහු ගේ අත දැතින්ම අල්ලා පසෙකට කළා ය.

"අතගාන්ඩවත් බැරි ද මට ඔයාව" යි ඔහු නහයෙන් හැඬුවේ ය.

"ලෙඩා ලෙඩා විදියට ඉන්න ඕන. ඔන්න ඕන්නැති වැඩ කරන්ඩ ආවොත් මං කියන්නෙම නෑ කතාවෙ ඉතුරු ටික..."

ඔහු දෑත ළය හරහා බැඳ ගත්තේ ය.

"හරි හරි... තියාගන්නවා තමුසෙගෙ මහලොකු බිබික්කම. කුමාරත්තෙක්ක සේරම නාඩගම් නටලා මට තමා නීති දාන්ඩ එන්නෙ.."

ඔහුගේ මේ වහා වෙනස් වන ස්වභාවය ඇයට හුරු පුරුදු ය. එහෙයින් වෙනදා තරමට ඇගේ මුහුන අඳුරු නොවී ය.

"මං නෙමේ කුමාර නං නැටුවා තමා හොඳ නාඩගමක්..." යි කී ඇය දිගු සුසුමක් හෙළුවා ය.

"මට හිතාගත්ත හැකි... තමුසෙව අමාරුවේ දාලා ඌ මඟාරින්ඩ ඇති..."

ඔහු අවඥාවෙන් මුව ඇද කළේ ය.

"නෑ සඳුන්... ඔයාට හිතා ගන්ඩවත් බෑ කුමාර මට කරපු දේ..."

"ඇයි? මොකක් ද උඹ තමුසෙට කෙරුවෙ...? කොයි කොල්ලත් කොයි කෙල්ලටත් කරනදේම තමා තමුසෙටත් කරන්ඩ ඇත්තෙ... වෙන මොන කෙහෙල්මලක් ද?"

ඇය ඔහු වෙතින් ඉවත්ව පැදුරේ හිඳ ගත්තා ය. වහා උරණව අත හකුලා ගත්තා ද තමා සමීපයෙහි සිටින කල ඔහුගේ ඉඳුරන් අවදිවන බව ඇය දනියි.

"නෑ... ඊටත් වඩා දෙයක්... කිසි කෙනෙකුට තිතාගන්ඩ බැරි දෙයක්..."

"හරි හරි ඉතිං ගණන් උස්සන්නැතුව කියනවා"

ඇය යළි නැඟී සිට ලාම්පුව නිවා දැමුවා ය. ලාම්පුතෙල් නාස්ති කරන්නට ඇය කැමති නැත. අරපරිස්සම පුරුදු නැතැයි සීතම්මා කොතරම් ආඩපාලි කීවේදැයි සිහි කරන්නට ඇය වඩාත් ප්‍රිය කළා ය. එහෙත් ඇගේ දෑස අභියස ප්‍රේමාන්විත බැල්මක් හෙලුවේ ඔහු ය. කුමාර ය. ඒ දේව දාසයා ය.

විදුලි පහන් ආලෝකය හුහුරු වූයෙන් ආශාගේ දෙනෙත හැකිලිණ. එහෙත් ගුරුන්නාන්සේ මාමාගේ නිවෙසේ තමාට වෙන් වූ කාමරයට වැදී හුදෙකලා වීමට නොරිසි යුවතිය දොරකඩ සිටගෙන හිටියා ය.

අනෙක් අතට තමාගේ අනාගතය පිළිබඳ ව සිදු කෙරෙන පිළිසඳර අසන්නට ඇය ප්‍රිය කළා ය.

"හේරෝටම කලිං මං මේ දැරිවිගේ මව් මුහුන ගැහෙන්ඩ ඕනෑ... තිරියම්ම මැරුණට මොක ද මව් තාම ඉන්නවනේ"

ඉන්නොල්පුවේ හාන්සි පුටුවේ දිග ඇදී හුන් ගුරුන්නාන්සේ කී කල ඇය වහා විරෝධය පෑවා ය.

"නෑ නෑ එයාට කියන්ඩ ඕන් නෑ..."

කුමාරගේ ද කළළු කරබාරු ගැහැනියගේද නෙත් ඇය වෙත යොමු වූයේ එකම වරය. හරියට කලින් කතිකා කර ගත්තා වගේ ය.



"තොතියා කොහොම ද...? ඒ ඇත්ති මේ ළමයගෙ මව් වචචි කොට"

ගුරුන්නාන්සේ කතා කළේ පුදුමයෙනි. මව ද දියණිය ද අතර ආරවුල් පිළිබඳ ව කිසිවක් ඔහු නොදනී.

"මට අම්මෙක් තාත්තෙක් නෑ... හිටියෙ සීතම්මා විතරයි..."

ආශාගේ රළු හඬින් කුමාර තැති ගත්තේ ය. ඇය කලන කරන්නට බැරි නැතැයි සැකයෙන් ඔහු නැඟී සිටියේ ය.

"නෑ මාමණ්ඩි... අපි හිමී ට කතා කරමු. හදිස්සියක් නැතේ... මෙයා ටික දවසකට මෙහෙ හිටියට කමක් නැතෙ නැත්දම්මෙ?"

ඔහු පුශුණාවතී දෙස හෙළුවේ බැගෑබර බැල්මකි.

"හැමදාම හිටියත් මොක ද ආගෙ අපිට දරු මල්ලෙක් ඉන්න එකක්යැ..."

ඇය දරු හැවිකාරයෙන් ආතුර වූ මවකගේ සිරි ඉසිළුවා ය.

"කුමාරගෙ අම්ම අප්පයි මේ ළමයගෙ අම්මයි මූණ ගැහිලා කතා බස් කරගන්ඩ ඕනි. කසාදයක් බඳිනවා කියන්නෙ ලේසි පහසු දෙයක් නෙමේනේ... චාරිත්තර වාරිත්තර කියලා දේකුත් තියෙනවා... දෙපැත්තෙ වැඩිහිටියො පැත්තකට දාලා අපි මුදුනො වෙන එකත් එච්චර හොඳ දෙයක් නෙමේනෙ කුමාර"

තරුණයා හැරී බැලුවේ සෙමින් වුවද තිරසාර ලෙස ඇවිලෙන්නට සූදානම් ගිනි මැළයක් වන් ළමිස්සිය දෙසයි.

"කුමාරගෙ අම්මලා මට කවදාවත් කැමති වෙන්නෙ නෑ... මං තාත් කවිරුවත් නැති අනාථයෙක්... මේ කසාදේ කවදාවත් කෙරෙන එකකුත් නෙමේ. මට අර ගිනි තිබ්බ ගේ හදල දෙන්ඩ... මට පුලුවන් තනියම ඉන්ඩ... මං බය නෑ."

ඇගෙන් එවන් කතාවක් සහ ඉල්ලීමක් බලාපොරොත්තු නොවූ ගුරුන්නාන්සේ උගුර පෑදුවේ ය. ඔහුගේ බිරින්දෑ නොපහන් සිතින් යුතුව තවත් බුලත් කොළයක් මුවෙහි ඔබා ගත්තා ය. මේ දෙන්න දෙමහල්ලන් තරගයට මෙන් විට කන බව කුමාර කවදත් සිතයි. එහෙත් ඔහු මේ රැයෙහි සිය පෙම්වතිය

මේ දරුදූවූ ඇවතුම් පැවතුම් පිළිබඳ ව කළකිරීමෙන් තැතැතුළු පිරිමැද්දේ ය.

"ඔය ළමයා කලබල නොවී හිටියනං තමා හොඳ... කලබලේට කොරොස් කටෙත් අත දාගන්ඩ බෑ කියනවනේ."

ඊටද ආශාට උත්තරයක් තිබිණ. එහෙත් ඇය මුව විවර කරත් ම කුමාර ආයාචනාත්මක බැල්මක් හෙළුවේ ය.

"වදින්නං කට වහගෙන ඉන්ඩ" යි කියන්නාක් වැනි ඒ බැල්ම ඇගේ මුව අගුළුලයි. කොහොමටත් තමා දෙතොල තරයේ වසාගත යුතු බව ඇය අවබෝධ කරගෙන සිටියා ය. නැතහොත් මේ රාත්‍රියෙහි ම මේ නිවෙසින් පිටතට ඇද දමන්නට බැරි නැත. එපරිද්දෙන් පලවා හරින්නට නිවැසියන් හට සිත්දෙන තරමට තමාගේ මුව විනාශකාරී බව සිතමින් ඇය කාමරයට වැදුණා ය.

සන්සුන්ව හා යහපත්ව ඉන්නට ඉටා ගත්ත ද ඒ වෙහෙසකර ප්‍රයත්නය මුළුමනින් ම ව්‍යර්ථ කර දමන්නට චාන්දනී සමත් වූවා ය.

"කොයි අර බැල්ලි?" යි ඇය ඇසුවේ සුගුණාවතීගෙනි.

නොබෝදා දරුවකු ලද බව පැහැදිලි ව දිස්වන ගැහැනියගේ හදිසි කඩා වැදීමෙන් ද ඒ ප්‍රශ්නයෙන් ද අන්දුන් කුන්දුන් වූ සුගුණාවතී "මොන බැල්ලියෙක් ගැනද මේ අහන්නෙ?" යි පෙරළා ප්‍රශ්න කළා ය.

"හොඳ හිතිං ඒකි එළියට අපල්ලා... ඒ පට්ට බැල්ලි ගේ අස්සෙ ආගෙන ඉන්නෙ මොන රූපාවටද...? යකෝ මටනෙ රූපාව තියෙන්ඩෝනෑ... මං නෙ ඒකි වැදූ අම්මා... පිට මිනිස්සුන්ටනෙ රූපාව..."

තමා නිසා දෝෂාරෝපණයට ලක්වන ගැහැනිය කෙරෙහි දයානුකම්පාවෙන් පමණක් නොව තමා වැදූ බව කියා සිටින ගැහැනිය සමඟ ඇවිළෙන්නට ද හෙඳටම උවමනා වූ බැවින් ආශා මිදුලට ආවා ය. මොහොතකට පෙර දිය නා දිගු වරලස මුදා හැර උන් ඇය අතිශයින් රූමත් වූවා ය. එහෙත් ඇය මාස ගණනාවක් සැඟවී සිටි ගර්භාෂය හිමිකාරිය ඊට සපුරා පටහැනිව අඳුරු හා අසෝබන පෙනුමක් ඉසිළුවා ය.



"හා මය එන්නෙ පැදී පැදී පට්ට පදුරි..."

මවක දියණියක වෙනුවෙන් කාචිත කරන මේ අභිරට වදන් සුගුණාවතීට ඇදහිය නොහැක. ඇය මවද දියණිය ද දෙස විටින් විට බලමින් අසරණව හා විස්මිත්ව පසු වූවා ය.

"මොකද තෑ ගහන්නෙ?"

ආශා තවමත් කෝපයට පත්ව නොසිටියා ය. චාන්දනී හැඳ සිටින ලිහිල් බ්ලවුසයේ ඉදිරිපස තෙමී තිබිණ. ඒ අළුත උපන් බිළිඳු වෙනුවෙන් ඉනූ කිරි කඳුලින් විය යුතු ය. ඒ දුක දැකත් යක්ෂාවේශයක් දරන්නට කෙල්ලට නුපුළුවන.

"තෑ ගහන්ඩ නෙමේ... මං අද තෝ මරනවා... මගෙ අම්මට මගෙ රත්තරං අම්මට කරපු දේට මං අද තෝ මරනවා..."

තව දුරටත් නිහඬව්ය යුතු නැති බව සිතූ සුගුණාවතී වටපිට බැලුවා ය. ඇගේ සැමියා කුමාර සමඟ තෙල් සාත්තුවකට දුර බැහැර ගොසිති.

ඔහු ඇත උගත් සාත්තරය පවා මේ යක්ෂාවේශයෙන් දඟලන ගැහැනිය මෙල්ල කරන්නට සමත් වනු ඇත්දැයි සැක සහිත ය.

"ගෙට යං... ගිහිල්ල වාඩිවෙලා කතා කරමු... මෙහෙම තෑ කොස්සං ගහන එක හොඳ නැහැ... අහළ පහළ මිනිස්සු බලනවා ඇති මේ මොකද කියලා..."

සුගුණාවතී කතා කළේ කරුණාවෙනි. ඇය කොහොමටත් සැර පරුෂ ගැහැනියක නොවේ. ඒ කරුණාවට ගරු කරන්නාක් මෙන් ආශා පළමුව කීකරු වූවා ය. චාන්දනී ඊට එකඟ වූයේ නො කැමැත්තෙනි.

"මං මේ ආවෙ වාඩිවෙව් ඉන්ඩ නෙමේ... ළමයත් ඇහැරිලා අඬනවා ඇති.. අරයට ටිකක් බලාගන්ඩ කියල මේ දුවගෙන ආවෙ ඉවසන්ඩ බැරිම නැත" යි කී චාන්දනී හඬා වැටුණා ය.

ඇයට මඳක් වෙලා හඬන්නට ඉඩ හළ සුගුණාවතී තේ කෝප්පයක් ගෙන ආවා ය.

Scanned with CamScanner

"කිරි දෙනේකේ උගුරක් බීලා ඉම්මු... කිරි දරුවන්ට බඩගිනි වෙනවලු සියඹලා කොළේ බිමට වැටෙන ටිකට හත් සැරයක්... දරුවට කිරි දෙන්ඩ අම්මා හොඳට කාල බීලා ඉන්ඩ එපායැ..." යි ඇය කීවේ දරුවන් හත් අට දෙනෙකුත් වැදූ හැදූ එකියක මෙනි.

"නෑ අක්කෙ... මට වාවන්ඩ බෑ... මං ඉස්පිරිතාලෙටත් ගිහිල්ලා කෑ ගහලා ආවෙ... ඇයි අප්පේ කොහොම ඉවසන්ඩද? මගේ දුප්පත් අම්මා හිඟන්නියක් වගේ වළ දාලා... පාංසකූලෙවත් නොදී... මොන අපරාධයක් ද" බුදු අක්කේ... මං ළමයා හම්බ වෙන්ඩ ඉස්පිරිතාලෙ ගිය ටිකට මගෙ අම්මා මැරිලා වළදාලත් ඉවරයි... මේකි මැරුවත් හිත් වදිනවද... මෙච්චර වරත්තු වැඩක් කරන්ඩ මේකිට කොච්චර හයියක් තියෙන්ඩ ඕන ද..."

දොර රෙද්දෙන් එපිට සෙල්රුවක් මෙන් නොසැලී හුන් ආශා මිත්තණියගේ දිරාපත් සිරුර දුටුවා ය. ඇයට ශෝකයක් නො දැනිණ. ජීවිතය හැර පියා ගිය මැහැල්ල වෙනුවෙන් අවමංගල උත්සවයක් නොපැවැත්වීම පිළිබඳව ඇය තුළ තවමත් පසුතැවිල්ලක් නොඋපදී.

"අනේ ඉතිං මහ වයසක් යැ... තේරෙන තරම තමා ඔය..."

සුගුණාවතී ළමිස්සිය වෙනුවෙන් කරුණු දක්වයි.

"මං නං කියන්නෙ ඕකි මගෙ ඇස් දෙකට පේන්ඩ එපා කියලා. දකින කොටත් මගෙ ඇඟේ මාලු නටනවා. මගෙ අම්මා මරාගත්තෙ ඔය දහදුරා බැල්ලි තමා... මරා ගත්තට මදිවට හොරෙංම වාගේ වළ දැම්මා... ඕකිට ජාති ජාතිත් පල දෙනවා මේ කරපු අපරාදේ."

චාන්දනී නැවතත් කඳුළු සලන්නට පටන් ගත්තා ය. ඇගේ ශාපයට ගොදුරු වූ කෙල්ල ගේ දෑසට කඳුලක් නොනැගිණ.

"ඕකි තියාගත්තොත් අක්කේ අක්කලාටත් මොනවයිං මොනව වෙයිද දන්නෑ... ඕකි ඉන්න තැනකට වගතුවක් නෑ..."

ආපසු යාමට නැඟී හුන් චාන්දනී කතා කළේ යළිත් දළුලන කෝපයෙනි.

"ගෑනු දරුවෙක් පාරට දාන්ඩ බෑනෙ නංගියේ..."



සුගුණාවතී ද දෙගිඩියාවෙන් පසු වන බවට ආශාට කේලම් කියන්නේ ඒ මලානික ස්වරයයි. රෙදි මල්ලත් රැගෙන වහා පිටව යාමට තරම් ආවේගයක් දැනුණ ද පෙම්වතාගේ බැගෑබර ඉල්ලීම ඇයට හරස් කපයි.

"ටිකක් ඉන්ඩ කුමාරි... තව ටිකක් ඉවසන්ඩ..."

ඔහු පුන පුනා පැවසුවේ ඒ වචන කීපයය. නොරුස්නා සහගත සිතින් වුවද ඇය නිහඬව පසුවූවා ය.

"අම්මලා ටිකක්වත් කැමති නෑ කුමාරි... මට තේරෙන්නෑ මොනව කරන්ඩද කියලා" යි අඳුරුව ගිය මුහුණින් යුතුව ඇය වෙත පැමිණි ඔහු දුක්මුසු හඬින් කී කල ඇය හිස් බැල්මෙන් බලා සිටියා පමණි.

"මං මොක ද කරන්නෙ කුමාරි?..."

"වෙන මොනව කරන්ඩද... ඔයා ඔයාගෙ වැඩත් බලා ගන්ඩ... මං මගේ වැඩත් බලා ගන්නං..."

ශෝකයෙන් හඬා වැටෙනවා වෙනුවට ඇය කෝපයෙන් කඩා පැන්නා ය.

"අර ළමයා ආවෙ නෑ නේද හුඟ දවසකින්" යි සුගුණාවතී අසන කල නම් ආශාගේ ඉවසීම අතුරුදහන් විය.

"ඒ ළමයා එන්නැත්තෙ මොක ද කියලා ඒ ළමයගෙං අහගන්ඩ නැන්දේ... මට ඔය මොන ළමයා ආවත් එකයි නැතත් එකයි. බය වෙන්ඩ එපා. මාත් හැමදාම මෙහෙට්ට වෙලා නැන්දලාගෙං කකා බිබී ඉන්නෙ නෑ."

රූබර හිරිමල් ළමිස්සියකගෙන් ඒ සා වාග් ප්‍රහාරයක් අපේක්ෂා නොකළ ගැහැනිය තිගැස්සුණා ය. ඇය සැමියා සමඟ කසු කුසු ගාන අන්දම දුටුවද ආශා ඇහුම්කන් දෙන්නට උත්සාහ නොකළා ය.

සියල්ල කණපිට පෙරළෙන්නට වැඩි දවසක් නොගියේ ය. ඇගේ දෑස මඟහරිමින් වුව කුමාර මව්පිය කැමැත්ත හා ආශිර්වාදය ලැබුණ බව පැවසුවේ ය.

Scanned with CamScanner

ගුරුන්නාන්සේ මෙන්ම බිරින්දෑද තමාට අන් කිසි දිනකවත් වඩා ආදරයෙන් සහ කරුණාවෙන් සළකන බව හැඟී ගිය ද ආශා ට අමුත්තක් නොදැනිණ. එහෙත් සිය මව ගේ සැමියා වරින් වර ගුරුන්නාන්සේ හමුවීම ඇය නොරිස්සුවා ය.

"ළමයගෙ වේලපත්කඩේ බලවගන්ඩ ඇවිල්ලා."

ඇගේ නොපහන් බැල්ම හැඳිනගත් සුගුණාවතී පහත් හඬින් කොඳුළා ය.

"මේ තේ එක බාප්පට දීල එන්ඩ දුවේ" යි ඇය තේ කෝප්පයක් සහිත බන්දේසිය දිගු කළ විට ආශා ඉවත බැලුවා ය.

"තේ නෙමේ... වහ කෝප්පයක් ගෙනිහිං දෙන්නෙ මං ඕකට" යි කියා ගත නුහුණුව ඇය දත් සැපුවාය.

"අපේ කුමාරට ඔබින්නෑ මේ ළමිස්සී... සැර වැඩියි... යක්ෂනියක් වගේ..." යි සුගුණාවතී ඇයට නොඇසෙන්නට කී කල ගුරුන්නාන්සේ හඬ නගා හිනැහුණේ ය.

"කුමාරට නරකක් වෙන්නෑ බං... කුමාරට විතරක් නෙමේ අපි කාට කාටත් කිරි උතුරන්ඩ යි යන්නෙ..."

"ඒ කිව්වෙ?" යි ඇය කුහුලින් හකුලා ගත් දෑසින් ඇසුවා ය.

"හොඳ හොඳ සෙල්ලං එළිවෙන ජාමෙටලු..."

"මට තේරෙන් නෑ ඔය අපංහ්‍රංසෙ..."

"දෙන දෙයියො ගෙටම ගෙනැල්ලා දෙනවා කියන්නෙ මෙව්වට තමා බං..."

ඇය ඔහු වෙතින් ඉවතට ගමන් කළේ නොමනාපයෙන් එල්ලා හැලෙන මුහුණිනි.

ඇයට මෙන්ම ආශාට ද නොවැටහෙන යමක් සිදුවෙමින් තිබිණ.

"අපි දෙන්නටම හරියට අපලලු. බිලියක් අරින්ඩ ඕනෑ කියන්නෙ ගුරුන්නාන්සෙ මාමා..."



පෙම්වතාගේ ස්වරයෙහි සසල වීමක් ඇති බව හැඳින ගන්නට තරම් ආශාගේ දෙකන තියුණු නොවී ය. ඔහු සමීපයෙහි සිටියදී පවා ඇය කුලගෙයක් තුළ පතිනියකගේ කාර්යභාරය ඉටු කරන්නට තමා සමත් වනු ඇත්දැයි කණස්සල්ලෙන් කල්පනා කරන්නට පුරුදුව සිටියා ය.

දේවදාසයෙකු වන පෙම්වතා විවාහයට පෙර සියළු අපල හා වස්දොස් දුරු කිරීම සඳහා දෙවියන්ගේ පිහිට පැතීමේ අරුමයක් ද ඇය නොදුටුවා ය.

අඳුරේ සැලෙන හඬ ඇඳ මත වැතිරුණ තරුණයාගේ පය බිඳී ඇති සේම අඳුරේ හිඳගෙන සිටින යුවතිය ගේ හද බිඳී රුහිරු ගලන බව හඟවයි.

"සඳුනි..."

හැම රැයකම පාහේ ඇගේ කතාව අතර තුර හූමිටි දෙන්නට පමණක් පුරුදුව හුන් සඳුන් එක් වනම හඬ ගෑවේ ය.

"ඇගේ කතාවේ මේ අවසාන භාගයේ සැඟවුණු අන්තරාය හා කුමන්ත්‍රණකාරී බව ඔහුට වැටහී ගියාක් මෙනි.

කෝ එන්ඩ... මගෙ ළඟට එන්ඩ"

ඔහු අපමණ දයාවෙන් ද උණුසුම් හදින් ද ඉල්ලා සිටියේ ය. ඒ ඉල්ලීමේ රාගයක් නොවී ය. ඇය නිහඬවම ඔහුට අවනත වූයේ එබැවිනි.

ඔහුට තුරුළු වූ ආශා වෙව්ලමින් සිටියා ය.

"ඔයාගේ ඇඟ ගැහෙනවා"

ඇය ඔහුගේ ළමැදේ මුහුන ඔබා ගත්තා ය.

"ඔච්චරම බයයි නං දුකයි නං ඉතුරු ටික කියන්ඩ එපා කෙල්ලේ..."

හැමදිනකම ඇගේ කතාව අසන්නට නොඉවසිලිමත් වූ හෙතෙම එසේ කීම පුදුම සහගතය.

"ඇති... දැං අපි නිදා ගමු..."

Scanned with CamScanner

"බෑ..."

ඇය හීන් හඬින් ඊට එරෙහි වූවා ය.

"මට අහන්ඩ බෑ සඳුනි... ඔයා කොච්චර දුක් විඳල තියෙනවද.. ඇනුත් ඔයා මං හිංඳා දුක් විඳිනවා... මගෙ කකුල හොඳ වුණාට පස්සෙ මං ඔයාට දුක් විඳින්ඩ දෙන්නෙ නෑ මගෙ රත්තරං... මං... මං... මලක් වගේ ඔයාව බලා ගන්නවා..."

ඔහු කොතෙක් හැඟීම්බර වී දැයි කිවහොත් ඇස කඳුළින් පිරිණ.

ඒ පොරොන්දුව අදහන්නට ඇය මැළි වුවද ඔහු ඒ අන්දමින් කතා කිරීම පිළිබඳ ව ඇය සතුටට පත් වූවා ය. ඇගේ පළමු පෙම්වතා වෙත මෙවන් හෘදයාංගම පෙම්බස් නොවීය. දෙවියන්ට හා යක්ෂ ප්‍රේත පිසාච ආදී අමනුෂ්‍ය ගනයාට බියෙන් පසුවූ හෙතෙම සිය හැඟීම් පළ කරන්නට පසුබට විය. කවර හෝ අද්භූත බලවේගයක් තමා ගේ හැසිරීම දෙස බලා සිටින බව ඔහු විශ්වාස කළේ ය.

"තව චුට්ටයි තියෙන්නෙ... එතකොට මගෙ කතාව ඉවරයි. ඒ චුට්ටත් කියල ආපුවහම මම නිදහස්නෙ..."

ඔහුගේ ස්පර්ශයෙන් දිරිමත් වූ කෙල්ල ප්‍රාණවත් හඬින් පැවසුවා ය.

"දැං හුඟක් රෑ වෙලානෙ. හෙට කියන්ඩ..."

"බෑ... හෙට කියලා දවසක් ගැන හිතන්ඩ මට බෑ සඳුන්... හෙටක් තිබ්බෙ නෑ මගේ ජීවිතේ කවදාවත්..."

ඒ වචන ඔහුගේ සිත රිදවයි.

"එහෙම කියන්ඩ එපා සඳුනි... මං ඔයාට හෙටක් හදනවා... ලස්සන හෙටක්... මට ඔයාට මහ ලොකු සැපක් දෙන්ඩ බෑ තමා... ඒ වුණාට අපිට සතුටින් ඉන්ඩ පුලුවං වෙයි."

ඔහු බලවත් විශ්වාසයෙන් තෙපලුවේ ය.

"අපට සතුටිං ඉන්ඩ පුලුවං වෙයි" යි ඇය ද ඔහු සමග එකඟ වූවා ය. එහෙත් කුමාර සමග ගෙවන ජීවිතයක් පිළිබඳ



ව ඇය මෙලෙස සිහින මවන්නට තරම් චමත්කාරයක ගිලී නොසිටියා ය.

වනය ගිලගනිමින් තිබෙන පුරාණ පන්සල වෙත යන අතරතුර ඇය කල්පනා කළේ කුමාරගේ මව හා සොයුරියන් පිළිබඳව ය. ඔවුන් සමඟ ගත කරන්නට සිදු වන ජීවිතය කෙබඳු අන්දමේ එකක් විය හැකි දැයි ඇය ළතැවුලට පත් වූවා ය.

"අපි වෙනම ගෙයක් හදමු" යි යෝජනා කරන්නට ඇය මැළි වූවා ය. කිසිවක් හෝ කිසිවෙකු නොමැති තමා කරබාගෙන හා යටහත් පහත් ව සිටිය යුතු යැයි නොකඩවා අවවාද කරන්නේ ඒ ආදරබර මැහැල්ල යි.

"කට පුක වහගෙන හිටපං. මොකී මොකා එක්ක ගියත් දරුවො වදනවා හදනවා... එච්චරයි... ඔය රූපෙත් විංග විංග දියවෙලා යනවා... කොයි කවුරුත් ඉතිං මිනිවළ ගාවට ... හෙමිං කිට්ටු වෙනවා..."

ඇගේ වචන රැව් පිළිරැව් දුන්නේ ය.

කොයි කව්රුන් කෙසේ වෙතත් ආශා මේ හැන්දෑවේ මිනි වළට ළංව සිටියා ය. නොහඳුනන හැඩි දැඩි මිනිසුන් දෙදෙනා දුටුවද ඇය තැති නොගත්තා ය. කුමාර මෙන්ම ගුරුන්නාන්සේ මාමාද සමීපයෙහි සිටින කල ඇය බිය විය යුත්තේ මන් ද...? එහෙත් ඇය දැඩි ව පිළිකුල් කරන මිනිසා දකින්ම නුහුරු බියකින් සැලී ගියා ය.

"අර මිනිහා මොක ද මෙහෙ...?"

ඇය සිය පෙම්වතාගෙන් ප්‍රශ්න කළා ය. පරිසරයේ අඳුර හා ගුප්ත බව ඇගේ හඬ මැනවින් පාලනය කළේ ය.

"කුමාරි..."

තරුණයා කිසිවක් කියන්නට තැත් කළේ ය.

ගුරුන්නාන්සේ ගේ තියුණු දැස කෙටිරි පහරකට වඩා විදුම් දුන්නේ ය.

"අ... අපි ටිකක් අහට්ට යංද?"

නුදුරෙහි ලෙන් ගුහාවක් වෙත අත දිගු කළ තරුණයා ඉස්සර විය. ඇය නිහඬව අවනත වුවද හැකි ඉක්මණින් ආපසු යාමේ උවමනාවෙන් පෙළුණා ය. සුගුණාවතී කැටි ව ආවේ නම් හොඳ බව ඇයට සිතුණේ නිරායාසයෙනි. එහෙත් ඇගේ පැමිණීම අනවශ්‍ය බව ගුරුන්නාන්සේ කියා සිටියේ ය. යහපත් හා සුවච කීකරු භාර්යාවක් ලෙස ඇය කවදත් ඔහුගේ තීරණයන්ට හිස නමන්නට පුරුදු ව සිටියා ය.

"අනේ යං නැන්දෙ..." යි ආශා රහසින් ඇවිටිලි කළ ද පලක් නොවීය.

"ගුරුන්නාන්සේ ඉරක් ඇඳලා කිව්වොත් මුළු දවසක් ඉරේ හිටපිය කියල නොහෙල්ලී ඉන්නැද්ද මං... ගුරුන්නාන්සේ දුන්නොත් වහ කෝප්පෙ වුණත් මීක් නොකියා බොන්නැද්ද මං...?"

තමා තවත් වචනයක් හෝ නොපවසා නිහඬවිය යුතු බව හඟින්නට සුගුණාවතීගේ ඒ කතාව සෑහිණ. සැබැවින්ම පන්සලට යාමට එන්නැයි තමා ඉල්ලා සිටීම පිළිබඳව ආශා ලැජ්ජාවට හා පසුතැවිල්ලට පත් වූවා ය. එහෙත් අඳුරු ලෙන තුළ ඇය විළිබර එකියක නොවූ අතර ප්‍රේමවන්තයාගේ පහස පතා නොඉවසිල්ලෙන් බලා සිටියා ය. සිත ගත හකුලා දමන බියමුසු තැතිගැන්ම ඔහුගේ උණුසුම් හිස වැළඳගැනීමකින් වියැකී යනු ඇතැයි ඇය බලා පොරොත්තු වූවා ය.

"කු...මාර..."

ඇගේ ස්වරයෙහි අනුරාගය හැඳින ගත්ත ද ඔහු පසුබෑවේ ය.

"ඇයි?"

ඔහු තමා ලෙන තුළට කැඳවාගෙන එන්නට ඇත්තේ සිප වැළඳගන්නට බවට වරදවා වටහාගත් කෙල්ලට ඒ ප්‍රමාදය වටහාගත නොහැක.

"කුමාරි... මට... මම..."



ඔහුට උවමනා වූයේ සමාව අයදින්නට ය. ඇගේ ජීවන සහකරුවා වෙනුවට ඇගේ ජීවිතය තීන්දු කරන වංචාකාර රැවටිලිකාරයා වීමට සිදුවීම පිළිබඳව අවංකව පසුතැවෙමින්, ඇගේ දෙපාමුල වැඳ වැටෙන්නට තරම් ඔහු දියාරුව ගොසිනි.

දෙවුරින් අල්ලා වැළඳ ගන්නවා වෙනුවට ඔහු තමාගේ පසුපසට ගොස් ඇතින් අල්ලාගත් කල අන්තරාදායක ඉව ඇනුණෙන් ඇය කෑ ගැසුවා ය.

"කුමාර..."

පෙර වූ අනුරාගය හා ප්‍රේමය මුළුමනින් ම අතුරුදහන් ව ඒ උච්ච ස්වරයෙහි ගැබ්ව තිබුණේ භීතියයි... අතිමහත් සැකයයි.

"මං මොනව කරන්ඩ ද... මං බැම කිව්වා... ඒ වුණාට වසන්ත මහත්තයයි..."

සත්‍යය මුළුමනින් ම අනාවරණය කරන්නට හෙතෙම ආපොහොසත් විය. නාඳුනන මිනිසුන් දෙදෙනා ඇය වෙත කඩා පැන්න බැවින් කුමාරගේ ග්‍රහනයෙන් ගැලවෙන්නට ඇරූ ප්‍රයත්නය ව්‍යර්ථ විය.

"අතෑරපල්ලා... අතෑරපල්ලා මාව..."

ඇය බෙරිහන් දුන්නා ය. නොනැවතී පොර බැදූවා ය.

"මට යන්ඩ දීපියව්... මට යන්ඩ දීපියව්..."

ලෙනෙහි පසෙක ගල් පව්වක් මත හොවන ලද කෙල්ල ගේ දෑත දෙපය කිටි කිටියේ බැඳ ඇමූ මිනිසුන් දෙදෙනා ඊළඟට වේදිකාවට සම්ප්‍රාප්ත වන පාත්‍රවර්ගයා උදෙසා ඉඩ හරින්නාක් මෙන් සීරුවෙන් සිට ගත්තෝ ය.

"ගුරුන්නාන්සේ හිස බැඳි ජටාවද ඉන බැඳි රෙදිකඩ ද රත් පැහැයෙන් බැබලිණ. උගුලකට හසුවූ මුවැත්තියක මෙන් ගැහෙමින් ආශා නොනවත්වා කෑ ගැවා ය."

"තොපි පර බල්ලො... මාව ලිහපියව්... මට යන්ඩ දීපියව්... තොපි මට මොකක් ද කරන්ඩ හදන්නෙ?..."

Scanned with CamScanner

"ඔය කට වහගන්නවද නැද්ද?" යි ඇයට තර්ජනය කළේ සිසිරය. ඇගේ මවගේ පුරුෂයාය.

"වල් බල්ලා... තෝ දකින කොටම මට සැක හිතුණා. ඒ වුණාට ඒ වුණාට කුමාර මට මෙච්චර බොරුවක් කරයි කියල නං මං හිතුවෙ නෑ... කවදාවත් හිතුවෙ නෑ..."

අනතුරුව ඇය ඉතිරිව පැවති මුළු මහත් ශක්තියම යොදා ගනිමින් සිය පෙම්වතාට ශාප කළා ය.

"කුමාර... ඇ වරත්තු බල්ලො තෝ මට මෙහෙම දෙයක් කෙරුවෙ කොහොමද? මොන හිතකින් ද? තොට හෙණ ගහනවා... අර වසන්තයා පස්සෙං නෙමේ තොගෙ පස්සෙං එනවා මං යස්සනියක් වෙලා උපදින උපදින හැම ආත්මෙකම... තොපි මාව මරයි... තොපිට වෙන මොනවද කරන්ඩ පුලුවං... තොපි එකෙකුටවත් මං යහතින් ඉන්ඩ දෙන්නෙ නෑ... අම්මාපල්ලා මං තොපි එකෙක් නෑර බෙලි කඩලා ලේ බොනවා... ලේ බොනවාම යි..."

මරණ මංචකයේ වැද හොවන නරබිල්ල නිහඬ කළ යුතු බැවින් රෙදි පාන්කඩ මුවෙහි ඔබන්නට සිදු වූයේ කුමාරට ය. සැලෙන සිරුරින් ඒ කාරිය ඉටුකළ හෙතෙම අඳුරු අහුමුල්ලක ගුලිවී දෑතින් මුහුන වසා ගත්තේ ය.

"කුමාර..."

ගුරුන්නාන්සේ කෝපයෙන් හඬ ගෑවේ ය.

"මෙහාට එමු. මෙහාට එමු... රෑ එළි වෙනකං මතුරන්ඩ තියෙනවා මට... ඔහොම වැදැරිලා කොහොමද...?"

දේව දාසයා ගුරුවරයා කරා ගැටුවේ අසාධ්‍ය රෝගයකින් පෙළෙන්නාක් මෙනි.

"කුකුල් බිල්ලක් බැරිනං එළු බිල්ලක් හරි දෙන්ඩ පුලුවංනෙ මාමා... නර බිල්ලක් ම ඕන්නෑනේ.. ඔය මොන බිල්ලක්වත් නොදී හිටං දැං නිධං ගොඩගන්නෙ මාමා පෙළක් අය..."



සුළැඟිල්ලක් හෝ සොලවා ගත නුහුණුව පැය ගණනාවකින් ගෙල කපා මිය යාමට නියමිතව හිඳින යුවතිය දෙස නොබලන්නට වෑයම් කරමින් ඔහු ආයාචනා කළේ ය.

"උඹට ඒ පණ්ඩිතකං වැඩක් නෑ කුමාර... මං කියන විදියට වැඩ කරපං. බැරිනං පලයං යන්ඩ... මට ගෝලයෝ දහයක් හොයා ගත්තැහැකි..."

හඳුන්කූරු, කපුරු හා කට්ට කුමංජල් දැවෙන්නට වූයෙන් ලෙන තුළ සිහිල් වාතය කෙනෙකුගේ හුස්ම හිර කරවන තරමට බර විය.

"වසන්ත මහත්තයත් කුළුදුලේ... වාන්දතියත් කුළුදුලේ" ඉතිං ආසා කෙල්ල තුං කුළුදුල්" යි කියමින් හිනැහුණු ගුරුන්නාන්සේ මාමා අබියස ජීවිතය උදෙසා අයදින්නට ආශා නොසිතුවා ය. ඇය ඉක්මන් මරණය ප්‍රාර්ථනා කළා ය. මරණයෙන් ඉක්බිති කෲර යක්ෂණියක වී ඔහු ද ඇතුළු අනෙකුත් සියළු දෙනාගෙන්ම පළි ගැනීම ඇයගේ අභිප්‍රාය විය. එහෙත් ඊට සපුරා පටහැනි ලෙස ඇය මීට පැයකට පමණ පෙර ද ප්‍රේම කළ මේ මොහොතේ ඇයගේ අසීමිත වෛරයට ලක්ව හිඳින දේව දාසයා ඇයගේ ජීවිතය ප්‍රාර්ථනා කළේ ය. මේ බියකරු රාත්‍රියේ දී ඇය ගලවා ගැනීමට කවර හෝ ඉඩක් පැදෙනු ඇතැයි ඔහු ගැහෙන හදවතින් බලාපොරොත්තු විය. ඇගේ ලෙයින් සේදී යන ගල්පව්ව දෙබැවී නිධානය දක්නට ලැබුණ ද තමාට සතුටු විය නොහැකි බව ඔහු ඉඳුරා දත්තේ ය. හුස්ම ඉහළ පහළ හෙලන නිමේෂයක් පාසා ඇගේ සුන්දරත්වයත් ඇයගේ කෲරත්වයත් ඔහුට හිරහැර නොකරන බවට සහතික විය හැකි ද?

ඉඳින් එසේ නම් මේ බිහිසුණු කුමන්ත්‍රණය හෙළිදරව් කොට තමා ඇය සමඟ පලා නොගියේ මන්දැයි ඔහු අනේක වාරයක් පසුතැවුණේ ය. ඒ සා ධෛර්යයක් හා නිර්භීතකමක් දේවදාසයෙකු වන තමා තුළ නොවන බව ඔහු පිළි ගත්තේ ය.

සිව්කොණ දැල්වෙන පන්දම් එළියෙන් වරෙක බොඳ වන වරෙක දැඩිවන අඳුරේ ද ආලෝකයේ ද සලිත සෙවණැලි නරඹමින් නොකඩවා ජප කරන මන්ත්‍ර අසමින් ඇය උඩුකුරුව

Scanned with CamScanner

සිය නාරිලාලිත්‍ය නොමඳව විදහා පාමින් වැතිර සිටියා ය. මිනිසුන් පස් දෙනෙකු වටකොට සිටියදී පවා අතවරයට හෝ දූෂණයට ලක්වන බවට බියක් සැකයක් නොඉපදිණ. මන්දයත් නරබිල්ල පවිත්‍ර කන්‍යාවක මිස පිරිමි ස්පර්ශයෙන් කිළුටු වී නොතිබීම අනිවාර්ය කොන්දේසියක් බව ඇය දැන හුන් බැවිනි.

"ඇති... තව එක වචනයක්වත් කියන්ඩ එපා..."

වනමැද ලෙන් ගුහාවට වඩා අඳුරු වූ කුටිය තුළ කම්පිත තරුණයා මහත් උද්වේගයෙන් අණ කළේ ය.

"අනේ, ඇයි? තව චුට්ටයිනෙ..."

"බෑ... මට අහගෙන ඉන්ඩ බෑ... තවත් නං මට අහගෙන ඉන්ඩ බෑ..."

ඔහුගේ ශෝකාකුල හඬ ඇයගේ ළයෙහි ඇනෙන කටු පොකුරකි.

"එළිවෙන්ඩ කිට්ටුව කුමාර මට පැනල යන්ඩ උදව් කරපු හැටි. මම මෙලෝ සිහියක් නැතුව දුවල දුවල ගිහිං පාර අයිනෙ නවත්තලා තිබ්බ එළවළු ලොරියක හැංගිලා හුඟාක් දුර ගිය හැටි... ඒ ලොරිය පස්සෙ අරුං ත්‍රීවිල් එකකින් පන්නගෙන ආපු හැටි... අහන්ඩ ඔයා කැමති නැද්ද?"

ඇය දැරියක මෙන් ඇසුවාය.

"නෑ..."

"ලොරියෙනුත් බිමට පැනලා පාර දිගේ දුවගෙන එද්දි කළු කෙට්ටු කැත කොල්ලෙක් හම්බ වෙච්චි හැටි නං ඔයා අහන්ඩම ඕනැ."

ඔහු ඇය ඇඩිව තුරුළු කර ගත්තේ ය.

"මං කැතයි... ඔයා තරං මං ලස්සන නෑ තමා. ඒ වුණාට මං ඔයාට ගොඩාක් ආදරෙයි මගෙ රත්තරං... ආයෙ කවදාවත් ඔය කතාව මට ඇහෙන්ඩ කියන්ඩ එපා..."

ඒ තුරුණු නෙත් කඳුලින් පිරී ගිය අයුරු දුටු ඇසක් නොවීය. සිව් නෙතක කඳුළටද දෙහදක ප්‍රේමාදරයට ද එකම සාක්ෂිකරු වූ ගන අන්ධකාරය ඒ රහස සඳා සුරකිනු ඇත.

# 21

ඇයට එක්දහස් එක් රැයක් උවමනා නොවීය. සති කීපයකින් ඇය ඇගේ කතාව කියා හමාර කළා ය. ද්වේශයෙන් හා වෛරයෙන් අවපැහැගැන්වුණු ප්‍රේමයෙන් හා පරිත්‍යාගයෙන් ඔපවත් වූ ඒ සැබෑ කතාන්දරයට ඉවසිල්ලෙන් ද නොඉවසිල්ලෙන් ද සවන් දුන් ඔහු කුමාර පිළිබඳ ව කල්පනා කළේ ය.

කීමට කතාවක් නොතිබූ ඊළඟ රාත්‍රියේ ඔහු ගේ ආරාධනාවක් හෝ ඇවිටිල්ලක් නැතිවම ඇය ඇඳට නැංගා ය.

"කොච්චර වුණත් සඳුනි කුමාර පව්. ඔයාව බේරුවනේ.... ඔයාට ආස නැද්ද එයාට මොකද වුණේ කියල දැනගන්ඩ?"

ඇය ඔහුට තුරුළුව දෑස පියාගත්තා ය. ඒ පියැවුණු දෑස වුව ඒ බියගුළු දේවදාසයා නොදුටුවේ ය.

"නෑ... මට දැනගන්ඩ කිසිම උවමනාවක් නෑ..."

ඇගේ හඬ රළු පරළු විය.

"කකුල හොඳවුණාම මිනිහා ගැන ටිකක් හොයල බලන්ඩ ඕන"

"ඇයි?"

"ඔයා එයාගෙනෙ... මට හිතෙනවා ඔයාව එයාටම බාර දෙන්ඩ..."

Scanned with CamScanner

ඇය කෝපය යටපත් කර ගන්නට වෑයම් නොකළා ය. ක්ෂණයකින් ඔහුගේ තුරුලින් මිදුණා ය.

"එහෙම මේ එක එක්කෙනාට ඕන විදියට එක එක එක්කෙනාට බාර දෙන්ඩ මං බඩුවක් නෙමේ.." යි කියමින් ඇය ඇඳෙන් බැස්සා ය.

ඔහු අඳුරේ ම ඇය වලක්වාලන්නට තැත් කළේ ය.

"සඳුනි... ඔන්න ඉතිං තරහ ගියා..."

ඇය ඇඳ පාමුල වුව වැතිරෙන්නට සූදානම් නොවූවා ය.

"මාව එපා නං කෙළින්ම කියන්ඩ..."

ඇය හැඬුම්බර හඬින් ඉල්ලා සිටියේ කාමරයෙන් පිටතට යමිනි.

"පිස්සු නැතිව මෙහෙ එන්ඩ ළමයො... මම විහිළුවක් කෙරුවෙ..."

ඇය කුඩා සාලයේ පැදුර එලාගත්තා ය.

"සඳුනි මෙහෙ එන්ඩ..."

ඔහු නොඉවසිල්ලෙන් කෑ ගැවේ ය.

"මට විහිළු කරන්න එපා සඳුන්... මම ජීවිතෙන් හොඳට බැට කාලා තියෙනවා... පරණ දේවල් සේරම අමතක කරලා අළුත් ජීවිතයක් පටන් ගන්ඩ හැදුවට ඒකට ඔයා මට ඉඩ දෙන් නෑ... එදා ඒ පරණ පාළු පන්සලේ ඒ සීතල ගල් ගුහාවේ කුමාර මැරුණා... මැරෙන්ඩ හිටියෙ මං වුණාට මැරුණෙ කුමාර..."

අඳුර ඉරා දමන්නට තරම් ඇගේ හඬ තියුණු ය.

"ඒ මිනිහා ඉන්නව ද මැරුණ ද කියන එකවත් දැන ගන්ඩ ඔයාට හිතෙන්ඩ ඕන... ඒ යකා ඔයාව බේරගත්තා... ඒක අමතක කරන්ඩ පුළුවංද?"

ඔහු කිසිකලෙකත් නොදුටු නාම මාත්‍රයෙන් පමණක් අසා තිබෙන තරුණයෙකු වෙනුවෙන් තර්ක කළේ ය.



"හරි... ඒකා මාව බේරගත්ත හිංදා මං ඒකව හොයාගෙන යන්ඩ ඕනෑ... හරි ෂෝක්නේ... මං හෙට උදේම යන්නං... මාව අයිති ඒ පර බල්ලට නං මං ඌව හොයා ගන්ඩම එපැයි කොහොම හරි... කකුල් දෙක ගෙවෙනකං ඇවිදලා ඇවිදලා හරි..."

ඔහු උඩුකය කෙළින් කළේ ඉතා සෙමින් සුවපත් වන පාදයට ශාප කරමිනි.

"මෙහාට එන්ඩ සඳුනි... මං ආයෙ මුකුත් කියන්නෑ... හොඳ ළමයා වගෙ එන්ඩ..."

ඔහුගේ හඬ බැගෑබරය. ඇගේ දෑසට කඳුළු නැගිණ.

"ඔච්චර දුක් වින්ද මං ගැන නෙමේ ඔයාට දුක හිතුණෙ ඒ බයගුල්ලා ගැන..."

"කුමාර බයගුල්ලෙක් වෙන්ඩ පුලුවං. ඒත් ඕනෑම බයගුල්ලෙකුට වීරයෙක් වෙන්ඩ පුලුවං... ඕනම වීරයෙකුත් බයගුල්ලෙක් වෙන්ඩ පුලුවං. ඒ දෙකේ ඒ හැටි වෙනසක් නෑ සඳුනි..."

ඇය පැදුරේ ගුලි වූවා ය.

"මට ඕවා තේරෙන් නෑ... මාත් යකෙකුටවත් බය නෑ කිව්වට මට බය හිතෙනවා සමහර වෙලාවට... බයට මාව වෙව්ලනවා... පපුව ගැහෙනවා..." යි කියන්නට සැලෙන දෙතොල තරයේ වසා ගත්තා ය.

"ඔයා එන්නෙ නැද්ද සඳුනි...?"

"නෑ... ඔයා නිදා ගන්ඩ..."

"ඔයා මගෙ ළඟ නැතුව මට නින්ද යන්නෙ නෑ සඳුනි... ඔයා එන්නැත්තං මං එනවා ඔයා ළඟට..."

ඇය නැඟී සිටියේ මහත් නොරිස්සුමිනි.

"දවස තිස්සෙ ඉඳගෙන ඉඳලා කොන්දත් රිදෙනවා... ඔයාට නම් මොකද... මුළු දවසම බුදියගෙන ඉඳලා මට වද දෙනවා..." යි දොස් කියමින් ඇය නැවතත් පැදුර අකුලා ගත්තා ය.

“මං මේක අස්සෙ තට්ට තනියම... ඔයාට නං ඉතිං අර බඩ තඩියා ඉන්නවනෙ... කොහොම හරි ඌ ඔයාව ඉඹිනවත් ඇති ඉන්ද්‍රක්කට හොරෙං. කව්ද දන්නෙ... ගෑනුත් හරි කැමතියිනෙ. සල්ලි තියෙනවනං මොකෙක් වුණත් කමක් නෑ...”

ඇය පැදුර බිම දමා ගැසුවේ අපමණ කෝපයෙනි. ඒ සරාගී මිනිසාගෙන් ගැල වී හිඳින්නට තමා දරන වෙහෙස සිහිපත් කරමින් යටිතොල විකාගත්තා ය. අඳුර නොසලකා නිවෙසින් පිට වී හිස හැරුණු අත යාමට තරම් වන ආවේගය මැඩ ගැන්ම පහසු නොවී ය.

“සද්ද නැතුව ඉන්නෙ කියන්ඩ දෙයක් නැති හිංදනේ... ඇයි ඉතිං මං කියන්නෙ ඇත්තනෙ...”

සඳුන් අත මුගුරක් ඇත්තාක් මෙනි. ඒ මුගුරින් ඔහු තමාගේ හිසට පහරක් එල්ල කළ විටෙක මෙන් ඇය සිය දෙපා මත මඳක් වැනුණා ය. ඉනික්බිති සියල්ල හමාර කරන අදහසින් ඇය ඇඟලාගෙන හුන් ගවොම ගැලෙව්වා ය. එය පමණක් නොව යටසාය ද තනපටය ද බිම පතිත විය. ඇය කාමරයට ගියේ මුළුමනින් ම නිරුවත් වීමෙන් පසුව ය. ඇයට විළියක් නොදැනුණේ ඇයගේ නිරුවත සඟවාගන්නට තරම් අඳුර උකුඩු බැවින් විය යුතුය. අනෙක් අතට නිරුවත සම්බන්ධයෙන් කවදත් ඇය තුළ අමුතු බියක් හෝ ලැජ්ජාවක් නොවී ය.

“තියෙන නැහැදිච්ච කම... ගෑනු දරුවෙක් විච්චිහම ඇඳලා කරලා වහගෙන පොරවගෙන අංගපුලාවකට ඉන්ඩෙපැයි... මේකි ගෙ තියෙන කඩප්පුලිකමට කෙළවරක් නෑ...”

සීතම්මාගේ අවලාද අසමින් ඇය ඇඳට නැංගාය. අසහනයෙන් පීඩා විඳින තරුණයා අසල වැතිරුණා ය. තමා සමීපයෙහි සිටින කෙල්ල නිරුවතින් පසුවන බවක් ඔහු නොදත්තේ ය. එවැන්නක් අනුමාන කරන්නට පවා ඔහු සමත් නො වීය.

“මට ඇත්තම කියන්ඩ”

ඔහුගේ හඬ බැරෑරුම් ය.



“ඒ මිනිහා ඔයාගෙ අතින්වත් ඇල්ලුවෙ නැද්ද?”

දවස් බෝජනය පිණිස කුලී වැඩට යන තමා පිළිබඳව සැකයෙන් පසුවීම කොපමණ වැරදි සහගත දැයි විමසන්නට නොගිය ඇය අනෙක් පස හැරුණා ය.

“ඇයි කතා කරන් නැත්තෙ... කියනවා... මොනවද වුණේ...? සඳුනි මට ඇත්ත කියනවා... මට කන්ඩ දෙන්නෙ තමුසෙ ඒ මිනිහා එක්ක බුදියගෙන ඉඳල හොයන සල්ලිවලින් නං ඊට වඩා හොඳයි මං බෙල්ලෙ වැල දාගන්න එක... එහෙම නැත්තං වහ ටිකක් බොන එක...”

ඇගේ නිශ්ශබ්දතාවයෙන් කුපිත වූ ඔහු ඇයට පහර දෙන්නට තැත් කළේ ය.

එහෙත් අඳුරේ වුව ඇය නිරුවතින් පසුවන බව ඔහු ගේ අතැඟිලි ඔහුට පහදා දුන් කල අප්‍රමාණ විමතියෙන් තිගැස්සුණේ ය.

“සඳුනි...”

ඇගේ සිරුර දිගේ පහතට අත යැවූ ඔහු නූල් පොටක් හෝ නොවන වග පසක් කරගනිමින් හඬ ගෑවේ ය.

“ඇයි මේ?”

ඇය ඔහුගේ අත ගසා දමා ඇඳ මත හිඳ ගත්තා ය.

“මාත් එක්ක රණ්ඩු වෙන්නෙ නිකං බොරුවට මාව සැක කරන්නෙ ඇයි කියලා මට තේරෙන්නැද්ද...? මං කිසි මිනිහෙක් එක්ක එකට ඉඳලා නෑ කිව්වට ඔයා පිළිගන්නෙ නෑ... ඔයාම බලාගන්ඩ... මං වෙන කොහොමද මේක ඔයාට තේරුම් කරන්නෙ... මට එපාවෙලා... එපා වෙලා... එක පැයක් හොඳට හිටියොත් මුළු දවසක් රණ්ඩු වෙනවා... මාත් මනුස්සයෙක් නේද? මං යස්සනියක් නං මට මෙච්චර දුක හිතෙන එකක් නෑ... එදා මං මැරුණනං හොඳයි... මං හිතුවෙම මැරිලා යස්සනියක් වෙන්ඩ... අර මෝඩයා මාව බේරගත්තු හිංදා මට ඒකත් නැතිවුණා... මැරෙන්ඩ ලෑස්ති වෙලා හිටියට අත පය බැඳපු ලණු බුරුල් කෙරුවම නැගිට්ටගන්ඩ දුවන්ඩමයි හිතුණේ...

Scanned with CamScanner

ජීවිතේට පුදුම කෑදරකමක් ඇනුණේ... කොහොම හරි පණ බේරගන්ඩ ඕන වුණේ... මැරිලා වැටෙන කල් හරි දුවනවා කියල හිතාගෙනයි දුවන්ඩ පටං ගත්තෙ... තාමත් දුවනවා මං... මට දැං හරි මහන්සියි... මට නවතින්ඩ ඕන... අනේ මට නවතින්ඩ හති අරින්ඩ ඕන සඳුන්..."

දෙදණේ මුහුන හොවාගත් කෙල්ල හඬා වැටුණා ය.

ඔහු දහසක් සිතිවිලිවලින් උතුරා ගියේ ය. නැවත ඒ හදවත මුළුමනින් ම හිස් විය.

"මං මහ මෝඩයෙක්"

ඇගෙන් සමාව ඉල්ලා සිටිනවා වෙනුවට ඔහු තමාටම දොස් පවරා ගත්තේ ය.

"මට තේරෙන්නෑ... මට ......."

ඔහු ද උඩුකය කෙළින් කොට අතකින් නළල මිරිකා ගත්තේ ය.

"ඔයා මාව කසාද බැන්දෙ නැතත් කමක් නෑ සඳුන්... අද මාත් එක්ක ඉඳලා හෙට මාව බැල්ලියක් වගේ එලවගත්තත් කමක් නෑ..."

කන්‍යාභාවය රැක ගැන්මේ වෙහෙසකර ප්‍රයත්නය අත්හැර දමන්නට තීරණය කළ කෙල්ල ඔහුට තුරුළු වූවා ය.

"මං ඔයා හිතන විදියේ බල්ලෙක් නෙමේ සඳුනි... මට ඕන තරං ඉඩ තිබ්බා මේ බිත්ති හතර මැද්දෙ. ඔයා කොච්චර විරුද්ධ වුණත් ඔයා කොච්චර සැර වුණත් මට ඒ දේ කරන්ඩ තිබ්බා..."

ඇය ඊට එරෙහිව කිසිවක් නොපැවසුවා ය. එය සැබෑවකැයි ඇයට පසක්වන බැවිනි.

"දැං මට කකුල ටිකක් බිම තියන්ඩ පුලුවං... අමරෙ අයිය ඉක්මනට එනවා... ඊට පහුවෙනිදම අපි කසාද බඳිමු..."

"ඊට කලිං වුණත් ඔයාට ඕන නං..."

ඇය නොකියා ගිලගත් දෑ වටහාගනිමින් ඔහු මඳ සිනාවක් මුව'ග නඟාගත්තේ ය.



"ඕන වුණත් ඉතිං මේ කකුලත් එක්ක බෑනේ... අන්ඩක් කඩාගත්තට පස්සෙ තමා ඔයත් ඇඳුම් ගලවගෙන මගෙ ළඟට එන්නෙ... ඒ දවස්වල තිබ්බ ගණං... අල්ලන්ඩවත් දෙන්නෑ..." යි නෝක්කාඩු කී ඔහු ඇය සිපගත්තේ ය.

"යන්ඩ... ඇඳුම් ඇඳගන්ඩ"

ඒ කාරුණික හඬ ඇයගේ කඳුළු අළුත් කරයි. ඇය ඔහුට අවනත වූයේ කුඩා දැරියක මෙනි.

"බලාගෙන... කළුවරේ ගිහිල්ලා දැන් හැප්පිලා වැටෙනවා...." යි ඔහු අනතුරු ඇඟෙව්වේ ළය පිරී උතුරා යන ස්නේහයෙනි.

සාමයෙන් ද දයාවෙන් ද සංසිඳී ගිය සිතින් කයින් තිත්දට වන් යුවළ අතර වූ නිහැඬියාව මොහොතකින් බිඳ වැටිණ. ඔහු හඬ නගා හිනැහුණෙන් ඇය පුදුමයට පත් වූවා ය.

"ඇයි?"

දෑසට නොපෙනෙන කනට ඇසෙන ඒ සිනාවෙන් නොසන්සුන් වූ ඇය මහත් කුකුසින් ප්‍රශ්න කළා ය.

"ඇයි හිනාවෙන්නෙ?"

ඔහුගෙන් පිළිතුරක් නොලද්දෙන් ඇය යළි ඇසුවේ දළුලන කෝපයෙනි.

"නෑ... මට අපේ කිරියත්ත කියන කතාවක් මතක් වුණා"

"මොකක් ද?"

"කැලේ ලියලන කොට වඳුරගෙ හක්ක වනවෙලා ලු..."

ඇයට ඒ කතාවේ අගක් මුලක් නොවැටහේ.

"ඒ කිව්වෙ"

"පැවිල්ලට කරකුට්ටං වෙච්ච කැලේ කන්ඩ කොලයක්වත් ගෙඩියක්වත් නැනෙ වඳුරන්ට... ඉතිං ඔය ඉපල් ලැටි ගගා ඉඳලා වැස්සකට පස්සෙ ගස් ලියලගෙන එනකොට අර දළු මල් ගෙඩි කා ගන්ඩ විදියක් නෑ කට සේරම තුවාල වෙලා..."

Scanned with CamScanner

ඒ උපමා කතාව මේ රාත්‍රියට හා පෙම්වතුන්ගේ ආදර දබරයන්ට සම්බන්ධ වන්නේ කෙලෙසදැයි ඇය කල්පනා කළා ය.

"ඔයත් ඉතිං මගෙ අණ්ඩක් කැඩෙන කල්ම හිටියනෙ" යි කී ඔහු නැවතත් තිහැහුණේ ය. ඇය විළියෙන් රත් පැහැගැන්වෙමින් "යන්ඩ... හරි නරකයි" යි නෝක්කඩු කීවා ය.

ඔහු හිනැහුණේ ප්‍රීතියෙන් මෙන්ම සැහැල්ලුවෙනි. ඇය අළුත ගෙනා මනමාලියක මෙන් විළිබර වූයෙන් ඇගේ කොපුලත රෝස පැහැය රත් පැහැයට හැරිණ.

පසුදා ඇය නිවෙසින් පිටව යාමට පෙර සරදම් කරන්නට අමතක නොකළා ය.

"හොඳටම පරක්කු වුණා අනේ. අර මිනිහ බලාගෙන ඉන්නවනෙ මං එනකං මාව ඉඹින්ඩ..."

ඉස්තෝප්පුවේ වාඩි වී හුන් තරුණයාගේ මුහුනට හීන් අඳුරක් හෝ ගලා නො ආවේ ය.

"ඔයාව ඉඹින්ඩ ආවොත් ඉතිං මිනිහටත් මං වගේ එක් තැන් වෙලා තමා ඉන්ඩ වෙන්නෙ අත පය කඩාගෙන..."

"ඇති යංතං... තේරුණා... මං කව්ද කියලා..."

"අපොයි ඔව්... ඒක තේරිලා කොච්චර කල් ද..."

ඇය පාර අද්දර නැවතී ඉන්නා ඉන්ද්‍රානි සමඟ එක් වූයේ කිකිණි හඬින් හිනැහෙමිනි. මේ සතුට හා සොම්නස සදාකාලික බව ඇය සිතුවේ අපමණ සැහැල්ලුවෙනි.

"දුකක් වින්දොත් ආසෝ සැපකුත් විඳින්ඩ සිද්ද වෙනවාමයි.. එහෙම නූනොත් බුදු බණ බොරු..."

සීතම්මාගේ වචන ඇගේ දෙකනේ රැව් පිළිරැව් දෙයි. සිත පුරා ඉතිර පැතිර යන සොම්නස හේතු කොට ගෙන අන් කවර දිනකටත් වඩා රූමත් වූ ආශා දෙස පොඩිමහත්තයා වරින් වර බැලුවේ තෘෂ්නාබර දෙනෙතිනි. එහෙත් ඇය වෙනදා මෙන් උරණ නොවූවා ය. ඔහු කෙරෙහි පවා නොකිපී ඉන්නට තරම් ඇය දයාන්විත වූවා ය.



සඳුන් සුවපත් කර ගන්නට ඇයට ඇඩි වෙහෙසක් දරන්නට සිදු විය. මිතුරන්ගේ උදව් පදව් පවා ක්‍රමයෙන් අඩු වී නැත්තටම නැතිව ගියේ ය. එහෙත් ඇය නොවෙනස් උද්යෝගයෙන් ඔහුට උවටැන් කළා ය. එහෙයින් ඇවිද යන්නට පිළිවන් වූ විගස ඔහු ඇය සිප වැළඳගත්තේ අපමණ ආදරයෙනි.

"මාස ගානක්ම ඔයා මං වින්ඳ දුක් වින්ද කෙල්ලේ..."

"ඕක මොකක්ද... දැං ඉතිං අවුරුදු ගාණක්ම... මැරෙනකංම ඔයා හිංදා දුක් විඳින්ඩනෙ මං බලාගෙන ඉන්නෙ..."

ඔහු සුසුමක් හෙළුවේ ය.

"නෑ සඳුනි... මං ඔයාට දුක් විඳින්ඩ දෙන්නෙ නෑ... හෙට ඉඳල මට වැඩ කරන්ඩ පුලුවං... ඔයා හෙට වැඩට යන්ඩ එපා..."

ඇය ඔහුගේ පාදයේ තෙල් ගාමින් මඳක් කල්පනා කළා ය.

"හෙට යන්ඩම වෙනවා සඳුන්... මම හෙට කියන්නං ආයෙ එන්ඩ වෙන්නෑ කියල... එක පාරටම එහෙම නොගිහිං ඉන්න එක හොඳ නෑනේ... මොනවා වුණත් අපි මෙච්චර කල් කෑවේ බීවේ ඒ මනුස්සයා දුන්න සල්ලිවලින්නෙ..."

ඔහු නොසතුටු මුහුණින් ඉවත බැලුවේ ය.

"නිකං පිනට දුන්නැයි... ඔයා පණ යනකං වැඩ කරලනෙ ගත්තෙ..."

"ඒක හරි... ඒ වුණාට අව්වෙ ඉන්නැතුව ඉඳගෙන ඇට තෝරන එක හුඟාක් අමාරු වැඩක් නෙමේනෙ සඳුන්. මං නොගියොත් ඉන්ද්‍රක්කටත් බැනුම් අහන්ඩ වෙයි. හෙට විතරයි යන්නෙ සඳුන්... ආයෙ කවදාවත් යන්නෙ නෑ... ඔයා වැඩ කරල හොයන සල්ලි වලිං මං ගෙදෙට්ට වෙලා කකා බිබී චූන් එකේ ඉන්නවා..." යි කී ඇය සිනාසුණා ය. ඔහු ගේ මුවඟ සිනාවකට විවර නොවී ය.

"අප්පේ මූනෙ හැටි... ඉරිසියාවෙ පුපුරු ගහනවා..."

"හෙට අමරෙ අයියත් එනවා... මං යන්ඩ ඕන අමරෙ අයිය එක්කං එන්ඩ"

Scanned with CamScanner

ඇය ද ඒ කල්‍යාණ මිත්‍රයා දැක බලා ගැන්මට නොඉවසිල්ලෙන් පසුවෙයි.

"අමරේ අයියා මට කැමති වෙයි ද?"

"අමරෙ අයියා ඔයාට උඩිංම කැමති වෙයි.... ඔයාට කැමති නොවෙන්නෙ කව්ද?"

ඇය ඔහු ගේ පය කෙනිත්තුවා ය.

"එහෙම නෙමෙයි... මං කියන්නෙ ඔයා මාව බඳිනවට එයා කැමති වෙයි ද කියල"

ඔහු නිකට පිරිමැද්දේ ය. පසුගිය තෙමස මුළුල්ලේ වැවෙන්නට ඉඩහළ රැව්ල කපා තිබූ බැවින් ඔහු ගේ මුහුණේ අමුතු ආලෝකයක් විය.

"නෑ... ඔයා වගේ මරුමුස් කෙල්ලක්ව කසාද බඳිනවට අමරෙ අයියා කොහොමටවත් කැමති වෙන එකක් නෑ..."

ඇය නැඟී සිටින්නට තැත් කළා ය.

"එහෙනං ඉතිං හොඳ සිරියාවන්ත කෙල්ලක් හොයාගන්ඩ... මං යන්නං යන්ඩ... ඉවරයිනෙ"

ඔහු ඇගේ අතින් ඇද්දේ ය.

"නෑ... තාම ඉවර නෑ... දැනුයි පටන් ගන්නෙ..."

ඒ හඬෙහි දැවටුණු අනුරාගය ඇයට ආගන්තුක නොවී ය. එහෙත් ඇය වෙනදා මෙන් තැති නොගත්තා ය. ඔහු වෙතින් මිදී පැන දුවන්නට හැකියාව තිබුණ ද ඇය නිහඬව අවනත වූවා ය.

"අනිද්දා අපි කසාද බඳින එකනෙ... ඒ හිංදා කමක් නෑ නේද...?"

ඔහු ඇය සිප වැළඳ ගනිමින් ඇසුවේ ය.

"කියන්ඩකෝ... කමක් නෑ කියන්ඩ..."

ඇය කඳුළු නැගෙන දෑස සඟවා ගන්නට තැත් කළා ය.

"මී... මං දන්නෑ..."



"ඔයා කැමති නැත්තං මට ඕන් නෑ... සඳුනි..."

ඇය දැඩිව ඔහු බදා ගත්තා ය.

ඒ ආලිංගනයෙහි ඇගේ කැමැත්ත නොමඳව ගැබ් ව තිබිණ. තවත් පමාවන්නට ඔහු නොසිතුවේ ය.

"ලාම්පුව නිවන්ඩ..."

ඇය පහත් හඬින් ඉල්ලා සිටියා ය.

"බෑ... මට බෑ කළුවරේ..."

ඔහුගේ මුරණ්ඩුකම ඇය සානුකම්පිත මඳහසකින් ඉවසුවා ය.

චිමිනි ලාම්පුවේ සෞම්‍ය ආලෝකය ඔවුන්ගේ නිරුවත් සිරුරු වඩාත් අලංකාර කරවයි. එහෙත් ඒ අනුරාගය ද අලංකාරයද දකින ඇසක් අහළ පහළ නොවී ය. නිරන්තරව ඔබ මොබ පියඹා යන කලාමැඳිරියෝ ස්ත්‍රී පුරුෂ මෛථුනයක වගක් නොදනිති. පිටත තුරුවදුල තුළ සැඟවගත් රැහැයියෝ නද දෙන්නට වූයේ ගෙතුළ උතුරා යන අනුරාගය පිළිබඳ ව නොතකමිනි.

"පොතේ ලියලා අත්සන් කරලා මිසක්කා කිසි පිරිමියෙකුට ඉඩක් දෙන්ඩ එපා ඕං තමුන්ගෙ ඇඟ උඩ දඟලන්ඩ... කැවුත්ත අතට ඇන්න කතා කෙරුවත් පිරිමි සතා විශ්වාස නෑ බං..."

මල්වර වූ දා පටන් සීතම්මාගේ ඔවැනි කතා කොතෙක් ඇසුවේ ද කිවහොත් ආශාට ඒවා කටපාඩම් ය.

"අනේ සීතම්මේ... මා එක්ක තරහවෙන්ඩ එපා සීතම්මේ" යි ඇය රහසින් ඉල්ලා සිටියේ තමා ඒ මැහැල්ල සමඟ කී වරක් නම් අමනාපව සිටියේ ද යන්න අමතක කර දමමිනි.

"තරහ ද?" යි සඳුන් ඇසුවේ කෙමෙන් සන්සුන් වන සිත කය පුද දෙන සැහැල්ලුවේ ගිලෙමිනි.

"නෑ..." යි ඇය කොඳුලේ ඔහුගේ ළමැදේ මුහුන ඔබාගනිමිනි.

"බය ද?"

Scanned with CamScanner

"මිහු..."

"මං ඔයාව දාල ගියොත්?"

ඇගේ දෙනෙත කඳුළු කොපුල් ඔස්සේ රූරා හැලිණි.

"මොනවා කරන්ඩ ද... රණ්ඩු වෙලාවත් දුක් වෙලාවත් වැඩක් නැතේ... කොහොම හරි ජීවත් වෙන්ඩ එපැයි..."

ඔහු ඇගේ හිස සිම්බේය.

"අම්මෝ... සද්ද නැතිව ඉඳී... මං දන්නැද්ද ඔයාගෙ යකා... මාව හම ගහයි ඔයා"

ඇය නැහැය ඉහළට ඇද්දා ය. මේ කමකට නැති කඳුළු නැහැය බර කරවයි.

"නෑ සඳුන්... පස්සෙං පන්නලා පලි ඇරං වැඩක් නෑ." ඔයා මට ඇත්තටම ආදරේ නං මාත් එක්ක ඉඳී... ආදරේ නැත්තං දාලා යන එක තමා හොඳ... බල්ලො බළල්ලු වගේ රණ්ඩු වෙවී ඉන්නෙ කොහොම ද? ජීවිතේ තිත්ත වෙනවා එතකොට..."

"දැං... මෙහෙම දෙයක් වුණාට පස්සෙත් ඔයාව දාලා ගියාට කමක් නෑ කියලද ඔයා කියන්නෙ."

"ඔව්..."

ඔහු ඇය මිරිකා ගත්තේ ය. ඇගේ දෙවුර රිදුම් දුන්නේ ය.

"සඳුනි... ඔයා දැං මගේ..."

"ඉතිං...? මට මොනවද කරන්ඩ කියන්නෙ? ඔළුවෙං හිටගන්ඩ කියලද?" මොහොතකට පෙර ඇය වෙත වූ කෝමල බව මුළුමනින් ම වියැකී ගොසිනි.

ඇගේ නොරිස්සුම් සහගත හඬින් ඔහු මෙතෙක් වෙලා වෙලාගත් චමත්කාරය හීන ව යයි.

"ඇයි ඔයාට තරහ යන්නෙ?"

"මං දන්නෑ..." යි කී ඇය ඔහු ගේ සිරුරින් ඉවතට ඇදී අනෙක් පස හැරුණා ය.



පොරෝණය ඇද සියොළඟ පමණක් නොව හිස ද වසා ගත්තා ය.

ප්‍රහේලිකාවක් දෙස හෙලන බැල්මෙන් ඔහු ඇය දෙස බලා සිටියේ ය.

"අපි ඉක්මණට කසාද බඳිමු" යි ඇය නොඉවසිල්ලෙන් යෝජනා නොකළා ය.

"මාව දාල යන්න එපා සඳුන්" යි කඳුලින් ආයාචනා නොකළා ය.

සුසුමක් හෙළු තරුණයා නිදා ගන්නට තැත් කළේ ය.

නින්දට ගිය බවක් ඇගෙව්ව ද ආශා සිය පළමු පෙම්වතා දකිමින් සිටියා ය.

කුමාර නැඟුරු වන කල ඇයට කෙළ ගසන්නට උවමනා විය. එහෙත් බෙහෝ වේලාවක් හැඬීම දෙඩීම නිසා ඇගේ මුව මුළුමනින් ම වියළී තිබිණ. ඇය පිපාසිතව සිටියා ය. එහෙත් වතුර ඉල්ලා සිටින්නට අදහස් නොකළා ය. සා පවස විඳ දරාගනිමින් ඇය මරණය ප්‍රාර්ථනා කළා ය. නුහුරු ආලෝකයෙන් හා මිනිස් හඬින් ද ගන්ධයෙන් ද තැති ගත් වවුලෝ ඒ මේ අත ඉගිල යන අයුරු බලා සිටියා මිස කෙඳිරියකුදු නොනැගුවා ය.

කුමාර ඇය වෙත නැඹුරු වූයේ වතුර බෝතලයක් ද අතැතිවය.

"තොපේ වතුරවත් මට එපා" යි එය ඈතට විසි වන සේ පහර දෙන්නට සිතුවේ දෑත බැඳ දමා තිබෙන බව අමතකව ගියාක් මෙනි. කෝපාග්නියෙන් දැවෙන ඇස නෙරවා ඇය ඔහුට ශාප කරන්නට සැරසුණා ය.

"මං බැමි බුරුල් කරනවා... තව ටිකකිං මං බොරුවට කෑ ගහනවා නයෙක් කෑවා කියලා. එතකොටම ඔයා පැනල දුවන්ඩ... පුලුවං තරං හයියෙං දුවන්ඩ..."

නොකඩවා ජප කරන ගුරුන්නාන්සේගේ මෙන්ම වසන්ත බණ්ඩාරගෙන් ආ ඇමතුමක් හේතුකොට ගෙන ලෙන් ගුහාවෙන්

Scanned with CamScanner

මඳක් පිටතට ගිය මිනිසුන් දෙදෙනා කුමාරට ඒ පණිවිඩය කියාගන්නට නොදැන වුව අනගි සහායක් දුන්හ.

මරණය වෙනුවට ජීවිතය තෝරා ගන්නට ඉඩක් ලැබෙනු ඇතැයි ඇය තුළ කිසිදු විශ්වාසයක් නොතිබිණ. එහෙත් තුන්කුළුඳුල් බිල්ලත් නිධානයත් පසු පස වසන්ත බණ්ඩාර සිටින බව අනාවරණය වීම හේතු කොට ගෙන ඇය මරණයෙන් මතු යක්‍ෂණියක වෙනවා වෙනුවට නොමැරී යක්‍ෂණියක වීමට තීරණය කළා ය.

"මං උගෙ බෙල්ල කඩලා ලේ බොනවා... උගේ විතරක් නෙමේ... මුං හැම එකාගෙම..." යි ක්‍රෝධයෙන් දත් සැපූ ඇය කුමාරගේ විලාපයෙන් තිගැස්සුණා ය.

"බුදු අම්මෝ..." යි ලෙන් ගුහාවේ අඳුරු අහු මුල්ලක ඇඳ වැටෙමින් ඔහු කෑ ගැවේ ය.

"ඇයි මොක ද? මොක ද?"

මිනිසුන් දෙදෙනා ඔහු වෙත දිව ගිය ද ගුරුන්නාන්සේ මල් බුලත් තට්ටුව අබියස යාතිකාව නතර නොකළේ ය.

"න... නයෙක් ගැහුවා... නයෙක්..."

කුමාරගේ වේදනාත්මක හඬ අසමින් ඇය පලා යාමේ පළමු පියවර තැබුවා ය.

"නයා නයා... පෙනෙත් පිප්පුවා..."

පළමු පෙම්වතාගේ මුවින් ඇගේ කන වැකි අවසන් වචන ඒවා විය.

පසෙක වැතිර සිටින තරුණයා හට නොඇසෙන්නට ඇය හඬා වැටුනේ ඒ දේව ආසයා වෙනුවෙනි.

පසුදා හිමිදිරියේ ඇය ඇඳෙන් බසින්නට තැත් කරන කල සඳුන් ඊට ඉඩ නොදුන්නේ ය.

"පරක්කු වෙලා... උයන්ඩත් ඕන..."

"පාන් කමු..."



ඔහු මොළොක් හඬින් කීවේ ය.

"වැඩට යන්ඩත් තියෙනවනේ... බත් ගෙතියන්ඩත් ඕන..."

ඔහු ඇගේ දෑසට එබුණේ ය. වසන ලද ජනේලය අතරින් රිංගා එන්නට තරම් ලා හිරු කිරණ මෝරා නැත. අඩ අඳුරේ වුව ඇගේ ඇස් තුළින් ඔහු ඇගේ හදවත දකින්නට වෑයම් කළේ ය.

"ඇයි මේ තරහෙන් වගේ?"

"නෑ... මොකට ද මම තරහ වෙන්නෙ?"

ඇය යම් කිසිවක් සඟවාගෙන සිටින බවට උපදනා සැකයෙන් ඔහු පීඩා වින්දේ ය.

"ඔයා බය ද මම ඔයාව ආලා යයි කියලා..."

ඇය සිනාවක් පාන්නට දැරූ ප්‍රයත්නය ව්‍යර්ථ විය.

"නෑ..."

"එහෙනං...?"

"මං දන්නෑ සඳුන්... මට තේරෙන්නෑ..."

ඇගේ සෝබර හඬ ඔහු තුළ දයානුකම්පාවක් උපදවයි.

"මඟුල් ගෙයක් ගන්න විදියක් නැති හිංදද...? හැම කෙල්ලෙක්ම ආසයිනෙ මනමාලියක් වෙන්ඩ... ඔයත් ආස ඇති. ඔයා මනමාලියක් වගේ ඇන්දම කොච්චර ලස්සනට ඉඳී ද..."

එවන් සුන්දර සිහිනයක් තමා තුළ වන බවක් ඇය දැන නොසිටියා ය. ඇතැම්විට සැඟවුණු සිහිනයක් පරිද්දෙන් යටි සිතේ තැන්පත් වී තිබුණා විය හැක.

"මට බයයි සඳුන්..."

"ඇයි? අර මිනිස්සුන්ට ද?"

"නෑ..."

"එහෙනං..."

ඇය සුසුමක් හෙළා සිය හදවත විවර කළා ය.

Scanned with CamScanner

"මට මෙච්චර කාලෙකට හොඳක් වෙලා නෑ සඳුන්... කිසිම හොඳක්... සතුටක්... ඉතිං ඉස්සරහටත් මට හොඳක් වෙයි කියලා හිතන්නෙ කොහොම ද මම? මට ඔයාව කසාද බඳින්ඩ බැරි වෙයි... අපට එකට ජීවත්වෙන්ඩ බැරි වෙයි. මොනවා හරි නරකක් නපුරක් වෙයි කියලා මට බය හිතෙනවා මගෙ දෙයියෝ..."

ඇයට හැඬුම් ආවේ ය.

"ඔහු ඇය තුරුළු කර ගත්තේ ද සිප ගන්නට වූයේ ද උමතුවෙන් මෙනි."

"නෑ කෙල්ලේ නෑ... ආයෙ ඔයාට දුක් විඳින්ඩ වෙන්නෙ නෑ... අපි හෙට බඳිමු... අනිද්දා අපේ ගෙදර යං.."

"ඇගේ ළය සිර වී තෙරපී ගියේ ය.

"ඔයාගෙ අම්මා...? අනේ මට බයයි සඳුන්..."

"අපෙ අම්මට කවදාවත් මේ තරම් ලස්සන ලේලියෙක් හම්බ වෙන්නෙ නෑ... එයා ඔයාට කැමති වෙයි. අතන මෙතන දුවන දිවිල්ල නවත්තලා අපි අපේ ගෙදර අළුත් ජීවිතයක් පටං ගමු... අපට ළමයි හම්බවුණාම අපේ අම්මා ඒ ළමයි හදන්ඩ අපට උදව් කරයි. එතකොට අම්මටත් පාළුවක් දැනෙන එකක් නෑ..."

සොඳුරු කැදැල්ලක සුබ සිහින ඇගේ ළය පෙළන ළ තැවුල තුනී කර දමයි. ඇය ඔහුට ඉඩ දුන්නේ පෙරදා රැයෙහි විඳි මිහිරට ලොබ වෙමිනි. සෙනෙහසද රාගය ද මුසු වූ කල ජීවිතය කොතෙක් නම් තෘප්තිමත් ද යන වග ඔවුන් පසක් කරගත් බවට සැක නැත.

"අප්පේ අද නං මූනෙ මලක් පිපිල වගේ..."

ඉන්ද්‍රානි පවා සරදම් කළා ය.

"දැං අරයට සනීපයිනෙ නේද? ඇරියසුත් එක්ක හම්බ වෙලා වගේ ඊයෙ රෑ නං..." යි ඇය පහත් හඬින් කී කල ආශා හඬ නඟා සිනාසුණා ය.

දෙතොල හැර නොයන මදහස ඇස ගැටුණු පොඩි මහත්තයා පවා



"මෙකිගෙ ලස්සන" යි හූල්ලා වැටුණේ ය.

"මේ නංගි ආයෙ වැඩට එන්නෑ කියන්නේ..."

ඉන්ද්‍රානි දැනුම් දුන්නේ තේ විවේකයේ දී ය.

"ඇයි" දැයි ඇසුවේ ඔහුගේ දෑසයි. ආශා ඒ බැල්ම මඟ හැරියා ය. තමා වෙනුවෙන් උත්තර බැඳීම යෙහෙළියට බාර දුන් කලෙක මෙන් නිහඬව පසුවූවා ය.

"ජෝඩුවත් එක්කම ගමේ යනවලු"

ඔහුගේ මුහුණේ අන්ධකාරය දුටු ඉන්ද්‍රානි "මං හෙට අපේ පුංචි අම්මව එක්කං එන්න..." යි පොරොන්දු වූවා ය.

මේ රූබර යුවතිය වෙනුවට ඒ දුර්වර්ණ කෙසඟ ගැහැනිය දැක දැක ඉන්නට ඔහු කිසිසේත් කැමැත්තක් නොදැක්වූවද කිසිවක් නොපැවසුවේ ය. එහෙත් මේ අවසන් දවසේ තමාගේ සිතැඟි මුදුන්පත් පමුණුවා ගන්නට උපරිම වෙහෙස දැරිය යුතු යැයි තීරණය කළේ ය. ඒ සඳහා ඔහුට ඉඩ ප්‍රස්තාව සැලසුණේ පුදුමාකාර ලෙසිනි.

යතුරු පැදියක තිරිංග තද වූයෙන් ඉන්ද්‍රානි ඒ වෙත දිව ගියා ය.

"වැඩි වේලාවක් මිඩංගු නොකොට ආපසු එන ගැහැනියගේ මුහුන විකසිත වී තිබිණ. ඇගේ දෙනෙත කඳුලත් මුහුණේ ආලෝකයත් වටහාගත නුහුණු ආශා ඇයි දැයි ඇසුවා ය.

"මගෙ කෙල්ල"

ඉන්ද්‍රානිට හැඬුම් එයි.

"ඇයි? මොකද වෙලා තියෙන්නෙ...?" යි වහා ප්‍රශ්න කළේ පොඩි මහත්තයා ය.

"නෑ... කෙල්ල කොටහළු වෙලා... අනේ ඉද ඉස්කෝලෙ යන්ඩ බෑ කියද්දි මං වදෙං පොරෙං යැව්වෙ..."

ඇය හඬමින් හා හිනැහෙමින් ද විස්තර කළා ය.

Scanned with CamScanner

දිගු මේසය පුරා විසිරුණු මෑ ඇට මත ආශාගේ දෑස නැවතිණි.

"මං ඉස්කෝලෙට යන්ඩ ඕනෑ පොඩි මහත්තයා."

ඔහුගේ දෙනෙත දැල්විණි.

"ඔව් ඉතිං යන්ඩම එපායැ..." යි කී ඔහු නුදුරෙහි නිවෙස වෙත ගියේ ය. ගෙමිදුලේ කොණක විශාල මඩුව තුළ හුදෙකලා වන්නට අකමැති වූ ආශා ද පිටතට ආවා ය.

"මං යන්නං නංගියේ..."

"මාත් එනවා.."

ආශා දැරියකසේ කී කල ඉන්ද්‍රානි මඳ සිනාවක් පෑවා ය.

"අපරාදෙනෙ නංගියේ දවස පාඩු කරගන්නෙ. තව මහ වෙලාවක් තියෙනවැයි. නංගි ඔය ටිකත් ඉඳලම සල්ලිත් අරංම යන්ඩ..."

කෙල්ල දෙගිඩියාවෙන් බලා සිටියා ය.

"හෙට ලොරිය එනවා... මට අද මේ වැඩේ ඉවරයක් කරගන්ඩ ඕන. හරියට වෙලාවටම යන්ඩ දගලන් නැතුව ටිකක් හිටියොත් තමා හොඳ..."

ඇය ඇට මේසය කරා ගමන් කරන අයුරු බලා හුන් මිනිසා පැවසුවේ ආමන්ත්‍රණයකින් තොරව ය.

නැවත වැඩෙහි නිතර වුවද ආශාගේ දෙකනේ රැව් දුන්නේ ඉන්ද්‍රානිගේ හඬ ය.

"ආයෙ ඉතිං මටත් එන්ඩ වෙන්නෑ කෙල්ලට වතුර වක් කරන කල්. නංගිලා අනිද්දා ගමේ යනවා කියන්නෙ. නැත්තං ඉතිං බත් කටක් කාලා යන්ඩ එන්ඩ තිබ්බනේ..."

කොටහළු මංගල්ලයක් ජයටම සිදු කළ යුතු බව ඇය කීවේ උද්දාමයෙනි. මවකගේ සාඩම්බරය ඒ වචනවල තැවරී තිබිණි.

"ඇටෙං පොත්තෙං එළියට එනකොටම මුං කොල්ලො එක්ක යාළු වෙනවනේ නංගියේ. කාට ද කියන්ඩ පුලුවං ඔය



මොකෙක් හරි රස්තියාදුකාරයෙක් එක්ක පැනල යයිද නොයයිද කියලා. ඉතිං මඟුල් ගෙවල් කෙසේ වෙතත් ඇස්වෝං.... එකවත් ලොකුවට කරගන්ඩ එපැයි..."

මුදල් නෝට්ටු කීපය තනපටය තුළ සඟවා ගනිමින් ඇය ගැමි ගැහැනියකගේ හදවත ගෙනහැර පෑවා ය. හිස සැලුවා විනා ආශා කිසිවක් නොපැවසුවා ය. ඇයට ඇඩිව උවමනා වූයේ ඉන්ද්‍රානි සමඟ පිටව යාමට ය. ඇය නොමැතිව නුරා බැල්මක හිරිහැරයට ලක්වෙමින් තවත් පැය කීපයක් ගත කිරීම පහසු කටයුත්තක් නොවන බව හඟිමින් කඩිසර වූවා ය.

"මට පොඩි ගමනක් යන්ඩ තියෙනවා. ඔය ළමයත් සල්ලි ගත්තනං. සල්ලි ගත්තට යන්ඩ එපා මං එනකල්..." යි කියමින් පොඩිමහත්තයා නිවෙස වෙත ගියේ ය.

ඒ වචන ඇයට ඉතා මිහිරි විය. ඔහු හැකිතාක් ප්‍රමාද වී එන්නේ නම් කොතරම් හොඳ දැයි සිතමින් ඇය නැගී සිටියා ය.

ඔහු යුහුසුළුව මඩුව පසු කර යන අතර ඇය දෑක දෑස අයාගත්තේ ය.

"කලබලේට මතකම නැති වුණා... මට පරක්කු වෙනවා ළමයෝ... අන්න ස්ටූල් එක උඩ සල්ලි" යි කී ඔහු යතුරු පැදියට නැගුණේ ය.

ඇය ඒ කුඩා නිවෙස වෙත ගියේ අපමණ සැහැල්ලුවකිනි. එහි වෙසෙන්නේ තනිකඩයෙකු බව මලින් තොර මිදුල පවා නිහඬව හෙළිදරව් කරන සෙයකි.

මේ තමා උපයන අවසන් මුදල බව සිතමින් ඇය ස්ටූලය වෙත නැඹුරු වූවා ය.

මුදල් නෝට්ටු කීපය අතින් ගනිත්ම වැරදීමක් සිදුව තිබෙන බව ඇයට හැඟිණි.

"මෙච්චර සල්ලි? වෙනදට දෙන්නෙ රුපියල් අටසීයයිනෙ... මෙතන දාහෙ කොලම පහක් තියෙනවනෙ..." යි ඇය මුදල් නෝට්ටු කීපය ගනිමින් තොල් මතුළා ය.

මේ කිසියම් පරීක්ෂාවක් ද? තමා කොතරම් අවංකද යන වග දැනගැන්මට ඔහු භාවිතා කළ උපක්‍රමයක් විය නොහැකි ද? ඇය මුදල් නෝට්ටු කිපය නැවත ස්ටූලය මත තැබුවා ය. තමාට අයත් නැති යමක් ලබා ගැනීම වැරැද්දක් බව සිතුවා ය.

"යකෝ එක රුපියල් දහයක් තියාගන්ඩ බැනේ මෙකි එක්ක. බඩේ තමා හංගන්ඩ වෙන්නෙ මට. කොතන හැංගුවත් හොයලා ගන්නවනේ මෙකි. මෙකිට ඉව තියෙනවද මංදා සතෙකුට වගේ..." යි සීතම්මා බැන වැදුණ ද මේ මද්දහනේ ඇයට අන්තරායක ඉවක් නොදැනිණ.

"ඇයි? ගන්ඩ. ඔය සේරම ඔයාට තමා..."

දැනටමත් දුර බැහැරක යමින් සිටින බවට නිසැක මිනිසාගේ හඬ ඇසෙත්ම ඇය තිගැස්සුණා ය. ඔහු සමීපයට පැමිණෙනතුරුම කිසිදු හඬක් නොඇසුණේ මන්දැයි ඇය පුදුමයට පත් වූවා ය. යතුරු පැදියේ නැඟී යාමද ඒ ගමනද ව්‍යාජයක් බව ඔහුගේ මුහුන දකිත්ම ඇයට වැටහිණ. ඒ පැරණි පාළු පන්සලේදී තැති ගත් ලෙසින් ම ඇය තැති ගත්තා ය.

"සද්ද නැතුව හිටියොත් මං තවත් සල්ලි දෙනවා... මට ඕන තරම් සල්ලි තියෙනවා... කුලී වැඩ කර කර දුක් විඳින්ඩ ඕන් නෑ..."

ඇය වටපිට බැලුවේ උගුලකට හසු වූ සතෙකු පලා යාමට මගක් සොයන්නාක් මෙනි.

"බයවෙන්ඩ දෙයක් නෑ... ඔය ළමයා ඔය හැටි බයවෙන්ඩ ළමිස්සියක් නෙමේනේ... කසාද බැඳපු ගෑනියෙක්නෙ. මාත් තනිකඩයා... මේක ඉතිං අපි දෙන්නගෙං පිට යන්නෑනේ..."

ඇගේ නිශ්ශබ්දතාවය අවනත වීමක් ලෙස වරදවා වටහාගත් මිනිසා අප්‍රමාණ ප්‍රීති ප්‍රමෝදයෙන් ඇය වැළඳ ගත්තේ ය. එකෙනෙහි ගිනිකන්ද පුපුරා හැලිණ.

"අතෑරපිය... අතෑරපිය මාව"

නෙත සිත වසඟ කරවන සුන්දරත්වයට ඒ සා කෲර බවක් සැඟ වී තිබිණැයි ඇදහිය නොහැකිව ඔහුගේ මුව විවර



විය. බුර බුරා ඇල්වෙන රාගාග්නිය පවා නිවා දමන්නට ඇගේ කෝපාග්නිය සමත් වුව ද මේ අගනා මොහොත අත් හරින්නට ඔහු කැමති නොවීය. අනෙක් අතට කජු කිරි කෙල්ලකට පැරදී පසුබා පලා යාම තමාට තරම් නොවන බව ඔහුට සිතිණ.

"බොරුවට කෑගහන්ඩ දඟලන්ඩ එපා. නිකං නෙමේනේ... මං සල්ලි දෙනවනෙ..." යි ඔහු ඇඩි හඬින් කීවේ ය.

ඇය ඔහුගේ ග්‍රහණයෙන් ගැලවගන්නට සමත් වූවා ය.

"ඉඳගෙන ඉඳලා අටසියක් හොයන වෙලාවෙ නිදියගෙන ඉඳලා පන්දාහක් හම්බුණාම නරක් වෙලා තියෙයි..."

ඇගේ සිරුරේ සියුමැලි බවින් අවදි වූ ඉඳුරන් ඔහු කෝපයට පත් කළේ ය.

"මගෙං කුණුහරප අහගන්නැතුව මට යන්ඩ දීපං"

ඇය ගිනිගෙන ඇවිළෙන දෙනෙතින් ඔහු දෙස එක එල්ලේ බලමින් අණ කළා ය.

"එකාතකට ඉතිං කරබා ගෙන මළකද වගේ ඉන්නැතුව මෙහෙම පොඩ්ඩක් දඟලන එකෙත් ගතියක් තියෙනවා තමා..."

ඔහු පෑ සාවඥ සිනාවෙන් ඇය තවත් කුපිත වූවා ය. ඒ මදිවාට ඔහු පියවරෙන් පියවර ඇයට සමීප වෙමින් සිටියේ ය.

"අල්ලපං බලන්ඩ මාව... මං උඹ මරනවා... මරන එක මරනවා"

පෙරදා රැයෙහි දී ද හිමිදිරියේ ද ඒ ප්‍රේමාතුර තරුණයාගේ ශක්තිමත් හා කඩවසම් සිරුරට යටව තැලී පොඩි වී අනුරාගයේ අනන්තය කරා ඉගිල ගිය ඇය මේ මද්දහනේ මේ තරබාරු අසෝබන මිනිසාට තමා ස්පර්ශ කරන්නට ඉඩ හැර කරබාගන්නේ කෙලෙසද?

"යකෝ මේකිගෙ සැර... ඉන්නෙ නං රෝස පොහොට්ටුවක් වගේ..."

ඇගේ කෝපය ඔහුට සිනාවට කරුණකි. එහෙත් ඉතා ඉක්මණින් සරදම් සිනාවකට විවර වූ මුවින් මරහඬක් ගිලිහිණ.

Scanned with CamScanner

ස්ථූලය මාරාන්තික අවියක්ව ඇගේ දෑතේ රැඳිණ. මුදල් නෝට්ටු කීපය බිම විසිරී තිබිණ.

හිරු ඉහළ අහසේ බැබලෙමින් පහළ මහ පොළොව දවාලයි. ඉපල් බේරුණ ගසක් යට බයිසිකලය පෙරළී තිබිණ. ගුරු පාර පාරවා වේගයෙන් ඇදී ගිය ජීප් රිය තුළ බයිසිකලය පැද ආ තරුණයා බය බිරාන්තව සිටියේ ය. ඔහුගේ කලිසම් සාක්කුව පත්ලේ සුරැකිව තිබූ ඒ ඉපැරණි ශාක ශේෂය හේතු කොට ගෙන ඔහුගේ නිදහස අහිමිව ගොසිනි. ඔහු ගේ වේදනාබර දෑස අබියස ඇගේ නිරුවත් සිරුර අතිශය ප්‍රභාමත්ව බැබලිණ.

සිව් වසරකට පසු නිදහස් ලෝකයට පිවිසි අමරසිරි ළය පුරා හුස්මක් ඉහළට ඇද්දේ ය. පවුරු ප්‍රකාර ඔබ්බෙහි හිත මිතුරු හදවතක මතකයෙන් තෙත්ව ගිය දෙනෙතින් ඔහු ඉදිරියට ගමන් කළේ ය. දැකගන්නට පුල පුලා බලා හුන් රුව අහළ පහළ නොවූවද හෙතෙම නොකැළඹුණේ ය.

# 22

හිරු බැස ගිය ද අග නගරයෙහි රාත්‍රිය දහවලට වඩා ආලෝකමත් විය. විදුලි බුබුළු මවන අනේක රූ රටා ඒ රමණීය ගොඩනැගිල්ලේ ආකර්ශනය ඔප් නංවයි. එහෙත් නිවෙන දැල්වෙන නෙක පැහැ විදුලි බුබුළු අතරේ ඇය පෙනී සිටි කල්හී සැබෑ ආකර්ෂණය ඇය ම බව නොහැඟුණේ කාට ද...?

“සුදු හංසි... සුදු හංසි...”

හංස ධේනුවකගේ පැහැයෙන් එල්ලා හැලෙන දිගු ලෝගුව ඇගේ දැතින්ම ගැලවෙන කල සුරා මතින් අවසඟ වෙමින් හුන් පිරිස අතරින් නැඟුණේ ඔල්වරසන් හඬකි.

“රෙඩ් රෝස්...”

දෑතේ ද ගෙලේ ද රත්රන් පළඳනා රාශියක් එල්ලාගෙන හුන් මිනිසෙකු මහ හඬින් කෑ ගැසුවේ ය. ඇය කිසිවෙකුගේ නෙතක් ඩැහැ ගන්නට වෑයම් නොකළා ය.

ඇගේ සිරුරේ හැඩතල මනාව උළුප්පා දමන දිගු ගවොම ඇගේ දෙපා මත පතිත වූ කල පැන නැඟි ඝෝෂාව දැරිය නොහැකි තරම් විය.

තනපටය හා යටිකය වසාගත් කෙටි කලිසම ඇගේ දිගු ඇඟිලිතුඩින්ම ගැලවී යන තුරු ඇසිපිය නොහෙළා බලා හුන් මිනිසුන් හුස්ම ඉහළ පහළ හෙලන බවක් හෝ නොපෙනිණ.

Scanned with CamScanner

ඉවසිල්ලේ හා සැනසිල්ලේ ඇගේ නර්තනය හා නිරුවත විඳින්නවුන් භාවනායෝගී තවුසන්ගෙන් වෙනස් නොවූහ. "ස්වීට් හාට්"යි මහත් උද්දාමයෙන් කෑ ගෑ අයෙක් තවත් මධු ටිකක් හිස් කළේ ය.

තනපටයද බිම පතිත වූ කෙණෙහි අතකින් ළය මිරිකාගත් මහල්ලෙක් "ගිනි කිකිළි" යි කෙඳිරුවේ ය. මියැසි රාවය වඩා වේගවත් විය. මධු බඳුන් බිම පතිතව බිඳී ගියේ ය.

ඇය නොළුස් වේදිකාව මත නර්තනයේ යෙදුණේ සකල ඇඳුම් ආයිත්තම්වලින් හැඩ වැඩ වූ කලෙක පරිද්දෙනි. අඳුන් ගැල්වූ නුවන් තුළ දිලෙන ගිනි පුපුරු දකින්නට නන් පැහැ මීදුම් දහරා මෙන් ආලෝක දහරා වගුරන විදුලි බුබුළු ඉඩ නොදෙයි.

ඉහළ මිලැති මත්පැන් ද හදක් පාසා සංගාරය ද දෝරේ ගලා යන රාත්‍රී සමාජ ශාලාවට සැතපුම් ගණනාවක් ඔබ්බෙහි මුළුමනින් ම අපේක්ෂා භංගත්වයට පත් තරුණයෙකු නමාගත් හිසින් දුර්ගන්ධය විඳ දරාගනිමින් සිටියේ ය.

තණපතක් පාසා දිලෙන පිණි බිඳු මෙන් මරණය සුලභ හා භයංකාර වුවද නිදැල්ලේ වනය සිසාරා ආහාර සෙවීම ද මෛථුනයේ යෙදීම ද එකම පරමාර්ථය වූ වනමෘගයෙකු සත්වෝද්‍යානයක කුඩා කූඩුවක සිරගත කිරීමේ දරුණු හා කෲර ඉරණම නොඉවසන්නාක් මෙන් ඔහු බන්ධනාගාරය ද සිර කුටිය ද පිළිකුල් කළේ ය.

"ඡික්... අමරෙ අයියා මං ගැන මොනව හිතන්ඩ ඇත්ද. සඳුනි ගැන නං මට ලොකු බයක් නෑ... ඉන්ද්‍රක්කා ඉන්නවනෙ ඕන දේකට... ඒ වුණාට එයා මං ගැන කිසි ආරංචියක් නැති වුණාම හිතයි මං එයාව දාලා පැනල ගියා කියලා... අයියෝ..."

ඔහු වරෙක දැතින් හිස බදා ගත්තේ ය. තවත් වරෙක ඒ මේ අත සක්මන් කළේ ය. අවුරුදු කීපයකට පසු හමුවන මිතුරා සමග එක් ව ගංජා දුමින් පෙණහලු පුරවා ගන්නට ද ඉනික්බිති සුඛ දුක්ඛ ස්වප්නයක කිඳා බැස මත් මායාවේ වෙළෙන්නට ද දරන ලද ප්‍රයත්නය මෙබඳු කුඩා කුටියකින් කෙළවර වනු ඇතැයි ඔහු කිසිසේත් නොසිතුවේ ය. ඔහු සන්තකයේ තිබුණේ ගංජා



මිලිගැම් කීපයක් වුව ද ඇප ලබාදීමට කිසිවෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් ලද තෙමසක සිර දඬුවම කල්ප ගණනාවකට වඩා දීර්ඝ බව හඟිමින් හූල්ලා වැටුණේ ය.

පියාපත් සිඳිනු ලැබූ පක්ෂියෙකු මෙන් ඔහු නිල් අඹරේ සැහැල්ලුව වෙනුවෙන් තැවුණේ ය. දැත් දෙපා තියුණු අසිපතකින් කපා වෙන් කරන ලද කලෙක මෙන් ඔහු වේදනාවෙන් මිරිකුණේ ය.

"මොකක් ද මේ වුණේ? මොකක් ද මේ වුණේ...?" යි ඔහු නොකඩවා කොඳුලේ ය. බිඳ වැටෙන සිහින කොපමණ සොඳුරු වී ද යන වග ඉඳුරා දැන හුන් හෙතෙම වැලපුණේ ය. එහෙත් ඔහුගේ ප්‍රේමයට පාත්‍ර වූ අංගනාව මුළුමනින් ම නිරුවත් වන කල පවා දෙනෙත කඳුලක් වෙනුවට ගිනි පුපුරු නොදිලිණ. කිසි කලෙකත් නොතිබුණ හිස් බවක් ඒ දෑසේ විය.

වේගවත් සංගීත රාවයට අනුව සැලෙන පුන් පියයුරු මත රැඳුණ අඩවන් ඇස් ඇගේ නාභියෙන් පහළට ගමන් කරන්නට වූයේ ඉල්පෙන හදවත් අසීමාන්තික රාගයෙන් කැකෑරෙන අතරතුරය. ඒ අතරේම ඇතැමුන් විරාගී මනසින් මී විතක් තොල ගාමින් නිහඬව පසුවූහ.

ඉහිල්ව ලිහිල්ව ගිය තරබාරු සිරුරු මිල අධික ඇඳුම් ආයිත්තම්වලින් වසාගෙන හුන් ඉහළ පෙලැන්තියේ මහත්වරුන් ගේ නිරුවත සපුරා දකින නාටිකාංගනාව සිය සිරුරේ නූල් පොටක් හෝ නොවන බව නොතකා හැරියා ය. කොතෙක් ආශා හරිතව හුන්න ද රතින් බබළන මේ අඟනා අත් තමා ස්පර්ශ නොකරන බව දැන සිටීම ඇයට සහනයට කරුණකි. දඩබ්බර තරුණයෙකු එවැන්නකට යත්න දරන්නේනම් වලක්වාලීමට හැඩි දැඩි ආරක්ෂකයන්ද සුපරීක්ෂාකාරීව පසුවූහ. සමාජ ශාලාවේ සම්භාවනීය සාමාජිකත්වය දරන ප්‍රභූවරුන් සාමාන්‍යයෙන් එහි නීති රීති උල්ලංඝනය නොකරන බැවින් ඇය නර්තනයෙහි රිද්මය පිළිබඳව පමණක් සැලකිලිමත් වූවා ය.

මනබඳනා සිරුරත් නෙත පිනවන ළැමත් දැක තුටු පහටු වූ ඇතැමුන් විසි කරන මුදල් නෝට්ටු දෙස බලන්නට ඇය පමා

Scanned with CamScanner

නොවූවා ය. ඇයට සිතා ගන්නට හෝ නුපුළුවන් මුදලකට ඇගේ පහස ලබාගන්නට වෑයම් කරන උදවිය සිටියද නර්තනයෙන් ඔබ්බට යාමට ඇය කිසිසේත් එකඟ නොවූවා ය. එක්තරා අඳුරු රාත්‍රියක හා අළුපැහැ හිමිදිරියක සිහින් කයින් විඳි ඒ රමණිය රමණියගේ මතකය මංජුසාවක් තුළ බහාලූ මුතු කැටයක් පරිද්දෙන් කැළුම් දෙන කල ඇයට තනියහනම සිරියහනක් වෙයි.

රංගනය හමාර කළ අංගනාව නුදුරෙහි කුඩා කුටිය කරා ඇදුණේ ද නිරුවතින්මය. අත්පොළොසන් හා ඔල්වරසන් හඬ පමණක් නොව ඇය ගලවා විසි කළ තනපටය දැනීන් මිරිකා ගන්නෙකු ගේ තෘෂ්ණාබර බැල්මද නොතැකුවා ය. එහෙත් තමා නියැලෙන වෘත්තියට අදාල අත්‍යවශ්‍ය අංගයක් වූයෙන් සුරත පෙළඹවා නරඹන්නන් හට ආචාර කරන්නට අමතක නොකළා ය.

"නංගමෝන්..."

"නම් එගේන්..."

"අයි ලව් යූ"

මුව මුව එවදන් පමණක් නොව අසභ්‍ය වදන් ද රැව් දුන්නේ ය.

පෙණ දමන බියර් වීදුරුව ඇගේ රත් දෙතොලේ ගැටිණ. එය හොලගාන අතරේම ඇය සිගරැට්ටුවක් දල්වා ගත්තා ය. එයින් නැගෙන දුම් රොටු විදුලි පහන් ආලෝකයේ මලානික බවට එක්තරා ගුප්ත ස්වරූපයක් එක් කළේ ය.

"කොහෙද ඉතිං... වැව් මාලු තිබ්බොත් මෙලෝ සිහියක් පහක් නැහැනේ... කොච්චර කිව්වද හිමීට කටු ඇරලා කාපං කියලා..." යි ඒ කුඩා කෙසග මැහැල්ල ආඩපාලි කියන්නේ බියමුසු බැල්මක් ද සමඟිනි. උගුරේ ඇනුණ මාළු කටුව මිණිබිරියට පමණක් නොව ඇයට ද වේදනා ගෙන දෙයි. මාළු පිණි මුසු නොකොට හෙදින් ගුලි කළ බත් ගුලි දෙක තුනක් ද කෙසෙල් ගෙඩියක් දෙකක් ද නොවිකා ගිලින්නට දෙන ඇය "හරිද..? දැං හරි ද?" යි අසන්නේ නොඉවසිල්ලෙනි. තීන් මාළු කටුවක් නොව තියුණු දිගු අසිපතක් ගිලුණ කලෙක මෙන් විස්සෝප වන මැහැල්ල "අප්පේ ආයෙ



නං මං ඔය පොඩි මාළු මේ ගේ අහලකට ගත් නෑ... ලොකු තෝත්පිලියො නැත්තං මාළු ගන්නෙම නෑ..." යි සපථ කරයි.

ඒ බත් ගුලි හා කෙසෙල් ගෙඩි උගුරේ ඇනුණ කටුව ඉවත් කළ පරිද්දෙන් බියර් වීදුරුවද සිගරැට්ටුවද ළය හිර කළ සියුම් ශෝකය තුනී කර දමයි. මද මත් බව සමඟ දැඩි සැහැල්ලුවක් ඇය වෙළා ගනියි. එහෙයින් කිසිවෙකු දොරට ගසන හඬින් නොකැළඹුණා ය. අපමණ ආශාවෙන් ද රාගයෙන් ද ඇවිස්සී ගිය එකෙකු ඇය ලුහුබැඳ ආව ද ආරක්ෂක අංශය ඒ පිළිබඳ ව වග බලා ගන්නා බව ඇය දනියි. එහෙත් දොරට එපිටින් ඇසෙන කලබලය ද කෑ ගැම් ද වඩ වඩාත් උත්සන්න වන බව හැඟී යත් ම ඇය නැඟී සිටියා ය. තමා තවමත් නිරුවතින් පසුවන බව නිහඬව කියාපාන කැඩපත මත රැඳුණ දෙනෙතින් මොහොතක් හිටගෙන සිටියාය.

"රූපෙයි පාටයි හින්දා උඹ ඔනැවට වඩා උඩගුයි. වරෙං මං උඹට කියල දෙන්ඩ පිළිකුල් භාවනාව කොරන හැටි..." යි සීතා ඇතැම් රැයක ආරාධනා කළ ද කෙල්ල එක් අවඥාබර බැල්මකින් ප්‍රතික්ෂේප කරයි.

"අද ඔහොම පාන පත්තු කෙරුවා වාගේ එළිය දුන්නට මොක ද හෙට පණුවගෙ බෝජනේ... කුණු සරීරේ කුණු සරීරේ..." යි අනිත්‍ය මෙනෙහි කරන මැහැල්ල පිළිකුල් භාවනාවට ලක ලැස්ති වෙයි.

අඩ නිරුවත් මිණිබිරිය අබියස බවුන් වඩන මිත්තණියගේ හෙවණැල්ල සලිත වන්නේ කුප්පි ලාම්පුව නිවා දමන්නට වෙර දරන සුළං පොදක අවිනීතකම නිසා පමණක් නොවේ. ආශාද මුවින් පිඹිමින් ඒ සඳහා උත්සාහ කරන බැවිනි.

"අත්ථි ඉමස්මිං කායේ කේසා
අත්ථි ඉමස්මිං කායේ ලෝමා
අත්ථි ඉමස්මිං කායේ නඛා
අත්ථි ඉමස්මිං කායේ දන්තා..."

Scanned with CamScanner

භාවනායෝගී මැහැල්ලගේ හඬ නව යව්වනියට මහත් කන්දොස්කිරියාවකි. එහෙත් මේ දැන් දෙකනේ නින්නාදවන ඒ හඬ නිරුවත් තරුණිය ඇල්මෙන් අසා සිටියා ය.

"මට ඒ කෙල්ල ඕන. ඉල්ලන ඕන ගානක් ගෙවනවා මං..."

මැහැල්ලගේ පිළිකුල් භාවනාව යටපත් කර දමමින් තරුණ හඬක් උස්ව හා රළුව නැගේ.'

"හංසි ඩාන්ස් කරනවා විතරයි මිස්ට! ඇල්බම් එකේ ඉන්න කෙනෙක් දෙන්න පුලුවන්..." සමාජ ශාලාවේ කළමනාකරුගේ හඬ ඇය හඳුනා ගත්තා ය.

හිස් වීදුරුව පසෙක තැබූ ආශා ඇඳුම් ඇඟලා ගත්තා ය.

"තමුසෙ දන්නවද මං කව්ද කියලා... මං මල්දෙනිය ඇමතිතුමාගෙ පුතා..." මට ඕන හංසි විතරයි.. තමුසෙට තේරුණද මට ඕන හංසි."

ඇමති පුත්‍රයාද පිරිවරද කොතෙක් ප්‍රචණ්ඩ වී ද කිවහොත් තව මොහොතකින් දොර කැඩී යනු ඇතැයි ඇය තැති ගත්තා ය. කෑ ගැසීම් පරයා හෙණහඬක් සේ ගිගුම් දුන් වෙඩි හඬින් ඇය සුඩුමැලිව ගියා ය. එහෙත් ඊළඟ මොහොතේ දොර විවර වුව ද ඇය බියට පත් නොවූවා ය. නිසැකව ම ඒ කළමනාකරු බව ඇය දැන සිටියා ය.

"අර ඇමතියගෙ පුතා මී හරකෙක් වගේ අනින්ඩ පනිනවා... හංසි ඔයාට හොඳ ගානක් හම්බ වෙයි. කැමති නම් යන්ඩ පුලුවං... අපිට මාර වධයක් මේක..."

බෙහෙවින් නොසන්සුන්ව හුන් මිනිසා වේගයෙන් කියාගෙන ගියේ ය. සාමාන්‍යයෙන් ඔහු ඉතා විනීත ලෙස කතා කරන්නෙකි.

"ඇමතියත් එච්චර හොඳ කෙනෙක් නෙමේ... අපිට මේක ගොඩිං බේරගන්ඩ පුලුවං. හංසි මොකද කියන්නෙ?"

ඇය ඔහුට පිටුපාන අතරතුර "සොරි" යි පහත් හඬින් මිමිණුවා ය. මොහොතක් ඇගේ දෙවුර සිපගන්නා කෙටි කෙස් කළඹ මත රැඳුණු ඇසින් පසු වූ ඔහු "ඕ කේ" යි කීවේ ය.



අනතුරුව ඔහු පයලු සපත්තු ඔප් නැගුණු බිම ගැටෙන හඬ නො නැසී ගියේ ය. දොර වැසිණ. ඇය නිසලව නිහඬව හා අකම්පිත ඇසින් ඒ හඬ අසා සිටියා ය.

ඉනික්බිති කොපමණ වේලාවක් ගතව ගියේදැයි ඇය නොදත්තා ය. කාලය පිළිබඳ ව හැඟීමක් ඇය තුළ නොවී ය. කාල ගෝට්ටිය කෙමෙන් තුනී වී යන බවක් හැඟී ගියෙන් ඇය අත් බෑගය අතින් ගත්තා ය. එකෙණෙහි සිහිවතු දොරට තට්ටු කරන හඬින් ඇගේ උද්යෝගය ඇල්විණ.

"සඳුනි... මේ දොර අරින්ඩ"

මාස ගණනාවකට පසු ඇසෙන ඒ හඬින් විසිළිසර වනවා වෙනුවට ඇය හැකිතාක් කඩිනමින් දොර ඇරියාය. එහෙත් ඇගේ ඇස දකින්නට නොඉවසිලිමත් වූ රුව කොතනකවත් නොවී ය. සංගීත රාවය ද මධු බඳුන් ගැටෙන හඬ ද උස් පහත් වන මිනිස් හඬ ද අසමින් ඇය විවේක කුටියෙන් පිටතට ආවා ය. සිරිත් පරිදි කරන්නාක් මෙන් දොර වසා ඇමූ ඇය අඩ අඳුරින් වෙළී ගිය පටු බරාඳය ඔස්සේ ඇතට ගමන් කළා ය. ඇගේ හිතම සැළිණ.

"බලාපල්ලා ගස්සන ගැස්සිල්ල... සිරිදේවි වගේ නෙමේ විසාකා සිටු දේවි වගේ ඇවිදින්ඩ පුරුදු වෙයං..."

මැහැල්ල අවවාද කළේ සිරිදේවි නම් රූමත් යක්ෂණියගේ හා මහා විසාකා සිටු දියණියගේ ගමන් විලාශය හොඳින් දැක ඇත්තියක පරිද්දෙනි. ළය රිදුම කොතෙක් බලවත් වුව ද කෙටි කෙස් කළඹ සලිත කරවමින් නවාතැන් පොළ වෙත යන තරුණියගේ දෙතොල මත සියුම් මදහසක් නැගිණ.

තවත් මොහොතකින් ඇගේ රුව නොපෙනී ගිය අතර පයලු අලංකාර මිරිවැඩි සඟල නැගූ හඬ ද කෙමෙන් වියැකිණ. අඩ අඳුරේ බොඳව ගිය සෙවනැල්ලක් පරිද්දෙන් වූව බරාඳය ඔස්සේ පැමිණෙන තවත් තරුණියකගේ පා ගැටෙන හඬ යළි නින්නාද විය.

නිමි....



# ගිරිදේවි

ශාන්ති දිසානායක

ගැබ කලලය දරන්නට
වල කළා වූ දණ්ඩන කඳවුරක
ඇයට ඇයම වන්නට
ඉඩ හසර නොදෙන වග
යළි යළිත් සපථ කරන කල
කෲර යක්ෂණියක මිසක
ගැහැනියක වී කුමකට...?

http://www.sarasavi.lk
Rs 550.00
ISBN 978-955-31-1072-5
SARASAVI 2017
Novel

සරසවි ප්‍රකාශකයෝ
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ. දුරකථන/ෆැක්ස්: 011 2769448 e-mail:publishing@sarasavi.lk

පිටකවරය සැකසුම:

Scanned with CamScanner